ගරු සභාපතිතුමනි දිවා ආහාරයේ විවේකයට පෙර සාක්ෂි ලබා දුන් ලංකා බැංකුවේ නිලධාරිණියගේ ඉතිරි සාක්ෂි කොටස ලබා ගැනීමට නියමිතව තිබුණත් මේ අවස්ථාවේදී එම සාක්ෂිය හිස්බුල්ලා මහතාටද විවෘතව ලබා ගනිමින් සිටි බැවින් ඔහු මෙම සභාව තුළ නොමැති බැවින්, ඔහු පැමිණීමෙන් පසුව එම සාක්ෂි ලබා ගැනීමට ඉඩ තබා මාධ්‍ය සහ වෙනත් අයට විවෘත නොවන සාක්ෂියක් වන විමර්ශන කටයුතුවල නිරත වූ විර්ශකයාගේ සාක්ෂිය මින් අනතුරුව මෙහෙයවීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

අවසර ලබා දෙමි.

****

සම්පූර්ණ නම : විජේසිංහ පතිරන්නැහලාගේ සනත් ධම්මික විජේසිංහ,

වයස : අවුරුදු 52 යි,

ජාතිය : සිංහල,

ආගම : බෞද්ධ,

දැනට තනතුර : ප්‍රධාන පොලිස් පරීක්ෂක.

දැනට සේවා ස්ථානය: දැනට පොලිස් මූලස්ථානයට අනුයුක්තව අපරාධ කොට්ඨාශයේ සේවය කරනවා. වර්තමානයේ මෙම කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරියෙක් වශයෙන් කටයුතු කරනවා ස්වාමීනි.

<u>ප්‍රතිඥා දෙයි.</u>

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ස්වාමීනි ඒ අනුව මෙම සාක්ෂිකරු මීට පෙරත් ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දී තිබෙනවා. ඒ අනුව ඔහුගේ මූලික සුදුසුකම් ආදිය මෙහෙයවීමකින් තොරව සෘජුවම කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමට අවසර පතනවා.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

අවසර ලබා දෙනවා

****

Presidential Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ධම්මික මහත්මයා ඔබ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට සම්බන්ධ වෙලා මූල්‍යමය විමර්ශන සම්බන්ධයෙන් මූලිකවම භාරව කටයුතු කළා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ මූල්‍යමය විමර්ශන සිදු කිරීමේදී හිටපු ආණ්ඩුකාර හිස්බුල්ලා මහතාගේ ක්‍රියාකලාපයන්ට අදාළව සිදුවන විමර්ශනය සම්බන්ධයෙනුත් ඔබ මූලිකත්වය ගෙන කටයුතු කළා කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ධම්මික මහත්මයා හිස්බුල්ලා මහත්මයාට අදාළව සිදු කෙරෙන විමර්ශනයේදී ඔබ කුමන ආකාරයේ විමර්ශනයක්ද දළ වශයෙන් සිදු කළේ කියලා සාරාංශගතව කියන්න පුළුවන්ද?

පි : ස්වාමීනි හිස්බුල්ලා මහතාගේ Batticaloa Campus Private Limited සමාගම සම්බන්ධයෙන් විමර්ශනය සිදු කළා. එම විමර්ශනයට සහාය ලබා ගැනීමට පහත සඳහන් තොරතුරු මා විසින් ලබා ගත්තා. ස්වාමීනි ප්‍රථමයෙන් එවකට අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ මාසික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා විසින් 2019.06.21 වන දින ඉදිරිපත් කරන ලද Batticaloa Campus Private Limited සමාගම සම්බන්ධ නිරීක්ෂණ වාර්තාවේ පිටපත්, ඊට අමතරව සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලේඛන සහ තොරතුරු. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයෙන් තොරතුරු, ලංකා බැංකුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තොරතුරු, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ තොරතුරු සහ නිලධාරීන්ගේ ප්‍රකාශ ලබා ගැනීම්, ඊට අමතරව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් තොරතුරු ලබා ගත්තා ස්වාමීනි, ඊට අමතරව Batticaloa Campus Private Limited සමාගම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන ඒකකයේ නිලධාරීන්ගේ ප්‍රකාශ සටහන් කලා ස්වාමීනි. අවසාන වශයෙන් හිස්බුල්ලා මහතාගේ සහ ඔහුගේ පුත්‍රයා සහ ඔහුගේ හිතවතුන්ගෙන් ප්‍රකාශ සටහන් කළා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබ විමර්ශන සිද්ධ කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ධම්මික මහත්මයාට සඳහන් කරන්න පුළුවන්ද ඔබ මේ Batticaloa Campus Private Limited කියන සමාගම සම්බන්ධයෙන්

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

විමර්ශන කරන කොට රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් ඊට අදාළව විමර්ශන සිද්ධ කළාද කියලා?

පි : එහෙමයි ස්වාමීනි. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ප්‍රධාන ලේකම්වරයාගේ ප්‍රකාශය සටහන් කර

ප්‍ර : ඔබ විමර්ශන සිද්ධ කළා?

පි : විමර්ශන සිද්ධ කළා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබට සඳහන් කරන්න පුළුවන්ද හිස්බුල්ලා මහත්මයාගේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත ඒගොල්ලෝ පිළිගන්න එක register කරනවද ලියාපදිංචි කරනවද නැත්නම් එය ප්‍රතික්ෂේප කිරීමක් සිද්ධ කරනවද?

පි :: ස්වාමීනි හිස්බුල්ලා මහතා ඉදිරිපත් කළ Hira Foundation ආයතනය ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම ආයතනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කර තිබෙනවා.

ප්‍ර : ඒ ප්‍රතික්ෂේප කිරීමට අදාළ ලේඛනයක් ඔබට දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරුට X613 ලේඛනය පෙන්වා සිටිනවා.

පි : හඳුනා ගන්නවා ස්වාමීනි.

ප්‍ර : දැන් මේ X613 අනුව සඳහන් වෙනවා නේද As for Information the disposal of Intelligence and Law Enforcement Agencies under this Ministry activities and the rest of members accept Chairmen of the Ogernesation Hira Foundation have come to the adverse notice කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සහ ඒ නිසා ලියාපදිංචි කිරීම Recommend කරන්න බැහැ කියලා එකක් සඳහන් වෙනවා නේද?

පි : එහෙමයි ස්වාමීනි එහෙම සඳහන්වීමක් වෙනවා.

ප්‍ර :: දැන් මේ අනුව ඔබ හොයලා බැලුවද රාජ්‍ය බුද්ධි අංශය විසින් මේ ශ්‍රී ලංකා හීරා පදනම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට වූ කරුණු කාරණා මොනවද කියලා?

පි : එසේ කළා ස්වාමීනි. මෙම ප්‍රතික්ෂේප කිරීමට වූ හේතුව සඳහන් වෙලා තිබුණේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් මෙම ආයතනයේ සභාපති ඇතුලු තවත් පුද්ගලයන් ප්‍රමාණයකට අසාදු සටහන් තිබෙන බව සඳහන් කර තිබුණා. ඒ අනුව අප රාජ්‍ය බුද්ධි සේවාවගෙන්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වාර්තාවක් කැඳෙව්වා ස්වාමීනි. ඒ වාර්තාව මට පුළුවන් ඉදිරිපත් කරන්න ස්වාමීනි.

ප්‍ර : ඒ වාර්තාව ඔබ සතුව තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබ විමර්ශනය කිරීමේදී ලබාගත් වාර්තාවක් කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද 2020.09.16 දිනැති බුද්ධි වාර්තාව X623 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>

ප්‍ර : දැන් ඔබ මේ X623 කියලා ලකුණු කරපු ලේඛනයයි, හිරා පදනම ලියාපදිංචි කිරීමට හිස්බුල්ලා මහත්මා ඉදිරිපත් කරපු සාමාජිකයන් දැක්වෙන ලේඛනයයි සංසන්දනය කරලා විමර්ශනය කළාද?

පි : එහෙමයි ස්වාමීනි මම විමර්ශනයක් සිදු කළා ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරුගේ පරිශීලනයට <u>X623</u> සමඟ C1308A වශයෙන් ලකුණු කරන ලද ලේඛනය ලබා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

සාක්ෂිකරුට C1308A ලේඛනය පෙන්වයි

මේ අවස්ථාවේදී මෙම සාක්ෂිකරුගේ සාක්ෂි විමසීම මහජනතාවට විවෘත නොවී ලබා ගන්නා බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : දැන් C1308A ලේඛනයයි, අපි දැන් X623 ලේඛනයයි පරීක්ෂා කරලා ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ **<u>X623</u>** මුලින්ම දැක්වෙන අෂේක් ඒ.එල්.එම් මුම්තාස් කියන පුද්ගලයා Hira Foundation කියන එකේ සංවිධානයේ මොන තනතුරද දන්නේ කියලා?

පි : ස්වාමීනි අදාළ ආයතනයට ලබා දුන් අයදුම් පත්‍රයේ එම පුද්ගලයාගේ නම සඳහන් වෙනවා අෂේක් ඒ.එල්.එම් මුම්තාස් කියලා. ඔහුගේ තනතුර සඳහන් වෙනවා Secretary General ඔහුගේ Identity card Number එකක් තියෙනවා ස්වාමීනි ඊට අමතරව permanent occupation එක සඳහන් කරනවා Program

FAIR COMMENT BY JEZEEM

Assistant කියලා. ලිපිනය සඳහන් වෙනවා ස්වාමීනි Kattankudy Batticaloa කියලා.

ප්‍ර : ඒ ඔය C1308A කියන අයඳුම් පත්‍රයේ තොරතුරු?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කරන්නේ X623 ලේඛනය අනුව මේ අෂේක් ඒ.එල්.එම් මුම්තාස් යන අය සම්බන්ධයෙන් මේ අසාදුගත වෙලා තියෙන තොරතුරු කෙටියෙන් මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : ස්වාමීනි මෙම පුද්ගලයා සම්බන්ධයෙන් ලබා ගත් බුද්ධි වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා.

1. මොහු Hira Foundation නමැති සංවිධානයේ මහලේකම් වශයෙන් කටයුතු කරනවා. මොහු මවුලවිවරයෙක්. විෂයාගේ සහෝදරයෙක් වන අම්ජාන් නැමැත්තා ආයුධ සන්නද්ධ මුස්ලිම් අන්තවාදී සංවිධානයක සිටි පුද්ගලයෙක් බව

ප්‍ර : ඊට අමතරව?

පි : ඊට අමතරව මොහු සතුව පවතින විදේශ සම්බන්ධතා අනුව Hira Foundation හරහා සෞදි අරාබි රාජ්‍යයේ විවිධ හිතවතුන් මාර්ගයෙන් සුභ සාධක කටයුතු සිදු කිරීම සඳහා මුදල් ලබා ගන්නා බව.

මීට අමතරව මොහු Center for Islamic Guidance අධ්‍යාපන ආයතනයේ තවුහිද් ප්‍රතිපත්තිය පෝෂණය කරන අල්මනාර් අරාබි පල්ලියේ අධ්‍යක්ෂක මණ්ඩලයක සාමාජිකයෙකු බව .

මීට අමතරව එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා යන අයගේ ආධාරකාරයෙකු වන බවත්, මොහු සතුව කෝටි 200 ක් පමණ වත්කමක් ඇති බවත්, මොහු ඥාති හිතවතුන්ගේ නමින් නුවරඑළිය, කොළඹ, මහනුවර හා කාත්තන්කුඩි යන ප්‍රදේශවලින් ඉඩම් මිළදී ගන්න බවත් සඳහන් වෙනවා.

ඊට අමතරව විෂයා විසින් කාත්තන්කුඩි සිට කොළඹ දක්වා ධාවනය වන මාගා නමින් සුඛෝපභෝගී බස්රථ සේවාවක් ද, නුවරඑළියේ මාගස්තොට ප්‍රදේශයේ මහා රෝයල් නමින් සංචාරක හෝටලයක් ද පවත්වාගෙන යන බවත්, කාත්තන්කුඩි ප්‍රදේශයේ Al Akusha Super Market නමින් වෙළඳ සංකීර්ණයක් ඉදිකරන බවටත් එම වාර්තාවේ සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ධම්මික මහත්මයා මේ Center for Islamic Guidance කියන තවුහීද් ප්‍රතිපත්ති අනුගමනය කරන පල්ලියක සාමාජිකයෙකු වගේම ඔහුගේ සහෝදරයෙක්, අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් වගේම අම්ජන් නමැති ආයුධ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

සන්නද්ධ මුස්ලිම් අන්තවාදී සංවිධානයක් සමඟ ඔහුගේ සහෝදරයෙක්ගේ සම්බන්ධතාවක් තියෙනවා කියන එක මෙහි පැහැදිලිව සඳහන් වෙනවානේ?

පි : පැහැදිලිව සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ සම්බන්ධයෙන් විමර්ශනය කරන කොට ඔබට මතකද මේ මුමිතාස් මවුලවි පාස්කු ප්‍රහාරයෙන් පස්සේ යම් ස්ථානයක CCTV කැමරා සමඟ නිරීක්ෂණය වුණා?

පි : පාස්කු ප්‍රහාරයෙන් පසුව ස්වාමිනි මට මතකයි ස්වාමීනි අවස්ථාවක් මම දැකලා තියෙනවා මාධ්‍යයේ යනවා.

ප්‍ර : Calm Resort and Spa කියන පාසිකුඩා හෝටලයේ අරාබි ජාතිකයින් කිහිප දෙනෙක් සමඟ දර්ශනය වුණේ මේ මුමිතාස් මවුලවි කියලා කිව්වොත් ඔබට මතක් වෙනවද?

පි : දැන් මතක් වෙනවා ස්වාමීනි. නිවැරදියි.

ප්‍ර : ධම්මික මහත්මයා දෙවෙනියට නම් සඳහන් පුද්ගලයාගේ නම මොකක්ද?

පි : ස්වාමීනි කේ.එල්.එම්.ෆරීඩ්.

ප්‍ර : දැන් මේ කේ.එල්.එම්. ෆරීඩ් කියන පුද්ගලයා හිස්බුල්ලා මහත්තයා විසින් ඉදිරිපත් කරපු C1308A කියන ලේඛනයට අනුව ඔහු ශ්‍රී ලංකා හිරා පදනමේ දරපු තනතුර මොකක්ද?

පි : Vice Chairman කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : උප සභාපති විදියට තමයි ලේඛනයේ දැක්වෙන්නේ?

පි : දැක්වෙන්නේ.

ප්‍ර : තව මොනවද එතන තොරතුරු දැක්වෙන්නේ?

පි : ඊට අමතරව ස්වාමීනි ඔහුගේ permanent occupation එක සඳහන් කරලා තියෙනවා ඒ යටතේ, Member of EPC කියලා. ඔහුගේ ලිපිනය සඳහන් වෙනවා 2/6, බාවා ලේන්, කාත්තන්කුඩි 6 ලෙස.

ප්‍ර : දැන් ඔබට සඳහන් කරන්න පුළුවන්ද දැන් ඔබ කිව්වේ ඒ C1308A application එකනේ. **X623** මේ තිරයේ දැක්වෙන ලේඛනයට අනුව ඔහු සම්බන්ධයෙන් තියෙන අසාදුගත වෙන්නට නැත්නම් blacklist වෙන්නට සුදුසු හේතු මොනවද කියලා කියන්න පුළුවන්ද?

පි : මේ වාර්තාවේ සඳහන් වෙනවා ස්වාමීනි මොහු යුද සමයේ අවි ආයුධ පරිහරණය කරන ලද කණ්ඩායමක් සමඟින් කටයුතු කරමින් යුද හමුදා බුද්ධි අංශය මඟින් 1998 දී ඔහු සතුව තිබූ ගිනිඅවියද සමඟ අත්අඩංගුවට ගෙන ඇති බවට ලේඛන ගතවෙලා තියෙනවා කියලා සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : මේ සඳහන් වෙන්නේ හිස්බුල්ලා අමාත්‍යවරයාගේ Hira Foundation පදනමේ ඉන්න උප සභාපතිවරයෙක් ගැන?

පි : එහෙමයි. උප සභාපතිවරයා.

ප : ඉන්පසුව නමක් සඳහන් වෙනවා එම්.අයි.රයිසුදීන් කියලා.?

පි : එහෙමයි ස්වාමීනි.

ප : දැන් ඔබට සඳහන් කරන්න පුළුවන්ද C1308A හිරා පදනමේ සාමාජිකයින්ගේ තොරතුරු දැක්වෙන ලේඛනයට අනුව මේ එම්.අයි. රයිසුදීන් කියන පුද්ගලයාට තියෙන්නේ මොන තනතුරුද එහි දැක්වෙන විස්තර මොනවද කියලා?

පි : ඔව් ඒ පුද්ගලයා ස්වාමීනි Administrative Secretary ලෙස ක්‍රියා කරනවා කියලා සඳහන් වෙනවා. Permanent occupation එකක් සඳහන් කරන්නේ නැහැ. ඔහුගේ ලිපිනය කෙන්යා 3, ත්‍රිකුණාමලේ කියලා සඳහන් වෙනවා.

ප : රයිසුදීන් සම්බන්ධයෙන් අසාදුගත වෙච්ච තොරතුරු මොනවද?

පි : මෙම පුද්ගලයා ස්වාමීනි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කරමින් සිට 1989.10.30 දින එම සේවයෙන් පලාගොස් ඇති පුද්ගලයෙකු බව ලේඛනගත වෙලා තියෙනවා රාජ්‍ය බුද්ධි සේවයෙන්.

ප : ගුවන් හමුදාවෙන් පලාගිය පුද්ගලයෙක් කියලා තමයි සඳහන් වෙන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ධම්මික මහත්මයා ඊළඟට සඳහන් වෙන **X623** ලේඛනයේ සඳහන් මේ පුද්ගලයාගේ නම මොකක්ද?

පි : ඒ පුද්ගලයා ස්වාමීනි එච්.එම්.එම්.රෆීක්

ප : එච්.එම්.එම්.රෆීක් කියලා තමයි නම සඳහන් වෙන්නේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : C1308A ලේඛනයට අනුව මේ රෆීක් යන තැනැත්තාගේ තනතුර මොකක්ද?

පි : මෙම පුද්ගලයා Director Cultural Division කියලා සඳහන් වෙනවා ස්වාමීනි මොහුගේ තනතුර Hira Foundation එකේ. මොහු ක්ලිනික් ලේන්, කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙක්.

ප : එතකොට මේ රෆීක් ගැන X623 ලේඛනයට අනුව රාජ්‍ය බුද්ධි අංශය තොරතුරු වාර්තා කරලා තියෙන්නේ මොනවද?

පි : මෙම පුද්ගලයා එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතාගේ පුද්ගලික ලේකම්වරයා වශයෙන් කටයුතු කරලා තියෙනවාලු ස්වාමීනි ඊට අමතරව 1987 වර්ෂයේදී උන්නච්චිය මුස්ලිම් ග්‍රාමයට එල්ල වූ LTTE සංවිධානයේ බලපෑම් හේතුවෙන් එහි සිටි මුස්ලිම් වැසියන් සමඟ ගම අතහැර කාත්තන්කුඩි ප්‍රදේශයට පලාගොස් රෆීඩ්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නමැති ආයුධ සන්නද්ධ කණ්ඩායමට එකතු වී එහි ක්‍රියාකාරකම්වල නිරත වී සිටීම සහ,

ප්‍ර : ඔහු ඒ කියන්නේ රෆීඩ් නමැති ආයුධ සන්නද්ධ කණ්ඩායමක සාමාජිකයෙක්?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : තව මොනවද තියෙන්න?

පි : ඊට අමතරව 2007 වර්ෂයේදී US Aid නමැති සංවිධානය මඟින් කාත්තන්කුඩි නගරයේ බස් නැවතුම් පොලක් ඉදිකිරීම සඳහා ස්ථානයක් වෙන් කිරීමට පැමිණි අවස්ථාවේ මොහුගේ ගිනිඅවියෙන් අහසට වෙඩි තබා නොසන්සුන්තාවයක් ඇති කර එම සංවිධානයේ නිලධාරියෙකුට තර්ජනය කිරීම හා ඔහුට අයත් මෝටර් රථයට දැඩි අලාභ හානි සිදුකර ඇති බව සහ මොහු විසින් නීති විරෝධී අවි ආයුධ රජයට භාර නොදී පරිහරණය කළ බවට තොරතුරු තිබෙනවා කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : නීති විරෝධී අවි ආයුධ රජයට භාර නොදී පරිහරණය කළා කියලත් මේ රෆීක් යන තැනැත්තාට තොරතුරු වාර්තා වෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ධම්මික මහත්මයා ඉන් අනතුරුව තොරතුරු දැක්වෙන පුද්ගලයගේ නම් මොකක්ද?

පි : එම පුද්ගලයා ඊ.එම්.රුස්වින් කියලා හැඳින්වෙනවා ස්වාමීනි.

ප්‍ර : මේ ඊ.එම්. රුස්වින් යන තැනැත්තා C1308A ලේඛනයට අනුව ඔහු ශ්‍රී ලංකා හිරා පදනම යන සංවිධානයේ දරණ තනතුර මොකක්ද?

පි : මොහු සඳහන් වෙනවා ස්වාමීනි Director Finance. අධ්‍යක්ෂක මූල්‍ය ලෙස. මොහු Kattankudy Baticaloa ලිපිනයේ පදිංචි අයෙක් බව සඳහන් වෙනවා.

දැන් වේලාව : ප.ව. 2.35 යි

මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රානී මිය විසින්ය.

President's Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ ධම්මිකා මිය
දැන් වේලාව : ප.ව. 2.35 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : ඒ අනුව X-623 ලේඛනයට අනුව මේ රුස්වින් යන තැනැත්තාට අදාළව දැක්වෙන Black List කරන්නට අවශ්‍ය හේතු මොනවද දැක්වෙන්නේ?

පි : ස්වාමීනි මෙම පුද්ගලයා හිස්බුල්ලා මහතාගේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් කටයුතු කර ඇති බවත්, කාත්තන්කුඩි නගරයේ ඩයලොග් දුරකථන සිම්පත් අලෙවි නියෝජිතයෙකු වශයෙන් ආයතනයක් පවත්වාගෙන ගොස් ඇති බවත්, මඩකලපුව ප්‍රදේශයේ සිට L.T.T.E. බුද්ධි අංශයේ සාමාජිකයෙකුට සිම්පතක් ලබා දීම හේතුවෙන් 2008 වර්ෂයේදී අත්අඩංගුවට පත්ව මාස අටක් පමණ සිරගතව සිටි බවත් ලේඛන ගතවෙලා තියෙනවා කියලා සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඊළඟට තොරතුරු දැක්වෙන පුද්ගලයාගේ නම මොකද්ද ධම්මික මහත්මයා?

පි : මෙම පුද්ගලයා ස්වාමීනි ඒ.එස්.එච්.එම්. අස්වා.

ප්‍ර : ඒ.එස්.එච්.එම් අස්වා යන පුද්ගලයා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔහු සම්බන්ධයෙන් C-1308(a) ලේඛනයට අනුව දැක්වෙන තොරතුරු මොනවාද?

පි : මෙම පුද්ගලයා HIRA Foundation ආයතනයේ Director Social Division සහ මොහුගේ Permanent රැකියාව, ස්ථිර රැකියාව සඳහන් කරලා තියෙනවා Chairman UC කියලා. මොහුත් කාත්තන්කුඩි, මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙක් ස්වාමීනි.

ප්‍ර : දැන් මේ අස්වා සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය X-623 ලේඛනයෙන් මොනවාද සඳහන් කරලා තියෙන්නේ?

පි : මෙම පුද්ගලයා 2000 වර්ෂයේ එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා සමඟ සමීප වෙමින් ප්‍රධාන දේශපාලන අනුගාමිකයෙකු වශයෙන් කටයුතු කර 2000 වර්ෂයේ පළාත්පාලන මැතිවරණයට ඉදිරිපත්ව ඇති බවත්, මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මුජාහිදීන් නැමැති මුස්ලිම් අන්තවාදී ආයුධ සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති බවටත් ලේඛනගත වෙලා තියෙනවා කියලා තියෙනවා ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ අනුව ඔහු මේ මුජාහිදීන් නැමැති ආයුධ සන්නද්ධ සංවිධානයේ සාමාජිකයෙක් වගේම ඔහු දේශපාලන වශයෙන් පළාත්පාලන මැතිවරණයටත් ඉදිරිපත් වෙලා කියලා සඳහන් වෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : තව මොනවද ඔහු ගැන සඳහන් වෙන්නේ?

පි : ඊට අමතරව මෙම සංවිධානයේ සියළු සාමාජිකයන් නැගෙනහිර පළාතේ විවිධ මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් හා ආයුධ සන්නද්ධ කණ්ඩායම්වල සාමාජිකයන් බවත්, පසුකාලීනව මොහොමඩ් හිස්බුල්ලා යන අයගේ රැකවරණය යටතේ දේශපාලන කටයුතුවල නිරත වී ඇති බවටත් ලේඛනගත වෙලා තියෙනවා කියලා සඳහන් වෙනවා ස්වාමීනි මෙම වාර්තාවේ.

ප : ධම්මික මහත්මයා ඔබගේ විමර්ශනවලදී දැන් ඔබ සඳහන් කළානේ මේ හිස්බුල්ලා මහත්මයාගේ ක්‍රියා කලාපයන් ගැන තමයි විමර්ශනය කළේ කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : ඒ අනුව Batticoloa Campus Private Limited කියන සමාගමේ ඊට අදාළ සමාගම් දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරලා තියෙනවද ඊට අදාළ දත්ත මොනවද කියන එක සම්බන්ධයෙන් විමර්ශනය කළාද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : ඔබ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් විමර්ශනය කළාද මේ Batticoloa Campus Private Limited කියන සමාගමේ ලියාපදිංචිය සම්බන්ධයෙන් සහ කවුද අධ්‍යක්ෂවරු, කවුද කොටස්කරුවන් කියන එක සම්බන්ධයෙන් විමර්ශනය කළාද?

පි : නිවැරදියි ස්වාමීනි. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කර, ලේඛන ලබාගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළා ස්වාමීනි.

ප : හරි. ඒ අනුව ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ Batticoloa Campus Private Limited කියන සමාගම කවද්ද සංස්ථාපනය කරලා තියෙන්නේ නැත්නම් Incorporate කරලා තියෙන්නේ කවද්ද කියලා?

පි : මීට සමාන නමක් Batticoloa Campus College Private Limited සමාගම ස්වාමීනි PV-106989 ලෙස 2015.07.14 වන දින ලියාපදිංචි කරලා තියෙනවා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ.

ප : 2015.07.14 වන දින තමයි ලියාපදිංචි කරලා තියෙන්නේ?

Proof Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : නිවැදියි ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ ලියාපදිංචිය සහතික කිරීමේ ලේඛනය ඔබට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : ඔය ලේඛනය පරීක්ෂා කරලා බලන්න?

පි : නිවැරදියි ස්වාමීනි. Batticoloa Campus College Private Limited නැමැති සමාගම 2015.07.14 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලේඛනගත වෙලා තියෙනවා PV-106989 ලෙස.

ප්‍ර : ලියාපදිංචි වෙලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද Batticoloa Campus College Private Limited යන සමාගම ලියාපදිංචිය තහවුරු කිරීමට අදාළ ලේඛනය C-1357 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඊට අමතරව ඔබ හොයලා බැලුවද මේ Batticoloa Campus College Private Limited කියන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරු කවුද කියලා?

පි : එහෙමයි ස්වාමීනි. මෙම සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරුන් එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා සහ අහමඩ් හිරාස් හිස්බුල්ලා ඔහුගේ පුත්‍රයා කටයුතු කරනවා ස්වාමීනි.

ප්‍ර : අහමඩ් හිරාස් හිස්බුල්ලා කියන්නේ ඔබගේ විමර්ශන අනුව හිස්බුල්ලා අමාත්‍යවරයාගේ පුතා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ අධ්‍යක්ෂවරුනේ. මූලික වශයෙන් Batticoloa Campus Private Limited ආයතනයේ Initial Share Holder නැත්නම් මූලික කොටස්කරුවන් වශයෙන් කටයුතු කරලා තියෙන්නේ කවුද?

පි : කොටස්කරුවන් ලෙස කටයුතු කරලා තියෙන්නේ ස්වාමීනි HIRA Foundation එකට මෙම කොටස්වලින් නිකුත් කර ඇති කොටස්වලින් 90,000 ක් හිමිවෙලා තියෙනවා.

ප්‍ර : HIRA Foundation කියලා කිව්වේ යම් Sri Lanka HIRA Foundation කියන සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමාගමද නැත්නම් වෙනත් HIRA Foundation කියන සමාගමක්ද?

පි : HIRA Foundation කියන සමාගම.

Project Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒ HIRA Foundation කියන සමාගමේ Registration අංකයකුත් දැක්වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහි අංකය?

පි : ස්වාමීනි එහි අංකය GA-2991 ලෙස සඳහන් වෙනවා.

ප්‍ර : මේ HIRA Foundation කියන ආරම්භක කොටස් හිමිකරුට කොතරම් Shares නැත්නම් කොටස් තියෙනවද?

පි : HIRA Foundation ආයතනයට කොටස් 90, 000 ක් තියෙනවා.

ප්‍ර : තව කාටද කොටස් තියෙන්නේ?

පි : ඉතිරි කොටස් 10, 000 අහමඩ හිරාස් හිස්බුල්ලා, හිස්බුල්ලා මහතාගේ පුත්‍රයාට හිමි වෙනවා ස්වාමීනි.

ප්‍ර : හිස්බුල්ලා මහත්මයාගේ පුත්‍රයාට කොටස් 10, 000 යි. HIRA Foundation කියන සමාගමට කොටස් 90,000 ක් තියෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි ඒ අනුව Batticoloa Campus ආයතනයට අදාළව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පෝරම අංක 1ට අදාළ ලේඛනය C-1357(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඔබ මෙහි සඳහන් කළේ අධ්‍යක්ෂවරු විදියට ඉන්නේ එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලයි, අහමඩ් හිරාස් හිස්බුල්ලයි?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : හැබැයි මේ වෙනකොට එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා හිටපු ආණ්ඩුකාරතුමාට මෙහි Shares තිබුණේ නැහැ නේ?

පි : නැහැ ස්වාමීනි. හිස්බුල්ලා මහතා 2019.01.14 දින අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වෙනවා.

ප්‍ර : අධ්‍යක්ෂ ධූරයෙන් ඔහු ඉවත් වෙනවා 2019.01.04 වන දින?

පි : එහෙමයි.

ප්‍ර : ඊට අදාළ ලේඛනය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : මූලික අධ්‍යක්ෂවරු දෙන්නෙක් හිටියා හිස්බුල්ලා අමාත්‍යතුමා සහ පුතා. ඊට පස්සේ හිස්බුල්ලා අමාත්‍යතුමා අයින් වෙන්නේ කවද්ද?

පි : 2019.01.04 වෙනිදා.

ප්‍ර : ඊට අදාළ ලේඛන ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්?

පි : එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහත්මයා අධ්‍යක්ෂ ධුරයෙන් Batticoloa Campus සමාගමේ අධ්‍යකත්ෂ ධුරයෙන් ඉවත් වීමට අදාළ ලේඛනය C-1357(b) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : මහත්මයා මේ මොහොමඩ් ලෙබ්බේ ආලිම් හිස්බුල්ලා නැත්නම් හිස්බුල්ලා අමාත්‍යවරයා ඉවත් වෙලා ඒ වෙනුවට තව අධ්‍යක්ෂවරු එදිනම Appoint කරලා තියෙනවාද?

පි : නිවැරදියි ස්වාමීනි. 2019.01.04 වන දින නව අධ්‍යක්ෂවරු හතර දෙනෙක් පත් වෙනවා.

ප්‍ර : කවුද ඒ අධ්‍යක්ෂවරු?

පි : පළවෙනියා එම්.එච්. අහමඩ් හිෆාස් හිස්බුල්ලා.

ප්‍ර : මේ පුද්ගලයා කවුද?

පි : මේ පුද්ගලයා ස්වාමීනි හිස්බුල්ලා මහතාගේ පුත්‍රයෙක් වෙනවා.

ප්‍ර : තවත් පුත්‍රයෙක්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : තව කවුද පත් කරලා තියෙන්නේ?

පි : දෙවෙනියාට මොහොමඩ් සහීබ්ඩීන් මොහොමඩ් ඉක්රාම්. නැවත තුන්වෙනියා අහමඩ් නලීර් මොහොමඩ් ෆවුසර් ජිෆ්රි. හතරවෙනියා මොහොමඩ් රාසික් මොහොමඩ් සුම්රි කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ 2019 ජනවාරී 04 වෙනිදා සිදු වෙච්ච අධ්‍යක්ෂ මණ්ඩල වෙනස?

පි : වෙනස ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ 2019 ජනවාරී 04 සිදු වූ අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීමනේ ඉදිරිපත් කළේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඊට පසුවත් යම්කිසි තව අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීමක් සිද්ධ වෙනවද මේ Batticoloa Campus Private Limited කියන සමාගමේ?

පි : අවස්ථා කිහිපයකදී වෙනස්වීමක් සිදු වෙනවා ස්වාමීනි. 2019.03.08 වෙනිදා සිනි මොහොමඩ් මොහොමඩ් ඉස්මයිල් කියන එක්කෙනෙක් පත් වෙනවා. නැවත එදිනම ටී.ඩී. කමල් ධර්මසිරි තෙන්නකෝන් කියන පුද්ගලයාත් පත් වෙනවා.

ප්‍ර : ඔවුන් දෙදෙනා පත් වෙනවා 2019 මාර්තු 08?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ ලේඛනයට ඔබට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි ඒ අනුව 2019 මාර්තු මාසේ 08 වෙනිදා අධ්‍යක්ෂවරුන් වෙනස්වීමට අදාළ සමාගම් දෙපාර්තමේන්තුවේ පෝරම 20 C-1357(c) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඉන් පස්සේ තවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීමක් සිද්ධ වෙනවද?

පි : නිවැරදියි ස්වාමීනි. නැවත 2019.05.04 වන දින ඉහතින් පත් වූ ධර්මසිරි තෙන්නකෝන් නැමැති පුද්ගලයා අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වෙනවා?

ප්‍ර : ඊට අදාළ ලේඛන ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2019.05.04 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම දැක්වෙන පෝරම අංක 20, C-1357(d) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : තවත් සමාගමේ අධ්‍යක්ෂවරුන් වෙනස්වීමක් පසුවට සිද්ධ වෙනවද?

පි : ඔව්. තවදුරටත් ස්වාමීනි 2019.06.20 වන දින පහත සඳහන් මා විසින් සඳහන් කරන අධ්‍යක්ෂවරුන් ඉවත් වෙනවා සමාගමෙන්. ඒ නිලධාරීන්,

ප්‍ර : දිනය නැවත කියන්න?

පි : 2019.06.20 වන දින.

ප්‍ර : හරි?

පි : ඔවුන් මොහොමඩ් සහාබ්ඩීන් මොහොමඩ් අක්‍රම්, අහමඩ් නීලර් මොහොමඩ් රසූල් ජීෆ්රි, මොහොමඩ් රාසික් මොහොමඩ් සුමෙයිර් සහ අවසාන වශයෙන් සීනි මොහොමඩ් මොහොමඩ් ඉස්මයිල් යන අධ්‍යක්ෂවරුන් 2019.06.20 වන දින අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වෙනවා ස්වාමීනි.

ප්‍ර : 2019.06.20 වන ඔබ නම් සඳහන් කරපු හතර දෙනා අධ්‍යක්ෂ ධුරවලින් ඉවත් වෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි ඒ අනුව 2019.06.20 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම් දැක්වෙන පෝරම අංක 20, C-1357(e) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඒ අනුව මහත්මයා අවසාන වශයෙන් අධ්‍යක්ෂවරු විදියට මේ වෙනකොට ඔබ විමර්ශනය කරන දවස වෙනකොට Batticoloa Campus Private Limited කියන ආයතනයේ ඉන්නේ කවුද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අවසාන වශයෙන් ස්වාමීනි ඉන්නේ හිස්බුල්ලා මහතාගේ පුතුන් දෙදෙනා, අවසාන අධ්‍යක්ෂවරුන් ලෙස ලේඛනවල සඳහන් වෙනවා. ඔවුන් තමයි එම්.එච්.ඒ. හිෆාස් හිස්බුල්ලා සහ එම්.එස්. අහමඩ් හිරාස් හිස්බුල්ලා.

ප්‍ර : ඔහුගේ පුතුන් දෙදෙනා තමයි ඉන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් විමර්ශනය කරගෙන යනකොට ඔබට හොයා ගන්නට පුළුවන් වුණාද මෙම Batticoloa Campus Private Limited සමාගමේ සාංගමික ව්‍යාවස්ථාවලිය අනුව මෙම සමාගමේ Object එක නැත්නම් එම සමාගමේ අරමුණ මොකද්ද කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ අනුව සමාගමේ අරමුණ?

පි : මෙම සමාගමේ අරමුණ 2015.07.14 වන දින සමාගම් ව්‍යවස්ථාවලිය අනුව ඉංග්‍රීසියෙන් සඳහන් වෙනවා ස්වාමීනි To setup a campus college under the public private partnership mode in order to produce middle level technicians with diploma level national vocational qualification in collaboration with Ministry of Youth Affairs and Skills Developments ලෙස.

ප්‍ර : තවත්?

පි : ඊට අමතරව ස්වාමීනි That company doesn't provide the primary and secondary education for children කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබට සාංගමික ව්‍යවස්ථාවලිය ඉදිරිපත් කරන්න පුළුවන් නේද Batticoloa Campus Private Limited ආයතනයේ?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන Batticoloa Campus College Private Limited ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලිය C-1357(f) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : දැන් ඔබ Batticoloa Campus Private Limited කියන ආයතනය ගැන සාක්ෂි ලබාදෙන කොට අපට නිරීක්ෂණය වුණා මෙහි ඉන්නවා Share Holder කෙනෙක් නැත්නම් කොටස්කරුවෙක් HIRA Foundation කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : මේ HIRA Foundation කියන්නේ මොකද්ද කියන එක සම්බන්ධයෙන් විමර්ශනය කළාද?

පි : එහෙමයි ස්වාමීනි විමර්ශනය කළා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද මේ HIRA Foundation කියලා කියන ආයතනය?

පි : මෙම HIRA Foundation Company Limited, HIRA Foundation ලේඛනගත වෙලා තියෙනවා ස්වාමීනි GA-212991 ලෙස 2014.12.10 වෙනි දින. මෙම සමාගම ඇපයෙන් සීමිත සමාගමක් ලෙස Company Limited by Guaranty කියලා සඳහන් වෙනවා ස්වාමීනි ඇපයෙන් සීමිත සමාගමක්. මෙම සමාගමේ ආරම්භක සාමාජිකයන් වන්නේ මොහොමඩ් ලෙබ්බේ අලීම් හිස්බුල්ලා මහතා සහ ඔහුගේ පුත්‍රයා වන අහමඩ් හිරාස් හිස්බුල්ලා මහතායි.

ප්‍ර : මේ සමාගම ඇපයෙන් සීමිත කියන සමාගමක් කියලා ඔබ සඳහන් කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ සමාගම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය තහවුරු කරන ලේඛනය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන HIRA Foundation යන ඇපයෙන් සීමිත සමාගමේ ලියාපදිංචිය තහවුරු කිරීමේ ලේඛනය C-1358 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : මෙම HIRA Foundation කියන ඇපයෙන් සීමිත සමාගම ලියාපදිංචි කරලා තියෙන්නේ 2014...?

පි : 2014.12.10.

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද මෙම HIRA Foundation කියන ඇපයෙන් සීමිත සමාගමේ ආරම්භක සාමාජිකයින් කවුරුන්ද කියලා?

පි : එහෙමයි ස්වාමීනි. ආරම්භක සාමාජිකයන් දෙදෙනෙක් සිටිනවා.

ප්‍ර : කවුද?

පි : පළවෙනි සාමාජිකයා මොහොමඩ් ලෙබ්බේ අලීම් මොහොමඩ් හිස්බුල්ලා මහතා සහ අහමඩ් හිරාස් හිස්බුල්ලා, හිස්බුල්ලා මහතාගේ වැඩිමහල් පුත්‍රයා ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ ලේඛනය ඔබට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

(ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන HIRA Foundation යන සමාගමේ ඇපයෙන් සීමිත සමාගමේ මූලික අධ්‍යක්ෂවරු සහ සාමාජිකයන් දැක්වෙන ලේඛනය C-1358(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ HIRA Foundation කියන ඇපයෙන් සීමිත සමාගමේ පිහිටුවීමේ පරමාර්ථ විදියට එහි සාංගමික ව්‍යවස්ථාවලියේ දැක්වෙන්නේ මොනවද?

පි : එහෙමයි ස්වාමීනි. මෙම සමාගමේ සමාගම් ව්‍යවස්ථාවලියේ අරමුණු ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් වෙනවා. කරුණු හයක් තියෙනවා ස්වාමීනි. පළවෙනි කරුණ To setup a campus college under to the public partnership amount in order to produce middle level technician with diploma level national vocational qualification in collaboration with the Ministry of Youth Affairs and Skills Development කියලා.

ප්‍ර : කියලා පළවෙනි පරමාර්ථය සඳහන් වෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : හිරා පදනමේ දෙවෙනි පරමාර්ථය මොකද්ද?

පි : දෙවෙනි පරමාර්ථය ස්වාමීනි To asset in deferent minutes and means to poor and need to people කියලා සඳහන් වෙනවා.

ප්‍ර : තුන්වෙනි පරමාර්ථය?

පි : තුන්වෙනි පරමාර්ථය Enhancement of Educational and Vocational Training Activity to Youth Children and Youth කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : හතරවෙනි පරමාර්ථය?

පි : හතරවෙනි පරමාර්ථය ස්වාමීනි Engagement to establish water sanitation and health facilities to poor and need to population කියලා සඳහන් වෙනවා.

ප්‍ර : පහ සහ හය සඳහන් කරන්න මහත්මයා?

පි : පහ සහ හය, පස්වෙනි එක Help to develop social and cultural activities in the society හයවෙනි එක Do the relief and rehabilitation activities in case of national disaster & civil comfit කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළව සාංගමික ව්‍යවස්ථාවලිය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද HIRA Foundation යන ආයතනයේ?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන හිරා පදනමේ සාංගමික ව්‍යවස්ථාවලිය C-1358(b) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : මේ HIRA Foundation කියන සමාගමෙනුත් හිස්බුල්ලා අමාත්‍යවරයා යම්කිසි මොහොතක ඉල්ලා අස්වීමක් වෙලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කවද්ද ඉල්ලා අස්වෙලා තියෙන්නේ?

පි : හිස්බුල්ලා මහතා 2018.12.28 වන දින හිරා පදනමෙන් ඉවත් වෙනවා ස්වාමීනි අධ්‍යක්ෂ ධුරයෙන්.

ප්‍ර : ඒ වෙනුවට තව කවුද පත් වෙන්නේ?

පි : එදිනම ස්වාමීනි හිස්බුල්ලා මහතාගේ පුතුන් දෙදෙනා මෙම තනතුරට පත් වෙනවා. පුතුන් දෙදෙනා මොහොමඩ් හිස්බුල්ලා අහමඩ් හිරාස් හිස්බුල්ලා New Director, අනිත් පුත්‍රයා මොහොමඩ් හිස්බුල්ලා අහමඩ් හිරාස්.

ප්‍ර : ඊට අදාළ ලේඛනය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන HIRA Foundation යන ඇපයෙන් සීමිත සමාගමේ අධ්‍යක්ෂවරුන් වෙනස්වීමට අදාළ පෝරමය 20, C-1358(c) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : ධම්මික මහත්මයා දැන් ඔබ කොමිෂන් සභාවට පැහැදිලි කළා Batticoloa Campus Private Limited සහ HIRA Foundation යන සමාගම්වල සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට පුළුවන් වූ තොරතුරු?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ Batticoloa Campus Private Limited යන සමාගමට අදාළව සිදු කරන විමර්ශනයේදී ඔබ හොයලා බැලුවද මේ Batticoloa Campus Private Limited කියන සමාගමට කොහොමද මුදල් ලැබිලා තියෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහොමද ඒගොල්ලන්ට මුදල් ලැබිලා තියෙන්නේ?

පි : මේ සම්බන්ධයෙන් ස්වාමීනි විමර්ශනයක් සිදු කළා. එසේ සිදු කළේ මීට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයෙන්

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

තොරතුරු ලබා ගනිමින්. එහිදී අනාවරණය වුණා මෙම සමාගමට විදේශයන්ගෙන් මුදල් ප්‍රේෂණ ලැබී ඇති බවට.

ප : ඒ අනුව අවස්ථා හතකදී අලි අබ්දුල්ලා අල් ජුෆාලි යන පදනමෙන් රුපියල් බිලියන 3.6 කට ආසන්න මුදලක් ලැබිලා තියෙනවා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : දැන් මේ මුදල සම්බන්ධයෙන් ඔබ විමර්ශනය කරද්දී ඔබට අනාවරණය වුණේ මේ බිලියන 3.6 ක මුදලට ආසන්න මුදල Batticoloa Campus Private Limited කියන ආයතනයට ලැබිලා තියෙන්නේ ණයක් විදියටද නැත්නම් ප්‍රදානයක් විදියටද?

පි : ස්වාමීනි මා සිදු කළ විමර්ශනයේදී හිස්බුල්ලා මහතාගේ ප්‍රකාශයේදී ඔහු සඳහන් කළේ මෙම මුදල් ලැබුණේ පොලී රහිත ණයක් ලෙස. එසේ වුවද ලංකා බැංකුවට ණය ගිවිසුම් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ ස්වාමීනි මෙම ගිණුම් විවෘත කිරීමේදී. ඊට අමතරව ආයෝජන මණ්ඩලයට සඳහන් කරලා තිබුණා හිස්බුල්ලා මහතා මෙම මුදල් පොලී රහිත ණයක් ලෙස ලැබිලා තියෙනවා කියලා. ඊට අමතරව ස්වාමීනි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය අමතමින් ඉදිරිපත් කරන ලද ලිපියක් මගින්ද මෙම ණය ගිවිසුම් යැයි හැඟෙන ලිපි ඉදිරිපත් කරලා තිබුණා ස්වාමීනි විමර්ශනයේදී අනාවරණය වුණා.

ප : ණය කියලා ප්‍රකාශ කරලා තිබ්බද?

පි : ඔව් එහෙමයි ස්වාමීනි.

ප : දැන් මීට අදාළව හිස්බුල්ලා මහතා විසින් යම්කිසි Loan Agreements නැත්නම් ණයවලට අදාළ ඒ ගිවිසුම් ඔබට ලබා දීමක් සිද්ධ කළාද?

පි : ඔහුගේ ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේදී ස්වාමීනි ඔහු ණය ගිවිසුම්, මෙම මුදල් ලබා ගැනීමට අදාළ ණය ගිවිසුම් හතක් ඉදිරිපත් කළා ස්වාමීනි.

ප : හතක් ඉදිරිපත් කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප : දැන් ඔබ සඳහන් මේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවෙනුත් ඔබ වාර්තාවක්, Sectorial Committee පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවෙත් වාර්තාවක් අරන් ඔබ විමර්ශනකය කළා කියලා. දැන් ඒ අධීක්ෂණ ආංශික කාරක සභාවටත් මේ ණය ගිවිසුම් ඉදිරිපත් කරලා තියෙනවද?

FAIR COMMENT — BY JEZEEM —

පි : නිවැරදියි ස්වාමීනි. ඔහු ලබාගත් ලේඛන අනුව ඔහු එම ආංශික කාරක සභාවටත් ණය ගිවිසුම් හයක් ඉදිරිපත් කරලා තිබුණා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට සඳහන් කරන්න පුළුවන්ද ඔබට ඉදිරිපත් කරපු ණය ගිවිසුමුයි, මේ ආංශික කාරක සභාවට ඉදිරිපත් කරපු ණය ගිවිසුමුයි අතර යම්කිසි වෙනසක් තියෙනවද කියලා?

පි : එහෙමයි ස්වාමීනි මම ඒ වෙනස නිරීක්ෂණය කළා ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් මම ලේඛනයකුත් සකස් කළා. මා වෙත ඉදිරිපත් කළ ණය ගිවිසුම්වල ණය ගිවිසුම් අංකයක් තියෙනවා ස්වාමීනි BCSLLASA 20120161 ආදී වශයෙන් ණය ගිවිසුම්වලට අංකයක් යොදලා තිබුණා. එසේ වුවද පාර්ලිමේන්තුවේ කාරක සභාව වෙත ලබා දුන් ණය ගිවිසුම්වල ස්වාමීනි එසේ අංකයක් ලබා දීලා තිබුණේ නැහැ. මා වෙත ලබා දුන් ණය ගිවිසුම්වල Lender ලෙස සඳහන් කරලා තිබුණේ ස්වාමීනි ඒ මුදල් ලබා දුන් පුද්ගලයා ලෙස සඳහන් කරලා තිබුණේ මෙන්න මේ ආකාරයට. ඒ හැම ණය ගිවිසුමකම තියෙනවා On behalf of shake අලි අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity කියලා. ඒ එක්කම Address එකක් සඳහන් වෙනවා ස්වාමීනි ෂෙයික් දිම් අල් ජුෆාලි, P.O. Box 55968, ජෙඩා, සෞදි අරාබියා කියලා. ඒ සෑම ණය ගිවිසුමකම ස්වාමීනි Lender ලෙස මෙම පුද්ගලයාගේ නම සහ Address එක සඳහන් වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ සරළව කිව්වොත් ඔබට ලබා දුන්නු ණය ගිවිසුම් හතේ, ඒ හතේම Lender ලෙස සඳහන් වෙන්නේ ෂෙයික් අලි අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity කියන එක?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඊට සාපේක්ෂව ඔබ බැලුවද Sectorial Committee එක, ආංශික අධීක්ෂණ කාරක සභාවට ලබා දුන් ණය ගිවිසුම් සම්බන්ධයෙන් පරීක්ෂා කරලා බැලුවද? ඒ දෙක සමානයිද වෙනස්ද කියලා ඔබට යමක් ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : නිවැරදියි ස්වාමීනි වෙනස්කමක් තියෙනවා. එම ණය ගිවිසුම්වල තියෙන්නේ ස්වාමීනි ණය ගිවිසුම් දෙහෙක සඳහන් වෙනවා ෂෙයික් අබ්දුල්ලා අල් ජුෆාලි කියනක එක. ඊට අමතරව තවත් ණය ගිවිසුම් හතරක තියෙන්නේ වෙනත් පුද්ගලයින්ගේ නම්.

ප්‍ර : මොනවද ඒ නම්?

පි : එකක් තියෙනවා ස්වාමීනි දෙවෙනි Agreement එකේ ෂෙයික් අල් රෂීඩ් Lender වශයෙන් සඳහන් කරනවා ෂෙයික් අල් රෂීඩ් යහා

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අබ්දුල් අසීස් සෞදි අරාබියා. ඔහුගේ Address එකත් රියාද්. ඒක වෙනස් Address එකක් ස්වාමීනි. අනිත් පුද්ගලයා ෂෙයික් හලිඩ් ඇට් ඩාවුට් අබුෂාලි සෞදි අරාබියාවේ. එයාගේ වෙනස් Address එකක් සඳහන් වෙනවා ස්වාමීනි. තව පුද්ගලයෙක් ඉන්නවා ෂෙයික් ෂෙයික් පෙරාස් නසාර්. ඔහුගේ Address එකත් වෙනස් ස්වාමීනි. සම්පූර්ණයෙන්ම මට ලබා දුන්නා Agreementවල එහෙම සඳහන් වෙන්නේ නැහැ ස්වාමීනි. ඒ වාගේ වෙනස්කම් තුනක් තියෙනවා ස්වාමීනි.

ප : ණය ගිවිසුම් හතරක වෙනස්කම් දක්නට ලැබෙනවාද?

පි : ණය ගිවිසුම් තුනක ස්වාමීනි.

ප : වෙනස්කම් දක්නට ලැබෙනවා. ඔබට ඉදිරිපත් කරපු ණය ගිවිසුම්, ඔබට ගරු කොමිෂන් සභාව වෙත නැවත ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : හිස්බුල්ලා මහතා විසින් ප්‍රකාශයක් ලබා දෙමින් ඔබට ඉදිරිපත් කළ ණය ගිවිසුම්?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : ධම්මික මහත්මයා 2016.03.01 දිනැති ණය ගිවිසුමක් ඔබට ඉදිරිපත් කළාද? 2016 මාර්තු 01 වෙනිදා දිනැති?

පි : 2016.02.15 ස්වාමීනි 2016/01 නැමැති ණය ගිවිසුමක් ඉදිරිපත් කළා.

ප : ඒ ගිවිසුම ඇති වෙලා තියෙන්නේ Batticoloa Campus Private Limited සහ ෂෙයික් අලි අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity එක අතර කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : ඒ Loan Agreement එකට අනුව ඒ ණය ගිවිසුමට අනුව USD, US Dollars හාර මිලියන 815,392 ක් කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු වෙත එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා ඉදිරිපත් කරන ලද 2016.03.01 දිනැති ණය ගිවිසුම C-1359 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප : තවත් ණය ගිවිසුමක් ඔහු ඉදිරිපත් කළාද 2016.05.01 දිනැතිව?

පි : එහෙමයි ස්වාමීනි. නිවැරදියි ස්වාමීනි.

ප : ඒ ණය ගිවිසුම ඇතිවෙලා තියෙන්නේ කුමන පාර්ශවයන් දෙක අතරද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity සමඟ.

ප්‍ර : කොපමණ මුදලකටද මේ ගිවිසුම, ණය ගිවිසුම ඇතුළත් වෙලා තියෙන්නේ දෙපාර්ශවය?

පි : 3.863771

ප්‍ර : මුදලකට තමයි ඇතුළත් වෙලා තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2016.05.01 දිනැති ණය ගිවිසුම C-1360 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : ඊට පස්සේ දැන් මේ අපි හිස්බුල්ලා මහතා ලබා දුන් ණය ගිවිසුම් දෙකක් ලකුණු කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : තවත් ණය ගිවිසුම් ලබා දුන්නා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : 2016.08.01 දිනැති අගෝස්තු 01 දිනැති ණය ගිවිසුමක් ඔබට ලබා දුන්නා කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ණය ගිවිසුම ඇති වෙලා තියෙන පාර්ශවයන් දෙක මොනාවද?

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි සහ හිස්බුල්ලා මහතා අතර ස්වාමීනි.

ප්‍ර : Batticoloa Campus Private Limited?

පි : එහෙමයි.

ප්‍ර : එම Charity එකත්, Batticoloa Campus Sri Lanka යන ආයතනයත් අතර තමයි ගිවිසුම ඇති වෙලා තියෙන්නේ. හරිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ගිවිසුමේ ඇති වෙච්ච දිනය වශයෙන් සඳහන් වෙනවා Effective date එක 2016 අගෝස්තු 01 වෙනිදා කියලා?

පි : ඔව්.

ප්‍ර : ණය මුදල වශයෙන් සඳහන් වෙන්නේ?

පි : මිලියන 3.611600 ශත 48

ප්‍ර : වශයෙන් සඳහන් වෙනවා.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ලේඛනය C-1361 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : හිස්බුල්ලා අමාත්‍යවරයා විසින් තවත් ණය ගිවිසුමක් ඔබට ලබා දුන්නාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ ණය ගිවිසුම ඇති වෙලා තියෙන්නේ කුමන පාර්ශව දෙක අතරද?

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation සහ Batticoloa Campus Sri Lanka ආයතන අතර.

ප්‍ර : ඒ Loan එකේ Effective Date එක විදියට, ණය ගිවිසුමේ ක්‍රියාකාරී දවස විදියට සඳහන් වෙන්නේ කවද්ද?

පි : 2016 ඔක්තෝම්බර් 01 වෙනිදා.

ප්‍ර : කොතරම් මුදලකටද මේ ණය ගිවිසුම දීලා තියෙන්නේ?

පි : 2.897794 ශත 50

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ණය ගිවිසුම C-1362 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

(තවත් ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා)

ප්‍ර : මේක පරීක්ෂා කරලා බලන්න මහත්මයා. මෙම ණය ගිවිසුම ඇති වෙලා තියෙන්නේ කුමන පාර්ශව දෙක අතරද?

පි : එම ඉහත පාර්ශව සමඟම තමයි ස්වාමීනි අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity සමාගම සහ Batticoloa Campus පුද්ගලික සමාගම අතර.

ප්‍ර : ඒ අනුව එම ණය ගිවිසුමේ Effective Date එක විදියට තියෙන්නේ කවද්ද? 2017 ජනවාරී 01 වෙනිදා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි. 2017 ජනවාරී 01 වෙනිදා.

ප්‍ර : එම ණය ගිවිසුමට අදාළ ණයට ලබා දුන් මුදල වශයෙන් කොච්චර කීයක් දැක්වෙනවද?

පි : 3.611600 ශත 40

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ලේඛනය C-1363 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

(තවත් ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා)

ප්‍ර : දැන් මෙම ණය ගිවිසුම කවුද ඔබට ඉදිරිපත් කළේ?

පි : මෙම ණය ගිවිසුම් සියල්ල ඉදිරිපත් කළේ ස්වාමීනි හිස්බුල්ලා මහත්මයා.

ප්‍ර : හිස්බුල්ලා මහත්මයා ඔහුගේ ප්‍රකාශය ලබාදෙන කොට ඉදිරිපත් කළා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ ණය ගිවිසුම තියෙන්නේ කුමන පාර්ශව දෙක අතරද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation සහ Batticoloa Campus පුද්ගලික සමාගම අතර.

ප්‍ර : ඒ අනුව මෙම ණය ගිවිසුමේ Effective Date එක විදියට කවද්ද තියෙන්නේ?

පි : 2017 මාර්තු 01 ස්වාමීනි.

ප්‍ර : කොපමණ මුදලක් ණය වශයෙන් මේ ණය ගිවිසුම් ප්‍රකාරව ලබා දීලා තියෙනවද?

පි : 2.897794 ශත 50 ස්වාමීනි.

ප්‍ර : US Dollars?

පි : US Dollars ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ණය ගිවිසුම C-1364 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

(සාක්ෂිකරුට තවත් ලේඛනයක් පෙන්වා සිටිනවා)

ප්‍ර : මේ හත්වන නැත්නම් අවසානයට ලබා දුන් ණය ගිවිසුම කිව්වොත් හරි?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ ණය ගිවිසුම කුමන පාර්ශවයන් දෙක අතරද ඇති වෙලා තියෙන්නේ?

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity සමාගම සහ Batticoloa Campus Sri Lanka සමාගම අතර ස්වාමීනි.

ප්‍ර : කවදා ඉඳන්ද මේ ණය ගිවිසුමේ Effective Date එක විදියට තියෙන්නේ?

පි : 2017 ජූනි 01 වෙනි දින සිට.

ප්‍ර : කොපමණ මුදල් ප්‍රමාණයක් ණය වශයෙන් ලබා දීලා තියෙනවද?

පි : 2.94844680 USD ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙ ලේඛනය C-1365 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : දැන් මීට සමගාමීව ඔබ සඳහන් කළා පාර්ලිමේන්තුවේ ආංශික කාරක සභාවේ ඉදිරිපත් කරපු වාර්තාවත් ඔබ සළකා බැලුවා කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ පාර්ලිමේන්තුවෙන් ලබාගත් ආංශික කාරක සභා වාර්තාව ඔබට මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි ඒ අනුව සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ Batticoloa Campus Private Limited ආයතනය සම්බන්ධ නිරීක්ෂණ වාර්තාව කාරක සභාවේ සභාපති මහාචාර්ය ආංශු මාරසිංහ මහතා විසින් 2019 ජුනි 21 දින නිකුත් කරන ලද එම වාර්තාව C-1366 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : දැන් මේ C-1366 වශයෙන් ඔබ ලබා ගත් ආංශික කාරක සභා වාර්තාවෙත් හිස්බුල්ලා මහතා විසින් එම කාරක සභාවට ඉදිරිපත් කරන ලද ණය ගිවිසුම් දැක්වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි දැක්වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔහු ඉදිරිපත් කරන ලද 2016 මාර්තු 01 දිනැති ණය ගිවිසුම ඔබට ගොනුවෙන් පෙන්වන්න පුළුවන්ද?

පි : පෙන්වා දිය හැකියි ස්වාමීනි 2016 මාර්තු 01 වෙනි දින ණය ගිවිසුම.

ප්‍ර : එතකොට මේ 2016 මාර්තු 01 වෙනි දිනැතිව ආංශික කාරක සභාවට ඉදිරිපත් කරපු වාර්තාවයි, ඔබට ඉදිරිපත් කරන ලද 2016 මාර්තු 01 දිනැති C-1359 ලේඛනයයි අතර වෙනසක් තියෙනවාද නැද්ද?

පි : ස්වාමීනි මෙම ණය ගිවිසුමේ අංකයක් Agreement ණය ගිවිසුම් අංකයක් සඳහන් වෙන්නේ නැහැ ස්වාමීනි. මා වෙත ලබා දුන් ණය ගිවිසුම්වල අංකයක් සඳහන් වෙනවා.

ප්‍ර : හැම ණය ගිවිසුම්, ඔබට ලබා දුන් ණය ගිවිසුම් හතේම මුල් පිටුවේ අංකයක් සඳහන් වෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ පාර්ලිමේන්තුවට ලබා දුන් ණය ගිවිසුම්වල එකකවත් අංකයක් සඳහන් වෙන්නේ නැහැ?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඊට අමතරව මම අහන්නේ දැන් ඔය 2016 මාර්තු 01 වෙනි දිනැතිව ඉදිරිපත් කරපු ණය ගිවිසුමේ ණය ලබා දෙන පාර්ශවයන් සහ ලබා දුන් ණය ප්‍රමාණය ගත්තොත් ඔබට ලබා දුන් එකයි මේ ගිවිසුමයි අතර යම්කිසි වෙනසක් තියෙනවද?

පි : වෙනසක් තිබුණා ස්වාමීනි ගිවිසුම් තුනක වෙනසක් මට නිරීක්ෂණය..,

ප්‍ර : මම අහන්නේ මෙම ගිවිසුමේ?

පි : මෙම ගිවිසුමේ වෙනසක් නැහැ ස්වාමීනි. එසේ වුවත් මෙම ගිවිසුමේ ගිවිසුම් අංකයක් නැහැ.

ප්‍ර : ඒක තමයි වෙනස?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : ඔව්.

ප්‍ර : නමුත් ණය මුදල සහ ණය ලබාදෙන Party එක නැත්නම් Lending Party එක අතර වෙනසක් නැහැ?

පි : වෙනසක් නැහැ ස්වාමීනි.

(ස්වාමීනි මෙම පාර්ලිමේන්තු ආංශික කාරක සභාවේ වාර්තාවේ ඇති 2016.03.01 දිනැතිව ඇති ණය ගිවිසුම C-1359(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : පාර්ලිමේන්තු ආංශික කාරක සභාවට ඉදිරිපත් කරපු 2016.05.01 දිනැති ණය ගිවිසුම ඔය C-1366 ලේඛනයේ තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි 2016.05.01 ණය ගිවිසුම ඉදිරිපත් කරන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : දැන් මේ ගිවිසුම ඇති වෙලා තියෙන පාර්ශවයන් දෙක මොකද්ද?

පි : මෙම ගිවිසුමේ ස්වාමීනි මා වෙත ලබා දුන් ගිවිසුම් හා සාපේක්ෂව ගිවිසුම් අංකයක් සඳහන් වෙන්නේ නැහැ. ණය දුන් පාර්ශවය ලෙස Lender ලෙස සඳහන් වෙන්නේ මටද ලබා දුන් ගිවිසුම්වල සඳහන් වෙන්නේ අල් ජුෆාලි කියන පුද්ගලයා Charity ආයතනයෙන් කියලා. නමුත් මෙම ගිවිසුමේ තියෙන්නේ ස්වාමීනි වෙනත් පුද්ගලයෙක්ගේ නමක්.

ප්‍ර : මොකද්ද ඒ නම?

පි : ඔහුගේ නම ෂෙයික් අලීඩ් ඇට් ඩෙවිට් අබු සලේ කියලා සඳහන් වෙනවා. ඔහුගේ ලිපිනයත් සඳහන් වෙනවා ස්වාමීනි රියාද් නගරයේ ලිපිනයක්.

ප්‍ර : ඒ කියන්නේ මෙම ගිවිසුමයි 2016.05.01 දිනැතිව ඔබට ලබා දුන්න C-1360 කියන ගිවිසුමයි, මේ පාර්ලිමේන්තු ආංශික කාරක සභාවට ලබා දුන්නු ණය ගිවිසුමයි ණය ලබා දුන් පාර්ශවයේ ඉඳන්ම ලොකු වෙනසක් තියෙනවා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි මෙම ගිවිසුම C-1360(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මහත්මයාට ඔය ලේඛනයෙන් පෙන්වන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට 2016.08.01 දිනැති ණය ගිවිසුම?

පි : එහෙමයි ස්වාමීනි. 2016 අගෝස්තු 01 වෙනි දින.

ප්‍ර : එම ණය ගිවිසුම ඇති වෙලා තිබෙන්නේ කුමන පාර්ශවයන් දෙක අතරද?

FAIR COMMENT BY JEZEEM

පි : එම ණය ගිවිසුමේ ස්වාමීනි Lenderගේ නම සඳහන් වෙන්නෙත් ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation කියලා. ණය ලබා ගත් පුද්ගලයා Batticoloa Campus Private Limited කියලා සඳහන් වෙනවා. ඒකේ වෙනසක් සඳහන් වෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ඉදිරිපත් කරපු C-1361 යි මෙම ලේඛනයයි අතර ණය දෙන පාර්ශවයන් අතින් ගත්තොත් වෙනසක් ඇති වෙන්නේ නැහැ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : සහ ඒ ණය මුදල අතින් ගත්තත් ඒත් සමානයි කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි මෙම ලේඛනය C-1361(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඔබට 2016 ඔක්තෝම්බර් මස 01 වෙනි දිනැති ණය ගිවිසුමක් පාර්ලිමේන්තු ආංශික කාරක සභා වාර්තාවෙන් පෙන්වා සිටින්න පුළුවන්ද?

පි : නිවැරදියි ස්වාමීනි 2016 ඔක්තෝම්බර් 01 වෙනි දින.

ප්‍ර : දැන් මෙම 2016 ඔක්තෝම්බර් 01 වෙනි දිනැති ලේඛනයයි, ඔබට ලබා දුන් 2016 ඔක්තෝම්බර් 01 වෙනි දිනැති C-1362 ලේඛනයයි අතර වෙනසක් තියෙනවද?

පි : වෙනසක් නිරීක්ෂණය වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද වෙනස?

පි : වෙනස ස්වාමීනි මෙහි Lender ලෙස සඳහන් වන්නේ ෂෙයික් අල් රෂීඩ් යාහයා අබ්දුල් අසීස් කියන පුද්ගලයා. ඔහුගේ රියාද් නගරයේ ලිපිනයක් සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබට ලබා දුන් ලේඛනයේ මොකද්ද දැක්වෙන්නේ?

පි : මට ලබා දුන් ලේඛනයේ ස්වාමීනි එහෙම වෙනසක් නැහැ. එතන සඳහන් වෙන්නේ ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation වෙතින් ලබා දුන් බවක් තමයි සඳහන් වෙන්නේ ස්වාමීනි Lender ලෙස.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ලේඛනය C-1362(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඔබට පෙන්වා දෙන්න පුළුවන්ද ඔය වාර්තාවෙන් 2017.03.01 දිනැති ණය ගිවිසුම?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 2017.03.01 ස්වාමීනි.

ප්‍ර : එම ණය ගිවිසුම සහ ඔබට ඒ දිනැතිවම ලබා දුන්න C-1364 ගිවිසුමෙයි මේකෙයි වෙනස මොකද්ද?

පි : ස්වාමීනි මෙම ගිවිසුමේත් ණය ලබා දෙන්නා වෙනස් පුද්ගලයෙක් ෂෙයික් ෆරාස් නසාර් කියලා පුද්ගලයෙක් ලෙස සඳහන් වෙනවා. ඔහුගේ ජෙඩ්ඩා නගරයේ ලිපිනයක් සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබට ලබා දුන් C-1364 තියෙන්නේ කවුරු කවුරු අතර ගිවිසුමක් කියලාද?

පි : ෂෙයික් අල් අබ්දුල්ලා අල් ජුෆාලි Foundation Charity අතර කියලා.

ප්‍ර : සහ Batticoloa Campus අතර?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : හැබැයි ඒ දෙකේම ණය දීපු Amount එක සමානයි කිව්වොත් හරිනේ?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද 2017.03.01 දිනැති ආංශික කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද ණය ගිවිසුම C-1364(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඔබට ඔය වාර්තාවෙන් පෙන්වන්න පුළුවන්ද 2017.06.01 දිනැති ණය ගිවිසුම?

පි : එහෙමයි ස්වාමීනි 2017.06.01 වන ණය ගිවිසුම පෙන්වා දිය හැකියි ස්වාමීනි.

ප්‍ර : එම ණය ගිවිසුමයි, ඔබට 2017.06.01 දිනැතිව ඉදිරිපත් කරන ලද C-1365 ගිවිසුමයි අතර යම්කිසි වෙනස්කමක් තියෙනවද?

පි : වෙනස්කමක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ වෙනස්කම?

පි : කාරක සභාව වෙත ලබා දුන් ණය ගිවිසුමේ නම සඳහන් වෙන්නේ ෂෙයික් ඩොක්ටර් අයිමාන් අල් ජුෆාලි සෞදි අරාබියා ලෙස. ඔහුගේ ලිපිනය සඳහන් වෙනවා ස්වාමීනි ජෙඩ්ඩා නගරයේ ලිපිනයක්.

ප්‍ර : ඔබට ලබා දුන් ලේඛනයේ?

පි : මට ලබා දුන් ලේඛනයේ සඳහන් වෙන්නේ ස්වාමීනි අල් ජුෆාලි Foundation Charity කියලා.

ප්‍ර : අල් ජුෆාලි Foundation Charity කියලා තමයි සඳහන් වෙන්නේ?

පි : නිවැරදියි ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි ඊට අදාළ ආංශික කාරක සභාවට ඉදිරිපත් කරන ලද ණය ගිවිසුම C-1365(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප : තවදුරටත් මහත්මයා ආංශික කාරක සභාවට ඉදිරිපත් කරලා තියෙන ණය ගිවිසුම් හයයි කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : 2017 ජනවාරී 01 වෙනි දිනැති ණය ගිවිසුම ඔබට ඉදිරිපත් කළත් ඊට අදාළව ආංශික කාරක සභාවට ඉදිරිපත් කරලා ඔය වාර්තාවේ නැහැ කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි. වාර්තාව ලබා දීලා තියෙන්නේ ණය ගිවිසුම් හයක් පමණයි.

ප : ඔබ විමර්ශනය කරනකොට හිස්බුල්ලා මහත්මයාගෙන් ඔබ මෙහි මෙම ණය ගිවිසුම්වල Originals නැත්නම් සත්‍ය පිටපත් ලබා ගැනීමට උත්සාහ කළේ නැද්ද?

පි : උත්සාහ කළා ස්වාමීනි.

ප : සාර්ථක වුණාද?

පි : සාර්ථක වුණේ නැහැ ස්වාමීනි ඔහු සත්‍ය පිටපත් නොමැති බව තමයි සඳහන් කළේ.

ප : සත්‍ය පිටපත්, මුල් පිටපත්?

පි : විමසීමක් කළා ස්වාමීනි. සත්‍ය පිටපත් සහ මුල් පිටපත්, මුල් පිටපත් ලබාදෙන ලෙස, ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කළා. නමුත් ඔහු ඉදිරිපත් කළේ නැහැ ස්වාමීනි.

දැන් වේලාව ප.ව. 3.35 යි
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.03.35 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණි මිය
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ඔබට එතකොට අනාවරණය වූ විදිහට ඔබට දීපු ණය ගිවිසුම් හත ප්‍රකාරව ඔහු සඳහන් කළාද මේ රුපියල් බිලියන 3.6 කට ආසන්න මුදල ලැබුණේ ඒ ණය ගිවිසුම් හත ප්‍රකාරව කියලා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : දැන් මෙසේ ලබා ගත්ත මුදල් Batticaloa Campus Private Limited කියන ආයතනය කොහොමද වියදම් කරලා තියෙන්නේ කියලා ඔබ විමර්ශනය කරලා බැලුවද?

පි : විමර්ශනය කරලා බැලුවා ස්වාමිනි.

ප්‍ර : මොනවද ඔබට ඒ සම්බන්ධයෙන් අනාවරණය වුණේ?

පි : මෙම මුදල් වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් ලේඛන ඉදිරිපත් කරන ලෙස හිස්බුල්ල මහතාගෙන් ඉල්ලා සිටියා ස්වාමිනි. විමර්ශනය කරනවා නම් මෙම මුදල් වියදම් වූ ආකාරය ඉතා දීර්ඝ විමර්ශනයක් සිදු කළ යුතුයි. සත්‍යතාවය අනාවරණය කර ගන්න. ඔහු ලබා දුන්නා ස්වාමිනි මේ Batticaloa Campus Private Limited ආයතනයේ Financial Statement එකක්. ඒක 2020 මාර්තු 31 වෙනි දින. එම මූල්‍ය වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි මේ Batticaloa Campus එකේ non-current assets යටතේ Batticaloa Campus ආයතනය ගොඩනැගීමට Building under construction කියලා මිලියන 3454 යි 729,243 ක මුදලක් වැය වෙලා තියෙනවා කියලා.

ප්‍ර : නැවත කියන්න ඒ ප්‍රමාණය?

පි : මිලියන 3454 යි නමසිය පනස්හය ලක්ෂ නමසිය පනස් අටක මුදලක්.

ප්‍ර : බිල්ඩිම සෑදීම සඳහා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට විමර්ශනයේදී අනාවරණය වුණාද Building materials ගෙන්වන්න කොච්චර මුදල් වියදම් කරලා තියෙනවද කියලා මේ ගිණුමෙන්?

පි : ස්වාමිනි Property and plant and equipment කියලා තවත් මිලියන 205 ලක්ෂ 195 යි 43 ක මුදලක් වැය වෙලා කියලා සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙහි මෙම Batticaloa Campus Private Limited කියන ආයතනය ගොඩනඟන්න නැත්නම් Construction එක කරන්න කරගෙන ගිහිල්ලා තියෙන්නේ කවුරු කියලද ඔබට අනාවරණය වුණේ?

පි : මෙහි සඳහන් ස්වාමිනි මට අනාවරණය වුණා මේ සඳහා සමාගමක් පිහිටුවලා තියෙනවා. ඒ සමාගමේ හිමිකාරත්වයත් යන්නේ හිස්බුල්ලා මහතාගේ පුතාට. Serendib Construction කියලා සමාගමක් ස්වාමිනි.

ප්‍ර : Serendib Construction Private Limited කියන ආයතනයෙන්ම තමයි මේ Batticaloa Campus ආයතනයේ ඉදිකිරීම් සිද්ධ කරලා තියෙන්නේ. ඒකත් කාට අයිති සමාගමක්ද?

පි : එම සමාගම ස්වාමිනි හිස්බුල්ලා මහතාගේ පුතාට හිමිව තිබෙනවා කියලා මට නිරීක්ෂණය වුණා ස්වාමිනි.

ප්‍ර : දැන් මං ඔබගේ අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත. ඔබගේ විමර්ශන අනුව ඔබ සොයා බැලුවද Batticaloa Campus Private Limited ආයතනය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර යම් යම් ගිවිසුම්වලට එළඹිලා තියෙනවද ඔවුන් අතර යම්කිසි ලිපි හුවමාරුවක් සිද්ධ වෙලා තියෙනවද කියලා ඔබ විමර්ශනය කරලා බැලුවද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබට මොනවද අනාවරණය වෙන්නේ?

පි : ප්‍රථමයෙන් අනාවරණය වුණා ස්වාමිනි BOI ආයෝජන මණ්ඩලයට හිස්බුල්ලා මහතා ඉදිරිපත් කරපු ලේඛනයක් සම්බන්ධයෙන්. ලේඛනයක් කිව්වට ස්වාමිනි එය අයදුම්පත්‍රයක්. කොළඹ 08, වැව පාර, අංක 10/18 දරණ ලිපිනයේ පිහිටි හීරා Foundation ආයතනයේ එම ලිපිනයේ පදිංචි හිස්බුල්ලා මහතා විසින් මූලිකව ඇමරිකානු ඩොලර් 4.5 ක මූලික ආයෝජනයක් සහිතව මඩකලපුව පූනානි හි උසස් අධ්‍යාපන ආයතනයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු අක්කර 35 ක භූමියක පිහිටුවීමට අවසර ඉල්ලා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙනවා ස්වාමිනි ආයෝජන මණ්ඩලය වෙත.

ප්‍ර : ඔබ ඔය සඳහන් කරන්නට යෙදුණු හිස්බුල්ලා අමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද ඒ ආයෝජන මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ආවරණ ලිපිය ඔබට පෙන්වා දෙන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි ඒ අනුව 2016/06/12 දිනැතිව හීරා Foundation යන ආයතනය විසින් හිස්බුල්ලා මහත්මයා අත්සන් කරලා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂක

FAIR COMMENT — BY JEZEEM —

ජනරාල් වෙත යොමු කරන ලද ආවරණ ලිපිය C 1368 ලෙසත්, ඊට අදාළව ඔහු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතෙහි ඇමුණුම C 1368 (A) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : ඉන් අනතුරුව ඔබට මොනවද මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අනාවරණය වුණේ?

පි : මෙම අයදුම්පත්‍රයේ ස්වාමිනි පරීක්ෂා කිරීමේදී එහි ආයෝජන සැලැස්මක් තිබුණා. ඒ ආයෝජන සැලැස්මේ සඳහන් වුණා ව්‍යාපෘති සඳහා මූලිකව ඇමරිකානු ඩොලර් 45.75 ක ආයෝජනයක් සිදු කිරීමට යෝජනා කරන බව. පසුව එම යෝජනාව මේ ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 4.75 දක්වා වෙනස් කරලා තිබුණා ස්වාමිනි.

ප : සංශෝධනය කිරීමක්?

පි : සංශෝධනය කිරීමක් තිබුණා ස්වාමිනි. එම ආයෝජන සැලැස්මේ ස්වාමිනි මෙම ව්‍යාපෘතිය සඳහා පහත මං සඳහන් කරන අධ්‍යාපන පීඨ ආරම්භ කිරීමට යෝජනා කරලා තිබුණා ස්වාමිනි.

ප : ඔහු ඒ කියන්නේ මේ ආයෝජන මණ්ඩලයට දෙන ඔහුගේ අයදුම්පත්‍රයේ යෝජනා කරනවා යම් යම් විවෘත කිරීමට බලාපොරොත්තු වන Faculties නැත්නම් විවිධ පීඨ මොනවද කියලා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප : ඒ අනුව මොනවද ඔහු බලාපොරොත්තු වෙන විවෘත කිරීමට බලාපොරොත්තු වෙන ඒ අදාළ පීඨයන්?

පි : එම පීඨයන් ලේඛනයේ සඳහන් වෙලා තිබුණේ ස්වාමිනි කෘෂිකර්මාන්තය Agriculture, දෙවෙනියට තිබුණා engineering, Islamic studies කියලා තියෙනවා ස්වාමිනි. Tourism සහ Health care studies යනුවෙන් සඳහන් කරලා තිබුණා එම පීඨවල නම්.

ප : හරි ඊට අමතරව ඔහුගේ තියෙන Infrastructure නැත්නම් ගොඩනැඟිලි සම්බන්ධයෙනුත් ඔය අයදුම් පත්‍රයේ සඳහන් වෙලා තියෙනවද?

පි : නිවැරදියි ස්වාමිනි. ඔවුන් අපේක්ෂා කරන ආරම්භ කිරීමට ඉදිකිරීමට අපේක්ෂා කරන බිල්ඩින් ලෙස සඳහන් වෙලා තියෙන්නේ ස්වාමිනි Administration Building එකක්, Library

ප : පුස්තකාලයක්?

පි : Auditorium, Staff Hostel

ප : Staff Hostel

FAIR COMMENT BY JEZEEM

පි : Student Hostel, Swimming pool සහ ක්‍රීඩාංගනයක් Play ground කියලා සඳහන් වෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ආයෝජන මණ්ඩලය මෙම ලබා දීපු හීරා Foundation යන නමින් තමයි මුලින්ම මේ අයදුම්පත්‍රය ලබා දුන්නේ. ආයෝජන මණ්ඩලය මෙම අයදුම්පත්‍රය MOHE එකට නැත්නම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කවද්ද යොමු කරන්නේ?

පි : 2015/08/03 වෙනි දින ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂකවරයෙක් විසින් එවකට පැවැති Ministry of උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය වෙත යොමු කරනවා ස්වාමිනි.

ස්වාමිනි මීට ප්‍රථමයෙන් මා ලකුණු කරන ලද ආයෝජන මණ්ඩලයට ඉදිරිපත් කරන ලද 2016/06/12 දිනැති ආවරණ ලිපියට දෙන ලද ලකුණු කිරීම C 1368 යන්න කපා ඉවත් කරන ලෙසත්, එය C 1367 වශයෙන් වෙනස් කිරීමට අවසර දෙන ලෙසත් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඊට අමතරව ස්වාමිනි C 1367 ලේඛනයට තව ඇමුණුමක් තියෙනවා. එය C 1367 (A) වශයෙන් ලකුණු කිරීමට අවසර දෙන ලෙසත් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසර ලබා දෙනවා.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ඔබ සඳහන් කළා දැන් සාක්ෂි ලබා දෙමින් මහත්මයා BOI එකට දීපු Proposal එක නැත්නම් යෝජනාව Ministry of higher Education උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරලා තියෙනවා ආයෝජන මණ්ඩලය විසින් කියලා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : කවද්ද යොමු කරලා තියෙන්නේ?

පි : 2015/08/03 වෙනි දින ස්වාමිනි.

ප්‍ර : ඒ යොමු කරපු ලිපිය ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන 2015/08/03 දිනැති ආයෝජන මණ්ඩලය විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද ලිපිය C 1368 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප්‍ර : දැන් මේ C 1368 කියන ඉල්ලීමට ප්‍රකාරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිලා තියෙන පිළිතුර response එක මොකක්ද මහත්මයා?

පි : ස්වාමිනි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලිපියක් එවලා තියෙනවා නැවත ආයෝජන මණ්ඩලය වෙත. එම ලිපිය ඉංග්‍රීසියෙන් තියෙනවා ස්වාමිනි. කියවන්න පුළුවන්. This has refers to your letter dated 2015.08.03 as for the proposal perused along with your letter the following ware observed Number 01: The objective of the article of association of Batticaloa Campus offering any degree programs. Second Number: The Application for site approval has been mention as site for training institute project. Therefore this proposal does not come under purview of the ministry of higher education කියලා සඳහන් කරලා තියෙනවා ස්වාමිනි එම ලිපියේ.

ප්‍ර : ඒ කියන්නේ එම අයදුම්පත්‍රයේ උපාධි ප්‍රධානෝත්සවයක් ගැන සඳහන් වෙන්නේ නැති නිසා ඔවුන් සඳහන් කරනවා ඔවුන්ට සරලව කියනවා නම් විරුද්ධත්වයක් නෑ කියන ස්ථාවරය තියෙනවද?

පි : Therefore this proposal does not come under purview of the Ministry of Higher Education

ප්‍ර : ඔවුන්ගේ විෂය පථයට වැටෙන්නේ නෑ කියලා තමයි සඳහන් වෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය ලිපියේ දිනය කවද්ද මහත්මයා?

පි : 2015/11/18 ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන 2015/11/18 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආයෝජන මණ්ඩලයට එවන ලද ලිපිය C 1369 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර : දැන් ඒ අනුව මහත්මයා අවසාන වශයෙන් ආයෝජන මණ්ඩලය සහ Batticaloa Campus Private Limited කියන ආයතන අතර යම්කිසි ගිවිසුමක් ඇති වෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි. 2016 අංක 02 දරණ ආයෝජන මණ්ඩල රෙගුලාසිවල ප්‍රතිපාදන අනුව ස්වාමිනි ආයෝජන මණ්ඩලය මෙම ව්‍යාපෘතියට 2016/01/12 වෙනි දින අනුමැතිය ලබා දෙනවා. හැබැයි එසේ අනුමැතිය ලබා දෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා උපාධි ලබා දෙන තත්ත්වය සඳහා පසුකාලීන අනුමැතිය ලබා ගන්න ඕනී.

ප්‍ර : කියන කොන්දේසියක් ඉදිරිපත් කරලා තියෙනවද?

පි : කොන්දේසියක් ඉදිරිපත් කරලා ස්වාමිනි.

ප්‍ර : තව මොනවා හරි කොන්දේසියක් තියෙනවද?

පි : ඊට අමතරව පිළිගත් විදේශ විශ්ව විද්‍යාලයකට අනුබද්ධ වීමෙන් පසුව උපාධි ලබා දෙන බවට විශේෂ කොන්දේසියකට යටත්ව තමයි මේ ආයෝජන මණ්ඩලය සහ Bitticalo Campus එක අතර ස්වාමිනි අන්‍යෝන්‍යතා සහයෝගීතා ගිවිසුමක් අත්සන් කරනවා. ඒ ගිවිසුමට මේ දෙපාර්ශවය එකඟ වන්නේ ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබට එම ගිවිසුම ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි ඒ අනුව Batticaloa Campus Private Limited සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇති කර ගන්නා ලද 2019 මැයි 19 වෙනි දිනැති ගිවිසුම C 1370 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර : ඒ අනුව දැන් මේ ආයෝජන මණ්ඩලයත් එක්ක ගිවිසුමකට එළඹීමෙන් පස්සේ Batticaloa Campus Private Limited කියන ආයතනය යම් කිසි ආයෝජන බදු සහන ලබා ගැනීමට අවසර ලබා දීලා තියෙනවද ඔවුන්ට?

පි : නිවැරදියි ස්වාමිනි තීරු බදු සහනයක් ලබා දීලා තියෙනවා. ආයෝජන මණ්ඩලය විසින් රුපියල් මිලියන 161 ක වටිනාකමකින් යුත් භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනයට හෝ දේශීය වෙළෙඳපොළෙන් තීරු බදු රහිතව ලබා ගැනීමට Batticaloa Campus ආයතනයට තීරු බදු සහනයක් ලබා දීලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් මං ඊළඟට ඔබේ අවධානය යොමු කරන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ Batticaloa Campus Private Limited කියන ආයතනය අතර ඇති වූ ලිපි හුවමාරු සහ ඇති වූ ගිවිසුම් සම්බන්ධයෙන්. ඔබ ඒ සම්බන්ධයෙන් විමර්ශන සිද්ධ කළාද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ විමර්ශනවලදී ඔබට මොනවද අනාවරණය වුණේ?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි අනාවරණය වුණා මඩකලපුව University college ආයතනයේ සභාපතිවරයා හිස්බුල්ලා මහතා ලිපියක් මඟින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පරීක්ෂණ ආයතනයට ඉල්ලීමක් කරලා මෙම Batticaloa Campus ආයතනයට උපාධි පාඨමාලා ප්‍රධානය පිරිනැමීම සඳහා අවසරයක් ලබා දෙන ලෙසට.

ප්‍ර : කවද්ද මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි : එය ස්වාමිනි ඉදිරිපත් කරලා තිබෙන්නේ

ප්‍ර : කවුද ඉදිරිපත් කරලා තිබෙන්නේ?

පි : හිස්බුල්ලා මහතා විසින්.

ප්‍ර : කාටද ඉදිරිපත් කරලා තිබෙන්නේ?

පි : උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එවකට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් අමුණුගම මහතාට ඉදිරිපත් කරලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : සරත් අමුණුගම මහත්මයාට තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. මාතෘකාව විදිහට මොකක්ද දැක්වෙන්නේ?

පි : Approval for the establishment of higher education institute in Batticaloa

ප්‍ර : In Batticaloa අත්සන් කරලා තියෙන්නේ කවුද?

පි : එච්.එල්.ඒ.එම්.හිස්බුල්ලා මහතා ස්වාමිනි.

ප්‍ර : එච්.එල්.ඒ.එම්.හිස්බුල්ලා මහතා?

පි : නිවැරදියි ස්වාමිනි. එම කාලයේ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළා.

ප්‍ර : වශයෙන් ඔහු මුද්‍රාව තබලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ලේඛනය C 1371 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර : දැන් මේ C 1371 වශයෙන් ලකුණු කරපු ලේඛනයේ නිල මුද්‍රාව මහත්මයා බලන්න?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එහි සඳහන් වෙනවා Deputy Minister of Economic Development කියලා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : උඩ පෑනෙන් ලියලා තියෙනවා EX කියලත් නේද?

පි : එහෙමයි ස්වාමිනි. හිටපු Deputy Minister of Economic Development කියලා තමයි සඳහන් වෙන්නේ.

President's Counsel
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : සඳහන් වෙන්නේ. පැනෙන් තමයි EX කියන කෑල්ල දාලා තිබෙන්නේ?

පි : නිවැරදියි ස්වාමිනි පැනෙන් දාලා තියෙන්නේ.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර : එකෙන් පේනවා නේද එක කාලේක University College Batticaloa Chairman කියන වචනෙයි කියන නිල නාමයයි Deputy Minister of Economic Development කියන තනතුරයි දෙකම එකම මුද්‍රාවේ පාවිච්චි කරලා තියෙනවා කියලා?

පි : නිවැරදියි ස්වාමිනි එසේ නිරීක්ෂණය වෙනවා.

****

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා

ප්‍ර : දැන් ඔබ මෙම ඉදිරිපත් කරන ලද C 1371 ලිපියෙන් පස්සේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මොනවද කරලා තියෙන අරගෙන තියෙන ක්‍රියාමාර්ග?

පි : ස්වාමිනි හිස්බුල්ලා මහතා ඉල්ලීම් කරලා තියෙන්නේ Batticaloa Campus ආයතනයට උපාධි පාඨමාලා ප්‍රධානය පිරිනමන ලෙස අවසර ලබා දෙන්න කියලා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ස්වාමිනි 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25 වෙනි වගන්තියෙන් නිශ්චිතව දක්වා ඇති එකී පනතේ 70 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව උපාධි පාඨමාලා ප්‍රධානය හා පිරිනැමීම් කරනු ලබන ආයතනයන්ට අවසර ලබා දීමේ කාර්යය විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී තිබෙනවා.

ප්‍ර : 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25 (A) වගන්තිය සමඟ කියවිය යුතු 70 (C) වගන්තිය කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ අනුව උපාධි Degree awarding status නැත්නම් උපාධි ප්‍රධානය හා පිරිනැමීමේ ආයතනවලට අවසර ලබා දීමේ කාර්යය උසස් අධ්‍යාපනය භාර විෂය භාර අමාත්‍යවරයාට පැවරීලා තියෙනවා කිව්වොත් නිවැරදිනේ?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඊට පස්සේ මොකක්ද සිද්ධ වෙන්නේ?

පි : ඊට පසු ස්වාමිනි මෙම දේශීව විෂය මාලා යටතේ උපාධි පාඨමාලා පිරිනැමීම සඳහා සුදුසු මෙරට පිහිටි උසස් අධ්‍යාපන ආයතනයක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස හඳුනා ගෙන

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එම ආයතනය නියාමනය කිරීම මෙම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරනවා.

ප්‍ර : හරි.

පි : මෙම හඳුනා ගැනීමේ හා නියාමනය කිරීමේ ක්‍රියාවලිය විශ්ව විද්‍යාල පනතේ 134 වෙනි වගන්තිය අනුව සහ 2013/08/22 වෙනි දිනැති අංක 182421 දරණ විශේෂ ගැසට් පත්‍රය මඟින් පල කරන රීතින්ට අනුව සිදු කරනු ලබනවා ස්වාමිනි.

ප්‍ර : සිදු කරගෙන යනවා. ඒ අනුව දැන් කුමන ආකාරයටද මේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් කියන එක ඒ Degree awarding status එක යම්කිසි ආයතනයකට පිරිනමන්නට කලින් මොනවද ඒගොල්ලො ආයතනිකව ගන්න ක්‍රියාමාර්ග?

පි : ස්වාමිනි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මම ඉහතින් සඳහන් කළ උපාධි 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 70 (ආ) වගන්තියේ ප්‍රතිපාදන අනුව විෂය කේෂ්ත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් ලත් ප්‍රතීතන හා තත්ත්ව ආරක්ෂණ සඳහා වූ ස්ථාවර කමිටුවක් පත් කිරීමේ හැකියාව තියෙනවා. පත් කරනවා ස්වාමිනි මේ සඳහා මෙම ක්‍රියාවලිය.

ප්‍ර : මෙම කමිටුව කොහොමද කෙටියෙන් හඳුන්වන්නේ?

පි : මෙම කමිටුව හඳුන්වනවා ස්වාමිනි SCAQA.

ප්‍ර : SCAQA?

පි : SCAQA කියලා.

ප්‍ර : Standing Committee on accreditation and quality assurance

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : වශයෙන් හඳුන්වනවා. එතකොට මේ කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කිරීමක් සිද්ධ කරනවද අමාත්‍යවරයාට?

පි : එහෙමයි ස්වාමිනි. මෙම කමිටුව මඟින් නියාමන ක්‍රියාවලිය සිදු කරනවා ආකාර දෙකකට. එකක් ආයතනික සමාලෝචනය හා අනිත් එක විෂය සමාලෝචනය ලෙස මූලික වශයෙන් පියවර දෙකකින් මෙම ආයතනය සමාලෝචනය සිදු කරනු ලබනවා.

ප්‍ර : ආයතනික සමාලෝචනය කියලා එක විදියකට ඒ ආයතනය ගැන බලනවා විෂය සමාලෝචනය කියලා තවත් විදියකට ඒ උසස් අධ්‍යාපන ආයතනය ගැන ඔවුන් නිරීක්ෂණය කරලා බලනවා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ආයතනික සමාලෝචනය කියන ආකාරයට ඔවුන් මොනවද බලන්නේ සාමාන්‍යයෙන්?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි ආයතනික සමාලෝචනය මඟින් ආයතනයේ ස්ථාපිත කරන්න හදන ඉල්ලුම් කරන ආයතනයේ ධාරිතාවය තමයි පරීක්ෂා කරන්නේ. ධාරිතාවය පරීක්ෂා කරනවා. විෂය සමාලෝචනය මඟින් යෝජිත පාඨමාලාවේ ගුණාත්මකභාවය පරීක්ෂා කරනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ධාරිතාවය පරීක්ෂා කරනවා කියන්නේ මොනවද මේ බලන්නේ ධාරිතාවය කියලා?

පි : ධාරිතාවය පරීක්ෂා කිරීම ලෙසින් ඔවුන් නිරීක්ෂණය කරන්නේ ස්වාමිනි මෙම ආයතනයේ පාලනය, කළමනාකරණය, මුල්‍යමය ශක්‍යතාවය

ප්‍ර : ශක්‍යතාවය?

පි : ඔව්. භෞතික සම්පත්, අධ්‍යාපන සැලසුම් හා සංවර්ධන සහ ක්‍රියාවලිය සහ තත්ත්ව ආරක්ෂණ පද්ධතිය ඊට අමතරව කාර්ය මණ්ඩලයේ අධ්‍යයන හා පර්යේෂණ හැකියාවන් ඔවුන් නියාමනය කරනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ ආයතනික සමාලෝචනය Pass නම් නැත්නම් ඒක සමත් වුණොත් තමයි විෂය සමාලෝචනය පැත්තට යන්නේ කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ අනුව මේ Batticaloa Campus ආයතනය C 1371 කියන ඉල්ලුම් පත්‍රය ලබා දෙනවනේ. ඊට පස්සේ ඔවුන් විසින් මොනවද කරලා තියෙන්නේ?

පි : ඊට පස්සේ ස්වාමිනි මෙම සමාලෝචන මෙම ආයතනය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වසර තුනකට වැඩි කාලයක් මම ඉහතින් සඳහන් කළ සමාලෝචන නිර්ණායකයන් 6 යටතේ ආයතනික ධාරිතාවය පරීක්ෂා කිරීමට කටයුතු කරලා තියෙනවා. එසේ කටයුතු කරලා ඉහතින් සඳහන් කළ මෙම ආයතනයේ මූල්‍ය ශක්‍යතාවය සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂා කිරීමට අවශ්‍ය බව එම Committee ට හැඟී ගිහිල්ලා තියෙනවා ස්වාමිනි. එසේ හැඟී ගියාට පසුව Batticaloa Campus ආයතනය මූල්‍ය ශක්‍යතාවය පිළිබඳව තක්සේරු කිරීමට තාක්ෂණික උපදේශ කමිටුවක් පත් කරනවා ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔවුන් මොනවද නිරීක්ෂණය කරන්නේ?

පි : එම තාක්ෂණික කමිටුව මඟින් ඔවුන් නිරීක්ෂණය කරනවා Batticaloa Campus ආයතනය සඳහා ස්ථාවර මූල්‍ය ධාරිතාවයක් පවතින බවට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව. මීට අමතරව ආයතනයේ අනාගත අවධානම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

කර නොමැති බව සහ පාලන ව්‍යුහය උසස් අධ්‍යාපන ආයතනය සඳහා නොගැළපෙන බවත් ඔවුන් නිර්දේශ ලබා දෙනවා ස්වාමිනි.

ප : ඒ අනුව ඔවුන්ගේ නිර්දේශ මත පදනම් වෙලා මේ SCAQA Committee එක විසින් Batticaloa Campus Private Limited කියන ආයතනයට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් කියන States එක නැත්නම් Degree awarding status එක ලබා දීම ප්‍රතික්ෂේප කිරීමක් කරනවද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප : ඊට අදාළව SCAQA Committee එකෙන් ඉදිරිපත් කරන ලද resolution එක නැත්නම් ඊට අදාළ නිර්දේශය සහ ඔවුන්ගේ හේතු දැක්වෙන ලේඛනය ඔබට දැක්කොත් හඳුන ගන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි ඊට අදාළ SCAQA කමිටු නිර්දේශය දැක්වෙන ලේඛනය C 1372 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : මහත්මයාට මේ Highlight කරපු කෑල්ල කියවන්න පුළුවන්ද?

පි : ස්වාමිනි එහි සඳහන් වෙනවා Based on overall financial position as reflected in the financial statement and the budget forecast provided and other concern including the government structure of entity the committee referred to above and the ministry officers are present a of the view that degree awarding status should not be granted to Batticaloa campus (PVT) Ltd

ප : කියලා සඳහන් වෙනවා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප : දැන් ඔවුන් මේ Degree awarding status එක නැත්නම් උපාධි ප්‍රධානය කිරීමට අදාළ ඒ දෙන අවසරය එහෙම ලබා දෙන්නේ නෑ කියලා තීරණය කරලා තියෙන්නේ කවද්ද?

පි : මේ සම්බන්ධයෙන් ස්වාමිනි මෙම තීරණය සම්බන්ධයෙන් හිස්බුල්ල මහතාත් දැනුවත් කරනවා ලිපියක් මඟින්. 2019/07/04 වෙනි දින තමයි ස්වාමිනි මෙම තීරණය ලබා ගන්නේ ස්වාමිනි.

ප : ඒ තීරණය ලබා ගන්නේ කමිටුව විසින් 2019/07/04 වන දින?

පි : 07/04 වන දින ස්වාමිනි.

ප : එය හිස්බුල්ලා මහතාට ලිඛිතව දන්වනවද?

පි : නිවැරදියි ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : කවද්ද ලිඛිතව දන්වන්නේ. එතකොට ඔහුට ලිඛිතව දන්වන්නේ 2019/07/10 දිනැති ලිපියකින් කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප : එය Chairman Batticaloa Campus කියලා ආමන්ත්‍රණය කරලා යවපු ලිපියක් කිව්වොත් නිවැරදියි නේද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප : එය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂයක යවලා තියෙනවා කිව්වොත් නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමිනි.

ස්වාමිනි මෙම 2019/07/10 දිනැති ලේඛනය C 1373 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : ධම්මික මහත්මයා ඔබ විමර්ශනය සිදු කරන කොට මේ හිස්බුල්ලා මහත්මයාගේ ක්‍රියාකලාපයන් සහ ඔහුට අදාළ Batticaloa Campus Private Limited කියන ආයතනය ගැන ඔබට අනාවරණය වුණාද මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් University College කියලා යම්කිසි ආයතනයක් තියෙනවද නැද්ද කියලා?

පි : අනාවරණය වුණා ස්වාමිනි.

ප : එහෙම ආයතනයක් තියෙනවද? මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් University College?

පි : ස්වාමිනි මෙම නම ඉස්සෙල්ලාම ආවේ අපි ලංකා බැංකුවේ නිලධාරීන්ගේ බැංකු ගිණුම් ප්‍රකාශ සටහන් කළා. ප්‍රකාශ සටහන් කරන කොට බැංකු ගිණුමක් අනාවරණය වුණා ස්වාමිනි. එම බැංකු ගිණුම කාත්තන්කුඩි ප්‍රදේශයේ කාත්තන්කුඩියේ BOC බැංකුවේ තමයි තියෙන්නේ. ඒ බැංකුවට හිස්බුල්ලා මහතා විසින් ලබා දුන්න ලේඛනවල මෙම මෙවැනි විශ්ව විද්‍යාලයක නමක් සඳහන් කරලා තිබුණා ස්වාමිනි.

ප : විශ්ව විද්‍යාලයක නමක් සඳහන් කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : හැබැයි එහෙම විශ්ව විද්‍යාලයක් භෞතිකව තියෙනවද නැද්ද කියලා හොයලා බැලුවද?

පි : මේ දක්වා සිදු කළ විමර්ශනවලදී ස්වාමිනි මෙවැනි නමකින් විශ්ව විද්‍යාලයක් පවත්වාගෙන යනවා කියලා අනාවරණය වුණේ නෑ ස්වාමිනි.

ප : ලියාපදිංචි ලේඛන මොකුත් හම්බ වුණේ නෑ?

පි : නැත ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙම දැන් ඔබ සඳහන් කළානේ BOC කාත්තන්කුඩිවල යම්කිසි ගිණුමක් පවත්වාගෙන යනවා කියලා මේ නමින්?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ ගිණුමට විදේශ ආමුඛ ප්‍රේෂණ ලැබිලා තියෙනවද?

පි : ලැබිලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කාගෙන්ද ලැබිලා තියෙන්නේ?

පි : ස්වාමිනි මේ වර්ෂය තියෙනවා Foreign remittance 2015/06/24 වන දින. මුදල් ලැබිලා තියෙනවා ස්වාමිනි

ප්‍ර : US ඩොලර්ස්

පි : US ඩොලර්ස් 66613.38 ක මුදලක්.

ප්‍ර : සහ

පි : සහ 2015/07/06 වන දින ඇමරිකානු ඩොලර් 79852.09 ක්. 2015/08/04 වන දින ඇමරිකන් ඩොලර් 39927.71 ක මුදලක් ලැබිලා තියෙනවා.

ප්‍ර : කවුද මේ මුදල් එවලා තියෙන්නේ?

පි : Sender ගේ නම සඳහන් වෙනවා ස්වාමිනි වම්පස යාෂා අබ්දුල් අසීස් සලමන් අර්ෂාඩ් කියලා සඳහන් වෙනවා ස්වාමිනි.

ස්වාමිනි මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සාක්ෂි ලංකා බැංකු නිලධාරියා මඟින් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා.

ස්වාමිනි මේ අවස්ථාවේදී ලංකා බැංකුව වෙනුවෙන් මීට පෙර සාක්ෂි දුන් සාක්ෂිකාරීය මේ මොහොතේ කොමිෂන් සභාව වෙත පැමිණ සිටිනවා ඇයගේ ඉතිරි සාක්ෂිය ලබා දීම සඳහා. එය ඉතාමත් කෙටි සාක්ෂියක් ස්වාමිනි. එම සාක්ෂියෙන් අනතුරුව මෙම සාක්ෂිය ලබා ගත හැකියි ස්වාමිනි. ඒ අනුව මෙම සාක්ෂිය පසුව ලබා ගන්නා මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී මේ සාක්ෂිකරුගෙන් තව යම්කිසි දුරකට දීර්ඝ වශයෙන් සාක්ෂි ලබා ගැනීමට ඇති බව පෙනී යන හෙයින් උදෑසන සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකාරියගේ සාක්ෂිය කෙටියෙන් අවසන් කළ හැකි බවට පෙනී යන හෙයින් කොමිෂන් සභාව මේ අවස්ථාවේදී මේ සාක්ෂිකරුගේ සාක්ෂි ලබා ගැනීම තාවකාලිකව නවත්වා උදෑසන ලබා දුන් සාක්ෂිය අවසන් කිරීමට තීරණය කරමි.

ඒ අනුව සාක්ෂිකරු දැනට මුදා හරිමි.

දැන් වේලාව : ප.ව.04.20 යි.

****

FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව. 6.00
සටහන් කරන්නේ: ධම්මිකා පෙරේරා විසින්ය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදී මීට පෙර මාධ්‍යට විවෘතව නොමැතිව ලබා ගනිමින් සිටපු සාක්ෂියේ ඉතුරු කොටස ලබා ගන්නා ලෙස දන්වන අතර, හිස්බුල්ලා මහතාට ඔහුගේ සාක්ෂි ලබා ගැනීම සඳහා නැවත කොමිෂන් සභාවට රාත්‍රී 7 ට පැමිණෙන ලෙසට දන්වමි.

****

සාක්ෂිකරු නැවත කැඳවයි.

සම්පූර්ණ නම : විජේසිංහ පතිරන්නැහලාගේ ධම්මික විජේසිංහ නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ධම්මික මහත්මයා ඔබ සිදු කරන විමර්ශනයේදී FIU නැත්නම් මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට ලබාදුන් යම්කිසි බුද්ධි වාර්තාවක් ඔබගේ විශේෂ අවධානයට යොමු වුණාද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ මූල්‍ය බුද්ධි වාර්තාව කාට යොමු කරපු බුද්ධි වාර්තාවක්ද?

පි : ස්වාමීනි මෙම බුද්ධි වාර්තාව 2016 සැප්තැම්බර් මස තමයි ප්‍රථමයෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට යොමු කරලා තියෙන්නේ. නැවත මෙම බුද්ධි වාර්තාවම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයටත් යොමු කරලා තිබුණා. එම අංශයත් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරලා තියෙනවා ස්වාමීනි. අප විසින්ද මෙම බුද්ධි වාර්තාව ලබාගෙන මීට අදාළ විමර්ශනයක් සිදු කළා ස්වාමීනි.

ප්‍ර : ඔබ විසිනුත් මේ බුද්ධි වාර්තාව සම්බන්ධයෙන් විමර්ශනයක් සිද්ධ කළා?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මේ 2019 සැප්තැම්බර් 26 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධ්‍යක්ෂක, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට යවන ලද බුද්ධි වාර්තාව X624 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : මහත්මයා මේ X624 වශයෙන් ලකුණු කරන ලද මූල්‍ය බුද්ධි වාර්තාවේ සඳහන් වෙන්නේ කුමන කාරණයක් ගැනද?

Fair Comment BY JEZEEM

පි : ස්වාමීනි මෙම බුද්ධි වාර්තාවේ මම මූලික වශයෙන්ම සමාගම් 2 ක් සම්බන්ධයෙන් සඳහන් වෙනවා.

ප්‍ර : මොනවාද ඒ සමාගම්?

පි : එක සමාගමක් තමයි ස්වාමීනි Selan Business Pvt Ltd. ඒගේ PV අංකයක් තිබෙනවා 91843. මෙම සමාගම ආරම්භ කරලා තියෙන්නේ 2013.04 මාසේ 4.

ප්‍ර : තව සමාගමක් ගැන සඳහන් වෙනවද?

පි : අනිත් සමාගම ස්වාමිනි ශාන්‍ති Pvt Ltd ලිමිටඩ් PV නම්බරයක් තිබෙනවා 10024. මෙම සමාගමත් ආරම්භ කරලා තියෙන්නේ 2014.08.27

ප්‍ර : DTL Suspicion කියලා මොකක්ද සඳහන් වෙන්නේ?

පි : ස්වාමීනි මෙම Selan Business Pvt Ltd සමාගම විසින් කොමර්ෂල් බැංකුවේ SIA Account එකක් ආරම්භ කරලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : SIA Account එකක්ද FIA Account එකක්ද?

පි : SIA Account එකක්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

පි : එම බැංකු ගිණුමට සෞදි අරාබි රජයේ පුද්ගල ගිණුමකින් එක් අවස්ථාවකදී ශ්‍රී ලංකා මුදල් මිලියන 826.8 ක් ලැබිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් මේ ඔබ සඳහන් කරන්නේ Selan Business කියන සමාගම සම්බන්ධව?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : දැන් මේ සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කළාද?

පි : නිවැරදියි ස්වාමීනි එම සමාගම සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගත්තා.

ප්‍ර : ඒ අනුව Selan Business සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ කවද්ද?

පි : Selan Business Pvt Ltd සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ ස්වාමීනි 2013.04 මාසේ 4.

ප්‍ර : එහි PV අංකය?

පි : PV අංකය 91843

Proceedings Copy

FAIR COMMENT BY JEZEEM

ප : එහි ලියාපදිංචිය සහතික කිරීමේ ලේඛනයක් ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : නිවැරදියි ස්වාමිණි පුළුවන් ස්වාමිනි.

ස්වාමීනි Selan Business Pvt Ltd **ආයතනයේ ලියාපදිංචිය තහවුරු කිරීමේ ලේඛනය C1377 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා**.

ප : දැන් මේ Selan Business සමාගමේ ආරම්භක කොටස්කරුවන් කවුද අධ්‍යක්ෂවරුන් සහ කොටස්කරුවන් කියන්න කෝ?

පි : ස්වාමීනි මෙම සමාගමේ 95% ක් කොටස් හිමිව තියෙන්නේ සෞදි අරාබි ජාතිකයෙකුට. ඔහුගේ නම අල්රෂීඩ් යහියා අබ්දුල් අසීස් කියන පුද්ගලයට.

ප : 95% ක් කොටස් තියෙන්නේ අබ්දුල් අසීස්ට?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඉතුරු 5% තියෙන්නේ කාටද?

පි : ඉතුරු 5% තියෙන්නේ එම්.එල්.ඒ.එම් හිස්බුල්ලා මහතාට ඉතුරු 5% කොටස් හිමිව තියෙන්නේ ස්වාමීනි.

ප : එතකොට ඒ කොටස්නේ, අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන්නේ කවුද?

පි : අධ්‍යක්ෂකවරුන් වශයෙන් අල් රිෂාඩ් යහාඅබ්දුල්ලා අසීස් සෞදි අරාබි පාස්පොට් එකක් හිමි පුද්ගලයෙක්. සහ එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා ස්වාමීනි.

ස්වාමීනි ඒ අනුව Selan Business Pvt Ltd ආයතනයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කළ පෝරම අංක 1, C1377A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : මෙහි අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්වීමක් සිද්ධ වෙලා තියෙනවද මහත්මයා?

පි : නිවැරදියි ස්වාමීනි 2019.01.04 වන දින අධ්‍යක්ෂක මණ්ඩලයේ හිටපු ඒ.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා Resign වෙලා ඒවෙනුවට මොහොමඩ් හිස්බුල්ලා අහමඩ් හිරාස් ඔහුගේ පුත්‍රයා පත් කරලා තියෙනවා ස්වාමීනි.

ප : 2019 ජනවාරී 4 වෙනිදා?

පි : එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි අධ්‍යක්ෂවරයෙක් වෙනස් වීමට අදාළ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන පෝරම අංක 20, C1377B වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ Selan Business මේ STR එකක් මත විමර්ශනය පටන් ගත්ත Selan Business කියන සමාගමේ අරමුණු මොනවද කියලා?

පි : අරමුණු ලෙස සඳහන් කරලා තියෙනවා ස්වාමී ඉංග්‍රීසියෙන් තියෙනවා In bound and out bound tourism ලෙස සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඊ ට අදාලව ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන් නේද?

පි : පුළුවන් ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන සේලාන් බිස්නස් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය C1377C වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : දැන් මේ Selan Business Pvt Ltd සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි වාර්තාවක් ඔබට ඉදිරිපත් වුණා නේ X624 ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ ඔබ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මූලික තොරතුරු හොයා ගැනීමෙන් අනතුරුව ඔබ විසින් විමර්ශනයක් ආරම්භ කළාද?

පි : නිවැරදියි ස්වාමීනි. විමර්ශනයක් ආරම්භ කළා.

ප්‍ර :: ඒ අනුව ඔබ මොනවද හොයා ගත්ත කාරණා?

පි : ස්වාමීනි විමර්ශනයට අනුව මෙම සමාගමට අයත් කොමර්ෂල් බැංකුවේ පවත්වාගෙන ගිය අංක 1416419901 දරණ ගිණුමට

ප්‍ර : මේක හිමින් පැහැදිලි කරන්න ඕනේ සාක්ෂිකරු කියන්න කෝ? Selan Business Pvt Ltd සමාගමේ කොහේද ඔබ ඔය සඳහන් කරන්න යන account එක තියෙන්නේ?

පි : කොමර්ෂල් බැංකුවේ SIA Account එකක්. ඒක ආරම්භ කිරීම.

ප්‍ර : එය ඔබ සඳහන් කරන ගිණුම් අංකය සඳහන් කරන්න?

පි : 1416419901 ස්වාමීනි.

ප්‍ර : දැන් මේ ඔබ සඳහන් කරපු මේ SIA ගිණුම කාට අයිති ගිණුමක්ද?

පි : මෙම ගිණුම selan business සමාගමට අයත් ගිණුමක් ස්වාමීනි.

ප්‍ර : selan business සමාගම වෙනුවෙන් විවෘත කරන ලද Investment Account එකක්?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒකට කොහෙන්ද මුදල් හම්බ වෙලා තියෙන්නේ

පි : ඒ ගිණුමට මුදල් ලැබිලා තියෙන්නේ ස්වාමීනි සෞදි අරාබි බැංකුවකින්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කොච්චර විතර මුදල් ප්‍රමාණයක් ලැබිලා තියෙනවද?

පි : දළ වශයෙන් ශ්‍රී ලංකාවේ මුදලින් මිලියන 826.8 ක් පමණ

ප්‍ර : කුමනල ප්‍රාන්තරයකදී ද ලැබිලා තියෙන්නේ?

පි : 2013.04.10 ඉඳලා 2014.12.11 වෙනි මාසේ කාලය දක්වා මෙම මුදල් ලැබිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ විසින් පිළියෙල කරපු ලේඛනයක් බලාගෙන නේද ඔබ සාක්ෂි දෙන්නේ?

පි : නිවැරදියි ස්වාමීනි. ස්වාමීනි මේ සම්බන්ධයෙන් මූල්‍ය විමර්ශන ඒකකය FCID ආයතනයත් නිලධාරීන් විමර්ශනයක් කරලා තියෙනවා. නිලධාරින්ගෙනුත් ප්‍රකාශ සටහන් කරලා තියෙනවා ස්වාමීනි.

<u>සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන Selan Business Pvt Ltd සමාගමට අදාළ ඔහු විසින් මූල්‍ය විමර්ශනයේදී හොයා ගත් කරුණු සම්බන්ධයෙන් පිලියෙල කරන ලද විශ්ලේෂණ වාර්තාව X625 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : දැන් මේ X625 ලේඛනය බලලා පැහැදිලි කළා ඔබ දැන් කොහොමද සෞදි අරාබියෙන් සමාගමේ SIA account එකට මුදල් ආවේ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ ඒ මුදල්වලට මොකක්ද වෙලා තියෙන්නේ?

පි : එම මුදල් ස්වාමීනි කොමර්ෂල් බැංකුවේ account එකට ලැබුණට පස්සේ නැවත එම සමාගමේම කොමර්ෂල් බැංකුවේ නාවල ශාඛාවේ අංක 1101012080 දරණ ගිණුමට හුවමාරු වෙනවා.

ප්‍ර : මේ අන්තිමට 12080 කියන ගිණුම කුමන ආයතනවලට අදාළ ගිණුමක්ද?

පි : ඒකත් Selan Business Pvt Ltd ආයතනයට.

ප්‍ර : හැබැයි ඒක SIA account එකක් නෙමෙයි සාමාන්‍ය ජංගම ගිණුමක්ද?

පි : සාමාන්‍යයෙන් ජංගම ගිණුමක්.

ප්‍ර : එතකොට ඒ ගිණුමට කොපමණ මුදල් හුවමාරු වෙලා තියෙනවද?

පි : මිලියන 720 ක් පමණ.

ප්‍ර : මිලියන 720 ක් පැමිණිලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි අවස්ථා 14 කදී ස්වාමීනි..

ප්‍ර: : ඒ මිලියන 720 දැන් එනවානේ 1101012080 කියන ගිණුමට කොමර්ෂල් බැංකුවේ?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ මුදල්වලට මොනවද වෙලා තිබුණේ?

පි : මෙම බැංකුවෙන් ස්වාමීනි චෙක්පත් නිකුත් කරනවා ඒ චෙක්පත් විවිධ අවස්ථාවලදී චෙක්පත් මඟින් මුදල් ඉවත් කර ගන්නවා. අවස්ථා 10 කදී චෙක්පත් 19 ක් ඒවායේ සාමාන්‍යයෙන් වටිනාකම මිලියන 30 ත් 90 ත් අතර. ඒ චෙක්පත් තැන්පත් වෙන්නේ කාත්තන්කුඩි ලංකා බැංකුවේ අංක 0074780765 දරණ ගිණුමට. මෙම කාන්තන්කුඩි BOC බැංකුවේ ගිණුමේ අයිතිකරු එස්.එච්.ඒ රහීම් කියන පුද්ගලයා අපි හඳුනා ගෙන අපි ප්‍රකාශයත් සටහන් කළා ස්වාමීනි අපි විසින්. ඊට පස්සේ මොහුගේ ප්‍රකාශයේදී තමයි අනාවරණය වුණේ මොහු හිස්බුල්ලා මහතාගේ සමඟ ඔහුගේ මිතුරෙක් ඔහුගේ ඉල්ලීම පරිදි මොහු විසින්..

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප්‍ර : කාගේ ඉල්ලීම මතද?

පි : හිස්බුල්ලා මහතාගේ ඉල්ලීම පරිදි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග ඛණ්ඩාර මහතා:</u>

ප්‍ර : ඒ කියන්නේ මේ හිස්බුල්ලා මහත්මයා කරන ලද ඉල්ලීමක් මතද?

පි : එහෙමයි ස්වාමීනි. ඉල්ලීම පරිදි ඔහු විසින් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ඉඩම් අක්කර 3338 ක් මිලදී ගන්නවා ස්වාමීනි. ඊට අදාළව මම ලේඛනයක් හදලා තියෙනවා ඒ ප්‍රදේශය සම්බන්ධයෙන්.

ප්‍ර : ඔබ දැන් සඳහන් කළා මේ ඉඩම් මිළදී ගැනීම සම්බන්ධයෙන් ඔබ යම්කිසි ලේඛනයක් පිළියෙල කළා ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ සඳහන් කළා දැන් මේ Selan Business සමාගම නමින් සෞදි අරාබියාවෙන් එන මුදල් පාවිච්චි කරලා ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් ඔහු මිලදී ගත්තා කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඔබ විමර්ශනයේදී හොයලා බැලුවද ඔවුන් ලබා ගත්ත ඉඩම් ප්‍රමාණය සහ ඒවා පිහිටි ප්‍රදේශ සම්බන්ධයෙන් විමර්ශනය කළාද?

පි : නිවැරදියි ස්වාමීනි විමර්ශනය කළා මේ පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කළා. ඊට අදාළ ඔප්පු ලබා ගත්තා. ඔප්පු සම්බන්ධයෙන්

FAIR COMMENT BY JEZEEM

දීර්ඝ ලෙස විමර්ශනයක් කිරීමට අවශ්‍යයි. ඒවට ප්‍රමාණවත් කාලසීමාවක් තිබුණේ නැහැ ස්වාමීනි.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප්‍ර : ඒ කියන්නේ ඒ ඔප්පුවල වලංගුභාවය පිළිබඳ?

පි : වලංගුභාවය සහ එම ඔප්පු විකුණු පුද්ගලයන් කවුද හඳුනා ගැනීමට අවශ්‍යයි ස්වාමීනි හැබැයි ස්වාමීනි FCID නිලධාරීන් මෙම ඉඩම් නරඹලා ඔවුන් සටහන් යොදා ගෙන තියෙනවා එම ක්‍රියාවලිය කරපු නිලධාරියාගේ ප්‍රකාශයකුත් මම සටහන් කළා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබගේ විමර්ශන අනුව ඔබ ඒ ඉඩම් සම්බන්ධයෙන් යම්කිසි ලේඛනයක් පිලියෙල කළානේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒක ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් Selan Business Pvt Ltd නමැති සමාගම විසින් සිදු කරන ලද ඉඩම් මිළදී ගැනීම් දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කර සිටිනවා. එය X625A වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා</u>.

පි : ස්වාමීනි පැහැදිලි කිරීමක් සේලාන් බිස්නස් සමාගම නමින්ම ගන්නවා උඩ තියෙන රූප සටහන අනුව ඉඩම් අක්කර 1050 ක්. ඊට පස්සේ විමර්ශන තුලින් අනාවරණය වුණා සේලාන් බිස්නස් සමාගම විසින් මුදල් ආයෝජනය කරලා වෙනත් නම් වලින් සහ වෙනත් සමාගම් මඟිනුත් මේගොල්ලන් සංවිධානාත්මකවම එම ඉඩම් මිළදී ගන්නවා. ඒ එකතුව තමයි සම්පූර්ණම 3338 ලෙස සඳහන් වන්නේ ස්වාමීනි.

ප්‍ර : මේ සම්බන්ධයෙන් FCID නිලධාරීන් ඔබ ප්‍රශ්න කිරීමේදී අනාවරණය වුණාද ඔවුන්ගේ විමර්ශනය සඳහා හිස්බුල්ලා මහත්තයාගේ ප්‍රකාශයක් සටහන් කරගෙන තියෙනවාද නැද්ද කියලා?

පි : ප්‍රකාශයක් සටහන් කරගෙන තියෙනවද කියලා අනාවරණය වුණා ස්වාමීනි ඔවුන් ප්‍රකාශයක් සටහන් කර ගෙන තිබුණා.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : මේ X625A කියන ලේඛනය ඔබ සකස් කළ ලේඛනයක්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව මෙහි මුලින්ම දැක්වෙනවා යම්කිසි වගුවක්, එහි මාතෘකාව විදියට ඔබ සඳහන් කරන්නේ මොකක්ද?

පි : විමර්ශනය තුලින් අනාවරණය වී ඇති සෙලාන් බිස්නස් සමාගම නමින් මිළදී ගත්ත ඉඩම්.

ප්‍ර : ඒ කියන්නේ මේ ඉඩම් අරගෙන තියෙන්නේ ඔප්පුවේ තියෙන්නේ සේලාන් බිස්නස් සමාගමේ නම?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සමාගම විසින් මිළදී ගත්ත ඉඩම් තමයි මෙහි දැක්වෙන්නේ?

පි : සමාගම විසින් .

ප්‍ර : ඒ අනුව මුලින්ම තියෙනවා ඉඩම පිහිටි ප්‍රදේශය 1 වෙනි එක ජාඇළ දළුගම.?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඉඩම් කීයක් අරන් තියෙනවද?

පි : ආසන්න වශයෙන් අක්කර 48 ක්.

ප්‍ර : ඉඩම් කැබලි 9 යි

පි : කැබලි 9 යි ස්වාමීනි. ඉඩම් ප්‍රමාණය අක්කර 48 යි.

ප්‍ර : එතකොට රත්නපුර කළවාන ප්‍රදේශයේ කැබලි කීයක් තියෙනවා?

පි : කැබලි 2 යි,

ප්‍ර : අක්කර ප්‍රමාණය?

පි : අක්කර 40 යි.

ප්‍ර : නාවලපිටිය ප්‍රදේශයෙන් ඉඩම් කැබලි කීයද?

පි : ඉඩම් කැබලි එකයි.

ප්‍ර : ප්‍රමාණය?

පි : අක්කර 175 ට ආසන්නයි.

ප්‍ර : ත්‍රිකුණාමලයේ තෝප්පූර් ප්‍රදේශයේ ඉඩම් කැබලි කීයක් අරන් තියෙනවද?

පි : ඉඩම් කැබලි 17 යි ස්වාමීනි අක්කර 92 ක්.

ප්‍ර : අක්කර?

පි : අක්කර 92 ක් පමණ.

ප්‍ර : මන්නාරම නදුක්කුඩා ප්‍රදේශයෙන් ඉඩම් කැබලි කීයක් අරන් තියෙනවද?

පි : ඉඩම් කැබලි 1 යි. අක්කර ප්‍රමාණය 190 යි ස්වාමීනි.

ප්‍ර : මන්නාරම කුරුප්පන්කුඩිරිප්පු ප්‍රදේශයේ ඉඩම් කැබලි කීයක් අරන් තියෙනවද blocks ?

පි : ඉඩම් කැබලි 54 යි ස්වාමීනි අක්කර 503 යි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට Selan Business Pvt Ltd කියන සමාගම නමින්ම ඒ ඔප්පුවල සඳහන් කරමින් ලබා ගත් මුළු අක්කර ප්‍රමාණය කීයද?

පි : අක්කර 1050 යි ස්වාමීනි.

ප්‍ර : ඒ සඳහා ඔප්පුවේ වටිනාකම ගත්තොත් රුපියල් කීයක් එකතුව විදියට එනවද?

පි : මිලියන 398 යි ලක්ෂ 188 යි 750 ක්.

ප්‍ර : දැන් මේ මුදල හොයාගෙන තිබෙන්නේ අර සෞදි අරාබියාවෙන් ආපු විදේශ මුදල් ප්‍රේෂණවලින් ආපු මුදල් වලින්ද?

පි : එහෙමයි ස්වාමීනි. මගේ ප්‍රකාශවලින් අනාවරණය වුණා අපි මේ රහීම් කියන පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කලා ස්වාමීනි

ප්‍ර : ඔබත් සටහන් කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහිදී ඔබට අනාවරණය වුණා?

පි : එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඔබ අර කියලා සඳහන් කරන්නේ ඔබගේ සාක්ෂියේදී ප්‍රකාශ කරන්නට යෙදුනු සෞදි අරාබියෙන් ආපු මුදලද?

පි : නිවැරදියි ස්වාමීනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : දැන් ඔබ දෙවෙනියට තියෙන වගුවට අපි අවධානය යොමු කරමු. ඒ වගුවේ මාතෘකාව විදියට ඔබ මොකක්ද කියලා තියෙන්නේ?

පි : විමර්ශනය තුලින් අනාවරණය වී ඇති සේලාන් බිස්නස් සමාගම විසින් මුදල් ආයෝජනය කර වෙනත් නම්වලින් මිලදී ගත් ඉඩම්.

ප්‍ර : ඒක පැහැදිලි කරන්න ඒ කියන්නේ මොකක්ද මහත්මයා?

පි : සමහර අවස්ථාවලදී ස්වාමීනි මෙම විමර්ශනයේදී අනාවරණය වුණා සමාගම් කිහිපයක්. සෙරෙන්ඩික් කොමර්ෂල් පුද්ගලික සමාගම, RMB ලංකා පුද්ගලික් සමාගම, ඊස්ට් ෆාම් ඉන්ඩස්ට්‍රිස්, සහ පුද්ගලයන්. එතකොට සමාගම් 3 ට ස්වාමීනි මේ සමාගම් 3 නේ බොහෝ සමාගම්වල අයිතිකාරත්වය හිමිවන්නේ හිස්බුල්ලගේ පුතාට වාගේ මට මතකයි. පරීක්ෂා කරලා බලන්න ඕන.

ප්‍ර : දළ වශයෙන් කියන්න?

Proceedings Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : අනිත් පුද්ගලයන් ස්වාමීනි ෆාමීයා, බුහාරී, රහීම් සහ මුම්තාස් යන පුද්ගලයන් හිස්බුල්ලා මහතාගේ හිතවතුන් කියලා පැවසුවොත් නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ 2 වන වගුවේ සඳහන් ඉඩම් මිළදී ගැනීම්වලටත්, භාවිතා කරලා තියෙන්නේ සෞදි අරාබියාවෙන් ඔබ දැන් කලින් X625 ලේඛනයේ සඳහන් කරලා ආපු සෞදි අරාබියානු මුදල් කියලා කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඔබ ඒ බව විමර්ශනයේදී තහවුරු කරගෙන තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ දැන් ඔය මේකේ පලවෙනි එකට අවධානය යොමු කරවමු. එහි තියෙනවා සෙරම්ඩිම් කොමර්ෂල් පෞද්ගලික සමාගම. දැන් මේ සෙරම්ඩිම් කොමර්ෂල් පෞද්ගලික සමාගම කියලා නම තිබ්බට මෙයට මුදල් සපයලා තියෙන්නේ සේලාන් බිස්නස් පුද්ගලික සමාගමේ ආපු අර විදේශ මුදල් කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ සෙරම්ඩිම් කොමර්ෂල් පුද්ගලික සමාගම නමින් ඉඩම් කොටස් කීයක් තියෙනවද?

පි : ඉඩම් කොටස් 4 ක් තියෙනවා ස්වාමීනි ඉඩම් අක්කර 2130 ක්.

ප්‍ර : 2130 ක් අරගෙන තියෙනවා. ඔබ හොයලා බැලුවද සමාගම දෙපාර්තමේන්තුවෙන් මේ සෙරම්ඩින් කොමර්ෂල් සමාගමේ සංස්ථාපනය කරලා තියෙන්නේ කවද්ද කියලා?

පි : එහෙමයි ස්වාමීනි. සෙරෙම්ඩිම් කොමර්ෂල් පුද්ගලික සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ 2012.11.09 වෙනි දින.

ප්‍ර : PV අංකය?

පි : PV අංකය 89298

ප්‍ර : ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ සෙරම්ඩින් කොමර්ෂල් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සමාගම් ඉදිරියේ සංස්ථාපනය කිරීමට අදාළ ලේඛනය?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන සෙරම්ඩින් කොමර්ෂල් ප්‍රයිවට් ලිමිටඩ් සංස්ථාපනය කිරීම තහවුරු කිරීමට අදාල ලේඛනය C1378 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා</u>.

දැන් වේලාව : ප.ව. 6.20 යි

මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රාණි මිය විසින්ය

FAIR COMMENT — BY JEZEEM

පෙර සටහන් කළේ ධම්මිකා මිය
දැන් වේලාව : ප.ව. 6.20 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන Serandib Commercial Private Limited සංස්ථාපනය කිරීම තහවුරු කිරීමට අදාළ ලේඛනය C-1378 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප : ඒ අනුව එහි පෝරමයේ 1 ට අනුව Serandib Commercial සමාගමේ අධ්‍යක්ෂවරයා වශයෙන් ඉන්නේ කවුද?

පි : අධ්‍යක්ෂවරයා වශයෙන් ඉන්නේ ස්වාමිනි මොහොමඩ් ඊබ්‍රාහිම් නසාර් කියලා පුද්ගලයෙක්.

ප : Shares තියෙන්නේ, කොටස් තියෙන්නේ?

පි : මොහොමඩ් ඊබ්‍රාහිම් නසාර්ට කොටස් එකක් තියෙනවා. එම පුද්ගලයා මේ හිස්බුල්ලා මහතාගේ ඥාති හිතවතෙක් කියලා හඳුනාගෙන තියෙනවා ස්වාමීනි.

ප : විමර්ශනයේදී හඳුනාගෙන තියෙනවා?

පි : හඳුනාගෙන තියෙනවා.

(ස්වාමීනි Serandib Commercial Private Limited සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරු සහ කොටස් හිමියන් දැක්වෙන පෝරමය 1 C-1378(a) වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා)

ප : දැන් මේ Serandib Commercial Private Limited සමාගමේ අධ්‍යක්ෂවරයෙක් මාරුවීමක් සිද්ධ වෙනවද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : කවද්ද මාරු වෙන්නේ?

පි : 2017.06.15 වන දින.

ප : ඒ මාරුවීම තුළින් කවුද පත් වෙන්නේ?

පි : අධ්‍යක්ෂ ධූරයට පත් වෙන්නේ ස්වාමීනි මොහොමඩ් හිරාස් හිස්බුල්ලා, හිස්බුල්ලා මහතාගේ පුත්‍රයා ස්වාමීනි.

ප : ඊට අදාළ ලේඛන ඔබට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2017.06.15 දිනැති අධ්‍යක්ෂවරයා වෙනස්වීමට අදාළ පෝරම අංක 20 C-1378(b) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් අපි නැවත ඔබගේ මම අවධානය යොමු කරනවාX-625(a) ලේඛනයට, මේ තිරයේ දැක්වෙන ලේඛනයට. දැන් ඔබ පැහැදිලි කළා Serandib Commercial පුද්ගලික සමාගමේ අයිතිකරුවන් සම්බන්ධයෙන්. මෙහි දෙවන වගුවේ දෙවෙනියාට තියෙන්නේ කුමන සමාගමක් ගැනද?

පි : සමාගම ස්වාමීනි RMB ලංකා පුද්ගලික සමාගම.

ප්‍ර : ඒ සමාගම නමින් ඉඩම් කොටස් කීයක් තියෙනවද?

පි : ඉඩම් කොටස් ගණන ස්වාමීනි එකයි.

ප්‍ර : අක්කර ප්‍රමාණය?

පි : අක්කර 33 යි.

ප්‍ර : අක්කර 33 කට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. දැන් මේ RMB ලංකා පුද්ගලික සමාගම සම්බන්ධයෙන් ඔබ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් කළාද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව RMB ලංකා පුද්ගලික සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ කවද්ද?

පි : සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ 2013.10.10 ස්වාමීනි.

ප්‍ර : මෙම සමාගමේ PV අංකය කුමක්ද?

පි : PV-94875.

ප්‍ර : මීට අදාළ සමාගම සංස්ථාපනය කිරීම තහවුරු කිරීමේ ලේඛනය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන RMB ලංකා සමාගම සංස්ථාපනය සහතික කිරීමේ ලේඛනය C-1379 වශයෙන් ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මේ RMB Lanka Private Limited ආයතනයේ ආරම්භක අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමිකරුවන් විදියට කවුද ඉන්නේ?

පි : ස්වාමීනි ආරම්භක අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කරනවා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පුද්ගලයන් තිදෙනෙක්. නම් වශයෙන් රෂිඩ් මොහොමඩ් මහරාන් අල් බුලූෂි. අනිත් පුද්ගලයා නෂිඩ් රාෂිඩ් මොහොමඩ් මහරාන් අල්බූෂි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පුද්ගලයෙක්, මන්සූර් රාෂිඩ් මොහොමඩ් මහරාන් අල්බූෂි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පුද්ගලයෙක් සහ අහමඩ් හිරාස් හිස්බුල්ලා.

ප්‍ර : ඒ අහමඩ් හිරාස් හිස්බුල්ලා කියන්නේ කවුද?

පි : හිස්බුල්ලා මහතාගේ වැඩිමහල් පුත්‍රයා ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ආරම්භක අධ්‍යක්ෂවරුනේ. එතකොට කොටස් කොහොමද ඔවුන් හතරදෙනා අතරේ බෙදී ගිහිල්ලා තියෙන්නේ?

පි : කොටස් බෙදී ගිහිල්ලා තියෙන්නේ ස්වාමීනි පළවෙනි පුද්ගලයාට රෂීඩ් මොහොමඩ් මහරාන් අල් බලූෂි Shares 55 යි, කොටස් 55 යි. අනිත් දෙවෙනි පුද්ගලයා නසීර් රෂීඩ් මොහොමඩ් මහරාන් අල්බලූෂිට කොටස් 20 යි, මන්සූර් රෂීඩ් මොහොමඩ් මහරාන් අල්බලූෂිට කොටස් 20 යි. අවසාන වශයෙන් අහමඩ් හිරාස් හිස්බුල්ලාට කොටස් 05 ක් තියෙනවා ස්වාමිනි.

(ස්වාමීනි ඒ අනුව RMB Lanka Private Limited යන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරුන් සහ කොටස්කරුවන් දැක්වෙන ලේඛනය පෝරම 1, C-1379(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මේ RMB Lanka Private Limited ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ඔවුන්ගේ අරමුණ වශයෙන් මොකද්ද සඳහන් කරලා තියෙන්නේ?

පි : සාංගමික ව්‍යවස්ථාවට අනුව අරමුණ සඳහන් කරලා තියෙනවා ස්වාමීනි Objectives conduct inbound and outbound tourism , ඊට පස්සේ මේ ගැසට් එහෙක නමක් තියෙනවා සඳහන් කරලා ඒකේ තියෙන්නේ Provided objectives permitted by extra order gazette notice Number 1232/4 dated 19th April 2002 under the exchange control act chapter.

ප්‍ර : වශයෙන් සඳහන් කරලා තියෙනවා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබට සාංගමික ව්‍යවස්ථාවලිය ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ RMB Lanka Private Limited කියන ආයතනයේ?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන RMB Lanka Private Limited ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලිය C-1379(b) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : නැවත මම ඔබේ අවධානය යොමු කරනවා X-625(a) වශයෙන් ලකුණු කරපු මේ තිරයේ දැක්වෙන ලේඛනයට. X-625(a) ලේඛනයට නැවත මම සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා. එහි අංක 03 වශයෙන් දැක්වෙන්නේ මොකද්ද මේ තිරයේ දැක්වෙන ලේඛනය?

පි : අංක 03 වශයෙන් East Farm Industries කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ East Farm Industries කියන ආයතනයට ඉඩම් කොටස් කීයක් ඔහු මිලදීගෙන තියෙනවද?

පි : ඉඩම් කොටස් 05 ක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : අක්කර කොච්චර ප්‍රමාණයක් අයිති වෙනවද?

පි : අක්කර 49 ක් ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ විමර්ශනය කරලා බැලුවද මේ East Farm Industries කියන සමාගම කවද්ද සංස්ථාපනය කරලා තියෙන්නේ කියලා?

පි : මෙම සමාගම සංස්ථාපනය කරලා තියෙන්නේ 2013.07.01.

ප්‍ර : එහි PV අංකය මොකද්ද?

පි : PV අංකය 93343.

ප්‍ර : ඊට අදාළ සමාගමේ ලියාපදිංචිය තහවුරු කිරීමේ ලේඛනයක් ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන East Farm Industries යන සමාගමේ ලියාපදිංචිය තහවුරු කිරීමේ ලේඛනය C-1380 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මහත්මයා මේ East Farm Industries කියන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරු සහ ආරම්භක කොටස්කරුවන් කවුද යන්න ඔබ විමර්ශනයේදී හොයා ගත්තාද?

පි : ආරම්භක කොටස්කරුවන් සහ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරන්නේ සාහුල් හමීඩ් අබ්දුල් රහීම් කියන පුද්ගලයා ස්වාමීනි.

ප්‍ර : කොටස්කරුවෙක් වශයෙන් කටයුතු කරන්නෙත් කවුද?

පි : එම පුද්ගලයාමයි සාහුල් හමීඩ් අබ්දුල් රහීම්.

ප්‍ර : මේ පුද්ගලයා සහ හිස්බුල්ලා අමාත්‍යවරයා අතර යම් සම්බන්ධතාවයක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි මොහුගේ හිතවතෙක් ලෙස ප්‍රකාශයේදී සටහන් කළා.

ප්‍ර : ඒ බව විමර්ශනයේදී අනාවරණය වෙලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි ඒ අනුව East Farm Industries Private Limited යන සමාගමට අදාළ එහි ආරම්භක අධ්‍යක්ෂවරු සහ කොටස්කරුවන් දැක්වෙන සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන පෝරම අංක 1, C-1380(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මේ East Farm Industries කියන සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ඔබ සතුව තියෙනවද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ස්වාමීනි. ස්වාමීනි මෙහි ව්‍යවස්ථාවලිය තිබුණත් එහි පරමාර්ථ මොනවාද කියලා සඳහනක් නැහැ ස්වාමීනි.

ප්‍ර : අන්තර්ගත කරලා නැහැ?

පි : අන්තර්ගත කරලා නැහැ.

(ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද East Farm Private Limited යන ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලිය C-1380(b) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : සාක්ෂිකරු මම ඔබේ අවධානය නැවත යොමු කරනවා X-625(a) ලේඛනයට. දැන් අප 1, 2, 3 වශයෙන් සඳහන් සමාගම් ගැන විස්තරාත්මකව හොයා බැලුවා. මේ 4 වෙනියාට ඉන්නේ කවුද?

පි : එම්.බී. ෆාමියා කියලා හඳුන්වන ස්වාමීනි මෙම පුද්ගලයා කාන්තාවක් ස්වාමිනි. මෙම කාන්තාවගේ ස්වාමියා තමයි 7 වෙනි ස්ථානයේ ඉන්න ඒ.එල්.එම්. මුම්තාස්.

ප්‍ර : මේ මුම්තාස් මවුලවී කියන මේ ඒ.එල්.එම්. මුම්තාස්ගේ බිරිඳ තමයි මේ ෆාමියා කියන්නේ?

පි : නිවැරදියි ස්වාමීනි. මොවුන්ගෙන් ප්‍රකාශ සටහන් කරන්න කැඳවීමක් කරන්න පරීක්ෂා කිරීමක් කළා. ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගැනීමේදී මොවුන් විදේශගත වී ඇති බව කරුණු තහවුරු වුණා ස්වාමීනි. එබැවින් ඒ ප්‍රකාශ සටහන් කරන්න නොහැකි වුණා ස්වාමීනි.

ප්‍ර : දැන් මේ එම්.බී. ෆර්මියා කියන තැනැත්තියට ඉඩම් කොටස් කීයක් තියෙනවද?

පි : ඉඩම් කොටස් 24 ක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : අක්කර?

පි : අක්කර 25 යි.

ප්‍ර : 25 කට ආසන්න ප්‍රමාණයක් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : 5 වෙනියට සඳහන් වෙන්නේ කවුද?

පි : එල්.ඒ.එම්. බුහාරි. මෙම පුද්ගලයා ස්වාමීනි කැඳවීමට අපිට අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් මේ පුද්ගලයාගේ ප්‍රකාශ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් සටහන් කරලා තිබුණා ස්වාමීනි.

ප්‍ර : ඉඩම් කොටස් ඔහුට කොච්චර ප්‍රමාණයක් තියෙනවද?

පි : ඉඩම් කොටස් ප්‍රමාණය දෙකයි. අක්කර 26 යි.

ප්‍ර : දැන් මේ මොහුත් හිස්බුල්ලා අමාත්‍යවරයා සමඟ සම්බන්ධයක් තියෙන පුද්ගලයෙක්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ බව සඳහන් කරනවා ස්වාමීනි.

ප්‍ර : අනාවරණය වෙලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ හය වෙනියාට තියෙනවා එස්.එස්.ඒ. රහීම් කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පුද්ගලයා ගැන ඔබ කලින් සඳහන් කළාද?

පි : මේ පුද්ගලයා සම්බන්ධයෙන් මම මොහුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන තියෙනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ පුද්ගලයාටත් හිස්බුල්ලා අමාත්‍යවරයා සමඟ සම්බන්ධතාවයක් තියෙනවාද?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔහු කියනවද මේ මුදල්, මේ ඉඩම් ලබා ගත්තේ ඔහුගේ මුදල්වලින් කියලා, කාගේ මුදල්වලින් ඉඩම් ලබා ගත්තා කියලද ඔහු සඳහන් කරන්නේ?

පි : හිස්බුල්ලා මහතා විසින් කරන ලද දැනුම් දීම පරිදි ඔහු විසින් ලබාදෙන මඟ පෙන්වීම යටතේ තමයි ලබා දුන්නු මුදල්වලින් ඉඩම් ලබා ගැනීමට කටයුතු කරලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඉඩම් කොටසක් තියෙනවා. අක්කර කොපමණ ප්‍රමාණයක් තියෙනවද?

පි : අක්කර 25 ක් පමණ තියෙනවා ස්වාමීනි. ඉඩම් කොටස් ගණන එකයි.

ප්‍ර : අවසාන වශයෙන් හත්වෙනියාට දැක්වෙන්නේ ඒ.එල්.එම්. මුම්තාස් කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පුද්ගලයා කවුද?

පි : මෙම පුද්ගලයා සම්බන්ධයෙන් ස්වාමීනි අපි මීට ප්‍රථම මම සාක්ෂි සටහන් කරන වෙලාවේදී තොරතුරු ඉදිරිපත් කළා. මෙම පුද්ගලයා තමයි අර SIS බුද්ධි වාර්තාවේ සඳහන් කළ මුම්තාස් කියන පුද්ගලයා ස්වාමීනි.

ප්‍ර : ඔහුට ඉඩම් කැබලි කොච්චර තියෙනවද?

පි : මැනුම් නිශ්චිතව නැත ස්වාමීනි. ඉඩම් කොටස් ගණන තුනක් කියලා අනාවරණය වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ පිළියෙල කරපු දෙවෙනි වගුව අනුව සෙයිලානි බිස්නස් සමාගම කියන නම යටතේ නැති වුණත් ඒ සමාගමට ආපු මුදල් සෞදි අරාබියාවෙන් ආපු මුදල් ආයෝජනය කරලා කොපමණ ඉඩම් අක්කර ප්‍රමාණයක් මිලදී ගෙන තියෙනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉඩම් කොටස් ගණන 40 යි ස්වාමිනි, අක්කර ගණන 2288 යි.

ප්‍ර : කොච්චර මුදලක් වෙනවද ඔප්පුවේ සඳහන් වටිනාකම ගත්තොත්?

පි : මිලියන 37,430 ක් පමණ.

ප්‍ර : සාක්ෂිකරු ඔබ මුලින්ම සාක්ෂි දෙනකොට ඔබගේ විමර්ශනය පටන් ගත්තේ මූල්‍ය බුද්ධි ඒකකයට ලැබුණු X-624 කියන වාර්තාවෙන් කියලා කිව්වොත් නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : එතකකොට මේ X-624 මූල්‍ය බුද්ධි වාර්තාවේ සෙයිලාන් බිස්නස් ප්‍රයිවට් ලිමිටඩ් කියන එකට අමතරව තවත් සමාගමක් සඳහන් වෙනවා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ සමාගම?

පි : ඒ සමාගමේ නම ස්වාමීනි ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් නමින් හඳුන්වන සමාගමක්.

ප්‍ර : දැන් මේ සමාගමට මුදල් ආවේ කොහොමද, ඒ සමාගම කොහොමද ඒ මුදල් වියදම් කළේ කියන එකට ඔබ යම්කිසි විශ්ලේෂණය කරන ලද මූල්‍ය විශ්ලේෂණ වාර්තාවක් ඔබ විසින් සැකසුවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එය මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි. දළ සටහනක් සකස් කරලා තියෙනවා.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ශාන්ත්‍රී ලිමිටඩ් ආයතනයට අදාළව සිදු කරන මූල්‍ය විශ්ලේෂණය කර ඊට අදාළව සකසන ලද සටහන X-626 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මහත්මයා මෙම X-626 සටහනට අනුව ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් කියන සමාගම ගැන ඔබ විමර්ශනය කළා කියලා කිව්වොත් නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මේ ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් සමාගම ගැන සමාගම් මැදුරෙන් ඔබ විමසීමක් කරලා බැලුවද?

පි : එහෙමයි ස්වාමීනි තොරතුරු ලබා ගත්තා.

ප්‍ර : ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ, සමාගම් මැදුරෙන් ලැබුණු දත්තවලට අනුව කවද්ද සංස්ථාපනය කරලා තියෙන්නේ?

පි : 2014.08.27 දින සංස්ථාපනය කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ PV අංකයක් තියෙනවද?

FAIR COMMENT — BY JEZEEM —

පි : PV අංකය 100524.

(ස්වාමීනි ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ සංස්ථාපනය කිරීමේ සහතික කිරීමට අදාළ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ලේඛනය C-1381 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඊට අමතරව ඔබ තවදුරටත් හොයලා බැලුවද ශාන්ත්‍රී බිස්නස් ප්‍රයිවට් ලිමිටඩ් කියන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරුන් සහ ආරම්භක කොටස් හිමියන් කවුද කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : කවුද ඒගොල්ලෝ?

පි : ආරම්භක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනවා අබ්දුල් කලීඩ් අල්ෂාත්‍රී කියන පුද්ගලයා.

ප්‍ර : අල්ෂාත්‍රී?

පි : එහෙමයි ස්වාමීනි. අනෙක් පුද්ගලයා අහමඩ් හිරාස් හිස්බුල්ලා.

ප්‍ර : මේ අහමඩ් හිරාස් හිස්බුල්ලා කියන්නේ කවුද මහත්මයා?

පි : හිස්බුල්ලා මහත්මයාගේ වැඩිමහල් පුත්‍රයා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔවුන්ට කොටස් කොහොමද බෙදිලා ගිහින් තියෙන්නේ?

පි : අබ්දුල් අසීස් කලීඩ් අල්ශාස්ත්‍රී කියන පුද්ගලයාට සමාගමේ කොටස්වලින් 95% ක් හිමියි. අහමඩ් හිරාස් හිස්බුල්ලාට හිමි වන්නේ කොටස් 5% ක් පමණයි.

ප්‍ර : ඊට අදාළ ලේඛන ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ පෝරම 1, C-1381(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මහත්මයා ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එහි ඒ ආයතනයේ පරමාර්ථ මොනවාද?

පි : ස්වාමීනි පරමාර්ථය සඳහන් කරලා තියෙනවා Inbound and outbound tourism and not connected to travel agent operations කියලා.

ප්‍ර : ඒ අනුව ඔබට ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලිය ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ශාන්ත්‍රී ප්‍රයවට් ලිමිටඩ් ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවලිය C-1381(b) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අවසර ඉල්ලා සිටිනවා)

ප : එහි යම්කිසි අධ්‍යක්ෂවරයෙක් වෙනස්වීමක් සිද්ධ වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : කවද්ද වෙනස් වෙන්නේ?

පි : 2019.07.27 වෙනිදා හිටපු හිස්බුල්ලා මහතාගේ පුත්‍රයා අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වෙලා ඊට පස්සේ අහමඩ් අබ්දුල් කාදර් මොහොමඩ් ජසීන් කියන පුද්ගලයාව Appoint කරලා තියෙනවා. ඒ සමඟම කොටස් හුවමාරුවකුත් සිදු වෙනවා ස්වාමීනි.

ප : ඒ සිදු වෙන්නේ හැබැයි පාස්කු ප්‍රහාරයෙන් පස්සේ 2019 අගෝස්තු 05 වෙනිදා?

පි : එහෙමයි ස්වාමීනි.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : දැන් ශාන්‍රී කියන ආයතනය ඔබ පැහැදිලි කළා කොහොමද අධ්‍යක්ෂවරුන් කවුද සහ ඔවුන්ගේ කොටස් කොහොමද බෙදී ගිහින් තියෙන්නේ කියලා. ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ශාන්‍රී ප්‍රයිවට් ලිමිටඩ් කියන ආයතනයට කොහොමද මුදල් ලැබුණේ කියලා?

පි : මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ වාර්තාව අනුව ස්වාමීනි මුදල් ඇවිල්ලා තියෙන්නේ අල් ඉන්බා බෑන්ක් සෞදි අරාබිය කියන බැංකු ආයතනයෙන් ඇමෙරිකානු ඩොලර් 1 Million 078555 කියලා තියෙනවා මුදලක්. ඇවිල්ලා තියෙන්නේ කොමර්ෂල් බැංකුවේ අංක 8010003591 දරන SIA Account එකට ගිණුමට. එම ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2014.09.23. මෙම ගිණුමට මුදල් ලැබුණාට පස්සේ ස්වාමීනි ...,

ප : මේ SIA Account එක ඔබ සඳහන් කරපු අන්තිමට 591 න් ඉවර වෙන SIA Account එක කුමන ආයතනයකට අදාළ Account එකක්ද?

පි : එම Account එක හිමි වන්නේ ශාන්‍රී ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට.

ප : ශාන්‍රී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ SIA Account එකකට තමයි සෞදි අරාබියෙන් මුදල් ඇවිල්ලා තියෙන්නේ?

පි : ඔව්. ස්වාමීනි සෞදි අරාබියෙන් ඇමෙරිකානු ඩොලර් එක් ලක්ෂ හැත්තෑ අට දහස් පන්සිය පනස් පහක් ලැබිලා තියෙනවා.

ප : එක්ලක්ෂ හැත්තෑ අට දහස් පන්සිය පනස් පහක් ඇමෙරිකානු ඩොලර්ස් තමයි හම්බ වෙලා තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඒ SIA Account එකට ඒ මුදල් ආවට පස්සේ ඊට පස්සේ මොකද්ද සිද්ධ වෙලා තියෙන්නේ?

පි : SIA Account එකෙන් ස්වාමීනි එම සමාගමේම බැංකු ගිණුමක් තියෙනවා කොමර්ෂල් බැංකුවේ 1030018198 කියලා. ඒ ගිණුමට මුදල් හුවමාරු වෙනවා 2014, 2015 කාලය තුළ මිලියන 70 ක ප්‍රමාණයක්.

ප්‍ර : ඒ මිලියන 70 ක කොමර්ෂල් බැංකු ශාඛාවට හුවමාරු වුණාට පස්සේ මොකද්ද සිද්ධ වෙලා තියෙන්නේ?

පි : ඊට පස්සේ ස්වාමීනි මෙම ගිණුමට සල්ලි මාරු වුණාට පසුව එම ගිණුම් තුළින් ලැබුණු මුදල්වලින් ඉඩම් ප්‍රමාණයක් මිලදී අරගෙන ඇති බව විමර්ශනවලදී අනාවරණය කරගෙන තිබුණා ස්වාමීනි.

ප්‍ර : දැන් ඒ අනුව ඒ ඉඩම් මිලදී ගැනීම සම්බන්ධයෙන් ඔබ විමර්ශනය කරලා විශ්ලේෂණ දත්ත අඩංගු වාර්තාවකුත් සැකසුවා කිව්වොත් නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එය ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

(ස්වාමීනි ශාන්ත්‍රී සමාගම නමින් ඉඩම් මිලදී ගත් තොරතුරු දැක්වෙන ලේඛනය X-626(a)වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ ශාන්ත්‍රී සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වෙනස් වෙනවද නැද්ද කියලා පසුකාලීනව?

පි : නිවැරදියි ස්වාමීනි. 2019.07.27 හිරාස් හිස්බුල්ලා මහතා, අහමඩ හිරාස් හිස්බුල්ලා මහතා අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වෙනවා.

ප්‍ර : කවුද පත් වෙන්නේ?

පි : මොහොමඩ් අබ්දුල් කාදර් මොහොමඩ් ජසීන් කියලා පුද්ගලයෙක් ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ ලේඛනය ඔබට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ශාන්ත්‍රී සමාගමේ අධ්‍යක්ෂවරු වෙනස්වීමට අදාළ තොරතුරු දැක්වෙන ලේඛනය C-1381(c) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මම සාක්ෂිකරුගේ නැවත අවධානය යොමු කරනවා X-626(a) වශයෙන් ලකුණු කරපු මේ තිරයේ දැක්වෙන ලේඛනය

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන්. දැන් මෙම ලේඛනයට අනුව ඔබ සඳහන් කරලා තියෙනවා ශාන්ත්‍රී සමාගම නමින් මිලදී ගත් ඉඩම් කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඒ ඔප්පුවේ Transfer එක ඒ කියන්නේ ඔප්පුව මිලදී ගැනීමේ පාර්ශවය විදියට සඳහන් වෙන්නේ ශාන්ත්‍රී ප්‍රයිවට් ලිමිටඩ් කියන සමාගම?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔවුන් කොහෙන්ද ඉඩමක් ලබාගෙන තියෙන්නේ?

පි : ඔවුන් ඉඩම් කැබලි එකක් අරන් තියෙනවා මඩකලපුව එරාවුර් කොන්නුකුඩා ප්‍රදේශයෙන් අක්කර 117 ක ...,

ප්‍ර : ඉඩම් අක්කර 117 යි, රූඩ් 1 යි, පර්චස් 27 ක්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔප්පුවේ සඳහන් වටිනාකම කියද?

පි : 20 Million.

ප්‍ර : ඊට පසසේ ඔබ දෙවන වගුවක් නිර්මාණය කරලා තියෙනවා. එහි මාතෘකාව මොකද්ද?

පි : එහි මාතෘකාව විමර්ශනය තුළින් අනාවරණය වී ඇති ශාන්ත්‍රී සමාගම විසින් මුදල් ආයෝජනය කර වෙනත් නම්වලින් මිලදී ගත් ඉඩම්.

ප්‍ර : මොනවද ඔවුන් වෙනත් නම්වලින් මිලදීගෙන තියෙන ඉඩම්?

පි : එහිදී සඳහන් වන සමාගමක් ලෙස Serendib Commercial පුද්ගලික සමාගම.

ප්‍ර : ඔබ මීට ඉහතදී ඒ සම්බන්ධයෙන් විස්තරාත්මකව දත්ත දැක්වුවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන් Serendib Commercial සමාගම කොතරම් ඉඩම් මිලදීගෙන තියෙනවාද?

පි : Serendib Commercial පුද්ගලික සමාගම ඉඩම් කොටස් හතරක් අරන් තියෙනවා ස්වාමීනි. ඒ හතර ප්‍රමාණය අක්කර 44 ක්.

ප්‍ර : වටිනාකම ඔප්පුවේ සඳහන්?

පි : Seven Million.

ප්‍ර : ඊට පස්සේ තව දෙවෙනියාට දැක්වෙන පුද්ගලයා කවුද?

පි : ඒ.එල්.එම්.එම්. මුම්තාස්.

ප්‍ර : වශයෙන් නම සඳහන් වෙනවා. ඔහු ඉඩම් කොටස් කොච්චර අරන් තියෙනවාද?

පි : ඉඩම් කොටස් තුනක් අරන් තියෙනවා ස්වාමීනි. මෙම ඒක ඔප්පු තිබුණේ දෙමළ භාෂාවෙන් නිසා මෙතන මේ ප්‍රමාණය දා ගන්න

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අපහසු වෙලා තියෙනවා ස්වාමීනි. සමාවෙන්න ස්වාමීනි එම ප්‍රමාණය රුඩ් දෙකයි පර්චස් දෙකක් කියලා තියෙනවා. පැහැදිලිව මට පැහැදිලි වුණේ නැහැ ස්වාමීනි මතකයේ හැටියට එම ඔප්පුවේ දෙමළ භාෂාවෙන් තිබුණේ.

ප : ඒ අනුව මේ ශාන්ත්‍රී සමාගමේ නමට සහ වෙනත් සමාගම් සහ පුද්ගලයින් නමට ඉඩම් මිලදීගෙන තියෙනවා කියලා දැන් ඔබ මේ ලේඛනයේ දක්වනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප : මේ ඉඩම් මිලදී ගැනීමට භාවිතා කරලා තියෙන්නේ මොන මුදල්ද?

පි : මෙම ඉඩම් මිලදී ගැනීමටත් භාවිතා කරලා තියෙන්නේ ස්වාමීනි අර මුලින් සඳහන් කළ සෞදි අරාබියේ බැංකුවෙන් ලැබුණු ...,

ප : ඒ කියන්නේ අල් ඉන්බා බෑන්ක් සෞදි අරාබියාවෙන් ආපු US Dollars එක්ලක්ෂ...?

පි : එක්ලක්ෂ හැත්තෑ අට දහස් පන්සිය පනස් පහක මුදල ස්වාමීනි.

ප : එක් ලක්ෂ නෙමෙයි මිලියන. එක් මිලියන හැත්තෑ අට දහස් පන්සිය පහක මුදල පාවිච්චි කරලා තමයි ඒ මුදලේ කොටසක් පාවිච්චි කරලා තමයි මේ ඉඩම් මිලදීගෙන තියෙන්නේ කියලද විමර්ශනයේදී අනාවරණය වුණේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප : දැන් ඔබ මේ විශාල වශයෙන් සෞදි අරාබියාවෙන් මුදල් පැමිණිලා ඉඩම් මිලදී ගැනීම් සිද්ධ වෙච්ච ඉඩම් මිලදී ගැනීම් සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන්නා. ඔබගේ විමර්ශනයේදී අනාවරණය වුණාද මේ ඉඩම් මිලදී ගැනීම් තුළින් ලංකාවේ තියෙන ලිඛිත නීතියේ යම් යම් ප්‍රතිපාදන උල්ලංඝනය වීමක් ගැන?

පි : නිවැරදියි ස්වාමීනි. මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමේදී ඊට අදාළව ප්‍රකාශයකුත් සටහන් කළා ස්වාමීනි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරියගෙන්. එම ප්‍රකාශවලට අනුව අනාවරණය වුණේ ස්වාමීනි 2014 අංක 38 දරන ඉඩම් සන්තකයේ පැවරීම සීමා කිරීමේ පනත යටතේ වැඩි කොටස් ප්‍රමාණයක් හිමි විදේශ ජාතිකයෙකුට ශ්‍රී ලංකාවේ ඉඩම් මිලදී ගැනීමට හැකියාවක් නොමැති බවයි.

ප : ඔබ සඳහන් කරන පනත 2014 අංක 38 දරන Land Restriction and Elevation?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඒ පනත?

FAIR COMMENT — BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පනතේ Preamble එක උඩින් තියෙන අර පූර්විකාව ඔබට කියවන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. 2014 අංක 38 දරන ඉඩම් සන්තකයේ පැවරීම සීමා කිරීමේ පනතේ පූර්විකාවේ මෙසේ සඳහන් වෙනවා ස්වාමීනි. විදේශිකයන්ට, විදේශ සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරත්වය ඇති ඇතැම් ආයතනවලට ශ්‍රී ලංකාවේ ඉඩම් සන්තකයේ පැවරීම සීමා කිරීමට විධිවිධාන සැලසීම සඳහාද, නිදහස් කිරීම් ප්‍රදානය කර ඇති අවස්ථානුගත කරුණු නිශ්චිතව සඳහන් කිරීම් සඳහාද විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරත්වයක් ඇති ඇතැම් ආයතනවලට ඉඩම් බද්දට දීම වෙනුවෙන් ඉඩම් බදු කරන බද්දක් පැනවීම සඳහාද ඇතැම් සංවර්ධන ව්‍යාපෘති සඳහා සහන සැලසීම සඳහාද 2096 අංක 114 දරන මුදල් පනතේ 6 වන කොටස ඉවත් කිරීම සඳහාද ඊට සම්බන්ධ සහ ආනුශාංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ප්‍ර : දැන් මෙම පනතේ 2.1 වගන්තිය කෙරෙහි මම ඔබේ අවධානය යොමු කරනවා. එහි මොකද්ද දැක්වෙන්නේ?

පි : 2.1 වගන්තිය යටතේ ස්වාමීනි වෙනත් යම් ලිඛිත සඳහන් වෙනවා මේ ආකාරයට....,

ප්‍ර : Not standing any provisions to the cantering any other written law the transfer of title of any land situated of Sri Lanka ඒ කියන්නේ ලංකාව තුළ සිටි ඕනෑම ඉඩමක් සඳහා කියලා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : සඳහන් වෙනවා Shall be prohibited if such transfer is A වශයෙන් To a Foreigner, B - To a company incorporated in Sri Lanka under the companies act where any foreign share holding in such company the direct or indirect is 50% or above කියලා සඳහන් වෙනවා B?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : සිංහලෙන් ඔබ ඒ කෑල්ල කියනවද?

පි : එහෙමයි ස්වාමීනි. වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයකට පටහැනිව කුමක් සඳහන් වුවද ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති යම් ඉඩමක හිමිකම හා විදේශිකයෙකුට හෝ හා සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද විදේශීය කොටස් හිමිකාරත්වය සෘජුව හෝ වක්‍රව 50% ක් හෝ ඊට වැඩි

FAIR COMMENT — BY JEZEEM —

සමාගමකට හෝ විදේශ සමාගමකට පවරනු ලබන්නේ නම් තුන්වෙනි වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි නිදහස් කිරීමක් සිදුකර ඇත්නම් මිස ඒ පැවරීම තහනම් විය යුතුය කියලා සඳහන් වෙනවා.

ප්‍ර : පැහැදිලිව සඳහන් වෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව මෙහි දැක්වෙන්නේ මේ 2B කියන ලංකාවේ සංස්ථාපනය කරන ලද විදේශිකයෙකුගේ තියෙන කොටස් 50% ට වැඩි අවස්ථාවක් කියලා කිව්වොත් නිවැරදියිද?

පි : නිවැරදියි ස්වාමීනි හරි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ විසින් මෙම කොමිෂන් සභාවට විස්තර කරන්නට යෙදුණු ශාන්ති පුද්ගලික සමාගම සහ සයිලාන් බිස්නස් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් විසින් ඒ දේපළ ලබා ගත්තේ මෙම 2014 අංක 34 දරන පනත බලාත්මක වූවාට පසුවද?

පි : මෙම ඉඩම් බොහොමයක් ස්වාමීනි මිලදී ගෙන තියෙන්නේ 2011 වර්ෂයේ වාගේ.

ප්‍ර : එතකොට ඒ සීමාවල් තිබ්බද?

පි : සමාවෙන්න ස්වාමීනි, 2014 න් පස්සේ තමයි මේ ඉඩම් අරන් තියෙන්නේ. නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි ස්වාමීනි.

ප්‍ර : නිවැරදි කිරීමක්ද කරන්නේ ඔබ?

පි : එහෙමයි ස්වාමීනි.

****

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : ඊට අමතරව දැන් ඔබ සඳහන් කළේ ඉඩම් සන්තකය Land Restriction and alienation ඉඩම් ....?

පි : ඉඩම් සන්තකය පැවරීම සීමා කිරීම පනත.

ප්‍ර : දැන් ඊට අමතරව තවත් පනතක තවත් වගන්තියක් මේ මිලදී ගැනීම තුළ උල්ලංඝනය වෙලා තියෙනවද?

පි : එසේ නිරීක්ෂණය වුණා ස්වාමීනි 1972 Land Reformed පනතේ මෙම සීමා කිරීමක් තියෙනවා කියලා නිරීක්ෂණය වුණා ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : මොකද්ද ඒ පනත සඳහන් කරන්න පුළුවන්ද?

පි : ස්වාමීනි ඒ පනතේ ඉංග්‍රීසියෙන් සඳහන් වීමක් තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පනතේ කී වෙනි වගන්තියේද?

පි : වගන්ති අංක 3 සහ ස්වාමීනි වගන්ති අංක 8.

ප්‍ර : 3 සහ 8. 3 තමයි සඳහන් වෙන්නේ අක්කර 50 ක Feeling එකක් සඳහන් වෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : 8 හි සඳහන් වෙනවා කිව්වොත් නිවැරදිද එය සමාගමකට, Cooperative Society එහෙකට ඒ සියල්ලකටම අදාළ වෙනවා කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද දැන් මේ ඔබ පැහැදිලි කරපු ඉඩම් මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදු කෙරෙන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කරගෙන යන විමර්ශනයක් තියෙනවද කියලා?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ නඩු අංකයක් ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි. කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු ඉදිරිපත් කරලා විමර්ශනයක් පවත්වාගෙන යනවා ස්වාමීනි. එහි B අංකය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගන්න ඕන. මේ වෙලාවේ එහෙම මතකයක් නැහැ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ගොනුව නැද්ද ඔබ ගාව?

පි : ස්වාමීනි විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යාම සහ මහ ඉඩමක් පවරා දීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන ඒකකය විසින් B/1631/1/19 යටතේ 2019.07.17 වෙනි දින අළුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරලා විමර්ශනයක් පවත්වාගෙන යනවා ස්වාමීනි.

ප්‍ර : B/1631/1/19?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒක විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නේද?

පි : එහෙමයි ස්වාමීනි Batticoloa Campus එක සම්බන්ධයෙන්.

ප්‍ර : ඒ පුද්ගලික ඉඩම් ලබා ගැනීම මිලදී ගැනීම ඒකට ඇතුළත් කරලා තියෙනවද දන්නවද?

පි : නැහැ ස්වාමීනි ඒක වෙනම B වාර්තාවක් යටතේ පවත්වාගෙන යන්නේ.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරලා තියෙනවාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පුද්ගලික ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමීනි.

****

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : මහත්මයා පාසිකුඩා Calm Resort and SPa කියන ස්ථානයේදී සෞදි අරාබියානු ජාතිකයෝ තුන් දෙනෙක් සහ හිස්බුල්ලා මහත්මයා අතර යම්කිසි සංවාදයක් වෙනවා මාධ්‍යවලින් ප්‍රචාරය වුණා කිව්වොත් නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළව ආපු පුද්ගලයින්ගේ නම් ඔබට සඳහන් කරන්න පුළුවන්ද?

පි : ෆාහඩ් සාඩ්, මොහොමඩ් ඊබ්‍රාහිම්, අබ්දුල් හමාඩ් කියලා සඳහන් කරන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : නම් තුන වෙන වෙනම කියන්න 1, 2, 3 කියලා?

පි : අංක 1 ෆාහඩ් සාඩ්, 2වෙනි එක මොහොමඩ් ඊබ්‍රාහිම්, 3 වෙනි එක අබ්දුල් හමාඩ්.

ප්‍ර : දැන් ඔවුන් සම්බන්ධයෙන් සිදු කරන විමර්ශනයේදී ඔවුන් යම්කිසි සමාගමක කොටස්කරුවන් විදියට ඔබට අනාවරණය වුණාද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ සමාගම?

පි : ඒ සමාගම MAF International නමින් හඳුන්වන සමාගමක් ස්වාමීනි. 2017.11.10 වන දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරලා තියෙනවා.

ප්‍ර : ඊට අදාළ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම තහවුරු කිරීම දැක්වෙන ලේඛනයක් ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : නිවැරදියි ස්වාමීනි.

(ස්වාමීනි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන සමාගමේ ලියාපදිංචිය තහවුරු කිරීමට අදාළ ලේඛනය C-1382 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මෙහි ආරම්භක අධ්‍යක්ෂවරුන් විදියට කවුද දැක්වෙන්නේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි ආරම්භක අධ්‍යක්ෂවරුන් ලෙස මොහොමඩ් ඊබ්‍රාහිම් අල් කදාරි, අනිත් පුද්ගලයා අබ්දුල්ලා හමඩ් එන් අල් කදාරි, ෆාහඩ් සාඩ් අල්බරාක්, ආතම් ලෙබ්බේ මොහොමඩ් මුම්තාස්.

ප්‍ර : ඔවුන් කොහොමද කොටස් බෙදී ගිහින් තියෙන්නේ?

පි : මොහොමඩ් ඊබ්‍රාහිම් අල්කදාරි කොටස් 31,000 යි ස්වාමීනි. අබ්දුල් හමඩ් එන් අල්කදාරි 32,000 යි. ෆාහඩ් ෂාඩ් අල්බරාක් කොටස් 32,000 යි. ආත්මා ලෙබ්බේ මොහොමඩ් මුම්තාස් කොටස් 5000 යි ස්වාමීනි.

(ස්වාමීනි ඊට අදාළ සමාගම් දෙපාර්ත්මේන්තුව විසින් නිකුත් කරන ලද MAF International Private Limited සමාගමට අදාළ පෝරම 1, C-1382(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මහත්මයා ඔබගේ විමර්ශනයේදී ඔබට මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් University College කියන ආයතනයක් ගැන ඔබට අනාවරණය වුණාද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එහෙම ආයතනයක් තියෙනවද ඇත්තටම?

පි : එහෙම ආයතනයක් විමර්ශනයේදී තියෙනවා කියලා අනාවරණය වුණේ නැහැ ස්වාමීනි. මෙම නම අනාවරණය වුණේ කාත්තන්කුඩි කොමර්ෂල් බැංකුවේ ගිණුමක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී එම ගිණුම ආරම්භ කිරීමට ගිණුම් හිමියා විසින් ලබා දුන් ලේඛනවල මෙම නම සඳහන් වෙලා තිබුණා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබ ඊට අදාළව ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් University College කියන ඒ ගිණුමට අදාළව මූලික ගිණුම පවත්වාගෙන යන්නේ කුමන බැංකුවේද කියලා?

පි : ලංකා බැංකුව, කාත්තන්කුඩි ශාඛාවේ ස්වාමීනි.

ප්‍ර : ලංකා බැංකුව, කාත්තන්කුඩි ශාඛාවේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ගිණුම් අංකය මොකද්ද?

පි : අංකය ස්වාමිනි 74791337 ඒක ජංගම ගිණුමක් ස්වාමිනි.

ප්‍ර : ගිණුම විවෘත කිරීමේ දවස කවද්ද?

පි : විවෘත කරලා තියෙන්නේ 2013.06.24 ස්වාමීනි.

ප්‍ර : මෙම ගිණුම හසුරුවන්නන් ලෙස කවුද සඳහන් වෙන්නේ?

පි : ස්වාමීනි මේකේ ලිපිනයක් සඳහන් වෙනවා ගිණුමේ Title එක තියෙනවා ස්වාමීනි මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් University

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

College, Batticoloa කියලා. Address එක තියෙන්නේ Stadium Road, Kaththankudy.

ප්‍ර : කියලා තමයි සඳහන් වෙන්නේ. මම අහන්නේ කවුද ගිණුම හසුරුවන්න බලය තියෙන්නේ කියලා?

පි : හසුරුවන්න බලය තියෙන්නේ ස්වාමීනි මොහොමුද් ලෙබ්බේ අලීම් මොහොමඩ් හිස්බුල්ලා.

ප්‍ර : එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා සහ?

පි : මොහොමඩ් ෆාරුක් මොහොමඩ් සිබ්ලි.

ප්‍ර : සිබ්ලි ෆාරුක් මහත්මයාට තමයි ගිණුම මෙහෙයවන්න බලය තියෙන්නේ කිව්වොත් නිවැරදියිද?

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : ඔබ කිව්වේ එම්.එෆ්?

පි : එම්.එෆ්.එම්. සිබ්ලි.

ප්‍ර : එම්.එෆ්.එම්. සිබ්ලි කියන්නේ ඒක දිග කරලා කියන්න?

පි : මොහොමඩ් ෆාරුක් මොහොමඩ් සිබ්ලි.

ප්‍ර : 2015.06.24 න් පස්සේ Signaratireලා මාරු වෙලා තියෙනවා කිව්වොත් නිවැරදියිද?

පි : එහෙමයි ස්වාමීනි. ගිණුම ආරම්භ කරන කාලයේ සිටියේ Signaraties එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා සහ එම්.එල්.එෆ් සිබ්ලි. ඊට පසුව ස්වාමීනි 2015.06.24 න් පස්සේ මෙම ගිණුමේ හිමිකරුවන් ලෙස එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා සහ එම්.එච්.ඒ. හිරාස් ඔහුගේ පුත්‍රයා කටයුතු කරනවා ස්වාමීනි.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : දැන් මෙම ගිණුමට විදේශ මුදල් ප්‍රේෂණ ලැබී තිබෙනවාද?

පි : ලැබිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : තවදුරටත් සඳහන් වෙනවා Documents and Details obtain at the time of opening the account as per regulator requirement කියලා සඳහන් වෙනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මෙහි KYC for Office Bearers කියලා සඳහන් වෙනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ මේ යටින් සඳහන් වෙන්නේ මොකද්ද මහත්මයා MOU?

පි : MOU between Ministry of Youth Affairs and Skills Development and Sri Lanka HIRA Foundation, Date 11.06.2013 කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන 74791337දරන කාත්තන්කුඩි ශාඛාවේ පවත්වාගෙන යන ගිණුමට අදාළ සාරාංශ වාර්තාවක් C-1383 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : මෙම ගිණුමෙන් විදේශ ආමුඛ ප්‍රේෂණ මෙම ගිණුමට ලැබී තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමීනි. ඇමෙරිකානු ඩොලර් 186393.18 ක් ඇවිල්ලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඊට අදාළ Swift පත්‍ර ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි ඉදිරිපත් කළ හැකියි ස්වාමීනි.

ප්‍ර : මුල්ම Swift Transfer එක වෙලා තියෙන්නේ කවද්ද?

පි : මුල්ම Swift Transfer එක වෙලා තියෙන්නේ ස්වාමීනි 2015.06.24 දින.

ප්‍ර : US Dollers කීයක් ඇවිල්ලා තියෙනවද?

පි : 66613.38 ක්.

ප්‍ර : කවුද ඒ මුදල් එවලා තියෙන්නේ?

පි : මුදල් එවලා තියෙන්නේ ස්වාමීනි Ordering Customer ලෙස සඳහන් වෙලා තියෙනවා යහා අබ්දුල් අසීස් සුලෙයිමාන් අල්රෂඩ්, රියාද් KSA ලිපිනයක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : සඳහන් වෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : Remittance Information විදියට මොකද්ද සඳහන් වෙන්නේ?

පි : Remittance Information ලෙස සඳහන් වෙන්නේ ස්වාමීනි Family Expense (Student Medical) කියලා. Beneficiary name OMLIT University මම හිතන්නේ ස්වාමීනි ඒක තමයි මලික් ස්වාමීනි Beneficiary name Comlit University කියලා තියෙනවා ස්වාමීනි.

දැන් වේලාව ප.ව. 7.20 යි
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.07.20 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණි මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි 2015/06/24 දිනට අදාළව ඉදිරිපත් කරන ලද swift transfer පත්‍රය X 627 (A) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : තවත් විදේශ ආමුඛ ප්‍රේෂණයක් සිද්ධ වෙලා තියෙනවද?
පි : තියෙනවා ස්වාමිනි.
ප : කවද්ද මහත්මයා?
පි : දිනය 2015/07 වෙනි මාසේ 06
ප : කවුද එවලා තියෙන්නේ සල්ලි?
පි : යාහායා අබ්දුල්ලා අසීස් සුලෙයිමාන්අල් රෂීඩ්.
ප : අර කලින් කියපු පුද්ගලයාමයි?
පි : එහෙමයි ස්වාමිනි.
ප : කොච්චර ඩොලර් ප්‍රමාණයක් එවලා තියෙනවද?
පි : 79852.09 ක්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2015/07/06 වෙනි දිනැති සිදු කරන ලද ආමුඛ ප්‍රේෂණයට අදාළ swift පත්‍රය X 627 (B) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප : තවත් විදේශ ආමුඛ ප්‍රේෂණයක් සිද්ධ වෙලා තියෙනවද?
පි : එහෙමයි ස්වාමිනි. 2015/08/04 වන දින.
ප : කොපමණ මුදලක් පැමිණිලා තිබෙනවද?
පි : ඇමරිකානු ඩොලර් 39927.71 ක් ස්වාමිනි.
ප : කවද්ද ඇවිල්ලා තියෙන්නේ?
පි : 2015/08 වෙනි මාසේ 04
ප : කාගෙන්ද හම්බ වෙලා තියෙන්නේ?
පි : Amount එක ස්වාමිනි ප්‍රමාණය 39927.71 ක්.

ස්වාමිනි 2015/08/04 දිනැති සිදු කරන ලද ආමුඛ ප්‍රේෂණයට අදාළ swift පත්‍රය X 627 (C) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ස්වාමිනි මලික් අබ්දුල් අසීස් ගිණුම විවෘත කිරීම වෙනුවෙන් කාත්තන්කුඩි ශාඛාවට ඉදිරිපත් කරන ලද ලේඛන කීපයක් පෙන්වා සිටීමට අවසර පතනවා.

ප : මහත්මයා මෙය පරීක්ෂා කරලා බලන්න. මෙය එම ගිණුම විවෘත කිරීම සඳහා එම ආදළ බැංකුවට ඉදිරිපත් කරන ලද ලේඛන කට්ටලයක් කිව්වොත් නිවැරදිද?
පි : නිවැරදියි ස්වාමිනි හඳුනා ගන්නවා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි මලික් අබ්දුල්ලා බින් අබුදුල් අෂින් University College යන නමින් කාත්තන්කුඩි ශාඛාවේ ගිණුමක් විවෘත කිරීමට අදාළව ලබා දුන් ලේඛන කට්ටලය C 1384 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට ලබා දෙමි.

****

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා

ප්‍ර : සාක්ෂිකරු ඔබතුමා විසින් ණය ගිවිසුම් පතක් ලකුණු කෙරුවනේ C 1359 සිට C 1365 දක්වා?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : එම ණය ගිවිසුම්වල 07 වෙනි කොටසෙහි තිබෙනවා ඇපකරයක් ගැන. ඔබතුමාගේ විමර්ශන කටයුතුවලදී මෙම ඇපකරයක් ගැන සඳහන් කරලා ඒ ඇපකරය බලන්න ඉල්ලුවද?

පි : හිස්බුල්ලා මහතාගේ ප්‍රකාශ සටහන් කිරීමේ නම් ස්වාමිනි එවැනි ඇපකරයක් සම්බන්ධයෙන් කරුණක් අනාවරණය වුණා කියලා මට ප්‍රකාශ සටහන් කිරීමේදී

සාක්ෂිකරුට C 1359 පෙන්වයි.

ප්‍ර : එකේ 07 වෙනි වගන්තිය බලන්න. 07 වෙනි වගන්තියේ තියෙනවා නේද ණය සඳහා සුරැකුමක් සම්බන්ධයෙන් Security for the loan?

පි : කී වෙනි පිටුවෙද ස්වාමිනි.

ප්‍ර : 07 වෙනි වගන්තියේ?

පි : 07 වෙනි වගන්තිය ස්වාමිනි සඳහන් වෙනවා Loan agreement mean this loan and security agreement ලෙස. නිවැරදි ස්වාමිනි 07 වෙනි වගන්තියේ security යනුවෙන් සඳහන් වෙලා එහි සඳහන් වෙනවා Barrow a here by grant to lender as a Security for this lone

ප්‍ර : ඒ කියන්නේ ඒ ණය සම්බන්ධයෙන් සුරැකුමක් වශයෙන් නේද?

පි : එහෙමයි ස්වාමිනි එහෙම තමයි තියෙන්නේ.

Present Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : දැන් ඒ අන්දමට මේ සුරැකුමක් ඔබතුමාට පෙන්නුවද?

පි : නැත ස්වාමිනි. එවැනි දෙයක් ඔහු සඳහන් කළේ නෑ.

ප්‍ර : ඒ සුරැකුම ගන්න ඒ පුද්ගලයින් දෙදෙනාගේ නම් දෙකත් සඳහන් වෙලා තිබෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොකක්ද නම් දෙක?

පි : එකක් මොහොමඩ් ලෙබ්බේ අලීම් මොහොමඩ් හිස්බුල්ලා and අහමඩ් හීරාස් හිස්බුල්ලා are the person guarantee

ප්‍ර : guarantee සමඟ ඊට අමතරව තියෙනවා stand by agreement?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : පොරොන්දු ගිවිසුමක් කියලා එහෙම නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ගිවිසුම පෙන්නුවාද?

පි : නැත ස්වාමිනි. වැඩිදුරටත් අනාවරණය කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් මේ සියලුම මේ ගිවිසුම්වල මේ අන්දමට සුරැකුමක් සම්බන්ධයෙන් සඳහන් කරලා තිබෙනවා නමුත් ඒවා එකක්වත් ඔබතුමාට පෙන්නලා නැහැ?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : හරිද?

පි : නිවැරදියි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

****

<u>ගරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ පෙන්වන ලද තොරතුරුවල අර මන්නාරම දිස්ත්‍රික්කයේ අක්කර දෙදාස් ගාණක ඉඩමක් තිබුණනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ඉඩම්වල දැන් මෙම සමාගම් විසින් මිලදී ගැනීමට ප්‍රථම එහි අයිතිය තිබුණේ කාටද කියන එක පිළිබඳව ඔබගේ විමර්ශනවලදී හෙළි වුණාද?

පි : ස්වාමිනි බොහෝ ඔප්පු ලබා ගත්තා ප්‍රකාශ සටහන් කිරීමේදී. ඒ සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන නිලධාරීනුත් ඔප්පු ලබා ගෙන ඉඩම්වලට ස්ථාන පරීක්ෂාවක් පවා කරලා තියෙනවා. දැන් ඔවුන් තවදුරටත් ඉදිරියට ගිහිල්ලා එම පුද්ගලයන්ව හඳුනා ගෙන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කරමින් පවතිනවා දැනට පවතින විමර්ශනයේදී.

ප්‍ර : ඒ කියන්නේ මේ පෞද්ගලික ඉඩම් අයිති පුද්ගලයන්ගෙද ඒ ඉඩම්?

පි : එහෙමයි ස්වාමිනි පෞද්ගලික පුද්ගලයන්ගේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

සාක්ෂිකරුව මුදා හරිමි.

මෙම සාක්ෂිකරුගේ සම්පූර්ණ සාක්ෂිය අප්‍රසිද්ධියේ මාධ්‍ය හා මහජනතාව නොමැතිව ලබා ගත් බව සටහන් කර තබමි.

දැන් වේලාව : ප.ව.07.30 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.12.11 වේලාව :- ප.ව 4.25

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, ,රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : අබ්දුල් කාදර් ෆාතිමා හාදියා
ප්‍රතිඥා දී සාක්ෂියට කැඳවයි.
වැඩිදුර සාක්ෂි සඳහා කැඳවයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: හාදියා මම කියන දේ ඇහෙනවද? මම කොමිෂන් සභාවේ සභාපති කථා කරන්නේ මම කියන දේ ඇහෙනවද ෆාතිමාට?
පි: ඔව්
ප්‍ර: ඇහෙනවද මං කියන එක?
පි: ඔව්
ප්‍ර: ෆාතිමාට සනීප නැතිව නේද හිටියේ?
පි: ඔව්
ප්‍ර: කෝවිඩ් හැදුනද?
පි: ඔව්.
ප්‍ර: කොහේද ෆාතිමා දැන් ඉන්නේ ෆාතිමා දැන් කොහේද ඉන්නේ?
පි: බෝගම්බර බන්ධනාගාරයේ.
ප්‍ර: බෝගම්බර බන්ධනාගාරයේ සම්පූර්ණයෙන් සනීප වෙලාද ඉන්නේ?
පි: දැන් හොඳයි
ප්‍ර: දැන් හොඳයි?
පි: ඔව්.
ප්‍ර: කවද්ද බෝගම්බර බන්ධනාගාරයට ආයෙත් ආවේ?
පි: දිනය මතක නැහැ.
ප්‍ර: මතක නැහැ තාම බෙහෙත් ගන්නවද?
පි: නැහැ.
ප්‍ර: අද දවස මොකක්ද කියලා ෆාතිමා දන්නවද?
පි: ඔව්.
ප්‍ර: මොකක්ද අද දවස?
පි: සිකුරාදා.
ප්‍ර: දිනය මතකද? දිනය දන්නවද?
පි: ඔව්.
ප්‍ර: කියන්න බලන්න?
පි: 11 වෙනිදා
ප්‍ර: 11 වෙනිදා කොයි මාසේද?
පි: දෙසැම්බර්
ප්‍ර: දෙසැම්බර් මාසේ අවුරුද්ද මතකද?
පි: 2020.
ප්‍ර: හාදියා දැන් වෙලාව කීයද කියලා දන්නවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: නැහැ.

ප්‍ර: ඔතන ඉන්න ඔය නිලධාරියාගෙන් නැත්නම් නිලධාරිණියගෙන් අහලා කියන්න?

පි: 4.35.

(පොඩ්ඩක් ඉන්න මං හාදියාගෙන් ආයෙත් ප්‍රශ්න ටිකක් අහනවා. ඊට ඉස්සෙල්ලා මට පොඩි සටහන් කිරීමක් කරන්න තියෙනවා. පොඩ්ඩක් අහගෙන ඉන්න මං ආයිත් ප්‍රශ්න අහන්නම්.)

සාක්ෂිකාරියගෙන් ලබා ගන්නා ලද සාක්ෂි සලකා බැලීමෙන් පසුව 2015 අංක 04 දරණ පනතේ 31 (2) උප වගන්තිය ප්‍රකාරව ඇයගේ සාක්ෂිය මෙම ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය ඔස්සේ ලබා ගැනීම සුදුසු බව කොමිෂන් සභාවට පෙනී යන හෙයින් මෙම මාධ්‍යය ඔස්සේ ඇයගේ වැඩිදුර සාක්ෂි ලබා ගැනීම සුදුසු බව කොමිෂන් සභාව තීරණය කරයි.

ප්‍ර: හාදියා ඔබ මීට පෙර කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන්නා මතකද?

පි: ඔව්

ප්‍ර: අපිට ඒ ඔබ කියපු සාක්ෂිවල තව වැඩිදුර විස්තර කර ගැනීම ඕන හින්දයි ඔබගෙන් මේ වගේ තවදුරටත් සාක්ෂි අහන්නේ. හරිද හාදියා?

පි: හරි.

ප්‍ර: ජමීල් මොහොමඩ් සහරාන්ව හම්බවෙන්නේ කොයි කාලේද ඉස්සෙල්ලම?

පි: පස්සේ තමයි ජමීල් කියලා නම දන්නේ. අබු හම්සා කියලා තමා කථා කරන්නේ සහරාන් ඊට පස්සේ 2019 ඒ 04 වැනි මාසේ සහරාන් අබු හම්සා අබු හම්සා කියලා කතා කරන්නේ. පස්සේ තමයි රිල්වාන් මල්ලි කිව්වේ. ජමිල් කියලා 2016 දෙසැම්බර් මාසේ ඉඳලා කොළඹ rent එකට ඉඳලා තමා ඒ ගොල්ලො කථා කරලා තිබුණේ.

ප්‍ර: ඔබ කියපු එක පොඩ්ඩක් පැහැදිලි මදි මට ඇහුණ විදිය මං කියන්නම් හරිද කියලා කියන්න?

පි: හරි.

ප්‍ර: සහරාන් ජමීල්ව හමුවෙන්නේ 2016 ද?සහරාන් ජමීල්ව ඉස්සෙල්ලම දැනගන්නේ 2016 ද?

පි: ඔව්.

ප්‍ර: සහරාන්ට කොහොමද ජමීල්ව හම්බ වෙන්නේ?

පි: 2016 අබුනාදියා කියලා එක්කෙනෙක් සහරාන්ගේ මල්ලි රිල්වාන්ට ඇවිල්ලා කථා කරනවා. ඒ වෙලාවේ තමා කොළඹ කට්ටිය හම්බෙන්න එනවා කියලා සහරාන්ව. අබුනාදියා කියලා එක්කෙනෙක් තමා එයාට පණිවිඩය කියන්නේ රිල්වාන්ට. රිල්වාන් ඒකේ සහරාන්ට කියනවා. ඊට පස්සේ එක දවසක් බැටිකලෝ GV ප්‍රයිවට් හොස්පිටල් එක ඉස්සරහා යන පාරේ තමා ගිහිල්ලා ඒ ගොල්ලෝ හම්බෙලා ආවේ. ඒ කොළඹ ඉඳලා පස් දෙනෙක් ආවා කියලා කිව්වේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොළඹ ඉඳලා ආපු පස් දෙනා එක් කෙනෙක්ගේ නම ඔයා කිව්වා අබුනාදියා කියලා?

පි: අබු නාදියා එයා කොළඹ එක්කෙනෙක් නෙමේ එයාට තමා කොළඹ ඉන්න කට්ටිය පණිවිඩය කියන්නේ ගිහිල්ලා කියන්න කියලා

ප්‍ර: එතකොට අබු නාදියා කාත්තන්කුඩියේ එක්කෙනෙක්?

පි: එයා අනුරාධපුරයේ එක්කෙනෙක්.

ප්‍ර: අනුරාධපුරයේ එක්කෙනෙක්?

පි: ඔව්

ප්‍ර: එතකොට මේ සහරාන්ව හම්බෙන්න ජමීල් එන්නේ කී දෙනෙක් එක්කද?

පි: ජමීල් එක්ක පස්දෙනෙක් එනවා.

ප්‍ර: ජමීල් එක්ක පස්දෙනෙක් එනවා. ජමීල් කියලා ඔබ දැන් හැම වෙලේම කියන්නේ අර අබු හම්සා කියන එක්කෙනා නේද?

පි: ඔව්

ප්‍ර: ඒ ජමීල් එක්ක ආපු අනෙක් අය නම් දන්නවද?

පි: ඔව්

ප්‍ර: කියන්න පුළුවන්ද හාදියාට?

පි: ඔව්

ප්‍ර: කියන්න?

පි: අබුබරා, අබු අබ්දුල්ලා,අබුහම්සා, අනිත් දෙන්නාගේ නම් මතක නැහැ.

ප්‍ර: හරි. අබු අබ්දුල්ලාගේ නම?

පි: අසාම් මුබාරක්.

ප්‍ර: හාදියා දන්නවද?

පි: ඔව්

ප්‍ර: කියන්න බලන්න?

පි: අසාම් මුබාරක්.

ප්‍ර: අසාම් මුබාරක්?

පි: ඔව්.

ප්‍ර: එතකොට මුබාරක්, ජමීල්, අබුබරා කියන්නේ ඉල්හාම් මොහොමඩ්?

පි: ඔව්.

ප්‍ර: ඉල්හාම් ඊබ්‍රාහිම් මොහොමඩ් නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට අනිත් දෙන්නාගේ නම් ඔයා දන්නේ නැහැ?

පි: නැහැ.

ප්‍ර: ඇයි මේ ජමීලුයි සහරානුයි හම්බ වෙන්නේ?

පි: ඒක ඒගොල්ලන් කලින් ඇවිල්ලා හම්බ වෙන කොට එතකොට මං දන්නේ නෑ. පස්සේ තමා සහරාන් 2019 පෙබරවාරි මං ගෙදර ඉඳලා කටුවාපිටිය ඉඳලා ආවට පස්සේ තමයි ඒ ගොල්ලෝ මේකට IS එකේ සංවිධානයට ජමීල් උදව් කරනවා කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කවුද හාදියාට කිව්වේ ජමීල් IS සංවිධානයට උදව් කරනවා කියලා?

පි: අබු හම්සා කියලා සහරාන් තමයි කිව්වේ එයා තමා ඉස්සෙල්ලා සිරියාවට යන්න හිටියේ එයා තමයි මේ ලංකාවට අබු එක්ක link එකේ ඉන්න සිරියා ඉන්න කෙනා කියලා අබු සුවේර්කියලා

ප්‍ර: අන්තිම ටික ආපහු කියන්න. කියපු අන්තිම වචන ටික ඇහුන් නැහැ හාදියා ආයෙත් කියන්න?

පි: 2019 පෙබරවාරි මාසේ 20 න් පස්සේ

ප්‍ර: කියන්න?

පි: සහරාන් අබු හම්සා කියලා එක්කෙනෙක් සිරියාවේ ඉන්න අබු සුවේර් කියලා එක්කෙනා එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා කියලා තමයි කිව්වේ

ප්‍ර: සිරියාවේ ඉන්න එක්කෙනාගේ නම අපහු කියන්න?

පි: අබු සුහේඩ්

ප්‍ර: ඒ සිරියාවේ ඉන්න එක්කෙනා ලංකාවේ එක්කෙනෙක්ද නැත්නම් සිරියාවේ එක්කෙනෙක්ද?

පි: ලංකාවේ කෙනෙක්

ප්‍ර: ලංකාවේ කෙනෙක් සිරියාවට ගිහිල්ලා?

පි: ඔව්.එයා 2013 ඒ කාලේ ගිහින් තියෙන්නේ.

ප්‍ර: 2013 ගියා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය අබු සුහේඩ් කියන එක්කෙනාගේ ලංකාවේ ඉන්නකොට නම දන්නවද?

පි: නැහැ.

ප්‍ර: එහෙම නමක් කිව්වද ඔයාට කොයි හරි වෙලාවක ඇහුනාද?

පි: පැහැදිලි නැහැ.

ප්‍ර: ඒ අබු සුහේඩ් කියන එක්කෙනාගේ ලංකාවේ නම කොයි වෙලාවක හරි ඔයාට ඇහුණද?

පි: 2019. මේ CID ඉන්න කාලේ තමයි එයාගේ නම දන්නේ මං . ඊට කලින් දන්නේ නැහැ. ලංකාවේ තිබුණා නම.

ප්‍ර: මම නමක් කිව්වොත් ඒ නමද කියලා කියන්න පුළුවන්ද?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ අබු සුහේඩ් නේද?

පි: සුහේඩ්

ප්‍ර: ලංකාවේ කියපු නම ඉෂාක් අහමඩ්ද?

පි: නිලාම් කියලා තමයි කිව්වේ

ප්‍ර: නිලාම් කියලද කිව්වේ?

පි: ඔව්.

ප්‍ර: දැන් 2016 සහරාන්ව මේ කට්ටිය හම්බවුණාට පස්සේ දිගටම අබුහම්සාත් එක්ක සහරාන් සම්බන්ධකම් පැවැත්වුවද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ආයේ කියන්න පුළුවන්ද?

ප්‍ර: 2016 කාත්තන්කුඩිවල සහරාන්ව අබුහම්සා අනිත් අයත් හම්බ වුණායින් පස්සේ දිගටම ඒ කට්ටිය මේ කථා කෙරුවද සම්බන්ධවෙලා හිටියද?

පි: ඔව් ඒ කියන්නේ එයාගේ ෆෙරන් එකෙන් ටෙලිග්‍රෑම් ඇප් එකෙන් තමයි වැඩිපුරම කථා කරන්නේ.

ප්‍ර: ටෙලි ග්‍රෑම් ඇප් එකෙන් තමයි වැඩිපුර කථා කෙරුවේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය අබු හම්සා එක්ක සිරියාවේ ඉන්න වෙන කවුරුහරි සම්බන්ධවෙලා හිටියද?

පි: ඒ දන්නේ මම එක්කෙනෙක් කියලා අබු සුහේඩ් කියලා තමා සම්බන්ධ කියලා කතා කරලා තියෙන්නේ.

ප්‍ර: ඒ අබු සුහේඩ් කියන තැනැත්තා මේ කොයි හරි වෙලාවක මැරුණා කියලා ආරංචි වුණාද?

පි: එයා 2005 සහරාන් කිව්වා අබු සුහේඩ් කියලා එක්කෙනෙක් සිරියාවේ මැරුණා කියලා

ප්‍ර: මැරුණා කියලා කිව්වා?

පි: ඔව්

ප්‍ර: අබු සුහේඩට ඇරෙන්න ජමීල් සිරියාවේ ඉන්න වෙන කවුරු හරි සමඟ සම්බන්ධතා නැත්නම් කථා කරපු බව හාදියා දන්නවද?

පි: ජමීල් කියලා දන්නේ නැහැ අබුබරා කියලා එක්කෙනෙක් තමා එයා අන්තිමට තමා සිරියාවේ එක්කෙනා එක්ක Link එකෙන් ඉන්නවා කියලා සහරාන් කථා කරලා තියෙන්නේ.

ප්‍ර: එතකොට ඉස්සෙල්ලා අබු සුහේඩ් අබු හම්සාත් එක්ක තමා කථා කරලා තියෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ සහරාන් කියනවා අබු සුහේඩ් අබු බරාත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා කියලා?

පි: ඔව්.

ප්‍ර: අබු සුහේඩ් ගැන හාදියා තව මොනවා හරි දන්නවද?

පි: අබු සුහේඩ් ගැන සහරාන් වැඩි විස්තර දන්නේ නෑ. එයා සිරියාවේ මැරුණා කියලා කිව්වලු.ඉන් පස්සේ එයාගේ නමට තමා පුත්තලම වනාතවිල්ලුව එකේ සහරාන් ඒ ඉඩම ගත්තේ අක්කර 80 ගාණක එක එයාගේ නමින් තමයි අබු සුහේඩ් කියලා ඒ ඉඩමට නම දාලා තියෙන්නේ.

ප්‍ර: දැන් අබු සුහේඩ් මැරුණාම පස්සේ හදියා කිව්වානේ අබු බරාත් එක්ක තව කවුරු හරි සිරියාවේ ඉඳලා කථා කෙරුවා කියලා?

පි: අබු සුහේඩ් මැරුණාට පස්සේ වෙන එක්කෙනෙක් අබුසුහේඩ් අබුබරා එක්ක ලින්ක් කරලා තමා තියෙන්නේ කියලා කිව්වේ. එයා එක්ක තමා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අබු බරා තමා සහරාන්ට පණිවිඩ කියන්නේ මෙයා කතා කරා කියලා සිරියාවේ ඉඳගෙන.

ප්‍ර: එතකොට අබු සුහේඩ් මැරුණයින් පස්සේ තවත් කවුරු හරි අබු බරාත් එක්ක සම්බන්ධ වීමක් තියෙනවා ?

පි: ඔව්

ප්‍ර: ඒ කවුද එයාගේ නම මොකක්ද?

පි: එයාගේ නම මම දන්නේ නැහැ.

ප්‍ර: නම දන්නේ නැහැ?

පි: නැහැ

ප්‍ර: ලංකාවේ එක්කෙනෙක්ද සිරියාවේ එක්කෙනෙක්ද ?

පි: ඒ දන්නේත් නැහැ.

ප්‍ර: ඒ අබු බරාත් එක්ක සිරියාවේ ඉඳලා සම්බන්ධ වුණ එක්කෙනා දිගටම ඒ වගේ අබු බරාත් එක්ක කථා කෙරුවද?

පි: ඒ සහරාන් කෝල් එකෙන් කථා කරන වේලාවේ තමා බරා මේ පණිවිඩය කිව්වා කියලා මං දැන ගත්තේ.

ප්‍ර: ඒ දෙන්නාට අමතරව තවත් සිරියාවේ ඉන්න කවුරු හරි එක්ක ඔය සහරාන්ගේ කණ්ඩායය මේ කවුරුහරි සම්බන්ධතාවයක් තිබ්බද?

පි: නැහැ දන්නේ නැහැ.

ප්‍ර: දන්නේ නැහැ හාදියාට මතක නේද අබු හින්ද්වා?

පි: එයා ඉන්දියා එක්කෙනා.

ප්‍ර: ඔයා ඒක අපිට ගිය පාර කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් තව වැඩි විස්තර ටිකක් ඕනේ. අපිට කියන්න හාදියා අබුහින්ද් ඉස්සෙල්ලාම සහරාන් එක්ක මේ කථා කරන්න පටන් ගන්නේ කොයි කාලේද?

පි: 2017 අන්තිමේ.

ප්‍ර: 2017 අන්තිමේ?

පි: ඔව්

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.5.50
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : අබු හින්ද් මොනවද සහරාන් එක්ක කතා කරන්නේ?

පි : එයා කතා කරන්නේ 2018. ඒ අබු හින්ද් කියලා සහරාන් එක්ක telegram app එකෙන් link එක තිබුණා අබු හින්ද් කියලා. ඉන් පස්සේ 2018 ඉඳලා තමයි එයා කතා කරන්නේ වීඩියෝ යවන්න කියලා. ඒ වුණාට ඉන්දියාවේ එකෙන් සිරියාවට ගිහින් තියෙනවලු පොඩි වයසේ එක්කෙනෙක් අවුරුදු 18ක් 15ක වගේ. එයා ගැන විස්තරයක් සහරාන්ට එවලා තිබුණා. මම ළඟ ඉන්නකොට එයා කතා කරන්නේ නැහැ.

ප්‍ර : අර අවුරුදු 18 ක එක්කෙනෙක් ගැන මොනවද අබු හින්ද් සහරාන්ට කියලා තිබ්බේ? මම ආයේ කියන්නම්. අවුරුදු 18ක එක්කෙනෙක් ගැන අබු හින්ද් මොනවද සහරාන්ට කියලා තිබ්බේ?

පි : එයා ගැන විස්තරය කියලා තිබ්බා. එයාගේ නමත් එක්ක එයා මෙහේ ඉඳලා සිරියාවට ගිහින් තියෙනවා කියලා විස්තරය කියලා තිබුණා. අර article....

ප්‍ර : කොහේ ඉඳලා සිරියාවට ගිහිල්ලා තියෙනවද කියලද?

පි : Indian

ප්‍ර : එතකොට ඒ අවුරුදු 18ක ඉන්දියාවේ ඉඳලා සිරියාවට ගියායි කියන එක්කෙනායි අබු හින්ද් කියන එක්කෙනායි එකම අයද නැත්නම් දෙන්නෙක්ද?

පි : දෙන්නෙක්.

ප්‍ර : එතකොට අර අවුරුදු 18 එක්කෙනා සිරියාවට ගිහිල්ලා මොනවද කරලා තියෙන්නේ?

පි : එයා එහේ ගිහිල්ලා මරාගෙන මැරිලා.

ප්‍ර : එහේ ගිහිල්ලා මරාගෙන මැරිලා?

පි : ඔව්.

ප්‍ර : ඒ මරාගෙන මැරුණු විස්තර අබු හින්ද් එවලා තිබුණද සහරාන්ට?

පි : ඔව්.

ප්‍ර : කොහේද මැරුණේ මොනවා කරන්න ගිහිල්ලද කියලාත් විස්තර එවලා තිබුණද?

පි : ඒ සිරියා එකේ මවුසුල් රක්කානායයි කියන ප්‍රදේශයේ තමයි.

ප්‍ර : මුසුල් මුසුල්?

පි : ඔව්.

ප්‍ර : එහේ මැරුණා කියලායි කිව්වේ?

President secretary's copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඒ වගේ විස්තර අබු හින්ද් ඇයි සහරාන්ට එව්වේ?

පි : සහරාන් මේ එයාගේ FB page එකේ telegram එකේ group තිබුණා. ඒකෙන් අන්සාර් කිලාෆත් කියලා channel එකෙන් දාලා තිබුණේ මේ විස්තරේ.

ප්‍ර : කාගේ විස්තරයද සහරාන් දාලා තිබ්බේ?

පි : India ඉඳන් ගියපු එක්කෙනාගේ විස්තර සිරියාවට.

ප්‍ර : එතකොට එයා ගැන වැඩි විස්තරද මේ අබු හින්ද් සහරාන්ට එව්වේ?

පි : ඔව්.

ප්‍ර : අබු හින්ද් වෙන මොනවද සහරාන්ට එව්වේ?

පි : අනිත් සිරියාවේ තියෙන පණිවිඩ අබු හින්ද් තමයි සහරාන්ට එවලා තියෙන්නේ. ඒ කියන්නේ මේ සහරාන් කතා කරන දේශනා කරපු වීඩියෝ හින්ද්ට යවනවා. හින්ද් තමයි සිරියාවට යවන්නේ කියලා කතා කළේ.

ප්‍ර : සහරාන්ගේ දේශන සහරාන් අබු හින්ද්ට යවනවා?

පි : අබු හින්ද්ට යවනවා.

ප්‍ර : එතකොට අබු හින්ද් ඒක සිරියාවට යවනවා?

පි : ඔව්.

ප්‍ර : සිරියාවේ කාටද යැව්වේ අබු හින්ද්?

පි : කාටද කියන්නේ සිරියාවේ නායකයාට තමයි මේ ඔක්කෝම documents යවන්න ඕනි කියලා කතා කළේ. ඒගොල්ලන්ගේ articles දේශනා එහෙම.

ප්‍ර : එතකොට සිරියාවේ නායකයා කවුද?

පි : අබුබකර් අල්බක්දාදී කියලා.

ප්‍ර : අබුබකර් අල්බක්දාදී?

පි : ඔව්.

ප්‍ර : එතකොට අබු බකර් අල්බැක්ඩැඩී නායකයා හැටියටද අබු හින්ද් සැළකුවේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට සහරානුයි, අබු බකර් අතර කෙළින්ම සම්බන්ධයක් තිබ්බේ නැද්ද?

පි : නැහැ.

ප්‍ර : අබු හින්ද් හරහා තමයි සම්බන්ධයක් තිබ්බේ?

පි : ඔව්.

ප්‍ර : කොච්චර කල් ඔය අබු හින්ද් හරහා සම්බන්ධයක් තිබ්බද? දැන් හාදියා අපිට කිව්වානේ 2017 අන්තිම කාලේ තමයි අබු හින්ද් සහරාන් එක්ක සම්බන්ධ වෙන්නේ කියලා? ඒ කාලයේ ඉඳලාම අබු

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හින්ද් අල්බක්දාදී සමඟ සහරාන්ගේ තොරතුරු බෙදා ගත්තද නැත්නම් පස්සේද ඒක වුණේ?

පි : 2019 April 19 වෙනකම් අබු හින්ද් එක්ක සහරාන් කතා කරා. ඊට පස්සේ 21න් පස්සේ තමයි සහරාන්ගේ මල්ලි රිල්වාන් 2019 April 25 වෙනකම් එයත් එක්ක කතා කරේ.

ප්‍ර : හාදියාට තේරෙන්න නැතුව ඇති මං අහපු ප්‍රශ්නය. මම ආයෙත් අහන්නම්. 2017 අන්තිම ඉඳලා අබු හින්ද් සහරාන් එක්ක කතා කරනවා. මගේ ප්‍රශ්නය වුණේ ඒ 2017 අන්තිම කාලේ ඉඳලාම අබු හින්ද් සහරාන්ගේ තොරතුරු සිරියාවේ අල්බක්දාදීට ඇරියද? නැත්නම් ඊට පස්සේ කාලයකද එහෙම පටන් ගත්තේ?

පි : පැහැදිලි නැහැ.

ප්‍ර : දැන් මේ අබුහින්දුයි සහරානුයි 2017 අන්තිම ඉඳලා කතා කරනවානේ?

පි : ඔව්.

ප්‍ර : පණිවිඩ යවනවානේ දෙගොල්ලොන්ට. සහරාන් අබු හින්ද්ට යවනවා. අබු හින්ද් සහරාන්ට එවනවා. හරිද ඒක?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ 2017 අන්තිම කාලේ ඉඳලාම සහරාන්ගේ විස්තර අල්බක්දාදීට අබු හින්ද් ඇරියද නැත්නම් ඒක පස්සේද පටන් ගත්තේ?

පි : මම දැකලා තියෙන්නේ 2017 ඉඳලා සහරාන් එයාට යවනවා කියලා තමයි මං දන්නේ.

ප්‍ර : 2017 අවසානයේ ඉඳලා සහරාන් මේ අබු හින්ද්ට පණිවිඩ යවනවා?

පි : ඔව්.

ප්‍ර : හාදියාට දැන ගන්න ලැබෙනවද මේ සහරානුයි අබු හින්දුයි ඉස්සෙල්ලාම සම්බන්ධ වෙන්නේ කොහොමද කියලා? ඒ දෙන්නා ඉස්සරවෙලාම කතා කරන්න පටන් ගත්තේ කොහොමද? දැන් දෙන්නා රටවල් දෙකකනේ ඉන්නේ? ඒ දෙන්නා දන්නේ නැහැනේ කොහොමද මේ කට්ටිය හම්බවෙන්නේ?

පි : ඒ සම්බන්ධය කොහොමද කියලා දන්නේ නැහැ. එයාගේ telegram appවලින් තමයි අබු හින්ද් කියලා එක්කෙනෙක් ඉන්නේ. නම දාලා තිබුණේ එහෙම තමයි එයා එයාට...

ප්‍ර : සහරාන් මේ විදියේ ප්‍රහාරයක් එල්ල කරන්න හේතුව මොකක්ද?

පි : ඒ හේතුව කළින් මම දන්නේ නැහැ මොකටද කියලා. පස්සේ තමයි දැන ගත්තේ.

ප්‍ර : මොකක්ද හේතුව?

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : ඒ කියන්නේ පිටරටවල මුස්ලිම් පොඩි ළමයෙක් මැරුණා කියලා. ඉන් පස්සේ New Zealand එකේ ක්‍රිස්තියානි එක්කෙනෙක් අපේ මුස්ලිම් කට්ටිය වදින වෙලාවේ ගිහිල්ලා මැරුවා කියලා. ඒක තමයි.

ප්‍ර : සහරාන් කොයි කාලේද මේ මැරෙන්න තීරණයක් කළේ?

පි : පැහැදිලියි.

ප්‍ර : සහරාන් කොයි කාලේද මෙහෙම මරාගෙන මැරෙන්න හිතුවේ?

පි : ඒ කියන්නේ මරාගෙන මැරෙනවා කියලා මං දන්නේ නෑ. IS කියලා ඒ සම්බන්ධය තියෙනවා කියලා දන්නවා මං.

ප්‍ර : මැරෙන්න යනවා කියලා හාදියාට දැනුම් දුන්නේ නැද්ද?

පි : වෙන තැනකට යනවා කියලා කිව්වේ. හිජ්‍රා යනවා කියලා.

ප්‍ර : හිජ්‍රා යනවා කියලා කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : එහෙම හිජ්‍රා යන්න එයා තනියම එයා හිතුවද නැත්නම් වෙන කවුරුහරි එයාට කිව්වද හිජ්‍රා යන්න කියලා?

පි : ඒ කියන්නේ එයා තමයි කිව්වේ එයා එක්ක තව කට්ටිය හිජ්‍රා යනවා කියලා, කියලා තිබුණේ. වෙන තැනකට යනවා කියලා.

ප්‍ර : සහරාන් කිව්වා තවත් කට්ටියත් එක්ක හිජ්‍රාවලට යනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : මං ඇහුවේ හාදියා එහෙම සහරාන් අනිත් අයත් එක්ක හිජ්‍රා ගියේ නැත්නම් හිජ්‍රා යන්න හිතුවේ එයාම තනිවම ඒක කරන්න හිතලද? නැත්නම් පිටරට කවුරුහරි එයාට කිව්වද ඒක කරන්න කියලා?

පි : මං පස්සේ දැන් ගත්තේ පිටරට කවුරුත් කිව්වේ නැහැලු. 21න් පස්සේ April ප්‍රහාරයෙන් පස්සේ කිව්වේ එයාගේ මල්ලි රිල්වාන් ඒගොල්ලෝ තමයි මෙහෙම තීරණය කරේ කියලා පස්සේ තමා සිරියාවට නායකයාට ඒගොල්ලෝ පණිවිඩය කිව්වේ කියලා මෙහෙම කරන්න ඉන්නේ ලංකාවේ කියලා.

ප්‍ර : රිල්වාන් කියපු ආපහු හිමිහිට කියන්න හාදියා.

පි : 2019 April මාසේ 21න් පස්සේ , සහරාන්ගේ මල්ලී රිල්වාන් එයා තමයි කිව්වේ ලංකාවේ ඒගොල්ලෝ මෙහෙම තීරණය කරා කියලා මැරෙන්න. ඉන් පස්සේ තමයි නායකයාට දැනුම් දීලා තියෙන්නේ කියලා.

ප්‍ර : හාදියා කියන හැටියට මේ කට්ටිය ඔක්කෝම හිජ්‍රාත් කරන්න තීරණය කෙරුවේ ඒ කට්ටියමයි ලංකාවේ?

පි : ලංකාවේ කට්ටිය.

ප්‍ර : වෙන කවුරුත් කියලා නෙවෙයි?

පි : නැහැ.

ප්‍ර : එහෙම හිජ්‍රාත් කරන්න අබු හින්ද් කිව්වද?

පි : ඒ ගැන මං වැඩිය දන්නේ නැහැ. කවුද කිව්වේ කියලා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : රිල්වාන් කිව්වද අබු හින්ද් කිව්වා කියලා මෙහෙම කරන්න කියලා?

පි : අබු හින්ද්ට සහරාන් තමයි කියලා තිබුණාලු මෙහෙම කරනවා කියලා.

ප : අබු හින්ද්ට සහරාන් කියලා තිබ්බා මෙහෙම කරනවා කියලා?

පි : ඔව්.

ප : හාදියා මේ අබු හින්ද්ගේ පින්තූරයක් දැකලා තියෙනවද?

පි : නැහැ.

ප : අබු හින්ද් සහරාන් එක්ක කතා කළේ මොන භාෂාවෙන්ද?

පි : දෙමළ භාෂාවෙන්.

ප : දෙමළ භාෂාවෙන් විතරද?

පි : දෙමළ භාෂාවෙන් තමයි වැඩියෙන් කතා කළේ.

ප : අබු හින්ද්ගේ වයස එහෙම දන්නවද? දන්නේ නැහැ?

පි : නැහැ.

ප : සහරාන් එහෙම කියලා නැහැ?

පි : නැහැ.

ප : ඉන්දියාවේ කොහේද ඉන්නේ කියලා කිව්වද?

පි : India එක්කෙනෙක් කියලා තමයි කිව්වේ.

ප : දැන් මේ බෝම්බ හදන්න මේ කට්ටිය කොහෙන්ද ඉගෙන ගත්තේ? ආයිත් මං කියන්නම්. මේ කට්ටිය ඒ කියන්නේ සහරාන්ගේ කට්ටිය බෝම්බ හදන්න ඉගෙන ගත්තේ කොහෙන්ද?

පි : ඉගෙන ගත්තේ හස්තූන් කියලා එක්කෙනෙක් තමයි ඒ සිරියා එකෙන් article අරන් දුන්නේ. Link එක. ඒ Link එකෙන් තමයි බලලා ඉංග්‍රීසිවලින් තියෙනවා අබුඩාබීක් කියලා page එකක්. ඒ page එකෙන් හස්තූන් තමයි ඒ ඉගෙන ගත්තේ කියලා කතා කළේ.

ප : අබුඩාබීක් කියන සහරාවෙන් Magazine එකෙන්?

පි : ඔව්.

ප : හස්තූන් තමයි ඒක හොයා ගත්තේ?

පි : ඔව්.

ප : දැන් හාදියාට මතකයි නේද රිල්වාන් 2018 අගෝස්තු 27 තුවාල වෙනවා. පිපිරීමක් වෙලා?

පි : ඔව්.

ප : ඒ පිපිරීම වුණේ රිල්වාන් මොනවා කරන්න ගිහිල්ලද?

පි : එයා බෝම්බ එක හදලා ඒකේ testing කරන්න අරන් ගියාලු පාලමුනෙ ප්‍රදේශයට.

ප : එතකොට ඒ 2017 අගෝස්තු 27 රිල්වාන් බෝම්බ හදන්න ගියේ අර හස්තූන් ඩාබීක් සහරාවෙන් ගත්තු තොරතුරු අනුවද නැත්නම් වෙනත් විදියකටද?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : ඒ හස්තූන් එක්ක එකතු වෙලා කරපු එක තමා හැදුවා බෝම්බ තමා කියලා කතා වුණේ.

ප්‍ර : ඒ හස්තූන් එක්ක එකතු වෙලා හදන්න ගිය බෝම්බ තමයි ඒ වෙලාවේ පිපිරුණේ?

පි : ඔව්.

ප්‍ර : අබු හින්ද් සහරාන්ට සල්ලි එහෙම එවලා තියෙනවද?

පි : එහෙම දන්නේ නැහැ.

ප්‍ර : හාදියා දන්නවද නමක් අහමඩ් ලුක්මන් තාලිබ් කියලා? මම නම ආපහු කියන්නම් අහමඩ් ලුක්මන් තාලිබ්? එයාටත් කියන්නේ අබු අබ්දුල්ලා කියලා?

පි : අබු අබ්දුල්ලා කියලා කතාවක් කරනවා ගොඩක් ඒ කියන්නේ එයාගේ appවලින් ගොඩක් නම තියෙනවා අබු අබ්දුල්ලා කියලා. එයාගේ ඇත්ත නම දන්නේ නැහැ.

ප්‍ර : ඒ කියන්නේ සහරාන්ගේ phone එකේ අබු අබ්දුල්ලා කියලා නම තිබ්බා?

පි : ඔව්.

ප්‍ර : හාදියා දන්න හැටියට ඒ අබු අබ්දුල්ලා කිව්වේ ලතීෆ්ටද නැත්නම් අබු අබ්දුල්ලාගේ ඇත්ත නම හාදියා දන්නේ නැද්ද?

පි : ඇත්ත නම මම දන්නේ නැහැ. අබු නම තියෙන්නේ ඒ එයාගේ app එකේ.

ප්‍ර : phone එකේ අබු අබ්දුල්ලා කියන එක තියෙනවා විතරක් දන්නවා? ඔය විදියට ඔය app එක පාවිච්චි කරලා කතා කරන්න සහරන්ට කවුද ඉගැන්වුයේ?

පි : ඒ කස්තූන් තමයි ඒ app එක හදලා දුන්නේ කට්ටියට.

ප්‍ර : හස්තූන් තමයි ඒ app එක හදලා දුන්නේ?

පි : ඔව්.

ප්‍ර : හාදියා දන්නවද මේ පුලස්තීනි ඉන්දියාවට ගිහිල්ලා තියෙනවා කියලා?

පි : නැහැ.

ප්‍ර : ඒක කිව්වේ නැද්ද ඔයාට? මං කියන්නේ 2019 අප්‍රේල් 21ට ඉදස්සෙල්ලා?

පි : නැහැ.

ප්‍ර : පුලස්තීනි කියලා තිබුණේ නැද්ද කොහේ කොහේ රටවල්වලටද එයා ගියේ කියලා?

පි : පුලස්තීනි කියලා තියෙන්නේ එයා අබුඩාබී ගිහින් තියෙනවා කියලා.

ප්‍ර : අබුඩාබි ගියා කියලා විතරයි කියලා තිබ්බේ?

පි : ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : වෙන රටවල්වලට ගියා කියලා කිව්වේ නැහැ?

පි : නැහැ.

ප : ඔය පුලස්තීනි අබු හින්ද් ගැන දැනගෙන හිටියද?

පි : ඒක ගැන නම් වැඩිය මං දන්නේ නැහැ.

ප : ඒක දන්නේ නැහැ. 2019 අප්‍රේල් 21ට පස්සේ රිල්වාන් අබු හින්ද් සමඟ මේක කතා කෙරුවද?

පි : ඔව්.

ප : එතකොට රිල්වාන්ව අබු හින්ද් එක්ක සම්බන්ධ කෙරුවේ කවුද?

පි : සහරාන්.

ප : එතකොට අප්‍රේල් 21ට පස්සේ රිල්වාන් අබු හින්ද් එක්ක කතා කෙරුවද?

පි : ඔව් සර්.

ප : එතකොට රිල්වාන් මොනවා හරි අබු හින්ද්ට ඇරියද?

පි : ඒගොල්ලෝ 2019 April 21 අර ප්‍රහාරයට කලින් දිවුරුම් දුන් වීඩියෝ ඒ ඔක්කෝම අබු හින්ද්ට යවලා තිබුණා රිල්වාන්.

ප : ඒ අබු හින්ද්ට ඇරියේ රිල්වාන්?

පි : ඔව්.

ප : හාදියාට මතකද කවදා විතරද ඒක අබු හින්ද් රිල්වාන් ඇරියේ කියලා?

පි : 2019 April 21 හවස් වෙලා තමයි ඒ video clip

ප : අප්‍රේල් 21 හවසම ඇරියා?

පි : ඔව්.

ප : හාදියා දන්නවද අර රිල්වාන් අබු හින්ද්ට යවපු ඒ දිවුරුම් දීම සම්බන්ධ වීඩියෝ එක ඒකද මේ සිරියාවේ තිබ්බ web එකේ දැම්මේ?

පි : පැහැදිලි නැහැ.

ප : දැන් හාදියා කිව්වානේ රිල්වාන් තමා අර දිවුරුම් දීම අබු හින්ද්ට ඇරියේ කියලා?

පි : ඔව්.

ප : එතකොට අබු හින්ද් ඒක අල්බක්දාදී නැත්නම් එයාගේ කාට හරි ඇරියා කියන එක රිල්වාන් දැන ගත්තද?

පි : ඒ වෙලාවේ රිල්වාන් කිව්වා එයාගේ අයියා සහරාන්ට කතා කළේ. ෂෙයිනිට. ෂෙයිනිට කතා කරලා තමා අබු හින්ද්ට යවන්න ඕනි. ඒකේ සිරියාවේ අල්බග්දාදීට ඒක යවන්න ඕනි කියලා. ඒගොල්ලන් හාර අරන් කියලා.

ප : කවුද ඒක අල්බග්දාදීට යවන්න ඕනි කියලා කිව්වේ?

පි : අබු හින්ද් තමයි යවන්න කිව්වේ.

ප : අබු හින්ද් තමයි කිව්වේ ෂයිනිට?

පි : රිල්වාන් සෙයිනිට කිව්වා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට රිල්වාන්ට ඒක කියලා තිබ්බේ අබු හින්ද්?

පි : කරා.

ප්‍ර : එතකොට අප්‍රේල් 21ම ඒවා ඇරියද අබු හින්ද්ට?

පි : ඔව්.

ප්‍ර : එතකොට අප්‍රේල් 21ට පස්සේ අබු හින්ද් රිල්වාන්ට කතා කෙරුවද?

පි : ඔව්.

ප්‍ර : කී සැරයක් කතා කෙරුවද?

පි : හැමදාම call ගන්නවා. 2019 April 21 ඉඳන් 25 වෙනකම්. 25 වෙනිදා වෙනකන් රිල්වාන් කතා කරනවා අබු හින්ද් එක්ක.

ප්‍ර : අප්‍රේල් 25 වෙනකම් රිල්වාන් අබු හින්ද් එක්ක කතා කරා?

පි : ඔව්.

ප්‍ර : අබු හින්ද් දැනගෙන හිටියද රිල්වාන්ලා ඉන්නේ කොහෙද කියලා?

පි : රිල්වාන් ඒගොල්ලන්ට විස්තරය කිව්වා. Eastern side එකේ ගේ 3ක් තියෙනවා කියලා. ඒ විස්තරය කියලා තිබ්බා.

ප්‍ර : රිල්වාන් කියලා තිබ්බා අබු හින්ද්ට දැන් අපි ඉන්නේ මේ නැගෙනහිර පළාතේ කියලා?

පි : ඔව්.

ප්‍ර : කොතනද කියලා හරියටම කිව්වද?

පි : ඒ තැන කිව්වේ නැහැ. නැගෙනහිර පළාතේ කියලා තමයි එයත් කියලා තිබුණේ.

ප්‍ර : නැගෙනහිර පළාතේ තමා කියලා කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : හාදියා දන්නවද රිල්වාන්ට වෙන නමක් තිබ්බා කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ නම?

පි : අබු කිතාල්.

ප්‍ර : ජල්අල් කිතාල් කියන්නෙත් රිල්වාන්?

පි : ඔව්. ජාඅල් කිතාල්

ප්‍ර : එකොට අබු හින්ද් දැනගෙන හිටියද රිල්වාන්ට කියන්නේ මේ නම කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ රිල්වාන්ට ඒ නම දැම්මේ කවුද?

පි : ඒ ගැන දන්නේ නැහැ.

ප්‍ර : සාරා නැත්නම් පුලස්තීනි දැනගෙන හිටියද රිල්වාන්ට කියන්නේ ජාල් කිතාල් කියලා?

පි : ඔව්.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : භාදියා අප්‍රේල් 21 වෙනිදාට පස්සේ අබු හින්ද් රිල්වාන්ට මොනවහරි මේ කියල තිබ්බද මෙන්න මෙහෙම කරන්න කියලා? තේරුණාද?

පි : නැහැ තේරුණේ නැහැ.

ප : දැන් අප්‍රේල් 21 වෙනිදා බෝම්බ ගියානේ. ඊට පස්සේ දැන් අබු හින්ද් රිල්වාන් එක්ක දිගටම කතා කෙරුවා කියලා කිව්වානේ?

පි : ඔව්.

ප : එතකොට ඒ කතා කරන කොට අබු හින්ද් රිල්වාන්ට කිව්වද ඉස්සරහට මොනවද කරන්න ඕනි කියන එක?

පි : අබු හින්ද් තමයි රිල්වාන්ට අහලා තිබුණේ safety ඉන්නවද කියලා. Safety ඉන්න කියලා තමයි එයා කතා කළේ. කවුද එළියට යන්නේ කියලාත් අහලා තිබුණා.

ප : එහෙම යන්නේ නැතුව හැංගිලා ඉන්න කියලා කිව්වද අබු හින්ද් නැත්නම් වෙන මොනව හරි කරන්න කියලා කිව්වද?

පි : ඒ කියන්නේ ඉන්න තැන safety නම් ඔහොම ඉන්න කියලා තමයි ඒ කතා කරලා තියෙන්නේ.

ප : ඉන්න තැන ආරක්ෂාවනම් එතනම ඉන්න කියලා?

පි : ඔව්.

ප : අබු හින්ද් ගැන නවුෆර් මවුලවි දැනගෙන හිටියද?

පි : ඔව්.

ප : නවුෆර් මවුලවි අබු හින්ද් එක්ක කතා කෙරුවද?

පි : ඔව් සර්.

ප : සාරා අබු හින්ද් එක්ක කතා කෙරුවද?

පි : සාරාද

ප : ඔව් සාරා. පුලස්තීනි අබු හින්ද් එක්ක කතා කෙරුවාද?

පි : නැහැ. දන්නේ නැහැ.

ප : සාරා අබු හින්ද් ගැන දැනගෙන හිටියද? මං ආයත් අහන්නම් සාරා අබු හින්ද් ගැන දැනගෙන හිටියද?

පි : ඒක දන්නේ නැහැ.

ප : ඔය අබු හින්ද් කියන එක්කෙනා ලංකාවට ඇවිල්ලා තියෙනවද?

පි : නැහැ. මං

ප : අබු හින්ද්ගේ පවුලේ විස්තර එහෙම සහරාන් දන්නවද?

පි : එහෙම මං දන්නේ නැහැ.

ප : අබු හින්ද් කියන්නේ ඉන්දියාවේම ඉපදිලා එහේ ඉන්න එක්කෙනෙක්ද නැත්නම් ලංකාවෙන් එහෙට ගිහිල්ලා ඉන්න එක්කෙනෙක්ද?

පි : ඉන්දියාවේ එක්කෙනෙක් කියලා තමයි කිව්වේ.

ප : සහරාන් තව මොනවද විස්තර කිව්වේ අබු හින්ද් ගැන?

පි : එයා ගැන වැඩිය විස්තර කිව්වේ නැහැ. එයා ඉන්දියා කියලා කිව්වේ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : දැන් ගිය පාර හාදියා අපිට කිව්වා නේද අබුහින්ද් සමහරක් වෙලාවට recorded, Messages, පණිවිඩ සහරාන්ට එවලා තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : මොනවද ඒවායේ තිබිලා තියෙන්නේ?

පි : අන්තිම දවස්වල තිබුණේ නවුෆර් මවුලවි එක්ක, නවුෆර් මවුලවිට අරාබිවලින් article එකක් එවලා තිබුණාලු. ඒක translate කරලා ආයේ යවන්න කියලා. ඒකේ නවුෆර් ඒක හරියට කිව්වේ නැහැ කියලා නවුෆර්ට පොඩ්ඩක් කියන්න කියලා තමයි සහරාන්ට ඒ voice එක එවලා තිබුණේ.

ප්‍ර : දැන් ඔය අබු හින්ද් ගැන දැනගෙන හිටියේ සහරාන්, නවුෆර් මවුලවි, හාදියා, රිල්වාන්, ෂෙයිනි විතරද?

පි : ඔව්

ප්‍ර : වෙන කවුරුත් ඔය කණ්ඩායමේ එයා ගැන දැනගෙන හිටියේ නැහැ?

පි : එහෙම මං දන්න අය මේගොල්ලෝ විතරයි.

ප්‍ර : දන්නේ මේගොල්ලෝ විතරයි නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ගියපාර මේ හාදියා අපිට කිව්වා සාරා කිව්වා කියලා මේ ඒ කියන්නේ අප්‍රේල් 21 බෝම්බ පුපුරන්න පටන් ගත්තාම පස්සේ සාරා කිව්වා කියලා මේ තව එක්කෙනෙක් ගිහිල්ලා තියෙනවා මොනව වුණාද දන්නේ නැහැ කියලා?

පි : පැහැදිලි නැහැ.

ප්‍ර : දැන් අප්‍රේල් 21 බෝම්බ ගියානේ. බෝම්බ පත්තු කෙරුවානේ. ඊට පස්සේ සාරා හාදියාට කිව්වද එක් අවස්ථාවකදී මේ තවත් එක්කෙනෙක් කොළඹ තව තැනකට ගියා. එයා ගැන අරාංචියක් නැහැ කියලා?

පි : මතක නැහැ.

ප්‍ර : අප්‍රේල් 21 න් පස්සේ රිල්වාන්, ෂෙයිනි නැත්නම් සාරා කියනවා ඇහුණද හාදියාට නැත්නම් හාදියාට කිව්වද ඇයි අර තව හෝටලයකට ගිය එක්කෙනා බෝම්බය පිපිරුණේ නැත්තේ කියලා? ටාජ් හෝටලයට ගිය එක්කෙනා ඇයි බෝම්බේ පිපිරුණේ නැත්තේ කියන්න හේතුව කිව්වද?

පි : ඒ රිල්වාන් තමයි ඒකේ කතා කරලා තිබුණේ. සාරා FB ඒකේ එතකොට ඒ වීඩියෝ එකේ ටාජ් හෝටෙල් වෙලාවට හදපු බෝම්බ එක හරි ගියේ නැහැලු. ඒක පිපිරුණේ නැහැ කියලා තමයි රිල්වාන් කතා කළේ. ඊට පස්සේ තමයි ඒ කතාව සාරා කිව්වේ.

ප්‍ර : එතකොට සාරා කිව්වේ බෝම්බය පිපිරුණේ නැහැ කියලද වෙන මොනවා හරිද කිව්වේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 8දෙනාට එක වෙලාවට තමයි හදලා තිබුණාලු. අටයි හතළිස් ගාණට. අරයට ටාජ් හෝටලයට ගියපු එක්කෙනාට තමයි පරක්කු කියලා කතා කළේ. ඊට පස්සේ රිල්වාන් තමයි ඒ කතාව කිව්වේ. එයා වෙන තැනකට ආයේ වෙන හෝටලයකට ගිහිල්ලා තමා පුපුරගෙන තියෙන්නේ.

ප්‍ර : හාදියාට අපිට කියපු ඒවාට අමතරව තව මොනවා හරි කියන්න තියෙනවද?

පි : නැහැ.

හරි හාදියා බොහොම ස්තුතියි සාක්ෂි ලබා දීම ගැන.
සාක්ෂිකාරියගෙන් පැහැදිලි කර ගැනීම් මෙතනින් අවසන් කරනවා.
සාක්ෂිකාරියා නැවත නිසි ස්ථානයට ගෙන යාමට බන්ධනාගාර නිලධාරින්ට නියෝග කරනවා.

එසේම බන්ධනාගාර නිලධාරින් දෙදෙනා නම් කරන්න අපිට
ජේලර් සී.ඒ. විජේසිංහ
නියාමක විනෝද් වීරසිංහ

ප්‍ර : ඔතන කී දෙනෙක් ඉන්නවද?

පි : 3 දෙනෙක් ඉන්නවා ස්වාමිනි.

ප්‍ර : අපිට කියලා තිබ්බෙ දෙන්නායි ඉන්නේ කියලා?

පි : ස්වාමිනි system operate කරන්න හිටියේ මම. ඒක භාරව හිටියේ ජේලර් විජේසිංහ මහතා. මෙයා කාන්තාවක් හින්දා කාන්තා නියාමිකාවක් හිටියා ස්වාමිනි.

ප්‍ර : හරි නැවතත් ඔය තුන්දෙනාගේම නම් කියන්න.

පි : ජේලර් සී.ඒ. විජේසිංහ, නියාමක විනෝද් වීරසිංහ, කාන්තා නියාමක කේ.ඒ.එස්.එස්. කුමාරපේළි
ඔය නිලධාරින් තුන්දෙනා තමාඅමතන්නේ කොමිෂන් සභාව. ඔබ ඔතන රාජකාරි කටයුතු කරන අවස්ථාවේ දී මේ දැන් දැන ගත්තු දේ අතිශය රහසිගතව ලබාගනු ලබන සාක්ෂියක් බව සළකන්න ඕනි. මොකද කොමිෂන් සභාවත් මේ වැඩිදුර පැහැදිලි කර ගැනීම ගත්තේ කිසිම මාධ්‍යකින් තොරව මහ ජනතාවත් නොමැතිව කොමිෂන් සභාවේ නිලධාරින් පමණක් සිටින අවස්ථාවක.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ නිසා ලබා දුන් සාක්ෂිය යම් හෙයකින් ඔබ තුන්දෙනාගේ මාර්ගයෙන් බාහිරට යන්න දෙන්න එපා.

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එලෙස යම් හෙයකින් ගිහිල්ලා තිබෙන බවට අනාවරණය වුණොත් නීතියට අනුව ඔබලාට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න වෙනවා. තේරුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

කොමිෂන් සභාව සහ බන්ධනාගාරය අතර සම්බන්ධතාවය නවත්වනවා.

****

දැන් වෙලාව : ප.ව. 5.30
කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 6.00තෙක් කල් තබනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.12.11 වෙලාව: ප.ව.7.40

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>මෙම සාක්ෂිය මාධ්‍යය නොමැතිව ලබා ගන්නා බව සටහන් කරමි.</u>

<u>වැඩිදුර සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම : හේරත් මුදියන්සේලාගේ චන්දික නිලංක හේරත්

ප්‍රතිඥා දී කැඳවයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ මීට පෙර මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන්නා නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඊට පසුව ඔබ මෙම කොමිෂන් සභාවට ලිපියක් එවලා තිබෙනවද ඔබ සහ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක අම්පාර?

පි : එසේය ස්වාමිනි.

එම ලේඛනයේ මුල් පිටපත සාක්ෂිකරුට පෙන්වයි.

ප්‍ර : ඔබ විසින් කොමිෂන් සභාවට එවපු ලේඛනය මෙකද?

පි : එසේය ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ලේඛනය X – 643 වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : මෙම ලිපිය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට හේතු වුණේ මොකක්ද?

පි : ස්වාමිනි මේ පාස්කු දෙවන ප්‍රහාරය වළක්වා ගැනීමට නිලධාරින් රාශියක් දායක වුණා. ඒකේ මේ වෙනකම් නිලධාරින් ඇගයීමට ලක් කෙරුවේ නැහැ. ඒ සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියලා තමයි මේ ලියුම හැදුවේ.

ප්‍ර : එම ලිපිය සමඟ ඇමුණුම් කිහිපයක් තිබෙනවා නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : එම ඇමුණුම් අතර යම්කිසි ලේඛනයක් තිබෙනවද අත්අඩංගුවට ගත් ත්‍රස්තවාදීන්ගේ ලැප්ටොප් පරිගණක සහ දෘඩ තැටි මඟින් ඔවුන් පුපුරණ ද්‍රව්‍ය සාදාගත් ආකාරය අනාවරණය කර ගැනීමට හැකිවීම යනුවෙන් සඳහන් කරන ලද ලේඛනයක්?

පි : තියෙනවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එය මෙම X – 643 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ කී වෙනි ඇමුණුමද?

පි : 20 ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ ඇමුණුම 20 වශයෙන් ලකුණු කරලා තිබෙන එම දත්ත සහ ඡායාරූප 2ක් තිබෙනවා නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : කොහෙන්ද මේවා රාජ්‍ය බුද්ධි සේවය ලබා ගත්තේ?

පි : ස්වාමිනි සමන්තුරේ ගබඩාවෙයි, නින්දවූර් ගබඩාවෙයි සහරාන්ගේ laptop 2ක් හම්බුණා. ඒ laptop 2 පරීක්ෂා කරනකොට ඔය වගේ ඒ කට්ටිය පුපුරණ ද්‍රව්‍ය හදන්න උපයෝගී කර ගත්ත වීඩියෝ රාශියක් අපට හම්බුණා. ඒ වීඩියෝවල පැහැදිලිවම තියෙනවා ඒ කට්ටිය ඒ වීඩියෝ බලලා තමයි හදලා තියෙන්නේ. ඒ වගේම පොත්පත් ඒ කට්ටිය පරීශීලනය කරපු පොත්පත්. ඒ වගේම video clip තිබුණා ගොඩක්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයේ ඇති ඇමුණුම 20 මේ අවස්ථාවේදී X – 643 (A) වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : මෙම X – 643 (A) දරණ ලිපියේ නැත්නම් ලේඛනයේ ඡායාරූප 2ක් තිබෙනවා නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මොනවද ඒ දෙක? මොනවාහරි මොකක්ද එහි මූලාශ්‍රය එතන අරාබි භාෂාවෙන් මොනවාහරි තියෙනවද නැත්නම්?

පි : මේකේ ඔක්කෝම video clipවල මේ සහරාන්ලාගේ team එක ගැන, ලංකාවේ කට්ටිය කවුරුත් මේ වීඩියෝවල නැහැ. මේ ඔක්කෝම බෝම්බ හදන ආකාරය දැක්වෙන වීඩියෝ. ඒ කියන්නේ සල්ෆියුරික් අම්ලය, නයිට්‍රේට් අම්ලය යොදාගෙන කොහොමද බෝම්බ හදන්න පුළුවන් මේකට layers දාන්නේ කොහොමද, ඊයම් බෝල දාන්නේ කොහොමද කියලා videoවලින් පෙන්වන දර්ශන තමයි ඔක්කෝම තියෙන්නේ. ඒවා විදේශීය රටක තමයි පටිගත කරලා තියෙන්නේ. අරාබිවලිනුයි ඉංග්‍රීසි භාෂාවෙනුයි තියෙන වීඩියෝ තමයි මේවගේ තිබ්බේ.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එම වීඩියෝ කොහේද නිපදවලා තියෙන්නේ කියන එක ඔබගේ විමර්ශනවලදී අනාවරණය වුණාද?

පි : ඒ වීඩියෝ මේ කට්ටිය ලංකාවේ හදපු එකක් නෙවෙයි ස්වාමිනි. මේ වීඩියෝ නිරීක්ෂණය කරාම පේනවා මේක විදේශිය රටක IS සංවිධානයෙන් ලබාගෙන එහෙම නැත්නම් අන්තර්ජාලයෙන් මොකක් හරි ත්‍රස්තවාදී සංවිධානයක් හදන වීඩියෝ තමයි ඔක්කෝම වීඩියෝ තිබ්බේ.

ප්‍ර : එම වීඩියෝ පට ලබා ගත්තේ සාමාන්‍ය අන්තර්ජාලයෙන්ද නැත්නම් dark webවලින්ද කියන එක සොයා ගැනීමක් ?

පි : නැහැ මේක මේ කට්ටියගේ laptop පරිගණක යන්ත්‍රවල තමයි තිබ්බේ ස්වාමිනි. කොහේද ඒක වෙනම foldersවල save කරලා තිබ්බේ මේවා. ඒවා ලබා ගත්ත ආකාරයක් දන්නේ නැහැ. මේ කට්ටිය ඒක ගොඩක් වීඩියෝයි, පොත්පතුයි පරීශීලනය කරලා තියෙනවා කියලා පෙනී ගියා.

ප්‍ර : දැන් රාජ්‍ය බුද්ධි සේවාවේ විමර්ශනවලදී යම් අනාවරණය වීමක් සිදු වුණාද දැන් ඔබ මේ X – 643 (A) දරණ ලේඛනයේ විදේශිය වීඩියෝ පට ගැනනේ කතා කරන්නේ. ඒ මත පදනම් කර ගත් මේ ත්‍රස්තවාදීන් විසින් අඳින ලද නැත්නම් ඔවුන් භාවිතා කරන ලද යම් දත්තයන් ඔබගේ විමර්ශනවලදී අනාවරණය වුණාද?

පි : එසේය ස්වාමිනි. මේ වීඩියෝ පටවල භාවිතා කරන්නේ සල්ෆියුරික් ඇසිඩ්, නයිට්‍රේට්වලට විශේෂයෙන්ම ටොලරින් කියන රසායනික ද්‍රව්‍යය යොදවලා වැඩි බලයක් ලබා දෙන high explosive ඒ කියන්නේ C4වලට සමාන තත්ත්වයක් හදා ගන්න ආකාරය තමයි පේන්නේ. මේ සම්බන්ධයෙන් අම්පාර අවි ගබඩා, මේ සම්බන්ධයෙන් විශේෂඥයෙක් ඉන්නවා අම්පාර. මේ ප්‍රාදේශිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවි පාලක කියලා. එතුමා හම්බවෙලා මේ සම්බන්ධයෙන් කරුණු විමසුවා. එතුමාත් පැහැදිලි කරා මේ කට්ටිය වැඩි හරියක් උත්සාහ කරලා තියෙන්නේ නයිට්‍රේටුයි සල්ෆියුරික්වලට ටොලරින් කියන එක මිශ්‍ර කරලා C4 තත්ත්වයේ පුපුරණ ද්‍රව්‍ය සාදා ගැනීමක් තමයි කරලා තියෙන්නේ කියලා.

ප්‍ර : දැන් මෙම X – 643 (A) දරණ ලේඛනයේම ඇමුණුමක් වශයෙන් යම්කිසි ලේඛනයක් තිබෙනවද ආමි මොහිදීන් නැත්නම් බදුර්දීන් මොහොමදු මොහිදීන් සම්බන්ධයෙන් යම් තොරතුරු අඩංගු කරලා ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ ඇමුණුම ?

පි : ඇමුණුම 8 ස්වාමිනි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් දැනටමත් ඉදිරිපත් කරන ලද ලේඛනය X – 643 හි ඇති 8 වන ඇමුණුම මේ අවස්ථාවේදී X – 643(B) වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : එම ලේඛනයට අනුව ආමි මොහිදින් සහ සහරාන්ගේ කණ්ඩායම අතර යම් සම්බන්ධතාවයක් රාජ්‍ය බුද්ධි සේවයේ විමර්ශනවලදී අනාවරණය වුණාද?

පි : ස්වාමිනි ආමි මොහිදින් තමයි මුල් කාලයේ ඉඳන්ම සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානවල ශාරීරික අභ්‍යාස සම්බන්ධව පුහුණුව ලබා දුන්න පුද්ගලයා.ඒ වගේම මේ ආමි මොහිදින්ට සහරාන්ගේ තරුණයන් මනාව හැසිරෙව්වේ මේ ආමි මොහිදින් කියන පුද්ගලයා. ඉතින් මේ සහරාන් , ආමි මොහිදින්, රිල්වාන් මේ ඔක්කෝම දැඩි සම්බන්ධතාවයක් පැවැත්වූ පුද්ගලයෝ.

ප්‍ර : ඊට අමතරව ඔහු යම්කිසි ක්‍රියාකාරකමකට සම්බන්ධ වුණාද? සම්බන්ධ වූ බවට තොරතුරු තියෙනවද?

පි : මොහු විශේෂයෙන්ම පුහුණු කඳවුරුවලදී ඒ කියන්නේ අවි පුහුණුවක් ලබා දීලා තියෙනවා කියලා තොරතුරු වාර්තා වුණා.

ප්‍ර : මොන පුහුණු කඳවුරුද?

පි : නුවරඑළිය , හම්බන්තොට.

ප්‍ර : ඊට අමතරව මේ X – 643 දරණ ලේඛනයේ තවත් යම් ලේඛනයක් තිබෙනවද සහරාන්ගේ පුහුණු කඳවුරුවලට සහභාගී වෙලා ඊට පස්සේ මරාගෙන මැරෙන්න කැමැත්ත පළ කරලා දැනට ශ්‍රී ලංකාවෙන් පැනලා ගිහිල්ලා ඉන්න යම් සැකකරුවන් සම්බන්ධයෙන්?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ ලේඛනය?

පි : ඇමුණුම 21 ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය X – 643 දරණ ලිපියේ 21 වෙනි ඇමුණුම X – 643 (C) වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : X – 643 (C) ලේඛනයට අනුව ශ්‍රී ලංකාවෙන් පැනලා ගිහිල්ලා සිටින පුද්ගලයින් කවුද? ඔවුන් සහරාන්ගේ කණ්ඩායම සමඟ තිබ්බ ක්‍රියාකාරකම් මොනවද?

පි : ස්වාමිනි එක්කෙනෙක් තමයි මොහොමඩ් මූනාස් මුවාත්. මෙයා ලංකාවට ඇවිල්ලා නුවරඑළියේ පුහුණු වෙලා පාකිස්ථානයට, දැනට පාකිස්ථානයේ තමයි ඉන්නේ. ඊට අමතරව..

ප : නුවරඑළියේ පුහුණු කඳවුරට විතරද ගිහිල්ලා තියෙන්නේ?

පි : නුවරඑළිය නෙවේ හම්බන්තොට පුහුණු කඳවුරට. තව කෙනෙක් ඉන්නවා මොහොමඩ් හකීම් මෙයා කටාර් රාජ්‍යයට ගිහිල්ලා ඉන්නවා. මෙයා හම්බන්තොට පුහුණු කඳවුරේ පුහුණුව ලැබුවේ. ඊට අමතරව අමස්දීන් හනාන් එයා ඩුබායි රාජ්‍යයට ගොස් ඉන්නවා. මොහු නුවරඑළිය පුහුණු කඳවුරේ පුහුණුව ලැබූ කෙනෙක්. අනිත් කෙනා ෆස්තුල් රහුමන් මුවාස් අහමඩ් දැන් තොරතුරු අනුව ස්පාඤ්ඤයට ගිහිල්ලා කියලා තොරතුරු තියෙනවා. නුවරඑළිය පුහුණු කඳවුරේ පුහුණුව ලැබිලා තියෙනවා.

ප : ඒ හතර දෙනාටම තව පොදු කාරණාවක් තිබෙනවද?

පි : ඔව් මොවුන් සියලු දෙනාම මරාගෙන මැරීම සඳහා දිවුරුම් දීලා තියෙන්නේ. රටින් ගිහිල්ලාත් තියෙන්නේ මරාගෙන මැරෙන දිවුරුම් ලබාදීලා. එතකොට ඉස්සරහට වුණත් මේ දිවුරුම අනුව ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාවක් තියෙනවා ස්වාමිනි.

ප : මේ හතර දෙනා අත්අඩංගුවට ගැනීමට යම් ක්‍රියාමාර්ගයක් දැනටමත් ගනිමින් සිටිනවද?

පි : එසේය ස්වාමිනි. මේ පාකිස්ථානයේ ඉන්න කෙනා දැනටම අත්අඩංගුවට අරන් තියෙනවා. පාකිස්ථාන් කෙනා පාකිස්ථාන බුද්ධි අංශයට තොරතුරු ලබා දීම අනුව අත්අඩංගුවට ගත්තා. ඔහු පාකිස්ථානයෙන් IS සංවිධානයට සම්බන්ධ වෙලා විශාල වැඩ කොටසක් කරපු පුද්ගලයෙක් බව දැනුම් දීලා තිබ්බා. ඊට අමතරව මේ කටාර් රාජ්‍යයට හකීම් කියන පුද්ගලයා දැනට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අනිත් දෙන්නා තාම සොයා ගැනීමට නොහැකි වෙලා තියෙනවා. එයා මේ කට්ටියගේ Passport අංක දීලා තියෙනවා Airport එකට ආවොත් එහෙම arrest කරන්න උපදෙස් දීලා තියෙනවා.

ප : මීට අමතරව මෙම ලේඛනයේ යම් තොරතුරක් සඳහන් වෙනවද ඩ්‍රෝන කැමරාවක් මේ ත්‍රස්ත කණ්ඩායම ලබා ගැනීම සම්බන්ධයෙන්?

FAIR COMMENT — BY JEZEEM —

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ලේඛනය?

පි : ඇමුණුම 11

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන X – 643 ලේඛනයේ ඇති 11 වන ඇමුණුම X – 643 (D) වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයේ විමර්ශනවලට අනුව ඩ්‍රෝන කැමරා කීයක් මේ කණ්ඩායම සතුව තිබ්බද? කොයි වසරේදීද එවැනි උපකරණ ලබා ගැනීමක් සිදු කළේ?

පි : මෙම ඩ්‍රෝන කැමරාව ලබා ගෙන තිබ්බේ අබ්දුල් අසීස් මොහොමදු රියාසද් කියන පුද්ගලයා මොහු තමයි සහරාන්ලාගේ සමාජ මාධ්‍ය ජාලා හසුරපු පුද්ගලයා. මොහුට මනා පරිගණක දැනුමක් තිබෙන පුද්ගලයෙක්. රිල්වාන්ගේ උපදෙස් පරිදි 2017 වර්ෂයේ තමයි මේ ඩ්‍රෝන කැමරාව අරන් තියෙන්නේ. එක ඩ්‍රෝන කැමරාවක් තමයි අරගෙන තියෙනවා කියලා අපිට විමර්ශනවලින් අනාවරණය වුණේ.

ප්‍ර : ඔබට යම්කිසි අවස්ථාවක BBC සේවය විසින් සාදන ලද වාර්තාමය වැඩසටහනක් මේ පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් වූ වාර්තාමය වැඩසටහනක් ඔබ විසින් නැරඹීමක් සිදු කරනවද?

පි : නැරඹීමක් සිදු කරා ස්වාමිනි.

ප්‍ර : එහි එක් කොටසක තිබෙනවා නේද ඩ්‍රෝන යානාවක් භාවිතා කිරීම සම්බන්ධයෙන් මේ කණ්ඩායම?

පි : ඒ විකාශනය කළේ මේ කට්ටිය මේ රියාසද්දුයි, රිල්වානුයි ගුවන් ගත කර ඩ්‍රෝන කැමරාව තමයි මේ විකාශය කෙරුවේ ස්වාමිනි.

ප්‍ර : මෙම X – 643 ලේඛනයේ තවත් තොරතුරු තියෙනවද මේ ආරක්ෂිත නිවාස සම්බන්ධයෙන්? දැන් ඔබ මීට පෙර කොමිෂන් සභාවට ඇවිල්ලා සාක්ෂි ලබා දුන්නානේ ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : එහිදී ඔබලා විසින් සොයා ගත්තු ආරක්ෂිත නිවාස පිළිබඳ සාක්ෂි ලබා දුන්නානේ?

පි : ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර : එදා සඳහන් නොකළ ඊට අමතරව සොයා ගනු ලැබූ ආරක්ෂිත නිවාස පිළිබඳව තොරතුරු මෙහි තිබෙනවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අඩ්ඩාලව්චේන ගැන. අඩ්ඩාලව්චේන එක ෂයිනි නතර වෙලා හිටිය ප්‍රධාන ආරක්ෂක නිවාසයක් ස්වාමිනි.

ප්‍ර : අපිට සාක්ෂි ලබා දුන්නේ නැහැ? කියන්න ඒ ගැන කියන්න.

පි : මේ අඩ්ඩාලව්චේන ජලාල් වීදියේ මොහොමඩ් නියාස් කියන පුද්ගලයා විසින් තමයි මේ නිවාසය අරන් තිබ්බේ. මේ නිවාසය නැවතිලා හිටියේ සහරාන්ගේ සහෝදරයා වන ෂයිනි තමයි නැවතිලා හිටියේ මේ නිවාසයේ. මේ නිවාසය සම්බන්ධයෙන් තොරතුරු ලැබිලා 2019/04/25 වන දින සෝදිසි කරනකොට සෝදිසි කරා. මේ නිවාසයේ තිබිලා තමයි ස්වාමිනි අපිට හම්බුණා මඩකලපුව සියෝන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බකරු අසාත්ගේ hard disk එකක් හම්බුණා. ඊට අමතරව ෂයිනිගේ උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, තව ඉඩමක් සම්බන්ධව ඔප්පු කිහිපයක් සම්බන්ධව හම්බුණා. මේ නිවාසයේ නැවතිලා හිටියේ ප්‍රධාන වශයෙන්ම තහවුරු වුණා ෂයිනි තමයි නැවතිලා හිටියේ කියලා. මොකද අපි හාදියාගෙන් ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය වුණා මේ නිවසේ නැවතිලා හිටියේ සයිනි කියලා. මේ නිවසේ තිබිලා තමයි ස්වාමිනි අර දිවුරුම් දෙන පැය 1 ½ ක සහරාන්ගේ පිරිස අට දෙනා ප්‍රහාරයට ප්‍රථම දිවුරුම් දෙන pen drive එක හම්බුණේ මෙම නිවසේ තිබිලා.

ප්‍ර : මෙම තොරතුරු ඔය X – 643 දරණ ලේඛනයේ කීවෙනි ඇමුණුමේද දාලා තියෙන්නේ?

පි : ඇමුණුම 09 ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි මේ අවස්ථාවේදී X – 643 ලේඛනයේ ඇති 09 වන ඇමුණුම මේ අවස්ථාවේදී X – 643 (E) වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කර සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඊට අමතරව ඔබ ළඟ යම් තොරතුරු තිබෙනවද මීට පෙර කොමිෂන් සභාවට ලබානොදුන් සාරා ජස්මින් නැත්නම් පුලස්තිනි සම්බන්ධව?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඔබ ළඟ තියෙන තොරතුර?

පි : ස්වාමිනි මේ මම මීට ප්‍රථම සාක්ෂි ලබා දීමෙන් පසුව තමයි මේ තොරතුර අනාවරණය වුණේ. මේ සාරා ජස්මින් හස්තූන් එක්ක විවාහ වුණාට පස්සේ හස්තූන් එක්ක විවාහ වුණේ 2015/09 වන මාසේ. ගෙදරින් ගියේ 2015/08 මාසේ ගිහිල්ලා හස්තූන් එක්ක විවාහ වෙලා

FAIR COMMENT — BY JEZEEM —

අබ්දුල් රාසික් තමයි මේක සම්පූර්ණ ක්‍රියාත්මක කළේ. නමුත් 2015 හදිසියේම 12/31 කල්මුණ පොලිසියේ ඇවිල්ලා entry එකක් දැම්මා. මේ හස්තූන් එක්ක ඉන්න බැහැ එයා ගෙදර යනවා කියලා. එතකොට ඊට අමතරව අබ්දුල් රාසික්ටත් දෙමළින් ලියුමක් ලිව්වා මේ මුස්ලිම් ආගම දැඩිව අන්තවාදී පැත්තට යන්නේ. මුස්ලිම් ආගම අතහැරලා මම ආයෙත් හින්දු ආගමට යනවා කියලා. එහෙම ලියුමකුත් ලියලා කල්මුණ පොලිසියේ පැමිණිල්ලකුත් දාලා 2016/01/06 වෙනිදා මෙයා සාරාගේ අම්මා නැවතිලා හිටියේ අබුඩාබීවල ඒ දවස්වල රැකියාව කරේ. අබුඩාබීවලට යනවා 2016/01/06 වෙනිදා. ඊට පස්සේ මෙයාගේ සාරාගේ උපන්දිනය තියෙන්නේ 03 වැනි මාසේ 07 වැනිදා. මාර්තු 07. මෙයා 2016 ගිහිල්ලා උපන්දිනේ සමරනවා අබුඩාවිවල. අබුඩාවි උපන්දිනේ සමරන කොට ඒ උපන්දින සාදයේ ඉන්නවා TNTJ කියලා ටී ෂර්ට් ඇඳගත්තු පුද්ගලයෙක්. TNTJ කියන්නේ තමිල්නාඩු තවුහිද් ජමාත් කියන එක. TNTJ කියන්නේ. එතකොට මේ පුද්ගලයා සාරාට යම්කිසි තෑග්ගක් දෙන ආකාරයකුත් තියෙනවා. එතකොට මේ සාරා රට ගියේ මුස්ලිම් ආගම සම්පූර්ණයෙන්ම එපා කියලා තමයි ගියේ. මේ උපන් දිනය සැමරුවේ ඒ අවස්ථාව වෙනකොට හින්දු ආගම වැළඳගෙන මුස්ලිම් ආගම එපා කියලා. නමුත් මේ උපන්දින පාටියෙන් පස්සේ තමිල් නාඩු තවුහිද් ජමාත් පුද්ගලයා සම්බන්ධ වුණාට පස්සේ සාරා වෙනස් වෙන්න පටන් අරන් තියෙනවා. මාස 2ක් ඇතුලත වෙනස් වෙලා ආයි සැරයක් ලංකාවට එනවා 2016/05/19. ඒ කියන්නේ 03 මාසේ උපන්දිනය සමරනකොට එහෙම එන්න අදහසක්වත් තිබුණේ නැති සාරා 05 වෙනි මාසේ 19 ආයේ ලංකාවට එනවා සම්පූර්ණ හින්දු ආගමයි ඔක්කෝම අම්මයි අතඇරලා ආපහු ලංකාවට ඇවිල්ලා ආපහු හස්තූන් එක සම්බන්ධ වෙනවා. එතකොට අපි හොයලා බැලුවාම මෙන්න මේ TNTJ කියන තමිල්නාඩු තවුහිද් ජමාත් කියන පුද්ගලයා සම්බන්ධ වුණාට පස්සේ තමයි වෙනස ඇති වෙලා තියෙන්නේ. එතකොට සාරාට රැකියාවක් කරන්න කියලා මෙයා දවස් 3ක් විතර එළියට එක්කරගෙන ගිහිල්ලා තියෙනවා සාරාව. එතකොට ඊට පස්සේ නමුත් රැකියාවක් කරලා නැහැ. සාරා දවස් 3ක් විතර එළියට ගිහිල්ලා විතරයි තියෙන්නේ. නමුත් මේ TNTJ කියන පුද්ගලයා ලංකාවේ පුද්ගලයෙක්ද ඉන්දියාවේ පුද්ගලයෙක්ද කියලා තවම අපිට තහවුරු කර ගන්න බැරි වෙලා තියෙනවා. ඔහුගේ ඡායාරූපයක් අපි ළඟ තියෙනවා. එතකොට මේ මොහු සම්බන්ධ වුණාට පස්සේ සාරා අර නිතරම ගෙදර ලැප්ටොප් එකක් දීලා තියෙනවා ඒකේ තමයි නිතරම ඉඳලා තියෙන්නේ. සාරාගේ අම්මා හදිසියේ රෑ මොකක්ද දුවගේ වෙනස්වීම කියලා

FAIR COMMENT BY JEZEEM

බලන්න Password එක ගහනකොට අර ඇම්බියුලන්ස් එකක සද්දයක් එන tone එක ඒ කියන්නේ Password එක ගහනකොට හදිසි ඇහැරෙන විදියට ඒ වගේ සද්දයක් ඇවිල්ලා සාරා ලැප්ටොප් එක උදුරගෙන තියෙනවා. එතකොට මෙයාගෙන් පස්සේ තමයි මේ පරිවර්තනය වෙලා තියෙන්නේ කියලා අපිට දැනට නිරීක්ෂණය වෙනවා ස්වාමිනි. මේ පුද්ගලයාගෙන් පස්සේ.

****

<u>රජයේ අධිනිතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ස්වාමීනි සාක්ෂිකරු මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන සාරා ජෙස්මින්ගේ උපන්දින පාටියේ යැයි දැක්වෙන ඡායා රූපය X 644 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

ස්වාමීනි සාක්ෂිකරු තවත් ඡායා රූපයක් මේ අවස්ථාවේ දී උපන්දින පාටියේම ඡායා රූපයක් මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරනවා. එය X 645 වශයෙන් ලකුණු කර මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.

ප්‍ර : මහත්මයට මේ අවස්ථාවේ දී X 644 ලෙස ඔබ ලකුණු කරපු ඡායා රූපයෙන් හඳුනා ගන්න පුළුවන් ද මේ සාරා ජෙස්මින් නැත්නම් මහේන්ද්‍ර පුලස්තනී කියන තැනැත්තිය?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : පෙන්වන්න?

පි : නිල්පාට ඇඳුමක් ඇඳන් ඉන්නේ සාරා ජෙස්මින්.

ස්වාමීනි එම ස්ථානය X 644 A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර : ඊට අමතරව දැන් ඔබගේ සාක්ෂියේ දී ඔබ සඳහන් කරා TNTJ යනුවෙන් T-shirt එකක් ඇඳන් ඉන්න පුද්ගලයෙක් ගැන. ඒ පුද්ගලයා මේ ඡායා රූපයේ ඉන්නවද?

පි : ඉන්නවා ස්වාමීනි.

ප්‍ර : ඒ පුද්ගලයා ඔබට පෙන්වන්න පුළුවන් ද?

පි : TNTJ කියලා සුදු පාට T- shirt එකක් ඇඳන් ඉන්නේ එම පුද්ගලයා ස්වාමීනි.

ස්වාමීනි එම පුද්ගලයාගේ ඡායා රූපය දැක්වෙන ස්ථානය සාක්ෂිකරු පෙන්නුම් කරනවා.

එය **X 644 B වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර : සාරගේ අම්මත් ඉන්නවද?

පි : ඉන්නවා.

ප්‍ර : මේ ඡායා රූපයෙන් ඔබට පෙන්වන්න පුළුවන් ද සාරා ජෙස්මින් යන තැනැත්තියගේ මව මේ ඡායා රූපයේ ඉන්නවද කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉන්නවා ස්වාමීනි. සුදු පාට සල්වාර් එකක් ඇඳන් ඉන්නේ සාරා ජෙස්මින්ගේ අම්මා.

ස්වාමීනි මේ සාක්ෂිකරු මේ ඡායා රූපයේ සාරා ජෙස්මින්ගේ මව පෙන්නුම් කරනවා.

එම ස්ථානය **X 644 C වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.**

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබට මෙම කොමිෂන් සභාවට විවෘතව හෝ නැත්නම් ලිපියක හරි ලියා කියන්න පුළුවන්ද කෙහෙන්ද මේ පින්තූර දෙක රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන්නේ කියලා?

පි : කියන්න පුළුවන් ස්වාමීනි. සාරා ජෙස්මින් හස්තුන් අතහැරලා ගිය අවස්ථාවේ කළුදාවලි ජසුවා කියලා දෙමළ පිරිමි ළමයෙක් එක්ක ආයෙ සම්බන්ධයක් ඇති කරගන්නවා. එතකොට මේ උපන්දින සාදයට දවස් කිහිපයක් වෙනකල් ඒ සම්බන්ධය තිබිලා තියෙනවා. එතකොට මේ පින්තූරවලට අමතරව සාරා ජෙස්මින්ගෙත් ඡායාරූප රාශියක් whatsapp මාර්ගයෙන් එවලා තිබ්බා. එතකොට මේ ඡායාරූප අහම්බයෙන් තමයි එවලා තිබ්බේ ජසුවා කියන මේ පුද්ගලයාට. ඔහු සාරා හස්තුන් අයින් වෙලා ගිහිල්ලා ප්‍රේම සම්බන්ධතාවයක් තමයි තිබිලා තියෙන්නේ. එතකොට මේ ඡායාරූප දෙකත් එක්ක තව ඡායාරූප රාශියක් එවලා තිබ්බා. ඒ ගොඩේ මේ ඡායාරූප දෙකත් එවලා තිබ්බා ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : එතකොට මේ තොරතුරු ලබාගත්තේ ජසුවා කියන පුද්ගලයාගෙන්ද?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : ඔබ කිව්වා නේද සාරාගේ පරිගණකය ඇගේ මව විසින් විවෘත කරලා ඇතුලත් වීමට හදන කොට යම් කිසි අනතුරු ඇඟවීමක් නැත්නම් මේ Ambulance එකක් වගේ සද්දයක් ගිහිල්ලා තියෙනව කියලා?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබගේ විමර්ශන වලින් අනාවරණය වුණාද ඒක කොහොමද එහෙම වෙන්න පුළුවන් කියලා?

පි : ඒ ගැන අපි මේ සාරාගේ අම්මාගෙන් ප්‍රශ්න කරා ස්වාමීනි. සාරාගේ අම්මගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරන කොට තමයි සාරගේ අම්මගේ ප්‍රකාශය මත තමයි සාරාගේ අම්මගෙන් තමයි ඒක කියවුණේ. සාරාගේ වෙනස්වීමක් වුණා අන්තිම කාලේ. සාරාගේ

FAIR COMMENT BY JEZEEM

අම්මා අපිට කෙළින්ම කිව්වේ නැහැ මේ පුද්ගලයා නිසා වෙනස් වුණා කියලා. නමුත් මේ අපිට පැහැදිලිවම birthday party එකේ වීඩියෝ දර්ශනයකුත් තියෙනවා ස්වාමීනි. ඒ වීඩියෝ දර්ශනයේ සාරා ඉන්නේ ගොඩක් සතුටින් ඉන්නේ. ඒ විඩියෝ දකින කොට. එහෙම මාර්තු 07 වැනිදා එහෙම ඉන්න කෙනා මැයි මාසේ ඒ රට අතැහැරලා දාලා එන්න තරම් මාස දෙකක් ඇතුළත පරිවර්තනයක් වෙන්න පුළුවන් මේ පුද්ගලයගෙන් කියලා අපිට නිරීක්ෂණය වෙනවා ස්වාමීනි. එතකොට සාරාගේ අම්මගෙන් ප්‍රශ්න කිරීම් වලදී තමයි හෙළි වුණේ ඊට පස්සේ laptop පරිගණකය වැඩි වශයෙන් පාවිච්චි කරලා රෑ මේක මොකද්ද කියලා බලන්න යන කොට siren එක්ක හඬ නැංවුවා කියලා.

ප්‍ර : ඒ ජසුවා නේද?

පි : ජසුවා.

ප්‍ර : ජසුවා කියන තැනැත්තා සොයා ගැනීම කොහොමද කරේ?

පි : ඒ අපේ තොරතුරුකරුවන් මාර්ගයෙන් සොයා ගත්තේ ස්වාමීනි.

ප්‍ර : කොයි කාලෙද සොයා ගත්තේ?

පි : මීට කලින් සාක්ෂි දීමෙන් පසුව.

ප්‍ර : ඔහුගේ වෙන මොනව හරි වැඩියමක් ගන්න පුළුවන් වුණා ද?

පි : ඒ ඡායාරූප තමයි ස්වාමීනි ගත්තේ. ඔය සාරා ඊට පස්සේ ඔය අබුඩාබි ඉන්න කොට අවස්ථා කිහිපයකදී කතා කරා කිව්වා. එයට අමතරව ඔය ඡායාරූප එව්වා කිව්වා නමුත් ඊට පස්සේ නැවත ලංකාවට ආවට පස්සේ හස්තුන් එක්ක ආයි සම්බන්ධ වුණාට පස්සේ සම්බන්ධය නැවත්තුවා ස්වාමීනි.

ප්‍ර : දැන් යම් කිසි අවස්ථාවක සාරා ජෙස්මින් නැත්නම් පුලස්තනී ජීවතුන් අතර ඉන්නවා කියන තත්ත්වයක් ඉස්මතු වෙනවනේ ?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඒ ජසුවා කියන තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීමක් සිදු කරනු ලැබුවද?

පි : ප්‍රශ්න කිරීමක් සිදු කරනු ලැබුවා ස්වාමීනි. ඔහු ප්‍රකාශ කරේ 04/21 ප්‍රහාරයට ටික කලකට පෙර දුරකථන ඇමතුමක් ලබාදුන්නත් ඒ 04/21 ආසන්න හෝ ඊට පසුව කිසිම සම්බන්ධයක් පවත්වන්න බැරිවුණා කියලා ස්වාමීනි.

ප්‍ර : සාරත් එක්ක?

පි : ඔව්. එසේයි ස්වාමීනි.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒ නැගෙනහිර පළාතේ කරන ලද විමර්ශනවලදී අනාවරණය වුණාද මේ මිය ගිය ත්‍රස්තවාදීන් නැත්නම් ඔවුන් සමඟ හිටපු අය ගාව සිම් විදේශිය කාඩ්පත් තිබ්බ ද නැද්ද කියන එක ?

FAIR COMMENT — BY JEZEEM —

පි : ස්වාමීනි සමන්තුරේ ගබඩාවේ මගේ මතකයේ හැටියට එදා නින්දවූර් වලයි ඒ සිම් කාඩ් පත් ගොඩක් තිබ්බත් ඒවා අම්පාර SOCO එකෙන් තමයි ගත්තේ. මට එහෙම එතැන එම විමර්ශනවලට අපි දායක වුණේ නැහැ. නමුත් මට මතකයක් තියෙනවා සිම් කාඩ් රාශියක් තිබ්බා කියලා.

ප්‍ර : ඒක දේශීයද විදේශිය ද කියන්න ඔබට යම් හැකියාවක් තියෙනව ද?

පි : මතකයක් නැහැ ස්වාමිනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයා ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදාහරී.
වේලාව :ප.ව. 08.30

කොමිෂන් සභාවේ කටයුතු 2020 දෙසැම්බර් මස 12වන දින පෙ.ව.10.00ට රැස්වේ.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.12.18 වෙලාව: පෙ.ව.11.10

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

* මේ අවස්ථාවේ පූජිත ජයසුන්දර මහතා කොමිෂන් සභාවේ රැඳී සිටින බව සටහන් කරමි.
* හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් නීතිඥ දේවක ජයසිංහ මහතා පෙනී සිටියි.
* හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙනුවෙන් නීතිඥ නදීශා කන්නන්ගර මිය පෙනී සිටියි.

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම	:	**අත්තනායක මුදියන්සේලාගේ නාමල් කුමාර**
වයස	:	**අවු 34යි**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**නැත**
ලිපිනය	:	**A 54/කරද, තුල්හිරිය**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර. සාක්ෂිකරු ඔබට අද මේ ගරු සභාවට සාක්ෂි දීමට එන්න කියලා සිතාසියක් ලැබුනාද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ සිතාසිය සමඟ තමුන්ට දැන්වීමක් ලැබුණාද අවශ්‍යතාවයක් තියෙනවා නම් ඔබ සාක්ෂි දෙන අද දිනයේදී ඔබ වෙනුවෙන් නීතිඥ නියෝජනයක් ලබාගන්න පුළුවන් කියන එක?

උ. එහෙම දැනුවත් වීමක් එම ලිපියේ සඳහන් වෙලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර. ඒ අනුව අද ඔබ මේ ගරු සභාව ඉදිරියේ සාක්ෂි දෙන අවස්ථාවේදී ඔබගේ අයිතිවාසිකම් වෙනුවෙන් නීතිඥ මහතෙකු පෙනී ඉන්නවද?

උ. ස්වාමිණි පෙනී සිටින්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර. ඔබට නීතිඥ සහායක් අවශ්‍ය නැද්ද ඒ කියන්නේ?

උ. නීතිඥ සහායක් වැදගත් වෙනවා ස්වාමිනි. නමුත් මට නීතිඥ මහතෙකුගේ මේ අවස්ථාවේ සම්බන්ධ කර ගැනීමට හැකියාවක් ලැබුනේ නෑ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර. ඔබ අදහස් කරන්නේ ඔබට නීතිඥ මහත්මයෙකුගේ සහායක් අරගෙන පෙනී සිටින්න අවශ්‍යයයි කියන එකද?

උ. එහෙම අදහස් කරන්නේ නැහැ ස්වාමිනි

ප්‍ර. නීතිඥ මහත්මයෙක් නොමැතිව ඔබ අද දින සාක්ෂි දෙන්න කැමති කියලද ඔබ තීරණය කරන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ. එහෙමයි ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර. සාක්ෂිකරු ඔබගේ උපන් ගම් ප්‍රදේශය කොහේද?

උ. උපන් ගම් ප්‍රදේශය ලිපිනය එස්ඒ 86, සමගිපුර මහඔය ස්වාමිනි.

ප්‍ර. එතකොට වරකාපොළ පොලිස් වසමේද?

උ. නැහැ ඒ.අම්පාර දිස්ත්‍රික්කයේ. දැනට මම පදිංචි වෙලා ඉන්නේ වරකාපොළ මගේ බිරිඳගේ ගමේ. පදිංචි වෙලා ඉන්නේ ස්වාමිනි. මහඔය උපන් ගම ස්වාමිනි.

ප්‍ර. ඔබ අධ්‍යාපනය හැදෑරුවේ සිංහල මාධ්‍ය යෙන්ද?

උ. සිංහල මාධ්‍ය යෙන් ස්වාමිනි. විද්‍යාලයේ නම බොරපොළ මහ විද්‍යාලය, බොරපොළ, මහඔය ස්වාමිනි.

ප්‍ර. ඔබ මම අහන ප්‍රශ්න වලට පිළිතුරු දෙන අවස්ථාවලදී පිළිතුරු වේගය අඩු කරලා පිළිතුරු ලබා දෙන්න කියලා මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා?

උ. පිළිපදිනවා ස්වාමිණි.

ප්‍ර. ඔබගේ වයස කීයද?

උ. 34 ස්වාමිනි.

ප්‍ර. ඔබගේ ආගම

උ. බෞද්ධ ස්වාමිණි

ප්‍ර. බෞද්ධයෙක් වශයෙන් බෞද්ධයෙක් විසින් පිළිපදින පංචශීලය පිළිපදිනවාද? කඩකරනවාද?

උ. බොහොමයක් පිළිපදිනවා ස්වාමිනි.

ප්‍ර. මොකක්ද?

උ. යම් අවස්ථාවල එහෙම කැඩෙන අවස්ථා තිබෙනවා

ප්‍ර. මම තුන්වන ශික්ෂාපදය ගැන ඔබෙන් අහන්නේ නැහැ. අනෙක් ශික්ෂාපද 4 ගත්තොත් ඔබේ අතින් බිඳේන්නේ මොන ශික්ෂා පදයද?

උ. පානාතිපාතා මදුරුවෙක් වගේ මැරෙනවා. නමුත් මම මදුරුවෙක් මරන්න තරම් හිත ධාර්මික කරගෙන හිටපු කෙනෙක් නොවෙයි ස්වාමිනි. නමුත් කාලයත් එක්ක අපි තේරුම් ගැනීමේදී මදුරුවෙක්ට පවා ජීවත් වීමේ අයිතියක් තිබෙන නිසා මදුරුවෙක් පවා මගේ අතින් මැරෙන්නේ නැහැ ස්වාමිනි. ඒක නොදැනුවත් ව ක්‍රියාත්මක වෙලා ප්‍රහාරයක් එල්ල වුනොත් ඇරෙන්න පළවෙනි ශික්ෂාපදය කැඩෙනවා බොහොම අඩුයි. කැඩෙනවානම් කැඩෙන්නේ මදුරුවෙක් ඒ වගේ නොහිතූ අවස්ථාවක මදුරුවෙක් ඝාතනය කෙරුවොත් තමයි.

ප්‍ර. වර්තමානයේදී අනෙකුත් ශික්ෂාපද 3 ඔබේ අතින් කැඩෙන්නේ නැද්ද?

උ. කැඩෙන්නේ නැහැ ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. දැන් සැක්ෂිකරු ඔබ අධ්‍යාපනය හැදෑරුවෙත් මහඔය ප්‍රදේශයේ?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඔබ වසර කීයක් විතර මහඔය ප්‍ර දේශයේ ජීවත් වුනාද?

උ. ස්වාමිනි මම අවුරුදු 16 ක් මහඔය ජීවත් වෙනවා ස්වාමිනි. සාමාන්‍ය පෙළ විභාගය අවසන් වන තෙක් මම ඉන්නේ මහඔය ප්‍රදේශයේ ජීවත් වුනා ස්වාමිනි.

ප්‍ර. කමක් නැද්ද ඔබ සාමාන්‍ය පෙළ සමත් වුනාද වගේ ඇහුවොත්?

උ. කමක් නැහැ ස්වාමිනි. මම කැමතියි මෙම ගරු අධිකරණය මගෙන් ප්‍රශ්න අහනවාට. මම මුලින්ම ප්‍රතිඥාවක් ලබා දුන්නා සියළුම දේට සත්‍ය ප්‍රකාශ කරන බවට. ඒ නිසා තමයි මම නීතිඥ මහත්මයෙකුගේ සහායක් නොමැතිව මේ ගරු අධිකරණයට ස්වාධින පිළිතුරක් අපේක්ෂා කරන නිසා ඒ පිළිතුර ලබාදෙන්න බලාපොරොත්තු වෙන්නේ.

ප්‍ර. මම තව එක ඉල්ලීමක් කරනවා. දැන් මම අහන ප්‍රශ්න තියෙනවානේ.?

උ. එහෙමයි. ස්වාමිනි.

ප්‍ර. ඔය ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුර ඔව් හෝ නැහැ වෙන්න පුළුවන්?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ ලබාදෙන පිළිතුර නැහැ නම් ලබාදිය යුතු පිළිතුර තියෙනවානේ අපි ඒ ලබා දිය යුතු පිළිතුර ඒ ප්‍රශ්නය අදාළව පිළිතුර ලබා දෙන්න කියලා මම කරුණාවෙන් ඔබෙන් තව දුරටත් ඉල්ලා සිටිනවා.

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. යම් විදියකින් ඔබට ඒ ප්‍රශ්නය තේරුනේ නැත්නම් ඔබ කියන්න ඒ ප්‍රශ්නය නැවත ප්‍රතිඋච්ඡාරණය කරන්න කියලා මම ඒක අනිවාර්ය යෙන්ම සතුටින්ම සිදු කරනවා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. අවුරුදු 16 ක් ඔබ ගම් ප්‍රදේශයේ ඉදලා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය ලිව්වාම ඔබ ඒ විභාගය සමත් වුනාද?

උ. නැහැ ස්වාමිනි.

ප්‍ර. ඔබ රැකියාවක් එහෙම කළාද?

උ. රැකියා කිහිපයක්ම කළා.

ප්‍ර. ඔබ අධ්‍යාපනය අ.පො.ස. සාමාන්‍ය පෙළින් නැවැත්වුවාට පසුව ඊට පස්සේ වෙනයම් අධ්‍යාපනික හෝ වෘත්තිය පුහුණුවක් හෝ පාඨමාලාවල් සම්බන්ධව හෝ යමක් හැදෑරුවද?

උ. පාඨමාලාවල් කිහිපයක්ම හැදෑරුවා ස්වාමිනි.

ප්‍ර. මොනවාද ඒ පාඨමාලාවන්?

උ. අලෙවිකරණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරුවා, ආරක්ෂක සුරක්ෂිතතාවය පිළිබඳව වෙනමම පාඨමාලාවක් හැදෑරුවා. මත්ද්‍රව්‍ය නිවාරණ පිළිබඳව උපදේශනය පාඨමාලාවක් හැදෑරුවා. ඊට පස්සේ පරිගණක පිළිබඳව ඩී.සි.එස්. ක්ලාස් එකක් කලා. නමුත් ඒ සම්බන්ධව

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ලොකු දැනුමක් මට නැහැ ස්වාමිනි. ඊට අමතරව පාඨමාලාවන් කිහිපයක් හැදෑරුවා. නායකව පුහුණු වැඩමුළු, ඒ වගේ පුද්ගලික ජීවිතයේ සාමාන්‍ය කෙනෙකුට කරන්න පුළුවන් ලොකු අධ්‍යාපනයක් නැතුව යන්න පුළුවන් ගොඩක් දේවල් කලා ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු පරිගණක භාවිතය සම්බන්ධයෙන් පරිගණක සම්බන්ධයෙන් මේ අවුරුදු 18 තුළ ඔබේ දැනුම වර්ධනය කරගෙන තියෙනවාද?

උ. නැහැ ස්වාමිනි.

ප්‍ර. පරිගණක භාවිතය ගැන, එහෙම නැත්නම් අන්තර්ජාලය භාවිතය ගැන ඔබ ඔබේ දැනුම කොහොමද?

උ. අන්තර්ජාලය සැරිසැරීම සාමාන්‍ය පුද්ගලයෙක් සැරිසරන විදියට මම අන්තර්ජාලය භාවිතා හැරුණම කරනවා ස්වාමිනි. ඒ හැරුණම ඒ සියළු කටයුතු කරන්නේ මම මගේ ජංගම දුරකථනයෙන්. ඊට අමතවර පරිගණක භාවිතා කරලා මම මගේ ජීවිතේ කටයුතු සිදුවෙන්නේ නැහැ ස්වාමිනි. ඒ නිසා පරිගණක ගැන ලොකු දැනුමක් නැහැ ස්වාමිනි. නමුත් ජංගම දුරකථන භාවිතය සාමාන්‍ය පුද්ගලයෙක් භාවිතා කරන ආකාරයට ස්වාමිනි මම භාවිතා කරනවා ස්වාමිනි.

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ ලැප්ටොප් එකක් භාවිතා කරනවාද?

උ. මගේ ගෙදර තියෙනවා. මම ඒක භාවිතා කරන්නේ නැහැ මේ ලගදි ගත්තේ. ඒක ගත්තෙත් වැදගත් තොරතුරු දාලා තියෙන්න ඕන නිසා.

ප්‍ර. අන්තර් ජාලයේ සැරිසරනවා කිව්වා නේ ඔබ ඒ කියන්නේ ඔබ දුරකථනය ආධාරයෙන්?

උ. එහෙමයි ස්වාමිනි

ප්‍ර. ස්මාර්ට් ෆෝන් එකක්ද භාවිතා කරන්නේ?

උ. ඔව්.

ප්‍ර. අන්තර්ජාලයේ ඔබ සැරිසරන කොට ඔබට හමුවෙලා තියෙනවාද මේ ඩාර්ක් වෙබ් කියන ක්ෂේත්‍ර යේ සැරිසරන්න?

උ. මම ඇහුවෙත් අද ස්වාමිනි

ප්‍ර. ඔබ අන්තර්ජාලය භාවිතා කරන්නේ මොනවාටද?

උ. මම අන්තර් ජාලය භාවිතා කරන්නේ මම ලංකාවේ ජීවත්වෙන පුරවැසියෙක් විදියට මට අවශ්‍ය දැනුම ලබා ගන්න සහ මේ රට තුළ සිදුවන දේවල් ගැන දැනගන්න සහ රටක් තුළ ජීවත් වන විට ලෝකයත් එක්ක ලෝකය මොන වගේ ගමනක්ද යන්නේ ඒ ගමනට අනුව අපි රටක් විදියට ඒකට කොයි විදියටද හැඩගැහෙන්න ඒන. ජීවන රටාව කොයි විදියටද හැඩගසා ගන්න ඕන. විශේෂයෙන් මම මත්ද්‍රව්‍ය නිවාරන උපදේශකවරයෙක් නිසා ඒ අවශ්‍ය දැනුම ලබා ගන්න විශේෂයෙන්ම ප්‍රවෘත්ති වගේ දේවල් නිරීක්ෂණය කරන්න මම අන්තර්ජාලය භාවිතා කරනවා. සෙවීම සඳහා තමයි ඒ කියන්නේ මගේ කෙටිම පිළිතුර සිදුවීම් පිළිබඳ සෙවීමටත් ඊට පස්සේ සිදුවීම කුමක්ද කියලා බලා ගැනීමටත් ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ ඒක අපේ රටේ සාමාන්‍ය ජීවිතයට කොයි වගේ විදියටද බලපාන්නේ. ඒවා කරන්නේ කවුද කියලා ඒවගේ තොරතුරු හොයලා බලන එක තමයි මෙන්න මේ අන්තර් ජාලය භාවිතා කරලා විශේෂයෙන්ම මම කරන්නේ.

ප්‍ර. මම ඔබතුමාට කාරුණිකව මතක් කරනවා පිළිතුරු ලබාදෙන විට ඒ ලබා දිය හැකි කෙටිම පිළිතුර ලබාදෙන්න කියලා පැහැදිලි කිරීමක් අවශ්‍ය වුනොත් මම ඒ පැහැදිලි කිරීම මම ඔබෙන් විමසා සිටින්නම්.

උ. එසේය ස්වාමිනි

ප්‍ර. ඔබ අර මුහුණු පොත් ගිණුමක් හෝ ගිණුම් භාවිතා කරනවාද?

උ. තියෙනවා ස්වාමිනි

ප්‍ර. කීයක්ද?

උ. මම දැනට භාවිතා කරනවා මගේ නමින්ම මුහුණු පොත් 03 ක්. ඊට අමතරව මම දිගාමඩුල්ලේ කෙනෙක් ඒකට මම පොදු නමක් දාලා මුහුණ පොතක් භාවිතා කරනවා දිගාමඩුලු ජනහඬ කියලා. පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් පැහැදිලි කිරීම කරන්නම්.

ප්‍ර. නෑ. ඒ කියන්නේ දිගාමඩුල්ලේ අසිරිය නෙවෙයි දිගාමඩුල්ලේ ජනහඬ කියලා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඔබ දිගාමඩුල්ලේ අසිරිය එහෙම කියවලා තියෙනවාද?

උ. අසිරිය කියවලා නැහැ ස්වාමිනි.

ප්‍ර. දැන් සාක්ෂිකරු දිගාමඩුල්ලේ අසිරිය කිව්වොත් දිගාමඩුල්ල එකදහස් නවසිය පනස් ගණන්වල එහි තිබුණ තත්ත්වය ගුරුවරයෙකුගේ ඇසින් දක්වන පොතක් කියලා මම ඔබට යෝජනා කළොත් ඔබට ඒක තේරුම් ගැනීමට හැකියාවක් තියෙනවාද?

උ. තිබෙනවා ස්වාමිනි.

ප්‍ර. කියවලා නැත්නම් කොහොමද නාමල් කුමාර මහත්මයා කොහොමද ඒ ගැන ප්‍රකාශ කරන්නේ.

උ. මම පොත ගැන කියවලා නෙවෙයි ස්වාමිනි. මම නැවත මම ප්‍රශ්නය විමසන ලෙස ඉල්ලා සිටිනවා?

ප්‍ර. ඔබ දිගාමඩුල්ලේ අසිරිය කියලා ගුරුවරයෙක් විසින් ඒ තම අත්දැකීම් අරඹයා ලියන ලද පොත කියවලා තියෙනවාද කියලා?

උ. නැත ස්වාමිනි.

ප්‍ර. එම පොතේ සඳහන් වන එකදහස් නවසිය පනහේ විතර දිගාමඩුල්ල පැවති තත්වය, ජනගහනය පුරාවස්තු සම්බන්ධයෙන් තිබෙන විස්තර ගැන යම් දැනීමක් ඔබට තියෙනවාද?

උ. නැත ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු ඔබ සාමාන්‍යයෙන් දවසකට කොපමණ වගේ වෙලාවක් අන්තර්ජාලයේ පියාඹනවාද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ. ස්වාමිනි මම දවසේ වැඩකටයුතු, නිවසේ වැඩ කටයුතු. මම මේ දිනවලත් කුලී රැකියාවක් කරනවා. පුළුවන් විදියට ඒ වැඩ කටයුතු දෛනික ගාස්තුවට තමයි වැඩ කරන්නේ. නමුත් සතියක් විතර මම වැඩට ගියේ නැහැ මේ පාස්කු ප්‍රහාරයට අදාලව නිතර නම කියවුනු නිසා. මම සතියක් විතර ඒ වැඩට යන්නෙත් නැහැ. ස්වාමිනි වෙලාවක් හම්බ වෙන හැම වෙලාවෙම මම අන්තර් ජාලයේ සැරිසරනවා.

ප්‍ර. එම සැරිසැරීමේදී ඔබ ඉස්ලාම් අන්තවාදය, අයි.එස්.අයි.එස්. සංවිධානය ගැන තොරතුරු ඔබ අධ්‍යනය කරලා තියෙනවද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව උපදේශක පාඨමාලාවක් හැදෑරුවා කිව්වා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. මොන වසරේද?

උ. 2015 අවසාන කාලයේ

ප්‍ර. කොහේද ඒක ඔබ හැදෑරුවේ?

උ. අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය රාජගිරිය ස්වාමිනි.

ප්‍ර. කොපමණ කාලයක වැඩසටහනක්ද?

උ. මේක මාස තුනක වැඩසටහනක්.

ප්‍ර. එහි අදියරවල් තියෙනවාද?

උ. එක පාඨමාලාවයි තියෙන්නේ ස්වාමිනි. ලංකාවේ වෙනත් පාඨමාලාවල් ඒ සම්බන්ධව නැහැ

ප්‍ර. ඔබ මේ වන විට ඒ පාඨමාලාව හදාරලා මේ වන විට ඔබ මත්ද්‍රව්‍ය නිවාරණය ගැන ඔබ උපදේශන සම්මන්ත්‍රණ, වැඩමුළු හෝ නායකත්ව කඳවුරු එහෙම පවත්වලා තියෙනවාද?

උ. වැඩසටහන් කිහිපයක්ම පවත්වලා තියෙනවා. අවශ්‍ය නම් ඉදිරිපත් කරන්නම්.

ප්‍ර. අවශ්‍ය නම් මම ඔබට ඒ ගැන කියන්නම්. සාක්ෂිකරු ඔබ දැන් මේ වැඩසටහනට සහභාගි වෙන්නේ ඔබට ලැබෙන ආරාධනයක් අනුවද?

උ. ආරාධනා අනුව

ප්‍ර. එහිදී ඔබට සම්මන්ත්‍රණයට උප දේශකවරයෙකු වශයෙන් ඔබ සහභාගී වීමේදී ඔබට යම් ගෙවීමක් කරනවාද?

උ. ඇතැම් අවස්ථාවල ගෙවීමක් කරනවා ස්වාමිනි. ඇතැම් අවස්ථාවල ගෙවීමක් කරන්නේ නැහැ. ඒකට හේතුව මම කිසිම වෙලාවක වැඩසටහනකට සහභාගී වෙන්න පුළුවන්නම් මුදල් ගැන කථා කරන්නේ නැහැ. දුන්නොත් ගන්නවා ස්වාමිනි. නොදුන්නොත් මම මගේ චේතනාවක් තියෙනවා ඒ චේතනාවට අනුව මම වැඩ කරනවා.

ප්‍ර. අවසානයට ඔබ ස්ථිර රැකියාවක් කලේ මොන කාලයේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ. අවසානයට ස්ථිරව පෞද්ගලික ආයතනයක රැකියාවක් කලේ ස්වාමිනි 2018.09.11 මම පෞද්ගලික ආයතනයක වැඩ කරනවා. එතනෙ සිට මම 2018/ 09 මාසේ 12 වැනිදා යම් හෙළිදරව්වක් කරනවා. එතනින් පස්සේ රැකියාව අහිමි වෙනවා එදින සිට මට එම ආයතනයේ රැකියාව නැහැ ස්වාමිනි.

ප්‍ර. ඔබට එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් එහෙම කොහොමද ඔබ සොයා ගන්නේ?

උ. මුදල් සොයාගැනීම අපහසුයි ස්වාමිනි. මම දැනට මගේ බැංකුවේ ණයක් තියෙනවා අරගෙන ඒකටත් නඩු දාලා තියෙන්නේ. ස්වාමිනි මම ඉහත කී හෙළිදරව්වට අනුව රැකියාව අහිමි වුනාට පස්සේ මුදල් සොයා ගැනීම සම්පූර්ණ අඩාල වෙලා තිබෙන්නේ ඒක නිසා මගේ අම්මාගෙන් තාත්තාගෙන් බිරිඳගේ අම්මාගේ තාත්තාගෙන් සහ මගේ සහෝදරයන්ගේ උදව්වෙන් මේ විදියට යම් සාධාරණයක් ඉටුවන තුරු මේ විදියට මනුස්සයෙක් විදියට පවතින්නට ඕන නිසාත්, භීතියට පිටින් අපි කටයුතු නොකළ යුතු නිසාත් අපේ ප්‍රතිපත්තිය නොවන නිසාත් මේ විදියට පුළුවන් විදියට පවතිනවා ස්වාමිනි.

ප්‍ර. ඔබ විවාහකයෙක්?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. බිරිඳ රැකියාවක් කරන්නේ නැද්ද?

උ. බිරිඳ රැකියාවක් කරන්නේ නැහැ. ඉගෙන ගනත්තා පහුගිය කාලය වෙනකල් තවත් එක විභාගයක් තියෙනවා

ප්‍ර. ඇයට යම් පරිගණක දැනුමක් තියෙනවාද?

උ. පරිගණකය සම්බන්ධයෙන් ලොකු දැනීමක් නැහැ ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු යම් සාධාරණයක් ඉටු වෙනවා කියලා කිව්වේ මොකක්ද?

උ. යම් සාධාරණත්වයක් කිව්වේ මම දැකපු ඉතිහාසයේ, මේ පැයකට එහා ගියපු කාලයත් මම ඉතිහාසයට එකතු කරනවා ස්වාමිනි. ඉතිහාසය තුළ රටේ ජාතික ආරක්ෂාවත් එක්ක ප්‍රශ්න කිහිපයක් තියෙන බව මම හදුනා ගත්තා. ඒ වගේම ඒවා ප්‍රකාශ ලබා දෙන්න ඕන තැන්වලට අවශ්‍ය තැන්වලට මම ප්‍රකාශ කරා. එතනදී ලංකාවේ නීතියත් එක්ක සාධාරණයක් ඉටුවිය යුතු ක්‍රමවේදක් තිබෙනවා. මම ලංකාවේ ප්‍රධාන පෙළේ පැමිණිල්ලක් කරපු කෙනෙක් ස්වාමිනි. වර්තමාන ජනාධිපති සහ හිටපු ජනාධිපතිතුමා ඝාතනය කිරීම පිළිබඳව. ඒකත් සමඟ ස්වාමිනි මම ඒකේ පැමිණිලි කරු සහ සාක්ෂිකරු ස්වාමිනි.

ප්‍ර. ඒ ගැන අවශ්‍ය වෙන් නැහැ. තමුන් බලාපොරොත්තු වන සාධාරණ විතරක් කෙටියෙන් කියන්න?

උ. සාධාරණ ස්වාමිනි පැමිණිල්ලක් ඉදිරිපත් කළාම ඒ කෙනාගේ රැකියාව අහිමි වීමත් ඒ කෙනා සාමාන්‍ය පුද්ගලික ජීවිතය පවත්වාගෙන යාම සම්පූර්ණ අඩාල වෙනවා. ඒ අඩාල වීමත් එක්ක පැමිණිල්ල නිසාම

FAIR COMMENT BY JEZEEM

නැවත රැකියාවක් ලබා ගැනීම අපහසුතාවයකට පත්වෙනවා ඒ පැමිණිල්ල නිසා ඒක වෙච්ච ලොකු අගතියක් කියලා මම හිතන්නේ

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ දැනුවත් 2019.04.21 වැනි දින කොළඹ සහ ඒ තදාසන්න ප්‍රදේශවලත් මඩකලපුව ප්‍ර දේශයේ ආගමික සිද්ධිස්ථාන 03 ක සහ තරු පංතියේ හෝටල්වල මරාගෙන මැරෙන් ප්‍රහාරයන් සිදුවූ බව

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. 2019 මැයි මාසේ 13 වෙනිදා හෙට්ටිපොළ ප්‍රදේශයේ යම් ජාතිවාදී කැලබෑනියක් සිදුවුනා කියලා මම ඔබට කිව්වොත් ඔබ එය පිළිගන්නවාද?

උ. සිදු වුනා ස්වාමිනි

ප්‍ර. මෙන්න මේ කලබෑනිය සම්බන්ධයෙන් ඔබ අත්අඩංගුවට පත්වුනාද?

උ. එහෙමයි ස්වාමිනි

ප්‍ර. කවදාද ඒ?

උ. 2019.05.14 වෙනිදා වරකාපොළ පොලිස් ස්ථානයේදී

ප්‍ර. ඒ කියන්නේ මේ සිද්ධිය සිදුවූ දිනට පසුදින?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඉන් අනතුරුව ඔබව කිසියම් වෙනත් විමර්ශන ඒකකයකට මාරු කරනු ලැබුවාද?

උ. ඔව්.

ප්‍ර. කොහේටද ඒ?

උ. අත්අඩංගුවට ගත්තේ කොළඹ දකුණ අපරාධ කොට්ඨාශයෙන් ස්වාමිනි. එදිනම හවස මම කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාශයට මාව මාරු කලා.

ප්‍ර. ඒ කියන්නේ සී.අයි.ඩී. එකට

උ. එසේය ස්වාමිනි.

ප්‍ර. සී.අයි.ඩී. එකේ ඔබ දවස් කියක් සිටියාද?

උ. දින 211 ක් හිටියා ස්වාමිනි.

ප්‍ර. ඔබ මේ කොමිෂන් සභාවට ප්‍රකාශය දෙන විටත් ඔබ හිටියේ මේ හෙට්ටිපොළ සිද්ධියට සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වෙලාද?

උ. එහෙමයි ස්වාමිනි. මම හිටියේ නුවර පල්ලේකැලේ දුම්බර බන්ධනාගාරයේ ස්වාමිනි.

ප්‍ර. සී.අයි.ඩී. එකේ ඔබ හිටියේ අර ඩී.ඕ. රැඳවුම් නියෝග මත ද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ අනුව තමයි ඔබ දින 211 ක් සිටි බව කියා සිටියේ?

උ. එහෙමයි ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. සාක්ෂිකරු අපේ ජන බල පක්ෂය කියලා දේශපාලන පක්ෂයක් තියෙනවාද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඔබ එහි සාමාජිකයෙක්ද?

උ. නැත ස්වාමිනි.

ප්‍ර. ඔබ එම පක්ෂය ආරම්භක සාමාජිකයෙක් වශයෙන් කටයුතු කළාද?

උ. නැත ස්වාමිනි.

ප්‍ර. කවුද ඒ පක්ෂයේ නායකයා?

උ. වැලිසරගේ සමන් පෙරේරා ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු ඔබ සී.අයි.ඩී. එකට ඔබව භාරගෙන ඔබ රැදවුම් නියෝග මත හිටියා කිව්වානේ?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ රැදවුම් නියෝග මත ඉන්න කොට ඔබ කොහිද රඳවලා තිබ්බේ?

උ. මම හිටියා ස්වාමිනි 4 වෙනි තට්ටුව කියලා අපි සාමාන්‍ය යෙන් භාවිතා කරනු ලබනවා. 4 වෙනි තට්ටුවේ ඉදිරිපස සිර මැදිරියේ තමයි හිටියේ.

ප්‍ර. ඔබ එම සිරමැදිරියට ප්‍රථමයෙන් යන විට එහි වෙනත් සිර කරුවන් සිටියාද?

උ. සිටියා ස්වාමිනි. මෙම පාස්කු ප්‍රහාරය සම්බන්දව සැකපිට අත්අඩංගුවට ගෙන රැදවුම් නියෝග මත සිටින ලද සැකකරුවන් 40 ක් පමණ හිටියා ස්වාමිනි.

ප්‍ර. ඔබ හිටපු සිර මැදිරියේ වෙනත් සැකකරුවන් හිටියාද?

උ. මම හිටපු සිර මැදිරියේ මුස්ලිම් ජාතික ඉස්ලාම් භකිත්ක 06 දෙනෙක් සහ ද්‍රවිඩ එක් සැකකරුවෙක් සහ මම අපි 8 දෙනෙක් හිටියා ස්වාමිනි.

ප්‍ර. දැන් කියන්න ඒ ද්‍රවිඩ සැකකරුගේ නම කියන්න බලන්න?

උ. මේරි ඇන්තනී පෝල් අජන්ත් තිපන් ස්වාමිනි අනුවර්ත නාමය තීපන් ස්වාමිනි.

ප්‍ර. නැවත කියන්න?

උ. මේරි ඇන්තනී පෝල් අජන්ත් තිපන් ස්වාමිනි අනුවර්ත නාමය තීපන් ස්වාමිනි.

ප්‍ර. ඔහු මොකටද මේ රිමාන්ඩ් භාරයේ හිටියේ?

උ. ඔහු ස්වාමිනි වවිනතිව් පොලිස් මාර්ග බාධකයේ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය කිරීම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන ආරම්භ කරලා තිබුණේ ස්වාමිනි. ඒ විමර්ශන ආරම්භ කිරීමෙන් අනතුරුව 2007 හෝ 2008 වර්ෂයේ පොලිස් නිළධාරියෙක් ඝාතනය කිරීම සම්බන්ධව තොරතුරක් අනාවරණය වුනා කියලා ඒ පුද්ගලයා සහ තවත් 2 නෙක් අත්අඩංගුවට අරගෙන තිබුණා. ඒ නිසා තමයි ඔවුන් හිටියේ පසුකාලීනව ඔවුන් අධිකරණයට ඉදිරිපත් කලා ස්වාමිනි. මඩකලපුව අධිකරණයට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. එතකොට ඔබ කියා සිටියේ ඉස්ලාම් භක්තිකයෝ හය දෙනෙක්ද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. කවුද ඒ හය දෙනාගේ නම්?

උ. ජාතික තවුහිඩ්... ජමාඩ් සංවිධානය ආවායි මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් තවත් එක්කෙනෙක් හිටියා ඔහු විද්‍යාව ගුරුවරයෙක් ඔහු හිටියේ කැකිරාව ප්‍ර දේශයේ ඔහු මොහොමඩ් කෆායින් මොහොමඩ් ෆාරිස්. සමාවෙන්න ස්වාමිනි තපාඩින් මොහොමඩ් ෆායික් තව හිටියා පහුගිය දවස්වල බෝම්බ පුපුරවාගැනීම සම්බන්ධ එකම පවුලේ සහෝදරයන් දෙදෙනාගේ පවුලේ තවත් සහෝදරයෙක් හිටියා මොහොමඩ් ඊබ්‍රහිම් ඉෆ්ලාල් අහමඩ්. තවත් හිටියා ස්වාමිනි ලැප්ටොස් වත්ත ඒ ඉඩමේ හිමිකරු එම්. මුෆිස් හිටියා.

ප්‍ර. 5?

උ. මොහොමඩ් ෆයිසර් මොහොමඩ් මුෆ්ති. මාවනැල්ල බුදුපිළිම කැඩීමට සම්බන්ධ. පහයි. සහරාන්ගේ බිරිඳ සමග ගිරිඋල්ල කඩේකින් ඇඳුම් ගැනීම සඳහා ගිහිල්ලා හිටපු රිෆාස් හිටියා.

ප්‍ර. දැන් මෙම පුද්ගලයෝ හය දෙනාගෙන් සිංහල භාෂාව කථා කිරීමට නොහැකි කී දෙනෙක් හිටියාද?

උ. සිංහල භාෂාව කථා කිරීමට ටිකක් අපහසුව හිටියේ නවුෆර් මවුලවි විතරයි. අනිත් හැම කෙනාටම සිංහල සාමාන්‍ය කතා කිරීමට පුළුවන් ස්වාමිනි.

ප්‍ර. සිංහල භාෂාව වටහා ගැනීමේ හැකියාවක් ඒ 06 දෙනාටම තිබුණාද?

උ. 06 දෙනාටම තිබුණා ස්වාමිනි. නවුෆර් මවුලවිට ටිකක් වටහා ගැනීම අපහසුයි ස්වාමිනි. අනෙක් හය දෙනාට අපි සිංහලෙන් දෙයක් කිව්වොත් වටහා ගැනීමේ හැකියාව තිබෙනවා ස්වාමිනි.

ප්‍ර. ඔබට ද්‍රවිඩ භාෂාව ලියන්න, කියන්න හෝ වටහාගැනීමේ හැකියාවක් තියෙනවාද?

උ. කිසිම දෙයක් බැහැ ස්වාමිනි.

ප්‍ර. දැන් නාමල් කුමාර මහත්මයා ඔබලා මේ රදවා සිටි සිර මැදිරියේ දිග පළල සාමාන්‍යයෙන් ඔබට කියන්න පුළුවන්ද?

උ. අඩි 08 ක් උස, අඩි 08 ක් පළල අඩි 10 ක් දිගයි ස්වාමිනි. එහෙම මම මැනලා බැලුවේ නැහැ ස්වාමිනි. මගේ උසත් එක්ක ඒක මට අදහසක් විදියට ගන්න පුළුවන් හැකියාව තියෙනවා ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු ඔබ ඔය දවස් 211 ම ගත කළේ ඔබ ඔය නම් සඳහන් කළ ඔය ඉස්ලාම් භක්තිකයන් සහ අර ද්‍රවිඩ ජාතිකයා සමඟද?

උ. විටින් විට මේ අය ඇතැම් ඇතුලේ ඒ අයගේම ඇතැම් ප්‍රශ්න ඇතිකර ගන්නා අවස්ථා ආවා. ආපු ඒ අවස්ථාවේදී ඇතැම් වෙලාවල්වලදී සිර මැදිරි මාරු කළ අවස්ථා ආවා. මොහොමඩ් මවුලවි මොහොමඩ් නවුෆර් මාත් එක්ක ප්‍රශ්නයක් ඇති වෙලා ස්වාමිනි මේ කොමිෂන් සභාව

FAIR COMMENT BY JEZEEM

බලාපොරොත්තු වෙන්නේ සත්‍ය නිසා මම කියන්න කැමතියි මගෙන් පහර දිමකටත් ලක් වුනා. එම නිසා ඔහුව එම සිර මැදිරියෙන් ඉවත් කළා ස්වාමිනි.

ස්වාමිනි මම බුදු පිංතූරයක් තියාගෙන ස්වාමිනි. ඒ හැමකෙනෙක්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒ හැම කෙනෙක්ටම රාමසාන් උත්සවයට අවස්ථාව දුන්නා. හජ්ජි උත්සවයට අවස්ථාව දුන්නා. මම මුස්ලිම් ජාතිකයෝ මරන්න සැලසුම් කරන කොට ඒ පිළිබඳව හෙළිදරව් කරලා මගේ ජීවිතයට අවධානමක් ගත්තු කෙනෙක් ස්වාමිනි. නමුත් මට ආගම ඇදහීමේ අයිතියක් තියෙනවා ඒ නිසා මම කැම එකක තිබුණු බත් එකක තිබුණු බුදු පිංතූරයක් කපාගෙන මම ඒක තියාගෙන බුදුන් වදින් සූදානම් වුනේ ඉස්ලාම් දහමේ උගන්වනවාලු මම නවුෆර් මවුලවි කිව්වේ වෙනත් ආගමික නායකයෙකුගේ පිංතූරයක් තියෙනවා නම් පිළිමයක් තියෙනවානම් ඒ අයගේ ආගම අදහන්න බැහැ කියලා. මාවනැල්ල බුදු පිළිම කැඩීම සම්බන්ධව එවැනි අදහසක් තමයි මට කිව්වේ මාත් එක්ක කථා කරන කොට ඇෆ්ගනිස්ථාන්වල බුදු පිළිම කැඩීම පිලිබඳව නවුෆර් මවුලවි මා එක්ක ඒ ගැන තමයි කථා කළේ. වෙනත් ආගමක නායකයෙක්ගේ පින්තූරයක් තියෙනවානම් එතන ආගම අදහන්න බැරි නිසා මට මේක අයින් කරන්න කිව්වා ස්වාමිනි. මම ඒකට අවනත වෙලා ඒ ස්ථානයේ රාජකාරියේ හිටිය පොලිස් නිළධාරීන් ස්වාමිනි මම මේක තියාගන්න ඕනද කියලා. මොකද මාව අයින් කළොත් මාව දාන්න වෙන තැනක් නැහැ. දාන්න වෙන සෙල් එකක් නැහැ. ඒ අයට පේන්න හිටියේ. ඒ අය අයින් කරනවානම් 08 ක් අයින් කරන්න වෙනවා. ඒ නිසා මගෙන් අහුවා පිංතූරය අයින් කරනවාද කියලා මම බුදු පිළිමය අයින් කළා. මේ අය මගෙත් එක්ක බුදු දහම පිළිබඳ තර්ක කරන්න පටන් ගත්තා දිගින් දිගටම. ඒ අය එක මතයකට ආවා. මට එක තර්කයක් ඉදිරිපත් කළා ස්වාමිනි. බුදු හාමුදුරුවෝ ආශාවන් අත් හරින්න කියලා තැන් තැන් වල ගිහින් කියපු එක තමයි බුදු හාමුදුරුවන්ට අතහැර ගන්න බැරි වෙච්ච ආශාව එහෙම නායකයෙක් පස්සෙන් ඔයගොල්ලෝ යන්නේ කියලා මේ අය දිගින් දිගටම තර්ක කරන්න පටන් ගත්තා ස්වාමිනි. දවසක් රාත්‍රී වෙලාවේ මම බාත්රූම් එකට ගිහින් එන වෙලාවේ මගේ කකුලේ තිබුණු චතුර බිංදුවක් නවුෆර් මවුලවිගේ කකුලේ ගෑවුනා කියලා නවුෆර් මවුලවි නැගිටපු ගමන් මට පයින් පහරක් ගැහුවා ස්වාමිනි. මම ස්වාමිනි මට ගැහුවොත් අනිවාර්යයෙන්ම මම ඉවසනවා අඩුයි ස්වාමිනි. මට සමාවෙන්න මේ කොමිසම ඉදිරියේ මම ප්‍රකාශ කරනවා, මම ගැහුවොත් මම ගහනවා ස්වාමිනි. මම හැම වෙලාවෙම කතා කරලා ප්‍රශ්න විසඳන්න තමයි උත්සාහ කරන්නේ. ගැහුවොත් ඒ ගහපු එකත් එක්ක මට ක්ෂණිකව ඇතිවුන කෝපයත් එක්ක මම පහර දුන්නා ස්වාමිනි. ඒක එළියේ හිටපු පොලිස් නිළධාරීන් දැක්කා ස්වාමිනි. මේ වුනේ 2019.10.13

FAIR COMMENT BY JEZEEM

වෙනිදා එදා රාත්‍රී ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයකුත් සටහන් වෙලා ඇති ස්වාමිනි.

ප්‍ර. පොලිස් නිලධාරින්ද දැක්කේ බන්ධනාගාර නිලධාරින්ද?

උ. පොලිස් නිලධාරින් ස්වාමිනි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ සිදුවීම වුණේ 04 වෙනි තට්ටුවේදී තමයි ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර. දැන් ඒ වන විට ඔබ ඊට පෙර ඔබ එම පුද්ගලයෝ සමඟ ආරවුලක් ඇතිකරගෙන තිබුණාද?

උ. ආරවුල් ඇතිකරගෙන තිබුනේ නැහැ ස්වාමිනි. ප්‍රශ්න කිහිපයක් තිබුණා ස්වාමිනි. මම ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාරත්මේන්තුවේ ස්ථානාධිපතිවරයාට වාචිකව දන්වලා බැරි නිසා මම ලිඛිතව දැන්වුවා. ස්වාමිනි නවුෆර් මවුලවි හැමදාම හවසට පැයක් දේශනයක් පවත්වන්න පටන් ගත්තා ස්වාමිනි සිර මැදිරිය ඇතුලේ ස්වාමිනි.

ප්‍ර. දැන් ඔබ 2019.05.13 හෝ 14 දින සිට මෙම ගැටුම ඇතිවන විට මාස 05 ක් විතර ඔබ අර පෙර සඳහන් කරපු ද්‍රවිඩ ජාතික තැනැත්තාත් මුස්ලිම් ජාතිකයෝ 06 දෙනාත් සමඟ එකම සිර කුටියේ හිටියා කියලා තමයි ඔබ කියන්නේ?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ සිර කුටිය ඉතා කුඩා සිර කුටියක් කියලා තමයි ඔබ කියා සිටියේ?

උ. එහෙමයි ස්වාමිනි

ප්‍ර. මෙම සිර කුටියේ ඔබ රැඳී සිටින විට එම සිර කුටියේ සිටි අනෙකුත් රැඳවියන් සමඟ ඔබ කථා බහ කරාද?

උ. කරා ස්වාමිනි කථාබහ කළා.

ප්‍ර. ඒ කථාබහ කිරීම් වලදී ඔබට යම් තොරතුරු දැනගන්නට ලැබුණාද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. සාක්ෂිකරු ඔබ කියා සිටියා 2019.10.13 වැනි දින ඔබත් නවුෆර් මවුලවි කියන පුද්ගලයාත් අතර ඇති වෙච්ච අවසන් වෙච්ච ගුටිබැට හුවමාරුව ගැන?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. එය ඔබ විසින් ඔබගේ බුදු දහමට අනුව බුදුරජානන් වහන්සේගේ පිංතූරයක් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් බවත් ඔබ කියා සිටියා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඔබ මෙම සිරකුටියේ සිටින විටද 2019 වසරේ රාමසාන් උපවාස කාලය පැවැත්වුනේ?

උ. එහෙමයි ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. දැන් මෙම රාමසාන් උපවාස කාලය සහ අනෙකුත් දිනවල ඔබ සමඟ සිටි ඉස්ලාම් භක්තික රැදවියන් තමන්ගේ ආගම මෙනෙහි කරමින් යාඥාවන් සිදු කළාද?

උ. ස්වාමිනි රාමසාන් උත්සවය දවසේ..

ප්‍ර. මම ඇහුවේ මේ රැදවියෝ රාමසාන් උත්සව සමයේ මේ ඉස්ලාම් භක්තිකයෝ රාමසාන් උත්සව සමයේ තමන්ගේ යාඥාවන් සිදු කළාද නැද්ද?

උ. රාමසාන් උත්සව සවසේ...

ප්‍ර. රාමසාන් උත්සව දවසේ නෙවෙයි අනිත් දවස් ටික ගැන උත්තරයක් දෙන්න?

උ. රාමසාන් උත්සව සමයේ අනෙක් දවස්වල යාඥාවන් සිද්ධ කළාද?

ප්‍ර. ඒ අවස්ථාවේ තමන් සිටියේ සිර මැදිරිය ඇතුලේද?

උ. ඇතුලේ ස්වාමිනි.

ප්‍ර. ඒ යාඥාවන් සිදු කළේ නිශ්ශබ්දවද නැත්නම් ශබ්ද නගලාද?

උ. ශබ්ද නගලා ස්වාමිනි.

ප්‍ර. ඔය යාඥාවන් දිනකට කී වරක් පැවැත්වුවාද?

උ. දිනකට පස් වරක් පැවැත්වුවා ස්වාමිනි. පස් පාරට වැඩියෙන් යාඥා කරන අයත් හිටියා

ප්‍ර. කවුද ඒ පස් පාරට වැඩියෙන් යාඥා කළේ?

උ. බොහෝ දෙනෙක් යාඥා කළා. ඒ ගැන මම විමසීම් කලා. එතකොට වදින තරමට ස්වර්ගයට යන්න ලකුණු අවශ්‍ය වෙනවා කිව්වා. ඒ ලකුණු ලැබෙන නිසා පුළුවන් තරම් යාඥා කරනවා කියලා කිව්වා.

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ මීට පෙර කියන්න උත්සාහ කරමින් සිටියා නවුෆර් මවුලවි දේශනාවක් පවත්වනවා කියලා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. මේ දේශනාව ඔහු පවත්වන්නේ උදේ ද දවල්ද හවස ද රැද?

උ. හවස ස්වාමිනි. ඒ යාඥා කිරීමෙන් පස්සේ අනෙක් අය නවුෆර් මවුලවි පැත්තට හැරිලා රවුමට වාඩි වෙනවා ස්වාමිනි. ඒ වාඩි වුනාට පස්සේ පැයක් විතර ඒ දේශනය පවත්වනවා ස්වාමිනි. දින දෙක තුනක් මෙහෙම ගියාට පස්සේ මට දමිළ භාෂාව තේරෙන්නේ නැහැ ස්වාමිනි. නමුත් ඔසාමා බිල් ලාඩන්, නුවර එළිය, බැටිකලෝ වගේ වචන කියන කොට මට වැටහුනා මොකක් හරි ප්‍රශ්ණයක් මෙතන තියෙනවා කියලා. මේ පිළිබඳව දැනුවත් කරන්න ඕන කියලා ඒ නිසා මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිතුමාට මම වාචිකව කිව්වා මට ඔබතුමාට විශේෂ දෙයක් කියන්න අවශ්‍යයි. මේ නවුෆර් මවුලවී කියන පුද්ගලයා මෙන්න මේ විදියට දේශනා පවත්වනවා මේකේ.

ප්‍ර. ඔබ ඒ ගැන ස්ථානාධිපතිවරයාට දැන්වුවාද?

උ. දැන්වුවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර. ඊට අමතරව ඔබ ප්‍රකාශයකුත් ලබා දුන්නාද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. මේ නවුෆර් මවුලවි මේ දේශනය ලබා දුන්නේ මොන භාෂාවෙන්ද?

උ. දමිළ භාෂාවෙන්.

ප්‍ර. ඔබලා සිටි සිර මැදිරිය ආසන්නයේ සී.අයි.ඩී. එකේ නිළධාරිනුත් හිටියා කියලා ඔබ කියා සිටියා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. මේ දේශන පවත්වන කොට ඔවුන්ට ඇහෙනවාද නැද්ද?

උ. අහෙනවා ස්වාමිනි.

ප්‍ර. ඒ ඇහුනත් ඔබ වාචිකව සහ ලිඛිතව ඒ බව ඔවුන්ට ප්‍රකාශ කළා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. එහෙම පැමිණිලි කරලා යම් කිසි සැකයක් පිළිබඳව ඔබ ඔවුන්ට ප්‍රකාශ කලාද?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. මොකක්ද ඒ සැකය?

උ. පහුගිය දින පාස්කු ප්‍රහාරයට අදාල සැකකරුවෝ මේ ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා මෙහෙම කථා කිරීමෙන් අනතුරුව මේ වගේ වචන ඉදිරිපත් කරනවා මට දෙමළ භාෂාව තේරෙන්නේ නැහැ. මට ඒ ගැන සැකයක් තියෙනවා. ඔබතුමාලාගේ අවධානය යොමු කරන්න. මේ කථා කරන්නේ ආගම පිළිබඳව නම් මට ඒක ප්‍රශ්ණයක් නැහැ. නමුත් ඒ කථා කරන්නේ රටේ ත්‍රස්තවාදය සහ ලෝකයේ ත්‍රස්තවාදය පිළිබඳ වචන එකතු කරලා ආගම ඒකට එකතු කරලා කථා කරනවා නම් ඒක නවත්වලා දාන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ස්ථානාධිපතිතුමාගේ මම ඉල්ලීමේ පළවෙනි පාර මම කිව්වා. ඒක පිළිතුරක් ලැබුනේ නැහැ. ඊට පස්සේ මම තීරණය කළා මම කටින් කිව්වාට හරි යන්නේ නැහැ කියලා මම කොළයකුයි පෑනකුයි ඉල්ලා ගෙන සෙල් එක ඇතුලේ තියාගෙන ලියලා මෙනවාද ලියන්නේ කියලා ඇහුවා මම කිව්වා නිතිමය ගැටළුවක් පිළිබඳවත ලියන්නේ කියලා. ස්ථානාධිපතිතුමාට දුන්නා ඒක දීමාත්ත් එක්කම ස්ථානාධිපතිතුමා නිළධාරීන්ට නියෝග කරලා තිබුණා ඒක බලන්න කියලා. ආරක්ෂක නිලධාරින් ඒ පිළිබඳව බලලා එදාට ස්ථානාධිපතිතුමාට ආපහු දැන්වුවා. ස්ථානාධිපතිතුමා කියුවා ආගම කියනවානම් කියන්න මට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ නමුත් මම දන්නවා මෙතන මොනවාද කථා කළේ කියන්න මම සොයලා බැලුවා. ඒ වැඩේ මින් ඉදිරියට තියා ගන්න බැහැ ආගම කියනවානම් කියන්න නැත්නම් මේ වැඩේ මෙතනින් නවත්වන්න කියලා

ප්‍ර. එතනින් පස්සේ?

උ. ඒ විදියේ දේශන පැවැත්වීම නැවැත්වුවා ස්වාමිනි.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර. ඒ අවස්ථාව වන විටත් ඔය තීපන් හිටියාද කුටිය ඇතුලේ?

උ. තිපන් ස්වාමිනි. තිපන් අධිකරණයට ඉදිරිපත් කළා.

ප්‍ර. ඔබ ඔය පැමිණිලි කරන දවස්වල තීපන් හිටියද?

උ. හිටියා ස්වාමිනි.

ප්‍ර. මේ සම්බන්ධව තිපන් සමඟ කථා කළාද?

උ. තිපන් මට යන අවස්ථාවේ කියලා ගියා. අපි හමුදාවට වැඩ කරපු අය හැබැයි මට ප්‍රශ්නයක් වුනා ඔයා පරෙස්සම් වෙලා ඉන්න. මගේ ජීවිතයට අනතුරක් වෙලා තියෙනවා මේ ගොල්ලො නිසා. ඒ නිසා මේගොල්ලො කියවාගෙන ආවාට ඔයා යන්න එපා. ඒ ගොල්ලන්ට යන්න තැනැක් නැහැ එයාලා කන්ඩම් කරවාගෙන ඉන්නේ. එක් නිසා මම විමර්ශනය කරපු නිළධාරීන්ට දැන්වුවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර. සාක්ෂිකරු ඔබ කිව්වානේ තිපන් යන දවසේ ඔබ කිව්වානේ අපි හමුදාවට වඩා කරපු අයනේ ප්‍රශ්න ඇති කරගන්න එපා කියලා....

උ. නැහැ ස්වාමිනි

ප්‍ර. මොකක්ද ඔහු කිව්වේ ඔහු හමුදාවට සේවය කරපු කෙනෙක්ද?

උ. නැහැ ස්වාමිනි. ඔහු කියුවේ LTTE එකත් එක්ක දෙකට බෙදුනා කිව්වා. මම කරුණාගේ පැත්තේ හිටියේ කිව්වා. අපි යුද්ධය අවසන් කරන්න හමුදාවේ නිළධාරීරන් මගේ කරපිටින් අරන් ගිහිල්ලා තිබුණා කිව්වා. ද්‍රවිඩ පොලිස් නිළදාරියෙක් ඝාතනය කළා කියලා තමයි මාව අත්අඩංගුවට අරගෙන තියෙන්නේ. මම ද්‍රවිඩයෙක් වෙලා මම ද්‍රවිඩයෙක් ඝාතනය කරයි ද කියලා ඇහුවා. අපිට සාධාරණයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඔයා පරිස්සම් වෙලා ඉන්න මේක ඇතුලේ මට කියන්න තියෙන්නේ මෙන්න මේ ටික. මොකද එයත් මඩකලපුවේ. මවුලවිලත් මඩකලපුවේ. එයා දැනන් හිටියා මෙයාලා ගැන. ඒ නිසා මට යන වෙලාවේ තිපන්, මේරි අජන්ත් තීපන් යන වොලවේ කියලා ගියා පරිස්සම් වෙලා ඉන්න කියලා. ස්වාමීනි

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර. තිපන් කිව්වේ නැද්ද නවුෆර් මවුලවි දේශනා කලානේ හැමදාම හවසට පැයක් මොනවාද අඩංගු වෙලා තිබුනේ කියලා ඔහුගෙන් ඇහුවේ නැද්ද?

උ. නැහැ ස්වාමිනි.

ප්‍ර. ඔහු භාෂාව දැනන් හිටියත් ඔහුගෙන් ඇහුවේ නැහැ ඒ ගැන?

FAIR COMMENT BY JEZEEM

උ. නැහැ..... තිපන්ට සිංහල ලියන්න බැහැ. තිපන් සිංහලෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එක්ක සිංහලෙන් කථා කරලා නැහැ ස්වාමිනි. තිපන් සිංහලෙන් කථා කලේ මා එක්ක විතරයි ස්වාමිනි. ඒ සම්බන්ධව අහන්න පුළුවන් උපරිම දේවල් මම තිපන්ගෙන් අහගත්තා ස්වාමිනි. ඒ දැනගත්තු දේවල් එක්ක තමයි මම තීරණය කලේ කටින් කියලා සාක්ෂියක් විදියටවත් ඉදිරිපත් වෙන්නේ නැති නිසා තමයි ලිඛිතව දුන්නේ ස්වාමිනි.

ප්‍ර. මම අහන්නේ දැන් ඔය නවුෆර් මවුලවිගේ දේශනවලදී කියවෙන දේවල් මොනවාද කියන එක ඔබ තිපන්ගෙන් විමසලා තීපන්ගෙන් තේරුම දැනගත්තේ නැද්ද?

උ. නැහැ ස්වාමිනි. නමුත් තීපන් දන්නවා මම ලියුමක් දුන්නා කියලා ස්වාමිනි.

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ මෙම සිර කුටියේ මෙම ඉස්ලාම් භක්තිකයන් සමඟ සිටින අවස්ථාවේදී ඔබ විමසා සිටියාදස 04.21 ප්‍රහාරය සිදු කළේ කුමන හේතුවක් සම්බන්ධයෙන්ද කියලා?

උ. විමසුවා ස්වාමිනි.

ප්‍ර. එයට කවුරු හරි පිළිතුරක් දුන්නාද?

උ. දුන්නා ස්වාමිනි.

ප්‍ර. කවුද දුන්නේ?

උ. ඒ සියළු දෙනාම මම ළඟ තියාගෙන කථා කලේ ස්වාමිනි

ප්‍ර. මොකක්ද ඒ ලැබුණු පිළිතුර?

උ. ඒ ලැබුණු පිළිතුර ස්වාමිනි ලෝකයේ දවසක ඉස්ලාම් රාජ්‍යයක් බිහි වෙනවා. ඒ ඉස්ලාම් රාජ්‍යය බිහි වෙන්න අවශ්‍ය නිසා ඒකේ තියෙනවා මේ අයගේ යුද්ධ කිරීමේ න්‍යායක් තියෙනවා. ඒ න්‍යායේ හැටියට ස්වාමිනි

ප්‍ර. මොකක්ද ඒ න්‍යාය?

උ. හිජ්රා

ප්‍ර. හිජ්‍රා?

උ. මට මතක හැටියට හිජ්රා කියලා ස්වාමිනි. මට මතක ස්වාමිනි හිජරා මට අහුන විදියට. ඒ හිජ්රා හැටියට ඉස්ලාම් පාලනයක් තිබෙන රටක සිටි ඉස්ලාම් රාජ්‍යයක් පාලනය කිරීම මොහොමඩ් නබි තුමා ආරම්භ කරලා තියෙනවා. ඒ අනුව මේක ආරම්භ වෙලා තියෙනවා. අයි.එස්. අයි.එස්. සියළු දෙනා එක් වෙලා මේ යුද්ධය ආරම්භ කළා. මේකේ තියෙන ප්‍රශ්ණය මගේ දැනුමෙන් මම ප්‍රකාශ කරන්නේ ඇමරිකාවෙන් IS සැකකරුවන්ට ත්‍රස්ත ප්‍රහාර දියත් කරනවා කිව්වා තවත් රටවල් පනස් ගානක් මේකට ඇමරිකාවට සම්බන්ධ කරගෙන අයි.එස්. ත්‍රස්තවාදයට එරෙහිව. අයි.එස්. ත්‍රස්තවාදය සටන් කරන්නේ ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් ඉස්ලාම් රාජ්‍යයක් දවසක ලෝකයේ ගොඩනැගෙන බව

FAIR COMMENT BY JEZEEM

ඉස්ලාම් දහමේ සඳහන් කරලා තියෙනවා කිව්වා. IS සංවිධානය මේ අය හැම කෙනෙක්ටම නියෝග කරලා තියෙනවා අපි එකතැනක හිටියොත් තමයි ඇමරිකාව අපි වෙන් වෙලා කැඩිලා ගිහිල්ලා තම තමන්ගේ රටවලට ගිහිල්ලා තම තමන්ගේ රටවල්වල ඒ පුපුරවා ගැනීම කරාම ඒ මරාගෙන මැරෙන දේ සිදු කළාට පස්සේ ඒ රට වලින් ඇමරිකාවට උදව් කරන එක නවත් වනවා. ඉස්ලාම් රාජ්‍යය ඉබේම බිහි වෙනවා කියන එක අවශ්‍ය උපදෙස් අයි.එස්. සංවිධානයෙන් ලැබිලා තියෙනවා කිව්වා. ඒ ලැබීමත් එක්ක ඒ අයට තිබෙන ලොකුම ප්‍රශ්ණය තමයි කතෝලික පල්ලි කිව්වා. මේ දේවල් වල සත්‍ය අසත්‍ය තාවය මම දන්නේ නැහැ ස්වාමිනි. මාත් එක්ක කථා කරපු දේ තමයි මම ප්‍රකාශ කලේ. ලෝකේ වැඩිම ජන ගහනයක් ඉන්නේ කතෝලික ජනතාව නිසාත්, ඇමරිකාවේ වැඩියෙන්ම ඉන්නේ කතෝලික ජනතාව නිසාත් ඇමරිකාවට දන්වන්න ඕන නිසාත් ඇමරිකාවන් එක්ක එකතු වෙලා මේ ඉස්ලාම් ත්‍රස්තවාදයට අයි.එස්ලාගේ වැඩ පිළිවෙලට ඒ ගොල්ලා ත්‍රස්තවාදය කියලා කියන්නේ නැහැ ස්වාමිනි. ඒ ගොල්ලා කියන්නේ ආගම වෙනුවෙන් කරන වැඩක් කියලා. ඒ ආගම වෙනුවෙන් කරන වැඩේට මේ රටවල් සම්බන්ධ වෙන එක නැවැත්වීම සඳහා තමයි මේ විදියට කතෝලික පල්ලි වැඩිපුරම තෝරාගත්තේ කියන එක තමයි කිව්වේ. ඒ වගේම අප්‍රේල් 21 තෝරාගත්තා කියලා මට කිව්වේ තව කාලයක් මේ ගොල්ලො ඇදිලා ගියානම් මේ ගොල්ලො කොහේදි හරි කොටු වෙනාව කිව්වා. අවසාන පොයින්ට් එකට ඇවිල්ලා ඉන්නේ කිව්වා.

ප්‍ර. අවසාන පොයින්ට් එක?

උ. ස්වාමිනි.

ප්‍ර. මොකක්ද අවසාන පොයින්ට් එක කියලා කිව්වේ?

උ. එහෙම කිව්වේ නැහැ ස්වාමිනි. බුද්ධි අංශය හොයොගෙන හොයාගෙන ගිහිල්ලා ඒගොල්ලන්ට ආයේ යන එන තැනක් නැති වෙලා තිබුනේ කිව්වා. පාස්කු ඉරිදා කියලා මේක තීරණය කරලා තියෙන්නේ ලෝකෙටම කරනවා නම් වැඩක් ලෝකෙටම දැනෙන්න කරන්න ඕන කිව්වා. ඒ ලෝකෙටම දැනෙන්න කරපු දේවල් තමයි ඒ ගොල්ලන්ගේ ආගම වෙනුවෙන් කරපු ඒවා ඔය පෙන්ටගනයට කරපු ඒවා ඒ වගේ මාස 07 ක කාලයක් තුළ ගොඩක් දේවල් කථා කළා ස්වාමිනි.

ප්‍ර. මෙම පුද්ගලයන් මෙහෙයවුවේ කවුද?

උ. ඔවුන් මෙහෙයවපු කෙනෙක් ඒ ගොල්ලා ප්‍රකාශ කරන්නේ නැහැ ස්වාමිනි. මම තීරණය කළා මට ජීවිතයට ලැබුණු සරදමක් විදියට මට මේ ගොල්ලා එක්ක ඉන්න ලැබිච්ච එක. මම හිතනවා මම උත්සාහ කළා පුළුවන් තරම් දේවල් දැනගන්න. මම පුළුවන් තරම් දේවල් දැනගත්තා ස්වාමිනි. මම උත්සාහ කළා ස්වාමිනි. නමුත් මට ඔවුන් මෙහෙයවපු බවට

FAIR COMMENT
BY JEZEEM

හෝ මොවුන් මෙහෙයවන බවට හෝ මට කිසිවක් දැනගන්න ලැබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර. මෙම සාකච්ඡාවලින් අනාවරණය වුනාද ඔය සිර කුටියේ සිටි පුද්ගලයන් 06 දෙනාට අමතරව වෙනත් සාමාජිකයන් මෙම මොවුන් සමඟ සිටිනවාද නැද්ද කියන කාරණය?

උ. පැහැදිලි නැහැ.

ප්‍ර. ඒ ප්‍රශ්නය ඉවත් කරගන්නවා ගරු සභාපති තුමනි
ඔවුන් පිළිගත්තාද මෙම 04.21 ප්‍රහාරය ඔවුන් විසින් සිදු කළාද? කවුරුන් විසින් සිදු කළාද කියලාද ඔවුන් කියා සිටියේ?

උ. ඒ අය ස්වාමිනි ඇතුලේ පිල් බෙදිලා කණ්ඩායම් වලට කැඩිලා හිටියේ ස්වාමිනි. එහෙම වෙන්න හේතුව සමහර අය හිටියා සහරාන් කියන්නේ කවුද කියලාවත් දන්නේ නැහැ සංවිධානය ගැන කිසිම දෙයක් දන්නේ නැහැ ස්වාමිනි. ඇතැම් අය හිටියා ක්‍රිකට් මැච් එකක් ගහන්න කියලා නුවර එළියට ගිහිල්ලා එකම එක දවසක් පැයක් ඉසලා ආපු මිනිස්සු හිටියා ස්වාමිනි.

ප්‍ර. ඔබ සමඟ 06 නේ හිටියේ සෙල් එකේ?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ සෙල් එකේ හිටිය හය දෙනා ඔබට කියා සිටියාද ඔය 04.21 ප්‍රහාරය කවුද සිදු කලේ කියලා?

උ. කියා සිටියා ස්වාමිනි.

ප්‍ර. කවුද?

උ. සහරාන් ඇතුලු කණ්ඩායම ස්වාමිනි.

ප්‍ර. එතකොට සහරාන් මොන කණ්ඩායමක සාමාජිකයෙක් කියලාද එලිදරව් වුනේ?

උ. සහරාන් ජාතික තවුහිත් ජමාන් සංවිධානය හදාගත්තාට පස්සේ උපදේශකවරයා වන්නේ මොහොමඩ් ඊබ්‍රාහීම් නවුෆර් මවුලවි.

ප්‍ර. නවුෆර් මවුලවි?

උ. මේ ගොල්ල අතර බල අරගලයක් හටගන්නවා ස්වාමීනි පසුකාලීනව කවුද ඒක කියුවේ ඔබට සංවිධානයේ මාත් එක්ක සිටි ප්‍රබල සැකකරුවන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළා ස්වාමිනි වාඩිවෙලා සාකච්ඡා කළා.

ප්‍ර. මොන භාෂාවෙන්ද ඔබ ඒ සාකච්ඡාව කළේ?

උ. සිංහලෙන් ස්වාමිනි.

ප්‍ර. ඔය සාකච්ඡාවේදී දැනගත්තා බල අරගලයක් ඇතිවුනා කියලා?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. කවුරු අතරද?

උ. නවුෆර් මවුලවි සහ සහරාන් අතර.

ප්‍ර. නවුෆර් මවුලවි සහ සහරාන් ඥාතීන්ද?

උ. ඥාතීන් ස්වාමිනි

President Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර. බිරිඳගේ?

උ. සහරාන්ට මේ විවාහය සූදානම් කරලා දෙන්නෙත් නවුෆර් මවුලවි. එතකොට සහරාන්ගේ බිරිඳගේ පුංචි තමයි ස්වාමිනි නවුෆර් මවුලවි බැඳලා ඉන්නේ. එතකොට සහරාන් ගේ වයිෆ් හාජියාගේ ගම් ප්‍ර දේශය නාරම්මල.

ප්‍ර. ඔබේ බිරිඳගේ ගමට ආසන්නවද?

උ. මම වරකාපොළ ස්වාමිනි.

ප්‍ර. එතකොට මේ බල අරගලය ඇති වෙන්නේ නවුෆර් මවුලවි සහ සහරාන් අතර?

උ. නවුෆර් මවුලවි සහ සහරාන් අතර

ප්‍ර. ඇයි?

උ. මේගොල්ලො ගිහිල්ලා අවසානයට හිර වෙනවා. හිරවුනාට පස්සේ සුවිසයිඩ් කරගන්න සහරාන් යෝජනාවක් ගේනවා. සහරාන්ගේ යෝජනාවත් එක්ක නවුෆර් මවුලවි ඒකට විරෝධ තාවය ප්‍රකාශ කරනවා ස්වාමිනි.

ප්‍ර. ඇයි?

උ. විරෝධතාවය ප්‍රකාශ කරන්නේ ස්වාමිනි මේ වෙලාවේ මේක කරලා හරි යන්නේ නැහැ මේක මීට වැඩිය හොඳට කරන්න ඕන කියලා තමයි ඒ විරෝධතාවය ප්‍රකාශ කරනවා නමුත් මේ සියලු දෙනාම කලින් සැලසුම් කරනවා හැම දෙයක්ම.

ප්‍ර. මොකක්ද? හැම දෙයක්ම කියන්නේ

උ. ත්‍රස්ත ප්‍රහාර මාලාවක් දියත් කරන්න

ප්‍ර. කොහොමද?

උ. කලින් සැලසුම් කරනවා ත්‍රස්ත ප්‍රහාර මාලාවක් දියත් කරනවා ලොකෙටම දැනෙන් ඕන විදියට රට පුරාම, මේ ගොල්ලා උත්සාහ කරන්නේ රට පුරාම මේක දියත් කරන්න

ප්‍ර. එකම දවසකද?

උ. එකම දවසක.

ප්‍ර. මිනිස් ජීවිත විනාශ කරන්නද නැත්නම්?

උ. මිනිස් ජීවිත හානි වෙන්න ස්වාමිනි

ප්‍ර. ඉලක්ක කරන්නේ කාවද?

උ. ඉලක්ක කරන්නේ ඇමරිකාවත් එක්ක තියෙන ප්‍රශ්නත් එක්ක ස්වාමිනි. විශේෂයෙන්ම කතෝලික ජනතාව තමා එල්ල කරනවා කිව්වේ ස්වාමිනි. ඒ කරන්න ඉන්න කොට බුද්ධි අංශවලින් සොයාගෙන යන නිසා තමයි සහරාන් විසින් ප්‍රකාශ කරලා තියෙන්නේ මේ ප්‍රහාර මාලාව පාස්කු ඉරු දින කරන්න ඕන කියලා තමයි මේ.

ප්‍ර. එතකොට ඒ යෝජනාවට මොකද වෙලා තියෙන්නේ?

උ. ඒ යෝජනාවට නවුෆර් මවුලවි එකඟ වෙලා නැහැ ස්වාමිනි.

President Secretariat's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර. ඇයි?

උ. ඒ එකඟ වෙලා නැත්තේ ඒක මීට වැඩිය හොඳට කරන්න ඕන කියලා. ඒක මේ වෙලාවේ කලොත් මේ තේරුමක් නැහැ කියන තැන ඉඳලා තමයි මේක මේ වෙලාවේ කරන්න හොඳ නැහැ කියලා නවුෆර් මවුලවී විරෝධතාවක් දක්වලා තියෙන්නේ. ආයුධ, පුහුණු කිරීම් පුපුරුවා හැරීම් මේ සියළු තැන් වල නවුෆර් මවුලවි හිටියා ස්වාමිනි. හිටියා කියන්නේ මාත් එක්ක කථා කරන කොට මම ඇහුවා ස්වාමිනි හැංගිලා හිටියේ කොහෝද මොනවාද කළේ කෑම ලැබුනේ කොහෙන්ද මේ සියළු දෙයක්ම හෙව්වා.

ප්‍ර. ඒ හොයපු දේවල් වලට පිළිතුරු ලැබුණාද?

උ. පිළිතුරු ලැබුණා ස්වාමිනි. සංවිධානයෙන් සල්ලි දිලා තියෙනවා මේවාට. සංවිධානායන් මුදල් ලැබෙනවා ස්වාමිනි. මේ ගොල්ලෝ මාවනැල්ලේ බුදු පිළිම කඩනවා ස්වාමිනි

ප්‍ර. කවුද ඔය කඩන්නේ?

උ. මොහොමඩ් නබීජ් මොහොමඩ් අබ්දුල්ලා සාජික්. ඒ දෙන්නා මගේ ලඟ හිටියේ නැහැ. නමුත් ඒ දෙන්නාගේ ඥාති සහෝදරකම් තියෙන ළඟම ඥාතීන් දෙදෙනෙක් මොහොමඩ් ෆයිසර් මොහොමඩ් මුස්ටි කියන කෙනාත් මොහොමඩ් රමීස්, මොහොමඩ් සාජිත් කියන මවුලවී කෙනාත් මා එක්ක එක සෙල් එකේ හිටියා. ඒ දෙන්නා හරහා උත්සාහ කලා අර දෙන්නා ගැන තොරතුරු සොයා ගන්න. නමුත් මට ඒක ඒ තරම් දුරට සාර්ථක් වුනේ නැහැ ස්වාමිනි. ඔවුන් කොයි තරම් දුරට අන්තවාදයෙන් ඔබ්බට ගිහිල්ලා ද හිටියේ කියලා කිව්වොත් මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් වුලවීවරයා විවාහක බිරිඳට රට යනවා කියලා ගෙරින් ඇවිල්ලා දඹුල්ල ප්‍ර දේශයට ඇවිල්ලා මාස 05 කට වැඩිය හැංගිලා ඉඳලා ඒ ගොල්ලා මඩකලපුවට යනවා ස්වාමිනි. යන්න යනකොට තමයි නවුෆර් මවුලවි දෙදෙනාව සහ සාජික් මවුලවි අත්අඩංගුවට ගන්නේ දඹුල්ල ප්‍ර දේශයේදී මේ වගේ අහන ප්‍රශ්න වලට උත්තර දෙන්න සාක්ෂි ටිකක් ගත්තා ස්වාමිනි.

ප්‍ර. දැන් ඔවුන් කියා සිටියාද ඔවුන් යම් අවස්ථාවකදී ඒ රැදවුම් නියෝග වලදී නිදහස් වෙලා ගියොත් ඔවුන් මොනවාද කරන්නේ කියලා?

උ. එහෙම මට මතක නැහැ ස්වාමිනි.

ප්‍ර. ඔවුන් කියා සිටියාද ඔය 04.21 මියගිය සියළු දෙනාම තමන් සම්බන්ධ කණ්ඩායමට ඔවුනුත් සම්බන්ධයි කියලා?

උ. කිහිප දෙනෙක් සම්බන්ධයි.

ප්‍ර. ඔබගේ සිර මැදිරියේ හිටපු කිහිප දෙනා?

උ. මගේ සිර මැදිරියේ හිටපු හය දෙනාගෙම සම්බන්ධතාවය තියෙනවා ස්වාමිනි.

ප්‍ර. එතකොට 04.26 සයිද මයිර්දු වලදි පුපුරවා ගැනීමක් වුනානේ නිවසක?

FAIR COMMENT BY JEZEEM

උ. 04.26

ප්‍ර. ඔව්?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඒ මියගිය පුද්ගලයන් ඔවුනුත් ඔවුන්ගේ කණ්ඩායම්වල සාමාජිකයන්ද නැද්ද කියන එක නවුෆර් මවුලවි ඔබට කියා සිටියාද?

උ. නැත ස්වාමිනි. 04.26 පුපුරවා ගැනීම සම්බන්ධව මට මතක නැහැ ස්වාමිනි.

ප්‍ර. එතකොට සහරාන්ගේ බිරිඳ ගැන එහෙම ඔබ කථා කලාද?

උ. බිරිඳ ගැන එච්චරද කථා කලේ?
එච්චරයිද බිරින්දෑවරුන් ගැන, සාකච්ඡා කලේ නවුරේ මවුලවිට බිරින්දෑවරුන් දෙදෙනෙක් ඉන්නවා කිව්වා. සහරාන්ව කොහොමද හාදිට සම්බන්ධ කලේ කියන එක ගැන කථා කලා. සහරාන් කෙතාහොමද බිහි වුනේ කියන ගැන ගැන අන්තවාදය පැත්තට. අන්තවාදය කොහොමද බිහි වුනේ කියන එක ඒ ගොල්ලා කියන්නේ නැහැ. දෙවියො වෙනුවෙන් යන ගමනේදි කොහොමද ඒක නිර්මාණය වුනේ කියලා කථා කලා. විවාහක බිරින්දෑවරුන් ගැන එතකොට ඒ බිරින්දෑවරුන් පාලනය කරන ආකාරය, විවාහ වීමේ ක්‍රම වේදය, ඒ විවාහ පාලනය වන ආකාරය, විවාහ දික්කසාද කිරීම් ගැන, දඩුවම් කරන ආකාරය පිළිබඳව නීති තිබෙන ආකාරය පිළිබඳව. සිංහල කුරාණයක් මට හමු වුනා ස්වාමිනි ආමි මොහිදින් කියන පුද්ගලයාගෙන්

ප්‍ර. ආමි මොහිදින්?

උ. ආමි මොහිදින් කියලා කෙනෙක් හිටියා ස්වාමිනි.

ප්‍ර. ඒ ගොල්ලා කොහේද හිටියේ.

උ. ආමි මොහිදින්, ඩොක්ටර් සාපි අනෙක් සිර කුටියේ?

ප්‍ර. අසල් වැසියෝ?

උ. අසල්වැසියෝ ස්වාමිනි.

ප්‍ර. ආමි මොහිදින්ට සිංහල කුරාන් කොයින්ද ඔබට ලබා දෙන්න?

උ. ඒ ගොල්ලා හැම කෙනෙක්ම ඒවා ගෙනල්ලා තිබුණා ස්වාමිනි. සිරමැදිරියේ ඉන්නකොට ඔවුන් ඒවා භාවිතා කළා. සිංහල ආමි මොහිදින්ට හොදින් කියවන්න පුළුවන් ස්වාමිනි. මටත් උවමනාව තිබුණා කියවන්න. මම කියවලා තිබුණේ නැහැ ස්වාමිනි. ආමි මොහිදින් මට දුන්නා මෙන්න මේක කියවන්න කියලා. සාමාන්‍ය පොතක් කියවන ආකාරයට නෙවෙයි අනිත් පැත්තේ ඉදලා කියවන්න තියෙන්නේ. කුරාණයේ සිංහල පරිවර්තනය ස්වාමිනි. කුරාණයේ අඩංගු නබි තුමාගේ ඒ ප්‍රකාශවල නෙවෙයි ස්වාමිනි. කුරාණය පරිවර්තනය කිරීමේදීම සිදු කළ පුද්ගලයෙක් මේ කුරාණය මම දැක්කා ස්වාමිනි. මේ කුරාණයේ මම දැක්කා මේක කියන්නම ඕන ජේසුස් වහන්සේගේ වගේ නෙවෙයි මේ කුරාණය

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. ඒ කුරාණය ඔබ ගෙනල්ලා තියෙනවාද?

උ. නැහැ. ආමි මොහිදින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී භාවිතා කළ සිංහල පරිවර්තනය සහිත කුරාණය ස්වාමිනි.

ප්‍ර. සී 138 සහ සී 1497 ලෙස ලකුණු කර ඇති අල් කුරාන් ග්‍රන්ථයන් දෙක සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා ස්වාමිනි.

ප්‍ර. ඔබට පරිශීලනය පරිහරණය කිරිමට ඔය ආමි මොහොමඩ් නැමැත්තා විසින් ලබා දුන්නේ මේ ග්‍රන්ථ දෙකෙන් එකක්ද?

උ. මට හරියට මතක නැහැ ස්වාමිනි. නමුත් මෙන්න මේ වගේ එකක් මතකයි ස්වාමිනි

ප්‍ර. ඒ කියන්නේ සී 1497 වගේ ග්‍රන්ථයක් කියලා මතකයි?

උ. මට හරියට කියන්න බැහැ.

ප්‍ර. ඔබ කියා සිටියානේ ජේසුස් වහන්සේ ගැන යමක් සඳහන් වෙනවා කියලා?

උ. සඳහන් වෙනවා.

ප්‍ර. පිටුව මතකද?

උ. මතක නැහැ ස්වාමිනි. නබිතුමා.මට මේ පිළිබඳව මට ලොකු දැනුමක් නැහැ ස්වාමිනි. මම මේ දැකපු දේ කියන්නේ සාමාන්‍යයෙන් කියන්නේ. මේවා සමාජයේ ප්‍රශ්න බවට පත් වෙන්න පුළුවන් දේවල් නිසා ස්වාමිනි. මගේ දැනුමේ හැටියට ස්වාමිනි. මේ ඇතුලේ තියෙන කරුණු සම්බන්ධව නෙවෙයි ස්වාමිනි මම කතා කරන්නේ. මෙන්න මේ ආරම්භයේ මෙන්න මෙතන පැහැදිලි කිරීමක් කරලා තියෙනවා ස්වාමිනි. මේ පැහැදිලි කිරීම කරන්නේ මේ කුරාණය සිංහල පරිවර්තනය කරපු අය ස්වාමිනි. ඒ සමාගම ස්වාමිනි. ඒකේ තියෙනවා තැනක මම දැක්කා මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් ඒක පෙන්නුවා. මෙන්න මේකම ඇති මේ තියෙන මිත්‍යා මතවාදය ඉස්මතු වෙන්න. තවත් ආගමකට ප්‍රහාරයක් එල්ල කරලා. තවත් ආගමක් පහත් කරලා ඒ ආගම උගන්වන න්‍යායේ තියෙනවානම්, නීතියේ තියෙනවානම්, ඒ පොතේ තියෙනවානම්, මේ සම්පූර්ණ ඉස්ලාම් දහම මේ පොතට නම් කැටිකරලා තියෙන්නේ ස්වාමිනි මේ පොතෙන්නම් මේ සම්පූර්ණ දහම උගන්වන්නේ ඒ පොත සංස්කරණය කරන මිනිස්සු මේකේ තියෙනවානම් කතෝලික. ඒ ආගම වගේ නෙවෙයි ජේසුස් වහන්සේ ප්‍රකාශ කර දේ වගේ නෙවෙයි නබිතුමාගේ ප්‍රකාශය කියලා සංසදනය කරලා තියෙනවානම් ස්වාමිනි මම තීරණය කරා මේකම මේ අන්තවාදයට යන්න ලොකුම ප්‍රශ්නයක් කියන එක මමම තීරණය කරලා මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට පෙන්නුවා ස්වාමිනි. ඒ නිසා මට දැන් වෙලාවක් දුන්නොත් මට මේ වෙලාවේ ගන්නේ නැතුව මම මේක වෙනම බලන්නම් ස්වාමිනි මං බලන්නම් මේකේ තියෙනවද කියලා ස්වාමිනි. කොහොම හරි අපරාධ පරීක්ෂණ

FAIR COMMENT BY JEZEEM

දෙපාර්තමේන්තුවේ ආමි මොහිදින් ලඟ තිබුණ සිංහල පරිවර්තනය. මං ඒ පොතම ගන්න උත්සාහ කරා. මගේ ළඟත් තියාගෙන හිටියා මං කාලයක් තිස්සේ. නමුත් මට ඒක තියා ගන්න පුළුවන් හැකියාවක් ලැබුණේ නැහැ ස්වාමිනි. එම පරිවර්තනයේ ඒ විදියට සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර. දැන් ඔබලා කතබහ මේ සාකච්ඡා කිරීමේදී ඔබ සමඟ සිටියානේ අර ඊබ්‍රහීම් සහෝදරයෙක්?

උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. ඔහුගේ සිංහල දැනුම කොහොමද?

උ. සිංහල කතා කරන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර. අතිවිශිෂ්ටයිද? හොඳයිද?

උ. බොහෝ දේවල් කතා කරන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර. දැන් ඒ කතාවලදී දැන් ඔහුගේ සහෝදරයාගේ බිරිඳ ඔහු පදිංචි වෙලා හිටපු නිවසේදී පුපුරවා ගන්නට යෙදුණා කියන එක ඔබ දන්නවද?

උ. දන්නවා ස්වාමිනි.

ප්‍ර. ඒ ගැන මොනවද ඔය බිරිඳ ගැන?

උ. මුලින්ම මම දන්නේ නැහැ මොකුත් මට කිව්වේ නැහැ. මට call එකක් ගත්තු එක විතරයි. මම call එකක් අරගෙන මේ ගැන කිව්වා කියලා කිව්වා. නමුත් ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතැම් අවස්ථාවන්වල ප්‍රශ්න කරනකොට සහ ඉන්පසුව අපිත් එක්ක කියපු දේවල් වෙනස් වුණා ස්වාමිනි. නුගේගොඩ පැත්තේ කඩයකින් ජැකට් වගයක් ගන්න ගිහිල්ලා ඒවා සම්බන්ධව මේ අය දැනුවත් වෙලා හිටියා කියලා ඒ සම්බන්ධව කතා කරාම මේ පුද්ගලයෝ නිරුත්තර වුණා ස්වාමිනි. නිරුත්තර වෙලා දෙන්න උත්තර නැති වුණා ස්වාමිනි. ඊට පස්සේ අපි ලොකුවට අහන්න ගියෙත් නැහැ ස්වාමිනි. අහන්න ගියානම් එතන ප්‍රශ්න ඇති වෙන නිසා. හැබැයි ඒ අයගේ කටින් නිතර කතා කරනකොට වචනයක් දෙකක් වචනයක් දෙකක් එළියට එන්න පටන් ගත්තා ස්වාමිනි. ඒකනේ බලන්නකෝ මෙහෙම ප්‍රශ්නයක් වුණානේ කියලා ඒ සිදුවීම සම්බන්ධව විමර්ශන නිලධාරින් දෙයක් හොයා ගත්තට පස්සේ අපිට කිව්වා ස්වාමිනි ඔව් එහෙම එකක් වුණානේ කියලා එහෙම කියනවා ස්වාමිනි. එහෙම නැතුව ඒ අයගෙන් නිකන් අපි කතා කරාට කොයි තරම් කතා කළත් වචන දාන්නේ මං මොකවත් දන්නේ නැහැ. මට දන්නේ නැහැ. මම දැක්කේ නැහැ. මම හිටියේ නැහැ. එවැනි කෙටි පිළිතුරු තමයි ඒවාට ලබා දුන්නේ ස්වාමිනි.

****

දැන් වෙලාව : ප.ව.12.10

මෙතැන් සිට : චන්දිමා මෙනවිය

FAIR COMMENT
BY JEZEEM

වේලාව : 12.10
පෙර සටහන් : ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට: චන්දිමා දිල්හානි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධී නීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔය 4.21 වන දින ස්වයංඝාතකයෝ suicide bombers ලා ඒ ගොල්ලන්ගේ භාර්යාවන් ගැන ඔබලා කථා වුණාද?

පි: මතක නැහැ ස්වාමිනි

ප්‍ර : පලා ගියපු හරි ඔය පුපුරවා ගත්තේ නැති අය ගැන ඔවුන් මොකද ප්‍රකාශ කරේ?

පි: ඒ සම්බන්ධව ප්‍රකාශ කරේ නැහැ ස්වාමිනි.

ප්‍ර : සහරාන්ගේ බිරිඳ අර සයින්ද මර්දුවලදි බේරිච්චි එක ගැන ඔවුන් මොකුත් කියා සිටියද?

පි: ඒ සම්බන්ධව කිව්වේ නැහැ ස්වාමිනි.

****

ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා

ප්‍ර : සාක්ෂිකරු ඔබ ඒ අවස්ථාවේදී ඇහුවේ නැද්ද කොහොමද මේ හාදියා පිපිරිමෙන් බේරුණේ කියන එක ගැන ඒ අය දන්නවද කියලා?

පි දන්නවා ස්වාමිනි. ඇතුලේ හමුවෙලා කථා කරනවා ස්වාමිනි.

ප්‍ර : නැහැ ඔබ ඇහුවේ නැද්ද ඒ අයගෙන්? කොහොමද මේක වුණේ කියලා?

පි මම ඇහුවා අර තරම් ලොකු මිනිස්සුත් මැරිලා මේ තරම් වූටි. මං හදියා ගැන ඇහුවේ නැහැ ස්වාමිනි මම ඇහුවා මේ ළමයාගේ වාසනාවට මේ ළමයා බේරිලා තියෙන්නේ කොහොමද දන්නේ නැහැ මෙච්ච මේ ළමයා මේ විදියට බේරුණේ කියලා. ඒ අය මොකද ඒ වෙනකොට ඇතැම් සැකකරුවන් අත්අඩංගුවට අරගෙන ස්වාමිනි. සන්නිවේදනය ඒගොල්ලන්ගේ බිදවැටිලා ස්වාමිනි සංවිධානය මෙහෙයවන්න කෙනෙක් නැහැ ස්වාමිනි. ඒ වෙන කොට ඒ නිසා ඒ ගොල්ලෝ පිළිබඳව මුකුත් දන්නැති බව තමයි ප්‍රකාශ කලේ ඒ වගේම ස්වාමිනි මටත් දැන ගන්න ලැබුණේ ඒ අය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මොකද වෙන්නේ කියලා ඒ අය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ සිදු වෙච්ච ක්‍රියාවලිය අත්අඩංගුවට ගත්ත වැඩපිළිවෙල පැයෙන් දෙකෙන් දවසෙන් දෙකෙන් සිදු වෙච්ච නිසා ඒ අයට ඒ කටයුතු මෙහෙයවන්නවත් ඊට පස්සේ මොකක්ද වුණේ කොහොමද බේරුණේ ඒ කිසිම දෙයක් ඒ ගොල්ලන්ට දැන ගැනීමේ හැකියාවක් තිබුණේ නැහැ ස්වාමිනි. ඒක තමයි කථා කිරීමේදී සහ ඒ අයත් එක්ක වෙච්චි සිදු වීම් පිලිබඳව අපි සාකච්ඡා කරන කොට දැන ගන්න ලැබුණේ එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අර කටුවා පිටිය බෝම්බකරු වන හස්තුන්ගේ භාර්යාව වන සාරා පිළිබඳව කථා කරාද?

පි සාරා පිළිබඳව කථා කරා ස්වාමිනි.

ප්‍ර : මොනවද?

පි මඩකලපුවේ කෙනෙක් කියලා කිව්වා සාරා ඒ අය කිව්වේ ඉස්සෙල්ලාම ගියා කියලා දැන් අබ්දුල් රාසික්ලා එක්ක කථා කරලා අබ්දුල් රාසික් කියන ඒ එක්කෙනා එක්කම තමයි මේ ගොල්ලෝ මේ විවාහ යෝජනා කරලා බලෙන් වගේ කැමති කරවා ගත්තේ කියලා කිව්වා කැමති කරවගෙන ආගමට ලොකු ලෙන්ගතු කමක් දැක්කුවා කියලා කිව්වා නමුත් රිෆාස් කියන සහරාන්ගේ තාවකාලික රියදුරා විදියට කටයුතු කරපු කෙනා අර ගිරිවුල්ල කඩෙන් ඇදුම් ගත්ත කෙනා ඒ කෙනා ප්‍රකාශ කරා ස්වාමිනි මේ සාරා කියන කාන්තාව එයා ආගම අතහැරලා ආවාට අපි ගොඩාක් දුරට ඒ ටැමිල් අය අපේ අයගේ බිරින්දෑවරු වෙලා ඉන්නවා ඒ ඉන්න බොහෝ දෙනෙක් අපි සම්බන්ධ කර ගන්න උත්සහ කරලා තියෙන්නේ මේ වගේ වැඩවලට කියලා කාපාර්චීන් මොහොමඩ් ෆායිස් කියන කෙනාගේ බිරිඳත් ද්‍රවිඩ ස්වාමිනි. ඒ දෙන්නා එකට ඉදලා තමයි කථා කරේ. අපි අපට අපේ ජාතියට බිහිකරනවා හැබැයි අපි ජාතිය වෙනුවෙන් කවුරු හෝ කෙනෙක් ආගම වෙනුවෙන් සම්බන්ධ වුණා නම් ඒ කැපකිරීම් කරන්න ඕන කියලා ඒක සම්පූර්ණ අනිත් සියලු දේ අත් හරින්න ඕනේ ඒ අත් හැරලා ඉස්ලාම් ආගමට අනුව කටයුතු කරන්න ඕනේ කියලා කිව්වා ඒ සඳහා ඒ ගොල්ලෝ ඒක සැලැස්මක් විදියට තමයි ද්‍රවිඩ තරුණියක්ව විවාහ කර ගන්නේ ඒ විදියේ කථාවක් කිව්වා ස්වාමිනි. ත්‍රිෆාස් කියන කෙනා ස්වාමිනි.

ප්‍ර : දැන් සාරා කොහේද ඉන්නේ මොකද කරන්නේ?

පි සාරා පිළිබඳව ඊට පස්සේ කිසිදු කථාවක් නැහැ ස්වාමිනි සරා suicide වුණාද සාරා වෙන කිසිම දෙයක් නැහැ ස්වාමිනි ඒ ගොල්ලෝ ඒ සම්බන්ධව කිසිම දෙයක් සඳහන් කරන්නේ නැහැ ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් මීට අමතරව මිය ගියානේ ටික දෙනෙක් මේ NTJ එකේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊට අමතරව රිමාන්ඩ් එකේ ඒ කියන්නේ CID එකේ හරි TID එකේ හාරේ හරි රිමාන්ඩ් එකේ නැති ඔය නවුෆර් මවුලවි වැනි අන්තවාදී පුද්ගලයන් තවත් මෙම සංවිධානයේ ඉන්නවද නැද්ද කියන එක ඔබ සොයා බැලුවේ නැද්ද?

පි සංවිධානයේ බහුතරයක් නැහැ ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි සංවිධානයත් එක්ක යම් යම් සම්බන්ධතා තිබුණ මිනිස්සු හිතවත් කම් තිබුණු මිනිස්සු සමහර අය මේක ත්‍රස්තවාදී සංවිධානයක් කියලා දැන ගෙන සම්න්ධතා තිබුණු මිනිස්සුත් නෙමේ එහෙම අය බේරිලා ඉන්නවා ඇරෙන්න බොහෝ පිරිසක් අත්අඩංගුවට පත්වෙලා ඉන්නේ ස්වාමිනි. ඒ වගේම විශේෂයෙන්ම මේ සංවිධානය ඇතුලේ නෙමේ මේ ඉස්ලාම් අන්තවාදයේ ඉන්න මම දකින මම කාලයක් තිස්සේ හොයාගෙන යන පුද්ගලියින් ස්වාමිනි මම අදටත් ස්වාමිනි ඉතා වගකීමෙන් මෙම ගරු කොමිෂම ඉදිරියේ ඒ ප්‍රකාශ කරනවා. ඉන්නවා ස්වාමිනි.

ප්‍ර : කවුද?

පි ඒ කියන්නේ ස්වාමිනි සිලෝන් තවුහිද් ජමාත් සංවිධානයේ මහලේකම් අබ්දුල් රාසික් ස්වාමිනි. මට චෝදනා එල්ලවෙයි ස්වාමිනි. නමුත් මම අන්තවාදය පිළිබඳව හොයන කෙනෙක් විදියට මම ඉතා වගකීමෙන් ඒ ප්‍රකාශ කරනවා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ ප්‍රකාශය?

පි ඔහු අන්තවාදී තීන්දු තීරණවල ඉතිහාසේ පටන් හිටියා ස්වාමිනි වර්තමාන නීතියට භය නිසා ඔහු දැනට අන්තවාදී අදහස් යටපත් කරගෙන කටයුතු කරනවා ස්වාමිනි ලද නිමේෂයක ස්වාමිනි ලංකාව ඇතුලේ ත්‍රස්තවාදය නැවත හිස එසවීමට කටයුතු අබ්දුල් රාසික් විසින් සිදු කරනවා ස්වාමිනි.

ප්‍ර : මොන වගේ කටයුතුද?

පි ඔහු අන්තවාදී කටයුතු සිදු කරන්නේ ස්වාමිනි යුද්ධයකින්ම අන්තවාදී කටයුත්තක් සිදු කරන්න අවශ්‍යතාවයක් නැහැ ස්වාමිනි. ඔහු කරන්න අවශ්‍යතාවයක් නැහැ ඔහු ඒ ආකල්පය ගොඩනැගපුවාම ත්‍රස්වාදීන් බිහි වෙනවා ස්වාමිනි. ඒ ආකල්පය ගොඩනැඟීම ඔහු ආරම්භ කරා ස්වාමිනි ඒ ආරම්භ කරේ බුදු රාජාණනන් වහන්සේ ගෑනුනෙක්ගේ මස් කෑවා කියපු තැනින් පටන් ගත්තේ ස්වාමිනි. ඒ සියලු තොරතුරු මේ කොමිෂමේ ඇති කියලා මා විශ්වාස කරනවා ස්වාමිනි. එතනින් පටන් ගත්තු ඒ අන්තවාදය දිගින් දිගටම ඔහු ප්‍රචාරය කරගෙන ආවා ස්වාමිනි. මේ ඊයේ පේරේදා වෙනකම් දැනට රටේ ව්‍යවස්ථාපිත නීතියටත් එහා ගිහිල්ලා තමන්ගේ ආගමික අයිතිවාසිකම් කියලා ලංකාවේ හඩක් නගන්න මං දැක්කා ඊයේ පෙරේදාත් කටයුත්ත කරලා තිබ්බා ආගමික අයිතිවාසිකම් ඉල්ලුවාට රටේ ව්‍යාවස්ථාපිත නීතියට පිටින් ඒ ආගමික අවශ්‍යතා ඉටු කර ගන්න ඔහු උත්සහ කරනවා ඔහු පිටුපස තාමත් ගමන් කරනවා කියන එක ස්වාමිනි මං කියන්න කැමතියි උදාරණයක් විදියට මම 2017 මම රාජ්‍ය බුද්ධි සේවය දැන්නුවා ස්වාමිනි 2018 ස්වාමිනි 2017 ස්වාමිනි සමාවෙන්න 2017 දෙසැම්බර් මාසේ ගෝල්ෆේස් පිටිටනිය ඉස්සරහා තිබුණා උද්ඝෝෂණයක් ස්වාමිනි මේ උද්ගෝෂණය තිබුණේ ස්වාමිනි ඇමරිකාවේ ඩොනල්ඩ්ට්‍රම්ප් IS ත්‍රස්ත සැකරුවන්ට ප්‍රහාර දියත් කරනවාට විරුද්ධව මගේ ළඟ පින්තූර කීපයක් තිබුණා ස්වාමිනි මම DIG නාලක

FAIR COMMENT BY JEZEEM

සිල්වා මහත්මයාට සහ රාජ්‍ය බුද්ධිසේවයට ඒ පින්තූර ලබා දුන්නා. මම එතතනදි පෙන්නුවා ඇමරිකාවේ ඩොනර්ට්‍රම්ප්ට් IS ත්‍රස්ත සැකකරුවෙකුට ප්‍රහාර දියත් කරනකොට ලංකාවේ ළමා අයිතිවාසිකම් මානවහිමිකම් උල්ලංඝනය කරලා කිරි දරුවෝ අතේ තියාගෙන ගිහිල්ලා ස්වාමිනි හවස තුනට විතර අර ගෝල්ෆේස් එකේ අව්වේ තියාගෙන බිම වාඩි කර ගෙන මෙම උද්ඝෝෂණය කරනවා ස්වාමිනි. ඒ කිරි දරුවා දන්නේ නැහැ ස්වාමිනි. මම ඉතාමත්ම කණගාටු වෙනවා ස්වාමිනි මේ දේවල් අපි හරියට පෙන්නුවොත් ස්වාමිනි. නමුත් ඒ දේවල්වල ක්‍රියාමාර්ග නොගත් එක පිළිපඳව මම කනගාටු වෙනවා. ඒ කිරි දරුවෝ මේක අන්තවාදය ත්‍රස්තවාදයක්ද ජාතිවාදයක්ද එහෙම නැත්නම් මෙතන ක්‍රියාත්මක වෙන්නේ මොකක්ද ඇත්තටම ගහන්නේ ත්‍රස්තවාදීන්ට ද කියලා කිරි දරුවෝ දන්නේ නැහැ ස්වාමිනි අපේ රටේ ළමා අයිතිවාසිකම් කියලා මහලොකුවට කථා කරනවා ස්වාමිනි නමුත් කනගාටුවෙනවා ස්වාමිනි ඒ තරම් ප්‍රස්ද්ධියේ මාධ්‍ය ඉදිරියේ අර වගේ කටයුත්තක් සිදුවෙන කොට මේ ළමයාගේ අයිතිවාසිකම් මේ රටේ නීතියට අනුව උල්ලංඝනය වෙනවා කියලා කිසිම කෙනෙක් අහන්න නැහැ ස්වාමිනි. අන්න ඒවා දැකපු නිසා මම සිංහල සහ සිංහල ස්වාමිනි විශේෂයෙන්ම කියන්න ඕනී සිංහලත් අන්තවාදයත් තියෙනවා ස්වාමිනි මේ රටේ. ඒ අන්තවාදයත් නැතිවෙන්න ඕනේ ස්වාමිනි මේ අන්තවාදය කියන පොදු වචනයේ ඉදලා තමයි මං ඉස්සරහට ගියේ ස්වාමිනි. මේ දෙපැත්තේම තියෙනවා සිංහල අන්තවාදයක් බිහිවෙන්නේ මූලිකත්වය ගත්තා ස්වාමිනී. ඉස්ලාම් දහමෙන් ඔබ්බට ගිහිල්ලා අන්තවාදයට ගිය මිනිසුන්ගේ ක්‍රියාකලාපය කියන්න කැමතියි ස්වාමිනි.

ප්‍ර : දැන් පාස්කු ප්‍රහාරයෙන් පසුව ඔවුන්ගේ ඉලක්කය වෙලා තිබේබේ මොකක්ද?

පි ඒ පිළිබඳව දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබ පාසැල් අවදියේ ඒ ඔබගේ ඒ පාසලේ සංවිධානවල සාමාජිකයෙක් එහෙම වෙලා හිටියද?

පි ස්වාමිනි සර්වෝදය සංවිධානයේ සාමාජිකයෙක් වෙලා හිටියා ස්වාමිනි දහම් පාසලේ ශිෂ්‍යනායකයෙක් වෙලා හිටියා දහම් පාසැල් සමිති සමාගම් සමඟවල නිලතල දැරවා ස්වාමිනි

ප්‍ර : ඔබගේ පාසැල් දරුවෙක් ළමයෙක් කුඩා දරුවෙක් වශයෙන් ඉන්නකොට ජීවිතයේ මම වැඩිහිටියෙක් වුණාම මම වෙන්නේ කවුද කියලා ඇහුවොත් අපි පොඩිකාලේ එක් එක් උත්තර දෙනවා?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔබගේ ළමාකාලයේ ඔබට කවුරු වෙන්නද පොඩි කාලයේ ඉදලා අවශ්ථාව වෙලා තිබ්බේ?

FAIR COMMENT
BY JEZEEM

පි ස්වාමිනි කවුරු වෙනවද කියන එක මගේ ඉලක්කයක් තිබුණේ නැහැ ස්වාමිනි නමුත් මම හිතුවා රටට වැඩදායි හොඳ වැඩක් කරන මනුශ්‍යයෙක් බවට පත්වෙනවා කියලා මං හිතුවා ස්වාමිනි එතකොට නොයෙක් අහදස් අවා හමුදාවට යනවා හමුදාවට ගිහිල්ලා හොඳ සේවයක් කරනවා එහෙම නැතිනම් මම ඉගෙන ගෙන හොඳ රැකියාවක් කරනවා ඒ වගේ අදහස් විවිධ අදහස් ආවා ස්වාමිනි නමුත් පොදුවේ තිබුණා මේ රට වෙනුවෙන් මට කරන්න පුළුවන් උපරිම දෙයක් කරනවා කියන එක එතනදි මට ආපු පළවෙනි එක අදහස තමයි ස්වාමිනි මත්ද්‍රව්‍ය ඒකට හේතුව මම දැක්කා යුද්දෙන් පස්සෙත් ඒ කාලේ මට ලොකුවටම ඔළුවට දැනුන දේ තමයි මේ මත්ද්‍රව්‍ය කියන එක තමයි පළවෙනියටම රටේ නැති කර ගන්න ඕනේ කියලා මම ගමේ සමහර මිනිසුන්ට ගොවිතැන් කරලා ගොවිතැන් කරලා පාසැල් යන ගමන් ගොවිතැන් කරනවා ස්වාමිනි මොකද පාසැල් යන්න අවශ්‍ය දේවල් ගන්න ඕනේ නිසා ගොවිතැන් කරලා ණය මුදල් පවා ගෙවලා ඒ කටයුතු කරලා තියෙනවා ස්වාමිනී. මං උපන් ගමේ.

ප්‍ර : දැන් සාක්ෂිකරු දැන් ඔබට ඒ කියන්නේ පාසලෙන් පසුවනේ මත්ද්‍රව්‍ය නිවාරණය ගැන ඔබේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ආකාර්ෂණය යොමු වුණේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : පාසැල් කාලේ තිබ්බේ මොකක්ද අර Ambition කියන්නේ මොකක්ද මං කරන්නේ?

පි පාසැල් කාලයේ වැඩි පුරම හිතුවේ ස්වාමිනි හමුදාවට යනවා කියලා ඒක ඔළුවේ තිබුණා ස්වාමිනි ඉතින් මොකද හේතුව එහෙම හිතන්න හේතුව ගොඩාක්ම තිබුණා ස්වාමිනි එකක් ඒ ඒක ගෞරවාන්විත සේවයක් අනෙක් එක ස්වාමිනි ලොකු දැනුමක් අධ්‍යාපනයක් ලබා ගන්න ලොකු අවශ්‍යතාවයක් මට තිබුණේ නැහැ ස්වාමිනි අපිට උවමනා වුණේ අද හැන්දෑ වුණා නම් හෙට උදේ වෙනකම් ජීවත් වෙන්න විතරයි ස්වාමිනි. මට මගේ හදවතට මගේ හඳවතට දැනීලා තියෙනවා ස්වාමිනි රාත්‍රී 10,11 ට හෙට උදේ එලිවෙනකම් ජීවත් වුණා නම් හොඳටම ඇති උදේ දවල්ට නම් LTTE කාරයන්ට සෙල්ලම් දාන්න බැහැ දුවලා හරි බේරෙනවා කියන අදහස තිබුණා එහෙම තිබුණ නිසා හමුදව ගැන තමයි ලොකු අදහසක් තිබුණේ ස්වාමිනි.

ප්‍ර : දැන් යුද්ධය ඉවරවුණානේ 2009?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට අවුරුදු 23 ක් විතර ඇති?

පි එහෙමයි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ කාලයේ යුද්ධය ඉවරවෙන කොට ඔබ මොනවද කරමින් හිටියේ?

පි යුද්ධය ඉවර වුණේ 2009 ස්වාමිනි 2009 මට මතක් වෙනවා මම ගුවන් හමුදාවට යන්න උත්සහ කරා ස්වාමිනි. මම ගරු කොමිෂම ඉදිරියේ සත්‍යම ප්‍රකාශ කරනවා මොකද මම ජීවිතයේ බලාපොරොත්තු වෙච්චි තැනක් තමයි ස්වාමිනි මෙවැනි කොමිෂම කියන වචනයක් මගේ හිතේ තිබුණේ නැහැ මට තිබුණේ ජනාධිපති කාර්යබලකායක් ඇති කරන්න මගේ අදහස තිබුණේ. මගේ තිබුණ දැනුම එච්චරයිනේ මම අදටත් බලාපොරොත්තු වෙනවා මෙම කොමිෂම ඉවර වෙලා මේ පාස්කු ප්‍රහාරයෙන් මේ කොමිෂම හොයලා ඉවරවෙලා නැවත මෙවැනි කොමිෂන් ඕනේ කියලා මොකද හේතුව මෙවැනි ප්‍රශ්න ඉදිරියට එනවා ස්වාමිනි මේ රට ඇතුලේ අනිවාර්යෙන්ම නිර්මාණය වෙනවා ඉතින් ඒ නිසා මම අද කියන්න කැමතියි 2009 මට හමුදාවට ගුවන් හමුදාවට යන්න හිතුණා. ඇත්තටම ස්වාමිනි මට ඒ ගුවන් හමුදාවට යන්න අධ්‍යාපන සුදුසුකම් තිබුණේ නැහැ පස්සේ මම දන්න කීපදෙනෙකුට කථා කරලා මට මේ අධ්‍යාපන සහතිකයක් හදා ගන්න ඕනේ කියලා අන්න ඒ වැරදි කරලා තියෙනවා ස්වාමිනි මම ඒවා මම අද මේ ගරු කොමිෂම ඉදිරියේ ඒවා මං පිළිගන්නවා ස්වාමිනි එවැනි වැරදි කරලා හැබැයි මම එවැනි වැරදි අධ්‍යාපන සහතිකයක් හදපු වරද කරා මං ස්වාමිනි ඒ කරලා මං හමුදාවට ගියා නමුත් අනතුරක් වෙලා මට ආපහු හමුදාවට යන්න ලැබුණ් නැහැ වැඩි කාලයක් ඉන්න වුණේත් නැහැ මාස දෙකක්ද තුනක් ද ඉන්න වුණේ ස්වාමිනි පුහුණු පාඨමාලවත් හැදෑරුවේ නැහැ ඉතින් ඒක තමයි පහුගිය දවස් වල මං දැක්කා තියෙනවා නාමල් කුමාර ගුවන් හමුදාවේ හිටියා කියා නාමල් කුමාර ගුවන් හමුදාවේ හිටියා කිව්වාට ස්වාමිනි පුහුණු පාඨමාලාවක්වත් හැදෑරුවේ නැහැ ස්වාමිනි. ඊට පස්සේ මම එතන එකම වරද කරේ. මම එතන අධ්‍යපාන සහතිකයක් මට ඒක හිතුණා ස්වාමිනි ඉතිහාසයෙන් මම ඒ වරද කරා ස්වාමිනි. හැබැයි මම ඊට පස්සේ කාලයක් එක්ක යන කොට මට හිතුණා මං මෙහෙම වරදක් ජීවිතයේ කරලා තියෙනවා කියලා. නමුත් යම් තැනකදි ඇහුවොත් අනිවාර්යෙන්ම මං ඒක කියනවා කියලත් හිතාගෙන ඉන්නවා ස්වාමිනි. හෙට අධිකරණයකින් දඬුවමක් ලැබුණත් ඒ වරදට මං ඒකේ වරද පිළිගන්නවා ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඒ කියන්නේ සාක්ෂිකරු ඔබ පන්සිල් පද පහෙන් එකක් කඩලා?

පි ඔව් ස්වාමිනි මම ඉතිහාසයේ මගේ පන්සිල් පද කැඩිච්ච අවස්ථා තියෙනවා මත්ද්‍රව්‍යත් භාවිතා කරලා තියෙනවා මත්ද්‍රව්‍ය වල තියෙන හානිය මම දන්නවා ස්වාමිනි ඒකයි මත්ද්‍රව්‍ය නැති කරන්න මම මත්ද්‍රව්‍ය

FAIR COMMENT
BY JEZEEM

ජාවාරම්කාරයම්ගෙන් ගුටි කාලා රෝහල්වල ඉඳලා තියෙනවා මගේ ඔළුවලට බෝතලේ බෙල්ල මිරිකලා මෙහෙම ගන්න හදන කොට තුන්දෙනෙක් පැනලා බේරගත්තේ ස්වාමිනි. ඒවා තියෙනවා ඉතිහාසයේ ඒ අත්දැකීම් තියෙනවා ඒ එහෙම බේරගන්න හේතුව මත්ද්‍රව්‍ය ජාවාරමට ගන්න විරුද්ධ වෙච්චි එකම කෙනා මම ස්වාමිනි තනියෙන්. අනිත් අය බයයි ස්වාමිනි මේ මත්ද්‍රව්‍ය ජාවාරමත් එක්ක යන්නේ ත්‍රස්ත මේක අන්තවාදයක් වගේ නිසා ස්වාමිනි. ඒ නිසා අතීතයේ මගේ ඉතිහාසයේ එවැනි වැරදි වෙලා තියෙනවා ස්වාමිනි ඒ දේවල් මම පිළිගන්න සුදානම් ස්වාමිනි.

ප්‍ර : හරි එතකොට ඔබ මං කිව්වොත් කුඩා කාලයේ ඉදලම නායකත්වයට කැපීපෙනීමට කැමති පුද්ගලයෙක් කියලා ඒක වැරදිද?

පි ස්වාමිනි ඒක මට දැනෙන්නේ නැහැ මට පුළුයන් විදියට වැඩ කර ගෙන යනවා එතනදි කැපී පෙනීමක් එනවද කියලා කියන්න මට තේරෙන්නේ නැහැ ස්වාමිනි හැබැයි මම ගිය ගොඩාක් තැන් වල මම හිටපු ගොඩාක් තැන් වල මෙහෙයවීම නායක්වය දේවල් වගේ මට ලැබිලා තියෙනවා මට එක උදාහරණයක් වෙනවා ස්වාමිනි මං මේක ගරු කොමිෂමේ මට විනාඩියක කාලයක් දෙනවා නම් මම කැමතියි ඒක කියන්න. සෙලින්කෝ සාමාගමේ සභාපතිතුමාගේ දේශනයක් තිබුණා දවසක් කොළඹ එතුමා දේශනය පටන් ගන්න කොට අහගෙන ගියා හැම කෙනාගෙන්ම පාසලේ නම කියන්න කියලා කියාගෙන යන කොට මේ කොළඹ අවට තමයි ඔක්කෝම හිටියේ ස්වාමිනි. මගේ පාසලේ නම අම්පහ බොරපොත විද්‍යාලය කිව්වාම ඔක්කෝම හිනා වුණා ස්වාමිනි. හැබැයි දේශනය අවසන් කරලා එතුමා වෙනුවෙන් ස්තූති කථාවක් කරන්න අවස්ථාවක් එනවා අන්න එතකොට ස්වාමිනි ස්තූති කථාව කරන්න කෙනෙක් හිටියේ නැහැ ස්වාමිනි මම මට ඒ වෙලාවේ මිනිස්සු මගේ පාසලේ නම අහලා හිණාවුණාට ඒ ස්තූතිකථාව කරාට පස්සේ නැවත සෙලින්කෝ සමාගමේ සභාපතිතුමා ගොඩ්ඩින් පෙරේරා මැතිතුමා හිටපු සභාපතිතුමා එතුමා නැවත මයික් එකට ඇවිල්ලා කිව්වා අපි බලා පොරොත්තු වෙන්නෙත් මෙන්න මේ වගේ මිනිස්සු නායකත්වය හොයා ගන්න අවාසන මොහොතත් ඇති කියලා කිව්වා ඉතින් ඒ නිසා ස්වාමිනි මං දන්නේ නැහැ මට ඒක බොහෝ තැන් වල ලැබෙනවා ස්වාමිනි මට ඒ පිළිබඳව කියන්න තේරෙන්නේ නැහැ.

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබ ජනාධිපති කාර්යකසාධක එවැන්නක් පිහිටුවීමට කැමැත්තෙන් හිටි බව ඔබ කියා සිටියානේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ යම් අවස්ථාවකදී මත්ද්‍රව්‍ය නිවාරණය කිරීම සම්බන්ධයෙන් වන ජාතික ජනාධිපති කාර්යසාධකයට ඔබ සම්බන්ධ වුණාද?

පි එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒ කොයි කාලේද?

පි ස්වාමිනි මම මත්ද්‍රව්‍ය ත්‍රස්තවාදයක් විදියට දැක්කේ 2015 න් පස්සේ ස්වාමිනි. ඒ 2015 න් පස්සේ මම දැක්කාට පස්සේ මං මේකට කටයුතු කරගෙන යන කොට මට බාධක ආවා මට හිතුණා මං ගමේ විතරක් නෙමේ මට පුළුවන් විදියට උපරීම කරනවා කියලා මං ඒ පිළිබඳව පාඨමාලවක් හැදෑරුවා ඒ පාඨමාලාවක හැදෑරුවාට පස්සේ මට ගම්වල ග්‍රාමීය මට්ටමින් වැඩ සටහන් සංවිධානය කරන්න අවශ්‍ය විදියේ පසු බිම නිර්මාණය වුණා ස්වාමිනි මගේ දවසින් දවස වැඩසටහන් වර්ධනය වෙලා එනකොට මං බැලුවා ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණයට තියෙන ආයතන මොනවද ඒවායෙන් මොනවද කරන්නේ ඒවායෙන් තියෙන ආයතන ඒවා කොහේද තියෙන්නේ කවුද ඒවා මෙහෙයවන්නේ මොනවද ඒවායෙන් කරන්නේ කියලා මේ පිළිබඳ හෙව්වා ස්වාමිනි. අවසානේ හොඳම තැනක් තියෙනවා මේ සියලු ආයතන ඒක රාශිවෙච්ච තැනැක් තියෙනවා මත්ද්‍රව්‍ය නිවාරණ කාර්ය සාධකබලකාය ඒක හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහත්මයාගේ ඒක සංකල්පයක් අනුව ක්‍රියාත්මක වෙන වැඩසටහනක් ස්වාමිනි. ඊට පස්සේ මම එතැන්ට ලිපියක් ඉදිරිපත් කලා මට එතන අධ්‍යක්ෂක වෛද්‍ය සමන්තකුමාර කිතලආරච්චි මහත්මයා හම්බෙන්න පුළුවන් වුණා ඉතින් එතුමා කෑගල්ල හිටපු මහ දිසාපති අබේවික්‍රමවනසිංහ මහත්මයාට ලියුමක් ඉදිරිපත් කරා මෙහෙම පුද්ගලයෙක් ඉන්නවා ස්වාධීනව වැඩ කරන්න පුළුවන් පුද්ගලයෙක් මේ කෙනාව සම්බන්ධ කර ගන්න කියලා ලිපියක් ඉදිරිපත් කළා ස්වාමිනි. ඒකත් එක්ක සම්බන්ධ වුණාට පස්සේ මම ජනාධිපති කාර්ය සාධක බලකායට ඒ ගොල්ලෝ කරගෙන යන වැඩ පිළිවෙලත් එක්ක මම නිකම් මගේ අදහස් ඉදිරිපත් කරා ස්වාමිනි මම කිව්වා. මම කිව්වා මේ මත්ද්‍රව්‍ය නිවාරණය අවුරුදු එකසියගාණක් මේ ලංකාවේ කර ගෙන යනවා. නමුත් හරියට කෙරිච්ච දෙයක් නැහැ මේ කරන හැටිය ටිකක් වෙනස් වෙන්න ඕනේ. මේක පක්ෂකයකට කාර්යාලකට මනුශ්‍යයකුට ලකුණක් වැටෙන විදියට නෙමේ මේක කෙරෙන්න ඕනේ කියලා මං මගේ ස්වයං අදහස් ඉදිරිපත් කරා මේ මත්ද්‍රව්‍ය මම දැකපු දේ මම සමාජයේ මම ඒ මිනිස්සුත් එක්ක මත්ද්‍රව්‍ය භාවිතා කරන අයත් එක්ක එකට හිටියාම ඒවාට යොමු වෙන්නේ කොහෝමද ඒවා එවැනි දේවල් එවැනි අදහස් මම ඉදිරිපත් කරා ස්වාමිනි ඒ ඉදිරිපත් කිරීමත් එක්ක මට පළවෙනි වැඩසටහනට ආරාධනා කරා කළුතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබුණ ග්‍රාමනිලධාරි සහ දිවි නැගුම නිලධාරින්ගේ වැඩමුළුවක සාකච්ඡාවකට මට ආරාධනාවක් කරා ජනාධිපති කාර්යාලයෙන් ඒ ආරාධනාවට මම ගියා ඉන් අනතුරුව වැඩසටහනෙන් පස්සේ මට නිතර ජනාධිපති කාර්යාලයට වැඩසටහන් එනවා ඒ වැඩසටහන් වලදි ඒ අය මට කථා කරලා කියනවා මෙන්න මේ අය අහවල් තැන වැඩසටහනක් තියෙනවා

FAIR COMMENT BY JEZEEM

වේලාව තියෙනවා නම් පුළුවන් නම් යන්න කියලා කියනවා ස්වාමිනි එවැනි අවස්ථාවල එවැනි සහයෝගය ලබා දීලා තියෙනවා ලංකාව පුරාම ගිහිල්ලා මගේ අතේ සල්ලිවලින් මට ලොකු ගාණක් යන්නේ නැහැ ස්වාමිනි. මම බස් එකේ ගියා බස් එකෙන් බැස්සා වැඩසටහන කරා බස් එකේ නැග්ගා ආවා. ඇතැම් වැඩසටහන්වලදි සාමාන්‍ය රුපියල් 2000 ක් , රු.3000 ක් , 4000 ක් මෙන්න මේ වගේ ගනන් දෙනවා ස්වාමිනි. ඒ වැඩසටහන් සංවිධානය කරන වැඩසටහන් ඉවර වුණාම සතුටට දෙනවා ස්වාමිනි. ඒක මං අරගෙන එනවා ස්වාමිනී. මට කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙන්න මේ වගේ දෙයක් සිද්ධවුණා ස්වාමිනි ජනාධිපති කාර්යාලයත් එක්ක ඊට අමතරව 2017. 05. වෙනි මාසේ 31 ලෝක දුම්වැටි විරෝධී දිනය එනකොට ස්වාමිනි මම යෝජනාවක් කරා ලෝක දුම්වැටි විරෝධී දිනයන් ඕනතරම් ඇවිල්ලා තියෙනවා ලංකවේ නමුත් මේ පාර ඔය ගොල්ලෝ කැමති නැද්ද වෙනස් විදියේ දෙයක් කරන්න මම මගේ ළඟ අදහසක් තියෙනවා මං ඉදිරිපත් කරන්නම් කියලා ඩොක්ටර් සමන්තට ඒක ඉදිරිපත් කරායින් පස්සේ ඇහුවා කොහොමද කරන්නේ කියලා මං කිව්වා මෙන්න මේ විදියට රෝඩ්සෝ එකක් අපි කරමු කියලා යෝජනාවක් ගෙනවිල්ලා ඒක කරන්නේ කොහොමද කියලා මම කිව්වා කිව්වාට පස්සේ ඒකට අනුමත වුණා ස්වාමිනි සැලැසුම් සියල්ල දියත් වුණා ස්වාමිනි ත්‍රිවිධ හමුදාවත් සම්න්ධකරගෙන ඒ වැඩසටහන කරන්න සැලසුම් කරා. නමුත් අවසානයේ 2017 මැයි 31 කියන්නේ ස්වාමිනි හොදට ගංවතුර තිබුණුදවසක් ස්වාමිනි මෙන්න මේ ගංවතුරත් එක්ක ලංකාවේ තිබුණ සියලු වැඩසටහන් ජාතික වැඩසටහන් තාවකාලිකව නවත්වලා දැමීමට මේ නිසා මේ වැඩසටහනත් නවත්වලා දැමීමා ස්වාමීනි.

ප්‍ර : තමන්ට ජනාධිපති කාර්යාලයෙන් මේ වැටුපක් ලැබුණද?

පි නැත ස්වාමිනි.

ප්‍ර : කාර්යාංශයෙන් ගෙවීමක්?

පි නැත ස්වාමිනි හැබැයි ස්වාමිනි ඔන්න ඔය ජාතික වැඩසටහන වේලාවේ ස්වාමිනි මං ඒක විශේෂයෙන්ම කියන්න ඕනේ මේ වෙලාවේ මට සමහර දවස්වලට ස්වාමිනි කොළඹ එන්නවත් සල්ලි නැහැ. මං අද එන්නෙත් මේ කොළඹ මට හම්බිච්චි යාලුවෙකුට මම ඊයේ කථාකරලා කියනවා හැන්දෑවේ 6 ගාණක මං සල්ලි හොයා ගන්න බැලුවා මං මට හෙට කොළඹ පාස්කු කොමිෂන් එකට යන්න තියෙනවා මගේ නම් Account එකක් නැහැ. මගේ Account තිබුණා ස්වාමිනි Account දැන් භාවිතා කරන්නේ නැහැ. මම වයිෆ්ගේ නංගිගේ account එක දීලා කිව්වා මට රුපියල් 1000 ක් දාන්න හෙට පාස්කු කොමිෂන් එකට ගිහිල්ලා එන්න කියලා මෙන්න මේ වගේ මම ඉල්ලගත්තු දේවල් තියෙනවා ස්වාමිනි

FAIR COMMENT BY JEZEEM

ඒවා මම කියන්න මේ කොමිෂන් එකට ඉදිරියේ පමණක් නෙමේ ලෝකයේ ඕන තැනක කියන්න මම ලැජ්ජා වෙන්නේ නැහැ ස්වාමිනි. ඒ වගේ අවස්ථාවලදි මම ජනධිපති කාර්යාලයේ වවුචරයකට අත්සන් කරලා රුපියල් 500 , 1000 ඉල්ලගෙන ඇති ස්වාමිනි. ඉල්ලගෙන තියෙනවා ස්වාමිනි. උපරිම ඒ එකතුව රුපියල් 4500 ක් හෝ 5000 ක් ඇති ස්වාමිනි. එකතුව සමස්ථ එකතුව ඊට වැඩියෙන් අරගෙන නැහැ ස්වාමිනි ඒ නිසා මම ගොඩාක් කනගාටු වෙනවා ස්වාමිනි එවැනි ප්‍රකාශයක් නිකුත් වෙලා තිබ්බා ඒක ගැන මේ ගරු කොමිෂම ඉදිරියේදී මම වැටුප් ලබා ගත්තා කියලා වැටුප් ලබාගෙන නැහැ ස්වාමිනි මගේ සේවය කවදාවත් ඒ වගේ වැටුපක් ගත්තා නම් මං ගත්ත කියලා කියනවා ස්වාමිනි. ඒක කිසිම ප්‍රශ්නයක් නැහැ ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් සාක්ෂිකරු රසිකා සංජීවනි කියලා මුහුණත් පොතේ?

පි face book ඒකක් ස්වාමිනි

ප්‍ර : ඔබට යාළුවෙක් ඉන්නවද?

පි ස්වාමිනි මේ face book හදන්නේ ත්‍රස්තවිමර්ශන දිසාවේ දැනට ඉන්නවාද දන්නේ නැහැ. හිටපු පොලිස් කොස්තාපල් සෙනවිරත්න මහතා මහත්මයා තමයි හදන්නේ. එතකොට මේක හදන්නේ ත්‍රස්තවිමර්ශන දිසාවේ office එකේදි මේක හදන දිනය තමයි 2017.09.20 ස්වාමිනි මේක හදන්නේ හැන්දෑවේ 6 ගාණකට වගේ මගේ මතකය විදියට 6ට,7 විතර ස්වාමිනි. මේ දවස තමයි නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහත්මයා සහ මම හම්බෙව්ව පළවෙනි දවස ස්වාමිනි. ඒ හම්බෙන්නේ එතුමාගේ office එකේදී සාමාවෙන්න ස්වාමිනි ඒ හම්බෙන්නේ එතුමාගේ office එකේදී ඒ හම්බෙන්න හේතුව එතුමාට අදාළ ත්‍රස්තවාදී තොරතුරක් මං ලබා දෙනවා ඒ ලබා දුන්න දවසේ තමයි මාත් එක්ක සම්බන්ධ වෙන්න සහ එතුමාගේ අවශ්‍ය අනිත් දේවල් කර ගන්න කියලා රසිකා සංජීවනි කියලා මුහුණු පොතක් අලුතින්ම ආරම්භ කරන්නේ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : තමන් ප්‍රථමවරට නාලක සිල්වා මහත්මයා හම්බුණේ ඒ විදියට නැත්නම් වෙනත් ක්‍රමයකට හම්බුණාද හදුන ගත්තද නැත්නම් ඔය මුහුණු පොතින් හදුන ගත්තද?

පි නැහැ ස්වාමිනි නාලක සිල්වා මහත්මයා මට හමුවෙන්නේ පුජිත් ජයසුන්දර මහත්මයා තමයි මාව සම්බන්ධ කරවන්නේ හිටපු

FAIR COMMENT — BY JEZEEM

පොලිස්පතිතුමා ඉතින් මම මට එනවා ඒකයි මං මුලින්ම ප්‍රකාශ කරේ ස්වාමිනි මේ අන්තවාදය සිංහල අන්තවාදයකුත් තියෙනවා ස්වාමිනි. අපි රටේ ජාතික ආරක්ෂාව ප්‍රමුඛ කොට හිතනකොට ජාතිය ආගම පැත්තකට දාලා ජාතික ආරක්ෂාව ප්‍රමුඛ කරලා කථා කරන්න සිද්ධ වෙනවා ස්වාමිනි. එතන දි මට චෝදනා එල්ල වෙයි ස්වාමිනි නමුත් මට මේ ගරු අධිකරණයෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ සත්‍ය නම් හරි දේ නම් මට ඒ වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කරන්න සිද්ධ වෙනවා ස්වාමිනි. එතකොට මම මත්ද්‍රව්‍ය ජාවාරමට විරුද්ධව ලොකු වැඩක් කර ගෙන ගියා ස්වාමිනි ඒ වැඩ කරගෙනයන එකත් එක්ක මම 2017.07 වෙනි මාසේ 02 වෙනිදා මංගල සමරවීර අමාත්‍යවරයාට විරුද්ධව මහනුවර ශ්‍රී දළදා මාලිගය ඉදිරිපිට උපවාසයක් ආරම්භ කරනවා ස්වාමිනි මේ උපවාසය ආරම්භ කරන්න හේතුව ස්වාමිනි මංගල සමරවීර අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරා ස්වාමිනි බියර්වලට සහනකයක් දෙන්න ඕනේ කියලා ඒ වගේම පෝයදවසට ආරක්කු බාර අරින්න ඕනේ පෝය දවසට අරක්කු බාර් වහලා තියෙන නිසා මිනිස්සු බියර් බොනවා වැඩියි කියලා ප්‍රකාශයක් කරා ස්වාමිනි. මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශකවරයෙක් විදියටත් ඒ වගේම මේ ලංකාවේ ඕනෑම දැනුමත් තියෙන කෙනෙකුටත් තේරෙනවා ස්වාමිනි මේකේ තියෙන බරපතලකම ඒ නිසා මම ස්වෙච්චාවෙන් මම තනියෙන් වැඩකරන කෙනෙක් නිසා මම තනියෙන් ඕකට විරුද්ධව උපවාසයක් කරනවා කියලා ඒ උපවාසය ආරම්භ කලා. මේක ලංකාදීප පුවත්පතේ සහ Sunday observer පුවත්පතේ පලවුණා ස්වාමිනි. මේ පලවීමත් එක්ක බොහෝ දෙනෙක් මං ගැන හොයන්න පටන් ගත්තා ස්වාමිනි. ඒ හොයන්න පටන්ගත්තේ පළවෙනි කණ්ඩායම තමයි රාජ්‍ය බුද්ධිසේවය ස්වාමිනි රාජ්‍ය බුද්ධිසේවය සම්බන්ධ වෙන්නේ මට අන්න ඊට පස්සේ ස්වාමිනි. ඔයා කවුද මොකද කරන්නේ කියාල රාජ්‍ය බුද්ධි සේවය මගේ පස්සෙන් ඔන්න නිතර ඉන්න පටන් ගත්තා ස්වාමිනි

ප්‍ර : තමන්ට මුලින්ම සම්බන්ධ වෙන්නේ රාජ්‍ය බුද්ධිසේවයද ත්‍රස්ත විමර්ශන අංශයද පොලිස්පතිතුමාද?

පි රාජ්‍ය බුද්ධිසේවය ස්වාමිනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධිසේවය තමයි මුලින්ම තමන් හඳුන ගන්නේ?

පි මුලින්ම සම්බන්ධවෙන්නේ රාජ්‍ය බුද්ධි සේවය ස්වාමිනි. වරකාපොල පොලිසියේ බුද්ධි අංශයේ නිලධාරින් සාමාන්‍යපොලිසියේ දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරින් එක්ක සම්බන්ධතාවය තිබුණා මගේ මත්ද්‍රව්‍ය වැඩ පිළිවෙලත් එක්ක වරකාපොල බුද්ධි අංශ නිලධාරින් දෙන්නෙක් හේරත් කියන නිලධාරියා සහ සාමාවෙන්න රාජපක්ෂ කියන නිලධාරියා සහ ජයලත් කියන මෙන්න මේ නිලධාරීන් දෙදෙනා ජයවීර මෙන්න මේ නිලධාරින් දෙදෙනා ස්වාමිනි කථා කරලා කිව්වා රාජ්‍ය බුද්ධිසේවයේ SIS

FAIR COMMENT BY JEZEEM

එකේ නිලධාරයෙක් අවා ඔයාව හම්බෙන්න ඕනේ කියලා කියනවා මොකද කියන්නේ කැමතදි මං කිව්වා කිසි ප්‍රශ්නයක් නැහැ මගේ ළඟට දාන්න කිසි ප්‍රශ්නයක් නැහැ ඔයා එවන්න මං එන්න නම් කොහේටද හම්බෙන්න ඕනේ කියලා ඇහුවා මොකක්ද කරේ ඇයි මෙහෙම කරේ මොකක්ද හේතුව මං කිව්වා මෙන්න මේකයි මෙහෙම කරන්න හේතුව කවුද ඔයාට මේකට උපදෙස් දුන්නේ ඒවැනි විස්තර ඇහුවා ස්වාමිනි ඒවාට මං දෙන්න ඕන පිළිතුරු ලභා දුන්නා ස්වාමිනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා හම්බුණේ කොයි අවස්ථාවේදී මුලින්ම?

පි රාජ්‍ය බුද්ධිසේවයේ ප්‍රධානියා මං දැකලම නැහැ ස්වාමිනි කථා කරලවත් නැහැ ස්වාමිනි. කවදාවත් කථා කරලා නැහැ.

ප්‍ර : තමන් කථා කරලාවත් නැහැ දැකලවත් නැහැ?

පි නැහැ ස්වාමිනි. අපේ ප්‍රදේශයේ ඉන්නවා නිලධාරියෙක් ඒ නිලධාරියා මට නිතර කථා කරනවා නිතර එයත් එක්ක සම්බන්ධතාවය තිබුණා ස්වාමිනි.

ප්‍ර : එතකොට රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානීයා කියන්නේ කවුද නම්?

පි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා ස්වාමිනි.

ප්‍ර: ඔහු කිසිම අන්දමකින් තමන් එක්ක කථා කරලා නැහැ දැකලත් නැහැ?

පි: නැහැ ස්වාමිනි. කථා කරපු පොලිස් නිලධාරින් ඉන්නවා.

ප්‍ර: එම නිලධාරියා කථා කරලා නැහැ?

පි: එම නිලධාරියා කථා කරලා නැහැ ස්වාමිනි.

ප්‍ර: දැකලත් නැහැ?

පි: දැකලත් නැහැ ස්වාමිනි.ඉස්සෙල්ලාම මං පින්තූරකින් හරි දැක්කේ ස්වාමිනි මේ පාස්කු කොමිෂන් එකට එන වෙලාවේ ස්වාමිනි. ඒ ඇරෙන්න දැකලා නැහැ. ඉතින් ස්වාමිනි ඊට පස්සේ මම මේ මත්ද්‍රව්‍යත් එක්ක ලොකු සටනක් කරන නිසා මාත් එක්ක ලොකු පිරිසක් සම්බන්ධ වෙන්න පටන් ගත්තා විශේෂයෙන්ම අන්තර් ජාලයෙන් ස්වාමිනි ඒකේ ප්‍රතිඵලයක් විදියට තමයි මට 2017.08.16 වෙනිදා මේ වගේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක ඉදලා මං හැන්දෑවෙන කොට මට මැසේජ් එකක් තියෙනවා නමල් මම ඔයත් එක්ක කථා කරන්න කැමතියි මං හිතන්නේ ඒක තියෙන්නේ ඉංග්‍රීසියෙන් ඒක මට මතක හැටියට මං ඊයේ පෙරේදා බැලුවේ නැහැ මං ඔයත් එක්ක කථා කරන්න කැමතියි මම ප්‍රභාකරන් කියන චිත්‍රපටියේ අධ්‍යක්ෂක කියලා ඉංග්‍රීසියෙන් තමයි තිබුණේ ස්වාමිනි. ඊට පස්සේ මං කිව්වා හරි කතා කරන්න කියලා මැසේජ් එකක් දැම්මා කතා කරා රට වෙනුවෙන් වැඩකරගෙන යන්න කැමතියි ඔයාට නායකයෙක් නැතිබවක් අපි දන්නවා අපි ඒක හදුනගෙන ඉන්නේ අපි කැමතියි ඒ නිසා ඔයත් එක්ක වැඩකරන්න රට වෙනුවෙන් ලොකු දේවල් ටිකක් තියෙනවා කථා කරන්න කියලා කිව්වා ඒ කිව්වාට පස්සේ ස්වාමිනි මම ඒක දවස් දෙකක් තුනක් යන කොට ඒ කෙනා එන්නේ වෙන

FAIR COMMENT — BY JEZEEM —

පැත්තකට කියන එක මට තේරුණා ස්වාමිනි මෙහෙම නෙමේ අපි ආයුධ අතට ගන්න ඕනේ අපි සන්නද්ධ වෙන්න ඕනේ අපි මේකට සිංහල බලකායක් හදන්න ඕනේ බලඇනියක් හැදෙන්න ඕනේ කියලා එවැනි ප්‍රකාශ ඉදිරිපත් කලා ස්වාමිනි. මේවාත් එක්ක මම තීරණය කලා මේක රටේ නීතියට පිටින් යනවා විතරක් නෙමේ මේක රටේ ජාතික ආරක්ෂාවටත් ප්‍රශ්නයක් වෙනවා ඒ වගේම මේක ත්‍රස්තවාදී කටයුත්තක් මෙතනදි කථා වුනේ ස්වාමිනි නැව් වලින් ආයුධ ගෙන්න ලංකාවට නැවකින් ආයුධ ගෙනත්ලා මාළු බෝට්ටුවලින් දාලා එතකොට ගන්න තමයි එතකොට මම ඊට පස්සේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියෙකුට කිව්වා මෙන්න මෙහෙම කථාවක් මනුශ්‍යයෙක් කියනවා මේ මනුශ්‍යා මේ වගේ ලොකු වැඩකට මේ සැලසුම් කරන්නේ මොකක්ද මේකට කරන්නේ මොකක්ද මේකට කරන්න ඕනේ කියලා ඊට පස්සේ මට කිව්වා එන්න කෑගල්ලට අපි හම්බෙලා කථා කරමු කියලා එතුමාත් එක්ක කථා කරාට පස්සේ එතුමාගෙන් මට ලැබුණ පිළිතුර තමයි හරි මං මේ සම්බන්ධව ඉහලත් එක්ක කථා කරලා බලන්නම් කියලා නමුත් මට දවස් දෙකතුනක් යනකම් ඒකට පිළිතුරක් ලැබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: තමුන්ට කියන්න පුළුවන්ද තමුන්ට පොලිස් පතිතුමා දුන්න තොරතුර?

පි: එහෙමයි ස්වාමිනි ඒක මං කියනවා ස්වාමිනි.

ප්‍ර: කෙටියෙන් කියන්න මොනවද දුන්න තොරුතුර?

පි: මේ තොරතුරේ මේ SIS තොරතුර ප්‍රතිචාරයක් නොවුන නිසා මං මේක අරගෙන යනවා කෑගල්ල හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සේරසිංහ මහත්මයා ළඟට එතුමා ළඟට ගිහිල්ලා මම කිව්වා සර් මෙන්න මෙහෙම තොරතුරක් ඇවිල්ලා තියෙනවා මේකට මොකද කරන්නේ කියලා එතුමා කිව්වා ඔයත් එක්ක IG සර් හිතවත්නේ ඔයා කෙලින්ම IG මොකද එතුමා දන්නවා පොලිස්පතිතුමාට මම දෙන මත්ද්‍රව්‍ය පිළිබඳව ඇතැම් තොරතුරු පොලිස්පතිතුමා කථා කරලා සේරසිංහ මහත්මයාට දෙනවා ඒ දවස්වල නාමල් කුමාර කියලා කියනවා එතකොට ඒ සම්බන්ධතාවය එතුමා දන්නවා එතුමා කිව්වා මේක IG සර්ටම කියන්න කියලා. IG සර්ටම කියන්න කිව්වාට පස්සේ මං මෙතුමාට දුරකථන අංකයට කථා කරා කථා කරලා ඉවරවෙලා සාමාන්‍යයෙන් මෙතුමාට දුරකථන අංකය ගන්න පුළුවන් ඕන කෙනෙකුට ඒ දවස්වල මට දැනටත් මතකයි. ඉතින් ඒ අංකයට මම කථා කරපුවාම කිව්වා සර් මම නාමල් කුමාර වරකාපොලින් කථා කරන්නේ ඔව් කොල්ලෝ කියන්න මොකක්ද ප්‍රශ්නේ කියලා ඇහුවා මම කිව්වා සර් මෙහෙම මේ ජාත්‍යයන්තර ත්‍රස්වාදී තොරතුරක් තියෙනවා මේ සර්ටම කියන්න ඕනේ මට ඒක කියලා ආන් හරි මං අහවල් දවසේ ඉන්නවා හැන්දෑවේ එන්න කියලා කිව්වා. ඉතින් ඒ දවසේ මම ගියා යනකොට මම එතුමාගේ ඇතුළුවීමේ පොතේ නම ලියලා ගියේ ගිහිල්ලා එතුමා හම්බුණා එතුමා හම්බෙන්න බැරිවුණා එතුමා එළියට

FAIR COMMENT BY JEZEEM

යන්න එනකොටම මාව දැක්කම ප්‍රියදර්ශන මහත්මයා කිව්වා නාමල් ඇවිල්ලා ඉන්නවා කියලා මෙහෙයි කියලා ආ නාමල් මෙයාගේ වැඩේ ප්‍රියදර්ශන මේ අපි කථා කරමු මේකට අවශ්‍ය හොඳ Expert කෙනෙක් ඉන්නවා කියලා ඉවරවෙලා මට නාලක සිල්වා මහත්මයාව සම්බන්ධ කරලා දෙන්නේ මෙන්න මේ මම දුන්න තොරතුරට අදාලව විමර්ශන කටයුතු කරන්න කියලා තමයි නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයාව මට පූජිත් ජයසුන්දර මහත්මයා තමයි සම්බන්ධ කරලා දෙන්නේ ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධිසේවය ගැනකථා කරා හිටපු පොලිස්පතිතුමා ගැන කථා කරා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: TID එක ගැන කථා කරා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මං ඔබට දැන් හඬපටයක් ඔබට දාවනය කරනවා ප්‍රථමයෙන් ඔබ මේ හඬපටය අහලා කියන්න කාගේද ඒ කටහඬවල් කියන එක ඔබ මේ ගරු සභාවට ඔබ ප්‍රථමයෙන් ප්‍රකාශ කරන්න?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: මෙම DGNJ 12 කියන හඬපටයේ කටහඬවල් දෙකක් ඔබට ශ්‍රවණය වුණාද?

පි: ස්වාමිනි එකක කථා කරන්නේ මම අනිත් එකේ කථා කරන්නේ ත්‍රස්තවිමර්ශන දිසාවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලකද සිල්වා මහත්මයා ස්වාමිනි.

ප්‍ර: මෙම DGNJ 12 කියන හඬපටයේ කටහඬවල් දෙකක් ඔබට ශ්‍රවණය වුණාද?

පි: ස්වාමිනි එකක කථා කරන්නේ මම අනිත් එකේ කථා කරන්නේ ත්‍රස්ත විමර්ශන දිසාවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයා ස්වාමිනි.

ප්‍ර: හරි ඒ කාගේ කටහඬද?

පි: නාලක සිල්වා මහත්මයාගේ ස්වාමිනි.

ප්‍ර: ඒ කාගේද කටහඬ?

පි: ඒ කටහඬ මගේ ස්වාමිනි. පස්සේ අවසානයටම කථා කරේ.

ප්‍ර: මේ DGNJ 12 කියන මේ හඬපටය කවුරු විසින් පටිගත කරන ලද්දක් ද?

පි: මම මගේ මේක ස්වාමිනි ඉතාමත්ම වගකීමෙන් මේක කියන්න ඕනේ මේ වචන ටික මේ වචන ටික මම මගේ ජංගම දුරකථනය රේකෝඩින් කියන ඇප් එකට ගිහිල්ලා දැන් රේකෝඩින් ඔන් කරන්න ඕනේ කියලා

FAIR COMMENT — BY JEZEEM —

හිතලා දැන් අර කලින් කථා කරපුවා සාක්ෂියක් විදියට මට ගන්න ඕනේ කියලා අදහස් කරලා රේකෝඩින් එක ඔන් කරලා මෙන්න මේ විදියට ලගින් පොන් එක තියාගෙන සර් අර කොහොමද මේක කොහොමද මෙවැනි කථා මම ඉදිරිපත් කරන්නේ එතුමා කියනවා සත්‍ය හෝ අසත්‍ය මං කල්පනා කරනවා හරි ඒ කියන්නේ මෙතන සත්‍යත්දේයි තව ගහනන්න ඕනේ අනිත් දේවලුත් දේයි මං මේකට අනුගතව කථා කරොත් තමයි මට මේ ටික එන්නේ එහෙම නැතිනවුණොත් මේ ටික එන්නේ නෑ මං ජීවිත කාලේ පුරාවට මේ ලංකාව තියෙනතාක්කල් මේවා රහස් කියලා තිරණය කරනවා ස්වාමිනි. ඒ තීරණය කරලා තමයි මං මගේ පෝන් එකෙන් රේකෝඩින් ඇප් එක ඔන් කරලා මම තමයි පටිගත කරන්නේ ස්වාමිනි.

ප්‍ර: ඔබ මේ තොරතුරු ගන්න තමයි DIG මහත්මයාගෙන් තොරතුරු ගන්න තමයි රේකෝඩ් කරේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ ප්‍රශ්න අහන්නෙත් DIG මහත්මයාගෙන් තොරතුරු ගන්න?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට තොරතුරුකරු කවුද?

පි: ස්වාමිනි මම ජාත්‍යතන්තර ත්‍රස්තවාදී තොරතුරක් පිළිබඳව අනාවරණය කරන්න ගියේ ඒ එහෙම කරන්න ගියාම ඒ පුද්ගලයා මේ රටේ බලයේ ඉන්න ජනාධිපතිව ඝාතණය කරන්න සහ

ප්‍ර: අපි මේ හඬපටයට සවන් දෙමු. DGNJ 13 දාවනය කරනවා. මේ කටහඬ ඔබ හඳුනා ගන්නවද?

පි: හඳුනා ගන්නවා ස්වාමිනි

ප්‍ර: කාගේද?

පි: ඒ කථා කරන්නේ මායි නාලක සිල්වා මහත්මයයි. ස්වාමිනි

ප්‍ර: මේ දැන් ශ්‍රවණය වුණේ ඔබේ කටහඬද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ කාගේ ද කටහඬ?

පි: ඒ නාලක සිල්වා මහත්මයාගේ ස්වාමිනි.

ප්‍ර: DGNJ 14 හඬ පටය දාවනය කරයි. මෙම කටහඬවල් ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: ස්වාමිනි අපි කතා කරන්නේ මමයි DIG නාලක සිල්වා මහත්මයයි.

ප්‍ර: DGNJ 15 සාක්ෂිකරුට සවන් දීමට සලස්වනවා. කාගේද මේ කටහඬ?

පි: මම සහ DIG නාලක සිල්වා මහත්මයා ස්වාමීනි.

ප්‍ර: DGNJ 16 හඬ පටය දාවනය කරයි. අවසානයට තිබූ DGNJ 16 හි තිබෙන කටහඬවල් ඔබ හඳුනා ගන්නවද?

පි: ඔව් ස්වාමිනි ඒ කථා කරන්නේ මම සහ නාලක සිල්වා මහත්මයා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මගේ පළවෙනි ප්‍රශ්නය මේ 12,13,14 ,15 තවත් තියෙනවද? DGNJ 12,13,14,15,16 කියන හඬ පට වල එකම දිනයකදී සිදු කරන ලද පටිගත කිරීම්ද නැත්නම් අවස්ථා වෙනත් අවස්ථාවන්වලදි කරාද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි: ස්වාමිනි මේ ඔක්කෝම එක දවසේ කරාද කියලා මට මතක නැහැ හැබැයි අවස්ථා කීපයකම මම පටිගත කිරීම් කරා ස්වාමිනි හැම පටිගත කිරීමක්ම කලේ වාහනේ ඇතුලේ ඉඳලා ස්වාමිනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ මේ පටිගත කරන්නේ නියෝජ්‍ය පොලිස් සේවයේ සිටින නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්ගේ සමඟ තියෙන සාකච්ඡාවකදී?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ විතරක් නෙමේ ඒ පටිගත කිරීම් සිදු කරන අවස්ථාව වන විට එතුමා ත්‍රස්තමර්ධන විමර්ශන ඒකකයේ TID කියන ඒ සුවිශේෂී ශ්‍රී ලංකා පොලීසේ තියෙන ඒ සුවීශේෂී ඒකකයේ ලොක්කා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඇයි ඔබ මෙම පටිගත කිරීම් සිදු කරේ?

පි: ස්වාමිනි මම ජාත්‍යයන්තර ත්‍රස්වාදී තොරතුරක් අරගෙන ගියේ ඒ යන කොට මම දන්නවා ඒක වැරදුණොත් ඒක ජාත්‍යයන්තර ත්‍රස්තවාදි තොරතුර අරගෙන යන කොට මං එහෙම යන්න හේතුව රටේ ආරක්ෂාව ගැන හිතලා ස්වාමිනි ත්‍රස්තවාදය මම දැකලා තියෙන්නේ ස්වාමිනි. ඒනිසා එතනදි විශේෂයෙන්ම සිද්ධ වෙන්න ගියේ මේ ලංකාවේ මුස්ලිම් පල්ලිවලට සහ රිසාද්බදුර්දීන් වගේ අමාත්‍යවරයා ඝාතනය කරන්න වගේ මෙන්න මේ වගේ සැලැස්මක් තමයි එතන ක්‍රියාත්මක වුණේ. ස්වාමිනි. ඒක මම තීරණය කරා මගේ දැනුමේ හැටියට මේක ත්‍රස්තවාදී කටයුත්තක් කියලා ඒ නිසා තමයි පොලිස්පතිතුමා ළඟට මං ඕක අරගෙන ගියේ ස්වාමිනි. අරගෙන

ප්‍ර: මොකක්ද අරගෙන ගියේ?

පි: ඒ තොරතුර ස්වාමිනි. ඒ තොරතුර තමයි මං පොලිස්පතිතුමා ළඟට අරගෙන යන්නේ ස්වාමිනි මෙන්න මේ විදියේ තොරතුරක් එනවා මේ විදියේ කෙනෙක් යෝජනාවක් කරනවා මේ පුද්ගලයා සාමන්‍ය කෙනෙක් වෙන්න විදියක් නැහැ. මේ පුද්ගලයා චිත්‍රපටි අධ්‍යක්ෂකවරයෙක් යම් කිසි හැකියාවක් තියෙන කෙනෙක් දැනුමක් තියෙන කෙනෙක් ඉන්නේ ප්‍රංශයේ මෙන්න කථා කරන දේ ගැන කියලා මේ විදියටම හඬපටයකුත් අරගෙනම තමයි ගියේ ස්වාමිනි.

ප්‍ර: ඔබ ගාව ඒ හඬපටය තියෙනවද?

පි: දැන් මගේ ළඟ නැහැ ස්වාමිනි. මම ඉදිරියේදී කොමිෂමට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. මම කොමිෂමෙන් ඉතා ගෞරවයෙන්

FAIR COMMENT BY JEZEEM

ඉල්ලනවා එවැනි හඬපට රාජ්‍ය බුද්ධිසේවයේ තිබෙනවා මම සෑම හඬපටයක්ම රාජ්‍ය බුද්ධිසේවයට ලබා දීලා තියෙනවා.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා ඔබ කරන්නට යෙදුණු හඬපට රාජ්‍ය බුද්ධි සේවයට ලබා දීලා තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මේ DGNJ 12,13,14,15 ,16,

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ කාටද ලබා දුන්නේ?

පි: මේ ටික රාජ්‍ය බුද්ධි සේවයට ලබා දීලා තියෙනවා.

ප්‍ර: රාජ්‍ය බුද්ධිසේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාටමද ලබා දුන්නේ?

පි: නැහැ ස්වාමනි මම මගේ ගමේ ප්‍රදේශයේ කෙනෙක්ට තමයි සම්බන්ධ වෙන්නේ නම ලක්ජීව ස්වාමිනි ඒ ලක්ජීව කියන නිලධාරියා තමයි මට සම්බන්ධ වෙන්නේ.

දැන් වේලාව : ප.ව 1.10
මෙතැන් සිට : නිල්මිණි කුමාරි

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.1.10
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : ලක්ජීව කියන්නේ තරු එක්කෙනෙක්ද පොලිස් කොස්තාපල්?

පි : එහෙම මං ගොඩක් දේවල් දන්නේ නැහැ ස්වාමිනි. මං ගොඩක් දේවල් හොයන්න ගියේ නැහැ ස්වාමිනි. නමුත් රාජ්‍ය බුද්ධි සේවයේ කියලා මම දන්නවා. වරකාපොළ පොලිසියේ නිලධාරියෙක් හඳුන්වලා දුන්නා මේ SIS එකේ එක්කෙනෙක් ඔයත් එක්ක කතා කරන්න කැමැතියි කිව්වා. ඔයාගේ තොරතුරු, ඔයාගේ මේ උපවාසය සම්බන්ධ තොරතුරු හොයන්න ආවේ කිව්වා. එතුමා ආවේ මංගල සමරවීර අමාත්‍යවරයාට විරුද්ධව කරපු උපවාසයේ තොරතුරු හොයන්න. පස්සේ ඒ මත ඒ හිතවත්කම ගොඩනැඟුණා. මට හිතුණා රාජ්‍ය බුද්ධි සේවයෙන්.. ඊට මං රාජ්‍ය බුද්ධි සේවය කියන්නේ මොකක්ද කියලා හෙව්වා ස්වාමිනි.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවය කියලා කියන්නේ මොකක්ද කියලා හෙව්වා? මොකක්ද ඒක?

පි : රාජ්‍ය බුද්ධි සේවය කියන්නේ ස්වාමිනි රජය පවත්වාගෙන යන රටේ ජාතික ආරක්ෂාව පවත්වා ගැනීම වෙනුවෙන් රහසිගතව රාජ්‍ය පාලනය කර ගෙන යෑමට අවශ්‍ය රහස් තොරතුරු එකතු කිරීමේ ඒකකය තමයි රාජ්‍ය බුද්ධි සේවය කියලා මගේ සරලව මම තේරුම් ගත්තේ ඒක තමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ තොරතුරු හෙව්වා කිව්වා රාජ්‍ය බුද්ධි සේවය කියන්නේ මොකක්ද කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කොහොමද කොහෙන්ද එය ලබා ගත්තේ?

පි : ස්වාමිනි තොරතුරු හොයනකොට මම විවිධ ක්‍රම භාවිතා කරනවා ස්වාමිනි. මට අවශ්‍ය තොරතුර හොයා ගන්න මම කල්පනා කරනවා ඒ තොරතුර මම හොයා ගන්න කාගෙන්ද අහන්න ඕනි. මේ රාජ්‍ය බුද්ධි සේවය කියන එක දැන් වචනයක් අහුවුණාම මගේ දැනුමේ හැටියට මම අද විශේෂයෙන්ම දෙයක් කියනවා. පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බලන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව කියන වචනය. මට ඕනි වෙනවා මේක හොයන්න. මම ඊට පස්සේ මේකට අන්තර්ජාලය භාවිතා කරනවා. ඊට පස්සේ මං භාවිතා කරනවා මේකේ ඉන්න මගේ දැනුමෙන් මං මේ කතා කරන්නේ. මේ judgment කවුද? මේ අයගේ ඉතිහාසය කතාව මොකක්ද ඊට පස්සේ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

මේකේ දැනට යන තත්ත්වය මොකක්ද මේක සාක්ෂි දීලා තියෙන්නේ කවුද එතකොට මේ යන වැඩපිළිවෙළ සාර්ථක අසාර්ථකයිද මේ වගේ ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවය කියන වචනය ආපහුවම සාමාන්‍ය දැනුමක් තියෙන කෙනෙකුට දෙයක් හොයන්න අවශ්‍යතාවය අපුවහම ඒ කෙනා ඒක සොයා ගන්න එක සාමාන්‍ය දෙයක්. සාමාන්‍යයෙන් කරන්න පහසුයි. පොදු ආයතනයක් ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඉන්න සාමාජිකයන්ගෙත් ඉතිහාසය සොයලද තියෙන්නේ?

පි : ස්වාමිනි.

ප්‍ර : සාමාජිකයින්ගේ ඉතිහාසය සොයලද හෙව්වද?

පි : නැහැ ස්වාමිනි එහෙම හෙව්වේ නැහැ. නමුත් මට හොයා ගන්න මම අදහස් කරේ ස්වාමිනි මට එහෙම පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බලන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව කියන වචනය ගත්තාම අපිට ඔය හැම එකක්ම හොයන්න පුළුවන්නේ ස්වාමිනි. සාමාන්‍යයෙන් සරල දේවල්නේ. බොහොම ලේසියි අපේ රටේ. හොයා ගන්න ලේසියි. පාස්කු ප්‍රහාරය හොයා ගත්තේ නැති ඒක කණගාටුවට කරුණක්. නමුත් හොයනවානම් ඒකත් හොයා ගන්න තිබුණා. ඉතින් මම ඒ සම්බන්ධයෙන් කියන්නේ විශේෂයෙන්ම අපේ රටේ තියෙන්නේ ජාතික ආරක්ෂාව බින්දුවේ තිබුණු නිසා වෙච්චි දෙයක් කියලා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකරුගෙන් වැඩිදුර සාක්ෂි ඇසීමට පෙර දිවා ආහාරය සඳහා කොමිෂමේ කටයුතු පස්වරු 2. 00 දක්වා නතර කරමි.

දැන් වෙලාව: ප.ව.1.25

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දිවා ආහාරයෙන් පසු නැවත කොමිෂන් සභාව ආරම්භ කරයි.

දැන් වේලාව : ප.ව. 2.10

සටහන් කළේ ල/ලේ: නිල්මිණි

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

* උදෑසන පෙනී සිටීම්වලට අමතරව මේ අවස්ථාවේදී හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා වෙනුවෙන් නීතිඥ මල්ක දිනෙත්ති මහතා පෙනී සිටියි. ඒ ඇර හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා කොමිෂන් සභාව තුළ රැඳී සිටින බවද සටහන් කර තබමි.

සාක්ෂිකරු නැවත කැඳවයි.

****

සාක්ෂිකරුගේ නම : අත්තනායක මුදියන්සේලාගේ නාමල් කුමාර

ආගම : බෞද්ධ

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ දිවා ආහාරය ලබා ගත්තාද?

පි : ලබා ගත්තා ස්වාමීනි.

ප්‍ර : ඔබට වෙනයම් අවශ්‍යතාවයන් මොකුත් තියෙනවාද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : හරි ස්තුතියි. සාක්ෂිකරු තුෂාර පීරිස් කියන පුද්ගලයෙකු ගැන ඔබ අද දින යම් යම් අවස්ථාවලදී ඔබේ සාක්ෂියේදී ප්‍රකාශ කරන්නට යෙදුණා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට ඔහු ප්‍රථමයෙන්ම ඔබ ඔහු සමඟ සම්බන්ධ වෙන්නේ කොහොමද?

පි : ඔහු මගේ Facebook Messenger එකට Massage එකක් දාලා තිබුණා.

ප්‍ර : කවද්ද?

පි : 2017 අගෝස්තු මාසේ 16 වෙනිදා.

ප්‍ර : මොකද්ද ඔහු කියලා තිබ්බේ?

පි : මම තුෂාර පීරිස්. ප්‍රභාකරන් චිත්‍රපටියේ අධ්‍යක්ෂක. මට ඔබත් සමඟ කථා කරන්න අවශ්‍යයි කියන එක. මේක ඉංග්‍රීසියෙන් දාලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තිබුණේ. මට ඒක සාමාන්‍යයෙන් තේරුම් ගැනීමේ හැකියාව තිබුණ නිසා මම සිංහලෙන් Message එකක් දැම්මා හරි පුළුවන් කථා කරන්න කියලා. ඊට පස්සේ එදාම මට මතක හැටියට එදාම කථා කළා විනාඩි දහය පහළොවක් කථා කළා.

ප්‍ර : මට මොහොතක් දෙන්න. මෙවිට ඔබ මොන වගේ කරුණු සම්බන්ධයෙන්ද ක්‍රියාත්මක වෙමින් සිටියේ?

පි : මේ වෙනකොට ස්වාමීනි 2017 අගෝස්තු මාසේ කියන්නේ මම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වල නිරත වෙලා, අගෝස්තු මාසේ 16 එන්නේ ඒ 07 වෙනි මාසේ 02 වෙනිදා මම අර උපවාසය නුවර කළාට පස්සේ මාසයක එක හමාරක් වගේ තමයි කාලය. එතනින් ලබපු ප්‍රසිද්ධියත් එක්ක සහ මගේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පුළුල් වෙලා මම ලංකාව පුරාම ක්‍රියාත්මක කළා. ඒ ක්‍රියාත්මක කරගෙන යන අතරතුර තමයි ඔය වගේ සිදුවීමක් සිද්ධ වෙන්නේ.

ප්‍ර : හරි. දැන් ඔහු ඔබ සමඟ කොහොමද සම්බන්ධ වුණේ අර Message එකෙන් පස්සේ?

පි : Message එකෙන් පස්සේ මම කිව්වා ඔව් කථා කරන්නට පුළුවන් කියලා. ඊට පස්සේ ඔහු කථා කළා මට. Messenger Call එකක් ගත්තේ. ප්‍රංශයේ ඉන්නේ කියලා කිව්වා.

ප්‍ර : ඒ කියන්නේ Facebook එක හරහා....?

පි : Facebook Messenger හරහා මට Messenger Call එකක් ගත්තේ ස්වාමීනි.

ප්‍ර : හරි. දැන් ඔහු සමඟ ඔබ කථා කළා කිව්වනේ විනාඩි දහයක් පහළොවක් පමණ?

පි : එහෙමයි ස්වාමීනි.

ජ්‍ර : ඔහුගෙන් ඔබ විමසා සිටියද ඔබව කොහොමද හඳුනා ගත්තේ කියන කාරණය?

පි : ස්වාමීනි මම ඇහුවා, ඇහුවම කිව්වේ ඔයා ලොකු වැඩක් කරගෙන යන කෙනෙක්. මම ඔයා ගැන හෙව්වා. මට ඔයා ගැන ගොඩක් තොරතුරු හොයා ගන්න පුළුවන් වුණා තනියෙන් වැඩ කරගෙන යන කෙනෙක්. මම කැමතියි ඔයත් එක්ක එකතු වෙලා වැඩ කරන්න. මට ලොකු දෙයක් කරන්න පුළුවන් හැකියාව තියෙනවා. මම අහවලා මෙහෙම ඉන්නේ, ප්‍රංශයේ ඉන්නේ. මෙන්න මේ වගේ වැඩ කටයුතු තමයි කරන්නේ කියන එක ඔහු ගැන පැහැදිලි කිරීමක් කළා. පළමු දවසෙම ස්වාමීනි ත්‍රස්තවාදී කටයුතු වගේ දේවල් කථා කළේ නැහැ. කොහොම වුණත් මගේ මම මත්ද්‍රව්‍ය නිවාරණය පැත්තෙන්, මත්ද්‍රව්‍ය මැඩලීම පැත්තෙන් වැඩ කරන

FAIR COMMENT BY JEZEEM

කෙනෙක් නිසා සාමාන්‍ය අඳුරන්නේ නැති Call එකක් ආවොත් මම ඕන කෙනෙකුට සුහදශීලීව කථා කරනවා. මම හැම වෙලාවෙම විමර්ශනාත්මකව කටයුතු කරන්නේ, ඒකට හේතුව ස්වාමීනි මගේ ගෙදර, මගේ ගෙවත්තේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ අත් බෝම්බ පවා හංගලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : හරි. නාමල් කුමාර මහත්මයා දැන් මෙම, ඔව් කියන්න ඒ පිළිතුර?

පි : ස්වාමීනි.

ප්‍ර : ඔබ ඒ බෝම්බයක් සැඟවීම සම්බන්ධයෙන් කියා සිටියනේ?

පි : ඔව්.

ප්‍ර : කියන්න මොකද්ද එහිදී වුණේ කියලා?

පි : ස්වාමීනි මම එදා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනකට ගිහිල්ලා මම එදා ඉන්නේ අම්පාරේ. රාත්‍රී කොහොම හරි 119 එකක් පොලීසියට ඇවිල්ලා, පොලීසිය ඇවිල්ලා ගමේ හොයන්න, හොයා ගන්න බැරුව ගිහිල්ලා, අනිත් පහුවදා මගේ ගෙදර Wife කථා කරලා මට කිව්වා පාර්සලයක් තියෙනවා කෙසෙල් පඳුර ළඟ මොකද්ද කියලා. මම කථා කරලා පොලීසිය දැනුවත් කරලා ඒක පරීක්ෂා කිරීම කළහම ඒක අත් බෝම්බයක් කියලා පොලීසියෙන් කිව්වා. පොලීසියෙන් කිව්වට පස්සේ මම කිව්වා මම අම්පාරේ ඉන්නේ මේ වෙලාවේ. මම පුළුවන් තරම් ඉක්මණට එනවා. ඔය ගැන පරීක්ෂණ පවත්වන්න අවශ්‍ය ප්‍රකාශ මම ලබා දෙන්නම් කියලා ස්වාමීනි. ඊට පස්සේ ඇවිල්ලා ප්‍රකාශ සටහන් කර ගැනීම, Wifeගෙන් පළවෙනියට ප්‍රකාශ සටහන් කරගෙන තිබුණා. Wifeගෙන් අහලා තිබුණා කාගෙද මේ බෝම්බය, කොහෙන්ද මෙතනට ආවේ කියලා. Wife කියලා තිබුණා මේක මම නම් දන්නේ නැහැ. මොකද්ද මෙතන වෙලා තියෙන්නේ කියලා. නමුත් මගේ මහත්මයාට මෙන්න මෙහෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් ප්‍රශ්න තියෙනවා. මෙහෙම පහරදීම්වලට ලක්වෙලා තියෙනවා. රෝහල් ගතවෙලා ඉඳලා තියෙනවා. කමාන්ඩර් රෙජිමේන්තුවේ සේවය කරපු සේවය හැර ගිය පුද්ගලයෙක් මේ ගමේ ඉන්නවා. ඔහු මත්ද්‍රව්‍ය ජාවාරම කරන්නේ ඔහු තමයි. ඔහුට ගමේම මිනිස්සු බයයි. නමුත් මගේ මහත්තයා ඒකට විරුද්ධව කටයුතු කරනවා. මේක ඔහු තියපු එකක් වෙන්න ඇති කියලා. ඊට පස්සේ මම ආවට පස්සේ මගෙනුත් ප්‍රකාශ ලබා ගත්තා. ඊට පස්සේ පොලීසියෙන් කිව්වා අපට 119 එකෙනුත් ඇ ඇවිල්ලා තියෙනවා දොළහයි ගාණකට කියලා. මම ඊට පස්සේ ඒ කථාව පොලීසියෙන් කිව්වම පස්සේ මම කිව්වා අනිවාර්යයෙන්ම ඔය 119 එක ගහන්න ඇත්තේ මෙන්න මේ නම කියන පුද්ගලයා

FAIR COMMENT — BY JEZEEM —

කියලා මම ප්‍රකාශයක් දුන්නා ස්වාමීනි. ඊට පස්සේ ඇහුවා ඇයි මගෙන් එහෙම කියන්න හේතුව කියලා. මම කිව්වා මේ පුද්ගලයා මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මට. මේ 119 එකේ Phone Detail එකක් අරගෙන බලන්න ඕන කියලා මට කිව්වා. මම කිව්වා මට ඒක බලන එක විමර්ශන ආරම්භ කරන්න. මම කැමතියි මේක බලාගන්න අනිවාර්යයෙන්ම කියලා. එම පුද්ගලයා පොලීසියට ප්‍රකාශය ලබා දීලා තිබුණේ ස්වාමීනි රාත්‍රී දොළහයි ගාණකට නාමල් කුමාර ඇවිල්ලා අත් බෝම්බයක් හංගනවා ඔහුගේ වත්තේ මම දැක්කා කියලා. එතකොට ඒ නිවසයි මගේ නිවසයි අතර දුර ප්‍රමාණය මීටර් පන්සීයකට වැඩියි ස්වාමීනි. කැළයක් මැඳින් ඇවිල්ලා බැලුවා කියලා කිව්වේ රාත්‍රී දොළහයි ගාණකට. මෙන්න මේ වගේ සිදුවීම් මට වෙලා තියෙනවා ස්වාමීනි. ඒ නිසා මම යම් කෙනෙක් මාත් එක්ක සම්බන්ධතාවයක් ගොඩ නගා ගන්න උත්සාහ කරනවා නම් මම ඒ ගැන දෙපාරක් හිතනවා. එක්කෝ කෙනෙක් එන්නේ වාසියට. එහෙම නැතිනම් ඔහු ස්වාධීන කැමැත්තෙන් එනවා වෙන්න පුළුවන්. හැබැයි ස්වාධීන කැමැත්තෙන් එන මිනිස්සු ස්වාමීනි අපේ රටේ ගොඩක් අඩුයි. පෞද්ගලික වාසියට තමන්ගේ අරමුණ මොකක් හරි චේතනාවක් මත එන අය තමයි ගොඩක් ඉන්නේ. ඒක මට ජීවිතයේ අත්දැකීමෙන් දන්න දෙයක් නිසා මම කවුරු කථා කළත් ඒ කෙනා දිහා මම බලන්නේ ස්වාමීනි ඒ කෙනා මොන හේතුවක් මතද මේ සම්බන්ධ වෙන්නේ, මොකද්ද මෙතන කරන්න උත්සාහ කරන්නේ කියන එක. තුෂාර පීරිස් මට එදා ඒ විදියට කථා කළා ස්වාමීනි. ඒ කථා කරනකොට මගේ ඔළුවට ආපු අදහස් කිහිපයක් තියෙනවා ස්වාමීනි. එකක් තමයි මොහු ලංකාවේ චිත්‍රපටියක අධ්‍යක්ෂවරයෙක්. චිත්‍රපටියක් හැමෝටම අධ්‍යක්ෂණය කරන්න බැහැ ස්වාමීනි. අනිත් එක මොහු විදේශ රටක ඉන්නේ කියලා කිව්වා. මේක සාමාන්‍ය චිත්‍රපටියකුත් නෙමෙයි, මේ චිත්‍රපටියේ නම ප්‍රභාකරන් ස්වාමීනි. එතකොට මොහු විදේශ රටක ඉඳලා මොනවද කරන්නේ. ඇයි මොහු නාමල් කුමාර කියන කෙනත් එක්ක මේ සම්බන්ධ වෙන්න උත්සාහ කරන්නේ. හොඳක් වුණොත් හොඳයි. නරකක් වුණොත් අනිවාර්යයෙන්ම මම මොහුට විරුද්ධව ක්‍රියාත්මක වෙනවා කියලා මම තීරණය කළා ස්වාමීනි. ඒ තීරණය කිරීමත් එක්ක මොහු ඉස්සරලම මාත් එක්ක කථා කළේ මත්ද්‍රව්‍ය සම්බන්ධව. ඔයා මත්ද්‍රව්‍ය නැති කරන්න ලොකු දෙයක් කරගෙන යනවා, අපි ඒකට කැමතියි. රටට වැඩ කරන මිනිස්සු තමයි මේ රටට ඕන. ස්වේච්ඡාවෙන් වැඩ කරන මිනිස්සු

FAIR COMMENT BY JEZEEM

තමයි ඕන කියලා කථා කළේ ස්වාමීනි. ඒ කථා කරලා ටික දවසක් ගිහිල්ලා ලංකාවේ මුස්ලිම් හිස එසවීමක් තියෙනවා. මේකට විරුද්ධව අපි ගරිල්ලා සංවිධානයක් විදියට බිහි වෙන්න ඕන කියලා මොහු යෝජනා කරනවා ස්වාමීනි. ඒ යෝජනා කිරීමත් එක්ක තමයි මම තීරණය කරන්නේ මේක ත්‍රස්තවාදී කටයුත්තක්. මගේ දැනුමේ හැටියට, මට තේරෙන විදියට මම අදහස් කරනවා මේක පිළිබඳව වාර්තා කරන්න ඕන, කියන්න ඕන, ගන්න ඕන ඉහළම ක්‍රියාමාර්ග ගන්න ඕන කියලා. ඒ නිසා තමයි ස්වාමීනි මම ඒ වෙනකොට 07.02 වෙනිදා උපවාසයෙන් පස්සේ, රාජ්‍ය බුද්ධි අංශය මාත් එක්ක සම්බන්ධ වුණාට පස්සේ මම රාජ්‍ය බුද්ධි අංශයේ ලක්ජීව කියන නිලධාරියාට මම කථා කරලා කියනවා, ලක්ජීව මහත්මයා මට විශේෂ පුද්ගලයෙක් කථා කළා. මේ පුද්ගලයා කථා කරලා මෙන්න මෙහෙම කථාවක් මට කියනවා, මේකට අපි මොකද්ද කරන්නේ කියලා. හරි ඔයා එන්න කෑගල්ලට. අපි කෑගල්ලට ඇවිල්ලා හම්බ වෙලා කථා කරමු කියලා. ඔහුගෙන් පිළිතුරක්, ඔහු ඒ ඔක්කොම ටික අහ ගත්තා. හරි මම ඒක බලන්නම් කියලා කිව්වා. හැබැයි මට ප්‍රති පිළිතුරක් දවස් තුන හතරක් යනකම් දුන්නේ නැහැ. ඒ අතර තුෂාර පීරිස්ගෙන් මම පුද්ගලිකව තීරණය කළා කවුරු කැමති වුණත් අකැමැති වුණත් මම මේක පුද්ගලිකව හොයනවා කියලා. මට පුළුවන් දෙයක් මම මේ වෙනුවෙන් කරනවා කියලා. ඊට පස්සේ..,

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ලක්ප්‍රිය කියන නිලධාරියා...?

පි : ලක්ජීව ස්වාමීනි

ප්‍ර : ලක්ජීව කියන නිලධාරියා කොහෙද වැඩ කරන්නේ, ඔබට හම්බ වුණේ කොහොමද?

පි : ඔහු වැඩ කරන්නේ කෑගල්ල ප්‍රදේශයේ රාජ්‍ය බුද්ධි සේවයේ තමයි කටයුතු කරනවා කියලා කියන්නේ. මම ඔහුගේ හැඳුනුම්පත බලලා නැහැ ස්වාමීනි. නමුත් මාව යොමු කළේ, මම අර නුවර උපවාසයෙන් පස්සේ වරකාපොළ පොලීසියේ අය ගෙදරට ඇවිල්ලා ඇහුවා රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියෙක් ඉන්නවා. ඔයාට යොමු කරන්නම්. මොකද කියන්නේ. එයා ඔයාගෙන් ප්‍රශ්න ටිකක් අහන්න ඇවිල්ලා ඉන්නවා. ගෙදරට නම් එන්න කැමති නැහැ කිව්වා. මම කිව්වා හරි කිසි ප්‍රශ්නයක් නැහැ ඔයාලා කැමති තැනක් කියන්න මම එන්නම් කියලා. ඒ අනුව ගිහිල්ලා ස්වාමීනි

FAIR COMMENT — BY JEZEEM —

හම්බ වුණා. ඔහු රාජ්‍ය බුද්ධි සේවයේ විය යුතුයි ස්වාමීනි. හරියටම මම ස්ථිර වශයෙන්ම දන්නේ නැහැ. නමුත් මම විශ්වාස කරනවා මගේ දැනුමේ හැටියට ස්වාමීනි ඔහු රාජ්‍ය බුද්ධි සේවයේ තමයි කියලා ස්වාමීනි.

ප : ආ ඉතුරු ටික කියන්න?

පි : ඉතිං ස්වාමීනි මොහුට දුන්නට පස්සේ මොහු මේ තොරතුර පිළිබඳව අධ්‍යයනය කළාද කියන්න මම දන්නේ නැහැ. නමුත් මට කිව්වා මේ ගැන අපි හොයන ගමන් ඉන්නේ නාමල්. අපි ඉක්මණටම ඕකට පිළිතුරක් දෙන්නම්. ඔයා පුළුවන් තරම් තොරතුරු ගන්න කියලා කිව්වා ඒ සම්බන්ධව. තියෙන තොරතුරු ඔක්කොම එකතු කර ගන්න කියලා කිව්වා. නමුත් ඒ එකතු කිරීමත් එක්ක ඒගොල්ලන්ගේ ක්‍රියාකාරිත්වයක් මම දැක්කේ නැහැ ස්වාමීනි. ඒ දැක්කේ නැති නිසා මට මේ දැන් එක පැත්තකින් මේ මනුස්සයා ආයුධ නැව් ගෙන්වන්න කථා කරනවා ස්වාමීනි ලංකාවට තුෂාර පිරිස්. ලංකාවේ මේ විදියට ගහමු කියලා සැළසුම් කරනවා. අමාත්‍යවරු ඝාතනය කරමු කියලා සැළසුම් කරනවා. ඒකට මම දැන් මෙතන තොරතුරු ගන්න ඕන නිසා, හරි OK අපි කරමු, එහෙනම් මෙහෙම කරමු, අරෙහෙම කරමු කියලා මගේ වචන ටික මම දානවා. දැන් එතකොට මම ත්‍රස්තවාදයේ කොටස්කාරයෙක් ස්වාමීනි. මේක මේ මේ විදියට යන්න ගියහම. මේක ගැන ගන්න ක්‍රියාමාර්ගයක් නැහැ. ඉහළ නිලධාරියෙක්ගේ අනුමැතියක් එන්නේ නැහැ කොතනින්වත්. ගත්තු ක්‍රියාමාර්ගයක් නැති නිසා මම කල්පනා කරනවා මේක ගිහිල්ලා කෑගල්ලේ SSP සේරසිංහ මහත්මයාට කියනවා. සේරසිංහ මහත්මයා තමයි කිව්වේ ඔයාට, IG සර් ඔයත් එක්ක හිතවත් නිසා මේක මට කරන්න පුළුවන් එකකුත් නෙමෙයි. මේක IG සර්ගෙන්ම යන්න ඕන ලොකු Case එකක් මෙතන තියෙන්නේ. ඔයා මේක IG සර්ටම කෙළින්ම කියන්න කියලා. ඒ නිසා තමයි ස්වාමීනි මම පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයාට ඕක කථා කරලා කියන්නේ. ඉතිං මෙන්න මේ විදියට ත්‍රස්තවාදී කටයුත්තකට තමයි තුෂාර පිරිස් සැළසුම් කරන්නේ, ඒ සිංහල ඩයස් පෝරාවක් හදලා, ගරිල්ලා සංවිධානයක් හදලා ඒ විදියට කරන්න උත්සාහ කරනවා. ඒ එහෙම කරන්න එක හේතුවක් වෙන්න ඇති ඉස්ලාම් අන්තවාදයෙන් හිස එසවීමක් රට ඇතුළේ තියෙන නිසා ස්වාමීනි.

****

Presidential Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : හරි. දැන් සාක්ෂිකරු ඔබ 2017.08.16 කුමාර පීරිස් සමඟ සම්බන්ධ වුණා Facebook එකේ Messengerවලින්. ඊට පස්සේ ඔහු කියා සිටියා මේ ලංකාව තුළ ත්‍රස්තවාදී කටයුත්තක් සිදු කරමු කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම් ජනතාවට එරෙහිව?

පි : මුස්ලිම් ජනතාවට එරෙහිව ස්වාමීනි.

ප්‍ර : ඒ එසේ කරමු කියා ඔහු කියා සිටියේ කවද්ද?

පි : ස්වාමීනි පළවෙනි දවසෙම කිව්වේ නැහැ. නමුත් සතියක් වගේ ඇතුළත ඔය ඔක්කොම සිද්ධ වුණා ස්වාමීනි.

ප්‍ර : හරි. එය සිදුවෙලා ඔහු මොනවද ඔබට කියා සිටියේ?

පි : ඔහු කථා කළේ දැන් මට ස්වාමීනි මට තොරතුරක් ගන්න ඕන නිසා මම යන්න ඕන හැමතැනින්ම ගියා. මම ඇහුවා එතකොට අපි දැන් කොහොමද මේක ගහන්නේ. මේකට අපට මුදල් ආධාර, දැන් අපේ කියන චේතනාවෙන්, එතන කථා කරන්නේ දැන් මට මේ තොරතුර ගන්න ඕන. ගන්න එකත් එක්ක මම කථා කරන්නේ මේක හරි මම Ok කියන තැන ඉඳලා ස්වාමීනි. එතකොට මම කථා කළේ හරි, එතකොට දැන් අපට සල්ලි කොහෙන්ද මේවාට. කවුරු හරි දේශපාලනඥයෝ අපිට සම්බන්ධතා තියෙනවාද. ඔයාට සම්බන්ධතා තියෙනවාද, දැන් එතකොට මම අහනවා දැන් යුධ හමුදාපතිතුමා හිටියේ මහේෂ් සේනානායක මහත්මයා මට මතක හැටියට. මම අහනවා Army Commandant එක්ක ඔයාගේ හිතවත්කම් තියෙනවද. දැන් මේ වගේ දෙයක් කරනකොට දැන් මොකක් හරි තියෙන්න එපැයි මේ මනුස්සයාට ලංකාවේ ස්වාමීනි. ඒ නිසා මම එතන අහනවා Army Commandant එක්ක සම්බන්ධතා තියෙනවද, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඔයා අඳුරනවද, මහින්ද රාජපක්ෂ මහත්තයා එහෙම අඳුරනවද, ඒ කාලේ Film කළානම් ඔයා අඳුරන්න ඕනනේ. එතකොට මේ වචන එනවා ස්වාමීනි ඔහුගෙන්. ඒ නිසා මම ඔහොම අහන, ඒ හැමදේම ඇහුවා ඒ තුෂාර පීරිස්ගෙන්. අහන දේවල්වල දේශපාලනඥයෝ පිළිබඳව ඔහු කථා කරන්න ගියේ නැහැ. නමුත් දේශපාලනඥයන්ව අල්ලා ගන්න ඔහු උත්සාහ කළා ස්වාමීනි. ඒවගේ හඬ පටත් මම ලබා දීලා තියෙනවා ස්වාමීනි. දේශපාලනඥයෝ අල්ලා ගන්න ඔහු උත්සාහයක නිරත වුණා. ඒ අල්ලා ගන්න උත්සාහ කරපු එක්කෙනෙක් තමයි මම ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM —

මම විතරයි මම හිතන්නේ මේ ගැන හෙළි කළේ. වෙන බොහෝ දෙනෙක් මේවා, බොහෝ දෙනෙක් එක්ක තුෂාර පීරිස් මේ සම්බන්ධව කථා කරලා ඇති. නමුත් ඒ කිසිම කෙනෙක් ස්වාමීනි කථා කරන්නේ නැහැ. ඒ බව එළියට කියන්න යන්නේ නැහැ. මිනිස්සුන්ගේ තියෙන ජීවිතවලට තර්ජන ප්‍රශ්න නිසා ඒවා මම හිතන්නේ කියන්න යන්නේ නැහැ. මට රිෂාඩ් බදුර්ඩීන් මුස්ලිම් වුණාට, මම මගේ ගමට ස්වාමීනි පන්සලක් හදලා තියෙනවා. හැබැයි ඉස්ලාම් භක්තිකයා කොයි වෙලාවකවත් පාගලා දානවා කියන චේතනාවක මම නැහැ. ඒ නිසා ස්වාමීනි රිෂාඩ් බදුර්ඩීන් නෙමෙයි කවුරුත් මේ රටේ එල්ලලා මරන්න ඉන්න කෙනෙක්ව හෙට ඝාතනය කරනවා කිව්වත් මම ඒකටත් විරුද්ධයි ස්වාමීනි.

ප : හරි. දැන් සාක්ෂිකරු ඔබ මේ තුෂාර පීරිස් එක්ක කථා කරනකොට ඔහු මේ ලංකාව තුළ මේ මුස්ලිම් ජාතිකයන්ට එරෙහිව මොනවා කරන්න ඕන කියලද කිව්වේ?

පි : ස්වාමීනි පල්ලිවලට බෝම්බ ගහන්න, ඊට පස්සේ මුස්ලිම් දේශපාලනඥයෝ, ඒ වගේම සංවිධාන විදියට යම්කිසි කෙනෙක් නැගී එනවා නම් ඒ අය, ඒ අයව රහසිගතව ඝාතනය කරන්න. තුෂාර පීරිස්ගේ සමස්ත අරමුණ වුණේ යම්කිසි ප්‍රහාර මාලාවක, දැන් සහරාන්ලා ප්‍රහාර මාලාවක් දියත් කළා වගේ තුෂාර පීරිස්ටත් අවශ්‍ය, ඒකම අනිත් පැත්ත ස්වාමීනි. ඒ වගේම ප්‍රහාර මාලාවක් දියත් කරලා මුස්ලිම් ජනතාව බය කරවන එහෙම කථාවක් නිර්මාණය කිරීම තමයි බලාපොරොත්තු වුණේ. නමුත් තුෂාර පීරිස්ගේ ස්වාමීනි මම පසුව හොයලා බලනකොට තුෂාර පීරිස් ඒ Target එකේ අපට ඒ කියන්නේ සිංහල මෙතන ස්වාමීනි ලොකු පැටලිල්ලක් තියෙනවා. ජාතීන් දෙක අතර ලොකු අරගලයක් තියෙනවා. අදටත් මේ රටේ ඒ අරගලය තියෙනවා. ඒක ගොඩක් දෙනා නොදන්න, දැනගෙන නිහඬව ඉන්නවද කියන්න මම දන්නේ නැහැ ස්වාමීනි. මට මේ ගරු කොමිසම ඉදිරියේ මේක මේ ගැන සත්‍යයම කථා කරන්න සිද්ධ වෙනවා ස්වාමීනි. ඇතැම් මිනිස්සු මේක අවස්ථාවක් කරගෙන මේ ජාතියේ නාමයෙන් ඒ වගේම තමන්ගේ ආගමේ නාමයෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන්න කැමති සිංහල සහ මුස්ලිම් ප්‍රජාවක් ඉන්නවා ස්වාමීනි මේ රටේ. අදටත් බිහිවෙලා ඉන්නවා ස්වාමීනි. මගේ ළඟ සාක්ෂි තියෙනවා අදටත් ඉන්නවා ස්වාමීනි. මම ඕන නම් ඒ සාක්ෂි ඕන නම් ඉදිරිපත් කරන්නම් ඉදිරියේදී. අදටත්, ගිය සතියෙත් මට කථා කරලා කියනවා ගිය සතියේ බුද්ධි අංශ නිලධාරීන් සම්බන්ධ කරලා මම හැදුවා WhatsApp Group එකක් ස්වාමීනි. ඒකට රාජ්‍ය

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නිලධාරීන්, දේශපාලනඥයොත් ඉන්නවා. ඒකේදී මම එක අදහසක් දැම්මා මේ ත්‍රස්තවාදය නැති කරන්න අපි කොහොමද වැඩ කරන්න ඕන කියලා මේ අන්තවාදයෙන් එහාට යන්න. එතනදී ඔය පුද්ගලයෙක් ඉදිරිපත් කරනවා අපි අනිවාර්යයෙන්ම ආයුධ සන්නද්ධ කණ්ඩායමක්, සිංහල ගරිල්ලා කණ්ඩායමක් බිහි කරන්න ඕන කියලා දැනට සතියකට කලිනුත් ස්වාමීනි මෙවැනි අදහසක් ඉදිරිපත් වුණා ස්වාමීනි මේ WhatsApp Group එකට. එතකොට ස්වාමීනි මෙහෙම මිනිස්සු ඉන්නවා. මෙහෙම මිනිස්සුන්ගෙන් තමයි තුෂාර පීරිස්ලා වගේ මිනිස්සු ප්‍රයෝජන ගන්න උත්සාහ කරන්නේ. ඒ අයගේ පටු අරමුණුවලට යන්න මේ කැක්කුමක් තියෙන තරුණ ප්‍රජාව එකතු කරගෙන සංවිධාන විදියට හදාගෙන මේ අයව Suicide කරවන තැනට සහරාන් ක්‍රියාත්මක වුණෙත් එහෙමයි. සහරාන් කොහොම වුණත් සහරාන් මැරුණේ අවසානයේ සහරාන්ලට කරන්න දෙයක් නැති නිසා. තුෂාර පීරිස් ක්‍රියාත්මක කරන්න ගියෙත් ඕකෙම අනිත් පැත්ත ස්වාමීනි. ඒ දෙකම ත්‍රස්තවාදය.

ප : දැන් ඔය ත්‍රස්තවාදී කටයුතු කොහොමද කරන්නේ. ඒවට පුපුරණ ද්‍රව්‍ය අවශ්‍යයි. ඒවාට අවි ආයුධ අවශ්‍යයි. දැන් මේවා සම්බන්ධයෙන් ඔබ ඔහුගෙන් විමසා සිටියාද නැද්ද?

පි : ස්වාමීනි මම ඒ හැම දෙයක්ම විමසුවා.

ප : මොනවද?

පි : ලංකාව ඇතුළේ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නේ, ඒ බඩු භාහිරාදිය කොහෙන්ද හොයන්නේ, ඒවාට...,

ප : ඔව් හරි. මට ඕන ඔබ ඒ අහපු ප්‍රශ්නවලට වඩා ඔබට ලැබිච්ච පිළිතුරු. මම අහන ප්‍රශ්නයට ඔබ පිළිතුරු...?

පි : පිළිතුරු ස්වාමීනි ඔහු මුදල් එහෙන් එවන්න සූදානම්. ඔහු මුදල් එවලත් තියෙනවා.

ප : කාටද?

පි : මට එවලා තියෙනවා ස්වාමීනි. ඒ එවලා තියෙන්නේ ත්‍රස්ත විමර්ශන දිසාවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයාට මම එක දවසක් කථා කරලා කිව්වා සර් මෙහෙම ආයුධ වගයක් ගන්න සල්ලි වගයක් එවන්න අහනවා මොකද කියන්නේ කියලා. අපි ආයුධ ටික මොකක් හරි මෙතුමා කිව්වා හරි සල්ලි ටික ගෙන්න ගන්න අපිට සාක්ෂියක් ඕන වෙනවා කියලා. මම කිව්වා හරි ගෙන්න ගමු. ඒත් දැන් ඉල්ලනකොට දෙන්න බඩු මොකද කරන්නේ. හරි අපි සල්ලි ටික ගෙන්න ගමු කියලා ත්‍රස්ත විමර්ශන දිසාවේ තිබුණ T-56 දෙකක් අපි පින්තූර ගහලා ඒ දෙක

FAIR COMMENT — BY JEZEEM —

යවලා අපි ඒකට අවශ්‍ය මුදල් ආවා. ඒ මුදල් ගත්තේ ස්වාමීනි මම. ඒවා කාටවත් දුන්නේ නැහැ. කවුරුත් ඉල්ලුවෙත් නැහැ මගෙන්. මමයි නාලක සිල්වා මහත්තයයි විතරයි ඒ වෙනකොට දන්නේ. නාලක සිල්වා මහත්තයාගේ ගෝලයා දන්නවා ඇති. එතකොට අපි දෙන්නා ඒ සල්ලි ලංකාවට ගෙන්නුවා. ගෙන්නලා අපි ඒක සාක්ෂියක් විදියට නාලක සිල්වා මහත්තයා සටහන් කර ගත්තා තුෂාර පීරිස් ලංකාවේ ත්‍රස්තවාදී කටයුත්තක් කරන්න මුදල් ලංකාවට එවනවා කියලා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : කොච්චර ප්‍රමාණයක්ද මුදල කියද?

පි : ස්වාමීනි එක්ලක්ෂ තිස් දාහක් විතර මට මතක හැටියට. ඒවා ත්‍රස්ත විමර්ශන දිසාවේ ඇති ස්වාමීනි. ඒ මුදල් ගත්තු බැංකුව, ගත්තු රිසිට් ඒ හැම දෙයක්ම ත්‍රස්ත විමර්ශන දිසාවට භාර දීලා තියෙනවා ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඒ කොයි කාලයේද?

පි : ඒ ස්වාමීනි 2017 අවසාන කාලයේ වගේ ස්වාමීනි.

ප්‍ර : එතකොට දැන් මේ මුදල් එව්වේ කුමන කරුණකටද?

පි : ස්වාමීනි මේක එව්වේ T-56 දෙකක් මිලදී ගන්න කියලා, මැගසින් හා පතොරම් 120 ක් සමඟ මැගසින් හතරක්, ඒ වගේම T-56 දෙකක් මිලදී ගන්න කියලා තමයි මේ මුදල එව්වේ.

ප්‍ර : ඒ මුදලට ගන්න තියෙනවද T-56?

පි : ගන්න නැහැ ස්වාමීනි. මට අවශ්‍ය වුණේ රුපියලක් හරි ත්‍රස්තවාදය වෙනුවෙන් යෙදෙව්වා නම් ඒක සාක්ෂියක් ස්වාමීනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු දැන් ඔහු කියා සිටියද දැන් ඔය පුපුරණ ද්‍රව්‍ය ඔබ කිව්වනේ ලංකාවේ හදන්න පුළුවන් කථාවක් ඔහු කියා හිටි බව?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔහු කියා සිටියද කොහොමද ඒක කරන්නේ කියලා?

පි : ඔහුට අවශ්‍ය ඒකට අවශ්‍ය දැනුම තියෙන පුද්ගලයෝ ඉන්නවා කියලා කිව්වා. ලංකාවේ ඒකට අවශ්‍ය තාක්ෂණාගාරයකුත් තියෙනවා කියලා කිව්වා.

ප්‍ර : කොහේද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : තැන මම ඇහුවා, මට තැන කිව්වේ නැහැ ස්වාමීනි. ඔහු එක්කෙනෙකුට එක්කෙනෙක් සම්බන්ධ කරවන් නැතුව තමයි ඒ කටයුතු කරන්න හැම වෙලාවෙම උත්සාහ කළේ. එතකොට මම හොයා ගන්න උත්සාහ කළා, එතකොට ලංකාවට ස්වාමීනි හඬ පට මම හිතන්නේ බොහොමයක්ම, හඬ පට බොහොමයක්ම ත්‍රස්ත විමර්ශන දිසාවේ ඇති. මම දන්නවා තියෙනවා කියලා. මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා වැඩිදුර විමර්ශන සඳහා අවශ්‍ය වුවහොත් එම ඒකකයෙන් ලබා ගන්න ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ස්වාමීනි.

ප්‍ර : එතෙක් මේ ගරු සභාවට කියන්න, දැන් ඔහු ඒ කියන්නේ ඔබ කියන තුෂාර පීරිස් කියන චරිතය, පුද්ගලයා ඔබට ඒ මෙම ත්‍රස්ත කටයුතු කිරීම සඳහානේ මේ අවි මිලදී ගැනීමට මුදල් එව්වේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : හරි. මේ ක්‍රියාව ඉතිං ඔබට තනියෙම කරන්න පුළුවන් ක්‍රියාවක්ද නැද්ද කියන එක ගැන ඔහු කථා කළාද?

පි : කථා කළා ස්වාමීනි. ගොඩක් අවස්ථාවල ගොඩක් දේවල් කථා කළා ස්වාමීනි.

ප්‍ර : ඒකට සම්බන්ධ වෙන පුද්ගලයෝ ගැන ඔහු ඔබට ප්‍රකාශ කර සිටියාද?

පි : Team එකක් හදා ගන්න කියලා කිව්වා. මම හැම වෙලාවෙම මම කථා කළේ ඒ පැත්ත සියල්ල හරි. මගේ පැත්ත හරි. නමුත් පැත්තේ ඉන්න කෙනෙක් කවුද, මොකද්ද වෙන්නේ ඒ කිසිම දෙයක් Planning නැහැ ස්වාමීනි. ඒවා ඉදිරියට සැළසුම් කරලා තිබුණේ නැහැ. හේතුව ඒ පැත්තක් නැති නිසා, අපි මේක විමර්ශනයක් විදියට ඉදිරියට ගිය නිසා හැම වෙලාවෙම උත්සාහ කළේ ඒ වෙලාවේ ඉදිරිපත් කරන ප්‍රශ්නය සහ ඒ වෙලාවේ කථා කරන දේ සාකච්ඡා කරලා ඉදිරියට මේක පවත්වාගෙන ගිහිල්ලා ඔහුගෙන් ගන්න ඕන දේවල් ගන්නවා මිසක් අපෙන් දේවල් ලබාදීම නෙමෙයි ස්වාමීනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු මෙහිදී මෙම මුස්ලිම් ජනතාවට ප්‍රහාරයක් එල්ල කරමින් ඒ ප්‍රහාරය කොහේද, කවද්ද සිදු කරන්නේ යන කාරණා ඔබ සමඟත් සාකච්ඡා කළාද?

පි : ස්වාමීනි දිනයක් දාගෙන තිබුණා.

ප්‍ර : කවද්ද?

පි : 2018 දෙසැම්බර් මාසේ දාගෙන තිබුණා. ඒ දාගෙන තිබුණේ සමාවෙන්න 11 වෙනි මාසේ දාගෙන තිබුණේ. ඒ දාගෙන තිබුණේ

FAIR COMMENT — BY JEZEEM —

ස්වාමීනි මහනුවර කැරැල්ලට අවුරුදු දෙසීයක් සම්පූර්ණ වෙන දවසට තමයි මේක දාගෙන තිබුණේ. නමුත් ඒ දිනය ඔහුට අවශ්‍ය දේවල් කර ගන්න බැරි වුණා. මොකද හේතුව ඔහු සම්බන්ධ වෙලා හිටිය හැමදේම දෙන්නම් හරි මම කරන්නම් කියන තැන ඔහුගේ ළඟටම මම සම්බන්ධ වෙලා හිටපු නිසා මගේ පැත්තෙන් වෙන්න ඕන එක දෙයක්වත් ඔහු මුදල් එව්වාටවත් කෙරිලා තිබුණේ නැති නිසා ඔහුට ඒ ප්‍රහාර මාලාව සැළසුම් කර ගන්න හැකියාවක් ලැබුණේ නැහැ ස්වාමීනි. හැබැයි වෙන කෙනෙක් එතන හිටියා නම් මුදල් එනකොට...,

ප්‍ර : දැන් සාක්ෂිකරු මේ කාලය වනවිට ඔබ සහරාන් කියන තැනැත්තාව දන්නවද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : සහරාන්ව දන්නේ නැහැ?

පි : දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : මේ තුෂාර පීරිස් ඔබට කිව්වද කවුරු හරි සම්බන්ධ කරලා දෙන්න කියලා තව?

පි : ස්වාමීනි පැහැදිලි මදි.

ප්‍ර : නැහැ. දැන් ඔබට අමතරව වෙනත් තැනැත්තන්ව ඔහුට සම්බන්ධ...?

පි : එහෙමයි ස්වාමීනි. ඒ කියන්නේ තුෂාර පීරිස් එක්ක කෙළින්ම සම්බන්ධ කරන්න කියලා කිව්වේ නැහැ. නමුත් දැන් දේශපාලනඥයන්ගේ නම් කියලා මට කියනවා නාමල් මට මෙයාව සම්බන්ධ කර ගන්න අමාරුයි. මෙයාට කථා කරලා කියන්න මට කථා කරන්න කියලා. එහෙම කියපු අවස්ථා තිබුණා ස්වාමීනි. දැන් උදාහරණයක් විදියට, එක සිදුවීමක් මට කිව්වා පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකරට කථා කරලා කියන්න තුෂාර පීරිස්ට කථා කරන්න ඕන කිව්වා කියලා. මම ගත්තා ඒ කියපු කථාව Recording එක ගත්තා, ප්‍රශ්නයක් නැහැ. මට ස්වාමීනි මම, මගේ ජීවිතේට අනතුරු වෙයි. නමුත් කියන්න ඕන දේ කියන්න සිද්ධ වෙනවා. මට අනිත් පැත්තට අවශ්‍ය වෙනවා තුෂාර පීරිස් එක්ක තියෙන සරත් වීරසේකර තියෙන සම්බන්ධය මොකද්ද කියලා හොයා ගන්න ස්වාමීනි. මම අනිත් පැත්තට Call එක ගහනවා සරත් වීරසේකර, ඒකත් Recording එක දාලා ගන්නේ මම. ගන්නවා සරත් වීරසේකර ඔව් මන්ත්‍රීතුමා ආයුබෝවන්. මට තුෂාර පීරිස් කියලා කෙනෙක් පණිවිඩයක් කිව්වා, මම අහවලා කථා කරන්නේ නාමල් කුමාර වරකාපොළින්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබතුමාගේ E-mail Address එක ඉල්ලුවා, කොහොමද ඉතිං මොකද කටයුතු ඉස්සරහට වැඩ කටයුතු. මෙන්න මේ වගේ කථා කරපු හඬ පට තියෙනවා ස්වාමීනි මගේ ළඟ. මම ඒවා ඉදිරිපත් කරලා තියෙනවා ඒ අදාළ තැන්වලට. එතකොට බේරන්න ඕනද, අත අරින්න ඕනද, පුද්ගලයාගේ තරාතිරම මොකද්ද, තත්ත්වය මොකද්ද ඒ කිසිම දෙයක් හෙව්වේ නැහැ ස්වාමීනි. මදුමාධව අරවින්දත් එක්ක මට කථා කරන්න ඕන කියලා කිව්වම මම කියනවා මට දුරකථන අංකයක් එවන්න. මට මදුමාධව අරවින්ද ඔයා නෙමෙයි මට සම්බන්ධ කරලා දෙන්න. මට දැන ගන්න ඕන මදුමාධව අරවින්දත් එක්ක යම් ප්‍රශ්නයක් තියෙනවද කියලා ගරු ස්වාමීනි. කර්නල් බර්තෝලන් නිව්ස්, යුධ හමුදා බුද්ධි අංශයේ හිටියේ කියලා කිව්වා. දැන් ඉන්නේ කළුතර පැත්තේ කැම්ප් එහෙක ඉන්නේ පසුකාලීනව කිව්වා. කර්නල් බර්තෝලන් නිව්ස් මගේ හොඳ යාළුවෙක් මට සම්බන්ධ කර ගන්න ඕන. මොහු ත්‍රස්තවාදයක් මොහුට ලංකාවේ ගොඩ නගන්න බැරි වුණා. ඒ බැරි වුණේ මම හිතන්නේ මම හින්දා. ඒ කර්නල් බර්තෝලන් නිව්ස් එක්ක මම තියෙන සම්බන්ධය මොකද්ද කියලා හොයන්න බලන්න උත්සාහ කළා. හැබැයි ඒ හැම තැනකම මම දැන ගත්තේ ස්වාමීනි හොයා ගත්තු දේ මොහු ඔවුන් සමඟ සම්බන්ධ වෙන්න උත්සාහ කරනවා. නමුත් මොහුට ඔවුන්ව සම්බන්ධ කර ගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ ස්වාමීනි. මෙන්න මේ නිසා, මෙහෙම පසුබිමක් තමයි ඒ වටා තිබුණේ. ඊට එහා Link එකක් එතන තිබුණේ නැහැ ස්වාමීනි.

ප : 2019.04.21 දින වෙච්ච ප්‍රහාරය සහ තුෂාර පීරිස් අතර සම්බන්ධයක් තියෙනවා කියලා ඔබට සාක්ෂි තියෙනවද?

පි : නැත ස්වාමීනි.

ප : දැන් සාක්ෂිකරු මේ තුෂාර පීරිස් මේ ලංකාව තුළ යම් ජාතිවාදී අරගලයක් ඇති කරන්න උත්සාහ කරනවා කියන එක ඔබ කියා සිටියා ඔබ අර ඔබ දන්න SIS එකේ මහත්තයාට කිව්වා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප : වැඩක් වුණේ නැහැ?

පි : නැත ස්වාමීනි.

ප : ඊට පස්සේ ඔබ මොකද කළේ?

පි : SIS එකට කිව්වම පස්සේ ඒකට වැඩක් වුණේ නැහැ. ඒගොල්ලෝ ඒකට පිළිතුරක් දෙන්නම් කිව්වා. නමුත් තුෂාර පීරිස් දවසින් දවස කථා කරගෙන, කථා කරගෙන යනවා. එයා ඊළඟ Option එකට මම යන්න ඕන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔව්. මොකද්ද ඊළඟ Option එක?

පි : ඒ නිසා මම පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයාට මේ පිළිබඳව දැනුවත් කළා. පූජිත් ජයසුන්දර මහත්මයා මට DIG නාලක සිල්වා මහත්මයා...,

ප්‍ර : පූජිත් ජයසුන්දර මහත්මයාට කවද්ද ඔබ දැනුවත් කළේ?

පි : මට මතක හැටියට ස්වාමීනි 2018, සමාවෙන්න 2017 සැප්තැම්බර් මාසයේ මුල් කාලයේ වගේ ස්වාමීනි. ඒ කියන්නේ මාසයක් ඇතුළත ස්වාමීනි.

ප්‍ර : 2017 ද, 18 ද?

පි : 17 ස්වාමීනි. 2017 අගෝස්තු මාසේ 16 වෙනිදා තමයි මට තුෂාර පීරිස් පළමුවෙන්ම කථා කරන්නේ. සැප්තැම්බර් මාසේ 16ට පෙර මට මතක හැටියට මාසයක් ඇතුළත මම පූජිත් ජයසුන්දර මහත්මයා හමු වෙනවා ස්වාමීනි.

ප්‍ර : එසේ හමු වුණාට පසුව එවකට පොලිස්පතිතුමා ඔබට මොකද කරන්නේ?

පි : පොලිස්තුමා කියනවා මේකට හොඳ මේක ත්‍රස්තවාදී කටයුත්තක්. මේක යන්න ඕන ඒ පැත්තට යන්න ඕන. ඒකට හොඳ Expert කෙනෙක් ඉන්නවා. ඒකට මම ඔයාව ඒ පැත්තට යොමු කරන්නම් කියලා ප්‍රියදර්ශන මහත්මයාට කියනවා නාලක සිල්වා මහත්මයාව සම්බන්ධ කරලා දෙන්න කියලා. නමුත් නාලක සිල්වා මහත්මයා ඒ වෙලාවේ සම්බන්ධ කර ගන්න බැරි වෙනවා. ඊට පස්සේ දවස් දෙක තුනකට පස්සේ මම Call එකක් ගහලා ඇහුවා සර් මොකද වෙන්නේ වැඩේ. මෙන්න මේ මේක Case එක මේ විදියට දැනට තියෙන්නේ මේ තත්ත්වයේ කියලා.

ප්‍ර : කාටද ඒ Call එක ගැහුවේ?

පි : මම පූජිත් ජයසුන්දර මහත්මයාට ගත්තේ. පූජිත් ජයසුන්දර මහත්මයාට Call එකක් අරගෙන කථා කරලා ඇහුවම පස්සේ කිව්වා එතුමා කිව්වා හරි පොඩ්ඩක් ඉන්න මම ඔයාව සම්බන්ධ කරලා දෙන්නම් කියලා මම උදේ හයයි ගාණක් වගේ මට මතක හැටියට. නාලක සිල්වා මහත්මයාට කථා කරලා කිව්වා නාලක මම ඔයාට කෙනෙක් සම්බන්ධ කරලා දෙනවා. මේ කෙනත් එක්ක සම්බන්ධ වෙලා වැඩක්, ලොකු වැඩක් තියෙනවා මේක කරගෙන යන්න බලන්න කියලා පූජිත් ජයසුන්දර මහත්මයා Phone එකෙන් තමයි නාලක සිල්වා මහත්මයාට කිව්වේ. ඊට පස්සේ මගේ Phone Number එකත් නාලක සිල්වා මහත්මයාට දුන්නා. නාලක සිල්වා මහත්මයා ඒ Call එක පූජිත් ජයසුන්දර

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මහත්මයාගේ Call එක Cut කරලා විනාඩියක් වගේ යනකොට නාලක සිල්වා මහත්මයා මට කරලා කිව්වා හරි ඔයා Office එකට ඇවිල්ලා මාව හමුවෙන්න කියලා. ඒ හමුවෙන්න ගිය දවස තමයි 2018 සැප්තැම්බර් මාසේ 20 මගේ මතකයේ හැටියට.

ප්‍ර : 17 ද, 18 ද?

පි : 20.

ප්‍ර : නැහැ මොන අවුරුද්දෙද?

පි : 2018 ස්වාමීනි. 2017 ස්වාමීනි සමාවෙන්න.

ප්‍ර : 2017 මොන මාසේද කිව්වේ?

පි : 2017 සැප්තැම්බර් 20 ස්වාමීනි.

ප්‍ර : ඔබ නාලක සිල්වා මහත්මයාට කිව්වද මෙම තුෂාර පීරිස් කියන තැනැත්තා විසින් ලංකාව තුළ ඒ මුස්ලිම් ජාතිකයන්ට විරුද්ධව කෝලහලයක්, පහර දීමක් සැළසුම් කරලා තියෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳව එතුමා ඔබට උපදෙස් ලබා දුන්නාද?

පි : ඔව් පළවෙනි පියවර විදියට එතුමා කිව්වා මේක ලොකු Case එකක්. මේක අපි රහසිගතව හොයන්න ඕන. මම ඔයා ලැබෙන හැමදේම Record කර ගන්න කියලා කිව්වා. ඊට පස්සේ එතුමා මට Calls එන ඒවා Record කරන්න අවශ්‍ය මේකක්, දත්ත ගබඩාකරණ යන්ත්‍රයක් දුන්නා. ඒකෙන් මම ගොඩක් හඩ පට කිහිපයක්ම ලබා ගත්තා. ඒක මම එතුමාට පසුව භාර දුන්නා සතියකට දෙහෙකට පස්සේ, ටික කාලයක් මගේ ළඟ තියාගෙන ඉඳලා. මම ඒක යන යන තැන්වල අරන් ගියා අම්පාරේ ඒ හැමතැනම යනකොට අරන් යනවා. අරන් ගිහිල්ලා ඒ අවශ්‍ය සාක්ෂියක් ලබා ගන්න පුළුවන් තැනකට, ත්‍රස්තවාදී තොරතුරක් ලබා ගන්න පුළුවන් තැනක, කථා ඒ කියන්නේ මොකක් හෝ රටේ ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙන දෙයක් කථා කරන තැනකට ගියොත් මම අනිවාර්යයෙන්ම ඒක භාවිතා කළා ස්වාමීනි.

ප්‍ර : දැන් ඒ සම්බන්ධයෙන් නාලක සිල්වා මහත්මයා හරි TID එක යම් පියවරක් ගත්තාද නැද්ද කියන්න ඔබට දැනුමක් තියෙනවද?

පි : ස්වාමීනි ඒ කථා කරන දේවල් සම්බන්ධව ඔහු මට මම අවස්ථා කිහිපයකම විමසුවාම පොලිස්පතිතුමාවත් දැනුවත් කරලා තියෙන්නේ. මට මේවා කරගෙන යන්න, මගේ පාඩුවේ කරගෙන යන්න පොලිස්පතිතුමා අවසර මට දීලා තියෙන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. අපි ඒවා විශේෂයෙන්ම දැනුවත් කරන්න ඕනේ

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

නැහැ. අපි විශේෂ වැඩක් කරනකොට, වැටලීම් වගේ කටයුත්තක් කරනකොට පොලිස්පතිතුමාව දැනුවත් කළහම ඇති කියලා නාලක සිල්වා මහත්මයා මට කිව්වා ස්වාමීනි.

ප : දැන් සාක්ෂිකරු ඔබට දැනීමක් තියෙද මේ කුමාර පීරිස් කියන තැනැත්තා දැන් කොහෙද ඉන්නේ කියන්න?

පි : තුෂාර පීරිස්...,

ප : ඔව් තුෂාර පීරිස් තමයි?

පි : දැනටත් ඉන්නේ ප්‍රංශයේ ස්වාමීනි.

ප : ඔහු අවසානයට ඔබ සමඟ සම්බන්ධ වුණේ කවද්ද?

පි : අවසානයට ස්වාමීනි මට මතක හැටියට 2018.07 වෙනි මාසේ වගේ, 07 වෙනි මාසේ 06 වෙනි මාසේ වගේ.

ප : එහිදී ඔහු කියා සිටියද ඔහු මේ මොකද්ද කරන්න යන ක්‍රියා පිළිවෙල කියලා?

පි : ඔහු අවසානෙටම වෙන් වෙන්න හේතුව දැන් මොහු අපි T-56 ගිනි අවි දෙකක් අපි දැන් හැම වෙලාවෙම කියන්නේ අපි ළඟ තියෙනවා කියලා. දැන් නාලක සිල්වා මහත්මයාගෙන් මම ගන්න ඕන අවශ්‍ය උපදෙස් ගත්තා හැම වෙලාවකම. මම කිව්වේ T-56 ගිනි අවි දෙක මගේ ළඟ තියෙනවා දැන් ප්‍රශ්නයක් නැහැ. මම කිව්වේ දැන් ඒ දෙක තියාගෙන අපි දැන් අපේ ළඟ ඒ දෙක තිබිච්චාවේ. ඊළඟට ඔයා මොකද්ද, දැන් ඔයාගේ දැන් Plan එකක් තියෙනවා නම්, ගහනවා නම් ඊළඟට ඔයා මට දෙන්න ඔයාගේ ඉන්න කොල්ලෝ ටික. මට අවශ්‍ය වුණා මේකට අවශ්‍ය පුද්ගලයෝ කවුද කියලා හඳුනා ගන්න ස්වාමීනි. මේක යම්කිසි ප්‍රහාරයක් හරි දියත් කරන්න ඔයාගේ ඉන්න පිරිස මට හඳුන්වලා දෙන්න කියලා. නමුත් පිරිස මට කොයිම වෙලාවකවත් හඳුන්වලා දීමක් කළේ නැහැ ස්වාමීනි. ඊට පස්සේ ඔහු උත්සාහ කළා මේ T-56 ගිනි අවි දෙක ඔහු ළඟට ගන්න. හැබැයි අපි ළඟ දෙන්න ගිනි අවියක් නැහැ ස්වාමීනි ඒ වෙනකොට. ඉතිං ඔය ප්‍රශ්නය දිගින් දිගටම ගියා. පස්සේ දිගන, තෙල්දෙණිය ගැටුම පස්සේ ඒ අත්අඩංගුවට ගැනීමේ කටයුතු නාලක සිල්වා මහත්මයා කළේ. ඒවාගෙන් පස්සෙත් ඔහුට සැක හිතෙන්න පටන් ගත්ත වෙච්ච සිදුවීම් එක්ක. මොකද හේතුව අමිත් වීරසිංහත් එක්ක මම එකට ඉඳලා අත්අඩංගුවට අරගෙන අනිත් පහුවදා උදේ බලනකොට මම එළියේ, අනිත් ඔක්කොම ඇතුළේ. එතකොට සාමාන්‍ය මිනිස්සුන්ට ඒක තේරෙනවනේ ස්වාමීනි. ඒ මිනිස්සු දැන ගත්තා මෙතන මොකක් හරි, මොකක් හරි එකක් මෙතන තියෙනවා

Provided by Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇතුළෙන් කියලා. ඒ නිසා ඒ සැකය මත පිහිටලා තුෂාර පීරිස් කිව්වා මට T-56 දෙක ඕන කියලා. ඉතිං දෙන්න එකක් නැහැ. අවසානයේ දෙන්න දෙයක් කොහොමත් නැති නිසා මේ සම්බන්ධය කැඩිලා ගියා. ඒ කැඩිලා මාස දෙකක් විතර ගියාට පස්සේ කථා කරන්නෙම නැහැ, Message එකක්වත් නැතුව ගියා. අදටත් ඔහු මම පිළිබඳව හොයනවා. මමත් ඔහු පිළිබඳව හොයනවා ස්වාමීනි.

ප : සල්ලි ඉල්ලුවේ නැද්ද ඔහු?

පි : නැහැ සල්ලු ඉල්ලුවේ නැහැ ස්වාමීනි. මොකද දැන් ත්‍රස්තවාදී කටයුත්තක් කරන්න ගිහිල්ලා දැන් මම ඒක හොයන තැන හිටියේ කිව්වම ඔහු නැවත ආයේ මගෙන් සල්ලි ඉල්ලන තැනට නෙමෙයි ඔහු මාව මඟ හරින්නයි උත්සාහ කළේ.

ප : දැන් සාක්ෂිකරු තුෂාර පීරිස් ඔහොමනේ. අර සමන් පෙරේරාද අර යාළුවා?

පි : සමන් පෙරේරා.

ප : සමාවන්න. අපේ ජන බල පක්ෂයේ නායකයා?

පි : අපේ ජන බල පක්ෂයේ සභාපති සමන් පෙරේරා, වැලිසරගේ සමන් පෙරේරා ස්වාමීනි.

ප : මෙයා තමන් කොහොමද හඳුනා ගත්තේ?

පි : මෙයා ස්වාමීනි, මේ ඔක්කොම එක ජාලයක් ස්වාමීනි.

ප : කවුද මේ ඔක්කොම?

පි : කොහෙන් කොහෙන් හරි එක්කෙනෙකුට එක්කෙනෙක් මොකක් හෝ දම්වැලක පුරුක් වගේ කොහෙන් හරි ගැවිච්ච සම්බන්ධතාවයක් තියෙනවා ස්වාමීනි.

ප : මේ ඔක්කොම කියන්නේ කවුද?

පි : ඔක්කොම කියන්නේ ස්වාමීනි මේ ප්‍රකාශ, මේ ප්‍රකාශය විශේෂයෙන්ම මාධ්‍ය ආයතනවලට නිකුත් නොකරන ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ප : මාධ්‍ය නැහැ?

පි : හොඳයි ස්වාමීනි. මේ ප්‍රකාශය කරන්නේ මගේ ආරක්ෂාව ගැනත් ප්‍රශ්න ගොඩක් තියාගෙන ස්වාමීනි. පාස්කු ප්‍රහාරය එල්ල වෙන්නේ 2019 අප්‍රේල් 21 ස්වාමීනි. ඊට සති දෙකකට විතර පස්සේ දින දා හතරකට විතර පස්සේ මැයි මාසේ 04 වෙනිදා හෝ 05 වෙනිදා මට මතකයේ හැටියට සෙනසුරාදා දවසක්, කපිතාන් අසේල ධර්මසිරි කියලා විශ්‍රාම ගිය කපිතාන්වරයෙක්.

ප : කොහේද?

FAIR COMMENT BY JEZEEM

පි : ජංගම දුරකථනයට කථා කරලා කියනවා එතකොට කපිතාන් අසේල ධර්මසිරි කියන්නේ ස්වාමීනි තුෂාර පීරිස් එක්ක සම්බන්ධතාවයක් තියෙන කෙනෙක්.

ප්‍ර : කොහොමද ඔබ දන්නේ?

පි : ඒක මම දන්නවා ස්වාමීනි. තුෂාර පීරිස්ලත් එක්ක කථා කරනවා කියලා අපි මම මේ සංවිධානයේ තුෂාර පීරිස් ගැන මම අවුරුදු දෙකක් විතර හොයාගෙන ගිය එක ස්වාමීනි. එතකොට ගොඩක් අවස්ථාවල තුෂාර පීරිස් එක්ක අසේල ධර්මසිරිත් කථා කරනවා. ඒ අසේල ධර්මසිරි මට කථා කරලා කියනවා නාමල් රැස්වීමක් තියෙනවා කොළඹ. හදිස්සි රැස්වීමක් තියෙන්නේ, දේශපාලනික රැස්වීමක්. මොකද කරන්නේ යමුද කියලා ඇහුවා. ස්වාමීනි ඒ වෙලාවේ මම කල්පනා කරනවා පාස්කු ප්‍රහාරය එල්ල වෙලා ටික දවසයි. දේශපාලනික රැස්වීමක් අසේල ධර්මසිරි සම්බන්ධ වෙනවා. ඒ කියන්නේ මෙතන මොකක් හරි සිදුවීමක් වෙනවා අනිවාර්යයෙන්ම. මම මේකට යන්න ඕන කියලා හිතලා මම කියනවා හරි ප්‍රශ්නයක් නැහැ මම ගෙදර ඉන්නේ. හැබැයි මට යන්න එන්න ක්‍රමයක් නැහැ. මම ගෙදර ඉන්නේ. මට යන්න එන්න හැකියාවක් නම් නැහැ කියලා. night අපි එනවා ඔයාව ගන්න. අපිත් එක්ක නගින්න කියලා කිව්වා. මම කිව්වා කිසි ප්‍රශ්නයක් නැහැ එන්න මම නගින්නම් කියලා. මගේ ගෙදරට කිව්වා මම මට කොළඹ යන්න තියෙනවා හදිස්සියේම. රැස්වීමක් තියෙනවා මම ටක් ගාලා ගිහිල්ලා එන්නම් කියලා. එතකොට ස්වාමීනි වාහනයට නැග්ගමයි මම දන්නේ මේ ඉන්නේ සමන් පෙරේරා කියන කෙනා. මෙයාගේ තමයි මේ ඩිෆෙන්ඩර් එක. මෙයා තමයි අපේ ජන බල පක්ෂයේ සභාපති කියන්නේ. එතකොට මේ යන්නේ ඩෑම්, සිංහලයේ සංවිධානයේ සභාපති කියන ඩෑම් ප්‍රියසාද්ලාගේ ගෙදර. ඩෑම් ප්‍රියසාද් කියන්නේ රොහින්ග්‍යා සරණාගතයන්ට පහර දීමේ චූදිතයෙක්. එතකොට මේ කෙනෙක්ගේ ගෙදර තමයි මේ යන්නේ. එතකොට අසේල ධර්මසිරි තමයි මට කථා කළේ. අසේල ධර්මසිරි තුෂාරත් එක්ක සම්බන්ධතාවයක් තියෙනවා. මෙතන මොකද්ද මේ සිද්ධ වෙන්නේ. මම ඇහුවා දැන් හරි මොකද්ද දේශපාලන රැස්වීම. ස්වාමීනි මම මේ ඒ වෙච්ච දේ ඒ විදියටම කියන්නේ ස්වාමීනි ලබාගත යුතු දේ කොමිෂන් එක ලබා ගනියි. නමුත් මම, මට දන්න දේ සහ සිද්ධ වුණ දේ කියන එක ඒක තමයි නිවැරදි විය යුත්තේ කියන තැන ඉඳලා තමයි මම කියන්නේ ස්වාමීනි. ඊට පස්සේ ඩෑම් ප්‍රියසාද්ලාගේ ගෙදර යන ගමන් මේ කථා වෙනවා

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පාස්කු ප්‍රහාරය එල්ල වෙලා ස්වාමීනි දවස් දා හතරයි, දා හතරක් විතර ඇත්තේ. එතනදී කථා වෙනවා අපි සිංහල බලයක් ගොඩ නගන්න ඕන. ඉස්ලාම් හිස ඉස්සුවා වැඩි අපි දේශපාලන පක්ෂයක් හදලා තියෙනවා. ඔයාලා වගේ වැඩ කරන අයට පුළුවන් මේකේ අපේක්ෂකයෝ විදියට ඡන්දේ ඉල්ලන්න. අපි මේ ඩෑම් ප්‍රියසාද්ව හම්බ වෙන්න යන ගමන්. මේ විදියට මේ පක්ෂය ගොඩ නගා ගමු. අපි මේකට අවශ්‍ය කට්ටිය මේ හදාගෙන යන ගමන්. මේ ගමන තමයි අපි යන්නේ කියලා කිව්වා. අනෙක් ඒ සාකච්ඡාවට ගිහිල්ලා මම ඒගොල්ලොත් එක්ක සම්පූර්ණ අදහස් දැනගෙන මම අනිත් පහුවදා මට ඒ වෙනකොට වෙනත් සම්බන්ධතා තිබුණේ නැහැ. රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරියාත් එක්ක මගේ සම්බන්ධතා තිබුණා. මම එතුමාට කථා කරලා කිව්වා අනෙක් පහුවදාම එතුමාට කථා කරලා කිව්වා මෙන්න මෙහෙම කෙනෙක් මට කථා කළා. මෙයාගේ කොළයක් මට දුන්නා. මෙන්න කොළය ඒ පින්තූරය. මෙයාගේ අදහස මේක.

ප්‍ර : කාගෙද ඔය?

පි : සමන් පෙරේරාගේ. සමන් පෙරේරා කියන කෙනෙක් මට හම්බ වුණා. එයා හම්බ වුණේ මෙන්න මේ ක්‍රමයට. එයාගේ අදහස් මෙන්න මේවා. එයා මෙන්න මේ මේ අයත් එක්ක දැනට සාකච්ඡා කරලා තියෙනවා. එතකොට මේක මේ අවස්ථාවෙන් හිස ඔසවන්න හදන වැඩක්. මේක ඇතුළේ ලොකු දෙයක් ක්‍රියාත්මක වෙන්න පුළුවන්. අන්තවාදයකුත් ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව ඕගොල්ලොන්ගේ අවධානය යොමු කරන්න. මම මොකද්ද මේ ගැන බලන්නද කියලා ඇහුවා. රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරියා කිව්වා රයිට් ඔයා ඔය පිළිබඳව නාමල් හොයන්න. හොයලා මට අවශ්‍ය තොරතුරු දන්වන්න කියලා. අවසානයේ මේ අය ලංකාව පුරාම යන්න පටන් ගත්තා. මඩකලපුවේ අම්පිටියේ සුමනරතන හාමුදුරුවෝ, මහනුවර අනෝජ් සිල්වා මේ වගේ අය මට හැම වෙලාවෙම Call කර කර බුද්ධි අංශවලට මේක දැනුවත් කරන්න බැහැ. මම කරපු වැඩේ ගිය හැම තැනකම Photo එකක් ගහලා මම මගේ Facebook එකෙන් මුදාහැරියා මම දැන් අහවල්ලුත් එක්ක අහවල් තැන ඉන්නේ කියන එක බුද්ධි අංශ නිලධාරියාට දැන ගැනීම පිණිස තමයි මම ඒ විදියට මගේ Facebook එක හරහා ස්වාමීනි මම පින්තූරය පින්තූරය මුදාහැරියා හැමතැනම ගහලා යන යන තැන්වල. ඒ ගිහිල්ලා ඒ ගමනේ තවත් එක ගමනක් විදියට තමයි ස්වාමීනි ඔය හෙට්ටිපොල ප්‍රදේශයෙන් යන්න යන්නේ. ඒ

FAIR COMMENT — BY JEZEEM —

හෙට්ටිපොල ප්‍රදේශයෙන් යන්න යනකොට ස්වාමීනි එතන සිදුවීම්, මම කථා කරන්නම් ස්වාමීනි මට විනාඩි කිහිපයක් දෙන්න. මම ඒක, මොකද හේතුව මේකත් ජාතිවාදයේ එක කොටසක් නිසා, මේ ත්‍රස්තවාදයේ එක කොටසක් නිසා ස්වාමීනි. හෙට්ටිපොලින් යනකොට හෙට්ටිපොල මිනිස්සු තුන්සීයක් හාරසීයක් විතර ඉන්නවා ස්වාමීනි. ඊට පස්සේ අපේ වාහනයේ ඩිෆෙන්ඩර් එක එළවපු Driver හෙට්ටිපොල. එයාව අඳුර, වාහනවලට යන්න දෙන්නේ නැහැ ස්වාමීනි. ඒ ඩිෆෙන්ඩර් එක යන්න හදන, එයා කියනවා මම හෙට්ටිපොල කෙනෙක් කියලා එයාව අඳුර ගන්නවා එතන අය. ආ හා යන්න එපා ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. මේ මහහැරලා යන්න එපා කියලා ඔහුට යෝජනා කරනවා. ඔහු ඩිෆෙන්ඩර් එක ඉස්සරහට ගිහිල්ලා, ටිකක් ඉස්සරහට ගිහිල්ලා නවත්තලා නාමල් මම පොඩ්ඩක් බලලා එන්නම්. ඔයාලා ඔහොම්ම ඉන්න කියලා කිව්වා.

ප්‍ර : නාමල් කියලා කිව්වේ ඇයි ඩිෆෙන්ඩරයේ අයිතිකාරයා ඉදිද්දි?

පි : ඒ ඩිෆෙන්ඩර් එකේ ඒ ගිය එක්කෙනා මම අඳුරනවා ස්වාමීනි අසේල එන් රාජපක්ෂ කියලා. අසේල එන් රාජපක්ෂ ඒ, මේ සියළු දෙනා සම්බන්ධව මම දන්නවා ස්වාමීනි.

ප්‍ර : මොනවද දන්නේ?

පි : ඒගොල්ලෝ මොනවද කරන්නේ, ඒගොල්ලෝ මේ මේවාත් එක්ක කොයිතරම් සම්බන්ධතාවයක් තියෙනවද, කොයි කොයි විදියට මේ සමාජ පසුබිම නිර්මාණය වෙලා ඉන්නවද මේ හැම දෙයක්ම. එතකොට මම ඒකයි කිව්වේ ස්වාමීනි මේ ඔක්කොම දම්වැලක පුරුක් වගේ. කොතනින් හෝ සම්බන්ධතාවයක් තියෙන මිනිස්සු මේවගේ ඉන්නේ. ඊට පස්සේ ස්වාමීනි ඔහු බැහැලා යනකොට මම කිව්වා, මට දැනුණා ස්වාමීනි. මොකද හේතුව DIG නාලක සිල්වා මහත්තයා මෙතන ඉන්නවා. මම කමක් නැහැ කථා කළාට. එතුමා දන්නවා මහනුවර, දිගන, තෙල්දෙණිය ගැටුම සිද්ධ වුණ වෙලාවේ ඒක කොහොමද මැඩ පවත්වන්න අවශ්‍ය අදහස් මගෙන් ආවේ කියලා. එතුමා දන්නවා අපි සැළසුම කොහොමද දියත් කළේ කියලා.

ප්‍ර : ඔබ, මේ කවුද නාමල් කුමාර මහත්තමයා ඔක්කෝම පටලවන් නැතුව කියන්න?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ පිළිතුරු දෙන ආකාරයෙන් ඔබට වැටහුණාට අපට වැටහෙන්නත් ඕන.

FAIR COMMENT — BY JEZEEM —

ඔබගේ තලයටම නැති නිසා. අපි වින්දේ නැති දෙයක්නේ. ඉතිං ඒක හින්දා පැහැදිලිව, සරළව පිළිතුරු දෙන්න කියලා මම ඉතාමත් කරුණාවෙන් ඔබතුමාට නැවත මතක් කරලා දෙනවා?

පි : හොඳයි ස්වාමීනි කෙටි පිළිතුරු ලබා දෙන්නම්.

ප්‍ර : හා. දැන් කියන්නකෝ දැන් ඔන්න හෙට්ටිපොලනේ දැන් නැවතුනේ අපි?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : හෙට්ටිපොල නැවතිලා, ඩිෆෙන්ඩරයත් නැවතුණානේ?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඩිෆෙන්ඩරයේ Driver මහත්තයා කිව්වා නාමල් මම බැහැලා බලලා එන්නම් කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් අයිතිකාර සමන් පෙරේරා මහත්තයත් හිටියා කිව්වනේ ඒ ගමනේ?

පි : හිටියා ස්වාමීනි.

ප්‍ර : ඉතිං එසේ ඉදිද්දී ඇයි ඔබට කිව්වේ කියලා තමයි මම ප්‍රථමයෙන්ම ඇහුවේ?

පි : අසේල එන් රාජපක්ෂ එයාගේ නම.

ප්‍ර : ඔව්?

පි : අසේල රාජපක්ෂ මාවත් දන්නවා. හේතුව මම ස්වාමීනි මගේ මා දැන් ඔබතුමා ඉදිරිපත් කරපු තර්කය ඉතාමත්ම...,

ප්‍ර : තර්ක නෙමෙයි මේ මම තර්ක ඉදිරිපත් කරන්නේ නැහැ?

පි : යෝජනාව, ප්‍රශ්නය ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය ඉතාමත්ම නිවැරදියි. හේතුව මම ප්‍රශ්නයක් වෙලාවට කවදාකවත් පස්සට ගහලා ඉඳලා නැහැ. කථා කරන්න පුළුවන් හැමතැනම කථා කරලා තියෙනවා ස්වාමීනි. අසේල රාජපක්ෂ දන්නවා අනිවාර්යයෙන්ම වාහනයේ එක්කෙනෙක් හරි බැස්සානම් අනිවාර්යයෙන්ම මම එතනින් බහිනවා කියලා ස්වාමීනි. ඒ නිසා තමයි මට කිව්වේ නාමල් ඔයා ඉන්න. මම ගිහිල්ලා පොඩ්ඩක් බලලා එන්නම් කියලා.

ප්‍ර : ඒ කියන්නේ බැස්සොත් ලෙඩක් කියලද හිතුවේ ඔහු?

පි : බැස්සොත් ලෙඩක් නෙමෙයි ස්වාමීනි මම දැක්කොත් දෙයක් මගේ ඇහැට මේක ගැන මට බලන්න ඕන කියලා හිතුණොත් මම අනිවාර්යයෙන් බලනවා ස්වාමීනි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඩිෆෙන්ඩර් එකට නැග්ගේ කොහේ ඉඳන්ද?

පි : ඩිෆෙන්ඩර් එකට නැග්ගේ ස්වාමීනි කුරුණෑගලින්, සමන් පෙරේරාගේ ගෙදරින් නැග්ගේ ස්වාමීනි. අපි සමන් පෙරේරා...,

ප්‍ර : සමන් පෙරේරා, අසේල කියන්නේ තුෂාර පීරිස් එක්ක සම්බන්ධතා පැවැත් වූ පුද්ගලයින්?

පි : නැහැ සමන් පෙරේරා තුෂාර පීරිස් එක්ක සම්බන්ධතා පවත්වන්නේ නැහැ ස්වාමීනි. නමුත් අසේල එන් රාජපක්ෂ තුෂාර පීරිස් එක්ක සම්බන්ධතා පැවැත්වුවා ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධතාවයන් ඒ මාර්ගයෙන් තමයි ඔබත් ඒකට සම්බන්ධ වුණේ?

පි : නැහැ ස්වාමීනි දැන් මාව සම්බන්ධ කරන්නේ කපිතාන් අසේල ධර්මසිරි කියලා කෙනෙක්. කපිතාන් අසේල ධර්මසිරි තුෂාර පීරිස් එක්ක සම්බන්ධතා පවත්වනවා ස්වාමීනි. එතකොට ඔහු තමයි මාව එතනට සම්බන්ධ කරන්නේ. මම හෙට්ටිපොලදී වාහනයෙන් බහිනවා ස්වාමීනි. හෙට්ටිපොල ඒ ගිය ගමනේදී වාහනයෙන් මම හෙට්ටිපොලදී බහිනවා.

ප්‍ර : කුරුණෑගලින් කොහේ යන්නද ආවේ?

පි : කුරුණෑගලින් ස්වාමීනි ඔහු සමන් පෙරේරා මාත් එක්ක කිව්වේ උදේ අපි ගාල්ලේ යමු කියලා. ගාල්ලේ සුමංගල පුෂ්ප කුමාර කියලා කෙනෙක් හම්බ වෙන්න යමු කියලා කිව්වේ. නමුත් ඒ හවස, ඒ උදේ ඒ විදියට කිව්වට යනකොට මම කිව්වා එහෙනම් අපි ගමට ගිහිල්ලා, ගමේ පන්සලටත් ගිහිල්ලා ගොඩ වෙලා යමු කියලා. නැහැ අපිට තව කෙනෙක් ඉන්නවා හම්බ වෙන්න ආරච්චිකට්ටුවේ අපි මේ පැත්තන් යමු කියලා යෝජනාවක් කළා. මම කිව්වා හරි කොහෙන් හරි කමක් නැහැ යමු කියලා ස්වාමීනි. අපි ඒ ගමන ආරච්චිකට්ටුවේ ඒ ඔවුන්ගේ තියෙන ගොඩක් දුර්වලතා තිබුණා ස්වාමීනි. ඔහු ගිහිල්ලා තියෙන්නේ ආරච්චිකට්ටුවේ හම්බ වෙන්න කියලා ගියාට දන්නේවත් නැති කෙනෙක්ව තමයි හම්බ වෙන්න ගිහිල්ලා තියෙන්නේ. මේ Phoneවලින් Contacts වෙලා ඒ විදියට සම්බන්ධතාවයක් හදාගෙන මේ එහෙම කෙනෙක්ව තමයි මේ හම්බ වෙන්න ගිහිල්ලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ හෙට්ටිපොලට යනකොට කවුරු කවුරුද හිටියේ? ඔබ හිටියා?

පි : සමන් පෙරේරා හිටියා.

Presidential Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : සමන් පෙරේරා?

පි : අසේල රාජපක්ෂ හිටියා.

ප්‍ර : අසේල ඒ තමයි රියදුරා නේ?

පි : ඔව් අසේල රාජපක්ෂ රියදුරා. ඊට පස්සේ අපිත් එක්ක අසේල ධර්මසිරි ගියා. ඔව් අපි...,

ප්‍ර : දැන් අසේල ධර්මසිරි තමයි සම්බන්ධ ඔබට අනුව මේ තුෂාර පීරිස්ට?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහොමද ඒ දෙන්නා සම්බන්ධ කියලා ඔබ දන්නේ, මොකද්ද තියෙන සාක්ෂිය කියලා මේ ගරු සභාවට කියන්න?

පි : ස්වාමීනි සාක්ෂි අපි බලනවා නම් අපේ ත්‍රස්ත විමර්ශන දිශාවේ තියෙන හඬ පටි ටික ගන්න වෙනවා ස්වාමීනි. මට සාක්ෂි කියන්නේ ස්වාමීනි දැන් මම අවස්ථා කිහිපයකම අපි දැන් එහෙට මෙහෙට මම කථා කරනවා ස්වාමීනි. දැන් තුෂාර පීරිස් මට කියනවා අසේල මට අද කථා කළා. මම අහනවා මොනවද කථා කළේ. නැහැ මේ අම්පාරේ නඩුව ගැන කථා කළා. මේ අර අම්පාරේ කඩයක් කුඩු කරපු එක, වඳ පෙති තියෙනවා කියලා ඉවර වෙලා කඩයක් කුඩු එහෙම කථා කළා කියලා එහෙම කියනවා ස්වාමීනි. එතකොට මම අනිත් පැත්තට මම අසේලට කථා කරලා කියනවා අසේල මොකද තත්ත්වය, මේ දවස්වල මොකද වෙන්නේ, අපේ යාළුවා එහෙම කථා කළේ නැද්ද, තුෂාරලා කථා කළේ නැහැ. ඒ විදියට කථා කරලා අහනවා ස්වාමීනි. එතකොට කියනවා මේ කථා කළා, උදේ කථා කළා, මෙන්න මේවා මේවා කථා කළා, මෙහෙම මෙහෙම කිව්වා ඉතිං මිනිහා මෙහෙම මෙහෙම වචන ටිකක් කිව්වා. එහෙම කියලා කියනවා ස්වාමීනි. එතකොට මට සනාථයි ස්වාමීනි. මොකද හේතුව මට අර පැත්තෙන් ලැබෙන දේ මම තව පැත්තකින් තහවුරු කර ගන්න හොයනවනේ ස්වාමීනි.

ප්‍ර : ඔව් ඇත්ත. ඔබ ඇත්ත වශයෙන්ම ඔබ දක්ෂ විමර්ශකයෙක්. නමුත් ඔබ මින් පෙර මම අහපු ප්‍රශ්නයකට කිව්වනේ තුෂාර පීරිස් එක්ක සම්බන්ධ අය දන්නේ නැහැ කියලා?

පි : සම්බන්ධ අය කියන්නේ ස්වාමීනි ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ අය.

ප්‍ර : ආ රයිට් රයිට්. මේ තුෂාර පීරිස් නම් කිව්වේ අසේල ගැන කිව්වා?

පි : ස්වාමීනි තව නම් කියපු අය ඉන්නවා ඕන තරම්. ඒ අය සංවිධානය, මේ ප්‍රහාරාත්මක මරාගෙන මැරෙන තුෂාර පීරිස් කථා කරන්නේ ප්‍රහාර මාලාවක් දියත් කරන්නනේ ස්වාමීනි. මේ ප්‍රහාර

FAIR COMMENT — BY JEZEEM —

මාලාව දියත් කිරීමට ඒ සැලැස්මේ ඉන්නවද කියලා මම කවුද කියන්න දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඇහුවේ වක්වත් නැද්ද දැන් අසේල ධර්මසිරි කිව්වේ ඔබට අනුව යුධ හමුදාවේ සිටි පුද්ගලයෙක් කියලා?

පි : ඔව් එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කැප්ටන් කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේ චරිතයක් ඉන්නකොට ඒ කියන්නේ යුධ පුහුණුව ලබපු, වෙඩික්කරුවෙක්, පුපුරණ ද්‍රව්‍ය ගැන විශේෂඥයෙක් වෙන්න පුළුවන්. හදිස්සියකට පුපුරණ ද්‍රව්‍යයක් හදා ගන්න හැකි මේ වගේ චරිතයක් ඉදිද්දී ඇයි ඔබව මේ සඳහා යොදා ගන්නේ කියන ප්‍රශ්නය ඔබ කවදාකවත් තුෂාර පීරිස්ගෙන් අසා සිටියේ නැද්ද?

පි : ස්වාමීනි මම මුලින්ම ඒක පිළිබඳව ප්‍රකාශ කළා. මම ස්වේච්ඡාවෙන් නැගී සිටි පුද්ගලයෙක්. තුෂාර පීරිස් මම ගැන හෙව්වා. ඒ මම කරන කැප කිරීම් ආමි, සමහරවිට යුධ හමුදාවට කරන අපහාසයක් නෙමෙයි මම. යුධ හමුදාවේ කපිතාන්, එක එක්කෙනා එක එක පුද්ගලයාගේ හැටියට ස්වාමීනි ඒ පුද්ගලයා කරන වැඩත් එක්ක තීරණය කරලා තමයි තුෂාර පීරිස් ඔහුගේ ළඟම කෙනා විදියට, මොකද හේතුව දැන් අසේලලාට වචනයක්, අසේලලා හොයන මිනිස්සු නෙමෙයිනේ ස්වාමීනි. ඒ අසේලලා කියන්නේ එයත් එක්ක සම්බන්ධ මොනවා හරි කටේ වචනය හංගගෙන කථා කරන මිනිස්සු. මොනවා හරි කථා කරන්න තියෙනවා නම්, සැලැස්මක් කරන්න තියෙනවා නම් මොනවා හරි හංගගෙන දුරස්භාවයක් තියාගෙන කථා කරන මිනිස්සු. නමුත් මම හොයන කෙනෙක්. මම කරන්නේ එතනින් එක වචනයක් ආපු ගමන් මම වචන දහයක් කියනවා ස්වාමීනි. දහයක් කියලා...,

ප්‍ර : ඔව් කියන්න?

පි : ඒ විශ්වාසය ඒක ඒ මට්ටමට තුෂාර පීරිස් එක්ක ගොඩ නැගුණට පස්සේ තමයි තුෂාර පීරිස් හැමදේම මාත් එක්ක, මටත් වුවමනා වුණේ ස්වාමීනි මටත් එතනට නිර්මාණය වෙන්න වුවමනා වුණා. නැත්නම් මොකද හේතුව මට ඒ කිසිම දෙයක් ගන්න බැරි වෙනවා ස්වාමීනි. මම දන්නවා අසේලලත් එක්ක ත්‍රස්තවාදී සැළසුම් කථා කරලා නැතුව ඇති. හැබැයි අසේලලත් එක්ක ගොඩක් සැළසුම් කථා කරලා ඇති කියලා මම අදහස් කරනවා ස්වාමීනි. සැළසුම් කියන්නේ ත්‍රස්තවාදී දේවල් නෙමෙයි. මෙහෙම වෙන්න ඕන, අරෙහෙම කරන්න ඕන, රට ඇතුළේ මේ වගේ දේවල් වෙන්න

FAIR COMMENT BY JEZEEM

ඕන. අන්න ඒ වගේ දේවල් අසේලලත් එක්ක තුෂාර පීරිස් කථා කරලා ඇති. හැබැයි ත්‍රස්තවාදී කටයුතු බෝම්බ පුපුරවන්න ඕන මෙන්න මේ වගේ දේවල් අසේලත් එක්ක කථා කරලා මම හිතන්නේ නැතුව ඇති.

ප්‍ර : හරි. අපි ඔය ඔබතුමා කියපු සමහර දේවල් මේ වෙනකොට අත් දකිමින් තියෙනවා. අර එකක් කිව්වම ගොඩක් වචන දහයක් කියනවා එක කියන වගේ ඒවා. මම නාමල් කුමාර මහත්තයාගෙන් අහන්නේ දැන් අසේල ධර්මසිරි අර අම්පාරේ අර කඩ කඩපු එකට සම්බන්ධයි කිව්වනේ?

පි : මම කිව්වේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එහෙනම් මොකද්ද, නැහැ අර වඳ පෙති සිද්ධියට?

පි : ඒකටත් සම්බන්ධ නැහැ ස්වාමීනි.

ප්‍ර : එහෙනම් මොකද්ද නාමල් පීරිස් කිව්වේ ඔබට අර අම්පාරේ සිද්ධියක් ගැන කියලා?

පි : අම්පාරේ සිද්ධියක් පිළිබඳව ස්වාමීනි කථා කළේ අම්පාරේ වඳ පෙති සම්බන්ධව ගැටළුවක් කියලා අම්පාරේ හිටපු නගරාධිපතිවරයා ඇතුළු පිරිසක් කඩයක් කැඩීම සම්බන්ධව අධිකරණයේ නඩුවක් යනවා ස්වාමීනි. ඒ නඩුව සම්බන්ධව අසේල ධර්මසිරිලා නීතිඥවරු හොයා ගන්න ඒ කථා කරලා තිබුණා තුෂාර පීරිස් එක්කත් ඒ පිළිබඳව සාකච්ඡා කරලා තිබුණා ස්වාමීනි. මම ඒක උදාහරණයක් ගෙන පෙන්නුවේ ස්වාමීනි යම්කිසි දෙයක් කථා කරනකොට, සිදුවීමක් කිව්වම මම ඒ සිදුවීම දැන් වඳ පෙති සිද්ධිය සම්බන්ධව, ඔය සම්බන්ධව තුෂාර පීරිස් එක්ක මට මතකයි අසේල ධර්මසිරි කථා කළා ඔය කඩය සම්බන්ධව. ඒ කථා කරපු වෙලාවේ මට තුෂාර කිව්වා මේකට Lawyersලා අසේලලා ගෙනියනවා කියලා කිව්වා. ප්‍රශ්නයක් නැහැ නාමල් එතන වැඩේ යනවා කියලා එහෙම කථාවක් කිව්වා. ඒ කියන එකත් එක්ක ස්වාමීනි මම අනිත් පැත්තට මම කිව්වේ මම අනිත් පැත්තට අසේලට කථා කරලා ඇහුවා මොකද අර වැඩේට Lawyersලා ඕගොල්ලොන්ට ඉන්නවද, කොහොමද. අපේ තුෂාරලා එහෙම කථා කළේ නැද්ද. මේ වගේ අන්න ඒකයි ඇහුවේ ස්වාමීනි. ඒ පිළිබඳව එහෙමයි කථා කළේ ස්වාමීනි.

දැන් වේලාව : ප.ව.3.10
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

FAIR COMMENT — BY JEZEEM

වේලාව: ප.ව 3.10
පෙර සටහන්: ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට : ල/ලේ වන්දිමා දිල්හානි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: කොතන ද ඔය?

පි: හෙට්ටිපොල පොලීසියම ඉස්සරහා ස්වාමීනි හරියටම පොලිසිය ඉස්සරහ එතන මිනිස්සු ලොකු පිරිසක් හිටියා 200 ක් 300 විතර ඒ මිනිස්සු ඔක්කෝම නාමල් කුමාර ආවා කියලා මෙහෙම වට කර ගත්තා ස්වාමීනි. මේක මේ දැන් ඒක ස්වාමිනි මං දන්නේ නැහැ ඒක කොහොම වුණාද කියලා මිනිස්සු ඔක්කෝම වට කර ගෙන මොකක් ද ඇයි ඇයි දැන් මොකක්ද දැන් මාව වට කර මට ගහන්න වගේ තමයි මාව වට කර ගත්තා වටකර ගෙන. මං ඇහුවා මොකක් ද ප්‍රශ්නේ ඇයි දැන් මොකක්ද කියලා ඊට පස්සේ කිව්වා අපේ මිනිස්සු හතර දෙනෙක් අත්අඩංගුවට අරගෙන ඉන්නවා ඒ අත්අඩංගුවට ගත්තු මිනිස්සු නිදහස් කරේ නැත්නම් අපි දැන් පොලිසිය කුඩු කරනවා කියලා කිව්වා එතකොට ස්වාමිනි හාමුදුරුවෝ නමක් වැඩියා.

ප්‍ර: පොලීසිය කුඩු කරන්න හදන කොට ඇයි ඔබව කුඩු කරන්න හැදුවේ ඒ ගොල්ලෝ?

පි: මට එහෙම ගහන්න හැදුවේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔව්?

පි: මං කිව්වේ මාව වටකරගත්තා කියලා විතරයි ස්වාමීනි

ප්‍ර: හරි මට සාමාවෙන්න මට ඇහුනේ ඔබට ගහන්න හැදුවා කියලා?

පි: ස්වාමීනි ඊට පස්සේ මිනිස්සුගෙන් මං ඇහුවා ඇයි දැන් මොකක්ද ප්‍රශ්නේ කියලා ඊට පස්සේ මිනිස්සු කිව්වා අපේ 4 දෙනෙක් ඊයේ රෑ අත්අඩංගුවට අරගෙන තියෙනවා මේ කුඩුවට දාලා තියෙනවා. මේ අය දුන්නේ නැත්නම් පොලීය අපි කුඩු කරනවා කියලා. එහෙම කියන කොට ස්වාමීනී

ප්‍ර: දැන් ඔබව එතන සිටි පුද්ගලයෝ හඳුනා ගත්තද?

පි: නැත ස්වාමිනි. නාමල් කුමාර කියලා හඳුනනවා මම ඒ එක්කෙනෙක්වත් හඳුනන්නේ නැහැ පුද්ගලිකව හඳුනන කවුරුත් නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ ගොල්ලෝ ඔබව හඳුනා ගත්තාද?

පි: හඳුනා ගත්තා ස්වාමීනි

ප්‍ර: ඒ හඳුනා ගත්ත ඒ ඊට පස්සේ තමයි ඔබ කියන්නේ ඔබ වට කරගත්තා කියලා?

පි: ඔව්

ප්‍ර: ඊට පස්සේ ඔබ මොකද කියා සිටියේ වට කරගත්තාට පස්සේ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඊට පස්සෙ මං ඇහුවා ඇයි දැන් මට වෙන්න යන දේ නම් මට තේරුණා ස්වාමිනි. ඒක මං මෙතන කියන්න ඕනේ ඉතා වගකීමෙන් වෙන්න යන දේ මට හිතුණා

ප්‍ර: මොකක්ද?

පි: මට දැණුනා අනිවාර්යෙන්ම දැන් මෙතන මොකක් හරි ප්‍රශ්නයක් වෙනවමයි කියලා මොකද හේතුව ඔවැනි සිදුවීම්වලට අපි දැන් මුහුණ දීලා තියෙනවානේ ස්වාමීනි මගේ අත්දැකීම්වල ඕක තියෙනවා. ඒ නිසා මං දැන ගත්තා දැන් අනිවාර්යෙන් මෙතන මොකක් හරි එකක් වෙනවාමයි මං කිව්වා කලබල වෙන්න එපා කවුරුත් කෑගහන්න එපා එක්කෙනෙක් කියන්න මොකක්ද ප්‍රශ්නේ ඊට පස්සේ කිව්වා මෙහෙම ප්‍රශ්නයක් වෙලා තියෙනවා කියලා එක්කෙනෙක් ඉස්සරහට ඇවිල්ලා හාමුරුවෝ නමකුත් අවා බලන්න මහත්මයා මෙහෙම කරන්න බැහැනේ මං කිව්වා ඒක තමයි හාමුදුරුවනේ කරන්න බැහැ කියලා ඉවර වෙලා වැන්දා වැඳලා ඉවර වෙලා මං ඇහුවා හාමුදුරුවනේ මොකක්ද දැන් වෙන්න ඕනේ කියලා. ඊට පස්සේ කිව්වා මේ බලන්නකෝ මෙහෙම මෙහෙම මේ ඔක්කෝටම කෑගහන්නේ නැතිව ඉන්න කියන්නකෝ පළවෙනි එක තමයි ප්‍රශ්නය සාකච්ඡා කරන එක සාකච්ඡා කරේ නැහැනේ ඔය ගොල්ලෝ ඇහුවද මොකක්ද වෙලා තියෙන්නේ කියලා

ප්‍ර: දැන් ඔබට වීඩියෝ පටයක් පෙන්වනවා **C 1479 සාක්ෂිකරුට පෙන්වා සිටියි**. සාක්ෂිකරු මෙම C 1479 ඔබ සිටියද?

පි: ඉන්නවා ස්වාමිනි.

ප්‍ර: එහි ඔබට පෙනෙනවා මෙම කොමිසන් සභාවේ සාක්ෂිදීපු දයාසිරි ජයසේකර කියන මන්ත්‍රීවරයත් සිටිනවද?

පි: ඉන්නවා ස්වාමීනි.

ප්‍ර: ඔහු පැහැදිලි නැති නමුත් රැවුලක් සහිත නිල්පාට හෝ කළු පාට ඉරි තිබෙන කමිසයක් ඇඳගෙන සිටින පුද්ගලයෙකුට කථා කරනවා හරිද පේනවද?

පි: නැවත පරීක්ෂා කරන්න

ප්‍ර: මෙන්න මේ මං පොයින්ටරය තියෙන්නේ?

පි: එහෙමයි ස්වාමීනි

ප්‍ර: ඒ කවුද කියලා ඔබට කියන්නට ඔබට හැකිද?

පි: ඒ ඉන්නේ මම ස්වාමිනි.

ප්‍ර: ඒ ඔබ හරි දැන් හරි සාක්ෂිකරු මේ ඔබ සමඟ කථා කරන්නේ මන්ත්‍රීවරයා ඔබට කියනවා මොකක්ද ඒ කියන්නේ?

පි: ඔය ඉන්න මේක මගේ ආසනය මං මේක බලා ගන්නම් කියනවා ස්වාමිනි

ප්‍ර: ඔබ ගිහිල්ලා මන්ත්‍රීවරයාට මොකක්ද කිව්වේ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමීනි ඔය මන්ත්‍රිවරයා එන්නේ මං පොලීසියටත් ගිහිල්ලා එළියට ආවට පස්සේ ස්වාමීනි මම අවශ්‍ය නම් පැහැදිලි කරන්නම් ස්වාමීනි

ප්‍ර: මොකක්ද වුණේ කියල කියන්න?

පි: ස්වාමීනි මම ගියායින් පස්සේ මිනිස්සු ටික වට කරගත්තාට පස්සේ මිනිස්සු අර වගේ ප්‍රකාශයක් කරාට පස්සේ මම කියනවා කලබල වෙන්න එපා කිසිම දෙයකට කලබල වෙන්න එපා කවුරුත් ප්‍රශ්නයක් ඇති කර ගන්න කිසිම අවශ්‍ය තාවයක් නැහැ ඔය ගොල්ලෝ දැන් කථා කරලා බලලා මොකද කරේ කියලා ඊට පස්සේ කථා කරේත් නැහැ කථා කරේ ඒ වෙන කොට ස්වාමීනි මිනිස්සු පොලිසියත් එක්ක කථා කරලාවත් නැහැ ඒ මිනිස්සුන්ගේ එකම Plan එක තියෙන්නේ පොලීසියට ගහන එක ස්වාමීනි වෙන මොනවත් නෙමේ පොලීසියට ගහන එක එකම Plan එක තියෙන්නේ ගහන්න ඊට පස්සේ මං කිව්වා කිසිම කෙනෙක් කලබලන වෙන්න එපා හාමුරුවොත් මං කිව්වා හාමුදුරුවෝ ඔබ වහන්සේ වඩින්න තව එක්කෙනෙක් කවුරු හරි එන්න කියලා පිරිමි කෙනෙක් ඊට පස්සේ OIC මහත්මයා ළඟට ගියාට පස්සේ ස්වාමීනි OIC මහත්මයා දැක්ක ගමන් අඳුර ගත්තා හාමුදුරුවන්ට වාඩිවෙන්න මේ ආසනය හඳලා දුන්නා ඒ අසුන් ගන්න ආසනය හදලා දීලා ඉවරවෙලා ඒ අවශ්‍ය කටයුතු කරලා OIC මහත්මයා මම අහන්න ගියෙත් නැහැ මට කිව්වා මං දන්නවා මොකක්ද කාරණය කියලා මහත්තයා DIG මහත්මයාත් එක්ක සාකච්ඡාවක් තියෙන්නේ මේ වෙලාවේ කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ මේකට අවශ්‍ය කටයුතු කරෙයි හාමදුරුවනේ කලබල වෙන්න එපා අපි සාකච්ඡා කරලා අපි ඒ ප්‍රශ්නය විසඳලා දෙන්නම් කියලා ස්ථානාධිපතිතුමා බොහෝම නිහත මානි විදියට ඒ අයට පිළිතුරු ලබා දුන්නා ඒ වෙලාවේ ස්වාමීනි හාමුදුරුවොත් ඇතුලේම ඉද්දි මං කිව්වා හාමුදුරුවනේ මෙන්න මෙහෙම විසඳන්න තියෙන ප්‍රශ්න තමයි අර මිනිස්සු අර ගහගෙන කරගෙන විසඳන්න හදන්නේ ඒක නෙමෙයි කරෙන්න ඕනේ මේක කියලා ඉවර වෙලා OIC මහත්මයා ළඟම ඉද්දින් ස්වාමීනි OIC මහත්මයා ළඟ ඉද්දි මම යනවා මං හදිසි ගමනක් යන ගමන් බැස්සේ මොකද මිනිස්සු ඉන්න නිසා බැස්සේ ප්‍රශ්න ඇති කර ගන්න එපා අපේ හාමුදුරුවනේ කියලා කිව්වම මගේ පෝන් නම්බර් එකත් හාමුදරුවෝ ඉල්ලගත්තා එතන පොලිසියට ගිය අනිත් එක්කෙනා මගේ phone number එකත් ඉල්ල ගත්තා මොනවාහරි තිබ්බොත් මහත්මයා කෝල් එකක් දෙන්නම් එහෙනම් අපි කෝල් එකක් දෙන්නම් කියලා නම්බරය ඉල්ලුවා මං කිව්වා හරි කෝල එකක් දෙන්න මොනවා හරි තිබ්බොත් ඕන දෙයකට කතා කරන්න කිසි ප්‍රශ්නයක් නැහැ කියලා පෝන් නම්බර් එකත් දීලා මම එළියට එන්න එනවා ස්වාමීනි එළියට එන්න එනකොට ඔය ඔතන ඉන්න මිනිස්සු ටික බලා ගෙන ඉන්නවා

FAIR COMMENT BY JEZEEM

දැන් මේ පොලීසිය ඇතුලට ගිය මනුෂ්‍යයෝ ගේන පිළිතුර මොකක්ද කියලා ඒ ගොල්ලන්ගේ නියෝජිතියෝ දෙන්නා ඇතුලේ මං විතරයි එළියට එන්නේ මං එළියට එනකොට මිනිස්සු ටික ඔක්කෝම මාව වට කර ගත්තා ඔතන මාත් එක්ක පොලීසයට ගිය දෙන්නාගෙන් එක්කෙනෙක්වත් නැහැ ස්වාමීනි ඔය වීඩියෝ එකේ කට්ටිය පොලීසිය ඇතුලේ මගේ මේ ප්‍රශ්නය ඉවරයි දැන් මේ දැන් යන්න යන්නේ ස්වාමීනි එළියට ආවාම මිනිස්සු වට කර ගෙන ඉන්නවා දායසිරි ජයසේකර මන්ත්‍රිවරයා දුර වාහනය නවත්වලා එනවා ස්වාමීනි ආවට පස්සේ මං ආයුබෝවන් මන්ත්‍රිතුමා කියලත් කියනවා ඒක ඔය වීඩියෝ එකේ නැහැ ඒක මොකද දන්නේ නැහැ නැති හේතුව කොහොමද දන්නේ නැහැ එහෙම කියනවා ස්වාමීනි ඒ කිව්වාට පස්සේ ඇවිල්ලා අර මිනිස්සුත් එක්ක තමයි කථා කරන්න පටන් ගන්නේ කථා කරාට පස්සේ හරි දැන් අපි මේ විදියට කරමු කියලා දයා සිරි ජයසේකර මන්ත්‍රිවරයා කියනවා

ප්‍ර: මොකක් කොහොම කරමු කියලද?

පි: අපි මේක කථා කරලා ශේප් කරලා ඔයගොල්ලෝ කලබල වෙන්න එපා මෙහෙම දගලන්න කරන්න යන්න එපා ඇයි දැන් මේ මිනිස්සු මාව වට කරගෙන එහෙම බැහැ දැන් මම එළියට ඇවිල්ලා කිව්වා ප්‍රශ්නයක් නැහැ මේ මිනිස්සුන්ට ඇප හම්බෙනවා කියලා මිනිස්සුන්ගේ තියෙන නූගත් කම හෝ එක්කෝ සංවිධානාත්මක කැරලි ගැසීමේ ක්‍රමවේදය ස්වාමීනි මිනිස්සු ගැන ඇප දීලා හරියන්නේ නැහැ. නිදහදස් කරන්න ඕනේ කියලා කියනවා ස්වාමීනි. නිදහස් කරේ නැත්නම් ඇප දීලා හරිය න්නේ නැහැ. නිදහස් කරන්න ඕනේ කියලා කියනවා

ස්වාමීනි කියලා කියනවා ඒ වගේ පුහු තර්ක ඉදිරිපත් ඒ වගේ මෙතන මම දැකපු බොහොම පහත් විදියට හැසිරිච්චි මිනිස්සු කොටඨාශයක් හිටියේ ස්වාමීනි ඔතන ඒ ඉදලා ඒ මිනිස්සු මත තමයි මං ඔය ඉන්නේ ඉන්න ගමන් තමයි දයාසිරි ජයසේකර මන්ත්‍රිවරයා ඇවිල්ලා අර මිනිස්සුත් එක්ක කථා කරන්නේ එහි කථා කරලා මම කියනවා මන්ත්‍රිතුමා මාත් පොලිසිය ඇතුලට ගිහිල්ලා කථා කරා මම දැන් මේ මට අවශ්‍යතාවය තිබුණේ ස්වාමීනී මමත් දැන් ගිහිල්ලා කථා කරා මම යන්න යන්නේ කියලා කියන්න ඒ වචනය විතරයි මං කිව්වේ මාත් දැන් ගිහිල්ලා කථා කරා පොලීසියට ඔයා පැත්තකට වෙලා ඉන්න මේක මගේ ආසනය මෙන්න මෙහෙම ස්වාමීනි මම ගොඩාක් කනගාටු වෙනවා මගේ ජීවිතයේ අවධානම පැත්තකට දාලා මුස්ලිම් පල්ලිවලට බෝම්බ ගහන්න ඉන්න කොට මුස්ලිම් ඇමතිවරු මරන්න ඉන්නකොට ඒකට විරුද්ධව ක්‍රියාත්මක වෙච්චි මට මේ ලංකාවේ මොහොමඩ් කියලා නමක් දාලා නාලක සිල්වා මහත්මයා දන්නවා මට විරුද්ධව ආපු සිංහල තරුණයන්ගේ ආපු තර්ජන කොච්චරද කියලා මට මොහොමඩ් කියලා නමක් දාලා තර්ජනය කරේ ස්වාමීනි එහෙම කරපු මට මම මේවා

FAIR COMMENT BY JEZEEM

දන්නවා දන්න නිසා තමයි අතන ඇතුලට ගිහිල්ලා කථා කරලා මට ඕන වුණේ මාත් ගියා ඇතුලට මං යනවා මන්ත්‍රිතුමා මෙතන ප්‍රශ්නයක් වෙන්න පුළුවන් ඔන්න ඔය ටික කියන්න තමයි මට උවමනාව තිබ්බේ ඒක බලන්න කියලා ඒ ටික කියා ගන්න උවමනාවක් වුන් නැහැ මම යම් කිසි හෙලිදරව්වක් කලා තමයි ඒ හෙළිදරව්ව කලේ දයාසිරි ජයසේකර මන්ත්‍රිවරයාගේ ස්වාමීනි සභාපතිවරයා පිළිබඳව එහෙම කරපු මට එතන කථා කරන්නේ දේශපාලන වාසියක් බලාපොරොත්තු වුණා ද කියලා කියන්න මං දන්නේ නැහැ ස්වාමීනි. මට කථා කරන්නේ තමුසේ ඉන්නවා මේක මගේ බල ප්‍රදේශය මං මේක බලා ගන්නනම් කියලා ස්වාමීනි ඒත් මම ඊට පස්සේත් මම ශ්‍රී ලංකාවේ පොලීසියේ නියෝජ්‍ය පොලිස්පතිවරු ඇතුළු විශාල ප්‍රමාණයක් මාධ්‍යවේදීන් ඇතුළු ගොඩක් දෙනා ඉන්න Whats App group එකක් තිබුණා ලොකු ඒකේ ලොකුවටම අන්තවාදී පිළිබඳව ඒ දවස්වල අපි කථා කලා මම එතනදීත් එළියට ඇවිල්ලා මම ඒකට මම මගේ හඬපටයක් නිකුත් කරනවා මම මෙන්න මෙහෙම ගමනක් ගියා මෙන්න මෙතන දායසිරි ජයසේකර මන්ත්‍රිවරයත් ආවා මෙන්න මේ වගේ කථා වක් කිව්වා මේ කියන විදියට නම් මේ මිනිස්සු අනිවාරියෙන් මොකක් හරි දෙයක් වැඩක් කරන්න බැරි නෑ මෙතන මොකක් හරි වෙන්නත් ඉඩ තියෙනවා කියලා මම ඒ විදියේ හඬපටයකුත් නිකුත් කරා ස්වාමීනි. ඉතින් ඔන්න ඔය වගේ දෙයක් තමයි ඔතන කථා වුණේ ස්වාමීනි.

ප්‍ර: ඔබට ඒ අර දුරකථන අංක ලබා ගත්ත පුද්ගලයන් සහ ස්වාමීන් වහන්සේ ඔබව පසුව සම්බන්ධ කර ගත්තද?

පි: සම්බන්ධ කර ගත්තා ස්වාමීනි.

ප්‍ර: මොකක්ද කියා සිටියේ?

පි: මට දවල් කොහොමත් 2.30 ට වගේ මට කථා කරා ඒ වෙනකොට මං මීගමුවේ ස්වාමීනි කථා කරලා කිව්වා මෙහෙමයි මෙහෙ ගහගන්නවා මං ඇහුවා මොකක්ද වෙන්නේ මට හරියට කියන්න දයාසිරි ජයසේකර ආවා ඇවිල්ලා ඉවරවෙලා කොල්ලෝ ටිකත් වාහනයට දාගෙන අනිත් පොලීසියට අරන් යන්න ගියා ඒ යන කොට (සමාවෙන්න) අපේ කොල්ලොත් තරහ ගිහිල්ලා පොලුඅරගෙන මුස්ලිම් කඩවලටයි ඒවාට මේවාට ගැහුවා අයියා මං ඇහුවා මොකද වෙන්නේ ස්වාමීනි මේක තමයි සත්‍ය දේ මං ඇහුවා ඔයා සම්බන්ධද ඊට පස්සේ කිව්වා මං සම්බන්ධ නැහැ කිව්වා මං කිව්වා නෑ සම්බන්ධ නැතිනම් දැන්ම ගිහිල්ලා ගෙදරට ගිහිල්ලා පාඩුවේ ගෙදරට වෙලා ඉන්න කිසිම දෙයකට සම්බන්ධ වෙන්න එපා ඔය ඔක්කෝම අත්අඩංගුවට ගන්නවා කියලා මම ඔහුට ඒ වෙලාවේ ප්‍රකාශ කරා ස්වාමීනි. මම කිව්වා ඕකේ CCTV කැමරා බලනවා ඊට අමතරව ඇසින් දුටු සාක්ෂි ගන්නවා ඕක ලොකු ප්‍රශ්නයක් ඔය දේපල අලාභ හානි කිරීම පොදු දේපල නඩුවක් ඕකට වැටෙනවා ඔය

FAIR COMMENT BY JEZEEM

ගොල්ලන්ට ICCPR app එකෙන් ඕකට නඩු වැටෙනවා ඒ නිසා ඔයගොල්ලෝ ඕකට සම්බන්ධවෙලා නම් දැන් කරන්න දෙයක් නැහැ සම්බන්ධ නැතිනම් දැන් හොදම දේ ගෙදරට ගිහිල්ලා පාඩුවේ තමන්ගේ පාඩුවේ ඉන්න එක ඇයි ඒ වගේ පුහුණු දෙයක් වෙන්න දුන්නේ කියලා ඇහුවම කිව්වා දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා පොල්ලක් අරන් ගහන්න ගියා අපේ උන් උන්ට ගැහුවා ඔහොම ඔහොම කියලා කථාවක් කිව්වා ස්වාමීනී. මේ ඊයේ පෙරේදා මාව මාධ්‍යයෙන් දැකලා නැවත කථා කරලා කිව්වා ඔයා එළියට ආවාද කියලා ඇහුවා.

ප්‍ර: කවුද?

පි: ඒ කථා කරපු කෙනා ස්වාමීනි.නාරම්මල කියලා කිව්වා මං phone number එකත් සටහන් කර ගත්තා මං කිව්වා කථා කරපු දෙය ලොකු දෙයක් මටත් මේ සාක්ෂියක් ඕන වෙලා තිබ්බේ එදා ඔතන මොකක්ද වුණේ කියලා ඒ නිසා අවශ්‍ය වුණොත් සාක්ෂි දෙන්න සුදානම්ද කියලා ඇහුවා මං වෙනුවෙන් කියලා ඇහුවා මං ඊට පස්සේ කිව්වා පුළුවන් කියලා දැන් ඔයා හිතන්නේ මං මේකට සම්බන්ධද නැද්ද මොකක්ද කියන්නකෝ ඔකේ කියලා මං හඬපටයකුත් ගත්තා ඒක මට අවශ්‍ය නැහැ කියලා මොකද දැන් පුද්ගලයා ඉන්නවානේ පුද්ගලයා කැමතියිනේ ඉදිරිපත් වෙන්න ඒ නිසා මම හඬපටය අයින් කරලා දැම්මා පෝන් එකෙන් මේ මං ගැන මොනවද හිතෙන්නේ කවුද ඕක කරේ කියලා ඇහුවාම පස්සේ කිව්වා ඒවා වැඩක් නැහැ කථා කරලා අයියා මේ ඔයා සම්බන්ධ නෑ කියලා නම් අපි දන්නවා අයියා කියලා ඒ මනුෂ්‍යයම මට කිව්වා ඔන්න ඔය වගේ සිදුවීමක් තමයි එතැන වුණේ

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට වැටහිච්චි විදියට එදා හෙට්ටිපොල , බිංගිරිය ඔය සිද්ධීන් ඇතිවුණේ කුමන කල්ලියක් හෝ කුමන කණ්ඩායමක් පිටිපස්සේ ඉඳගෙනද?

පි: ස්වාමීනි මම දන්න විදියට ගොඩාක් වෙලාවට මිනිස්සු ඔවා දේශපාලනයට තල්ලු කරන්න උත්සහ කරනවා නමුත් මම දන්න දෙය මම මේ ගරු කොමිෂමට වගකීමෙන් කියනවා ඔවැනි සිදුවීමක් දේශපලනයේ ඕක සම්බන්ධ වෙන්න ඕනේ නැහැ ස්වාමීනි ඔවැනි සිදුවීමෙන් දැන් ඕක පාස්කු ප්‍රහාරය වෙච්ච ගමන මට නම් දැනුණා අනිවාර්යෙන්ම කොහේ කොහේ හරි අනිවාර්යෙන්ම දැන් ඇවිල්ලා සිදුවීම් කීපයක් සිදුවෙනවා කියලා හැබැයි මං කණගාටු වෙනවා ස්වාමීනි ඒක විශේෂයෙන්ම කියන්න ඕනේ මම හෙට්ටිපොල යන කොට හෙට්ටිපොල හිටියේ පොලිසියේ මං හිතන්නේ ඉස්සරහා 10 ක් 15 ක් තමයි එහෙම තමයි හිටියේ හැබැයි මම එතනින් ගිහිල්ලාත් පැය ගාණකට

FAIR COMMENT BY JEZEEM

පස්සේ තමයි ස්වාමිනී ඔය ඔතන පහර දීම සිදුවීම සිදු වෙලා තියෙන්නේ ස්වාමිනි ඒ වෙනකොටත් ඒ ප්‍රදේශයට ඇදිරි නීතිය දාන්න හෝ විශේෂ කැරලි මර්දනයක් ඒකකයක් යොමු කරන්න හෝ මොකක් හෝ වැඩ පිළිවෙලක් එදා ක්‍රියාත්මක වුණානම් ඇත්තටම මං හිතනවා ඒ විදියේ දෙයක් එදා එතන සිද්ධ වෙන්නේ නැහැ කියලා ස්වාමීනි ඔයිට වැඩිය ලොකුවට මහනුවර, දිගන , තෙල්දෙණිය පැත්තේ ඔයිට වැඩිය ලොකුවට ගියා ස්වාමිනී ගැටුම් නමුත් ආරක්ෂක සැලැස්මේ හැටියට මර්දනය කර ගැනීමේ වැඩපිළිවෙලවල් තියෙනවා ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් හැබැයි මෙම ඔබ සමඟ ගියපු සමන් පෙරේරා ඒ අපේ ජන බල පක්ෂය බිහිකරේ කුමණ අරමුණක් සඳහාද?

පි: ඒ පක්ෂය හැදුවේ ස්වාමිනි ඒක තමයි මං කිව්වේ මේවා ඉතාම පුද්ගලික කරුණු සිංහලට අයට විතරයි ඡන්දේ ඉල්ලන් පුළුවන් වෙන්නේ ඒ පක්ෂයෙන් ඡන්දය ඉල්ලන් පුළුවන් වෙන්නේ සිංහල. බෞද්ධ අයට විතරයි එතකොට

ප්‍ර: ඒ පක්ෂයෙන් ඉල්ලන්න පුළුවන්?

පි: ඒ පක්ෂයෙන් ඉල්ලන්න පුළුවන් වෙන්නේ. එතාකොට දැන් වර්තමානය ගත්තොත් දැන් ඔය ඥානසාර හාමුදුරුවෝ, රතනා හාමුදුරුවෝ ඡන්දය ඉල්ලලා තියෙන්නේ ඒ පක්ෂයෙන් එතකොට තවත් පැත්තක් ගත්තොත් එහෙම මන්ත්‍රී ධුරයට ගහගෙන අර තුවාල ලබලා හිටියේ අරඹේපොල රතනසාර කියන අර ස්වාමීන් වහන්සේ රෝහිත්යා සිද්ධිය සම්බන්ධව එතකොට මන්ත්‍රී ධුරයක් සම්බන්ධව ඊයේ පෙරේදා මං දැක්කා ගැටුමක් ඇතිවුණා කියලා පහරදීමට ලක්වෙලා භික්ෂූන් වහන්සේ නමක් මාධ්‍ය සාකච්ඡාවක ප්‍රකාශයක් නිකුත් කරලා තිබ්බා එතකොට ඒ හාමුරුවෝ ඉන්නෙත් අපේ ජන බල පක්ෂයේ එතකොට ස්වාමිනි එදා මම පැය 24 ක් තුළ දැකපු ඒ දැක්ම ඒ ටික මම CID එකේ අත්අඩංගුවේ ඉන්නකොට මම කිව්වා මේන් මෙක ඒක නිසා තමයි මම ගොඩාක් බේරුණේ ස්වාමිනි. මම SIS එකට පිළිවෙලට ඒ ටික මැසේජ් කරලා යවලා තියෙනවා මෙයත් එක්ක සම්බන්ධයි මෙයත් එක්ක සම්බන්ධයි මේ මේ විදියට මේ විදියට කියලා දැන් නම් ඒ ටික නැහැ ස්වාමිනී. මොකද CID එකෙන් පෝන් එක එළියට ගන්න කොට ඔක්කෝම අයින් කරලා ගන්න ඕනේ මොනවත් වැඩ කරන්නේ නැහැ ස්වාමීනි. හැබැයි CID එකේ ඉද්දී කොට මගේ වේලාවට ඒ ටික ස්වාමිනී තිබුණා. මම හිතුවේත් නැහැ තියෙනවා කියලා පෝන් එක ඕන් කරලා බැලුවම ඔක්කෝම ටික පිළිවෙලටම තියෙනවා ස්වාමීනි ඒ ටික පෙන්නුවා පෙන්නලා කිව්වාව මෙන්න මේක තමයි මේ තියෙන්නේ මේ තියෙන්නේ අහවල් නිලධාරියා මං මේක හොයාගෙන

FAIR COMMENT BY JEZEEM

යන ගමනක් මෙන්න මෙතන මේ වගේ සැලැස්මක් තියෙනවා ඔය ගොල්ලොත් කැමති නම් හොයන්න කියලා CID එකටත් මේ විදියට ප්‍රකාශයක් දුන්නා ස්වාමීනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු අපේ ජන පල පක්ෂය දැන් ඔබ ඔය අවස්ථාව වන කොට මේ අන්‍ය ජාතිකයන් සම්බන්ධයෙන් මොනවගේ මතයක්ද දැරුවේ?

පි: ලංකාවේ පාර්ලිමේන්තුව තමයි නීතිය සම්පාදනය කරන්නේ ඒ නීතිය සම්පාදනය කරන තැන අපේම මිනිස්සුන් කොටඨාශයක් හිටියොත් අපේ ජාතිය සහ බුදු දහම ගැන හිතන කොටඨාශයක් හිටියොත් අපේ අය ඒකට අවශ්‍ය කටයුතු කරයි ඊට පස්සේ නීතිය හදාගත්තොත් අනිත් දේවල් සියල්ල හදාගන්න පුළුවන් කියන තැන ඉදලා තමයි ඒ ගොල්ලෝ දේශපාලනික වශයෙන් තමයි විසඳුමකට යන්න බලාපොරොත්තු වුණේ මේ ප්‍ර ශ්නයට දේශපාලනික වශයෙන් විසඳුමකට

ප්‍ර: ඔව් ඒ කියන්නේ ඔවුන් අන්‍යාගමිකයන් සම්බන්ධයෙන් තරහවක් මරහවක් එහෙම තිබ්බද?

පි: අපේ ජන බල පක්ෂයේ සභාපති සමන් පෙරේරාගේ ළඟ නම් එහෙම එකක් නැහැ නමුත් ඒ පක්ෂය වටා එකතු වෙලා ඉන්න ඇතැම් මිනිස්සුන්ගේ ඒ ප්‍රශ්නය ඒ අදහස් තිබුණා ස්වාමිනි

ප්‍ර: ඒ පක්ෂයේ සාමාජිකයන් අර ඔබ ඩිපෙන්ඩරයෙන් පල්ලෙහාට බහින කොට ඒ ගොල්ලෝ එතන හිටියද?

පි: ස්වාමීනි එම පක්ෂයට සම්බන්ධ අයද ස්වාමීනි

ප්‍ර: ඔව්?

පි: එම පක්ෂයට සම්බන්ධ අය කවුරුත් හිටියේ නැහැ ස්වාමිනි

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ අපේ ජන බල පක්ෂයේ සාමාජියෙක්ද?

පි: නැත ස්වාමිනී.

ප්‍ර: එහෙනම් ඇයි ඔබ ඒ පක්ෂයේ, සමාජිකයෝ සභාපති ඒ කට්ටියත් එක්ක වාහන වල නැගලා එහේ මෙහේ යන්න පෙළඹුණේ?

පි: බොහොම වැදගත් ස්වාමිනි මම අගයකරනවා ගොඩාක් ඒ ප්‍රශ්නයට ස්වාමිනි මේ කොමිෂමේ එවැනි ප්‍රශ්නයක් මට ඉදිරිපත් කිරීම මම ගොඩක් අගය කරනවා ස්වාමිනි මේක මාව අත්අඩංගුවට ගැනීම සම්බන්ධවත් ලැබෙන පිළිතුරක් ස්වාමිනි. හේතුව මට මේ තොරතුර ආවට පස්සේ අපි එදා මෙහෙම පක්ෂයක් හදනවා සිංහල අය විතරයි මේකේ ඡන්දය ඉල්ලන්නේ මෙන්න මේකයි සැලැස්ම කියලා කිව්වාට පස්සේ මට උවමනා වෙනවා මේක ගැන හොයන්නත් හොයන්න උවමනා වෙනවත් එක්කම අපේ ජන බල පක්ෂයේ සභාපති මාත් එක්ක කියනවා ඔයා අපිට එන්න අපිත් එක්ක වැඩ කරන්න අපේ තියෙන

FAIR COMMENT BY JEZEEM

කටයුතු වලට ඔයා සහයෝගය දක්වන්න එතකොට අපි ඔයාට යම් කිසි ගානක් ගෙවන්නම් මට තිබුණා ප්‍රශ්නයක් ස්වාමිනි පළවෙනි එක මගේ රැකියාව නැතිවෙලා මම අන්ත අසරන වෙලා ඉන්නේ ඒවා මාධ්‍යට නෙමේ කිසිම තැනකට කියන්න බැහැ ස්වාමිනි. එහෙම වුණොත් මං ඒ දේවල් බලාපොරොත්තු වෙච්චි මනුෂ්‍යයෙක් බවට පත්වෙනවා ස්වාමීනි මං පුළුවන් විදියට මගේ දේවල් කරගෙන යන අතරතුර මගේ ආර්ථිකයත් බින්දුවට වැටිලා තිබුණේ ස්වාමීනි එතකොට ඒ ප්‍රශ්නයටත් ඒක විසඳුමක් අනෙක් එක මම රාජ්‍ය බුද්ධි සේවයට මං කිව්වාට පස්සේ ඒ අය ප්‍රශ්නයක් නැහැ නාමල් මේක බලලා කියන්න ඔයා එතැන්ට ලින්ක් වෙලා ඉස්සරහට යන්න ඒ දේවල් ඒ දෙන්න කියලා නමුත් මම කණගාටු වෙනවා ස්වාමීනි මම ඒ තරම් තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයට ලබා දීලාත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ නිලධාරින්ව ගෙන්නලා ප්‍රශ්න කරාම අපරාධ පරීක්ෂණ දෙපාරත්මේන්තුවේදී රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරියා කිව්වා මම මේ සම්බන්ධව දන්නේ නැහැ කියලා ස්වාමීනි හොඳ වෙලාවට මගේ අර Whats App ඒකේ පණිවිඩ තිබුණ නිසා ස්වාමීනි මං එදා බේරුණා නැතිනම් රාජ්‍ය බුද්ධි සේවය කියනවා මං මෙයත් එක්ක සම්බන්ධතාවයක් නැහැ කියලා. මං ඒ නිසා ඒ සාක්ෂි පුළුවන් විදියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දීලා තියෙනවා ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඒ අපේ ජන බල පක්ෂයනේ එතකොට මහසෝන් බලකාය කියන්නේ මොකක්ද?

පි: මහසෝන් බලකාය කියන්නේ මම එහෙම දන්නේ නැහැ ස්වාමීනි සංවිධානයේ අය ත්‍රස්තවාදී අදහස් දරන සංවිධානයක් කියලා කෙටියෙන් ප්‍රකාශ කරනවා ස්වාමීනි.

ප්‍ර: මොකක්ද නැවත කියන්න කරුණා කරලා?

පි: සංවිධානය පිළිබඳව ගොඩාක් දේවල් දන්නේ නැහැ ස්වාමීනි. සංවිධානයේ ත්‍රස්තවාදී අදහස් දරණ සංවිධානයක් බව ප්‍රකාශ කරනවා ස්වාමීනි.

ප්‍ර: කවුද එහි නායකයා?

පි: අමිත් වීරසිංහ ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබ මෙම පක්ෂය ඇයි ඔබ මෙම පක්ෂය ත්‍රස්තවාදී අදහස් දරණ පක්ෂයක් ලෙස නම් කරන්නේ?

පි: ස්වාමීනි මහසෝන් බලකාය දේශපාලන පක්ෂයක් නෙමේ මහසෝන් බලකාය සංවිධානයක් විදියට ලංකාවේ සිංහල තරුණ තරුණියෝ එකතු කරලා ගොඩනැගුණ එකක්

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: සාමාජිකයෝ කීයක් විතර ද?

පි: ස්වාමීනි සමාජිකයෝ සංඛ්‍යාව මම දන්නේ නැහැ ස්වාමීනි හරියටම නමුත් ලොකු සාමාජිකයෝ සංඛ්‍යාවක් ඒ දිනවල හිටියා දැනට සාමාජිකයෝ කොපමණ ප්‍රමාණයක් ඉන්නවද කියන්න මම දන්නේ නැහැ පහු ගිය කාලේ මම ඒ පිළිබඳව හෙව්වේම නැහැ ස්වාමීනි

ප්‍ර: ඔබේ මේ සංවිධානයට සම්බන්ධ වෙලා හිටියාද?

පි: සම්බන්ධ වුණේ නැහැ ස්වාමීනි

ප්‍ර: මේ සංවිධානය සම්බන්ධයෙන් තොරතුරු ඔබ කිසියම් ආයතනයකට ලබා දුන්නද?

පි: ත්‍රස්ත විමර්ශන දිසාවට ලබා දීලා තියෙනවා ස්වාමීනි

ප්‍ර: කාටද ඒ ලබා දුන්නේ?

පි: DIG නාලක සිල්වා මහත්තයාට ස්වාමීනි.

ප්‍ර: හරි ඒ කොයි කාලේද?

පි: 2017 ස්වාමීනි

ප්‍ර: 2017, 2018,

පි: 2017 ස්වාමිනි 2017 අවසාන කාලයේ ඉදලා තොරතුරු ලබා දෙනවා ස්වාමීනී 2018 සිදුවීම සම්බන්ධව තොරතුර විශේෂයෙන්ම ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබ මේ ත්‍රස්තවාදී කණ්ඩයමක් කියලා නම් කරන්නේ කියලා කියන්න ඉස්සෙල්ලම?

පි: ත්‍රස්තවාදී කණ්ඩායමක් විදියට නම් කරන්නේ ස්වාමීනි සංවිධානයක් විදියට හෝ තනි පුද්ගලයෙක් විදියට හෝ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයට යම් කිසි ප්‍රහාර මාලාවන් එහෙම නැත්නම් අදහස් ප්‍රකාශ කිරීම් දියත් කරනවා නම් මං හිතනවා ඒ ත්‍රස්ත සංවිධානයක් කියලා ඒ වගේම තවත් ජන වර්ගයකට ජන කොට්ඨාශයකට විරුද්ධව ඒ තමන් ඉන්න රට තුළ ඉදගෙන ප්‍රකාශ නිකුත් කරනවා නම් ප්‍රහාර දියත් කරන්න සැලසුම් කරනවා නම් ඒවා ඉතින් මගේ දැනුමේ හැටියට ස්වාමීනි මම හිතනවා ස්වාමීනි ඒ ත්‍රස්තාවාදීන් කියලා

ප්‍ර: දැන් ඔබ කියා සිටියා යම් ජන වර්ගයකට එරෙහිව අදහස් ප්‍රකාශ කරනවා නම් එයත් ත්‍රස්තවාදී සංවිධානයක් කියලා?

පි: එහෙමයි ස්වාමිනි. විද්‍යානුකූලව ජීවත් වෙන්න අවසරයක් තියෙනාව ස්වාමීනි ත්‍රස්තවාදී සංවිධානයකට විරුද්ධව අදහස් ප්‍රකාශ කරොත් අපිත් ත්‍රස්තවාදියෙක් වෙන්නේ නැහැ. නමුත් මේ රටේ පුර වැසියෝ විදියට ජීවත් වෙන රටේ ඉන්න තවත් ජනවර්ගයකට විරුද්ධව කටයුතු කරනවා නම් අදහස් ප්‍රකාශ කිරීම කියන්නේ මම කියන්නේ ස්වාමිනි අදහස් ප්‍රකාශ කිරීම කියන්නේ ත්‍රස්තවාදියෙක් දැන් අපි කථා කරන කොට තවත් ජනවර්ගයක අඩුපාඩු කථා කිරීම ත්‍රස්තවාදී අදහසක් වෙන්නේ නැහැ

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි ඒ ජන වර්ගය නැතිවෙන්න ඕනේ ඒ ජනවර්ගය විනාශ වෙන්න ඕනේ අපි විතරයි මේකේ ඉන්න ඕනේ. මේක අපේ ඒ මිනිස්සු එළවන්න ඕනේ. මරන්න ඕනේ මේ වගේ අදහස් වෙනවා නම් ස්වාමිනි මං හිතනවා ඒක ත්‍රස්තවාදී කියලා

ප්‍ර: මේ වගේ අදහස් මහසෝන් බලකාය විසින් ව්‍යාප්ත් කරාද?

පි: තිබුණා ස්වාමීනි

ප්‍ර: ඔවුන් එය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරාද?

පි: ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරපු අවස්ථාවත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔවුන් යම් පහරදීම් වැනි දේවල් කරනවා නම් වෙන ජනවර්ගයක් අරඹයා එයත් ත්‍රස්තවාදී කටයුත්තක් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මෙම මහසෝන් බලකායේ එවැනි පහර දීම් 2017 වර්ෂයේදී සිදු කරාද?

පි: ස්වාමිනි 2017 වර්ෂයේ එවැනි පහරදීමක් නොකලට එවැනි පහර දීමක් කරන අවස්ථාවක් සංවිධානය කලා ස්වාමීනි.

ප්‍ර: මොකක්ද ඒ?

පි: ඒ හජ්ජි උත්සවය දවසේ

ප්‍ර : මොන අවුරුද්දේද?

පි: හජ්ජි උත්සවය දවසේ 2017.09.01 වෙනිදා වගේ මට මතක හැටියට ඒ 09 වෙනි මාසේ 01 වෙනිදා වගේ මට මතක හැටියට ස්වාමිනි කෙන්ගල්ල මධ්‍ය මහා විද්‍යාලයේ මහනුවර කෙන්ගල්ල මධ්‍ය මහා විද්‍යාලයේ හජ්ජි උත්සවයක් සංවිධානය කරලා තිබුණා ස්වාමිනි. ඒ හජ්ජි උත්සවයට එන මේ හජ්ජි සමරන්න එන බැතිමතුන්ට පහර දෙන්න අවශ්‍ය සැලැස්මක් දියත් කරලා තිබුණා ස්වාමිනි මහසෝන් බලකායෙන් ඒ සැලැස්ම නිසා එවකට ඒ එම ප්‍රදේශයේ හිටපු පොලිස් නිලධාරින් අධිකරණ නියෝගයක් ලබාගෙන තිබුණා ස්වාමිනි. අමිත් ජීවන් වීරසිංහ ඇතුළු ඒ කීප දෙනෙක් නම් කරලා ඒ අයට ඒ ප්‍රදේශයට අතුළු වීම තහනම් කරලා ස්වාමිනි. ඒ මම හොයලා බැලුවා පළවෙනි සැලැස්ම ස්වාමිනි දෙවනි එක ස්වාමිනි මහනුවර දිගන , තෙල්දෙණිය ගැටුම 2018.03 මාසේ 05 හෝ ඊට අසන්න දිනයක එවැනි සිදුවීම් වලට ඔවුන් සම්බන්ධ බවට අපට තොරතුරු අණාවරනය වුණා ස්වාමිනි.

ප්‍ර: ඒ නිසයි ඔබ කියන්නේ මේ මහ සෝන් බලකාය ත්‍රස්වාදීන් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් දිගන මේ සිද්ධියක් වුණා කියලා ඔබ කිව්වානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහිදි ඔය සිද්ධිය මැඩ පවත්වන්නට කිසියම් ශ්‍රී ලංකා පොලිසිය සමත් වුණාද?

පි: ශ්‍රී ලංකා පොලිසිය අසමත් වෙලා හිටියේ ස්වාමීනි.

ප්‍ර: කොහොමද එහෙනම් ඔබ සමත් කරේ?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒක නියෝජ්‍ය පොලිස්පති නාලකද සිල්වා මහත්මයා මට කථා කරලා කිව්වා නුවර පිළිබඳව බලමුද කියලා ඇහුවා මං කිව්වා හරි බලමු කිව්වා. කථා කරලා අපි පොලිස්පති තුමාගෙන් උපදෙස් අරන් තිබුණා ඊට පස්සේ අපි එදාම 2018.03. වෙනි මාසේ 06 වෙනිදා රාත්‍රියේම අපි මහනුවර ප්‍රදේශයට යනවා

ප්‍ර: දෙදහස්?

පි: 2018.03.06 රාත්‍රියේ

ප්‍ර: ආ ඔව්?

පි: අපි නුවරට යනවා නුවරට ගියාම ඒ කටයුතු සංවිධානය වෙන්නේ විහාරස්ථානයක එම විහාරස්ථානයට යන කොට නාලක සිල්වා මහත්මයාගේ නියෝජිතයකුත් මාත් එක්ක යනවා ඒ ගිහිල්ලා අපි දෙන්නත් එක්කම තමයි ඒවා බලන්නේ කුඩු ගල කියලා ගමක් තිබුණා ඒ ගමෙන් ඇතුලට ගිරාකඩුව කියලා පන්සලක් තිබුණා ඒ පන්සලේ තමයි මේ දෙවල් සැලසුම් වුණේ ඒ පංසලට අපි මමයි නාලක සිල්වා මහත්මයායි නියෝජිතයයි ගියාම අපි තිරණය කරා තව ටිකක් වෙලා යන කොට මේ ගැටුම් උත්සන්න වෙනවා අනිවාර්යෙන්ම මේ ප්‍රහාර දියත් වෙනවා කියල. ප්‍රහාර දියත් වෙන විදියත් ප්‍රහාර සැලසුම් වන විදිය මම පමණක් නෙමේ ස්වාමීනි නාලක සිල්වා මහත්මයාගේ නියෝජිතයා පොලිස් නිලධාරියෙක් පොලිස් කොස්තාපල් වරයෙක් ප්‍රභාත් කියලා ඔහුයි මායි සවන් දුන්නා විතරක් නෙවෙයි දැක්කත් එකක් ස්වාමිනි මේවා සංවිධානය වෙන විදිය ඊට පස්සේ අපි නාලක සිල්වා මහත්මයාව හැකිතාක් ඉක්මනට අපි කඩයට යනවා කියලා ඇවිල්ලා අපි නාලක සිල්වා මහත්මයාට දැනුවත් කරා මෙන්න මෙහෙම ප්‍රශ්නයක් වෙන්න යනවා මේ ප්‍රශ්නය දිගට යනවා කියලා ඊට පස්සේ අනික් පහුවදා වෙනකොට මේ ප්‍රශ්න යන්න ඕන උපරිම ගිහින් ඉවරයි ස්වාමිනි හැබැයි අපිට පැය 24 ක වගේ කාලයක් ඇතුලත සම්පූර්ණ එම කැරැල්ල මැඩපවත්වන්න හැකියාවක් ලැබුණා ස්වාමිනි

ප්‍ර: ඒ සඳහා ඔබට නෙමෙයි අහන්න රජයෙන් යම්?

පි: ගෙවීමක් කරලා තියෙනවා ස්වාමීනි රුපියල් ලක්ෂ දෙකහාමාරක්

ප්‍ර: මං ගෙවීමක් හැදුවේ ගෙවීමක් නෙමේ යම් ප්‍රධානයක් ඔබට කරලා තියෙනවද කියලා?

පි: දීලා තියෙනවා ස්වාමිනි, ලැබිලා තියෙනවා.

ප්‍ර: එය මුදලක් වශයෙන් ද ඔබට ලැබුණේ?

පි: චෙක් පතක් ලැබුනා ස්වාමිනි. ඒක බැංකුවෙන් මාරු කරලා ගත්තේ ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම ගරු සභාවේ සාක්ෂි දියපු ස්වාමින් වහන්සේ කෙනෙක් ගලගොඩ අත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ ප්‍රකාශ කර සිටියා උන්වහන්සේගේ මැදිහත් වීමෙන් තමයි මෙම ගැටුම සමතයකට පත්

FAIR COMMENT BY JEZEEM

කරන්න පුළුවන් වුණේ කියන එක දැන් අද ඔබ කියනවා ඔබගේ මැදිහත් වීම තුළින් තමයි මෙම ගැටුම් සමනයට පත් කරන්න පුළුවන් වුණේ කියලා දැන් මෙහෙම තත්ත්ව දෙකක් එන්න හේතුව මොකක්ද?

පි: ස්වාමීනි ඒකට මගේ නිවැරදිතාවය වෙනුවෙන් මං ප්‍රකාශ නිකුත් කරන්න කලින් මං නම් කීපයක් ප්‍රකාශ කරනවා ඒ නම් වලින් ඒ තොරුතුරු ලබා ගන්නා ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා හිටපු පොලිස්පති පූජිත් ජයසුන්ද මහත්මයා ත්‍රස්ත විමර්ශන දිසාවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයා මෙන්න මේ අයගෙන් ඒ පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලෙස මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මොකද මට මමයි කරේ කියලා මම කොහොමද ස්වාමිනී මම ඔප්පු කරන්නේ

ප්‍ර: සාක්ෂිකරු මෙම සිද්ධිය ඔබගේ දායකත්වය වෙනුවෙන් ඒ ලැබුණු ප්‍රධානයට අමතරව ඔබට තවත් යම් ප්‍රධානයන් ලැබිලා තියෙනවද?

පි: ලැබිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කීයක්ද?

පි: එතන ලක්ෂ දෙකහාමාරක් ලැබිලා තියෙනවා ස්වාමීනි

ප්‍ර: ප්‍රධානයන් මං ගාණ නෙමේ අහන්නේ ප්‍රධානයක් තව ලැබිලා තියෙනවා?

පි: ඔව්

ප්‍ර: ඒ මොනවා වෙනුවෙනුන්ද?

පි: ඒ ස්වාමිනි රොහින්ගියා සරණාගතයින්ට.

ප්‍ර: නැවත කියන්න?

පි: රොහින්ගියා සරණාගතයින්ට පහර දීමේ සැකකරුවන් සැඟව සිටියේ ස්වාමීනි ඒ සැඟවී ඉන්න දවස්වල අත්අඩංගුවට ගන්න අපි තුෂාර පිරීස්ගෙන් තොරතුරු අරගෙන මෙන්න මෙවා ඉතාමත් වැදගත් ස්වාමිනි මේ තොරතුරු ගන්නේ තුෂාර පිරිස්ගෙන් තුෂාර පිරිස් තමයි එයාව සම්බන්ධ කරලා දෙන්නේ එතකොට රොහින්ගියා සරණාගතයින්ටයි පහර දීලා තියෙන්නේ ස්වාමිනි සරානාගතයන් කොටියාශයකට එතකොට එතනම ත්‍රස්තවාදයක් නිර්මාණය වෙලා තියෙනවා ස්වාමිනි රට ඇතුලේ මෙන්න මේ අයව අත්අඩංගුවට ගන් නැතිව ඉන්න කොට ගන් නැතිව නෙමේ ගන්න බැරිව ඉන්න කොට අපි තුෂාර පිරිස්ගෙන් තොරතුරු ලබාගෙන ඒ අයව අත්අංගුවට ගන්නවා ඒ වෙන දෙයක් නිසා නෙමෙයි නාලක සිල්වා මහත්මයා මට මගෙන් ඉල්ලීමක් කරා රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් මේක කරන්න ඕනේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් කියන එක එතුමා ඉල්ලපු නිසා මං ඒ උදව්ව එතුමාට මගේ ජීවිතයට එන තර්ජන පසෙලකා මං ඒ උදව්ව කරා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කියන්නේ එම සිද්ධියටත් තුෂාර පිරිස් සම්බන්ධයි කියලද?

පි: ස්වාමීනි තුෂාර පිරිස් ඒ සිද්ධියට සම්බන්ධයි කියලා මං සෘජුව චෝදනා කරන්නේ නැහැ නමුත් ස්වාමිනි මේ පහර දීම්වලට සම්බන්ධ බොහෝ දෙනෙක් තුෂාර පිරිස් එක්ක සම්බන්ධතා පවත්වනවා ස්වාමිනි

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: උදාරණයක් ලෙස ගතහොත්?

පි: උදාහරණයක් විදියට ගත්තොත් ස්වාමිනි අරඹේපොළ රතනසාර හාමුදුරුවෝ මෙම චෝදනාවේ ප්‍රධානම කෙනෙක් උන්වහන්සේව මට හඳුන්වලා දෙන්නේ තුෂාර පිරිස් ස්වාමිනි.

ප්‍ර: කොහොමද?

පි: තුෂාර පිරිස් ඒ අය හදනවා ස්වාමිනි SJB කියලා එකක් වට්සැප් ගෲප් එකක්.

ප්‍ර: මොන වගේද?

පි: සිංහලයේ ජාතික බල මුළුව කියලා. ඒකේ නම ඒ SJB කියන ඒ Whats App group එකේ ඒ ඉන්නේ තුෂාර පිරිස් ඇතුළු කණ්ඩායමක් ඔවුන් පළමුවෙන්ම සැලසුම් කරන්නේ පුනාදිවල විශ්වවිද්‍යාලයට හිස්බුල්ලා මන්ත්‍රිතුමා ඇතුළු පිරිසක් එන වෙලාවක් බලලා පුපුරවා හැරීමක් කරන්න ස්වාමිනි.

ප්‍ර: SJB

පි: SJB කියන group එකක් හදලා ඒකට වෙනම විඩියෝ කීපයකුත් ඒ ගොල්ලෝ ගිහිල්ලා වෙනම කණ්ඩායමක් යවලා අරගෙන තිබුණා ඒවා මං නාලක සිල්වා මහත්මයාට ලබා දීලා තියෙනවා. ඒ ගොල්ලොන්ගේ පළවෙනි සැලැස්ම වුනේ මෙන්න මෙතන ස්වාමිනි. මෙතනින් ආරම්භ කරපු අය මෙතන SJB කියන සංවිධානය සිංහලයේ ජාතික බලමුළුව කියන සංවිධානයේ මහලේකම් තමයි පූජ්‍ය අරඹේපොල රතනසාර ස්වාමින් වහන්සේ ස්වාමිනි.

ප්‍ර: ඒ සංවිධානය දැනටත් ක්‍රියාත්මකයි ද?

පි: දැනටත් ක්‍රියාත්මකයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔය මොකක්ද ඔය ස්වාමින් වහන්සේගේ නම?

පි: පුජ්‍ය අරඹේපොල රතනාසාර ස්වාමිනි.

ප්‍ර: ඔබ කිව්වේ අර පහර දීමක් කීපයක් වුණා කිව්වෙත් ඒ ස්වාමින් වහන්සේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඒ ස්වාමින්වහන්සේ ඔබ කියන අපේ ජනබල පක්ෂයෙන් සමාජිකයෙක්ද?

පි: එහෙමයි ස්වාමිනි. අපේ ජන බලපක්ෂයේ දැනට කොටස් දෙකකට වෙන්වෙලා ඉන්නේ ස්වාමීනි එක කොටසක් මෙහෙයවනවා ප්‍රංශයේ ඉන්න තුෂාර පිරිස් ඒ මෙහෙයවන කොටස අතරේ ඉන්නවා අපේ ජන බල පක්ෂයේ දැන් ඔය පහර දීමට ලක්වෙච්ච අරඹේපොළ රතනසාර හාමුදුරුවෝ සහ තව කීපදෙනෙක් පක්ෂයට සම්බන්ධ අය නෙමේ ඒළියේ ඉන්න කීප දෙනෙක් ඉන්නවා ස්වාමීනි.

ප්‍ර: කවුද ඒ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: නම් වශයෙන් ස්වාමිනි අපි නාලක සිල්වා මහත්මයාට මම තොරතුරු කීපයක්ම ලබා දිලා එතුමා කාලයක්ම තිස්සේ අත්අඩංගුවට ගන්න හෙව්වා මහනුවර ප්‍රදේශයේ එරංග කියලා පුද්ගලයෙක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කරපු

ප්‍ර: එරංග?

පි: එරංග කියලා ඉතින් ඔවුන් මෙම සංවිධානයට මුදල් සපයා ගැනීම සඳහා බැංකු මුදල් ප්‍රවාහනය කරන වෑන් රථයක් කොල්ල කන්න සිකරැට් ප්‍රවාහනය කරන සිකරැට් වෑන් එකක් කොල්ල කන්න මෙවැනි දේවල් සැලසුම් කරා ස්වාමීනි ඒ සැලසුම් කරපු ඒවාගේ පළවෙනි යවපු කෝල් එක ඉදලා අපි ඒ අවශ්‍ය සාක්ෂි හඬපටය විදියට ලබා ගත්තා ස්වාමිනි එතකොට මෙවැනි පිරිසක් ඒ එක්කෙනෙක් ඊට පස්සේ ජනිත මීපගේ කියලා තව පුද්ගලයෙක් මේ වගේ කීප දෙනෙක්ම ඔහුත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා ස්වාමීනි ඉතින් ඒ සම්බන්ධ වෙලා ඉන්න සියලුම දෙනා පිළිබඳව මම ඒ දවස්වල තොරතුරු ලබා දුන්නා පසු කාලීනව මේ වෙනස් වුණාට පස්සේ මගෙන් මම කරන්න ඕන ටික කරලා මම ඒ හොයන එක සම්පූර්ණ නවත්වලා දැම්මා ස්වාමිනි මේ මෑත කාලයේ අත්අඩංගුවට ගත්තාට පස්සේ ස්වාමිනි.

ප්‍ර: හරි එතකොට අනිත් කාණ්ඩයේ කවුද ඉන්නේ?

පි: භික්ෂූන් වහන්සේල වශයෙන් මට දැනුවත්ව ඉන්නේ ස්වාමිනි අරඹේපොළ රතනසාර හාමුදුරුවෝ සම්බන්ධවෙලා ඉන්නවා ඒ ඇරුණාම භික්ෂූන් වහන්සේලා පිළිබඳව මට කියන්න අමාරුයි වෙනත් අය විදියට මහනුවර ප්‍රදේශයේ ඔය එරංග කියන්නේ ගුවන් හමුදාවේ හිටපු කෙනෙක් ජනිත මීපගේ කියන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩකරන ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරපු කෙනෙක් තව ගයාන් කියලා කෙනෙක් ඔහුත් යුද හමුදාවේ සේවය කරපු කෙනෙක් එම පිරිසක් හිටියා ස්වාමිනි මට මතක තියෙන ඔය තුන්දෙනෙක්ගේ 4 දෙනෙක්ගේ මං නම් ප්‍රකාශ කරේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කියා සිටින්නේ ඒක තවත් පැත්තකට බෙදිලා ඉන්නවා කියලා?

පි: ස්වාමිනි අපේ ජන බලපක්ෂය දෙපැත්තකට බෙදිලා ඉන්නේ ස්වාමිනි.

ප්‍ර: මොකක් ද ඒ කොටස් දෙක කියලා මං අහන්නේ?

පි: ඥානසාර හාමුදුරුවෝ සහ සමන් පෙරේරා ඇතුළු පිරිසක් එක් පාර්ශවයක් නියෝජනය කරනවා තුෂාර පිරිස් තවත් පාර්ශවයක් මෙහෙයවනවා ප්‍රංශයේ ඉදලා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ඔබ කියා සිටින්නේ අරඹේ පොල මොකක් ද ඒ ස්වාමීන් වහන්සේගේ නම සාක්ෂිකරු?

පි: අරඹේපොල රතනසාර ස්වාමීන් වහන්සේ

ප්‍ර: අරඹේපොල රතනසාර කියන ඒ ස්වාමීන් වහන්සේ අපේ ජනබල පක්ෂයේ සාමාජිකයෙක්?

FAIR COMMENT — BY JEZEEM —

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඒ වගේම අර රොහිණ්යා සරාණාගතයින්ට පහර දීමේ සැකකරුවෙක්?

පි: සැකකරුවෙක් ස්වාමිනි.

ප්‍ර: ඒ හා සාමානවම මෙම ස්වාමින් වහන්ස ඔබ කියන ආකාරයට තුෂාර පිරිස්ට මේ ප්‍රංශයේ සිටින තුෂාර පිරිස්ට සම්බන්ධයි?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: තුෂාර පිරිස් කියන්නේ ඔබට 2017 පමණ 2017 දී පමණ සිට?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ලංකාව තුළ අන්‍යාගමිකයන්ට ප්‍රහාර දීමක් සිදු කලයුතු බවට ඔබට ප්‍රකාශ කරපු තැනැත්තෙක්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ මෙම මේ සම්බන්ධයෙන් ඒ කියන්නේ ඔබ මෙතෙක් දීපු සාක්ෂි සම්බන්ධයෙන් ඔබට යම් මීට අමතරව ඔබට යම් දෙයක් කියන්න තියෙනවද?

පි: ස්වාමිනි පොදුවේ මේ සාක්ෂි සම්බන්ධව කියන් කිසිවක් නැහැ නමුත් පොදුවේ යම් අදහසක් දක්වන්න

ප්‍ර: පොදු අදහසට පස්සේ එමු දැන් සාක්ෂිකරු වට්ටමඩු රක්ෂිතය තියෙන්නේ කොහේද?

පි: ස්වාමිනි අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් වෙන්නේ ස්වාමිනි.

ප්‍ර: මෙන්න මේ රක්ෂිතයේ සිදුවෙච්ච යම් සිදුවීමක් සම්බන්ධව ඔබ

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: තොරතුරු හොයා ගත්තද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොනවද ඒ තොරතුරු?

පි: 2017 තුෂාර පිරිස් කථා කරලා කියනවා වට්ටමඩු කියලා රක්ෂිතයක් තියෙනවා ඒ රක්ෂිතයට යන පාර මේක එතන ඉන්නවා සමන් කියලා කෙනෙක් ඔයාව

ප්‍ර: කියන්න?

පි: ඔයාව ඒ තැනට මම අරගෙන යන්නම් ඒ ඔයාව ඒ තැනට අරගෙන යයි. රක්ෂිතයක හදන පල්ලියක් එතන එන පිරිස අපි රෙකී කරලා අවශ්‍ය අවි ආයුධ අරන් ගිහිල්ලා එතන දී ඒ මිනිස්සු ටිකත් මරලා දාමු කියලා යෝජනාවක් කරනවා. මේ යෝජනව කරන එකත් එක්කම මට මම නාලක සිල්වා මහත්මයාට ඒ පිළිබඳව දන්වනවා අපිට බලන්න උවමනා වෙනවා එහෙම එකක් තියෙනවද කොහේද තියෙන්නේ එහෙම එකක් ක්‍රියාත්මක වෙනවද කියලා ඒ අනුව නාලක සිල්වා මහත්මයා මට උපදෙස් ලබා දෙනවා මම යනවා ගිහිල්ලා වීඩියෝ කරනවා සමහර ඒවා ඔලුවෙන් හිටගෙන වීඩියෝ කරනවා වගේ ස්වාමීනි ගන්න පුළුවන් තරම්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි එකතු කර ගෙන එනවා නාලක සිල්වා මහත්මයාගෙන් බැනුනුත් අහනවා මේ ඔළුවෙන් හිටගෙන තමයි බලන්න වෙන්නේ කියලා ස්වාමිනි. ඒ විදියට සාක්ෂි ටික අරගෙන ඇවිල්ලා ස්වාමිනි අපි ඒ සාක්ෂි ලබා දෙනවා ඊට පස්සේ වට්ටමඩු රක්ෂිතය පිළිබඳව අපි කරලා බලනනවා අක්කර 4000 ක විතර රක්ෂිතයක් ස්වාමිනි ඒ රක්ෂිතය ඒ පල්ලිය හදලා තියෙන්නේ රක්ෂිතයේ මැද ස්වාමිනි අම්පාර දිස්ත්‍රික්කයේ මහදිසාපති තුමා නියෝග කරලා තියෙනවා ඒ පල්ලිය හදන එක නවත්වන්න කියලා නමුත් කොන්ක්‍රීට් යොදලා ඉදි කිරීම් හොයලා තියෙනවා ස්වාමිනි ළිං හදලා තියෙනවා වැසිකිලි හදලා තියෙනවා සියලු පල්ලවලට අවශ්‍ය දේවල් එතන නිර්මාණය කරලා තියෙනවා ස්වාමිනි. කැලේ පටන් ගත්තු තැන ඉදලා කිලෝමීටර් 04 ක් විතර ඇතුලට ගියාම තමයි මේ පල්ලිය තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: මොන ආගමකට හෝ මොන?

පි: ඉස්ලාම් ආගම අදහන්න තමයි ස්වාමිනි මෙතන හදලා තියෙන්නේ ස්වාමිනි. ඊට පස්සේ එතනට අපි ගිහිල්ලා හොයලා බැලුවා

ප්‍ර: 2017 නේ?

පි: 2017 ස්වාමිනි. ඊට පස්සේ මම 2018 නැවත තුෂාර පිරිස් මට කථා කරලා කියනවා වට්ටමඩු යන්න පුෂ්පරාජා කියලා කෙනෙක් ඉන්නවා එයාව හම්බබෙලා එයත් එක්ක සාකච්ඡා කරන්න එහේ ප්‍රශ්න ටිකක් තියෙනවා මේ මුස්ලිම් අයට ගහන plan එක හදාගෙන එන්න කියලා ඒ පාර මම තනියෙන් යන්නේ නැහැ ස්වාමිනි නාලක සිල්වා මහත්මයාගේ ගෝලයෝ දෙන්නෙකුත් එක්ක මම යන්නේ ස්වාමිනි.

ප්‍ර: කවුද ඒ ගෝලයෝ දෙන්නා?

පි: එක්කෙනෙක් ප්‍රභාත් අනිත් එක්කෙනාගේ නම මට මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: ප්‍රභාත් කියන්නේ කවුද?

පි: ප්‍රභාත් කියන්නේ පොලිස්කොස්තාපල් වරයෙක් ස්වාමිනි ත්‍රස්ත විමර්ශන දිසාවේ සේවය කරේ ස්වාමිනි.

ප්‍ර: අංකයක් දන්නවද?

පි: ස්වාමිනි.

ප්‍ර: ඒ කොස්තාපල්වරයාට අර පොලිසියේ තියෙනවානේ අංක?

පි: නැත ස්වාමිනි

ප්‍ර: ඒ අංකය ඔබ දන්නේ නැහැ?

පි: නැත මම නිලඇඳුම් ඇඳලා ඉන්නවා දැකලා නැහැ ස්වාමිනි. මං හැමදාම දැක්කේ සිවිල් ඇදුමෙන් ස්වාමිනි.

ප්‍ර: ඉතින්?

පි: ඉතින් එම නිලධාරියාත් එක්ක ගියා අපි හිටපු පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් තමයි පුෂ්ප රාජ් කියන්නේ පුෂ්ප රාජ්ව අපිට සම්බන්ධ කරලා දෙන්නේ තුෂාර පිරිස්

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔව්?

පි: තුෂාර පිරිස් කියන්නේ මේ අයට ප්‍රශ්න වගයක් තියෙනවා ඒ ටික බලලා එහේ ප්‍රහාර මාලා ඒ කියන්නේ දැන් මේ වට්ටමඩු රක්ෂිතයේ මේ පිරිස පල්ලියට එන පිරිසට ප්‍රහාරයක් දියත් කරන විදිය සැලසුම් කරන්න කියලා තමයි මාව යවන්නේ මං එතනදි කියනවා තුෂාරට හරි මගේ හොඳ යාළුවෝ දෙන්නෙක් ඉන්නවා මං ඒ දෙන්නත් එක්ක යන්නම් කියලා යාළුවෝ දෙන්නා TID අපි තුන්දෙනත් එක්ක යනවා නාලක සිල්වා මහත්මයාගෙන් නිතර උපදෙස් අපට ලැබෙනවා අපි ගිහිල්ලා බැලුවා පුෂ්ප රාජත් එක්ක ගියා රක්ෂිතය ඇතුලටම ගිහිල්ලා බැලුවම අපි පුෂ්පරාජ ළඟ තියෙන සාක්ෂි ටිකත් අරගෙන බැලුවා පුෂ්පරාජාගෙන් ඇහුවා ඇයි මෙහෙම ඔයා චෝදනා කරන්නේ මේ විදියට මේ මිනිසුන්ට චෝදනා කරන්න මොනවද තියෙන කරුණු ඔයාට මොනවද වෙලා තියෙන්නේ කියලා අපි හෙව්වා. ඒ හොයලා බලන කොට තමයි ස්වාමිනි අපි දැනගත්තේ ඉස්ලාම් පිරිසක් ඒ ප්‍රදේශයේ දැවැන්ත විදියට හිස ඔසවලා තියෙනවා ඒ පිළිබඳව අදාල අංශවලට දැනුවත් කරලා තිබුණත් ඒකට ක්‍රියාමාර්ගයක් නැහැ කියලා කණගාටුවට කරුණක් ස්වාමිනි මේ සියලු කටයුතු සිදුවෙන්නේ සාගම STF කඳවුර පහුකරලා ඒකට යන්න ඕනී මේ සියලු දේවල් සිදුවෙන්න ස්වාමිනි.

ප්‍ර: කොච්චර වගේ දුරක්ද?

පි: ස්වාමිනි STF කඳවුරේ ඉඳලා කිලෝමීටර් 04ක් STF කඳවුර පටන් ගන්නේ සාගම වැවත් එක්ක වැවෙන් එහා පැත්තේ සාමාන්‍ය කිලෝමීටර දෙක තුනක තමා කිලෝමීටර් 3, 4 ක් විතර ඇති ස්වාමිනි උපරිම.

ප්‍ර: ඒ කියන්නේ ඔය කඳවුර මඟ ඇරලා යෑමට හැකියාවක් තියෙනවද?

පි: කඳවුර මඟ ඇරලා යන්න හැකියාවක් නැහැ ස්වාමිනි

ප්‍ර: දැන් සාක්ෂිකරු මෙම ඉදි කිරීම් මෙම කටයුතු වලට කිසියම් සංවිධානයක් හෝ සංවිධාන සම්බන්ධයි කියලා ඔබට අනාවරණය වුණාද?

පි: ස්වාමීනි පුෂ්ප රාජාගෙන් තොරතුරු මම සම්පූර්ණ තොරතුරු ටික ගත්තේ පුෂ්ප රාජ්ගෙන් ඒ ගත්තුවල තොරතුරුවල හැටියට එතනට දේශපාලනඥයෝ සහභාගි වන බවට ඔහු අපිත් එක්ක කිව්වා ස්වාමිනි. දේශපලනඥයෙන් කවුද කියලා කිව්වාම මම ප්‍රභාත්ට කිව්වා ඔක්කෝම ටික ඔන්න අහගන්න මට අදාල නැහැ ඕවා පහාත් අහගන්න ඕවා කියලා මම ත්‍රස්ත විමර්ශන දිසාවේ ඒ ගිහිල්ලා හිටපු නිලධාරින්ව යොමු කරා ඒ කථාවට ස්වාමිනි.

ප්‍ර: කවුද ඉතින් මේ සම්බන්ධ වෙලා හිටපු දේශපාලනඥයෝ?

පි: දේශපාලනඥයෝ පිළිබඳව ස්වාමිනි මට ඒ දවස්වල කථා කරපු විදියට හිස්බුල්ලා,රිසාඩ් බදුර්දීනුත් ඇවිල්ලා ගිහිල්ලා තියෙනවා කියලා කිව්වා

FAIR COMMENT — BY JEZEEM —

කැලේ ඇතුලේ තියෙන පල්ලියට මේ ගොල්ලෝ එනවා යනවා කියලා ඔය නම් කීපයක්ම කිව්වා කවුද හකීම් සම්බන්ධයි කියලා කිව්වා අනිත් ඒවා මට මතක නැහැ ස්වාමිනි මට මතක නැති දේ වගකීමෙන් ප්‍රකාශ කරන්න අමාරුයි.

ප්‍ර: මේ අක්කර පත්තුවේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ?

පි: අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුව ස්වාමිනි

ප්‍ර: මේ එළිමහන් කරපු තැන මොනවටද දේවස්ථානයට අමතරව වෙන කිසියම් හෝ කටයුත්තකට පාවිච්චි කරනවද නැද්ද කියන එක හෙලි දරව් වුණාද?

පි: ස්වාමිනි මේ මුස්ලිම් අය මෙතන ද්‍රවිඩ, අයගේ ද්‍රවිඩ අය කිරි ගොවියෝ මේකේ ගොවිතැන් කරන්න තහනම් නමුත් කිරි ගවයන්ව ඒකට ඇතුලු කරන්න යම් පිරිසකට අවසර ලබා දීලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ කෑම ලබා දෙන්න?

පි: ඔව් කෑම ලබා දෙන්න ස්වාමිනි. එතකොට මේ අය දැනට වසර ගණනාවකට පෙර පුෂ්පරාජ ළඟ පින්තූරත් තියෙනවා ගවයන්ගේ ඔලුව කපලා තියලා පින්තූර මේ ගොල්ලෝ ලියනවා ස්වාමිනි ලියලා බිසිල්බෝඩ්වල ලියලා ඒ ගොල්ලෝ දැන්වීමක් දානවා මේවා අල්ලන්න ආවොත් උඹලාට වෙන්නෙත් ටිකම තමයි කියලා ස්වාමිනි එවැනි අන්තවාදී අදහස් දැනට අවුරුදු 4,5 ට ඉස්සෙල්ලම ඉදලම ප්‍රසිද්ධියේම පෙන්නපු ප්‍රදේශයක් ස්වාමිනි.

ප්‍ර: රාත්‍රී කාලයේ මෙම දේවස්ථානයට පුද්ගලයෝ යනවා එනවද එහෙම නැත්නම් ඔවුන් රාත්‍රිකාලවල් එහිදි ගතකරනවද?

පි: ගතකරනවා ස්වාමිනි. බ්‍රහස්පතින්දා රෑට මෙහේ ඉන්නවා කියලා තමයි අපිට තොරතුරු ලැබුණේ ස්වාමිනි

ප්‍ර: බ්‍රහස්පතින්දා රෑට?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු මේ වට්ටමඩු රක්ෂිතයනේ මේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට ජාතික තවුහිද් ජමාත් කියන සංවිධානයේ නායකයා ලෙස හඳුන් වන සහරාන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: සම්බන්ධයෙන් ඔබ යම් තොරතුරක් පොලිස්පතිතුමාට ලබා දීලා තියෙනවද?

පි: පොලිස්පතිතුමාට නම් ලබා දීලා නැහැ මට මතක හැටියට නමුත් මම නාලක සිල්වා මහත්මයාට නම් ස්වාමීනි මම විඩියෝ එකක් යවලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: වීඩියෝ එකක් යවලා තියෙනවා?

FAIR COMMENT — BY JEZEEM —

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔය වීඩියෝ එක?

පි: ඒක ස්වාමිනි දිගන තෙල්දෙණිය ගැටුම ඇති වුනේ 2018.03. මාසේ මුල් කාලේ ස්වාමිනි. ඊට පස්සේ කොහොමත් 10 විතර වගේ 10,15 විතර වගේ කාලයකදි මට මතකයි විඩියෝ එකක් අවුට් කරා මුස්ලිම් අය ඒකේ ඉන්නේ සහරාන් ඉන්නේ කියලා මම දැනගෙන හිටියේ නැහැ ස්වාමිනි ඒ වීඩියෝ පටය නිල්පාට පසුබිමක තියෙන වීඩියෝ එකක් ඒ විඩියෝ එක මම නාලක සිල්වා මහත්මයට වගේම තුෂාර පිරිස්ටත් යැව්වා ප්‍රංශයට ස්වාමිනි ඒක ද්‍රවිඩ භාෂාවෙන් තමයි කථා කරේ ඒ කථා කරලා ඔහු ඒකේ කිව්වේ අපි වීඩියෝ එක පසුව අයින් කරලා තිබුණා ඒක හොයා ගන්න නැති වුණා පස්සේ ඒ විඩියෝ එක ඔහු කියලා තිබුණා මට ඒ කියපු එක වචනයක්වත් ස්වාමිනි මට තේරේන්නේ නැහැ

ප්‍ර: ඇයි මොන භාෂාවෙන්ද ඒක කරලා තිබුණේ?

පි: දෙමළ භාෂාවෙන් ස්වාමිනි.

ප්‍ර: ද්‍රවිඩ භාෂාවෙන්?

පි: දෙමළ භාෂාවෙන් තිබුණේ මම ඊට පස්සේ ඕක යැව්වා තුෂාර පිරිස්ට තුෂාර පිරිස්ට මම යවලා ඇහුවා මේ මොකෙක්ද කථා කරන්නේ මොනවද මේ මූ කියන්නේ කියලා ඒ භාෂාවෙන්ම තමයි කථාකරන්නේ මොනවද මූ මේ කියන්නේ කියලා මං මේ ඊට පස්සේ ස්වාමිනි ඔහු මට කිව්වා මේ අපේ උන්ට බනින එකක් මේ කරන්නේ

ප්‍ර: අපේ උන්ට කියන්නේ?

පි: සිංහල අයට අපේ උන්ට බනින එකක් මේ කරන්නේ මේක කියන්නේ අපේ උන් ආයුධ අතට ගත්තා වගේම අපේ ඒගොල්ලන්ගේ ආගම වෙනුවෙන් ඒ අපිත් ආයුධ අතම ගන්න ඕනේ අපිත් ප්‍රහාර මාලාවක් දියත් කරන්න ඕනේ කියල එයා කියනවා ස්වාමිනි. ඒ කියන එක ඒ විදියටම මට තුෂාර පිරිස් පැහැදිලි කරේ නැහැ. සහරාන් කියලා කෙනෙක් කියන්නේ කිව්වා ඊටපස්සේ මම ඔය සහරාන් කියන නම දන්නේම නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ වෙනකොට?

පි: අහලාවත් නැහැ.

ප්‍ර: ඒ මේ කොයි කාලේද?

පි ඔය 2018.03 වෙනි මාසේ ස්වාමිනි. ඊට පස්සේ මම ඔය වීඩියෝ එක දැම්මා නාලක සිල්වා මහත්මයටත් මං දාල මං එතුමාට කිව්වා මෙහෙම මෙහෙම විඩියෝ එකක් එවලා තියෙනවා සර් මේක බලන්න මොකක්ද දන්නේ නැහැ කවුද දන්නේ නැහැ කියලා හරි මං බලන්නම් නාමල් හරි මං ඒකට අදාල අංශයට ඒක මං යොමු කරන්නම් කියලා එතුමා කිව්වා ඒ විතරක් නෙමේ තව මට මතකයි එලවා එලවා මට ඒක හරියටම ඔලුවට එන්නේ නැහැ ස්වාමිනි එලව එලව කොටන විඩියෝ එකකුත් තිබුණා

FAIR COMMENT — BY JEZEEM

මොනවා හරි එකකින් ගහනවා ස්වාමිනි ඒ වගේ වීඩියෝ එකකුත් මට මතකයි ස්වාමිනි. ගහනවා ඒ දවස්වල මට අවා ඒකත් ආවේ පාන්දර වෙලාවක ඒකත් මං යැව්වා.තවත් පිරිසක් දුවනවා බයිසිකල් වගයක් පෙරලිලා ගිනි තියනවා හරි එහෙම ලොකු සිදුවීමක් වෙනවා ලංකාවේ ඇතුලේ එහෙ වීඩියෝ එකකුත් ආවා ඒත් මට මතක නැහැ ඒකත් ඔය අන්තවාදී සිදුවීමකට සම්බන්ධ එකක් ස්වාමීනි

ප්‍ර: දැන් ඔබ මේ වීඩියෝ එක ඇරියානේ නාලක සර් සිල්වා මහත්මයාට?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉතින් නාලක සිල්වා මහත්මයාගෙන් ඇහුවාද සර් මොකක්ද මේ කියලා?

පි: නෑ මම එතුමාගෙන් අහන්න ගියෙත් නැහැ ඊට පස්සේ මම හැබැයි ඒ වෙලාවේ කිව්වා සර් මේක බලලා මොකක් හරි කරන්න වෙයි කියලා. හැබැයි ඒකට ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ මම මේ ඕක මම පෙන්නුවා හැබැයි ශානි අබේසේකර මහත්මයාට.

ප්‍ර: ඒ කොයි කාලේද ශානි අබේසේකර මහත්මයා.....?

පි: ශානි අබේසේකර මහත්මයා හම්බෙන්නේ ස්වාමීනි මම නාලක සිල්වා මහත්මයා පිළිබඳව කථා කරන්න ගිහිල්ලා තමයි ශානි අබේසේකර මහත්මයා ඒක මම කොහේවත් ප්‍රකාශ කරලා නැහැ ස්වාමිනි ශානි අබේසේකර මට මේක දැන් කාට හරි කියන්න ඕන වෙලා මම කල්පනා කරනවා දැන් කියන්න කෙනෙක් ඇත්තේම නැහැ මං මේක මේ CID එකේ ඩිරෙක්ටර් මහත්මයාට කියනවා කියලා මම ඩිරෙක්ටර් මහත්මයාව සම්බන්ධ කරගෙන ඩිරෙක්ටර් මහත්මයාව හම්බ න්න යනවා.

ප්‍ර: කොයි කාලේද ඒ?

පි: ඒ 2018 කොහොමත් දිගන තෙල්දෙණිය ඔය ගැටුමෙන් පස්සේ සහරාන්ලාගේ ඔය වීඩියෝ ඔක්කෝම out වෙලා ඔක්කෝම සමථයට වුණාට පස්සේ මට මතක හැටියට 5 වෙනි මාසේ, 6 වෙනි මාසේ 04 වෙනි මාසේ , 05 වෙනි මාසේ වගේ.

ප්‍ර: 2018?

පි: එහෙමයි ස්වාමිනි මගේ ඒකට හරියටම දිනය මට හොයා ගන්න බැහැ ස්වාමිනි ඇතුලත් වීමේ ලේඛනයේ ඇති ස්වාමිනි මම ඇතුලත් වෙච්චි දිනය

ප්‍ර: 2018 මැද හරියේ කිව්වොත් හරිද? අවුරුද්දේ මැද?

පි: ඔව් 04 වෙනි මාසේ 05 වෙනි මාසේ වගේ

ප්‍ර: හරි ඔබ දැන් යනවා CID එකට?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ගිහිල්ලා?

පි: ඒ ගිහිල්ලා මම ශානි අබේසේකර මහත්මයාව හම්බෙනවා. හම්බෙලා මම කියනවා සර් මට කේස් 02 තියෙනවා. එකක් තමයි මම මෙන්න මෙහෙම

FAIR COMMENT BY JEZEEM

ලොකු වැඩක ගියා. ගියාට පස්සෙ මෙන්න මෙහෙම ප්‍රශ්නයක් මෙන්න මෙහෙම කතන්දරයක් තියෙනවා.

ප්‍ර: මොකක්ද මොකක්ද?

පි: මම කිව්වා සර් මෙන්න මෙහෙම නාලක සිල්වා මහත්මයා මේ වගේ යෝජනා ටිකක් කරලා තියෙනවා මට ඒ සම්බන්ධව මට ඔබතුමාට කියන්නත් ඕනේ. තව මෙන්න මෙහෙම වීඩියෝ එහෙකුත් තියෙනවා.

ප්‍ර: මොකක්ද මේ මෙන්න මෙහෙම වීඩියෝ එක?

පි: කවුද මේ මෙයාගේ එක සහරාන්ගේ එක ස්වාමිනි. වීඩියෝ එකකුත් තියෙනවා. ඒ වීඩියෝ එක මොකක්ද ඒ මොකක්ද ඒකට කරන්න පුළුවන් සර්ලාට ඒ සම්බන්ධව ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය කියලා මං ඇහුවා. ඊට පස්සේ හරි ඔය ටික ඔක්කෝම තියාගන්න පරිස්සම් කරලා මට ඔයාගේ phone number එක කියන්න කිව්වා. මං phone number එක කිව්වා. පොලිස්පතිතුමා ලංකාවේ නැහැ රට ගිහිල්ලා ඉන්නේ. පොලිස්පතිතුමාගෙන් අහන්නේ නැතිව මට මේකට කිසිම තීරණයක් ගන්න බැහැ කියලා කිව්වා.

ප්‍ර: හේතුවක් කිව්වද එතුමාට තීරණයක් ගන්න බැරි?

පි: පොලිස්පතිතුමාට කියන්න ගන්න බැහැ කිව්වා සර්. පොලිස්පතිතුමාට කියන්නේ නැතිව මේකට තීරණ ගන්න බැහැ කියලා කිව්වා. ඒ නිසා මට නැවත කථා කරලා කියන්නම් කියලා කිව්වා එන්න දිනයක් ස්වාමිනි අද වෙනකම් කථා කරේ නෑ ඒ දිනයට.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර: ඔබව ශානි අබේසේකර මහත්මයා ළඟට යොමු කරන්න කවුද ඔබට උදව් කරේ?

පි: මට වරකාපොල පොලීසියෙන් ස්ථානාධිපතිතුමා තමයි උදව් කරේ ස්වාමිනි. මම වරකාපොල පොලීසියේ ස්ථානාධිපතිතුමා ළඟට ගිහිල්ලා කිව්වා මට ලොකු කේස් එකක් තියෙනවා අපරාධමය තොරතුරක් තියෙනවා. මට මේක ඉහලට දාන්න ඕනේ. කවුද විශ්වාසවන්ත නිලධාරියෙක් ඉන්නේ පොලීසියේ කියල. ඊට පස්සේ කිව්වා කිසි ප්‍රශ්නයක් නැහැ නාමල් CID එකේ ඩිරෙක්ටර් මහත්මයා ශානි අබේසේකර මහත්මයා හොඳ වැඩකාරයා හොඳ වැඩකරන්න පුළුවන් කෙනෙක් හොඳට වැඩ කරන කෙනෙක්. විශ්වාසයත් රකිනවා කිසි ප්‍රශ්නයක් නැහැ. ඔයා ගිහිල්ලා එයාට කථා කරන්න කියලා මං කිව්වා සර් මං කොහොමද සම්බන්ධ කරගන්නේ කියලා ඉන්න මං කථා කරලා දෙන්නම් කියනවා එතකොටත් කථා කලා. වරකාපොල පොලීසියේ හිටියේ CIA ජනකාන්ත හෙට්ටිආරච්චි මහත්මයා එතුමා කථා කරලා කිව්වා මේ සර් මෙහෙම මගේ කොල්ලෙක් ඉන්නවා මෙහෙම තොරතුරු

FAIR COMMENT — BY JEZEEM —

වගයක් තියෙනවාලු සර්ට දෙන්න කැමැතියි කියලා කොහොමද හම්බෙන්නේ කියලා ඇහුවා ඊට පස්සේ කිව්වා හරි එවන්න මේ වරකාපොලින් ආවේ කියලා නාමල් කුමාර කියලා කියන්න කිව්වා' එතකොට ඇතුලට ගන්නම් කියලා. ඊට පස්සේ මං ගේට්ටුවට ගිහිල්ලා කිව්වා ගේට්ටුවෙන් මාව ඇතුලට ගත්තා ලියලා කරලා ඇතුලට ගත්තාට පස්සේ මං එතුමාට ගිහිල්ලා නාලක සිල්වා මහත්තයා පිළිබඳව සහ සිදුවීම අර සහරාන්ගේ වීඩියෝ එකත් මං ඒ වෙලාවේ පෙන්නුවා හැබැයි මම කණගාටු වෙනවා ස්වාමිනි. ශානි අබේසේකර මහත්මයා මං ළඟ කථා කරන කොට ගොඩක් වෙලා නින්ද ගිහිල්ලා හිටියේ. ඊට පස්සේ දෙපාරක් විතර ඔලුව උස්සලා මෙහෙම මෙහෙම වැටිලා ඉදලා මොකක්ද ඔයා කියන්නකෝ කියලා ඉවරවෙලා මම කිව්වා දෙපාරක් තුන්පාරක් මට ඊට පස්සේ එපාම වුණා ස්වාමිනි. නැවත මම කෝල් කරලාවත්.. ජනකාන්ත මහත්මයා ඇහුවා නාමල් මොකද අර වැඩේ වුණේ උඹ ගිය වැඩේ හරිද කිව්වාද මොකද වුණේ කියලා ඇහුවා මගෙන්. මං කිව්වා නෑ සර් මට කෝල් එකක් දෙන්නම් කියලා කිව්වා තාම කෝල් එකක් දුන්නේ නැහැ කියලා මම ඒ මනුෂයා හිත රිදෙන නිසා මං ඒ විදියට කිව්වා ස්වාමිනි. හැබැයි මට කවදාවක්වත් නැවත කෝල් එකක් දීලා අහන්න හිතුන් නෑ මේ ශානි අබේසේකර මහත්මයාගෙන් සර් මම අර කිව්වදේ මොකද තත්ත්වය කියලා මං අහන්නවත් හිතුන් නැහැ මොකද මං අර තරම් වැදගත් තොරතුරක් අරගෙන මේ වරකාපොල ඉදලා බස් එකේ ගිහිල්ලා වියදම් කරගෙන ගිහිල්ලා කියන කොට ශානි අබේසේකර මහත්මයාට නින්ද යනවා. ඉතින් එහෙම වුණාම වැඩක් නැහැ කියලා හිතලා තමයි මම ඊට පස්සේ මම ඒ ගැන අහන්නවත් ගියේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඊට අමතරව මොනවාහරි ශානි අබේසේකර මහත්මයාව දැනුවත් කළාද කාත්තන්කුඩි ප්‍රදේශයේ මොනව හරි සිද්ධින්**?**

පි: නැත ස්වාමීනි.

ප්‍ර: අලියාර් හන්දියේ සිදුවීම පිළි බඳව**?**

පි: අලියාර් හන්දියේ ඒ අලියාර් හන්දියේ අර පන්න පන්නා පහර දීම සම්බන්ධව ස්වාමිනි ඒ වීඩියෝ එක.

ප්‍ර: දැනුවත් කරා?

පි: ඒක ඒක කථා කරා ස්වාමීනි.

ප්‍ර: ඔහු මොනවද කිව්වේ ඒ සම්බන්ධයෙන්**?**

පි: ඔහු පොලිස්පතිතුමාගෙන් අහන්න ඕනේ කියලා කිව්වා හැමදේම ස්වාමිනී පොලිස්පතිතුමාගෙන් අහන්නේ නැතිව කිසිම ක්‍රියාමාර්ගයකට යන්න බැහැ කියලා කිව්වා ස්වාමිනි.

ප්‍ර: ඒකත් කිව්වේ නින්දෙන්ද?

FAIR COMMENT BY JEZEEM

පි: නෑ කථා කරනකොට ස්වාමිනි මම දැන් මගේ කොහොමත් ස්වාමීනි මගේ ඒක දුර්වලතාවයක් මගේ කථා කීරිම වැඩියි නමුත් ඒක මගේ දුර්වලතාවයක් වුණාට කියන්න තියෙන දේ සම්පූර්ණ පැහැදිලි කරලා කියන එක මගේ යුතුකම නිසා මම පැහැදිලි කරලා කියනවා ඉතින් මම කිව්වා කියනකොට නිදා ගත්තා. නින්ද ගියා ස්වාමිනි. හිතාමතා නිදා ගත්තා නෙමේ.

දැන් වේලාව : ප.ව 4.10
මෙතැන් සිට : නිල්මිණි කුමාරි

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.4.10
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් ඔබ කියා සිටියානේ මේ සම්බන්ධයෙන් ඔබ නාලක සිල්වා මහත්තයාටත් කිව්වායි කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ යම් ලිඛිතව ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කරාද?

පි : නැත ස්වාමිනි. ඔය කිසිම තොරතුරක් ලිඛිතව දන්වලා නැත ස්වාමිනි මෙතෙක් කාලයකට.

ප්‍ර : ඔබ අද දිනයේ සාක්ෂි දෙන විට 2020දී ලංකාව තුල අනිවාර්යයෙන්ම ප්‍රහාරයක් සිදු වෙන්න පුළුවන් කියන කතාවක් ගැන කියනවද?

පි : කියනවා ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ගැන ඔබ ලිඛිතව කාට හරි ලබා දුන්නද?

පි : මේ ගැන ලිඛිතව ලබා දුන්නා මේ 2020ට පෙර ප්‍රහාරයක් වෙන්න පුළුවන් කියලා ලියලා දුන්නේ නැහැ ස්වාමිනි. හැබැයි මම මේ යන විදියට ලංකාව තුල ත්‍රස්තවාදයක් නිර්මාණය වෙනවා. ඒ අනුව ගැටුම් ඇති වෙනවා. ජාතීන් අතර අසමඟියක් ඇති වෙනවා. මේක දේශපාලනික වශයෙන් බලපානවා කියලා මම නාලක සිල්වා මහත්තයාත් දීර්ඝ විදියට සාකච්ඡා කරලා එතුමන් එක්ක මං , එතුමාට මම කිව්වා. කිව්වට පස්සේ එතුමා මට කිව්වා ඒකට මොකක්ද කරන්නේ පුළුවන්නේ කියලා ඒකේදී මං කිව්වා මගේ දැනුමේ හැටියට ස්වාමිනි අද මේ කොමිෂන් එක කියන මම හිතනවා මං එතෙන්ට ආදේශ කරනවා. මම එදා කිව්වෙත් ඔන්න ඕකම තමයි. මම කිව්වා මම හිතුවේ ජනාධිපති කාර්ය සාධන බලකායක් හදන්න. නමුත් නාලක සිල්වා මහත්තයා සහ ඒ පරිසරය ඒකට ලොකු අවස්ථාවක් නොදුන්න නිසා, කැමැත්ත තිබුණේ අගමැතිතුමත් එක්ක කටයුතු කරන්න නිසා මම කිව්වා අග්‍රාමාත්‍ය කාර්ය.. මට වැඩක් නැහැ ස්වාමිනි අග්‍රමාත්‍ය නෙවෙයි ප්‍රාදේශිය සභා මන්ත්‍රීතුමා බලකායක් හරි කමක් නැහැ හැදිලා මගේ අරමුණ තිබුණේ මේක නැති කරන තැනට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන්න. එතකොට එහෙම යෝජනාවක් කරා ස්වාමිනි. එතනදී මම කිව්වා නාලක සිල්වා මහත්තයාට අනිවාර්යයෙන් මේ යන විදියට ගත්තොත් මේ ජාතීන් දෙක අතර මරාගෙන මැරීමක් සිද්ධ වෙනවාමයි අනිවාර්යයෙන්ම. මේ යන විදියට ගත්තොත් ප්‍රහාර මාලාවක් දියත් වෙනවා. ත්‍රස්තවාදයක් මෙතන අළු යට ගිනි වගේ පත්තු වෙන ගමන් තියෙන්නේ කියන එක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මම නාලක සිල්වා මහත්තයාත් එක්ක නිතර නිතර කතා කරා ස්වාමිනි.

ප්‍ර : ඔබ ලිඛිතව යම් ලේඛනයක් ලබා දීමක් සිදු කරාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කාටද ඒ?

පි : ඒ නාලක සිල්වා මහත්තයාට ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ ලබා දුන්නේ?

පි : ඒ ලබා දුන්නේ ස්වාමිනි මෙවැනි ප්‍රශ්න ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් නිසා මෙවැනි ප්‍රශ්න නිරාකරණය කරගෙන රටේ ජාතික ආරක්ෂාව පවත්වාගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙලක් තමයි මම ඒකේ හැදුවේ ස්වාමිනි. ඒ වැඩපිළිවෙළ මම පිටු 4කින් තමයි ලියලා තිබුණේ මම නෙවෙයි මගේ බිරිඳ ඒක ලිව්වේ. මම ලියලා දුන්නා note එකක් දාලා දුන්න එකක්. එතකොට බිරිඳ ඒක සටහන් කරලා දුන්නා. Type කරලා මොකුත් නැතුව නාලක සිල්වා මහත්තයාට ගෙනත් භාර දුන්නා. සම්පූර්ණ plan එක මේකේ හැදුවේ නැහැ ස්වාමිනි. සම්පූර්ණ plan එකක් කියන්නේ අද මේ පාස්කු කොමිෂම හදනවා කිව්වාම ඒක එක වචනයක් විතරයි. හැබැයි මේක ඇතුලේ කරන්න තියෙන අනිත් වැඩ කොටස තමයි ඒකට ඇතුලත් වෙන්න ඕනි. ඒ වගේ කාර්ය සාධන බලකායක් හදමු කියලා කිව්වා. කොමිෂන් ගැන මට ලොකු දැනුමක් තිබුණේ නැහැ ස්වාමිනි. ඒ කාර්ය සාධන බලකාය හරහා මෙවැනි ත්‍රස්තවාදී තොරතුරු පිළිබඳව අනාවරණය වෙන දේවල් අධිකරණයට කරුණු වාර්තා කරපු සමහර දේවල් තියෙනවා. ඒවාගේදී වෙච්ච දේවල් තියෙනවා ස්වාමිනි ඉතිහාසයේ වෙච්ච දේවල්. ඒ දේවලුත් අරගෙන වර්තමානයේ වෙන දේවල් අරගෙන, ඥානසාර අපි ස්වාමිනි මෙතන මම මෙතන විනාඩියක කාලයක් ඉල්ලනවා අදහස් ප්‍රකාශ කරන්න. ඥානසාර හාමුදුරුවෝ කියනවා උඹලා අර විදියට ඉඳපල්ලා මේ විදියට ඉඳපං උඹ එන්න එපා උඹගේ අතපය කඩනවා. ඇට තලනවා. මරනවා ගහනවා කියනවා ස්වාමිනි. මේ ආගමක් ජාතියක් වෙනුවෙන් මොකක් හරි. අනික් පැත්තෙන් අබ්දුල් රාසීක්ලා කියනවා බුදු හාමුදුරුවෝ කියන්නේ මීනිමස් කාපු එකෙක් මේ පිළිගන්න එපා මෙහෙමයි කියලා මේ පැත්තෙන් කතාවක් එනවා ස්වාමිනි. එතකොට මෙවැනි අර්බුදයක් දිගින් දිගට වෙනකොට මේක ගැන හොයා බලන්න කිසිම වැඩපිළිවෙළක් රටේ ක්‍රියාත්මක වුණේ නැහැ ස්වාමිනි ඉතාමත්ම කණගාටුවෙන් මං ප්‍රකාශ කරනවා මෙතන. ඉතින් ඒ නිසා මෙවා ගැන හොයලා බලන්න මේවා එක්කෝ බැහැ. එක්කෝ පුළුවන්. මේකේ ඇත්ත මේක බොරුව මේක. මේකේ තියෙන්නේ

FAIR COMMENT BY JEZEEM

මිත්‍යා මතය මෙතන තියෙන්නේ කියලා හරියට ඒක ඒ මිනිස්සුන්ට ඒ අදහස් ඉදිරිපත් කරලා තර්ක කරලා ඒ යෝජනා චෝදනා ඉදිරිපත් කරලා ස්වාමිනි හරි නිවැරදි තීන්දුවකට රටක් විදියට එන්න අවශ්‍ය තැනක් නිර්මාණය වෙලා තිබුණ් නැහැ ස්වාමිනි. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ හරි අපට අවස්ථාවක් ලැබිලා තියෙනවා මේ ඉස්සරහට නිර්මාණය වෙන්න තියෙන ත්‍රස්තවාදය වළක්වා ගන්න අවශ්‍ය පසුබිම ඒ කියන්නේ ඒ කටයුතු සැඟවෙලා තියෙන දේවල් එළියට අරගෙන මේක මේක ඇතුලේ මෙන්න මෙහෙම දෙයක් තියෙනවා කියන එක කතා කරලා ඒකෙන් වැළකෙන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කර ගන්න අපට අවස්ථාව ලැබිලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ ලබා දීපු ලේඛනය කෝ දැන්?

පි : ඒ ලබා දීපු ලේඛනය මගේ ළඟ නැහැ ස්වාමිනි. ඒක නාලක සිල්වා මහත්තයා ළඟ ඇති ස්වාමිනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර : ඔබ ඒ පිටු 4ක් පුරා ඒ ලේඛනය සකස් කරා කියලා කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොනවද ඒ පිටු 4ක් පුරා ලිව්වේ?

පි : පිටු 4ක් පුරා ලිව්වේ ස්වාමිනි කාර්ය සාධන බලකායක් හදන්න ඕනි. ඒ කාර්ය සාධන බලකාය හරහා ඒකේ වෙනම මාධ්‍යය ආයතනයක් හදන්න ඕනා. ඒ මාධ්‍යය ආයතනය හදනවා වගේම ලංකාවේ ප්‍රශ්න ගැටුම් ඉදිරිපත් කරන ජාතීන් අතර අසමඟියක් ඇති වෙන ආකාරයේ ප්‍රශ්න ගැටුම් ඇති කරන අය කැඳවන්න ඕනි ඒවට. කැඳවලා ඒවාගේ විමර්ශනය කරන්න ඕනි. විමර්ශනය කරලා ඒ වගේ වැරදිකාරයෝ ඉන්නවානම් ඒවාට ඉහළ දඬුවම් ලබා දෙන්න අධිකරණවලට ඒ අවශ්‍ය බලය හදලා ඒවගේ වැරදි කරන අය ඉන්නවා නම් අධිකරණවලින් දඬුවම් කිරීමේ වැඩ පිළවෙළවක් ආරම්භ කරන්න ඕනි. මෙන්න මේ වගේ දේවල් තමයි ස්වාමිනි ඒකේ තියෙන්නේ.

ප්‍ර : ලිපිය භාර දුන්න අවස්ථාවේ දී නාලක සිල්වා මහත්තයා ඔබට මොනවද කියපු දේවල්?

පි : මේවා කියවන්න පුළුවන් වෙයිද කියලා ඇහුවා. මං කිව්වා මුතු ඇට වගේ ලියලා තියෙන්නේ සර්. Wife තමයි ලිව්වේ කියලා කිව්වා. එතුමා කිව්වා හරි ප්‍රශ්නයක් නැහැ මම ලබන මට මතක හැටියට මම රට යනවාද කොහේද මොකක් හරි එහෙම කතාවක් කිව්වා. රට ගිහිල්ලා ආපුවහම ඇමතිතුමා ඉන්නවා කිව්වා ලබන සතියේද කොහේදෝ ඉන්නවා. ඒ ඇමතිතුමා හම්බ වෙලා අපි මේක සාකච්ඡා කරමු. ඒ යනකොට හරියටම තියෙන්න point වලින්

FAIR COMMENT BY JEZEEM

තියෙන්න ඕනි ඔයා තමයි මේක පැහැදිලි කරන්න ඕනි. ඔයා තමයි මේ යෝජනා ටික දෙන්න ඕනි කියලා නාලක සිල්වා මහත්තයා කතා කරනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : අර 2018 මාර්තු මාසේ වරකපොළ ප්‍රදේශයේ කෝලහලයකුත් ඇති වෙන්න ගියාද?

පි : 2018 මාර්තු මාසේ 5 වෙනිදා නැහැ 6 වෙනිදා තමයි ඔය පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ ස්වාමිනි. මුහුණු පොතේ facebook messenger හරහා පණිවිඩයක් සංසරණය වෙනවා.

ප්‍ර : ඒ අර දිගන සිද්ධියෙන් පස්සේද ඉස්සරවෙලාද?

පි : දිගන සිද්ධියට ඉස්සරවෙලා ස්වාමිනි. Message එකක් සංසරණය වෙනවා. නාංගල්ල මුස්ලිම් පල්ලියේ ආයුධ වගයක් ගෙනත් බෑවා. KDH වැන් එකකින් ගෙනත් බෑවේ. MAS Holdings එකේ Security කරන කෙනෙක් තමයි මේක දැක්කේ. මේ පල්ලියේ ආයුධ තියෙනවා කියලා. ස්වාමිනි ආයුධ තියෙනවද නැද්ද කියන්න මම දන්නේ නැහැ. හැබැයි මට තිබුණා ඒ වෙලාවේ යුතුකමක් සහ වගකීමක්. මම වෙලා තියෙන දේවල් දන්නවා. ඒ දන්න නිසා මම දන්නවා තරුණයෙක්ගේ පිබිදීම කොතනදත් කියලා. අලව්ව අවටත් ඒ වගේ තරුණයෝ ඉන්නවා කියලා මම දන්නවා ස්වාමිනි. ඒක නාලක සිල්වා මහත්තයාත් දන්නවා හොඳටම. ඊට පස්සේ මම වරකාපොළ පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. මෙන්න මෙහෙම ප්‍රකාශයක් සංසරණය වෙනවා. ජාතීන් අතර ගැටුමක් ඇති වෙන්න පුළුවන් මේක වැඩිදුරට ගියොත්. ඔබතුමාලා මේ පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරලා මේක තිබුණද නැද්ද කියලාවත් අඩු තරමේ මිනිස්සුන්ට කියන්න කියලා.

ප්‍ර : කාටද කියන්නේ?

පි : මම වරකාපොළ පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා ස්වාමිනි. ඒ පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ 2018 /03 මාසේ 06 වෙනිදා උදේ. රෑ තමයි අපේ නාලක සිල්වා මහත්තයා ගෝලයෝ දෙන්නෙක් එක්ක නුවර යන්නේ. දිගන තෙල්දෙණිය ගැටුම සමථයකට පත් කරන්න ස්වාමිනි.

ප්‍ර : එතකොට වරකාපොළ සිද්ධියට මොකද වුණේ?

පි : වරකාපොළ සිද්ධිය ස්වාමිනි මම පැමිණිල්ල ඉදිරිපත් කරා. මට කරන්න පුළුවන් දේ මම කරා. මට ඊට වැඩිය කරන්න පුළුවන් දෙයක් නැහැ. මම නුවර ගියා ස්වාමිනි. මම OIC මහත්තයාට කතා කරලා ඇහුවා මොකක්ද ප්‍රශ්නේ බැලුවද කියලා. නාමල් බැලුවා එතන ඇති

FAIR COMMENT — BY JEZEEM —

දෙයක් නැහැ. ඒක මේ බොරුවට ගහපු මොකක් හරි Message එකක්. මොකක් හරි බොරු කතාන්දරයක් එතන තිබ්ලා තියෙන්නේ. ඒක ප්‍රශ්නයක් නැහැ. එහෙම මොකුත් නැහැ කියලා කිව්වා.

ප්‍ර : සාක්ෂිකරු කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබේ යාළුවෙක්ද?

පි : cell එකේ ඉන්න කාලේ නම් වෙලාවකට තර්ක කරන කෙනෙක්. වෙලාවකට යාළුවෙක්.

ප්‍ර : ඔහුද ඔබ අර ගුරුවරයෙක් ලෙස හඳුන්වපු පුද්ගලයා?

පි : එහෙමයි ස්වාමිනි. ඔහු කැකිරාවේ. ඔහුගේ තාත්තා මිය ගිහිල්ලා. අම්මා ඉන්නවා. ළමයි 4 දෙනෙක් ඉන්නවා. වයස අවුරුදු මගේ වයසමයි. එතකොට රැකියාව විදියට කළේ ගුරු වෘත්තිය. විද්‍යාව අංශයෙන් තමයි ඉගැන්වුයේ. අනුරාධපුර පාසලක ඉගැන්වුවා. ඔහු විද්‍යා පීඨයේ ඉන්න කාලයේ විද්‍යා පීඨයේ ඉන්න කෙනෙක් එක්ක යාළු වෙලා Tamil කෙනෙක් යාපනයේ. ඇයව කසාද බඳිනවා. විවාහ වුණාට පස්සේ ඔවුන් ඒ ෆායිස්ගේ ගෙදර පදිංචි වෙනවා. ටික කාලයක් ගියාණ පස්සේ මොවුන්ට සම්බන්ධ වෙනවා ශ්‍රී ලංකා තවුහිද් ජමාත් SLTJ කියන සංවිධානය. එතකොට හිටපු මහා ලේකම් අබ්දුල් රාසීක්. අබ්දුල් රාසීක් සම්බන්ධ වෙලා වෙනවා අබ්දුල් රාසීක් කියනවා. එතකොට අබ්දුල් රාසීක් මෙයත් එක්ක සම්බන්ධ වෙන්න හේතුව මෙයත් එවැනි අදහස් ඉදිරිපත් කරන්නේ facebook එකේ. අදහස් ප්‍රකාශ කරන කෙනෙක් ස්වාමිනි. ඒ ප්‍රකාශ කරන කෙනෙක් නිසා මොහු ගුරුවරයෙක් නිසා අබ්දුල් රාසීක් මොහුත් එක්ක සම්බන්ධතාවයක් ගොඩනඟා ගන්නවා. එහි ප්‍රතිඵලයක් විදියට ස්වාමිනි...

ප්‍ර : කොයි කාලේද ඒ ගොඩනඟා ගැනීම සිදු වෙන්නේ?

පි : එහි ප්‍රතිඵලයක් විදියට මොහුට ඒ සම්බන්ධතාවය ගොඩ නඟාගන්නේ ස්වාමිනි 2011, 2012 වගේ. එතකොට ඒ 2009 ඉඳලා මොහු මොහුගේ කටයුතු අන්තවාදී අදහස් ප්‍රකාශ කිරීම මොහු 2009 යේ ඉඳලා ක්‍රියාත්මක කරගෙන යනවා.

ප්‍ර : මොහු කියන්නේ?

පි : කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් කියන පුද්ගලයා. ඊට පස්සේ...

ප්‍ර : කොහේ කොහේද ඒ ප්‍රචාරය කරන්නේ?

පි : ස්වාමිනි.

ප්‍ර : කොයි ප්‍රදේශයේද ඒ ප්‍රචාරණය කරන්නේ?

පි : ඔහුගේ මුහුණු පොත හරහා තමයි ඒ ප්‍රචාරණය කරන්නේ ස්වාමිනි. ඔහුගේ මුහුණු පොත හරහා ඔහු අන්තවාදී අදහස් ප්‍රකාශ කරගෙන

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

යනකොට ඒ අදහස් බලලා තමයි අබ්දුල් රාසීක් ඔහුත් එක්ක සම්බන්ධ වෙන්නේ. 2011 , 2012 විතර. ඒ සම්බන්ධ වෙලා මොවුන් අබ්දුල් රාසීක් මොවුන්ට අදහස් ඉදිරිපත් කරනවා. මොවුන් දෙන්නාම දැනුමක් තියෙන අය නිසා ඔවුන් එකතු වෙලා කටයුතු කරනවා. ඉන් පසුව ඔවුන් තීරණය කරනවා ලංකාවේ රැල්ලක් ගොඩ නැහෙනවා ස්වාමිනි සිංහලේ කියලා. මේ සිංහලේ කියලා රැල්ලක් ගොඩ නැහෙන්නේ සිංහල තරුණයන්ගේ සිංහල ජාතිකයන්ගේ ලේවල තියෙන අභිමානය නිසා කියලා මේගොල්ලෝ අපේ සිංහල තරුණයෝ කියනවා මම සිංහලයෙක්. මගේ ඇහේ දුවන්නේ සිංහල ලේ කියලා කියනවා ස්වාමිනි. ඒක මගේ කන්වලටත් ඇහිලා තියෙනවා. මෙන්න මේ වචනය අභිමානවත් නිසා මේ අය සැලසුම් කරනවා සංවිධානාත්මකව මේකට දෙයක් කරමු කියලා. එහි ප්‍රතිඵලයක් විදියට ස්වාමිනි මොවුන් සැලසුම් කරා ලේ ලබාදීමේ වැඩසටහනක්. ලේ දන්දීමේ ජාතික වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න මුස්ලිම් අයගෙන්. සිංහල අයගෙන් නෙවෙයි ස්වාමිනි මුස්ලිම් අයගෙන්. ඒ වැඩ සටහන ඔවුන් දියත් කරන්නේ කවදා හරි තව අවුරුදු කිහිපයක් ගියාම සිංහලේ සිංහලේ කිව්වම ඇයි උඹලා සිංහලේ කියන්නේ ඇයි මොකක්ද සිංහලේ කියන්න තියෙන වටිනාකම කියලා කිව්වම අපේ ඇහේ දුවන්නේ සිංහල ලේ කියලා කිව්වම නැහැ උඹලාගේ ඇහේ සිංහල ලේ විතරක් නෙවෙයි දුවන්නේ මුස්ලිම් ලේත් දුවනවා. අපි ලේ දීලා තියෙන්නේ කියන තර්කය ගොඩ නඟන්න තමයි ස්වාමිනි ඒ වැඩේ ඔවුන් සැලසුම් සහගතව තමයි එය ක්‍රියාත්මක කරන්නේ ස්වාමිනි. ඊට පස්සේ මොවුන් මේ විදියට ලේ point 6500ක් පාසල්වලින් ලබා ගන්නවා ස්වාමිනි. ලේ point 6500ක් මොවුන් රජයේ ලේ බැංකුවට ලබා දෙනවා ස්වාමිනි. 2015 මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අබ්දුල් රාසීක්ට මේකට සම්මානයකුත් ලබා දෙනවා ස්වාමිනි. මෙන්න මේ සම්මානය ලබා දීමේදී කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස්ගේ නම මේකට ඇතුලත් වෙච්ච නැති නිසා මොවුන් ආගම වෙනුවෙන් මේ කැපකිරීම කරනවා කියන මිනිස්සු තමන්ගේ නම ඒකට දැම්මේ නැති වුණාට මේ දෙන්නා අතර සට්ටනයක් ඇති වෙනවා ස්වාමිනි. මේ සට්ටනය ඇති වීමේ ප්‍රතිඵලයක් විදියට SLTJ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියන සංවිධානයෙන් කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් ඉවත් වෙනවා ස්වාමිනි. ඉවත් වුණාට පස්සේ ටික දවසක් යනකොට අබ්දුල් රාසීකුත් ඒකෙන් අයින් වෙනවා. අයින් වෙලා අබ්දුල් රාසීක් සිලෝන් තවුහිද් ජමාත් කියන STJ කියලා සංවිධානයක් පිහිටුවා ගන්නවා ස්වාමිනි. ඒකේ මහා ලේකම් විදියට ඔහු කටයුතු කරනවා ස්වාමිනි. ඊට පස්සේ අබ්දුල් රාසීක්ට තරහා ඔය attack කරගෙන යන මේ ගමනේ අබ්දුල් රාසීක්

FAIR COMMENT BY JEZEEM

පිළිබඳව විරුද්ධ අදහස් ප්‍රකාශ කරනකොට SLTJ ඒකේ මුලින් හිටපු සාමාජිකයෙක් විදියට සහරානුත් මේ හැම දෙයක්ම දන්නවා අබ්දුල් රාසීක් පිළිබඳව. සහරාන් මෙන්න මෙතනදී සම්බන්ධ වෙනවා කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් එක්ක. සම්බන්ධ වෙලා අබ්දුල් රාසීක්ට විරුද්ධව කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් සහරාන් එක්ක සම්බන්ධ වෙන්නේ වෙන දේකට නෙවෙයි. අබ්දුල් රාසීක්ට විරුද්ධව ක්‍රියාත්මක වීමේ චේතනාවෙන්.

ප්‍ර : ඇයි ඒ?

පි : අබ්දුල් රාසීක් අර ගත්ත සම්මානයට ඒ සම්මානය නිවැරදි හිමිකරු කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් වන නිසා ඔහුට ඒ සම්මානය ලබා නොදුන්න නිසා තමයි ඔහු අබ්දුල් රාසීක් එක්ක තරහා වෙන්නේ. ඒ තරහා වෙලා අයින් වෙනවා. අයින් වෙනකොට සහරානුත් අබ්දුල් රාසීක් එක්ක තරහායි.

ප්‍ර : ඒක තමයි. මං ඇහුවේ සහරාන් ඇයි තරහා?

පි : තරහා වෙන්න හේතුව ස්වාමිනි ඔය අන්තවාදී අදහස් දරණ බොහෝ පිරිසකට නායකයෝ කියන අයට එකට ඉන්න බැහැ ස්වාමිනි. ඒක අපේ සිංහල අයගේ අතරත් තියෙනවා ස්වාමිනි. එහෙම අවස්ථා මම දැකලා තියෙනවා ස්වාමිනි. දැන් ඔය ගත්තොත් අපි ස්වාමිනි සත්‍යම කතා කරනවානම් අපේ ඔය කියන ජාතී, අපි දැන් කියනවානේ ජාතීවාදී ජාතිය වෙනුවෙන් කතා කරනවා වගේ ඉන්න නායකයෝ ඉන්නවානේ ස්වාමිනි. ඔය එක්කෙනෙක්වත් එක්කෙනෙකුට එක්කෙනෙක් සම්බන්ධතාවයක් සෘජු සම්බන්ධතාවයක් යාළුවෝ වගේ ඇසුර කරන සම්බන්ධතාවයක් නැහැ. හැම තැනම තියෙන්නේ මමත්වයෙන් තමන්ගේ සංවිධානයක් ගොඩ නඟාගෙන ඉස්සරහට යෑම. මට දෙයක් කර ගැනීම තමයි ඔය හැම කෙනෙක්ගේම අරමුණ. ඒ අන්තවාදී අදහස් දරණ අයගේ ඒක තියෙනවා ස්වාමිනි. අබ්දුල් රාසීක්ගේ සහරාන්ගේ ඒක තිබුණා ස්වාමිනි අබ්දුල් රාසීක්ගෙත් ඕක තිබුණා.

ප්‍ර : ඔබේ පිළිතුර එපමණයිද?

පි : ස්වාමිනි තව ටිකක් කතා කරන්නම් ඒ සම්බන්ධව.

ප්‍ර : කියන්න කියන්න.

පි : ඉතින් එතනදී අබ්දුල් රාසීක් එක්ක තරහා නිසා සහරාන් එක්ක කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් සම්බන්ධ වෙනවා. ඒ සම්බන්ධ වෙලා සහරාන් එක්ක කටයුතු කරගෙන යනකොට තමයි අවසානයේ කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අත්අඩංගුවට පත් වෙන්නේ. අපි දෙන්නා එක සිර මැදිරියේ ඉන්නේ. ඔහු ඉගෙන ගත්තු කෙනෙක්. ඒ නිසා මම තීරණය කරා ඔහුත් එක්ක ලොකු හිතවත්කමක් ගොඩ නඟා ගත්තොත් ගොඩක් දේවල් ගන්න

FAIR COMMENT BY JEZEEM

පුළුවන් කියලා. අනිත් එක ඔහුට සිංහල කතා කිරීමේ ලොකු හැකියාවක් තිබුණා. සිංහල ලියන්නත් හැකියාව තිබුණා. ඒ නිසා ඒ තොරතුරු ලබා ගන්න හැකියාව ලැබුණා ස්වාමිනි.

ප්‍ර : ඒ ලබා ගත්ත තොරතුරු ඔබට කීමට හැකියාවක් තියෙනවද තව?

පි : ඔහුගෙන් කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස්ගෙන් ලබාගත්තේ ඒ තොරතුරු ස්වාමිනි. ලේ බැංකුවට ලේ ලබා දුන්නා කියන ඒ තොරතුරු පමණයි ස්වාමිනි. ඒ වගේම ද්‍රවිඩ කාන්තාවන් විවාහ කර ගන්න හේතුව.

ප්‍ර : උදයේ ප්‍රකාශ කරපු විදියට?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු 4.50ට නැවත ආරම්භ කරනවා.

දැන් වෙලාව : ප.ව.4.30

****

දැන් වෙලාව : ප.ව.5.05

සම්පූර්ණ නම : අත්තනායක මුදියන්සේලාගේ නාමල් කුමාර. ප්‍රතිඥා දී සාක්ෂියට කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධී නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු කෆාඩින් ෆාරුක් කියන අයගේ බිරිඳ ඇය දැන් ඉස්ලාම් ධර්මය වැළඳගෙනද තියෙන්නේ කියන එක ගැන ඔබට අවබෝධයක් තියෙනවද?

පි: ඉස්ලාම් ධර්මය වැළඳගෙන තියෙන්නේ ස්වාමීනි

ප්‍ර: ඇය මෙම ෆායිස් යන අයගේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධතාවයක් දක්වනවද නැද්ද කියලා ඔබට අවබෝධයක් තියෙනවද?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔබට තියෙන අවබෝධය?

පි: කෆාර්ඩීන් මොහොමඩ් ෆායිස් අබ්දුල් රාසික් එක්ක එකතු වෙලා මේ ලේ දන්දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න හදන කොට ෆායිස් සහ ඇගේ බිරිඳ ගුරුවරු විදියට උගන්වනවා පස්සේ මේ දෙන්නම රැකියාවෙන් ඉවත් වෙලා කොළඹ මාලිගාවත්ත ප්‍රදේශයට ඇවිල්ලා කූලි නිවාසයක නවතිනවා ඒ කූලි නිවාසයට රුපියල් 15000/= ක මුදලක් අබ්දුල් රාසික් ගෙවනවා. ඒ රැකියා දෙකම අතහැරලා තමයි මාලිගාවත්ත ප්‍රදේශයේ මොවුන් නැවතිලා ඉන්නේ. ඒ නැවතිලා ඉන්න ගමන් තමයි ස්වාමිනි මේ

FAIR COMMENT BY JEZEEM

වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ පූර්ණ වශයෙන් බිරිඳ මේකට රැකියාවක් විදියට එවැනි සම්පූර්ණ කැපකිරීමක් කරන්නේ නැහැ. නමුත් ෆායිස් කරන කටයුතුවලට අවශ්‍ය සහයෝගය ඇය ලබා දෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ කියා සිටියා සහරාන් හසිම් කියන ස්වයං ඝාතකයාත් SLTJහි සංවිධානයේ සමාජිකයෙක් වෙලා හිටියා කියලා?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඔබට මොකක්ද ඒ සමාවෙන්න සහරාන් SLTJ සාමාජියෙක් වෙලා හිටිය බවට ඔබට යම් සාක්ෂියක් තියෙනවද?

පි: සාක්ෂියක් නැහැ ස්වාමිනි.

ප්‍ර: එසේ නම් ඔබ කොහොමද ප්‍රකාශ කරන්නේ සහරාන් SLTJ එකේ සමාජිකයෙක් වෙලා හිටියා කියන එක?

පි: ස්වාමිනි මම ෆායිස්ගෙන් ඇහුවා ඔබට කොහොමද සහරාන් සම්බන්ධ වෙන්නේ කියලා හොයලා බැලුවා එතනදි මට ෆායිස් තොරතුරු ලබා දුන්නේ සහරානුයි මමයි දෙන්නමය එක සංවිධානයේ කලින් හිටියේ සහරාන් සංවිධානයෙන් අයින් වෙලා යන්නේ අබ්දුල් රාසික් එක්ක ප්‍රශ්නයක් ඇතිවෙලා

ප්‍ර: මොකක්ද ප්‍රශ්නේ කියලා කිව්වද?

පි: ප්‍රශ්නේ මොකක්ද කියලා කිව්වේ නැහැ ස්වාමිනි. ඒ අය දරන අදහස් මතවාදවල ගැටලුවක් තියෙනවා කියලා කිව්වේ ස්වාමිනි. මං ඒ ප්‍රශ්නය මොකක්ද කියලා පැහැදිලි කරලා අහන්න ගියේ නැහැ ඒ නිසා එකම සංවිධානයේ ඉදලා දෙන්නා මාරුවෙලා ඉස්සෙල්ලම සහරාන් යනවා පසුකාලිනව තමයි ෆායිස් යන්නේ ඒ වෙලාවෙ තමයි ෆායිස් කිව්වේ අපි දෙන්නම සහරාන් මටත් කලින් ඒ සංවිධානයට සම්බන්ධ වෙලා තියෙන්නේ සහරාන් ප්‍රශ්නයක ඉන්නවා කියලා මම දැන ගෙන හිටියේ නැහැ මගේ අදහස් ඉදිරිපත් කරන කොට කෆාර්ඩීන් ෆායිස්ගේ අදහස්වලට සහරාන් එකඟ වෙලා කියලා තියෙනවා මමත් මේ සංවිධානයේ වැඩ කරේ මටත් මෙන්න මෙහෙම ප්‍රශ්න තියෙනවා එයත් එක්ක වැඩ කරන කොට කියලා ඒ නිසා තමයි දෙන්නා එකතු වෙලා තියෙන්නේ එතන දි තමයි මම දැන ගත්තේ සහරාන් ඒ සංවිධානයේ ඉඳලා තියෙනවා කියලා ස්වාමිනි

ප්‍ර: ඔබ NTJ කියන එහෙම නැත්නම් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ගැන කොයි කාලේද දැන ගත්තේ?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳ දැන ගන්නේ ස්වාමිනි සංවිධානයක් විදියට මම දැන ගත්තේ මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: SLTJ එහෙම නැත්නම් ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔබ එවකට පොලිස්පතිව සිටි පූජිත් ජයසුන්දර මහත්මයාව දැනුවත් කරලා තියෙනවද?

පි: SLTJ පූජිත් ජයසුන්දර මහත්මයාට මම ඒ සම්බන්ධව මට මතක නැහැනේ ස්වාමිනි. මතක නැහැ ස්වාමිනි

ප්‍ර: ඔබ කිසියම් සංවිධානයක් අන්තවාදී ආගමික සංවිධානයන් ගැන හිටපු පොලිස්පතිවරයාව දැනුවත් කරලා තියෙනවද ඔබ?

පි: සිලෝන් තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව කථා කරලා තියෙනවා

ප්‍ර: මොනවද ඒ?

පි: නමුත් නාලක සිල්වා මහත්මයාත් එක්ක තමයි කථා කරලා තියෙන්නේ මට පූජිත් ජයසුන්දර මහත්මයා එක්ක කථා කරපු එක මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කර සිටියා මේ අපේ ජන බල පක්ෂය සම්බන්ධයෙන් සහ එහි කටයුතු මහසෝන් බලකාය ගැනත් ඔබ කියා සිටියා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ දන්නවද සිංහල රාවය කියලා සංවිධානයක් ගැන?

පි: අහලා තියෙනවා ස්වාමිනි නමුත් මම සංවිධානය පිළිබඳව ලොකු දෙයක් දන්නේ නැහැ ස්වාමිනි

ප්‍ර: එතකොට සිංහලයේ ජාතික බලමුළුව?

පි: ඒ සංවිධානය පිළිබඳව ස්වාමිනි ප්‍රකාශ කරා අරඹේපොල රතනසාර ස්වාමින් වහන්සේ ඒ සංවිධානයේ මහලේකම් විදියට කටයුතු කරනවා ස්වාමිනි.

ප්‍ර: හරි සිංහලයේ ජාතික සංවිධානය?

පි: සංවිධානය ආරම්භ කිරීමේ දී සාලිය ටී. රණවක කියලා කෙනෙක් ක්‍රියාත්මක වුණා ඊට පස්සේ ජනිත මීපගේ කියලා කෙනෙක් හිටියා ඊට පස්සේ හිටියා දැන් ඩ්‍රැන් ප්‍රියසාද් කියලා කෙනෙක් සංවිධානයේ සභාපති විදියට කටයුතු කරනවා ස්වාමිනි.

ප්‍ර: ඩ්‍රැන් ප්‍රියසාද් ඔබ සහ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා ඔය මේ තිදෙනා අතර මොනව වගේ සම්බන්ධතාවයක්ද තිබුණේ?

පි: ස්වාමිනි රොහින්ගියා සිදුවීමෙන් පස්සේ ඒ සිදුවීමට අදාල සැකකරුවන් අත්අඩංගුවට ගන්න නාලක ද සිල්වා මහත්මයා මට කථා කරලා කිව්වා ජාතික ආරක්ෂාව පිළිබඳව මෙතන තියෙන ප්‍රශ්නයක් ඒ නිසා මෙතන ජාතියක් ගැන ආගමක් ගැන නෙමේ මෙතන කථාව රටේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තියෙන්නේ අපි මෙකේ තොරතුරු ටික හොයා ගන්න ඕනේ කියලා ඊට පස්සේ මම තුෂාර පිරිස්ට කථා කරලා තුෂාර පිරිස්ගෙන් ඇහුවා මොකක්ද දැන් මගෙන් මුකුත් කෙරෙන්න නැද්ද ඔය පහර දීම්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්බන්ධව මගෙන් මොනවාහරි දෙයක් කෙරෙන්න තියෙනවා නම් කියන්න කියලා

ප්‍ර: මොන පහරදීම් ගැනද?

පි: රොහින්ගියා සරණාගතයින්ට පහර දීම සම්බන්ධව ස්වාමිනි. ඊට පස්සේ මගෙන් කෙරෙන්න දෙයක් නැහැ කිව්වා ගහලා ඉන්න මිනිස්සු හැංගිලා ඉන්නේ පුළුවන් නම් ආරක්ෂා කරලා ආරක්ෂාව සහිතව තියා ගන්න බලන්න කිව්වා ඊට පස්සේ ඩ්‍රෑන් ප්‍රියසාද් සම්බන්ධව තුෂාර පිරිස් අනාවරණය කරා. පස්සේ අපි ඔහුවත් අත්අඩංගුවට ගැනීමටත් අවශ්‍ය කටයුතු කරා ඩ්‍රෑන් ප්‍රියසාද් පිළිබඳව පසුව හොයාගෙන යන කොට මම හඬපටයකුත් මම හිතන්නේ මගේ ළඟ තිබුණා ඔව් තිබුණා ස්වාමිනි. සිරිපාදය පැත්තේ අර හෝටලයක් හදන ඉඩමක හෝටලයක් හදන ඒ හිමිකරුව ලංකාවට එන වෙලාවේ පැහැර ගැනීමකට සැලසුම් කරා තුෂාර පිරිස් එක්ක තුෂාර පිරිස්ගේ නියෝජිතයා විදියට. තුෂාර පිරිස් මේක සැලසුම් කරන්න මට කියනවා නාමල් මේක ගිහිල්ලා සැලසුම් කරන්න කියලා ඔයාට මම ඒකට ඩ්‍රෑන් ප්‍රියසාද් සම්බන්ධ කරලා දෙනවා කියලා කියනවා ස්වාමිනි එවැනි තොරතුරුත් එක්ක මම තීරණය කරනවා මේ මට එන තර්ජන කොහොම වුණත් ස්වාමිනි. මේවා ත්‍රස්තවාදි අදහස් කියලා ස්වාමිනි ඩ්‍රෑන් ප්‍රියසාද් ඒ ත්‍රස්තවාදී අදහස් දරන පුද්ගලයෙක් විදියට මම රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ප්‍රකාශ කරන්න කැමතියි ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ ඔහු සමඟ තියෙන අමනාපයක් නිසාද ප්‍රකාශ කරේ?

පි: කිසිදු අමනාපයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට නාලක ද සිල්වා හිටපු දැන් වැඩ තහනමට ලක් වෙලා ඉන්න නියෝජ්‍ය පොලිස්පතිතුමා?

පි: පැහැදිලි මදි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔහු දැන් මේ ත්‍රිකෝණයේ ඔබ, ඩ්‍රෑන් ප්‍රියසාද් සහ නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහත්මයා හිටියානේ. ඔබ ඩ්‍රෑන් ප්‍රියසාද් ගැන කිව්වා නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහත්මයා ගැන මොකක්ද ඔබට කියන්න තියෙන්නේ?

පි: නාලක ද සිල්වා මහත්මයා පිළිබඳව ස්වාමිනි අහන්නේ මට නාලක සිල්වා මහත්මයා පිළිබඳව අහන කාරණය මට පැහැදිලි නැහැ.

ප්‍ර: හරි මං පැහැදිලි කරන්නම් පසුවට දැන් සාක්ෂිකරු අර නවුෆර් මවුලවි ෆාහිස්, ඉෆ්රාන් එතකොට මුෆිස් මාවනැල්ලේ මුස්ති. රිෆාස් කියන 06 දෙනෙක් ගැන ඔබ උදේ සාක්ෂි දුන්නානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ 06 දෙනා සහ තුෂාර පිරිස් අතර සම්බන්ධතාවයක් තියෙනවනද?

පි: නැත ස්වාමිනි. ඒ මම දන්න විදිය ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ අද පෙරවරුවේ සාක්ෂි දෙන කොට කියා සිටියා අර CID එකේ ඉන්න කොට ඔබගේ අසල්වැසියෝ ගැන?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව ඔබ කියා සිටියා ආමි මොහදින්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: තව කවුද හිටියේ විශේෂ චරිත මතකද?

පි: ස්වාමිනි මධුෂ් හිටියා ආමි මොහිදින් හිටියා ඩොක්ටර් සාපි හිටියා, රිල්වාන්ගේ මාමා හිටියා

ප්‍ර: රිල්වාන් කියන්නේ කවුද?

පි: රිල්වාන් කියන්නේ සහරාන්ගේ මල්ලි ස්වාමිනි. රිල්වාන්ගේ මාමා හිටියා සහරාන්ගේ වයිෆ්ගේ අයියා හිටියා අන්සාර් මවුලවි හිටියා තව 40 ක් විතර හිටියා ස්වාමිනි

ප්‍ර: දැන් මේ කියපු තැනැත්තන්ගෙන් අර ඉස්සෙල්ලා කියපු 06 දෙනාට අමතරව දැන් ඔබ ප්‍රකාශ කරපු පුද්ගලයන් සමඟ ඔබ සාකච්ඡා කරාද?

පි: කථා කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මොනවාහරි එහිදිත් ඔබට යම් තොරතුරු ලබා ගන්න හැකියාවක් ලැබුණද?

පි: ස්වාමිනි ත්‍රස්තවාදී තොරතුරු සම්බන්ධව ආමි මොහොදින් එක්ක කථා කරන කොට ස්වාමිනි දැන ගත්තේ ආමි මොහොදින් දේශපාලනයත් එක්ක බැදිලා යන ගමනක ගිහිල්ලා තියෙන්නේ.

ප්‍ර: මොකක්ද දේශපාලනය?

පි: ආමි මොහිදින් හිස්බුල්ලාත් එක්ක මුලින් සම්බන්ධතාවයක් තිබිලා තියෙනවා ඊට පස්සේ හිස්බුල්ලත් එක්ක විරෝධතාවයක් ඇවිල්ලා තියෙනවා පස්සේ මෛත්‍රිපාල සිරිසේන මහත්මයාගේ 2015 ජනාධිපතිවරණයට පූර්ණ සහයෝගය ලබා දුන්නා කියලා ආමි මොහිදින් කිව්වා මෙන්න මේ වගේ කරුණු තමයි ඔහු අනාවරණය කලේ. ඒ වගේම අවශ්‍ය අවි ආයුධ පුහුණුවට අවශ්‍ය සහයෝගය ඔහු ලබා දුන්නා කියලා කෙටියෙන් මං කිව්වේ සහරාන්ලාගේ අවශ්‍ය අවි ආයුධ පුහුණුවට අවශ්‍ය සහයෝගය ලබා දුන්නා කියලා විතරයි කිව්වේ

ප්‍ර: කොහේදි ලබා දුන්නේ කියලා කිව්වද?

පි: කොහේදිද ලබා දුන්නේ කොහොමද කරේ ඒ මොනවත් කිව්වේ නැහැ ස්වාමිනි කිසිම දෙයක් කිව්වේ නැහැ. ඒ වගේම මම සහ මධුෂ් අපි තුන්දෙනා එකට ඉන්නකොට කිව්වා සිංහල මිනිස්සු කොහොමත් මැරෙන්න ඕනේ හේතුව උන් අපිට ඔය කෑගහන්නේ අපේ ළමයින් හදනවා එහෙම කියලා කෑගහනවා ඉතින් ඔවුන්ට එය කර ගන්න බැරිවුණාට කරන්න දෙයක් නැහැ අපිට අපේ ගමනට බාධා කරන්න එනවානම් අපි කොහොමත් ගහනවා කියලා මධුෂුයි මායි අපි තුන්දෙනාම ඉන්න ඒ කියන්නේ මධුෂ් තමයි ඒ ප්‍රශ්නය අහුවේ ඇයි දැන් මොකක්ද

FAIR COMMENT — BY JEZEEM —

තියෙන ප්‍රශ්නේ කියලා මධුෂ් ඇහුවා ආමි මොහදින්ගෙන් ඊට පස්සේ කිව්වා නෑ නෑ උඹලාගේ මිනිස්සු ඔය විදිය කථා කරාට උඹලාගේ මිනිස්සුන්ට උඹලාගේ මිනිස්සු ෆේල් මෙතන අපි මෙහෙයි අපි ළමයි හදාගෙන අපේ ජාතිය ගොඩනගා ගෙන යන කොට උඹලාට ඊරිසියයි. උඹලට කාල ඉන්න බැහැ ඒ නිසා උඹලාගේ උන්ට කොහොමත් ගහන එක හොඳයි කියලා කිව්වා ආමි මොහදින්ට සිංහල මං උදේ ප්‍රකාශ කරා සිංහල කියවීමේ ලිවීමේ චතුර හැකියාවක් තියෙනවා. ඊට අමතරව මාකඳුරේ මධුෂ් එක්ක කථා කරා අවශ්‍ය නම් පමණක් නම් ඉදිරිපත් කරන්නම්

ප්‍ර: පාස්කු ප්‍රහාරයට සම්බන්ධද?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබගේ ගවේශනයන්වලට අනුව?

පි: නැත ස්වාමිනි

ප්‍ර: සාෆි කියන පුද්ගලයෙක් ගැන ඔබ සඳහන් කරා?

පි: ඩොක්ටර් සාෆි ස්වාමිනි ඩොක්ටර් සාෆි ගේන්නේ ඉරිදා දවසක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගේන්නේ මට මගේ මතකය විදියට තමයි මං මේ කියන්නේ ස්වාමිනි 29 වෙනිදා වගේ දවසක් ඉරිදා දවසක්

ප්‍ර: මාසේ?

පි: මැයි මාසේ 29.

ප්‍ර: මොන අවුරුද්දේද?

පි: 2019 මැයි 29 ඉරිදා දවසක් මට මතක විදියට උදේ ගේනවා ඒ ගෙනාවට පස්සේ අනික් පහුවදාම අනික් පහුවදාම ඩිරෙක්ටර් මහත්මයා හම්බෙන්න ඕනේ කියලා යනවා

ප්‍ර: අනිත් පහුවදා කියන්නේ ඊට පසු දිනද නැත්නම් ඊට දවස් දෙකකට පස්සේද?

පි: නෑ නෑ පසු දිනම ස්වාමිනි ඒක මට හොඳට මතකයි මං ඒක මතක තියා ගත්තා ස්වාමිනි විශේෂයෙන්ම ඒකට හේතුව සාමාන්‍ය සිරමැදිරියෙන් කෙනෙක් එළියට ගන්නකොට ස්වාමිනි එතන පොතක් තියෙනවා ඒ පොතේ නම ලියලා ගත්තේ කවුද කියලා ලියලා තමයි ගන්නේ ස්වාමිනි. නමුත් ඩොක්ටර් සාෆිට එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ ස්වාමිනි ඒ නිසා මට ඒක උවමනාවෙන්ම බලන්න හිතුණා ස්වාමිනි ඩොක්ටර් කෙනෙක් ගේනවා කිව්වට මං දැනගෙන හිටියේ නැහැ ස්වාමිනි මම ඒ වෙනකොට ඩොක්ටර්ගේ සිදුවීම් මොනවත් දන්නේ නැහැ මං සිර මැදිරිය ඇතුලේ

ප්‍ර: දැන් මේ සාෆි කියන ඒ ඩොක්ටර් ඔබගේ සිර මැදිරියේ ද හිටියේ?

පි: නැහැ ස්වාමිනි. සිරමැදිරිය අතර වෙනස තියෙන්නේ ස්වාමිනි මෙන්න මේ මම මෙකෙන් මේ පැත්තේ ඉන්නවා මෙකේ එහා පැත්තේ තමයි ඩොක්ටර් සාෆිලා හිටියේය ඒ වගේ දුර ප්‍රමාණයක් තමයි වෙනස තිබුණේ

FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි. ඩොක්ටර් සාෆිව ආපු දවසට පස්සේ දවසේ ඩිරෙක්ටර් මහත්මයා හම්බ වෙන්න කියලා ගත්තා ඊට පස්සේ ටික දවසක් යන කොට ඩොක්ටර් සාෆි කෑගහන්න පටන් ගත්තා ඇතුලේ සින්දු අපි සිර මැදිරියේ ඉන්න මධුෂ් එක්ක සින්දු කියන්න පුළුවන් කට්ටිය හිටියා ත්‍රස්ත සැකකරුවෝ රෑට සින්දු කියන්න පටන් ගත්තා ඩොක්ටර් සාෆිත් සින්දු කියනවා

ප්‍ර: මොන සින්දුද?

පි: ඩොක්ටර් සාෆි සිංහල සින්දුවල කෑලි කියනවා

ප්‍ර: එතකොට මියුසිකුත් දුන්නාද ඔයගොල්ලෝ?

පි: නෑ මම ඔව්වාට සම්බන්ධ නැහැ ස්වාමිනි

ප්‍ර: සමාවෙන්න ඔතන සිටපු සිරකරුවෝ නිකම් ඔය පොඩි මේසයකට තට්ටුවක් දැම්මා හරි?

පි: නෑ මේස නැහැ ස්වාමිනි පසුකාලීනව කිසිමදෙයක් තියා ගන්න බැරිවුණා ඇතුලේ නැතිනම් ඇතුලේ මත්ද්‍රව්‍ය පවා තිබුණා ස්වාමිනි සිර මැදිරිය ඇතුලේ මේ ඒ සම්බන්ධව මට මේකට අදාල නැති නිසා මං කථා නොකරනවා නමුත් ඩොක්ටර් සාෆි මිනිස්සුන් එක්ක හිතවත් වුණා

ප්‍ර: නෑ මට මේ සංගීතය ගැන පොඩ්ඩක් දැන ගන්න ඕනේ ඒ ඔබලා සින්දු කියන වේලාවට නිකන් විසිල් පාරකින් හරි අර අත්පුඩියක් ගහලා තාල ඇල්ලීමක් හරි ඔය වගේ ඒවා වුන් නැද්ද?

පි: විසිල් ගහන්නේ නැහැ ස්වාමිනි නමුත් අත්පුඩි ගහන එක සමාන්‍යයෙන් සිද්ධ වෙනවා 04 වෙනි තට්ටුවටම ඇහෙන්න වගේ සින්දු කියනවා රෑට ඕක ප්‍රශ්නය තියෙන්නේ ස්වාමිනි මම ප්‍රශ්න ඉදිරිපත් කරා ඉතින් ඒකට මම විතරයි ස්වාමිනි මං විතරයි ස්වාමිනි මගේ තනි කැමැත්තක් තවත් 39 ක් 40ක් ඒ ගොල්ලෝ කියන්නේ අපි ඉන්නේ හිරේ පොඩි සින්දුවක් කියන්න හරි නිදහසක් ඕනේ ඒක මිනිස්සුන්ගේ අයිතියක්

ප්‍ර: එතකොට ඔබලා ඔය සින්දු කියන කොට අර ඔබ සඳහන් කරපු අර 40 ක් පමණ වූ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වූ සැකකරුවන් ඔවුන්ගේ ක්‍රියාකලාපය වුණේ මොකක්ද?

පි: සාමාන්‍යයෙන් ස්වාමිනි සින්දු කියන වේලාවට සිර මැදිරි දැන් මම හිටපු සිරමැදිරියේ සින්දු කියන්නේ නැහැ ලේසියෙන් ඒකට හේතුව මම හිටපු සිරමැදියේ කුඩා සිරමැදියක් ඉඩ අඩුයි නමුත් මධුෂ්ලා හිටපු සිරමැදිරිය ස්වාමිනි එකටම තියෙනවා සිරමැදිරි තුනක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ 04 ක් තියෙනවා ස්වාමිනි. ඒ සිරමැදිරි 4 ලොකු ප්‍රමාණයකට ඉන්න පුළුවන්. ප්‍රධාන සිර මැදිරියේ 20 කට විතර ඉන්න පුළුවන් ස්වාමිනි.ඒ ඒ අය එක එක දැන් ලොකුම සිර මැදිරියේ ඉන්න අය ඒ අය වෙනම සින්දු කියන්න පටන් ගන්නවා මේ අය වෙනම සින්දු කියන්න පටන් ගන්නවා සමහර වේලාවට ඔක්කෝම එක සින්දුව

FAIR COMMENT — BY JEZEEM —

කියනවා එහෙම කියන අවස්ථාත් තියෙනවා සිර මැදි සිර මැදි කිහිපයේම ඉන්න අය

ප්‍ර: ඉතින්? දොස්තර සාෆි

පි: සිංහල සින්දු කියන්න දන්න කෙනෙක් හිටියා ස්වාමිනි ඔහු මට නම මතක නැහැ සිංහල සින්දු ගොඩාක් කියන්න දන්නවා ඔහු දමිල සින්දුවලට වැඩිය සිංහල සින්දු තමයි කියන්නේ. ඩොක්ටර් සාෆි ඊට පස්සේ දින කීපයක් හිටියා 10 ක් 15 ක් ඉන්නකොට ඩොක්ටර් සාෆි මට මතකයි දවසක් කෑගැහුවා සිරමැදිරියේ ඉදලා මේ එපා වෙලා තියෙන්නේ විනාශ කරනවා එහෙම විනාශ කරනවා කියන්නේ මගේ එයාගේ ජීවිතය විනාශ කරනවා කියලා කෑගැහුවා මොකක්ද මේ කරන්නේ කියලා කෑගැහුවා කෑගැහුවාට පස්සේ පොලිස් නිලධාරින් ඒ පිළිබඳව දැන්නුවා දැන්නුවාට පස්සේ ඒ පිළිබඳව ඩොක්ටර් සාෆිත් එක්ක කථා කරන්න ආවේ ASP තිසේරා මහත්මයා තිසේරා මහත්මයා ඇවිල්ලා කිව්ව ඩොක්ටර් සාෆිට කලබල වෙන්න එපා ඔයා ඕනවට වැඩිය නටන්න හදන්න එපා ඔයාට එළියට යන්න අවශ්‍ය විදියට අපි කටයුතු කරලා තියෙන්නේ. ඒවා ඒ වෙලාවට වෙයි වෙලාව එනකම් පාඩුවේ ඉන්න කියලා කිව්වා. එතනදි මට හිතුණා ඒක එවැනි ප්‍රකාශයක් ASP මහත්මයෙක් ඩොක්ටර් සාෆිට කිව්වා කියන්නේ අනිවාර්යෙන්ම මෙතන මොකක් හරි එකක් වෙන්න පුළුවන් කියලත් මට හිතුණා හැබැයි මේ ඩොක්ටර් සාෆි ඒත් කියව ගන්න එක අතහැරියේ නැහැ ටිකක් වෙලා ASP මහත්මයා එක්ක කියවා ගත්තා කියවගෙන

ප්‍ර: මොන භාෂාවෙන්ද?

පි: ඩොක්ටර් සාෆි ඉංග්‍රිසියෙනුත් කථා කරා ASP මහත්මයා ඉංග්‍රිසියෙනුත් කතා කරා සිංහලයෙනුත් කථා කරා සිංහලයෙනුත් කථා කරා , ඉංග්‍රිසියෙනුත් කථා කරා භාෂා දෙකෙන්ම කථා කරා ස්වාමිනි. සිංහලයෙන් කතා කරපුවා තේරුණා. ඉංග්‍රීසියෙන් කතා කරපුවා මට තේරුණේ නෑ. මම ඉංග්‍රිසි භාෂාව තේරෙන්නේ නැහැ ස්වාමිනි. ඒ නිසා මට ඒක තේරුනේ නැහැ සිංහලයෙන් කථා කරපු ටික කිව්වේ කලබල වෙන්න එපා මේක මේ වගේ යන ක්‍රමයක් තියෙනවා ඒ ක්‍රමයට තමයි මේ යන්නේ ඔයාට පැමිණිලි මෙච්චර තියෙනවා. ඒ පැමිණිලි තියෙද්දි අපි ඔයාට එළියට යන්න පුළුවන් වෙන්න අපි හදලා දීලානේ තියෙන්නේ එතනත් අපි කියනදේට වැඩිය ඔයා පිටි යනවා නම් ඔයා ප්‍රශ්නයක් ඕනම් දා ගන්න අපිට ප්‍රශ්නයක් නැහැ එහෙම කියලා ඩොක්ටර් සාෆිට පැහැදිලි කලා. ඊට පස්සේ ටික දවසකින් අධිකරණයට ඉදිරිපත් කරා ස්වාමිනි.

ප්‍ර: ඊට පස්සේ අධිකරණයකට ඉදිරිපත් කරා?

පි: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් සාක්ෂිකරු අර රාම්සාන් දවසේ 2019 ද 2020 ද රාම්සාන් දිනයේ අර දවල් ආහාරයක් ලැබුණා කිව්වානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කවුද ඒක සංවිධානය කලේ?

පි: ඒක මං හොඳටම මතක තියා ගත්තා ස්වාමිනි ඒක මගේ දැනුමේ හැටියට මට හිතුණා මෙහෙම දෙයක් වෙන්න බැහැ කියලා අපි ඉන්නේ ස්වාමිනි පොලිසිය හදවත බදු අපරාධ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ ඒ අත්අඩංගුවේ ඉන්න අපට ටොපියක්වත් එළියෙන් වතුර බෝතලයක්වත් ගෙන්න දෙන්නේ නැහැ ස්වාමිනි ඒ දවස්වල ගෙනෙන්න දුන්නේ නෑ ස්වාමිනි. එවැනි පසුබිමක රාම්සාන් උත්සවය දවසේ ඔක්කෝටම කෑම දෙනවා කියලා කිව්වා උදේ.

ප්‍ර: කවුද දුන්නේ ඒ කෑම.

පි: ස්වාමිනි ඒ කෑම දුන්නේ අර ඊබ්‍රහිම් හජ්ජියාර්ගේ පුතෙක් වන මොහොමඩ් ඊබ්‍රාහිම් ඉෆ්ලාල් හමඩ් කියන කෙනාගේ ඒ කෙනා බැඳලා ඉන්නේ මහනුවරින් ඒ බැඳලා ඉන්න වයිෆ්ගේ තාත්තා තමයි දුන්නේ ස්වාමිනි.

ප්‍ර: එය සිරකරුවන්ට විතරද?

පි: සිරකරුවන්ට විතරක් නෙමේ මං හිතුවේ සිරකරුවන්ට විතරක් දුන්නා කියලා නමුත් ඒ වෙලාවේ ඊට පස්සේ එතන අපේ රාජකාරිය ඉන්න නිලධාරින්ගෙන් ඇහුවා කොහොමත් මුස්ලිම් ඒ අයගේ මෙහෙම දෙයෙක් තිබුණා කෑමක් කන වේලාවට කොයිතරම් තරහ වුණත් දැන් මාත් එක්ක තරහයි මට හැමවෙලාවේම කියනවා කමුද කියලා අහනවා මගෙන් ඒ වගේ පොලිස් නිලධාරින්ගෙනුත් අහනවා සර්ලා කාලද ඉන්නේ කමුද කියලා අහනවා. ඉතින් එදා ඇහුවා සර් මොකද කරන්නේ මෙකෙන් අයින් කරන්නද කමුද කියලා ඇහුවා ඊට පස්සේ කිව්වා නෑ නෑ අපිට අපේ ටික වෙනමතියෙනවා ඔයගොල්ලෝ කන්න අපි කන්නම් කියලා ඒ ගොල්ලන්ට වෙනම හම්බ වෙලා තිබුණා ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු වනාතවිල්ලුවේදී අර පුපුරන ද්‍රව්‍ය හොයා ගත්තානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ පුපුරන ද්‍රව්‍ය හොයා ගැනීමට අදාලව හිටි සැකකරුවන් දෙදෙනෙක් නිදහස් කල බව ඔබ දන්නවද?

පි: දන්නවා ස්වාමිනි

ප්‍ර: මොනවද ඔබ ඒ තැන ගැන දන්නේ?

පි: මම දන්නේ ස්වාමිනි ඔය මුෆිස් කියලා ඒ ඉඩමේ අයිතිකාරයා හිටියේ මාත් එක්ක එක සිරමැදිරියේ. මම අවට පස්සේ මම ඒ මිනිස්සු කවුද කියලා මං දන්නේ නැහැ මං එනකොට ඔක්කෝම අත්අඩංගුවේ හිටපු අය මම තමයි අධුනිකයා ඊට පස්සේ මම ඒ අය කවුද කියලා හොයාගෙන ටිකින් ටික කථා කරලා කාලයක් යන කොට මේ අය මාත් එක්ක කිව්වා

FAIR COMMENT — BY JEZEEM

අපේ දෙන්නෙක් යැව්වා අපි දෙන්නෙක් තියා ගත්තා දෙන්නෙක් යැව්වා මං ඇහුවා යවපු දෙන්නා කවුද කියලා ඊට පස්සේ කිව්වා අපිත් එක්ක එකට හිටපු දෙන්නෙක් යැව්වා මේ මං ඇහුවා ඒගොල්ලෝ මේවට ඒගොල්ලෝ නෙමේ අපිත් මේවාට සම්බන්ධ නැහැ කියලා මේගොල්ලෝ කිව්වා ඊට පස්සේ මං ඇහුවා දැන් ඔයගොල්ලෝ සම්බන්ධ නැහැ කියන්නේ කොහොමද කියලා මං මේ අයගෙන් ඇහුවාට පස්සේ මේ අය කිව්වා අපිව අත්අංඩගුවට මූගිස් මාත් එක්ක කිව්වා මාව අත්අඩංගුවට ගත්තේ ජනවාරි 16 ඒ ජනවාරි 16 වෙනිදා මාව අත්අඩංගුවට ගත්තාට පස්සේ මම මේ ඔක්කෝම කිව්වා කියලා. මං ඇහුවා මොනවද ඔයා ඔක්කෝම කිව්වේ කියලා මේ පුපුරණත් ද්‍රව්‍ය කාගේද මේවාගෙන් මොනවද කරන්න හදන්නේ කියලා පැහැදිලිවම ප්‍රකාශ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන්නා කියලා කිව්වා. ඊට පස්සේ ඒ අය කිව්වා අනික් දෙන්නා නම් මොනවටවත් සම්බන්ධ නැහැ කියලා තමයි මාත් එක්ක කිව්වේ හැබැයි ඒ වගේම කිව්වා ඒකට කවුරු හරි උදව් කරා එළියට යන්න අපිට උදව් කරා කියලා කිව්වා මට නම කිව්වාට දැන් මට නම මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ පොලිසියේ ඇතුලින්ද පිටින් කියන එක?

පි: පිටින් පිටින් කියලා කිව්වේ ස්වාමිනි.

ප්‍ර: දේශපාලනඥයෙක්ද?

පි: දේශපාලනඥයෙක්ගේ නමක් කිව්වේ ස්වාමිනි මට ඒක මතක නැහැ ස්වාමිනි ඒක දේශපාලනඥයෙක්ගේ නමක් කිව්වා

ප්‍ර: මොන ජාතිකයෙක් වශයෙන්ද මතකයක් තියෙනවද?

පි: මුස්ලිම් ජාතික දේශපාලනඥයෙක් ස්වාමිනි.

ප්‍ර: ඔබ අහලා තියේද මේ හිටපු බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයෙක් හිටියා අසාද් සාලි කියලා?

පි: ස්වාමිනි අසාද් සාලි ස්වාමිනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ අද ඔබට ඇසීමට සැලැස්සුවා DGNJ 12,13,14,15 සහ 16 කියන හඬපටයන් කීපයක්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ එහිදි කියා සිටියා ඒ හැම හඬ පටයකම ඔබේත් නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතාගේත් කටහඬ තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: යම් අවස්ථාවකදි අද දින ශ්‍රවනය කරන්නට දුන් හඬ පට හෝ වෙනත් හඬ පට security council එහෙම නැත්නම් ආරක්ෂක මණ්ඩලයේදී එහි සාමාජිකයන්ට ශ්‍රවණය කරන්නට ලැබුණා නැද්ද යන්න ඔබට දැන ගැනීමට ලැබුණද?

පි: දැන ගැනීමට ලැබුණා ස්වාමිනි

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: කාගෙන්ද ඒ දැන ගැනීමට ලැබුණේ?

පි: මට ඒක දැන ගැනීමට ලැබුණේ සෘජුවම මට ඒ ප්‍රකාශය කරේ ස්වාමිනි නාලක සිල්වා මහත්මයාගේ ගෝලයා

ප්‍ර: කවුද ප්‍රගීත්ද?

පි: ප්‍රභාත් කියන

ප්‍ර: සමාවෙන්න ප්‍රභාවත්

පි: ප්‍රභාත් කියන කෙනා නමුත් මට ඒ සෘජු ප්‍රශ්නය සෘජුව ඒක දැන ගන්න ලැබෙනවට ලැබෙන්න කලින් මට ඒක එහෙම වෙච්ච බවට සනාථත් වුණා ඒ පිළිබඳවත් අවශ්‍ය නම් ඉදිරිපත් කරන්නම් ප්‍රකාශ කරන්නම් ඊළඟට ඉන් පස්සේ මං ඒ පිළිබඳ දිගට හෙව්වා ස්වාමිනි. ඒ සොයා බැලිමේදීත් කරුණු අනාවරණය වුණා ස්වාමිනි.

ප්‍ර දැන් මේ හඬපට security council එකට ආරක්ෂක මණ්ඩලයට ගියපු මාර්ගය ඔබ දන්නවද?

පි: දන්නවා ස්වාමිනි

ප්‍ර: කොහොමද?

පි: මම රාජ්‍ය බුද්ධි සේවයේ ලක්ජීව කියන නිලධාරියාට මං ඒවා ලබා දුන්නාට පස්සේ ඔහු මට කිව්වා මේවා ඉහලට යොමු කරනවා ඉහලට යොමු කරලා ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා කියලා ඒ ඉහලට යොමු කිරීමේ ප්‍රතිඵලයක් විදියට තමයි ස්වාමිනි ආරක්ෂක මණ්ඩල රැස්වීමට ඒවා යොමුකරලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: ඒ හඬ පට 2019.04.21 සිදු වූ ඒ අර මිලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධද නැද්ද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු පොලිස් සැරයන් නන්දලාල් කියලා තැනැත්තෙක් ඔබ දන්නවද?

පි: දන්නවා ස්වාමිනි

ප්‍ර: කොහොමද ඔහුව හඳුනගත්තේ?

පි: ඔහු ස්වාමිනි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ දෙකේ සේවය කරන පොලිස් සැරයන්වරයෙක් ස්වාමිනි ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ම අත්අඩංගුව ඉන්න කාලයේ අපේ ආරක්ෂාවට යොදවලා හිටපු පොලිස් සැරයන්වරුන් අතරින් එක්කෙනෙක් ස්වාමිනි. මොහු මාත් එක්ක අවස්ථා කීපයකදීම කථා කරලා තියෙනවා

ප්‍ර: මොනවද කථා කරලා තියෙන්නේ?

පි: කථා කරලා තියෙන්නේ ස්වාමිනි ගෙදර කවුද ඉන්නේ මොකද වෙන්නේ අත්අඩංගුවට ගත්තේ ඇයි කොහොමද ජීවිතය මොකක්ද ඉස්සරහට කරන්න බලාපොරොත්තු වෙන්නේ මේ වගේ දේවල් ස්වාමිනි එතන ඉන්න නිලධාරියා මාත් එක්ක කථා කරනවා ස්වාමිනි හැමදාම.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මේ නන්දලාල්ට භාෂා කීයක් කථා කරන්න පුළුවන්ද?

පි: භාෂා කීයක් කථා කරන්න පුළුවන්ද කියලා මං දන්නේ නැහැ ස්වාමිනි. සිංහල භාෂාව හොඳට මාත් එක්ක කථා කරා ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ නන්ද ලාල් ආමි මොහොදීන් කියන අර ඔබ කියපු පුද්ගලයා සමඟ කථා කරනවා ඔබ දැකලා තියෙනවද?

පි: මට එහෙම නම් මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: මේ නන්ද ලාල් සමග ඔබ කථා කිරීමේදී ඔබට මේ නන්දලාල් පොලිසි CID නන්දලාල් මහත්මයා යමක් ඔබට දන්වා සිටියද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ දන්වලා හිටියේ?

පි: ජනාධිපතිවරණය තිබුණේ ස්වාමිනි 2019.11.16 වෙනිදා ස්වාමිනි ඒ ජනාධිපතිවරණයෙන් පස්සේ දවසේ ප්‍රතිඵල නිකුත් වුණා ස්වාමිනි. 17 වෙනිදා ඒ 17 වෙනිදා උදේ රාජකාරියට වාර්තා කරනවා සාජන් නන්දලාල් මහත්මයා, ඒ රාජකාරියට වාර්තා කිරීමත් සමඟ ටිකක් උණුසුම් තත්ත්වයකුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මතුවෙනවා. ඒ ටිකක් වෙලා යන කොට ඔය අතුරුදහන් වෙච්ච නිශාන්ත ද සිල්වා මහත්තයලත් ඒ අයත් රාජකාරියට වාර්තා කරනවා 12 විතර වෙනකොට ඔය ඔක්කෝම ගිහිල්ලා ගොඩාක් පිරිසක් එළියට යනවා එදා තමයි මම නිශාන්ත සිල්වා මහත්මයා දැක්ක අවසාන දවසත් 17 වෙනිදා ඊටපස්සේ CID එකට නිශාන්ත සිල්වා මහත්මයා ආවේ නැහැ. නන්ද ලාල් මහත්මයා ඔය ඔය වගේ දේවල් කථා කර ඉන්නකොට නන්දලාල් මහත්මයාට අපි FM රේඩියෝ එකක් මම ඉල්ලුවා ස්ථානාධිපතිතුමාගෙන් ඡන්ද ප්‍රතිඵල අහන්න කියලා ස්වාමිනි. ඒක පොලිස් සැරයන්වරයෙකුගේ අධීක්ෂණය යටතේ අපි ඡන්ද ප්‍රතිඵල අහන්න හිටපු නිසා උදේ වෙනකම්ම අහලා දවල් වෙනකොට 10 විතර වෙන කොට වගේ අපිට ප්‍රතිඵල දැනගන්නට පුළුවන්කම ලැබුණා අපි ලංකාවට පලමුවෙන්ම රටක් විදියට සුභපැතුවේ ස්වාමිනි මාලදිවයින අපේ ලංකාවේ ජනාධිපතිවරයාට පළමුවෙන්ම සුභපතන්නේ මාලදිවයින්වලින්ම තමයි සුභ පතන්නේ ස්වාමිනි. ඊට පස්සේ මම සාජන් නන්දලාල් මහත්මයත් එක්ක කිව්වා ඒ වෙලාවේ මාලදිවයින්වලින් අපේ රටට පළවෙනියට සුභපතනවා ඔය සුභපතන එකේ යටි අරමුණ කාලයක් යනකොට අපිට තේරුම් ගන්න පුළුවන් වෙයි ඔය නිකම් නම් වෙන්න විදියක් නැහැ කියලා ප්‍රතිඵල නිකුත් වීමටත් පෙර ස්වාමිනි ඊට පස්සේ සාජන් නන්දලාල් මහත්මයා කියනවා මාලදිවයින් ගැන ඔයා මොනවද දන්නේ මං කිව්ව මම ගොඩාක් දේවල් දන්නේ නැහැ ඉතින් මේ ත්‍රස්තවාදීන් ටිකක් ඉන්නවා කියලා දන්නවා ත්‍රස්තවාදි අදහස් දරණ මිනිස්සු ඒ රටේ ඉන්නවා කියලා මං දන්නවා කියලා කිව්වා. හොදයි නාමල් මං ඔයාට රහසිගත දෙයක් කියනවා ඔයා ඒක රහසක් විදියට තියාගෙන ගිහිල්ලා

FAIR COMMENT BY JEZEEM

ඔයා මේ රහස මං මේ කියන කෙනාට කියන්නත් එපා පුළුවන් නම් මේ කෙනාගේ ජීවිතය බේර ගන්න උත්සහ කරන්න මට මෙන්න මෙහෙම තොරතුරක් දැන ගන්න ලැබුණා කියලා මම ඇහුවා මොකක්ද තොරතුර කියලා ස්වාමිනි. එතනදි ඔහු ප්‍රකාශ කරා මාලදිවයිනේ සිට අයුධ සන්නද්ධ පුද්ගලයෝ දෙන්නෙක් ලංකාවට ගෙන්වලා තියෙනවා මුස්ලිම් අය ගෙන්නුවේ කොහෙන්ද ආවේ මොකෙන්ද කවද්ද ආවේ කිසිම දෙයක් මම අහන්න ගියේ නැහැ ස්වාමිනි පොලිස් නිලධාරියෙක් මට ලබා දුන්න තොරතුර දුන්නේ මෙහෙම ඇවිල්ලා තියෙනවා ඒක මට තමයි අහුවුණේ මගේ විමර්ශනයකට තමයි අහුවුනේ මම ඒක ඩිරෙක්ටර් සර්ට දැම්මා ඉන්දේ ළඟ නිසා මහජන කැලඹීමක් ඇතිවෙයි කියලා case එක අදින්න එපා කියලා කිව්වා case එක යටගහලා File යටගහලා තියෙන්නේ කවුරුත් දන්නේ නැහැ තාම මේක CID එකෙන්වත් දන්නේ නැහැ කට්ටිය ඒ නිසා මේක යට ගහලා තියෙන්නේ ඔයා ගිහිල්ලා පුළුවන් නම් ඥාණසාර හාමුදුරුවෝ වටිනවද නැද්ද කියලා ඇහුවා මං කිව්වා වටිනවා කියලා ඒහෙම නම් ඒ ජීවිතය ආරක්ෂා කරගන්න ඔයා කටයුතු කරන්න මේක ප්‍රශ්නයක් ඇතිවෙන්න දෙන්න එපා කියලා මට නන්දලාල් මහත්මයා කිව්වා. මම හිතුවා ඒක ඒ වෙලාවේ ඒ කියපු ටික ඒ විදියටම මතක තියා ගන්න නමයි ඒ ඔක්කෝම හොයා ගත්තේ නන්දලාල් කියලා මම නම දැනගෙන හිටියේ නැහැ ස්වාමිනි නන්දලාල් මහත්මයාගේ මම ඒ නම හොයා ගත්තෙත් ඊට පස්සේ මම කවදා හරි මේක සාක්ෂියක් විදියට ඉදිරිපත් කරත් මේ නමත් වැදගත් වෙනවා දිනෙත් වැදගත් වෙනවා කථා කරපු දේත් වැදගත් වෙනවා ඒ මාතෘකාවට එන්න හේතුවත් වැදගත් වෙනවා කියලා මම හැමදේම එතන ඒ වෙච්ච සිදුවීම මතක තියාගෙන එතුමාගේ නම හොයාගෙන ඒ ටික කරගෙන මතකයේ තියාගෙන හිටියා ස්වාමිනි කවදාහරි ඔය සම්බන්ධව කථා කරන්න අවස්ථාවක් ලැබිච්ච තැනක කථා කරනවා කියලා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒකට හඬපටයක් තියෙනවද?

පි: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුලේ ස්වාමිනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු 2019.04.21 ඔය ත්‍රස්ත ප්‍රහාරය සිදුවුණානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: 2019.04.20 ඔබට රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරිවරයකුගෙන් දුරකථන ඇමතුමක් ලැබුණද?

පි: ඔව් ස්වාමිනි. මට අර ලක්ජීව කියන නිලධාරියා මට කථා මට මතකයි

ප්‍ර: කවුද?

පි: ලක්ජීව කියන නිලධාරියා මට කථා කරා කථා කරලා නාමල් මොකද වෙන්නේ කියලා ඇහුවා

ප්‍ර: වේලාව කීයට විතර වගේ ඇද්ද?

FAIR COMMENT BY JEZEEM

පි: වේලාව මට මතක හැටියට උදේ ස්වාමිනි කථා කරා නෙමේ ආවා වගේ මට මතකයි ඔහු ආවා.

ප්‍ර: ඔබේ නිවසට ආවාද?

පි: නෑ ගෙදරට කවදාවත්ම එන්නේ නැහැ ස්වාමිනි. ඔහු ගෙදරට කවදාවත්ම එන්නේ නැහැ මාව හම්බ වෙන්න අවශ්‍ය නම් මට කෝල් එකක් ගහලා ගෙවල් ළඟට ගෙදර උඩ පාරට ඇවිල්ලා කියනවා මම මේ පාරට ඇවිල්ලා ඉන්නේ මට හම්බෙ වෙන්න ඕන කියලා ඉතින් එදා ආවා ඇවිල්ලා කොහොමද තර්ජන තියෙනවද කියලා ඇහුවා ප්‍රශ්න මොනවද තියෙන්නේ කියලා ඇහුවා වැඩිය එළියට බහින්න එපා කියලා කිව්වා මට මතක හැටියට කොහොම හරි මම call එකක් ගන්න ඉඳලා හරි මට call එකක් ගන්න බැහැ මගේ phone එකේ සල්ලි තිබුණ් නැහැ ඊට පස්සේ මට මතක හැටියට රු 500 ක් හරි 1000 ක් හරි මට දීලාත් ගියා වගේ මට මතකයි ස්වාමිනි. කොහොම හරි ගාන මට මතක නැහැ ස්වාමිනි මට මතකයි යම් කිසි මුදලක් මම දීලා ගියා phone එකට කාඩ් එකක් දාගන්න කියලා ස්වාමිනි.

ප්‍ර: ඔහු ඇවිල්ලා මොකක්ද ඔබට කියා සිටියේ?

පි: කිව්වා මේ දවස්වල වැඩිය එළියට බහින්න එපා

ප්‍ර: හේතුවක් කිව්වද?

පි: නැහැ මගෙන් ඇහුවා තර්ජන තියෙනවාද ප්‍රශ්න තියෙනවද කවුරු හරි කෝල් කරාද මොනවද වෙලා තියෙන්නේ මේ දවස්වල මොනවද අලුත් තොරතුරු ඔයාට තර්ජන එහෙම තියෙනවද කියලා ඇහුවා මට වෙන මොනවත් කියන්න ගියේ වැඩිය එළියට බහින්න එපා මේ දවස්වල පොඩ්ඩක් අවදානම් තත්ත්වය අවදානම් පරිස්සමින් ජීවත් වෙන්න ඕනේ කියලා මට එහෙම කිව්වා ස්වාමිනි.

ප්‍ර: ඉතින් මොකද ඔබ කරේ?

පි: මම හා කිව්වා ස්වාමිනි.

ප්‍ර: අ...

පි: මම හා කියලා කිව්වා ස්වාමිනි.

ප්‍ර: ඒ අවවාදය පිළිපැද්දද?

පි: අවවාද ලබා දෙනවා ස්වාමිනි මං ඉතින් මගේ ජීවිතය මට වටිනවා මං පුළුවන් තරම් මගේ ජීවිතය මං ආරක්ෂා කර ගන්න කටයුතු කරනවා ඒත් අත්‍යවශ්‍ය දෙයකට මම යායුතු දෙයකට මම්ම යන්න ඕනේනම් මම යනවා ස්වාමිනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඉන් අනතුරුව ඔබ දැනගත්තද 4.21 වෙච්ච ප්‍රහාර ගැන?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ අද මේ ගරු සභාවට දීපු සාක්ෂියට අමතරව ඔබට 2019.04.21 ඒ සිදුවූ ප්‍රහාර මාලාවට සම්බන්ධව වෙනත් යමක් මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි: මේ අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය සම්බන්ධව මම හිතනවා ගොඩාක් කථා කරා ස්වාමිනි අවශ්‍යතාවයක් මට විශේෂයෙන්ම එන්නේ නැහැ පොදු අදහසක් අවශ්‍ය වෙලාවට අවස්ථාවක් ලබා දුන්නොත් පොදු අදහසක් ඉදිරිපත් කරන්නම් ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු මීට අමතරව මේ ලංකාව තුළ ක්‍රියාත්මක අන්තවාදී ආගමික සංවිධාන සම්බන්ධයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එක් විශේෂ ආගමකට නෙමේ ඔබත් කියා සිටියා අන්තවාදි සංවිධාන ගැන මේ අන්තවාදි සංවිධානවල ක්‍රියාකාරිත්වය ගැන ඔබට සාක්ෂි සහිතව යමක් මේ ගරු සභාවට ප්‍රකාශකරන්න තියෙනවද?

පි: සාක්ෂි සහිතව ඔය සංවිධානවල ක්‍රියාකාරිත්වය පහුගිය කාලය පුරාවටම අපි දැක්කා ස්වාමිනි. එම දැකපු සිදුවීම් අපේ ඉතිහාසයේ පහුගිය කාලය පුරාවටම වාර්තා වෙලා තියෙනවා ස්වාමිනි පල්ලිවලට ගහනවා , කඩවල් කුඩු කරනවා ඒ වගේම මුස්ලිම් අය ඇවිල්ලා බෝම්බ පුපුරනවා සරණාගතයින්ට ගහනවා ගෙවල් ගිණි තියෙනවා මෙන්න මේ LTTE ත්‍රස්තවාදයෙන් පස්සේ මෙවැනි සිදුවීම් කිපයක්ම මේ රටේ වාර්තා වුණා ස්වාමිනි මේවා අධිකරණවල විභාග වන නඩු දක්වා. මෙවැනි සිදුවීම් ගියා ස්වාමිනි මිනීමැරුම් සිද්ධ වුණා ස්වාමිනි, ඒ මොන සිදුවීම සිදුවුණත් වසර ගාණක් අපි ඒවා ඉස්සරහට ඇඳගෙන ගියා මිසක් අපි කොයිම වෙලාකවත් ඒවා කවුද මෙහෙයවන්නේ කවුද ඒවගේ පිටිපස්සේ ඉන්නේ කියන එක හොයලා ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තේ නැහැ ස්වාමිනි.

ප්‍ර: කවුද ඉන්නේ මේ සංවිධානවල?

පි: සංවිධානවල ස්වාමිනි අපි පැහැදිලිවම දකිනවා ස්වාමිනි

ප්‍ර: අන්තවාදි ආගමික සංවිධාන හැසිරිවීමේ හෝ ක්‍රියාත්මක කිරිමේ පිටුපස ඉන්නේ කවුද?

පි: දේශපාලනඥයෝ ස්වාමිනි.

****

දැන් වෙලාව:ප.ව.5.45

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව 5.45
පෙර සටහන් : ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: කවුද ඒ ඉන්න දේශපාලනඥයෝ?

පි නම් වශයෙන් මම දේශපාලනඥයන්ට මේ වේලාවේ චෝදනා එල්ල කරන්නේ නැහැ ස්වාමිනි.නමුත් දේශපාලනඥයෝ වාසි ලබා ගැනීම පිණිස මෙවැනි සංවිධානවලට යම්යම් සහයෝගය ලබා දෙන අවස්ථා තියෙනවා ස්වාමිනි. එවැනි දේශපාලනඥයෝ එවැනි අපි දේශපාලන පක්ෂයක් විදියට දකිනවා අපේ ජන බල පක්ෂය අපේ ජන බල පක්ෂයේ සභාපති සමන් පෙරේරා එතකොට ස්වාමිනි ඒ පක්ෂයේම සාමාජිකයෙක් විදියට පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයට ඇන කොට ගන්න අරඹේපොල රතන හාමුදුරුවෝ එදා රෝහින්ගයා සරණාගතයින්ට පහර දෙනවා ස්වාමිනි. එතකොට දේශපාලනඥයෝ කියෙන්නේ සෘජුවම මං මේකට සම්බන්ධ නැහැ කියලා කියනවා. හැබැයි දේශපාලකයාගේ පෝෂණය කොතනින් හෝ මෙම සංවිධානවල සමාජිකයෝ ලබනවා ස්වාමිනි ඒවා හොයා ගන්න මෙවැනි තැනක් බිහිවීම වටිනවා ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු ඔබ අද දීපු කාරණා සම්බන්ධව රූපවාහිනී වැඩසහටහනකට සහභාගී වෙමින් ප්‍රකාශ කර සිටියද මේ මෑතකදී?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ වැඩසටහන ඒ වැඩසටහනේ දිනය කවද්ද?

පි රූපවාහිනී වැඩසටහනකට සම්බන්ධ වුණේ නැහැ නමුත් මම මාධ්‍යවේදියෙක් එක්ක සාකච්ඡාවක් කරා ස්වාමිනි.

ප්‍ර: කවුද මාධ්‍යවේදියා?

පි චමුදිත කියලා මාධ්‍යවේදියෙක් එක්ක කථා කලා ස්වාමිනි දැනට මාසයක් විතර

ප්‍ර: දැනට මාසයකට පෙර එහිදීත් ඔබ අද දින ප්‍රකාශ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට යම් කිසි අවස්ථාවක ඔය පාස්කු දින ප්‍රහාරයේ සැකකරුවන් විසින් ප්‍රකාශයක් නැත්නම් දැන්වීමක් කරනු ලැබුවද පාස්කු දින ප්‍රහාරයට පෙර මේ කණ්ඩායමේ එක් තැනැත්තෙකු නැත්නම් කීප දෙනෙක් ආරක්ෂක අංශවලට අහුවෙන්න ගියා නමුත් එතනින් ඒක කොහොමහරි බේරුණා නැත්නම් මොනවාහරි හේතුවකින් ඔවුන් මග හැරුණා කියන මොනව හරි අදහසක් ඔබට ලැබුණද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි දින කීපයකට පෙර කීයලා ලැබුණේ නැහැ ස්වාමිනි නමුත් නුවර එළියප්‍රදේශයේදි එවැනි සිදුවීමක් වුණා කියලා දැන ගන්න ලැබුණා ස්වාමිනි.

ප්‍ර: ඒක විතරද?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ආමි මොහොදින් ඔබට දැනුම් දුන්නද යම්කිසි බුද්ධි තොරතුරු බුද්ධි නිලධාරින් ඔහුව ඇවිල්ලා හම්බ වීමක් ඔහු ගැන සැකයක් තිබ්බා හම්බුණා කියන කාරණාව සම්බන්ධයෙන්?

පි බුද්ධි නිලධාරින් එක්ක සම්බන්ධතා තියෙනවා කියලා තමයි ප්‍රකාශ කරේ ස්වාමිනි.

ප්‍ර: මොන බුද්ධි නිලධාරින් කියලා කිව්වද?

පි කිව්වේ නැහැ ස්වාමිනි

ප්‍ර: නම් කෙරුවේ නැද්ද?

පි නැත ස්වාමිනි.

ප්‍ර: නන්දලාල් සමඟ කරපු සාකච්ඡාවලදි යම්කිසි කාරණාවක් ඔබට දැනගන්නට ලැබුණද මේ කණ්ඩායම අල්ලගන්න නැත්නම් ඔවුන් සමඟ යම් සම්බන්ධතාවයක් තිබ්බ කියලා?

පි අපරාධ පරීක්ෂණ දේපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ දෙකෙන් තමයි ස්වාමිනි මාවනැල්ලේ බුදු පිළිම කැඩිම පිළිබඳව විමර්ශන ආරම්භ කරලා තිබුණේ ස්වාමිනි. ඒ අයගේ විමර්ශනවලට අනුව තමයි ස්වාමිනි ගිහිල්ලා ඒ විමර්ශනවල ප්‍රගතිය ප්‍රතිඵලයක් විදියට තමයි ස්වාමිනි ලැක්ටොස් වත්තේ හිමිකරු මූෆිස් , හමාස් ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්නේ ස්වාමිනි. ඊට පස්සේ ඒ විමර්ශන දිගින් දිගටම ගිහිල්ලා තියෙනවා ස්වාමිනි. ඒ යන එකේ ප්‍රතිඵලයක් නිසා තමයි ස්වාමිනි මේ අය හැමවේලාවේම කිව්වේ තවත් ඉදිරියට රැදිලා ඉන්න කාලයක් නැති නිසා බුද්ධි අංශවලට තොරතුරු අනාවරණය වෙලා තියෙන නිසා බුද්ධි අංශ ඒ අයගේ ලඟටමඇවිල්ලා තියෙන බවත් ඒ අයත් දැනගෙන තියෙනවා ස්වාමිනි. ඒ අයව අත්අඩංගුවට ගන්න තැනටම ඇවිල්ලා තියෙනවා කියලා ඒ අය දැනගෙන තියෙනවා ස්වාමිනි ඒ විදියේ කථාවක් කිව්වා ස්වාමිනි.

ප්‍ර: ආමි මොහොදින් කිව්වද මේ ඔහුව අල්ලා ගැනීමට යම්කිසි කණ්ඩායමක් පැමිණයත් ඔහුට ඒක මඟ ඇරලා ඉන්න පුළුවන් වුණ කියන එක?

පි ස්වාමිනි මට මතක නැහැ නමුත් ආමි මොහොදින් සාමන්‍යයෙන් ඒ ව ගේ කථා කියනවා ස්වාමිනි ස්වාමිනි සාමාන්‍යයෙන් ඔහු ඔහුගේ වීරකම් එවැනි ප්‍රකාශ එවැනි දේවල් සාමාන්‍ය කිරීමේ හැකියාවකුත් තියෙන කෙනෙක් ස්වාමිනි. එවැනි කථාවක් මට කිව්වේ නැහැ.

Registrar's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ආමි මොහිදින්ගෙන් ප්‍රකාශයක් වුණාද ඔහු මේ සහරාන්ගේ කණ්ඩායමේක්‍රියාකාරකම්වලට දායකත්වයක් වුණාද කොහොමද ඒදායකත්වය වුණේ කියන එක ගැන?

පි සම්බන්ධයක් තියෙනවා කිව්වා රිල්වාන් එක්ක සම්බන්ධතාවය තියෙනවා කියලා කිව්වේ ස්වාමිනි. මඩකලපුව Weapon training වලට ඔහු අවස්ථා කීපයක සහයෝගය ලබා දීලා තියෙනවා කිව්වා ස්වාමිනි.

ප්‍ර: කොහේද ඒ සහයෝගය දීලා තියෙන්නේ?

පි: ස්ථානය කිව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: කොයි කාලේද ලබා දුන්නද කියලා කිව්වද?

පි නෑ කාලේ කිව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ Weapon training ලබා දුන්නේ මේ සහරාන්ගේ කණ්ඩායමටද නැත්නම්?

පි සහරාන්ගේ කණ්ඩායමට ස්වාමිනි.

ප්‍ර: සහරාන්ගේ කණ්ඩායමට?

පි ඔව් රිල්වාන් තමයි ඒ සම්බන්ධතාවය ගොඩනඟලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: මොන Weapon training එකකට සහභාගි වෙලා තියෙන්නේ?

පි ඔහු ඒ පිළිබඳව කථා කලේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබගේ ඔය කාලය තුළ යම්කිසි අවබෝධයක් ලැබුණද මේ එවකට ඇමතිවරයෙක්ව හිටි හරින් ප්‍රනාන්දු මහත්මයාගේ පියාට මේ වෙන්න යන ප්‍රහාරය දැනගත්තේ කොහොමද කියලා?

පි ඔවුන් ආමි මොහදීන් ඇතුළු හැම කෙනෙක්ම ඒ පිළිබඳව කථා කලා ස්වාමිනි ඇතුලේ ඒ කථා කරලා ඒ හැම කෙනෙක්ම කිව්වේ මේවා දැනුවත් වෙන්න ඕන තැන් වලින් දැනුවත් වෙලා තියෙන්නේ අපිත් දැනුවත් වෙනවා නම් බුද්ධි අංශ අපේ පිටි පස්සටම ඇවිල්ලා ඉන්නේ කියලා බුද්ධි අංශ මේවා දැනුවත් වෙන්න නැති වෙන්න විදියක් නැහැ කියලා ඒ අය එහෙම අදහසක් ප්‍රකාශ කරා ස්වාමිනි. ඒ ඇරෙන්න හරීන් ප්‍රනාන්දු මහත්මයාට හෝ එහෙම පුද්ගලික නම් වශයෙන් කිව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔය ප්‍රහාරය සඳහා පුපුරන ද්‍රව්‍ය ලබා ගත්තේ කොහෙන්ද කියන එක ගැන ඔබට යම්කිසි අනාවරණයක් සිදුවුණාද?

පි පුපුරණ ද්‍රව්‍ය ලබා ගෙන තිබුණේ ස්වාමිනි නාරම්මල ප්‍රදේශයේ විජිත හේරත් කියන කෙනෙක්ගේ ගල්වලකින් සහ හේරත් මුදියන්සේලාගේ ප්‍රැන්සස් ලාවුස් කියන කෙනෙක්ගේ ගල් කුරි එකකින් තමයි පුපුරණත් ද්‍රව්‍ය ටිකක් ලබා ගෙන තියෙන්නේ අනිත් පුපුරණත් ද්‍රව්‍ය රිල්වාන්ලා සොයා ගත්තා කියලා තමයි කිව්වේ තැනක් කිව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: කොයි කාලේද ලබා ගත්තා කියලා කිව්වද?

FAIR COMMENT — BY JEZEEM

පි ඒක පුපුරා හැරීමට කාලයකට ඉහතදී ගත්තා කියලා තමයි කිව්වේ ස්වාමිනි.

ප්‍ර: අරගෙන කොහේද තියලා තිබුණේ කියලා අනාවරණයක් වුණාද?

පි පුත්තලමට අරන් ගිහිල්ලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ වනාතවිල්ලුව ගැන නෙමේ මං අහන්නේ වනාතවිල්ලුවේදී හම්බුණානේ දේවල්?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ප්‍රහාරය සඳහා යොදාගත් පුපුරණ ද්‍රව්‍ය කොහෙන්ද ලබා ගත්තේ කියලා යම්කිසි අවස්ථාවක අනාවරණය වුණාද?

පි නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ මීට ඉස්සෙල්ලා කියපු උත්තර ඔක්කෝම අදාල වෙන්නේ වනාතවිල්ලුවෙන් සොයා ගත්ත පුපුරන ද්‍රව්‍ය සම්බන්ධයෙන්?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ප්‍රහාරයට යොදා ගත්තු පුපුරණ ද්‍රව්‍ය කොහෙන්ද ලබාගත්තේ කියන එකට ඔබට යම් තොරතුරක් නැහැ?

පි නැහැ ස්වාමිනි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ මීට පෙර මගේ ප්‍රශ්නයකට ප්‍රකාශ කර සිටියා මාධ්‍යවේදියකු සමඟ සාකච්ඡාවක් සිදු කලා මීට මාසයකට වගේ පෙර?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම සාකච්ඡාවේදී ඔබ මෙම පාස්කු දින ප්‍රහාරය සහ අන්තවාදී ආගමික කටයුතු පිළිබඳව ඔබ අදහස් දැක්කුවානේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: අන්න ඒ කරුණු එකී සාකච්ඡාවේදී ඔබ සාකච්ඡාවට බදුන් කලාද?

පි සියල්ලම කථා කරලා නැහැ ස්වාමිනි. වේලාව තිබුණේ විනාඩි 30 ක කාලයක් ඒ විනාඩි 30 ට ආවරණය වෙන විදියට කථා කලා ස්වාමිනි.

ප්‍ර: එය විකාශයනය වුණාද යම් වැඩසටහනක?

පි එය මාධ්‍යයක විකාශනය කරේ නැහැ ස්වාමිනි ඒක YouTube චැනල් එකක විකාශනය වුණේ ස්වාමිනි

ප්‍ර: කවද්ද ඒක YouTube එකට නිකුත් කරේ?

පි ස්වාමිනි මට දිනය මතක නැහැ දැන් මාසයකට විතර කාලයක් ඇතුලත

ප්‍ර: කවුරුන් විසින් ද ඒක නිකුත් කරන්නට යෙදුණේ?

පි මාධ්‍යවේදියා විසින් ස්වාමිනි

ප්‍ර: ආ.....?

පි එම මාධ්‍යවේදියා ස්වාමිනි

ප්‍ර: මොකක්ද ඒ YouTube චැනල් එකේ නම?

Present Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි චමුදිත කියලා කෑල්ලක් තියෙනවා මට අනිත් එක මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: චමුදිත කියන කෑල්ල විතරක් මතකයි. මොකක්ද නැවත කියන්න ඒ මාධ්‍යවේදියාගේ නම?

පි චමුදිත මට අනිත් කෑල්ල මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: මේ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු විසින් ප්‍රකාශය කරන YouTube නාලිකාවක ප්‍රචාරය කර ඇති දැන් මෙම සාකච්ඡාවේදී ඔබ ප්‍රකාශ කරන්නට යෙදුණු මෙම කොමිෂන් සභාවේ විෂය පථයට භාජනය වෙලා තියෙන කරුණු ගැන ඔබ සත්‍යයක්ද ප්‍රකාශ කරේ?

පි ඔව් ස්වාමිනි

ප්‍ර: ඒ කරුණුවල වගකීම එහි ඔබ ප්‍රකාශ කරන්න යෙදුණු කරුණුවල වගකීම ඔබ අද දින භාර ගන්නවද නැද්ද කියලා කියන්න?

පි භාරගන්නවා ස්වාමිනි.

ප්‍ර: එම වැඩසටහනේ ඔබ මෙම කොමිෂමේ විෂය පථයට අදාලව හෙලි කරන්නට ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණු තවදුරටත් තහවුරු කිරීමට ඔබ භාරයේ යම් සාක්ෂි තියෙනවද?

පි ස්වාමිනි ඒ කරුණු මට නැවත බලන්න අවශ්‍යයි ස්වාමීනි

(විඩියෝවක් දර්ශනය කරයි)

ප්‍ර: දැන් ඔබ සහ මේ කොමිෂන් සභාවේ නරඹන්නට යෙදුණු ඒ විඩියෝව පටයේ YouTube චැනලය Truth with chamudtha කියන ඒ වැඩසටහනේ ඔබ සිටිනවද ඔබද ඒ ඉන්නේ?

පි සිටිනවා ස්වාමිනි.

ප්‍ර: ඒ ඔබ ප්‍රකාශ කරන දේවල් සියල්ලම සත්‍ය ද?

පි ඔව්

ප්‍ර: පාස්කු ප්‍රහාරය සහ ආගමික අන්තවාදය සම්බන්ධයෙන්?

පි පාස්කු ප්‍රහාරය සහ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් කථා කරන සියල්ල සත්‍යයයි ස්වාමිනි.

ප්‍ර: මෙය ඔබ කවද්දද මෙම වැඩසටහන මේ චමුදිත කියන මාධ්‍යවේදියා වෙත ලබා දුන්නේ?

පි ස්වාමිනි මට දිනය මතක නැහැ දැන් මාසයක් හමාරක් විතර ඇති ස්වාමිනි

ප්‍ර: කොහේදීද මේ පටිගත කිරීම සිදු කලේ?

පි වරකාපොල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මංගෙදර ග්‍රාමසේවා වසමේ කරද කියන මගේ ගමේ ස්වාමිනි.

ප්‍ර: ඔබේ ගමේ ඒ පිටුපසින් තිබෙන්නේ ඔබේ නිවසද?

පි නැහැ ස්වාමිනි

ප්‍ර: සාක්ෂිකරු මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි සාක්ෂිකරු විසින් හදුනා ගන්නට යෙදුණු Truth with chamudthaනැමැති YouTube චැනලයේ

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විනාඩි 33 ක් පමණ ධාවන කාලයක් ඇති ඒ වීඩියෝ ක්ලිපය C 1526 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා එය භාගත කිරීම සඳහා අපගේ තාක්ෂණික අංශය වෙත නියෝගයක් නිකුත් කරන ලෙසත්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ඉල්ලා සිටි පරිදි අදාල වීඩියෝ පටිගත කිරීම බාගත කර C 1526 වශයෙන් ලකුණු කිරීමට අවසර ලබා දෙමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

(ප්‍රශ්නය සකස් කර ඉදිරිපත් කරයි)

ප්‍ර: ඒ කියන්නේ මෙම පාස්කු දින ප්‍රහාර හෝ ඒ සම්බන්ධව කටයුතුවල තුෂාර පිරිස් ඒ පිටුපස සිටියද?

පි පාස්කු ප්‍රහාරය සම්බන්ධව මම දැනුවත් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ කියා සිටියා මේ කරුණා අම්මාන් කියන දේශපාලනඥයා සම්බන්ධයෙන්?

පි ඔව් ප්‍රකාශ කලා ස්වාමිනි.

ප්‍ර: ඔහු වෙත කෝටී රුපියල් කෝටී 15 වක කොන්ත්‍රාත්තුවක් ලබා දීම ගැන ඔබ සඳහන් කරනවා?

පි ස්වාමිනී එතන නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යතාවයක් තියෙනවා. ඒ කෝටි 15 ක් කියන එක මගේ හඬපටයේ නැවත මම සවන් දුන්නාම ස්වාමිනි දැන ගත්තා මිලියන 15 ක් කියලා තමයි සඳහන් වෙලා තියෙන්නේ

ප්‍ර: මිලියන 15 ක්?

පි හඬ පටයේ තියෙන්නේ මිලියන 15 ක් ස්වාමිනි. තුෂාර පිරිස් සමඟ ඒ කථා කරන හඬපටයේ නැවත මම මාධ්‍ය නිවේදනයෙන් පස්සේ සවන් දුන්නා බලන්න යම් කිසි තැනක නීති ගැටළුවකට මුහුණ දෙන්න වුණොත් කියලා යම් වැරදීමක් වුණාද කියලා බැලුවම ස්වාමිනි මිලියන 15 තමයි කෝටි 15 කියලා කියන්නේ ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔබ මේ කරුණාඅම්මාන් සහ දැන් ඔබ කියන විදියට රුපියල් මිලියන 15 වල සම්බන්ධතාවය?

පි ස්වාමිනි මිලියන 15 ක් කියන්නේ පොඩි මුදලක් ඒ වගේ ප්‍රහාරයක හැටියට මම මට මිලියන 15 ක් කිව්වාම තුෂාර පිරිස් මම නැවත ඇහුවා ඔයාට වැරදුණාද මිලියන 15 ක්ද හරියටම කියලා ඊට පස්සේ ඔව් ඔව් මිලියන 15 ක්මයි කියලා කිව්වා ස්වාමිනි. ඒ කිව්වේ ස්වාමිනි ලංකාවේ පල්ලිවලට ප්‍රහාරයක් දියත් කරන්න?

ප්‍ර: මොන පල්ලිවලට ද?

FAIR COMMENT BY JEZEEM

පි මුස්ලිම් පල්ලිවලට ස්වාමිනි.තුෂාර පිරිස් කථා කරලා තිබුණා කරුණා අම්මාන් එක්ක ඒ දුරකථනයෙන් කථා කරලා තිබුණේ ස්වාමිනි ඊට පස්සේ මට මේක අනාවරණය වෙන්නේ ඒ දවස්වල අරඹේපොල සිද්ධියේ SJB කියන වට්සැප් ගෘප් එකක් හදාගෙන මේ ගොල්ලෝ

ප්‍ර: SJB?

පි ඔව් SJB සිංහලයේ ජාතික බලමුළුව කියලා SJBකියලා ගෘප් එකක් හදාගෙන ඒ අය ක්‍රියාත්මක වුණේ ප්‍රහාර පුණානි විශ්ව විද්‍යාලයින් පටන් ගෙන ප්‍රහාර මාලාවක් දියත් කරන්න මෙන්න මේක සැලසුම් කරපු තුෂාර පිරිස්ලා කරුණා අම්මාන් එක්ක කථාකරලා කරුණා අම්මාන් එක්ක සාකච්ඡාවට යවනවා අරඹේපොළ රතනසාර ස්වාමින් වහන්සේ සහ සුභකාන් කියලා කෙනෙක් එයාගේ නම ද්‍රවිඩ කෙනෙක් සුභකාන්

ප්‍ර: සුභකාන්?

පි සුභකාන් කියලා කෙනෙක් යවනවා මට ඇහුණා සහ මාත් එකක් කථා කරපු නම භාවිතා කලේ සුභකාන් කියලා ඊට එහා තොරතුරක් මට එතනින් හොයාගන්න බැරිවුණා. මට ඒක මං ඒක දැනගත්තේ මෙහෙමයි ස්වාමිනි තුෂාර පිරිස් මට ඕක දැනගන්න වුවමනා වෙලා මම කිව්වා කරුණාඅම්මාන් මට හම්බවෙන්න බැරිවෙයිද දන්නේ නැහැ කියලා අපෝ අපෝ ඔයාට කරුණාම්මන් සම්බන්ධ කරන්නේ නැහැ එක පාරක් මම අරඹේපොල යවලා අරඹේපොළලා සෙල්ෆියක් ගහලා එළියට දාලා තව පොඩ්ඩෙන් ඔක්කෝම මාට්ටුවෙනවා කියලා. මම ඇහුවා මොකක්ද ඒ කථාව කියලා. ඊට පස්සේ කිව්වා මම මෙහෙම පල්ලිටිකට ගහන්න කියලා Plan කරන්න කරුණා හම්බෙන්න යැව්වා. ඒ යැව්වාට පස්සේ මේගොල්ලෝ සෙල්ෆි ගහලා ඔක්කෝම කරගෙන ආවා ගාණකුත් කථා කර ගත්තා මං ඇහුවා මොකද වැඩේ ok කර ගන්න පුළුවන්ද ගාණක් සල්ලි ප්‍රශ්නයක් නැද්ද කියලා නෑ නෑ ඒක තමා අපිට දැන්.funds පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා අපේ කීපදෙනෙක්තව මේ දවස්වල සල්ලි දාන්න පොඩ්ඩක් පරක්කු වෙනවා අන්තර්ජාතික මට්ටමින් ඉන්න අය සල්ලි දාන්න පරක්කු වෙනවා ඒ නිසා මේක පොඩ්ඩක් අපි කථා කරන්න තව ඇඳගෙන යනවා ඉස්සරහට කියලා කිව්වා දැන් මට තුෂාර පිරිස්ගෙන් ස්වාමිනි ඒක ඒකපාර්ශිකව පිළිතුරක් විදියට ඒක මදි ඒ නිසා මම අනිත් පැත්තට පිළිතුරක් අරඹේපොළ හාමුදුරුවන්ගෙන් ගන්න ඕන නිසා අරඹේපොල හාමුදුරුවොත් එක්කත් කථා කරන ගමන් මම ඇහුවා මොකක්ද මේ කරුණා අම්මාන් එක්ක සෙල්ෆියක් ගැහුවා කියලා තුෂාර කිව්වා මොකක්ද ඒ කථාව කියලා ආ ඔව් ඔව් අපි ගියා මෙහෙම වැඩකට ගියා මං කිව්වා දැන් ඉතින් සල්ලි තුෂාර දුන්නද වැඩේ ok ද කියලා ඇහුවා නෑ නෑ ඌ ඔය කියන විදියට ඌට දෙන්න සල්ලි දෙන්න නැහැ ඌගේ ළඟ ඌ දැන් ඔය සල්ලි ටික එකතු කර ගන්න ඕනේ එහෙම කියලා

FAIR COMMENT BY JEZEEM

කිව්වාම ස්වාමිනි ඒ සාක්ෂි දෙකම මං එකතු කර ගත්තා හඬ පට විදියට මම ඒක ස්වාමිනි 2018 දෙසැම්බර් මාසේ 12 වෙනිදා මාධ්‍ය මම එතකොට අම්පාරේ හිටියේ මහියංගනයේ මහඔයේ ස්වාමිනි මගේ ළඟ ඒ දෙන්නාගේම හඬපට දෙකේම කෑලි දෙක එකතු කරලා මම ඒක ස්වාමිනි මාධ්‍යයට ලබා දුන්නා නමුත් ස්වාමිනි අම්පාරේ ඉන්න මාධ්‍යවේදියාට මං ඒ පිළිබඳව අනාවරණය කරන්න එන්න කියලා කථා කරාම අම්පාරේ මාධ්‍යවේදියා මගෙන් ඇහුවා ඇයි කියලා මං කිව්වා මෙන්න මෙහෙම සිදු වීමක් කරුණා අම්මාන් පිළිබඳව මෙතන කියවෙනවා එන්න කියලා අම්පාර මාධ්‍යවේදියා ඒ ගමන ප්‍රතික්ෂේප කරා ඔහු මගෙන් ඉල්ලීමක් කරා ස්වාමිනි ඒක කරන්න එපා කියලා ස්වාමිනි.

ප්‍ර: ඇයි?

පි ඒක මෛත්‍රිපාල සිරිසේන මහත්මයාගේ පක්ෂයේ ලේකම් කෙනෙක් වන නිසාත් මේක අනාවරණය කලොත් ඔයාට ලොකු ප්‍රශ්නයක් වෙන්න පුළුවන් කියලා කිව්වා නමුත් ඒ නිසා මම හිරු දෙරණ වගේ මාධ්‍ය ආයතන මුලස්ථානවලට කථා කරලා මම ඉල්ලුවා මහියංගනයේ මාධ්‍යවේදීන්ගේ දුරකථන අංක ඉල්ලගෙන මහියංගනය මාධ්‍යවේදියෝ ගෙනත්ලා මම ස්වාමීනි මේ හඬ පටපත් එක්ක නිකුත් කරපු ඒ මාධ්‍ය නිවේදනය නිකුත් වුණේ නැහැ. ඒක මාධ්‍යයේ පලවුනේ නැහැ ස්වාමිනි ඒ දිනය ස්වාමිනි 2018.12.12 වෙනිදා ස්වාමිනි අම්පාර මත මගේ ගෙදරදි ඔය පිළිබඳව මම පළමුවෙන්ම අනාවරණය කරනවා ඊට කලින් මම අද පුවත්පතට මම 12 වෙනි මාසේ 10 වෙනිදා කියනවා LTTE සංවිධානයේ හිටපු නායකයෙක් පිළිබඳව මම ඉදිරියේ දී විශේෂ හෙලිදරවවක් කරනවා කියලා ස්වාමිනි. නමුත් ඒ මාධ්‍යට කරපු ඒ හෙලිදරව්ව එදා අනාවරනය කලේ නැහැ ස්වාමිනි.ඒ පැහැදිලිවම හඬ පට තිබිලත් ඔව් අපි මම යැව්වා කියලා තුෂාර පිරිස් කියනවා කරුණා අම්මාන් මෙච්චර ගානක් ඉල්ලුවා කියලා තුෂාර පිරිස් කියනවා අනිත් පැත්තෙන් ගිය කෙනා අරඹේපොල රතනසාර හාමුදුරුවෝ ස්වාමින් වහන්සේ කියනවා ඔව් මම තමයි ගියේ මෙහෙම ප්‍රශ්නයක් වුණා කියලා කියනවා ඒ තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබිලත් මාධ්‍ය ඒවා පල කරේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ හඬපට ඔබ ගාව තියෙනවා දැනටත්?

පි ඒ එක හඬපටයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: අනෙක් හඬ පටය?

පි: අරඹේපොළ රතනසාර ස්වාමින්වහන්සේගේ හඬපටය මම එදා දවසේ මාධ්‍ය සාකාච්ඡාවට පැමිණි නිලධාරින්ට ලබා දුන්නා ඒ නිලධාරින්ගෙන් ලබා ගන්නා මේවා ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ස්වාමිනි.

ප්‍ර: නම් කරන් පුළුවන් ද ඒ නිලධාරින්?

FAIR COMMENT
BY JEZEEM

පි මට නම් වශයෙන් කියන්න බැහැ නමුත් මහියංගනයේ මාධ්‍යවේදියෝ හරි,දෙරණ, මාධ්‍ය ආයතනවලින් මහියංගනයේ කටයුතු කරන්නේ ඒ අය ස්වාමිනි.

ප්‍ර: රිෂාඩ් බදුර්දීන් මහත්මයාව ඒ කියන්නේ හිටපු අමාත්‍ය රිසාඩ් බදුර්දීනුත් රත්නපුර ප්‍රදේශය හෝටල් හිමයෙකු?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: සහ සාම්පූර්වල තැනැත්තෙක් ඝාතනය කිරීමට තුෂාර පිරිස්ට අවශ්‍ය බව කියා සිටියා?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය ඔබට දැන්නුවද ඔහු?

පි දැන්නුවා ස්වාමිනි.

ප්‍ර: ඒ කොයි කාලේද?

පි ඒ ස්වාමිනි ඔය 2017 මාත් එක්ක ඔය සම්බන්ධ වුණාට පස්සේ ඔය තොරතුරු ගැනනිතර කථා කරා ස්වාමිනි.

ප්‍ර: මේ පුද්ගලයන් ඔබට නම් කරන්න පුළුවන්ද?

පි නම් කරන්න බැහැ ස්වාමිනි

ප්‍ර: මොන ජාතිකයන්ද?

පි ලංකාවේ කෙනෙක් නෙමේ ස්වාමිනි රත්නපුරට එන කෙනා එතකොට රිසාඩ් බදුර්දීන් ඒක මං නම් වශයෙන්ම දන්නවා ස්වාමීනි සාම්පූර්වල මේ පුද්ගලයා වෙන්නේ සාම්පූර් අර වෛත්‍යයක් ඩෝසර් කරා පහුගිය පුවතක් පල වුණා එහෙම අවුරුදු දෙකකට තුනකට ඉස්සර වෙලා ස්වාමිනි. මෙන්න මේකේ ප්‍රාදේශීය ලේකම්වරිව මේකේ සහයෝගයක් දැක්වුවා කියලා කිව්වා තුෂාර පිරිස් කිව්වා ඒ ප්‍රාදේහීය ලේකම්වරියක් ඒ ප්‍රාදේශිය ලේකම්වරිය ඝාතනය කරන්න ඕනේ කියලා කිව්වා ඊළඟට ස්වාමිනි ඔහු ප්‍රකාශ කරා ඒ ඉඩම හරියේ කටයුතු කරන තවත් පුද්ගලයෙක් ද්‍රවිඩ පුද්ගලයෙක් ඉන්නවා මෙයට සහයෝගය දෙන අන්න ඒ පුද්ගලයාවත් ඝාතනය කරන්න ඕනේ කියලා කිව්වා ස්වාමිනි.

ප්‍ර: එය ක්‍රියාත්මක වුණාද?

පි ක්‍රියාත්මක වුන් නැහැ ස්වාමිනි ඒ දක්වා ක්‍රියාත්මක වෙන්න දුන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ ගැන පොලිසියකට හෝ?

පි දන්නවලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: කාටද කොහාටද?

පි මම රාජ්‍ය බුද්ධි සේවයට දන්වලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ රාජ්‍ය බුද්ධි සේවයේ අර ඔබ පෙර සඳහන් කල නිලධාරියාටම ද?

පි ඔව් ස්වාමිනි. ඒ නිලධාරියා අවසාන වශයෙන් ඊයෙත් කථා කරා ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ සම්බන්ධයෙන් මොකක්ද ගත්ත පියවර දැන් ඊයේ මොකක්ද කථා කරලා ඔහු කියා සිටියේ?

පි ඊයේ මම කථා කරේ ස්වාමිනි

ප්‍ර: ඇයි?

පි මම කථා කරා සාමාන්‍යයෙන් එක්කෝ එයා මට ගන්නවා නැත්නම් මම ගන්නවා මම කථා කරලා කිව්වා හෙට පාස්කු කොමිසන් එකට සාමාන්‍යයෙන් මම ඔය යන හැම ගමනකම ගොඩාක් ඒවාගේ මම ඔහුට දැන්නුවා ස්වාමිනි ඊයේ එදා ලිපියක් භාර දෙන්න ආවා ඒ දවසේත් කිව්වා මං කථා කරලා කිව්වා මම හෙට පාස්කු කොමිෂන් එකට යන්න කියලා එවලා තියෙනවා මං හෙට යනවා මොකක්ද තත්ත්වය කියලා ඇහුවා මං කිව්වා මුකුත් තත්ත්වයක් නැහැ ඔයා මට කිව්වේ නැත්තේ මොනවද මෙච්චර කාලයකට කියලා ඇහුවා මං කිව්වා ඉතින් ඔයාට හැමදේම දැන් කියලා තියෙන්නේ කියලා හෙලිදරව් කරන්න පෙර මොනවා හරි දෙයක් නොකියපු දේවල් තියෙනවද කියලා ඇහුවා මං කිව්වා ඔව් කියලා මොනවද කියලා නැත්තේ කියලා මං කිව්වා සාතන කුමන්ත්‍රණය පිළිබඳව මං ඔයාට කියලා නැහැනේ ඇයි මට කිව්වේ නැත්තේ කියලා ඇහුවා මම කිව්වා ඉතින් ඔයා කියලා බෑනේ ඔයාට කිව්වා නම් මට වෙඩි කන්න වෙන්නේ ඔයාලට කිව්වාම පස්සේ ඔයාලා ගිහින් අනිත් පැත්තට කියනවානේ කියලා කොහොමද දන්නේ කියලා ඇහුවා මං කිව්වා ඔයා මට කිව්වානේ ඔයත් මට කිව්වා පාස්කු ප්‍රහාරයේදී මේ ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී ඔයාලා මොකද වුණේ ඔයලා සවන් දෙන්න කියලා ඔයාලා මුල වරද්ද ගත්තා ඒ නිසා මම ඔය ලොකු දේවල් ඔයාලාට දෙන එක නැවැත්තුවා එච්චරයි මං ඔයාලට නොකියලා තියෙන්නේ මං අනිත් හැමදේම කියලා තියෙන්නේ කියලා මං ඊයේ කිව්වා කියන් නැති කිව්වේ නැති මොනවා හරි තියෙනවද කියලා ඇහුවා මං කිව්වා කිව්වේ නැති මුකුත් නැහැ හැමදේම වගේ කියලා තියෙන්නේ කියලා එච්චරයි ඇහුවේ ස්වාමිනි. ඊයේ.

වේලාව: ප.ව 6.45

මෙතැන් සිට: නිල්මිණි කුමාරි

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

දැන් වෙලාව : ප.ව.6.45
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් සමඟ මොනවගේ සම්බන්ධයක්ද තිබ්බේ?

උ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩපිලිවෙලට මම කැමැත්තක් තිබුණා. ඒ හැරෙන්නට කිසිම සම්බන්ධතාවයක් තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර ඔබත් මෛත්‍රීපාල සිරිසේන මහත්තයාත් අතර අතරමැදියකු සිටියාද?

උ නැහැ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බාරයේ සිටින කාලය තුළදී දැන ගැනීමට ලැබුණාද සහරාන්ගේ කණ්ඩායමට මූල්‍යාධාර ලැබුණේ කොහොමද කියන්න?

උ නැත ස්වාමීනි. ඉබ්‍රාහිම් මුදලාලිගේ පුතාලා උදව් කරනවා කියලා කිව්වා. ඊට අමතරව විදෙස් රටවලින් කොහොමද එන්නේ ඒවා මොනවත් දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර පොලිසිය සහරාන්ගේ කණ්ඩායම ඔච්චර හොයද්දී සහරාන් සහ ඔහුගේ කණ්ඩායම ඔච්චර කල් සැඟවිලා සිටියේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඔබට යම්කිසි දැනුමක් ලැබුණාද?

උ මට දැනුමක් ලැබුණා පමණක් නොවෙයි ස්වාමීනි, ඒ සම්බන්ධව අපි ඇතුලෙදිත් කතාවුණා. ඒ ත්‍රස්ත සැකකරුවොත් එක්කත්. ස්වාමිනි මාවනැල්ලේ බුදුපිළිම කැඩීමෙන් පස්සේ එය අන්තවාදී කටයුත්තක් බව එය අපේ නීතියට අනුවම හඳුනාගෙන තිබුණා ස්වාමීනි. අපේ රටේ නීතියට අනුවම එය ත්‍රස්තවාදී ක්‍රියාවක් බව. ඊට අමතරව ස්වාමීනි එයට IS ත්‍රස්ත සංවිධානය එයට සම්බන්ධතාවයක් තිබුණ බවට බුද්ධි අංශ ඒ වෙනකොටත් සනාථ කරගෙන තිබුණා ස්වාමිනි. ඒ පිළිබඳව මම රාජ්‍ය බුද්ධි සේවයෙන්ම විමසුවාම ඒ අයම මට කියලා තියෙනවා ස්වාමිනි මේක ISලාගේ සම්බන්ධතාවයක් මේකේ තියෙනවා කියලා තියෙනවා ස්වාමිනි මම මේවා එළියේ කිසිම තැනක කතාකරන්නේ නැහැ. ඊටපස්සේ ඒ අයගෙන් තොරතුරු ලැබුණු විදිහය පිළිබඳ ප්‍රශ්නයක් එන නිසා. මම ඇහුවා කතාකරලා මොකක්ද ඇත්තටම මෙතන වෙලා තියෙන්නේ කියලා. මගේ මුහුණු පොතෙත් ස්වාමිනි මට මතකයි පාස්කු ප්‍රහාරයට මාස කිහිපයකට පෙර මම මාවනැල්ල බුදුපිළිම කැඩීමට IS

FAIR COMMENT BY JEZEEM

ත්‍රස්ත සංවිධානය සම්බන්ධයි කියලා මම ප්‍රකාශයකුත් නිකුත් කරා ස්වාමීනි. එහෙම කරන්නට හේතුව මං අර අරගොල්ලන්ගෙන් දැනගත්තා. මොකද මම එක දෙයක් දන්නවා කවදාවත් ඒ නිලධාරියා මට බොරු කියන්නේ නැහැ ස්වාමිනි. ඔහු දන්නවා මට බොරු කිව්වොතින් අනිත් පැත්තට කොහෙන් හරි අහුවෙනවා කියලා. ඒ නිසා කවදාවත් මට බොරු කියලා නැහැ. ඔහු කියලා තියෙනවා මේකට ISසම්බන්ධතාවයක් තියෙනවා. අපි උපරිම හොයන ගමන් ඉන්නේ. මොනවා හරි තොරතුරක් ලැබුණොත්.

ප ඔබ අර නිලධාරියා වශයෙන් සඳහන් කරන්නේ කවුද?

උ ලක්ජීව කියන නිලධාරියා ස්වාමීනි. ඊටපස්සේ ස්වාමිනි මුෆිස් කියන ඒ ත්‍රස්ත සැකකරුවා ලැක්ටොස් වත්තේ ත්‍රස්ත සැකකරුවා අත්අඩංගුවට ගන්නේ ජනවාරි 16 වගේ ස්වාමිනි මට මතකයේ හැටියට. ඔහුත් එක්ක මම කතා කලහම මම ඇහුවා ඉතින් ඔයාලා මෙච්චර කාලයක් මේකේ හැංගිලා හිටියේ මොකක්ද දැන් මේකේ ඉන්න චාන්ස් එකක් කොහොමද තිබුණේ ජනවාරි 16 ඉඳලා අප්‍රේල් 21 වෙනකම් ඇයි මේ කට්ටියව අත්අඩංගුවට ගන්න බැරිවුනේ කියන එක අපි සාජිත් මවුලවි ඔක්කොම එකතුවෙලා මම ඇහුවා නිකන් මට දැනගන්න ඇහුවා නිකන් මට දැනගන්න විදියට තමයි ඇහුවේ ස්වාමිනි. මට දැනගැනීමේ අවශ්‍යතාවය තිබුණා. එතනදි ඔවුන් ප්‍රකාශ කරේ ස්වාමිනි. රටේ තිබුණ ආරක්ෂක සැලැස්මේ තිබුණ දුර්වලතාවය නිසා මේ අයට මේ විදියට හැංගිලා ඉන්න පුළුවන්කම ලැබුණා කියලා. එතනදී ඒගොල්ලෝ මට කිව්වා එක අවස්ථාවක ඉෆ්ලාල්ගේ සහෝදරයෙක් ස්වාමිනි, ඉබ්‍රාහිම් මුදලාලිගේ පුතෙක් ඒ පාස්කු ප්‍රහාරය සිදුවෙන දවසට පෙර දවසේ නිවසට ඇවිල්ලා ගිහිල්ලා තියෙනවා ස්වාමිනි. එතකොට ඉෆ්ලාල් කියනවා බුද්ධි අංශ Alert එකේ හිටියා නම් අපේ ගේ වටේ දාගෙන හිටියා නම් ඉෆ්ලාල් ඒක කියන්නේ ඉෆ්ලාල්ගේ බෙරුම එන විදියට තමයි ඉෆ්ලාල් කියන්නේ , ඉෆ්ලාල් කියනවා ඕකගේ දැන් තමන්ගේ සහෝදරයාට මේ කියන්නේ, ඕකව අපරාදේ අත්අඩංගුවට ගන්න තිබ්බා, එහෙම අරගෙන වෙඩි තියලා මරලා දාන්ට තිබ්බා. අපිත් අමාරුවේ වැටුනා, බුද්ධි අංශ CID alert වෙලා හිටියා නම් අපේ ගෙදරට ඇවිල්ලා ගියා. ඒ ගිය එක අත්අඩංගුවට ගන්ට මේගොල්ලන්ට හැකියාවක් නැහැ. ඒකෙන් අපි හිරේ වැටුණා. එහෙම කියලා ඒගොල්ලම කියනවා කිසිම plan එකක් තිබුණේ නැහැ මේ අය අත්අඩංගුවට ගන්න. අත්අඩංගුවට ගන්න plan එකක් තිබුණ නම් අප්‍රේල් 21 පෙර දවසේ අර මේගොල්ල ත්‍රස්ත සංවිධානයට සම්බන්ධයි කියලා නම් වශයෙන් තිබිලා තියෙනවා ස්වාමිනි. ඒ වගේම මේ ගොල්ලෝ අතුරුදහන් කියලත් බුද්ධි අංශ දැනගෙන ඉඳලා තියෙනවා. ඒ අතුරුදහන් එකේ අප්‍රේල් 21 වෙනිදා ප්‍රහාර මාලාවක් දියත්වෙනවා කියලත් දැනගෙන ඉඳලා තියෙනවා ස්වාමිනි. නමුත් අඩුම තරමේ පැය 24ට

FAIR COMMENT — BY JEZEEM —

කලින් හරි බුද්ධි නිලධාරියෙක් නිරීක්ෂණයක යෙදෙව්වා නම් ස්වාමිනි නිවසකට එනවාද යනවාද මොකක්ද වෙන්නේ කියලා අඩුම තරමේ පැය 24කට ඉස්සෙල්ලා මේක යෙදෙව්වා නම් ස්වාමිනි, මේ එක ත්‍රස්ත සැකකරුවෙක් හරි අත්අඩංගුවට ගන්න පුළුවන්කම තිබුණා ස්වාමිනි. ඉතින් ඔවුන් ඒ සම්බන්ධව කතාකරනවා. මේ රටේ තිබුණ ආරක්ෂක Plan එකක් නොතිබුණ නිසා තමයි ස්වාමීනි මේ පාස්කු ප්‍රහාරය එල්ල වුනේ කියන එක මගෙත් මතය. ඒ වගේම ඒ අයත් අපිත් එක්ක කතාකරන්නේ ඒ අවකාශයෙන් ප්‍රයෝජනය ගත්තා කියලා තමයි ඒගොල්ල හැම වෙලාවෙම කතාකරන්නේ ස්වාමීනි.

ප්‍ර එතකොට ඒ ආරක්ෂක තත්ත්වය එවැනි හිදැසක් තිබ්බ බව ඔවුන් කලින් දැනගෙන හිටියාද? නැත්නම් මේ ප්‍රහාරයෙන් පස්සෙද ඔවුන්ට මෙච්චරක්?

උ කලින්ම දැනගෙන ඉඳලා තියෙන්නේ ස්වාමීනි හැබැයි මේ ගොල්ලෝ කවුරුත් හිතුවේ නැහැ ස්වාමිනි මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මේක මේ තරම් විමර්ශණයක් ඇවිල්ලා මේ වගේ කොමිෂන් හැදිලා එයිට පස්සේ ගැවිච්ච ගැවිච්ච හැමෝම අත් අඩංගුවට ගන්නට වැඩපිළිවෙලක් සකස්වෙයි කියලා මේගොල්ලෝ හිතුවේ නැහැ. එහෙම හිතන්ට හේතුව ස්වාමිනි ඒගොල්ලෝ බැලුවේ වෙච්ච දේවල්. පහුගිය කාලයේ වෙච්ච දේවල් එක්ක මොකක් හරි සිදුවීමක් වුනා, එක්කෙනෙක් දෙන්නෙක් අත්අඩංගුවට ගත්තා. පොඩි කාලයක් හැංගිලා හිටියා. කතාව ඉවරයි ස්වාමීනි. මෙහෙම කාලයක් තමයි තිබුණේ. ඒ නිසා මේගොල්ලෝ හිතුවේ මේකත් ඒ විදියට වෙයි කියලා. හැබැයි ස්වාමිනි මේකේ ගොඩක් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අත්අඩංගුවට ගන්න ඕන ගැවුන ගෑවුන බොහෝමයක් අත්අඩංගුවට අරගෙන තිබුණා ස්වාමිනි.

ප්‍ර ඔවුන්ට යම් අවබෝධයක් තිබ්බද අප්‍රේල් 21 වෙනිදාට පෙර ඔවුන් කරන ක්‍රියාවන් රාජ්‍ය බුද්ධි සේවයේ නැත්නම් යුධ හමුදා බුද්ධි අංශය විසින් නිරීක්ෂණය කරන බවට ඔවුන්ගේ යම් පෙර දැනුමක් තිබුණද ඒ සම්බන්ධයෙන්?

උ පෙර දැනුමක් තිබිලා තියෙනවා ස්වාමිනි

ප්‍ර කොයි බුද්ධි අංශය සමඟද?

උ මොන බුද්ධි අංශයෙන්ද කියන්න දැනුමක් නැහැ ස්වාමිනි. ඔවුන් සම්බන්ධව දැනුවත් වෙලා ඉන්නවා කියලා ඔවුන් දැනගෙන තිබෙනවා ඒකට හේතුව එක උදාහරණයක් විදියට ඒගොල්ලෝ පෙන්වන්නේ ස්වාමිනි නුවරඑළියේ කඳවුරට පොලිසියෙන් කඩාවැදීම ස්වාමීනි ඒ වෙලාවේ වෙච්ච සිදුවීම මම සම්පූර්ණ ස්වාමිනි එක පුද්ගලයෙක්ගෙන් දැනගත්තා. මම උදේ ප්‍රකාශ කරා ස්වාමීනි ක්‍රිකට් ගහන්න කියලත් සමහර මිනිසුන් අරගෙන ගිහිල්ලා තියෙනවා. එක මනුෂ්‍යයෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදි මට හම්බවුනා. හම්බවුනහම ෆාරිස්

FAIR COMMENT BY JEZEEM

කියන පුද්ගලයෙක්, නාරංවල ඔහුගේ අම්මත් සිංහල තාත්තත් සිංහල ඔහුව කුඩා කාලයේ මුස්ලිම් පවුලකට හදාගන්න දීලා තියෙනවා. ඒ හදාගන්න දුන්නට පස්සේ ඔහුත් මුස්ලිම් ආගමේ කෙනෙක් බවට පත්ලොා තියෙනවා. පස්සේ ඔහුට යාළුවෙක් තමයි කතාකරලා තියෙන්නේ නුවරඑළියේ යන් ට්‍රිප් එකක් යන් ක්‍රිකට් ගහන්න කියලා. ගියාට පස්සේ මේ අයට කියලා තියෙන්නේ අද එළියට බහින්න එපා. ඔහොම්ම ඉන්න හෙට උදේ විශේෂ සාකච්ඡාවක් තියෙනවා. ඒ සාකච්ඡාව තිබ්බට පස්සේ ඔයගොල්ලන්ට යන්ඩ පුළුවන් කියලා. සාකච්ඡාව පටන්ගන්න හදනකොටම තමයි ස්වාමීනි පොලීසියෙන් ඇවිල්ලා තියෙන්නේ. පොලිසියෙන් එනකොට සහරාන්ලා කියලා තියෙන්නේ මේ අයට ඔයගොල්ලෝ කවුරුත් එළියට බහින්න එපා අපි තමයි මේවට උත්තර දෙන්නේ කියලා. එතකොට ඒ උත්තර දෙන්නේ කියලා ඒ විදියට ඒ සැලැස්මේ ඉන්නකොට සහරාන් එතකොට දැනගෙන ඉඳලා තියෙනවා සහරාන් පිටිපස්සේ බුදධි අංශ ඉන්නවා කියලා. නමුත් ස්වාමීනි එතන ඒගොල්ලෝ සූක්ෂමව පොලීසිය අහපු ප්‍රශ්නවලට උත්තරදීලා හැඳුනුම්පත් ඔක්කොම ඉදිරිපත් කරලා හැඳුනුම්පත් ටික පොලීසියට අරන් ගිහිල්ලා පොලිසියෙන් පස්සේ හැඳුනුම්පත් ටික ඉල්ලාගෙන තමයි මේගොල්ලෝ එතනින් පිටවෙලා ගිහිල්ලා තියෙන්නේ ස්වාමීනි. එතකොට ඒ දවස්වල ඉඳලම මොහු මඩකලපු ප්‍රදේශයේ ගැටුම්වලින් පස්සේ සහරාන් හැංගිලා ඉන්නපටන්ගත්තට පස්සේ සහරාන් දන්නවා සහරාන් පස්සෙන් බුද්ධි අංශ අවධානයෙන් ඉන්නවා කියලා ස්වාමීනි.

ප ඒ නුවරඑළිය පුහුණු කඳවුරට අවි ආයුධ ගෙනල්ලා තිබ්බාද?

උ ස්වාමීනි මම කතාකරපු කෙනා දන්නේ නැහැ අවි ආයුධ ගෙනල්ලා තියෙනවා කියලා. නමුත් තවත් අය කිව්වා අවි ආයුධ ගෙනල්ලා තියෙනවා කියලා ස්වාමීනි.

ප එතකොට පොලිසියට ඒ ටික අහුවුනේ නැද්ද?

උ පොලිසියට ඒවා ඇහුවෙලා නැහැ ස්වාමීනි

ප ඇයි ඒක අහුවුන් නැත්තේ?

උ අහුවෙලා නැති හේතුව කුමක්ද කියන්න මම දන්නේ නැහැ ස්වාමීනි.

ප ඔබගේ ඉතුරු විස්තරය කරන්න

උ ඊට පස්සේ ස්වාමීනි මඩකලපුව සිදුවීමෙන් පස්සේ සහරාන් හැංගෙනවා මම මේවා සත්‍යයද අසත්‍යයද කියන්න මම දන්නේ නැහැ ස්වාමිනි. මම මේ කතා කරපු දේ පමණයි කතාකරන්නේ. මඩකලපුව සිදුවීම් වලට පස්සේ සහරාන්ලා හැංගුණාට පස්සේ මේ වගේ තැන් තැන්වල පුහුණුවීම් කටයුතු කරගෙන, මේ සංවිධානය විදියට ගරිල්ලා suicide team එකක් විදියට මේක හදාගෙන ගිහිල්ලා නුවරඑළියේදීත් මේගොල්ලෝ අත්අඩංගුවට ගන්න ගිහිල්ලා මේ ගොල්ලෝ අවසාන මොහොත දක්වා බේරි බේරි බේරි ඇවිල්ලා තියෙනවා. ස්වාමීනි නමුත් ඒගොල්ලෝ අදහස්

FAIR COMMENT — BY JEZEEM —

කරනවා ජනවාරි 16 වෙනිදා වෙනකොට ලංකාවේ බුද්ධි අංශවලට සනාථ කරන්න තොරතුරක් ලැබිලා ඉවරයි. මේක කියන්නේ ෆායිස්ලා මේක හොඳටම කියනවා ස්වාමීනි පැහැදිලි කරලා. ෆායිස් කියන්නේ ගුරුවරයෙක්. ඔහු කියනවා නාමල් අපේ ලංකාවේ intelligence ගොඩක් දුර්වලයි කියලා එයා කියනවා ජනවාරි 16 වෙනිදා වෙනකොට ආයුධත් තිබුණා නම් පුපුරණ ඒ අවශ්‍ය දේවලුත් තිබුණ නම් ඒ සංවිධානය කරන මිනිස්සු හැංගිලා ඒවා සංවිධානයත් කරනවා නම් ජනවාරි 16 ඉඳලා අප්‍රේල් 21 වෙනකම් අපේ රටේ බුද්ධි අංශ මොකක්ද කරේ කියලා අහනවා. බුද්ධි අංශවල තිබුන දුර්වලතාවය නිසා තමයි ජනවාරි 16 ඉඳලා අප්‍රේල් 21 දක්වා අපිට මේක සැලසුම් කරගන්න කාලයක් ඇවිල්ලා තිබුණේ කියලා තියනවා. ඉතින් ඒ නිසා ස්වාමීනි ඔවුන් නිතර කියනවා බුද්ධි අංශ ඒගොල්ලන්ගේ පස්සෙන් අවධානයෙන් හිටියට ඒ ගොල්ලන්ව අල්ලගන්න පුළුවන් තැනකට බුද්ධි අංශවලට පත්වන්න බැරිවුනා කියලා කියනවා බුද්ධි අංශවලට වැඩිය ඒගොල්ලෝ ශක්තිමත්ව කටයුතුකරා කියලා, මට ඒගොල්ලෝ භාවිතා කරපු ඇප් එකක නමකුත් කිව්වා ට්‍රීමා හරි මොකක් හරි ඔය වගේ නමකුත් කීවා මට මට නම හරියට මතක නැහැ ස්වාමීනි මොකක් හරි ඒ ඇප් එකෙන් තමයි මේගොල්ලෝ නිතර නිතර කටයුතු කරේ කියලාත් කිව්වා ස්වාමිනි.

ප ඔබගේ එම සාකච්ඡා වලදි සාකච්ඡා වුනාද අර ට්‍රාජ් සමුද්‍ර හෝටලයට මරාගෙන මැරෙන ප්‍රහාරයට ගිය පුද්ගලයා ගැන?

උ නැත ස්වාමීනි

ප ඒ පිළිබඳ සාකච්ඡාවක් වුනේ නැහැ?

උ සාකච්ඡාවක් වුනේ නැහැ ස්වාමිනි

ප ඔබ ඒ සම්බන්ධයෙන් විමසීමක්වත් කෙරුවේ නැද්ද ඇයි එතන පිපිරීමක් සිදු වුනේ නැත්තේ කියලා?

උ නැහැ. ස්වාමීනි.

ප මේ ප්‍රහාරය කවදාද සැලසුම් කෙරුවේ කියන එක සම්බන්ධයෙන් ඔබට යම් අනාවරණයක් වුනාද මේ සැකකරුවන් සමඟ සාකච්ඡා කිරීමේදී?

උ ත්‍රස්ත ප්‍රහාරයට නුදුරේදීම තමයි සැලසුම් කරා කිව්වේ ස්වාමීනි.

ප දින සම්බන්ධයෙන් මොකුත් කිව්වේ නැහැ?

උ දින සම්බන්ධයෙන් මොකුත් කිවේ නැහැ ස්වාමිනි වැඩි කාලයක් යන්නේ නැතිව තමයි සැලසුම් කලේ කියලා කිව්වා ස්වාමිනි. මාසයක් ඇතුලත සියළු දේවල් සංවිධානය කරලා රන්ඩු වෙන්න ඕන අය රන්ඩුවෙලා. වෙන්න වෙන්න ඕන අය වෙන්වෙලා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වෙන්න ඕන අය ඒ පැත්තට සම්බන්ධවෙලා ඒ සියළු කටයුතු සිද්ධ වුනා කිව්වා ස්වාමීනි මාසයක් වගේ ඇතුලත. නමුත් එතනදි තව විශේෂ කතාවක් කිව්වා නවුෆර් මවුලවි සහ සාජිත් මවුලවි,ස්වාමිනි ඔවුන් නිතර ප්‍රකාශ කළා සාජිත් මවුලවිසහ නවුෆර් මවුලවිව මාවනැල්ල බුදු පිළිම කැඩීමෙන්

FAIR COMMENT BY JEZEEM

පස්සේ සාජිත් මවුලවි පොලිසියට අවස්ථා කිහිපයකම භාරවෙන්න උත්සාහ කරලා තියෙනවා. සාජිත් මුවලවි විවාහවෙලා ඉන්න කෙනෙක්. නමුත් සහරාන් ඔහුට කියලා තියෙනවා කිසිම අවස්ථාවක භාරවෙන්න එපා. බාර වුනොත් අපි ඔක්කොම අහුවෙනවා කියලා සාජිත් මවුලවි සහ නවුෆර් මවුලවි මේ අය දඹුල්ල ප්‍රදේශයට ගෙනල්ලා දඹුල්ල ප්‍රදේශයේ තමයි නැවතිලා ඉඳලා තියෙන්නේ ස්වාමීනි. ඒ ඉන්න කාලයට අවශ්‍ය මුදල් සියළුම දේවල් සහරාන් දීලා තියෙනවා ස්වාමීනි. ඒ විදියට කතාවුනා කොහොමත් ඒ අය පාස්කු ප්‍රහාරය පිළිබඳව සංවිධානයේ අත්අඩංගුවේ ඉන්න බොහෝමයක් දෙනා දැනුවත් වෙලා හිටියා. නමුත් ඒ අය කිසිම කෙනෙක් ඒක එලියට දැම්මේ නැහැ ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ ඔබට දැනගන්නට ලැබුණු කාරණාවලට අනුව ඔය මැරුණු අය විතරක් නෙවෙයි දැනට අත්අඩංගුවේ සිටින තැනැත්තනුත් මේ ප්‍රහාරය මේ විදියට වෙනවා කියන එක දැනගෙන හිටියා?

උ ඔව් ස්වාමිනි දැන් ඒක මේ කොමිෂමට ඉතාමත්ම විනිවිදභාවයකින් යුක්තව නිරීක්ෂණය කරන්න පුළුවන් වෙයි ස්වාමිනි. දැන් නවුෆර් මවුලවි හැමවෙලාවෙම කියනවා මම තරහා වුනා කියලා. ඇයි තරහ වුනේ කියලා ඇහුවම කියන්නේ මම මේකට කැමති වුනේ නැහැ. මොකටද කැමති වුනේ නැත්තේ කියලා ඇහුවම කියන්නේ මේ ප්‍රහාරයට මම කැමතිවුනේ නැහැ කියලා කියන්නේ. ප්‍රහාරයට කැමති වුනේ නැහැ කියන්නේ ස්වාමිනි එතනම ඔහු ප්‍රකාශ කරලා ඉවරයි ස්වාමිනි මේ ප්‍රහාරය පිළිබඳව ඔහු දැනුවත්කියලා ස්වාමිනි. ඔහු විතරක් නෙවෙයි එතකොට ඔහු වටා ඉන්න සහ නවුෆර් මව්ලවි වටා ඉන්න සියළුදෙනා නවුෆර් මවුලවි වටා එතකොට පිරිසක් එකතුකරව ගන්නේ එහෙමනම් ස්වාමිනි එකතු කරවගන්නේ ප්‍රහාරයට විරුද්ධ අයනේ එකතුකර ගන්නේ ස්වාමීනි ඔහු වටේ ඒ කියන්නේ ඒ ප්‍රහාරය පිළිබඳව ඒ අයත් දැනුවත්වෙලා ඉන්නවා කියන එක ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර සාක්ෂිකරු දැන් ඔබ මේ විස්තර කරගෙන ආපු විදියට ඔබ සමඟ ඒ කුටියේ හිටපු ඉස්ලාම් අන්තවාදීන් පස්දෙනා සෑහෙන තොරතුරු දීලා තියෙනවානේ.

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ ඔවුන් සමඟ කතාබහ කිරීමේදී ඔබට වැටහුනාද මෙතනින් ඔබ්බට ඔවුන්ගේ අරමුණ මොකක්ද වෙලා තිබුණේ කියලා?

උ ඒගොල්ලෝ හැම වෙලාවේම එතනින් ඔබ්බට ඊළඟ plan එකක් ගැන හිතලා තිබුණේ නැහැ. මේගොල්ලන්ගේ තිබුනේ ස්වාමිනි, මේ ගොල්ලෝ හිතුවේ මේ සිද්ධියෙන් පස්සේ රට යන පැත්තකට මුහුණ

FAIR COMMENT — BY JEZEEM —

දෙනවා කියන තැන තමයි හිටියේ ස්වාමිනි. නැවත මම දැක්කා ඇතැම් තැන්වල ස්වාමිනි පුවත්පත්වල පවා තියෙනවා මේ දෙවෙනි ප්‍රහාරයක් තුන්වෙනි ප්‍රහාරයක් එහෙම කියලා තියෙනවා ස්වාමීනි. දෙවැනි ප්‍රහාරයක් තුන්වෙනි ප්‍රහාරයක් ඒගොල්ලෝ සැලසුම් කරලා තියෙන්න ඇති ස්වාමිනි. ඒගොල්ලන්ගේ තිබුණු අවි ආයුධත් එක්ක. මං ඒක හරියටම කියන්න දන්නේ නැහැ ස්වාමිනි. හැබැයි ඒ අයගේ ස්වාමිනි මේ සංවිධානය නැවත ගොඩනගලා නැවත ප්‍රහාර මාලාවක් අපි කාලයක් ගියහම දියත් කරමු කියලා එහෙම Plan එහෙක හිටියේ නැහැ ස්වාමීනි මේ අය. අර තියෙන වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍යත් එක්ක මෙතන එක Blast එකක් කරලා ඒකෙන් පස්සේ දෙවෙනි පියවර විදියට ඔය අන්තවාදී මතයේම තුෂාර පීරිස්ලාත් ඉන්නවා ස්වාමිනි. එකක් මෙහෙම කරනවා ඊළඟ එක මෙහෙම කරනවා, ඊළඟ එක මෙහෙම කරනවා කියලා. එතකොට ඒ මතයේම සහරාන්ලාගේ කණ්ඩායමත් ඉන්නවා ස්වාමිනි. හැබැයි ඔවුන් කාලයක් ගිහිල්ලා මේ රට අල්ලන තැනට මේ ප්‍රහාර මාලාව දියත් කරමු කියන තැන එහෙම ඉඳලා නැහැ ස්වාමිනි. ඔවුන් අර මේක දැනෙන්ටත් ඕන නිසා ලෝකෙට කරන්ටත් ඕන නිසා, අවසානයේ යන්ට තැනකුත් නැති නිසා හිරවෙලා නිසා අන්තවාදය දැන් සහරාන්ට අවශ්‍යයි සහරාන්ගේ දැනුමත් එක්ක කිසිම කෙනෙකුට තර්ක කරන්න හැකියාවක් තිබිලත් නැහැ ස්වාමිනි. සාමාන්‍යයෙන් සහරාන් රාත්‍රියට ලැප්ටොප් එක තියාගෙන බිම වාඩිවුනහම, උදේ වෙනකල් ලැප්ටොප් එකේ අන්තර්ජාලයේ එකම ඉරියව්වේ, හැන්දෑවේ වාඩිවුනහම එකම ඉරියව්වේ උදේ වෙනකම් සහරාන්ට ඉන්ට පුළුවන් හැකියාව තියෙනවලු ස්වාමීනි. ඉතින් ඒ වගේ කටයුතු කරපු කෙනෙක්. ඉතින් එයාට උවමනා වුනා එයා ආගමික වශයෙන් ජීවිතය පවා දෙවියෝ වෙනුවෙන් පුජා කරා කියලා ඒ කටයුතු කරන්න ස්වාමිනි. ඉදිරියේදි ඊළඟට කරන්න තියෙන සැලසුම් පිළිබඳව ස්වාමීනි මට නම් එහෙම දැනගන්න නැහැ ස්වාමිනි.

ප්‍ර ඉෆ්ලාල් අහමඩ් ඒ දෙමටගොඩ ගෙදර හිටියා නේද? ඒ ගෙදර බෝම්බ පිපිරෙන වෙලාවේ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එතකොට ඔහුගෙන් ඔබ දැනගත් විදියට ඔහු ඔබත් එක්ක බොහොම සුහදව කතාකරා කිව්වානේ, ඇයි අර කාන්තාව දරුවන් සමඟ පුපුරුවා ගන්න හේතුව වෙලා තිබුණේ?

උ ඇය විවාහ වෙලා ආවාට පස්සේ ස්වාමිනි, ඒ ස්වාමියාට ලොකු ලෙන්ගතුකමක් දැක්වුවා කියලා කිව්වේ ස්වාමිනි. එතකොට ඉෆ්ලාල් කියන්නේ පවුලෙනුත් මේ කට්ටිය අපෙන් වෙන්වෙලා වගේ අපේ කටයුතුවලටත් ලොකු සම්බන්ධතාවයක් තිබුණේ නැහැ කියලා කියනවා. නමුත් ඒක මම පිලිගත්තේ නැහැ ස්වාමිනි. ඒක පිළිගත්තේ නැතිවුනාට

FAIR COMMENT BY JEZEEM

පස්සේ මම ඒයාට ප්‍රශ්න කරා නැහැ එහෙම කියන්න එපා මේක ඔයාලගේ සම්බන්ධතාවය අනිවාර්යෙන්ම තියෙනවාමයි මොනවා හරි දෙයක් මෙතන ඔයාලගේ සම්බන්ධතාවයක් මුදල් හරි මොනවා හරි ඔයගොල්ලෝ දීලා තියෙනවා ඔයගොල්ලෝ දන්නේ නැතිව ත්‍රස්තවාදි කටයුත්තක් ගේ ඇතුලට බෝම්බයක් ගේනකල් ඔය ගොල්ලෝ දන්නේ නැහැ කියන්න බැහැ කියලා මම ඉෆ්ලාල්ට කිව්වා. ඊටපස්සේ කිව්වා ඒ අය ඔය පුපුරුවාගත්තු සියළුමදෙනා තමන්ගේ බිරින්දැවරුන්ගේ මනස හදලා තියෙනවා මේ විදියට පලවෙනි පුපුරුවා ගැනීම ඒගොල්ලෝ කරාට පස්සේ ස්වාමීනි ඒ අයට අත්අඩංගුවට ගන්න ආවොත් ඒ අයට suicide කර ගන්න කියලා ඒගොල්ලන්ගේ මනස හදලා තිබුණා කියල තමයි ඉෆ්ලාල් අහමඩ් කිව්වේ. ඉෆ්ලාල් අහමඩ් කියනවා දැන් ඒගොල්ලෝ ඒ කාන්තාව ලඟ එයා හිටියා නම් ඒයත් ඒ තත්ත්වයට පත්වෙනවා කියලා ඉෆ්ලාල් අහමඩ් කියනවා ස්වාමිනි. සියළුදෙනාගේ මනස හදලා තිබ්ලා තියෙන්නේ එතකොට ඔය සාරා කියන කාන්තාව හාදියා ඒ හැමකෙනෙක්ගෙම දැන් ස්වාමිනි මම දකිනවා ස්වාමිනි යම් යම් විදියට ප්‍රකාශ නිකුත් වෙනවා ස්වාමිනි මම ඒක දන්නේ නැහැ කියලා මට මොනවත් කියලා නැහැ ප්‍රකාශ නිකුත් කරනවා. ඒ ප්‍රකාශ අපි දකිනවා ස්වාමීනි. නමුත් සත්‍යතාවය ඒකෙන් එහාට ගිය කාරණා තියෙනවා ස්වාමීනි එතැන. බිරිඳ දන්නේ නැතිවෙන්න විදියක් නැහැ ස්වාමීනි. එතකොට හාදියා CID office එකට එනකොට රිෆාස් ඒගොල්ලෝ ලොකු සම්බන්ධතාවයක් තියෙනවා. නවුෆර් මවුලවි රිෆාස්ලා හාදියාත් එක්ක ලොකු සම්බන්ධතාවයක් තියෙනවා. හාදියාට ටක් ගාලා කතා කරලා, දුර ඉන්නකොට ළඟට කතාකරන්න හාදියත් එක්ක ලඟට කතා කරන්න හම්බවෙන්නේ නැහැ. නමුත් දුර ඉන්නකොට වචන තුන හතර ටක් ගාලා හුවමාරු කරගන්නවා මෙහෙම කියන්න මෙහෙම කියන්න කියලා. ඉතින් ඒ විදියට කටයුතු කරා ස්වාමිනි ඒකෙන් මම දන්නවා මේ ඔක්කෝම මේවා දන්නවා බේරෙන්ට එකාට එකා බොරු කියනවා අවසානයේ ස්වාමීනි මම ගොඩක් සතුටුවෙනවා කොමිෂන් එකේදි ඔක්කොම අහුවෙනවා. එහෙන් මෙහෙන් බොරු කිය කියා කොහෙන් ආවත්.

ප්‍ර දැන් ඔබට මතකද මුෆීක් අර ලැක්ටොස් වත්තේ අයිතිකාරයා?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඔහු මේ ඉඩම මිලයට අරන් තියෙන්නෙම මෙවැනි අන්තවාදි කටයුතුවලට උදව් කිරීමේ බලාපොරොත්තුවෙන් වගේ හැඟවුනාද?

උ ස්වාමිනි ඒක මම දැනගත්තේ පොලිස් නිළධාරියෙක් සිර කූඩුවේ ආරක්ෂාවට ඉන්න පොලිස් නිලධාරින් කිව්වා මම මුෆීස් ගැන ලොකුවට දැනගෙන හිටියේ නැහැ ඒ වෙනකොට ස්වාමිනි කිව්වා මූත් හිටියා නම් අද වෙනකොට නැහැ කියලා කිව්වා. ඊටපස්සේ මුෆීස් හිනාවුනා. ඔව් ඒක

FAIR COMMENT BY JEZEEM

තමයි ඇත්ත තමයි කියලා කිව්වා. මුෆිස්ට සිංහල කතාකරන්න ටිකක් අමාරුයි. මම ඇහුවා මොකක්ද ඒක තමයි ඇත්ත තමයි කියන්නේ කියලා. එතකොට අපේ කෆාර්ඩින් මොහොමඩ් ෆායිස් කිව්වා, ඔව් ඒක තමයි ඇත්ත තමයි කියන්නේ මුගෙත් ඔළුව නැතිවෙනවා Blast එකට අහුවෙනවා හිටියානම් කියලා. මම ඇහුවා මොකක්ද ඒකේ තේරුම කියලා. එතකොට ස්වාමීනි ඒකේදි මම දැනගත්තේ ඒ ඉඩම අරගෙන සියළුම දේවල්වලට උදව් කරලා ඒ අංශම වෙනුවෙන් ස්වාමීනි මුෆිස් ඒක කරන්නේ මුෆිස් දැනටත් CID එකේ තේ හැදුවේ, සිරකරුවන්ට වෙනමත් තේ හැදුවේ මුෆිස්ලා. උපරිම සද්භාවයෙන් බොහොම සතුටින් හිනාවෙලා ඉන්නේ. මම ඇහුවා පුපුරන ද්‍රව්‍ය ගබඩාවක්ම ගෙදර තියන් ඉඳලා අත් අඩංගුවට අරගෙන ඇවිල්ලා දැන් ඕනනම් උපරිම සාමාන්‍යයෙන් අවම අවුරුදු 7ක්වත් බන්ධනාගාරයේ ඉන්ඩ වෙයි. මොකද කියන්නේ කියලා. ඒක ප්‍රශ්නයක් නැහැ දෙවියෝ වෙනුවෙන්. මේක අපට දෙන්නේ දෙයියෝ. දෙයියෝ තමයි අපිට මේ Test එකක් කරන්නේ. ඒ Test එක අපි පාස් වෙන්ඩ ඕන කියලා කිව්වා ස්වාමිනි. අන්න ඒක නිසා මම දන්නවා අනිවාර්යෙන්ම මුෆිස් නම් ඒකට සම්බන්ධතාවයක් තියෙනවා කියලා. මගේ දැනුමේ හැටියට මට තේරෙනවා ස්වාමිනි. නමුත් එතන එහෙම සාමාන්‍යයෙන් ගැවුනත් අත්අඩංගුවට ගන්නවානේ ස්වාමිනි නමුත් යම් පිරිසක් ඉන්නවා මොනවත් දන්නේ නැහැ. සහරාන් කියන කෙනාව එක්කෝ ඇසුරු කරා එහෙම නැතිනම් සහරාන් එක්ක මොකක් හරි, අඩුම තරමේ සහරාන් ඒ මනුෂ්‍යයාට කෝල් එකක් අරගෙන තියෙනවා, මන් මේවා මෙහෙම නිවැරදි කරන්න කතාකරන්නේ ස්වාමිනි අපිට මේවා ජීවිත පිළිබඳව ප්‍රශ්න ස්වාමිනි. නැතිවුනෙත් ජීවිත කවදා හරි මෙතනින් එහාට අවසන් තීන්දුවේදි බන්ධනාගාර ගතවෙන්නේ ස්වාමිනි ජීවිත. ඒ නිසා ස්වාමිනි මම දන්න දේ කියන එක මට යුතුකමක් වෙනවා. මේ කොමිෂමට අදාළ නොවුනත් මට හිතුණා ඒක කියන්න. එතන ඉන්නවා ස්වාමිනි වැරදි නැති මිනිසුනුත් ඉන්නවා. වැරදි නැති මිනිස්සුත් සමහර වෙලාවට සහරාන් කතාකරලා කියලා තියෙනවා මාව හම්බවෙන්න මං මෙහෙම ආගම උගන්වන කෙනෙක් , මෙහෙම මවුලවි කෙනෙක් කියලා කියලා තියෙනවා. මට කිව්වොත් ස්වාමිනි මමත් හා කියනවා ඒව ගේ ප්‍රශ්නවලට ඒ ෆෝන් කෝල් එකට අත්අඩංගුවට අරගෙන අත්අඩංගුවේ ඉන්න මිනිස්සුත් එතන ඉන්නවා ස්වාමිනි.

ප්‍ර ඒ වගේම ඇත්තට සම්බන්ධවෙලා තාමත් අල්ලාගන්න බැරි වෙලා හැංගිලා ඉන්න මිනිස්සුත් තව ඉන්නවා කියලා ඔබට හෙළිදරව් වුනාද?

උ ස්වාමිනි මට එහෙම දැනෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර අර රිෆාස් කියන පුද්ගලයා මතකයිනේ?

උ එහෙමයි ස්වාමිනි

ප්‍ර එයා නේද අර ගිරිඋල්ලේ කඩයට ගියයි කිව්වේ?

FAIR COMMENT
BY JEZEEM

උ ඔව් ස්වාමිනි

ප එතකොට ඔහු ඒ සංවිධානයේ ඔය සහරාන් සමඟ ඒ කටයුතුවල බොහෝම උන්න්දුවෙන් නිරතවෙලා හිටි බව ඔබට වැටහුනාද?

උ ඔව් ස්වාමිනි. බොහෝම කැමැත්තෙන් අන්තවාදි අදහස්වල කෙළවරටම ගිය මිනිස්සු ස්වාමිනි. ඒ. හැමෝම නෙවෙයි, එතනින් ¼ ක් විතර තමයි ඒ තත්ත්වයේ ඉන්නේ. ඔය අත්අඩංගුවේ ඉන්න අයගෙන් පුනරුත්ථාපනය අපි මනුෂ්‍යයෙක්ගේ ජීවිතය පුනරුත්ථාපනය කරලා හරි ගන්න පුළුවන් නම් ඒකයි වටින්නේ ස්වාමීනි. නමුත් මම දන්නවා රිෆාස්ලව කවදාවත් පුනරුත්ථාපනය කරලාවත් ගන්න බැහැ. ඒකේ පලවෙනිම තැන ඉන්නේ නවුෆර් මවුලවි. ඊළඟට අබ්දුල් අහක් , අබ්දුල්ලා සාදික් කියන මෙන්න මේ අර මාවනැල්ලේ බුදු පිළිම කැඩීමේ සැකකරුවෝ දෙන්නා ඒ දෙන්නාත් ඒකේ ඉහළින්ම ඉන්නවා. ඊළඟට තවත් ඒ වගේ සැකකරුවෝ පිරිසක් ඉන්නවා. රිෆාස්ලා එතකොට ඔය මුෆිස් කියන ලැක්ටෝස් වත්තේ අයිතිකාරයා. මේ අය හැම වෙලාවෙම රිෆාස්ලා දකුණේ තිබුණ පුහුණු කඳවුරුවලටත් ගිහිල්ලා. නුවරඑළියටත් ගිහිල්ලා. ලංකාවේ හැම තැනටම ගිහිල්ලා. රෙදි ටිකත් අරන් දිලා කටඋත්තර දෙන්න ගියාම කියනවා මම මොනවත් දන්නේ නැහැ ඇදුම් ටිකක් ගන්න ආවේ එහෙම කියනවා. නමුත් හාදියා හම්බවුනාහම මෙහෙම මෙහෙම කියලා ඇඟිලිවලින් හරි කතාකරලා අවශ්‍ය දෙන්න ඕන සිග්නල් එක දීලා. මේ විදියට සාක්ෂි දෙන්න කියලා කියනවා. මට පැහැදිලිවම තේරුණා ස්වාමිනි ඒ මිනිස්සු කොහොම කවදා මොන අධිකරණයෙන් නිදහස් වෙයිද කියන්න මම දන්නේ නැහැ. මම දන්නවා ඕකෙන් ¼ ක් පැහැදිලිවම මේ පාස්කු ප්‍රහාරයටත් සම්බන්ධයි ඒ වගේම මේ අන්තවාදි අදහසේ තවමත් ඉන්නවා. තවමත් අවස්ථාවක් හම්බවුනොත් නවුෆර් මවුලවිට එහෙම අද අවස්ථාවක් හම්බවුනොත් අදත් suicide කරගන්නවා ස්වාමිනි. මේ දැන් අවස්ථාවක් දුන්නොත් මේ දැනුත් suicide කරගන්න තත්ත්වයට ඔවුන්ගේ මනස ඔවුන් ගොඩකරගෙන නිරවුල්ව නිදහස්ව ඉන්නවා ස්වාමීනි. සිංදුවක් කියලා. ඇහුවම ඇයි කියලා මේක දෙයියෝ දුන්න Test එකක්. අපි දෙයියෝ වෙනුවෙන් කැප කිරීමක් කරන්න ඇවිල්ලා ඉන්නේ මේ. ඒ නිසා අපිට අවශ්‍ය ලකුණු ඒ ලකුණු ටික තමයි අපි හදාගන්නේ කියලා ඒ විදියට ප්‍රකාශ කරනවා ස්වාමීනි. සාමාන්‍යයෙන් බොහෝ දුරට උපවාස කරනවා කැම කන්නේ නැතිව. දවසකට ලකුණු 10ක් හම්බවෙනවා උපවාස කරොත් ඒ වගේ ඒ ගොල්ලන්ගේ එහෙම එකක් තියෙනවා ස්වාමිනි.

ප ඔබ කියන්නේ නවුෆර් මවුලවි සිංදු කියනවා කියලාද?

උ නවුෆර් මවුලවි සිංදු කියන්නේ නැහැ ස්වාමිනි. නවුෆර් මවුලවි නැහැ වචනයක් දෙකක් කියනවා ස්වාමිනි. එහෙම නවුෆර් මවුලවිට සිංදු කියන්ට බැහැ. නමුත් හිනාවෙලා වචනයක් දෙකක් සිංදුවක කෑල්ලක්

FAIR COMMENT BY JEZEEM

වචනයක් දෙකක් එහෙම කියනවා සිංහල සිංදු කියන්ට බැහැ ඒත්. සිංහල සිංදුවක් කියනවා ටික් ටිකිරි ටිකිරි ලියා කියලා ස්වාමීනි.

ප දැන් නවුෆර් මවුලවිත් එක්ක කතාකරනකොට ඔබට යම්කිසි ආකාරයක වැටහීමක් ලැබුණද පෙනුමෙන් මේ මිනිස්සු නිකං අහිංසක ජීවිත වගේ පෙනුනට ඇතුලතින් ගැඹුරින් බොහෝම දරුණු අදහස් තියෙන පුද්ගලයන්ද කියලා?

උ ස්වාමීනි ඒ මිනිසුන්ගේ දරුණුකම කොච්චරද කීවොතින් ස්වාමීනි මට මුහුණ දෙන්නට සිදුවුණ දේවලුත් එක්ක ස්වාමීනි මම මේ ගරු කොමිෂම ඉදිරියේ මගේ හිතට දැනුණ චේතනා මම ප්‍රකාශ කරන්නේ නැහැ ස්වාමීනි එහෙම ප්‍රකාශ කරොත් ස්වාමීනි මම එල්ලුම් ගහට යන ප්‍රකාශයක් කරන්න වෙන්නේ ස්වාමීනි ඒ නිසා මම එවැනි ප්‍රකාශයක් කරන්නේ නැහැ. ඒ තරම් නරක හිත් තියෙන නරක වැඩ කරන මිනිස්සු ස්වාමීනි මිනිස්සු ගැන කාන්තාවෝ ගැන කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ළමා අයිතිවාසිකම් පිළිබඳව ඒ දහමත් එක්ක අපි කතාකරනකොට අපිට තේරෙනවා මේක ස්වාමීනි මම දන්නේ නැහැ මෙතන ඉස්ලාම් භක්තිකයෝ ඉන්නවාද කියලා ස්වාමීනි නමුත් මම ඇත්ත කතා කළයුතුයි. ස්වාමීනි ගරු කොමිෂම ඉදිරියේ මේක තමයි මේකට හේතුව වෙලා තියෙන්නේ ස්වාමීනි මේ මේ මිථ්‍යා මතය තමයි ස්වාමිනි මෙතනට ඇදලා දැම්මේ. මේකේ ළමා අයිතිවාසිකමුත් නැහැ. කාන්තා අයිතිවාසිකමුත් නැහැ. රටේ නීතියත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයත් නැහැ. මොකක්වත් නැහැ ස්වාමීනි මේක ඇතුළේ. මේගොල්ල දරණ මතය ඇතුලේ ඕක තමයි ඇත්ත කතාව ස්වාමීනි.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප සාක්ෂිකරු ඔබට අර හමුවුනානේ සිරගෙදර ඔබ CID එකේ අත්අඩංගුවේ ඉන්නකොට ඔය ඉස්ලාම් ආගමික අන්තවාදයට සම්බන්ධවෙච්ච කණ්ඩායම?

උ එහෙමයි ස්වාමීනි.

ප නවුෆර් මවුලවි, ඔබට දැනගන්නට හම්බවුනාද ඒගොල්ලෝ අයිතිවෙන්නේ මොන ඉස්ලාම් ආගමික නිකාය වැනිදේටද? ඔබ කතාකරාද ඔවුන්ගේ නිකායවල් ගැන?

උ ස්වාමීනි නිකායවල් දෙකක් ප්‍රධාන වශයෙන්ම කිව්වා. එකක් මෙන්න මෙතන මේ දෙවටගහ මේ හරියේ මොකක් හරි තියෙනවා කිව්වා දෙවටගහ, සූෆි මුස්ලිම්වරු කියලා එකක් කිව්වා. අනික් එක ෂියා මුස්ලිම්වරු කියලා කිව්වා. එතකොට මේ අය දැන් සූෆි මුස්ලිම්වරු අයත් එක්ක, මේ අය වැඳුම් පිදුම් කරන අයත් එක්ක තරහයි ස්වාමීනි. ඒගොල්ලොන්ගේ තියෙනවා සොහොන් අදහනවා ඔහොම කතාවක්

LEAK COMMENT BY JEZEEM

තියෙනවා ස්වාමීනි දෙපැත්තක්. ඒකේ නෙවෙයි මේගොල්ලෝ මේගොල්ලෝ අනික් පැත්තේ. ඉතින් මේ අය අනිත් අයත් එක්ක සම්පූර්ණයෙන් විරුද්ධයි ස්වාමිනි. ඒ කියන්නේ මේ අය දැන් එතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා ස්වාමිනි ඒ අය කියනවා අනිත් අය මුස්ලිම් නෙවෙයි කියනවා. මම ඇහුවා ඇයි මුස්ලිම් කියන්නේ ,මුස්ලිම් කියන්නේ ඒගොල්ලන්ගේ ආගමත් එක්ක බැඳුන වචනයක් කියනවා මුස්ලිම් කියලා කියන්නේ. ආගම කොහොමද බිහිවුනේ කියලා ඒ අය කියලා කියනවා , මේ අය නිකායවල් කැඩිලා ගියා. නිකායවල් කැඩිලා මුහම්මද් නබිතුමාගෙන් පස්සේ ඒ බෑණා එක පැත්තකට කැඩිලා ගියා. ළමයි එක පැතත්කට කැඩිලා ගියා මේ නිසා මේ දෙපැත්තකට ගිහිල්ලා අදහන විදිය දෙකක් වෙලා දැන් දෙපැත්තක් හැදිලා තියෙන්නේ ඒගොල්ලෝ නෙවෙයි මුස්ලිම් අපි තමයි මුස්ලිම් කියනවා. මේගොල්ලෝ කියනවාලු ස්වාමීනි එගොල්ලෝ නෙවෙයි මුස්ලිම් අපි තමයි මුස්ලිම් කියලා, ඒ විදියේ ප්‍රකාශයක් කරනවාලු ස්වාමීනි එතකොට මේ අය සුෆී නෙවෙයි ෂියා , කොහොම හරි ඔය සොහොන් කොත් අදහන එකේ අනිත් පැත්ත ස්වාමීනි.

ප්‍ර සාක්ෂිකරු දැන් ඔබට මම හිතනවා පැහැදිලියි කියලා ඔය සහරාන් හෂීන් අයිතිවුනානේ නැෂනල් තවුහිද් ජමාත් කියන සංවිධානයකට,

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඊටපස්සේ අබ්දුල් රාසික් අයිතිවුනානේ සිලෝන් තවුහිද් ජමාත් එකට, ඔබට දැනගන්න හම්බ වුනාද ඔය නවුෆර් මවුලවි ඒ සංවිධාන දෙකට අයිතියිද? එහෙම නැත්නම් වෙනත් සංවිධානයකට අයිතියිද කියලා?

උ නවුෆර් මවුලවි ස්වාමිනි නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ. NTJ කියන සංවිධානයත් එක්ක සහරාන් එක්ක කටයුතු කරන්නේ. ඊටපස්සේ පසුකාලිනව ඔය රණ්ඩුවෙලා ප්‍රශ්න වුනාට පස්සේ දෙන්නත් එක්ක මතවාදය පිළිබඳව ගැටුමක් ආවාට පස්සේ දෙන්න වෙන්වෙලා මාවනැල්ලේ සංවිධානයක් එක්ක කටයුතු කරන්න උත්සාහ කරලා තියෙනවා. ඒ එක්කම තමයි නවුෆර් මවුලවිව ගිහිල්ලා දඹුල්ලේ තැනක දාලා තියෙන්නේ ස්වාමීනි සහරාන්ලා.

ප්‍ර අර සාදික් අබ්දුල්ලා කියන එක්කෙනා අයිතිවෙන්නේ මොන සංවිධානයටද කියලා දැනගන්න හම්බවුනාද?

උ ඒ සාදික් අබ්දුල්ලා අයියලා මල්ලිලා ඒගොල්ලන්ට වෙනම සංවිධානයක් හදන්න අවශ්‍ය උපදෙස් සහරාන් ලබාදීලා තිබුණා ස්වාමීනි. ඒ උපදෙස්වලට අනුව කණ්ඩායමක් වශයෙන්, මොකක් හරි නමකුත් කිව්වා මට මතක නැහැ. ඒ නමින් සංවිධානයක් ස්වාමිනි මාවනැල්ල ප්‍රදේශයට විතරක්, ඒගොල්ලන්ගේ ප්‍රදේශයේ අවශ්‍ය දේවල් කරන්න ඒගොල්ලෝ ඒ සංවිධානයක් විදියට හදාගෙන ඒ රැල්ලක් විදියට දැන් ටීම් එකක් එකතුවෙලා ඒගොල්ලෝ තමයි මේ පළවෙනි වැඩේ අපි මෙහෙන් පටන්

FAIR COMMENT BY JEZEEM

ගමු කියලා, ඒගොල්ලන්ගේ වැඩ පටන් ගන්නේ සුරුවම්වලට බුදුපිළිමවලට පහරදීම පුංචිම තැනින් තමයි ඒගොල්ලෝ පටන්ගත්තේ. කොහොම වුනත් පුංචිම තැනින් පටන් අරගෙන ත්‍රස්තවාදය අපට පෙනුනා ස්වාමීනි.

ප්‍ර නවුෆර් මවුලවි ඔබට සඳහන් කළාද ඔහු ඉස්ලාම් ආගමික අන්තවාදී මතවාදයට ඔහු ආරම්භ කළේ කොයි කාලයේද කියලා?

උ ස්වාමීනි ඔහු මට ඒ පිළිබඳව කතා කලේ නැහැ. ඔහු වෙනත් විදේශ රටක නීති කාර්යාලයක භාෂා පරිවර්තකයෙක් විදියට කටයුතු කරා කියලා කීවා. වසර 10ක් විතර මට මතක හැටියට. ඊටපස්සේ ලංකාවට ඇවිල්ලා සහරාන් එක්ක කටයුතු කරන්නේ කියලා කිව්වා. ඒ ඉන්න කාලේ එහේ ඉන්නකොට මේ පිළිබඳව ඉගෙනගත්තා කියලා කිව්වා. අන්තවාදය කියලා කොයිම වෙලාවකවත් ස්වාමීනි අන්තවාදය හෝ ත්‍රස්තවාදය ඒ සම්බන්ධව ඒගොල්ලෝ වචනයක්වත් කතාකරන්නේ නැහැ ස්වාමීනි. ආගම සහ දෙවියෝ වෙනුවෙන් කැපවීම කරන්න ඕන විදිහ ඉගෙන ගත්තා කියලා කියනවා හැරෙන්න ස්වාමීනි අර දේවල් කතාකරන්නේ නැහැ. එහේ ඉන්න කාලේ ඉගෙන ගත්තා කිව්වා. එතකොට සිරියාවට ගියාද කොහේටද ගියේ මොනවද කලේ ඒ තොරතුරු මම කොයි තරම් ඇහුවත් ස්වාමීනි, එක මාතෘකාව සතියක් විතර කතාකරහම තමයි ස්වාමීනි එක වචනයක් විතර එළියට ගන්න පුළුවන් වෙන්නේ ඒ මිනිසුන්ගෙන්. එළියටම ගන්න බැහැ ස්වාමිනි මම මේ ගරු කොමිෂමට ප්‍රකාශ කරනවා ඒක වගකීමෙන් මේ කොමිෂමට ඇවිල්ලා ප්‍රකාශ කරන්න කිව්වත්, දන්නේ නැහැ, තේරුනේ නැහැ. මං දන්නේ නෑ, මට තේරුනේ නැහැ කියන ප්‍රකාශය තමයි ස්වාමීනි ලබාදෙන්නේ.

ප්‍ර අර ඔබ සඳහන් කරානේ රාජ්‍ය බුද්ධි සේවාවේ කෑගල්ලේ නිලධාරියෙක් ඔබත් සමඟ සම්බන්ධතා පැවැත්තුවා කියලා?

උ එහෙමයි ස්වාමීනි

ප්‍ර ඒ නිලධාරියා සමඟ ඔබ ඉස්සෙල්ලාම සම්බන්ධතා ආරම්භ කරේ මොන අවුරුද්දේද?

උ 2017.07 වෙනි මාසේ ස්වාමීනි.

ප්‍ර කවුද ඔහු ඔබට හඳුන්වලා දුන්නේ?

උ වරකාපොළ පොලිසියේ බුද්ධි අංශයේ රාජකාරී කරන රාජපක්ෂ සහ ජයවීර කියන පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනා ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ සඳහන් කළා 2019 අප්‍රේල් 20 වෙනි දින ඔබව හමුවීමට පැමිණියා.

උ පැමිණියා ස්වාමීනි.

ප්‍ර පැමිණිලා ඔබට කිව්වා කියලා හෙට දිනයේ ප්‍රවේශමෙන් ඉන්න එළියට යන්න එපා?

උ හෙට දිනයේ කියලා කිවේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM

ප මේ දවස්වල ටිකක් ආරක්ෂා වෙලා ඉන්න වැඩිය එළියට යන්න එපා. මොනවාහරි ප්‍රශ්න තිබුණොත්මට කතාකරලා කියන්න?

උ එහෙමයි ස්වාමීනි.

ප එතකොට දැන් ඔබ 2017 ඉඳලා අඳුනනවානේ මේ නිලධාරියා?

උ එහෙමයි ස්වාමීනි.

ප ඔබ තොරතුරුකරුවෙක් හැටියට ඔහුත් සමඟ ගනුදෙනු කරනවා, ඔබ නිකන්වත් ඇහුවේ නැද්ද ඔහුගෙන් මොකක්ද ඔබ මේ කියන්නේ කියලා? මේ දිනවල ප්‍රවේශමෙන් ඉන්න එළියට යන්න එපා?

උ නැහැ සාමාන්‍යයෙන් ස්වාමීනි ඔහු මගෙන් දවස් දෙක තුනකට සැරයක් කතාකරලා අහනවා ඔයාට මොනව හරි ප්‍රශ්න තියෙනවාද? තර්ජන තියෙනවාද කියලා? මම කොහොමත් කියන්නේ ඉතින් ප්‍රශ්න එනවා නම් එයි දැනට නැහැ. මොනවත් ප්‍රශ්න නැහැ කියලා මම හැමදාම උත්තර දෙනවා ස්වාමීනි. එදත් ඇවිල්ලා ඒ විදියට බැලුවා. හැබැයි මට අහන්න විශේෂ හේතුවක් ස්වාමිනි මට එහෙම දැනුන් නැහැ ඒකේ.

ප එතකොට ඔබෙන් සාමාන්‍යයෙන් අහන ප්‍රශ්නයක්?

උ සාමාන්‍යයෙන් අහන ප්‍රශ්නයක් ස්වාමීනි. දවස් දෙක තුනකට සැරයක් සතියකට සැරයක් අනිවාර්යෙන්ම කතාකරලා අහනවා මොකද වෙන්නේ, කොහෙද ඉන්නේ හොඳින් නේද? ප්‍රශ්නතියෙනවාද? තර්ජන තියෙනවාද? කෝල්ස් ආවාද? කවුද කතාකරේ? කාවද හම්බවුනේ, මොනවද මේ දවස් ටිකේ වුනේ කියලා ඔහු මගෙන් අහනවා. ඔහු මට ලේසියෙන් වචනයක් දෙන්නේ නැහැ ස්වාමීනි. මමත් ඉතින් කියන්ට තියෙන හැමදේම ස්වාමීනි කියනවා. හේතුව මේ මම විශ්වාස කරනවා මෙතන සාක්ෂියක් ඉතුරුවෙන්න ඕන මම කරන හැම වැඩේම කියලා හිතලා මම යන එන හැම ගමනක්ම වගේම බොහෝදුරට කියනවා ස්වාමීනි.

ප ඔහුට ඔබ දෙන තොරතුරු ඔහු රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා වෙච්ච නිලන්ත ජයවර්ධන මහතාට ලබාදෙනවාය කියලා ඔහු ඔබට කිව්වාද?

උ ඔහු ඉහළට යවනවා කියලා තමයි කිව්වේ ස්වාමීනි.

ප ඉහළට යනවාකියලා

උ එහෙමයි ස්වාමීනි ඔහුගේ නිලධාරියෙක් මට කතාකරලා තියෙනවා දවසක. මට ඒ නිලධාරියාගේ නම මතක නැහැ. ඒ නිලධාරියා කවුද කියලා මම අහලාත් නැහැ. ඔහුගේ ඉහළ නිලධාරියෙක් කියලා තමයි කිව්වේ. හැබැයි නිලන්ත ජයවර්ධන මහත්තයා වෙන්ට නම් බැහැ ඒ කතාකරපු විදියට. මගේ දැනුමේ හැටියට නම් මට තේරුනා සාමාන්‍යයෙන් අයිපී මහත්තයෙක් හෝ එස්අයි මහත්තයෙක් හෝ සාමාන්‍යයෙන් ටිකක් වයස කෙනෙක් තමයි කතාකරන්නේ. ඒ කටහඬත් එක්ක මගේ දැනුමේ හැටියට ඊට ඉහළ උසස් නිලධාරියෙක් වෙන්ට බැහැ කියලා මට හිතෙනවා ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඇයි ඔබ එහෙම හිතන්නේ? ඔබ කොහොමද හිතන්නේ?

උ නැහැ කතාකරනකොට ස්වාමීනි නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්ගේ කතාවයි. පොලිසියේ වයසට ගිහිල්ලා එස්අයි මහත්තයෙක්ගේ වෙච් කෙනෙක්ගේ කතාවයි මොකද්ද කියලා මට හොඳට හඳුනන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර ඔබ ළඟ ඉන්න කොටද කතාකරන්නේ?

උ නැහැ දුරකථනයෙන් කතාකරන්නේ ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ සඳහන් කළා, ඔය අත්අඩංගුවේ හිටපු කණ්ඩායම අතර හිටියා කියලා මේරි ඇන්තනී පෝල් අජන් තීපන් කියලා අර වවුනතිව් පොලිස් නිලධාරීන් දෙදෙනා ඝාතනයට සැකපිට අත්අඩංගුවට ගත්ත අය. එම පුද්ගලයාත් සමඟ ඔබ ඉතා ළඟින් ආශ්‍රය කළාද? අර අනික් ඉස්ලාම් ත්‍රස්තවාදී කණ්ඩායමත් සමඟ කතාකළා වගේම?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔහු ඔබට කිව්වාද විශේෂ හේතුවක් ඔහුට වුනේ මොකක්ද? ඇයි ඔහු මේ ඇතුළේ ඉන්නේ?

උ නැහැ මට ඔහු කෙටියෙන්ම කිව්වේ මුන් ඔක්කෝම මේකට සම්බන්ධයි නාමල්. ඔයත් එක්කත් ගොඩාක් තරහින් ඉන්නේ ඔයත් මුස්ලිම් අයට ගැහුවායි කියලා. මෙතෙන්ට දාලා තියෙන්නේ ඔයාට ගේමක් දෙන්න. ඒ නිසා මුන්ට ඒක කවුරුහරි කියලාද දන්නෙත් නැහැ. මුන් ඒක කොහොම දන්නවාද දන්නෙත් නැහැ. මුන් ඉන්නේ ගොඩක් තරහින් ඔයත් එක්ක. පරිස්සම්වෙලා ඉන්න කියලා මට කිව්වා.

ප්‍ර කවුද මුන් කියන්නේ?

උ ඒ IS ත්‍රස්ත සැකකරුවන්ට ස්වාමීනි.

ප්‍ර අර ඇතුළේ ඉන්න?

උ මට මේ කතාකරපු භාෂාවෙන්ම මම මේක ප්‍රකාශ කරන්නේ ස්වාමීනි. එතකොට ඔහු මට යන්ඩ කලින් කීවේ ඔයා මුස්ලිම් අයට ගැහුවා කියලා, මුස්ලිම් පාස්කු ප්‍රහාරය ගැහුවේ මුන්නේ ගැහුවේ, එහෙම තමයි ස්වාමීනි මට පැහැදිලි කළේ. මුන්නේ පාස්කු ප්‍රහාරය ගැහුවේ. එතකොට මේ පාස්කු කේස් එකෙන් පස්සේ ඔයාව අත්අඩංගුවට අරගෙන මේක ඇතුළේ උන්ගේ මැදටම දාලා තියෙන්නේ ඔයාට මොකක් හරි කේස් එකක් අදින්ට වෙන්න පුළුවන්. මුන්ගෙන් පරිස්සම් වෙලා ඉන්න. මුන් ගොඩක් තරහින් ඉන්නේ ඔයත් එක්ක. ඔයාට නිතර බණිනවා, ඒක නිසා පරිස්සම් වෙලා ඉන්ට කියලා කිව්වා. ඊට අමතරව මේ හේතුවක් වෙන දේවල් මේක ඇයි මේ එල්ල කරන්ට හේතුව මොනවද කතාවුනේ. ඒ දේවල් මම අහන්න ගියේ නැහැ ස්වාමීනි.

ප්‍ර නැහැ මම ඔබගෙන් අහන්නේ මේ අන්ජන් තීපන් කියන සැකකරුවා ඔබට කිවාද? ඔහු මේකට සම්බන්ධ නැහැ?

FAIR COMMENT BY JEZEEM

උ ඔහු මේකට සම්බන්ධ නැහැ ස්වාමීනි. ඔහු අත්අඩංගුවට අරන් තියෙන්නේ වවුනතිව් පොලිස් මාර්ග බාධකයේ රාජකාරියේ යෙදී සිටපු පොලිස් නිලධාරීන් ඝාතනය කිරීමට නෙමෙයි ස්වාමීනි.

ප එහෙනම්?

උ වවුනතිව් පොලිස් මාර්ග බාධකයේ රාජකාරියේ යෙදී සිටපු පොලිස් නිලධාරි ඝාතනය කිරීමෙන් පස්සේ විමර්ශණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආරම්භ කරනවා ස්වාමීනි. එය ආරම්භ කරගෙන යනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අනාවරණය වෙනවා 2007 වර්ෂයේ පොලිස් නිලධාරියකු ඝාතනය කිරීමේ තොරතුරක්. ඒ තොරතුර මත ඔවුන් විමර්ශණය කරගෙන ගිහිල්ලා මේ මේරී ඇන්තනී පෝල් අන්ජන් තීපන් මගලන් කියලා කෙනෙකුයි මදන් කියලා කෙනෙකුයි මෙන්න මේ වගේ තුන්දෙනෙක්ව අත්අඩංගුවට ගන්නවා ස්වාමීනි. ඊට අමතරව වවුනතිව් පොලිස් මාර්ග බාධකයේදී රාළහාමිලා ඝාතනය කිරීම කියලා වෙනම දෙන්නෙක් අත්අඩංගුවට ගන්නවා. මේ තුන්දෙනාව අත්අඩංගුවට ගන්නේ 2007 කේස් එකකට ස්වාමීනි. ඒ අත්අඩංගුවට අරගෙන ඒගොල්ලන්ව තියාගෙන ඉන්න අතරතුර අර ගොල්ලන්ව වවුනතිව් පොලිස් මාර්ග බාධකයේ හිටපු පොලිස් නිලධාරීන් ඝාතනය කිරීමට අත්අඩංගුවට ගත්තු සැකකරුවන්ව තියාගෙන ඉන්නවා ස්වාමීනි මාස 3ක රැඳවුම් කාලයක් තියාගෙන ඉන්නවා, තියාගෙන ඉඳලා ඉවරවෙලා ඒ අයමයි මේ අපරාධය කරේ ප්‍රමාණවත් කරුණු තියනවා කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරුණු ඉදිරිපත් කරලා නැවත රැඳවුම් නියෝග දීර්ඝ කරගෙන මාස 5ක් යන කාලයකදී තමයි පාස්කු ප්‍රහාරය එල්ලවෙන්නේ. මාස 5ක් විතර ගියාට පස්සේ තමයි අහුවෙන්නේ ස්වාමීනි මේ අය නෙවෙයි මේකට සම්බන්ධ වෙන අය කියලා. දින මම හිතන්නේ එකසිය ගානක් ගිහිල්ලා තමයි ඒගොල්ල දැනගන්නේ මේ අය සම්බන්ධ නැහැ මේකට කියලා. පාස්කු ප්‍රහාරය එල්ලවුනායින් පස්සේ තමයි අර දෙන්නා වවුනතිව් පොලිස් නිලධාරීන් ඝාතනය කරාය කියලා අත්අඩංගුවට ගත්තු අයව නිදහස් කරලා යවන්නේ නැතිනම් සමහරවිට..

ප ඒ අය නෙවෙයි ඔබත් එක්ක හිටියේ ඇතුලේ නේද?

උ නැහැ නැහැ ස්වාමීනි

ප එහෙනම් මගේ ප්‍රශ්නය මම හිතන්නේ අදාළ නැහැ. කපාඩීන් මොහොමඩ් ෆායිස් කියලා ඔබ සඳහන් කරානේ , අබ්දුල් රාසික් සමඟ එකතුවෙලා හිටපු එක්කෙනා ගැන. අබ්දුල් රාසික් එක්ක ලේ දන්දීමේ ව්‍යාපාර එහෙම කරා කියලා. ඒ මොහොමඩ් ෆායිස් කියන පුද්ගලයා ඔබ සඳහන් කලා ද්‍රවිඩ කාන්තාවක් තමයි විවාහ වෙලා හිටියේ කියලා. දැන් මේ ෆායිස් කියන පුද්ගලයා ඔබට කිව්වාද මේ ජාතික තවුහිද් ජමාත්

FAIR COMMENT — BY JEZEEM

සංවිධානයේ ඔය අබ්දුල් රාසික් කියන කෙනා ඔය අන්‍යාගමික අයව ඉස්ලාම් ආගමට හැරවීමේ වැඩසටහනක් ඔහු කරනවා කියලා?

උ අබ්දුල් රාසික් එහෙම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනවා කියලා මට එහෙම කිව්වා මතක නැහැ ස්වාමීනි.

ප්‍ර කිව්වේ නැද්ද?

උ මතක නැහැ ස්වාමීනි.

ප්‍ර ඔබට කිව්වාද ෆායිස් මේ අබ්දුල් රාසික් අර සාරා ජෙස්මින් කියන නමට දෙමළ කාන්තාවක් ඉස්ලාම් ආගමට හරවලා හස්තූන් කියලා අයෙකුට විවාහ කරලා දීපු එක ඔබත් සමඟ කතාකළාද?

උ ඒ සම්බන්ධව කතාකරා ස්වාමීනි.

ප්‍ර මොනවද ඒ සම්බන්ධව කිව්වේ?

උ ඒ සම්බන්ධව කාත්තන්කුඩි පොලීසියට ගිහිල්ලා පැමිණිලි කරලා තියෙනවා ස්වාමීනි. ඒ සම්බන්ධව මෙයා කිව්වා මේ ද්‍රවිඩ කෙනෙක්, ඒකයි මම ඉස්සෙල්ලා ස්වාමීනි උදේ ඒ පිළිබඳව ප්‍රකාශ කරේ. ද්‍රවිඩ කාන්තාවන්ව ඒ ආගමට සම්බන්ධ කරගෙන, දැන් අන්තවාදී කටයුතු කරන අය ද්‍රවිඩ කාන්තාවන් ඒකට සම්බන්ධ කරගන්න ලොකු උත්සාහයක් තිබිලා තියෙනවා කියලා බව මම උදේ ඒකයි ප්‍රකාශ කළේ ස්වාමීනි.

ප්‍ර අබ්දුල් රාසික්ගෙද?

උ අබ්දුල් රාසික් ස්වාමීනි. එතකොට අබ්දුල් රාසික්, අන්තවාදී පස්සෙන් යන සියළුමදෙනාගේ ඒ සැලැස්ම තිබිලා තියෙනවා ස්වාමීනි. අබ්දුල් රාසික් ඒ කාන්තාවගේ කතාව ස්වාමීනි කපාර්ඩීන්ලා ඒගොල්ලෝ කතාකරන විදියට එතන ලොකු අසාධාරණයක් වුනා කියලා ඒගොල්ලෝ කියන්නේ නැහැ. මේ ගැහැණු ළමයා ඉස්සෙල්ලා කැමතිවුනා කියලා කිව්වා. පස්සේ බැහැ කිව්වා කියලා කීවා කීවා. ඊට පස්සේ ගිහිල්ලා අබ්දුල් රාසික්ලා මැදිහත්වෙලා පොලීසියටත් ගිහිල්ලා කතාකරලා පොලීසියේ පැමිණිලි කිහිපයකුත් ගිහිල්ලා තියෙනවා ස්වාමීනි. ඒ පැමිණිලිවලටත් අබ්දුල් රාසික් මැදිහත්වෙලා ඒවා සමථයකට පත්කරලා බලෙන් වගේ ගැහැණු ළමයාව ගෙනාවා කියලා තමයි කිව්වේ ස්වාමීනි.

ප්‍ර මගේ අවසාන ප්‍රශ්නය සාක්ෂිකරු. ඔබ පසුගිය කාලයේ අත්අඩංගුවට පත්වුනානේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ අත්අඩංගුවට පත්වෙලා කොච්චර කාලයක් ඇතුලේ හිටියාද? කවදා ඉඳලා කවදා වෙනකම්ද කියලා කියන්න?

උ ස්වාමීනි අත්අඩංගුවට පත්වෙන්නේ 2019 මැයි මාසේ 14 වෙනිදා, නිදහස් වෙන්නේ 2020.06.19 වෙනිදා ස්වාමීනි. දින 402ක් ස්වාමීනි.

ප්‍ර ඔබ දැන් කිව්වා මේ කොමිෂන් සභාවේදී හෙළිවෙනවා ඔක්කොම , අර කට්ටිය ඔබට නොයෙක් දේවල් බොරු කීවා, ඒ බව තේරුණා, නමුත්

FAIR COMMENT BY JEZEEM

මෙම කොමිෂන් සභාවේ දී ඔය සියළු සත්‍ය හෙළිවෙනවා කියලා ඔබ කිව්වා නේද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ මෙම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් පුවත්පත්වල යන ඒවා හැමදාම කියවනවාද?

උ හැමදාම කියවන්නේ නැහැ ස්වාමීනි. විශේෂයෙන්ම මම බලනවා සාමාන්‍යයෙන් මේකට යම් හෝ සම්බන්ධතාවයක් හෝ මොකක් හෝ තියෙන කෙනෙක් සාක්ෂියක් ලබාදෙන්න ආවොත් එදාට මම ඒක බලනවා ස්වාමීනි. විශේෂයෙන්ම හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා, හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහත්මයා, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා , රාජ්‍ය බුද්ධි ප්‍රධානි හිටපු නිලන්ත ජයවර්ධන මහත්මයා, ජාතික බුද්ධි ප්‍රධානි හිටපු සිසිර මෙන්ඩිස් මහත්මයා, ඊට පස්සේ නන්දන මුණසිංහ මහත්මයා මේ වගේ අය ඇවිල්ලා යම්කිසි ප්‍රකාශයක් මෙතන දෙනවානම්, කොමිෂමට දෙනවා කියලා මං දැනගත්තොත් මම බලනවා මොකක්ද වෙලා තියෙන්නේ කියලා ස්වාමීනි. මට මේක දැනගැනීමේ ලොකුම, මට පුද්ගලිකව තියෙනවා අවශ්‍යතාවයක්. මේ ත්‍රස්තවාදය මම දැකපු එකක්. මේක මම කියපු එකක්. ඒ වගේම ඉස්සරහටත් මේ ත්‍රස්තවාදය රටේ නිර්මාණය වෙන එකක් ස්වාමීනි. අන්න ඒ නිසා මම මේ පිළිබඳව, මම හොයාගෙන ගිය ගමනේ අවසානය මෙතන. මම අදහස් කරලා තියෙනවා ස්වාමීනි මේ පාස්කු කොමිෂමේ කටඋත්තර දීලා අවසන් වෙච්ච දවසක ඉඳලා නැවත කිසිම දවසක මාධ්‍ය ඉදිරියේ කිසිම ප්‍රකාශයක් කරන්න නැතිවෙන්න. ඒකට හේතුව මගේ ගමනේ අවසාන බලාපොරොත්තුව මෙතන ස්වාමීනි. මෙතනින් එහාට ආයේ කතාකරන්න මේ ලංකාවේ අපට සාධාරණය ඉෂ්ඨ වෙන තැනකුත් නැහැ. ඒ නිසා මේ පිළිබඳව මම නිරන්තර අවධානයෙන් ඉන්නේ ස්වාමීනි. නිරන්තරව මං මෙතන මොකක්ද වෙන්නේ කියලා හොයනවා ස්වාමීනි.

ප්‍ර ඔබ හොයලා බලන්නේ ඔබ සඳහන් කරපු රජයේ ඉහළ නිලධාරීන් මේ කොමිෂමට ඇවිල්ලා දෙන සාක්ෂි මොනවාද කියන එක පමණයිද?

උ නැහැ ඒවා විතරක්ම නෙවෙයි ස්වාමීනි. කොමිෂමෙන් ලබාදෙන ඇතැම් නියෝග තියෙනවා. තීන්දු තීරණ තියෙනවා. ඒ තීන්දු තීරණ ලබාදෙන්න හේතු මොනවාද කියලාත් බලනවා. ඒ වගේම ස්වාමීනි ත්‍රස්ත සැකකරුවෝ මම විශේෂ අවධානයක් යොමුකරන්නේ අර අය දෙන ඒවට. ඊට අමතරව ත්‍රස්ත සැකකරුවෝ ගෙනල්ලා ඊයේ පෙරේදා දවසක නවුෆර් මවුලවිත් මේ කොමිෂම හමුවේ ප්‍රකාශ ලබාදීලා තිබුණා. ස්වාමීනි. අන්න ඒ වගේ වෙලාවල්වලට මම බලනවා ස්වාමීනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිමට අවස්ථාවක් අවශ්‍යයද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතීඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි අවස්ථාව ලබාදෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ශාමීල් පෙරේරා මහතා</u>

ප්‍ර සාක්ෂිකරු ඔබ මීට පෙර පටිගත කරපු C.1526 ඒ පටිගත කිරීමේ 25 වන මිනිත්තුවේ ඔබ සඳහන් කරලා තිබෙනවා. ඔබ ඇත්ත කියන්න බයවෙන්නේ නැහැ කියලා. එහෙමයි නේද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් මේ ඊබ්‍රාහිම් මුදලාලිගේ එක් පුතෙක් ඔබ සමඟ හිරහාරයේ සිටියා කියලත් කිව්වා ඒක හරිද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට මේ රාමසාන් දිනයෙහි කෑම දුන් බවත්, ඔබ සඳහන් කෙරුවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් මෙම කෑම තරු පහේ හෝටලයකින් දුන් බවටත් ඔබ කිව්වා?

උ තරුපහේ නෙවෙයි ස්වාමීනි තරු පන්තියේ හෝටලයක ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ දන්නවාද මේ 2019 මේ රමසාන් දිනය තිබුනේ පාස්කු ප්‍රහාරයට සුළු දවසකට පසුව නේද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම රාමසාන් දිනයේ නේද මේ දවල් භෝජනය දුන්නේ තමන්ලාට?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් මේ අවස්ථාවේදි පාස්කු ප්‍රහාරය ගැන කතා කෙරුවාද?

උ පාස්කු ප්‍රහාරය සම්බන්ධව ස්වාමිනි මට මතක නැහැ.

ප්‍ර ඒ කියන්නේ මේ ඊබ්‍රාහිම් මුදලාලිගේ පුතෙක් සහ අනිත් කට්ටිය පාස්කු ප්‍රහාරය ගැන කතා කෙරුවාද ඒ අවස්ථාවේදී?

උ ඒ අවස්ථාවේදි පාස්කු ප්‍රහාරය ගැන කතා කරා මට මතක නැහැ.

ප්‍ර දැන් එම පටිගත කිරීම එනම් C.1526 එම පටිගත කිරීමේදී 9 වන මිනිත්තුවෙහි ඔබතුමාට චමුදිත කියලා තිබෙනවා DIG නාලක සිල්වා අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ ඔබ කළ ප්‍රකාශය නිසා කියලා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර සහරාන් හෂීන් අත්අඩංගුවට ගැනීමට ටික දවසකට පෙර මේ නාලක සිල්වා මහත්මයාව හිර භාරයට ගත් බවත් මෙම චමුදිත කිව්වා කියලා කිව්වා නේද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර සහ ඔහු තවදුරටත් ප්‍රකාශ කෙරුවා මේ පාස්කු ප්‍රහාරය සිදුවෙන්නේ නැහැ නාලක සිල්වා එළියේ සිටියා නම් කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි ස්වාමීනි

ප ඒ සම්බන්ධයෙන් ඔබ කුමක්ද කියන්නේ?

උ ස්වාමීනි, මම ඔය හෙළිදරව්ව කරන්නේ 2018.09.12 වෙනිදා ස්වාමීනි. නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයා අත්අඩංගුවට ගන්නේ 2018 ඔක්තෝම්බර් මාසයේ ස්වාමීනි. ඊටපස්සේ තමයි ස්වාමීනි මේ මාවනැල්ලේ බුදු පිළිම කැඩීම සිදුවෙන්නෙත් ඊටපස්සේ ස්වාමීනි. ඊටපස්සේ වවුනතිව් පොලිස් නිලධාරීන් ඝාතනය කරන්නෙත් ඊටපස්සේ ස්වාමීනි. ලැක්ටෝස් වත්තේ අවි ආයුධ ගබඩාව හොයාගන්නෙත් ඊටපස්සේ ස්වාමීනි. පාස්කු ප්‍රහාරය එල්ලවෙන්නෙත් ඊටපස්සේ ස්වාමීනි. එතකොට මේ වෙනකොට මාස කිහිපයක්ම වෙනවා ස්වාමීනි. ත්‍රස්ත විමර්ශණ දිසාව පුද්ගලයෙක් මත නම් ක්‍රියාත්මක වෙන්නේ ඒක පොලිසියේ ඒකකයක් වෙන්න බැහැ. ඒක පුද්ගලික ඒකකයක් වෙන්න ඕන ස්වාමීනි. මේක රටේ ආයතනයක් ස්වාමීනි. මහජනතාව තමයි මේවට වැටුප් ගෙවන්නේ ස්වාමීනි. මේකේ වැඩකරන මේ නිලධාරීන්ට වැටුප් ගෙවන්නේ මහජනතාව ස්වාමීනි. පුද්ගලයෙක්ගේ ක්‍රියාකාරකමක් මත රාජ්‍ය ආයතනයක තීන්දු තීරණ පිළිබඳව හැකියාව පිළිබඳව මනින්න බැහැ ස්වාමීනි. ඒක ඒ ආයතනය පිළිබඳව තියෙන ගැටළුවක් ස්වාමීනි. නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයා මාත් එක්ක වැඩකරන කාලයේ මම කොතනකවත් කියලා නැහැ ස්වාමීනි ඔහු දුර්වල විදියට වැඩ කරා කියලා ස්වාමිනි. ඔහු ඉතා දක්ෂ විදියට වැඩකළා ස්වාමීනි. ඔහු මාත් එක්ක වැඩ කරනකොට ඒ සැලසුම් ක්‍රියාත්මක කරපු නිසා තමයි ස්වාමීනි ඉහත සඳහන් කළ ආකාරයට ඔය රොහින්ගයා සරණාගතයින්ට පහරදීලා ඒ ත්‍රස්ත සැකකරුවන් හැංගිලා ඉන්න කොට ඒ පුද්ගලයන්ව අත්අඩංගුවට ගත්තේ, ඔහුගෙයි මගෙයි තිබුණ දක්ෂතාවය නිසා ස්වාමීනි. ඒ වගේම තමයි දිගන තෙල්දෙණිය ගැටුම සමථයකට පත්කරන්න බැරුව ජාතික ආරක්ෂාව පල්ලෙහාට වැටිලා තියෙන වෙලාවේ නාලක ද සිල්වා මහත්තයයි, මමයි සැලසුම් කරලා ඒ අත්අඩංගුවට ගැනීම සිදුකරපු නිසා තමයි ස්වාමීනි ඒ විදියට සාර්ථකව ඒක මැඩපවත්වන්න පුළුවන් වුනේ ස්වාමීනි. නමුත් ස්වාමීනි මම අනාවරණය කරගත්තු අපරාධමය තොරතුරක් මම ඒක ඉදිරිපත් නොකර, ඒ පිළිබඳව පැමිණිල්ලක් කරන් නැතුව මම තියාගෙන හිටියා නම් ස්වාමීනි, ඒ අපරාධයේ මමත් කොටස්කාරයෙක් වෙනවා ස්වාමීනි. පුද්ගලයෙක් හොඳ 1000 ක් කරත් වැඩක් නැහැ ස්වාමීනි. එක පුද්ගලයෙකු ඝාතනය කරොත්. දැන් අද වෛද්‍ය සාෆි පිළිබඳව කතාකරනවා ස්වාමීනි. වෛද්‍ය සාෆි ඕනතරම් මිනිසුන්ට ජීවිත දීලා ඇති. හැබැයි එක ජීවිතයක් හරි නැතිකරලා තියෙනවා නම් ඔහු මනුෂ්‍ය ඝාතනයක් කරපු අපරාධ කාරයෙක් වෙනවා ස්වාමීනි. කොයි තරම් හොඳ කරලා තිබුණත් යම්කිසි අපරාධමය සිදුවීමකට සැලසුම් කරලා හෝ අපරාධයක් කරලා තියෙනවා නම්

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි ඔහු අර කරපු සියළුදේත් එක්ක රටේ නීතියත් එක්ක අපිට ඒක අනිත් පැත්තට දාන්ඩ සිද්ධවෙනවා ස්වාමීනි. මම අනාවරණය කරගත්ත දේ මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කලා ස්වාමීනි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමයි ඒ පිළිබව විමර්ශණ ආරම්භ කළේ. ස්වාමීනි. ශානි අබේසේකර මහත්මයා ප්‍රමුඛ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කරලා තිබුණා ස්වාමීනි. කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ බී.10744/18 කියන නඩුවට කරුණු ඉදිරිපත් කරන්නේ නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහත්මයා, එතුමා තමයි මේකට ප්‍රමාණවත් කරුණු තියෙනවා කියලා කියන්නේ ස්වාමීනි. එතකොට මම අපරාධමය තොරතුරක් අනාවරණය කරලා තියෙන්නේ ස්වාමීනි. ඒ අපරාධමය තොරතුරක් අනාවරණය වෙලා තියෙද්දී ඒකට අදාළ පුද්ගලයකු අත්අඩංගුවට අරගෙන තියෙන්නේ ස්වාමීනි එතනදී වූදිතයෙක් විතරයි ස්වාමීනි නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා කියන්නේ, ඒ අත්අඩංගුවට ගත්තට පස්සේ රටේ තිබෙන ජාතික ආරක්ෂාවේ දුර්වලතාවය නිසා ස්වාමීනි පාස්කු ප්‍රහාරය එල්ල වෙනවා. ඒ එල්ලවීම තම තමන්ගේ වාසියට හරවා ගැනීම පිණිස ඇතැම් පුද්ගලයෝ කියනවා මේක මෙහෙම වුනා නම් මෙහෙම වෙන්නේ නැහැ කියලා ස්වාමීනි. සිදුවීම සිදුවී අවසන් නමුත් ඒ අත්අඩංගුවට ගැනීම මේ පාස්කු ප්‍රහාරයට කිසිසේත්ම සම්බන්ධතාවයක් නැහැ කියන එක මම ඉතා වගකීමෙන් ප්‍රකාශ කරන්න කැමතියි ස්වාමීනි.

ප්‍ර දැන් ඔබතුමා මේ C.1526 පටිගත කිරීමේ සඳහන් කරලා තිබෙනවා එවකට ජනාධිපතිතුමා විසින් මෛත්‍රිපාල සිරිසේන මහතා විසින් ඔබට යම් අන්දමක පත්වීමේ ලිපියක් දුන්නා කියලා එහෙම නේද?

උ ඕක පත්වීමේ ලිපියක් දුන්නා කියලා මගේ වචනයක් මට , එහෙම කොහොම හරි ලිපියක් තියෙනවා ස්වාමීනි. ඒක පත්වීමේ හරි මොකක් හරි වෛද්‍ය සමන්ත කුමාර කිතලවආරච්චි මහත්මයා තමයි ඒ ලිපිය මගේ ළඟ තියෙනවා ස්වාමීනි. අවශ්‍ය නම් ඉදිරිපත් කරන්නම් ස්වාමීනි.

ප්‍ර දැන් තවදුරටත් ඔබ කියලා තිබෙනවා එවකට සිටි ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාර්යාලයේ සේවකයන් සමඟ සම්බන්ධකම් තිබුණා කියලා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ වගේම ජනාධිපති කාර්යාලයට යනවා එනවා කියලත් සඳහන් කරලා තියෙනවා?

උ ඒ වීඩියෝ එකේම ස්වාමීනි. මම කියනවා ඒ විඩියෝ එකේම කියනවා ස්වාමීනි, මේකේ වෙනම තියෙන්නේ ජනාධිපති කාර්යාලයේ නෙවෙයි මේක වෙනම තියෙන්නේ කියලා මම කියනවා ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ මත්ද්‍රව්‍ය ගන්න බවටත් පිළි අරගෙන තියෙනවා?

FAIR COMMENT BY JEZEEM

උ ඉතිහාසයේ අරගෙන තියෙනවා ස්වාමීනි.

ප්‍ර එතකොට සිර මැදිරියේ හිටපු කාලයෙත් මත්ද්‍රව්‍ය අරගෙන තිබෙනවාද?

උ නැත ස්වාමිනි.

ප්‍ර දැන් ඔබ කීවානේ ඔබ ඇත්ත කියන්න බය වෙන්නේ නැහැ කියලා?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර දැන් මම මේ සම්බන්ධයෙන් මේ ප්‍රශ්න ඔබගෙන් අහනවා?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර කවුද ඔබට කිව්වේ නාලක සිල්වා මහතාගේ දුරකථන ඇමතුම් පටිගත කරන්න?

උ ස්වාමිනි පටිගත කිරීම මට පුරුදුකරෙත් නාලක සිල්වා මහත්තයා. ඔහු තමයි මට ඉස්සෙල්ලාම රෙකෝඩරයක් අතට දීලා කිව්වේ එන යන කතාකරන හැමතැනම ඒවා ඔක්කෝම රෙකෝඩ් කරන්න කියලා ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ මේ නාලක සිල්වා මහතාගේ පටිගත කිරීම් හැර වෙන කිසිම පටිගත කිරීමක් මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තිබෙනවාද?

උ නැත ස්වාමීනි. මෙම කොමිෂන් සභාවට මම නාලක සිල්වා මහත්තයාගේ හඬපටයක්වත් ඉදිරිපත් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ දන්න තරමින් මේ අන්දමට පටිගත කිරීම් කරන එක හොඳ දෙයක්ද?

උ ස්වාමීනි ඒක අපේ ප්‍රතිපත්තිය පිළිබඳව ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්. හැබැයි මේ ලංකාව පවතින්නේ,ලංකාව යන්නේ නීතියත් එක්ක. නීතියේදි අවසාන තීන්දු තීරණ ගන්නේ අධිකරණය ස්වාමීනි. අධිකරණයකට මම මිනිහෙක් මැරුවා කියලා කීවාට වැඩක් නැහැ ස්වාමීනි ඒ අධිකරණයට සාක්ෂි අවශ්‍ය වෙනවා ස්වාමීනි. යම්කිසි පුද්ගලයෙක් පිළිබඳව අපි කරුණක් අනාවරණය කලහම විශේෂයෙන්ම ත්‍රස්ත විමර්ශණ දිසාව භාරව හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා පිළිබඳව මම කරුණු අනාවරණය කරන්නේ ස්වාමීනි. ඒ කරුණු අනාවරණය කිරීමේදි ඒවා අධිකරණය දක්වා අනිවාර්යෙන්ම යනවා කියලා මම දන්නවා ස්වාමීනි. මම සාමාන්‍ය පුරවැසියෙක් විදියට ඒ දැනුම මට තියෙනවා ස්වාමීනි. අන්න ඒ නිසා ස්වාමීනි මම අඩුම තරමේ හඬපටයකින් හරි සාක්ෂියක් තියාගන්න ඕන බව මම තීරණය කළා ස්වාමීනි. මෙම ගරු අධිකරණයට මම අද කියන්න කැමතියි ස්වාමීනි මේ හඬපට ටික අද සවන් නොදුන්නා නම් එහෙම කතාවක්වත් වුනේ නැහැ කියලා තමයි ස්වාමීනි කවුරුත් පිළිගන්නේ. ඒක හරි සාක්ෂියක් තියෙන නිසා අඩුම තරමේ නාලක සිල්වා මහත්මයා සහ මම අතර කතාවෙලා තියෙනවා කියලා අපි දෙන්නා හම්බවෙලා තියෙනවා කියලා හරි, සාමාන්‍යයෙන් එක ළඟ ඉඳලා කතාකරලා තියෙනවා කියලා හරි

Registered Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂියක් එන්නේ ස්වාමීනි තියෙන්නේ මේ හඬ පටයක් හරි තියෙන නිසා ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ වෙන වචනයකින් කිව්වොත් මේක ඉතාම අති විශිෂ්ඨ ක්‍රියාවක් කියලයි තමා කියන්නේ?

උ ස්වාමීනි මගේ හැටියට අපරාධමය තොරතුරක් අනාවරණය කරගන්නවා නම් මේක අති විශිෂ්ඨ ක්‍රියාවක් ස්වාමීනි.

ප්‍ර ඒ විදියටම මේ අන්දමට පටිගත කිරීම් කරන පුද්ගලයින් නිලධාරීන් සහ මහත්වරුන් කියලත් ඔබ සලකනවා නේද?

උ ස්වාමීනි මිනිසුන්ගේ පුද්ගලික දේවල් පටිගත කරනවා නම්, ඒ දේවල් පටිගත කරලා ඉවරවෙලා සමාජගත කරනවා ඒක අශිෂ්ඨ ක්‍රියාවක් විදියට මම දකිනවා ස්වාමීනි. නමුත් අපරාධමය ක්‍රියාවක් සිදුකරන්න සැලසුම් කරනවා නම් ඒ පිළිබඳ Record කරලා තියාගන්න එක ඒක මහත්මා ගතිගුණයක් කියලා මම හිතනවා ස්වාමීනි. අපරාධයක් කියන එකේ අදහසම එනවා ස්වාමීනි යම්කිසි කෙනෙකුට හෝ දෙයකට අගතියක් කරන දෙයක් කියලා ස්වාමීනි. යම්කිසි කෙනෙකුට හෝ දෙයකට අගතියක් කරන දෙයක් සාක්ෂි සටහන් කරගැනීමට අපි රෙකෝඩ් එකක් අරගෙන ගන්න එක ඒක කොයිතරම් ඒක මහත්මා ගතියක්ද කියන එක මං හිතන්නේ මේ කොමිෂන් සභාව තීරණය කරයි ස්වාමීනි.

ප්‍ර දැන් නාලක සිල්වා සහ ඔබ අතර මේ හඬපටය රාජ්‍ය බුද්ධි සේවාවට ලැබුණේ කෙසේද?

උ මම ලබාදුන්නා ස්වාමීනි.

ප්‍ර ඊටපසුව ඔබ දන්නා තරමින් මෙය ජාතික ආරක්ෂක මණ්ඩලයටත් ඉදිරිපත් කරලා තිබෙනවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් ඔබගේ සාක්ෂියේදී ඔබ කිව්වා හඬපට මේ හඬපට මේ අන්දමට පටිගත කිරීම නාලක සිල්වා සහ ඔබ අතර, මේ හඬපට පටිගත කිරීම මේ සිදුවුන ත්‍රස්ත ප්‍රහාරයට කිසිම සම්බන්ධයක් නැති බවට ඔබ සාක්ෂි දුන්නා අද?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර දැන් ඔබට සෘජුව මෙය ප්‍රකාශ කිරීමට හැකිවන්නේ කොහොමද?

උ ස්වාමීනි සෘජුව ප්‍රකාශ කරන්නේ නාලක ද සිල්වා මහත්මයා අපරාධයක් කරන්න සැලසුම් කරපු කෙනෙක් ස්වාමීනි. ඒකට අවශ්‍ය ප්‍රමාණවත් සාක්ෂි මගේ ළඟ තියෙනවා ස්වාමීනි. දැනටත් මෙතන ඉදිරිපත්වෙලා තියෙන හඬ පටවල සාක්ෂිවලට අනුව එතුමා ත්‍රස්ත විමර්ශණ දිසාවේ නියෝජ්‍ය පොලිස්පතිවරයකුට නෙවෙයි ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් කොස්තාපල්වරයෙකුට යුක්ති සහගත නොවන ආකාරයෙන් කටයුතු කරපු බවට මේ ගරු කොමිෂම ඉදිරියේ ඔප්පුවෙනවා ස්වාමීනි. එහෙම

FAIR COMMENT BY JEZEEM

කටයුතු කරපු පුද්ගලයෙක් පිළිබඳව අනාවරණය කරාට පස්සේ තමයි ස්වාමීනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිකම්ම නෙවෙයි ස්වාමීනි, විමර්ශණයක් කරලා විමර්ශණයේ කරුණු නීතිපති දෙපාර්තමේන්තුවට දන්වලා ස්වාමීනි. නීතිපතිතුමාගේ උපදෙස් මත තමයි ගරු අධිකරණයේ නඩු කටයුතු මෙහෙයවාගෙන යන්නේ. ඒ අනුව තමයි ස්වාමීනි අත්අඩංගුවට ගැනීමක් සිදුවෙන්නේ. ස්වාමීනි එතකොට ඒ අත්අඩංගුවට ගැනීම සහ පාස්කු ප්‍රහාරය වළක්වා නොගැනීම නාලක සිල්වා මහත්මයා අත්අඩංගුවට ගැනීම නිසා සිදුවුනා කියලා යම් කෙනෙක් සාධාරණීකරණය කරන්න උත්සාහ කරනවා නම් ගරු ස්වාමීනි මේ කොමිෂම ඉදිරියේ මා ඉතා වගකීමෙන් ප්‍රකාශ කරනවා ඒ අත්අඩංගුවට ගැනීම පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට හේතුවුනේ නැහැ කියලා ස්වාමීනි.

ප්‍ර දැන් ඔබ දන්නවාද පූජ්‍ය අරඹේපොල රත්නසාර හිමි?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ ස්වාමීන් වහන්සේ කවුද?

උ ඒ ස්වාමීන් වහන්සේගේ ගම අරඹේපොළ කුරුණෑගල. භික්ෂූන් වහන්සේ නමක් කියලා දන්නවා. හිටපු තැන් ටිකක් දන්නවා. අපි නාලක සිල්වා මහත්තයයි මායි තමයි හෙව්වේ. ඒ හොයපු දේවලුත් එක්ක ආපු ගියපු තැන් මොනවද කරේ කිව්වේ කියලා ඒ වගේ දේවල් දන්නවා ටිකක් දන්නවා ස්වාමීනි.

ප්‍ර ඒ ස්වාමීන් වහන්සේව හම්බවෙලා තියෙනවාද?

උ අප්පෝ හම්බවෙලා තියෙනවා ස්වාමීනි. මගේ නිවසේ ගෙදර ඉඳලා එනකොට තමයි නාලක ද සිල්වා මහත්තයා නිට්ටඹුවේදි අත්අඩංගුවට ගන්නේ ස්වාමීනි. ඒකත් සැලසුම් සහගතව සිදුවෙච්ච සිද්ධ වෙන්නේ ස්වාමීනි.

ප්‍ර දැන් සාක්ෂිකරු මෙම ටීවී පටියේ සිටින්නේ ගරු පූජ්‍ය අරඹේපොල රතනසාර හිමි කියලා කිව්වොත් හරිද?

උ හරි ස්වාමීනි.

ප්‍ර මේ අවස්ථාවේදී එම Tall with Sudaththa වීඩියෝ පටය C.1527 වශයෙන් ලකුණු කිරීමට අවසර පතයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

අවසර ලබාදෙමි.

****

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා

ප්‍ර දැන් මේ වීඩියෝ පටයෙහි තිබෙන විස්තර සම්බන්ධයෙන් ඔබ කුමක්ද කියන්නේ?

උ ස්වාමීනි ඒ ලිපිය මම බෝගම්බර බන්ධනාගාරයේ ඉන්න කාලයේ මම තමයි ලිව්වේ. මගේ ගෙදර ලිපිනය දාලා ලියන්නේ.මම ලංකාවේ කොහේ හිටියත් ලිපියක් ලියනකොට මගේ ගෙදර ලිපිනය දාලා ලියන්නේ. හැබැයි ලිපිය මම මේක ගරු අධිකරණයට යෝජනා කරනවා ඒ ලිපිය පිටපතක් ලබාගන්නා ලෙස. ඒකට හේතුව ස්වාමීනි මේ ගරු අධිකරණයේ මේ පිළිබඳව සාකච්ඡා වෙච්ච නිසා. ඒ ලිපිය මම පැහැදිලිවම ලියලා තියෙනවා. මම දැනට ඉන්නේ බන්ධනාගාරයේ. බන්ධනාගාරයේ ඉඳලා තමයි මේ ලිපිය මම ඉදිරිපත් කරන්නේ කියලා ස්වාමීනි. ඕක මම රැඳවියෙක් අතේ එවන්නේ. රැඳවියෙක් ඇප අරගෙන යන්ඩ කෙනෙක් ඉන්නවා. ඔහුට මම දෙනවා. මම කැලැන්ඩරයේ 2020 අවුරුද්දේ කැලැන්ඩරයේ අවසාන කොළටික කඩනවා ස්වාමීනි මම. මට සිරමැදිරියේ හිටපු හැම කෙනෙක්ම මට ආදරෙයි. මම කියනවා මට ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතින් මට නඩුවක් දාලා තියෙන්නේ නමුත් මෙතන ලොකු දේවල් සිද්ධවුනා මාව අත්අඩංගුවට ගත්ත වෙලාවේ ඉඳලා. ඒ දේවල් මොනම ක්‍රමයකින් හරි සමාජගත වෙන්න ඕන. මෙන්න මේ සමාජගත කිරීම කරන්න පුළුවන් කෙනෙකුත් ඉන්නවා ඒ නිසා ඔයා මේක එළියට අරගෙන ගිහිල්ලා ඇපදීලා යනකොට මේ ලිපිය අරන් ගිහිල්ලා මේකේ පිටපතක් ජනාධිපති කාර්යාලයට තැපැල් කරලා යවන්න. අනික් පිටපත නීතිපති දෙපාර්තමේන්තුවට තැපැල් කරලා යවන්න. එක පිටපතක් මෙන්න මේ කියන නම්බර් එකට කතාකරලා මේ හාමුදුරුවන්ට දෙන්ඩ. එතකොට හාමුදුරුවොත් එක්ක මම ඒ වෙන කොට අත්අඩංගුවට ගැනීම සම්බන්ධව ප්‍රශ්නයක් ඇතිවෙලා හාමුදුරුවොත් එක්ක එහෙම ප්‍රශ්නයක් තියෙන එක වෙනම දෙයක්. සමාවෙන්න නමුත් මම දන්නවා මේක අරඹේපොල හාමුදුරුවන්ගේ අතට ගියහම අරඹේපොල හාමුදුරුවෝ මේක සමාජ කතිකාවතක් දක්වා නිර්මාණය කරනවා. ඒ නිර්මාණය කිරීම හරහා මම දන්නවා අනිවාර්යෙන්ම මගෙන් මේ පිළිබඳව යම් තැනකින් ප්‍රශ්න කරයි. ඒ ප්‍රශ්න කරන තැනදී මට සත්‍ය ප්‍රකාශ කරන්න අවස්ථාවක් එනවා. අන්න එතනදී මට වෙච්ච දේ සාධාරණයක් ඉටුවෙයි කියලා තමයි ස්වාමීනි මම ඔය ලිපිය සම්පූර්ණ සත්‍ය සිදුවීම ලියන්නේ. එතනදී ස්වාමීනි විශේෂයෙන්ම කියන්න අවශ්‍යතාවය මම කැලැන්ඩරයේ, ලියන්න කොලයක් නැහැ ස්වාමීනි පැනක් හොයාගෙන කැලැන්ඩරයේ අවසාන කොළ 4ම කඩනවා ස්වාමීනි මාස 4ම. ඒ මාස 4ම කඩලා සිරමැදිරියේ හිටපු අනික් අයටත් කියනවා මම කමක් නැද්ද කියලා ඒ අයගේ කැමැත්ත ගන්නවා. ඒ අය මට කැමතිවෙනවා. එකඟ වෙනවා. සහයෝග දෙන්ඩ. මේ විදියට

FAIR COMMENT BY JEZEEM

පිටු 12ක 13ක විතර ස්වාමීනි මගේ මතකයේ හැටියට ලිපියක් සකස් කරනවා. ස්වාමීනි. ඒ ලිපිය සකස් කරලා මේ විදියට එළියට එවනවා ස්වාමීනි. ඒ ලිපියේ තියෙනවා කේරළ ගංජා භාවිතා කිරීම පිළිබඳව තියෙනවා ස්වාමීනි. මං එතන ලියන්නේ ලිපියක් ස්වාමීනි. ඒ ලිපියේ මට මම පළවෙනි ගිණිකූර ගැහුවා පත්තුවුනේ නැහැ. සිගරට් එකක් වගේ එක ගිණිකූරෙන් පත්තුකරන්න පුළුවන් එකක් නෙවෙයි කේරළ ගංජා කියන්නේ. ගිණිකූරක් ගැහුවා ඒක බොන්නේ නැත්නම් නිවෙනවා. ඒ නිසා මම දෙවෙනි ගිණිකූරත් ගැහුවා ඒකත් නිවුණා ටික වෙලාවක් යනකොට. ආයෙත් තුන්වෙනි එකත් ගැහුවා. මං ගිණිකූරු 10ක් විතර ගැහුවා. ඒ කියලා මේ සම්පූර්ණ කතාව මට ලියන්න බැහැ ස්වාමීනි. මම මෙතන යම්කිසි වගකිව යුත්තෙක්ගේ ඇස ගැටෙවා කියලා තමයි මම. මට අවශ්‍යතාවය තියෙන්නේ වෙච්ච දේ සිදුවීම පැහැදිලි කිරීමට. ස්වාමීනි. මේකේ ගිණිකූරෙන්ද පත්තු කරේ. ලයිටරයෙන්ද පත්තුකරේ. ඒ හාගේ ඉස්සෙල්ලා එයාද බීවේ පස්සේ මං ද බිව්වේ. ඒ කතාව නෙවෙයි ස්වාමීනි මට එතනදී කියන්න අවශ්‍යතාවය තියෙන්නේ. ඒ නිසා ස්වාමිනි කියන්න කැමතියි මෙම ගරු කොමිෂම ගන්න තීන්දුව කුමක් වුවත් එතන වෙච්ච සිදුවීම මම ඉස්සෙල්ලා මෙම කොමිෂම ඉදිරියේ ප්‍රකාශ කළා ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥවරයාට ලබාදෙමි

****

<u>නීතිඥ මධු ජයතිලක මහත්මිය</u>

ප්‍ර ගරු කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු අනෙකුත් විනිසුරුතුමන්ලාගෙන් අවසරයි. නාමල් කුමාර මහත්මයා ඔබ හිටපු බුද්ධි අධ්‍යක්ෂක වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයාව පුද්ගලිකව හඳුනනවාද?

උ නැත ස්වාමීනි.

ප්‍ර ඔහුත් එක්ක යම් අවස්ථාවකවත් කතාබහ කරලා තියෙනවාද?

උ නැත ස්වාමීනි.

ප්‍ර නාමල් කුමාර මහත්මයා තව කියන්න මට නිලන්ත ජයවර්ධන මහත්මයා ඔබව දුරකථනයෙන් හෝ සම්බන්ධවී ඔබගෙන් යම් තොරතුරකවත් හෝ අරන් තියෙනවාද?

FAIR COMMENT
BY JEZEEM

උ නැත ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාගෙන් විමසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් වැඩ තහනමට ලක්ව තිබෙන නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාට ලබාදෙමි.

මෙතන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය
දැන් වෙලාව : ප.ව.7.45

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: රාත්‍රී 7.45
පෙර සටහන් ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට :ල/ලේ චන්දිමා දිල්හානි

<u>නීතිඥ මල්ක දේනෙත්ති මහතා</u>

ප්‍ර: මහත්මයා?

පි: ස්වාමිනි

ප්‍ර: මහත්මයා විසින් සඳහන් කරා මහත්මයා ඇත්ත කියන්න බය වෙන්නැති පුද්ගලයෙක් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මේ ජනාධිපති ඝාතන කුමන්ත්‍රණය කියන මේ මහා භයානක අපරාධය පිළිබඳව?

පි: පැමිණිලි කරා ස්වාමිනි.

ප්‍ර: පැමිණිල්ලක් කරන්න තමයි ගියේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මහත්මයා තීරණය කරා මේ වගේ භයානක අපරාධයක් සම්බන්ධයෙන් මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරන්න ඕනේ කියලා?

පි: ස්වාමිනි මං ඒ පැමිණිල්ල ඉදිරිපත් කරේ ඊළඟ පොලිස් කොමිසමට ස්වාමිනි

ප්‍ර: ඒ කවදද ඒ පැමිණිල්ල ශ්‍රී ලංකා පොලිස් කොමිෂමට කරේ මුලින්ම?

පි: 2018. 09 වෙනි මාසේ 13 වෙනිදා ස්වාමිනි.

ප්‍ර: 2018.09.13?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉන් අනතුරුව කුමක්ද සිදුවුණේ පොලිස් කොමිෂමේ කැඳවීමක් කරාද මහත්මයා?

පි: නෑ ඒ පිළිබඳව පොලිස් කොමිෂම ශ්‍රී ලංකා පොලිස්පතිතුමාට දන්වලා තිබුණා ශ්‍රී ලංකා පොලිස්පතිතුමා පූජිත් ජයසුන්ද මහතා ඒ සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ විමර්ශන ඒකකයට යොමු කරලා තිබුණා SIU එකට ඉන් අනතුරුව හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහත්මයා SIU එකෙන් අපේ ගෙදරට ආවා ස්වාමිනි. මගෙන් ප්‍රකාශ ලබා ගන්න ඒ ඇවිල්ලා ඉන්න වෙලාවේම මගේ පුද්ගලික දුරකථනයට කෝල් එකක් ආවා ඒ ආවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න මහත්මයාගෙන් එතුමා කථා කරලා කිව්වා මම Senior DIG රවි සෙනවිරත්න කථා කරන්නේ අපි විමර්ශන ආරම්භ කරනවා ජනාධිපතිතුමා අපිට නියෝග ලබා දුන්නා කාටහරි විමර්ශනයකට යම්කිසි තොරතුරක් ලබා දීලා තියෙනවා නම් ඒක ඉල්ල ගන්න මේ ඒවා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාටවත් කිසිම දෙයක් දෙන්න එපා අපිට විතරක් දෙන්න කියලා. මම කිව්වා මේ වෙනකොටත් මේ SIU එකෙන් ASP මහත්මයෙක් ඇතුළු කණ්ඩායමක් ඇවිල්ලා ඉන්නේ මට ඒක කියන්න බැහැ ඒ අය පොලිස් නිලධාරීන් ඔබතුමාම කැමති නම් කියන්න කියලා දුරකථනය දුන්නා ඒ වෙලාවේ එතුමා ඒ අයත් එක්ක කථා කරා SIU එකෙන් ඇවිල්ලා හිටපු නිලධාරීන් පිටවෙලා ගියා එදා රාත්‍රියේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ ASP ලොකු හෙට්ටි මහත්මයා ඇතුළු පිරිසක් ආවා. ඒ ඇවිල්ලා එදා රෑ ප්‍රකාශ ලබා ගත්තා වැඩි දුර ප්‍රකාශ ලබා දීම සඳහා.

ප්‍ර: එදා රෑ ප්‍රකාශ ලබා දුන්නේ කියලා කියන්නේ කවදද දිනය?

පි: දිනය මට හරියට මතක නැහැ ස්වාමිනි 2018.09.14,15 වගේ ස්වාමිනි ඒ ආසන්න 16 වගේ ඒ ආසන්න දිනයක් ස්වාමිනි.

ප්‍ර: මහත්මයා ඒ ආකාරයෙන් අපරාධ පරීක්ෂණ දේපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කලේ කාගේ හෝ බලපෑමක් මතද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: ඒ මහත්මයා ස්වෙච්ඡාවෙන් තමයි ලබා දුන්නේ?

පි: ස්වේච්ඡාවෙන් තමයි ලබා දුන්නේ ස්වාමිනි.

ප්‍ර: ඒ මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එවැනි පැමිණිල්ලක් සමඟ ප්‍රකාශ කටඋත්තර කීයක් පමණ ලබා දුන්නාද ඔය සිද්ධිය සම්බන්ධයෙන්?

පි: ස්වාමිනි මට මතක නැහැ දවස් ගනණාවක්ම ප්‍රකාශ ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර: ඒ මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එවැනි පැමිණිල්ලක් සමඟ ප්‍රකාශ නැත්නම් කට උත්තර කීයක් පමණ ලබා දුන්නද ඔය සිද්ධිය සම්බන්ධයෙන්?

පි: ස්වාමිනි මට මතක නැහැ දවස් ගණනාවක් ප්‍රකාශ ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර: සාමාන්‍ය කටඋත්තර කීයක් වගේ ලබා දුන්නද කියලා මහත්මයාට?

පි: දවස් 04 ක්, 05 ක් වගේ.

ප්‍ර: දීර්ඝ ලෙස ඒ ප්‍රකාශ ලබා දුන්නද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ප්‍රකාශ ලබා දුන්නාට පස්සේ ඒ මහත්මයාට ඒ ප්‍රකාශය කියවන්න අවස්ථාවක් ලබා දුන්නද අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුවෙන්?

පි: කියවන්න අවස්ථාවක් ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර: යමක් ඒ ප්‍රකාශ වලට ඇතුලත් කිරීමට අවස්ථාවක් මහත්මයාට ලබා දුන්නද?

පි: ලබා දුන්නා ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව මහත්මයා ඒ ප්‍රකාශ කියවලා තේරුම් ගත්ත බවට සඳහන් කරලා අත්සන් කලාද?

FAIR COMMENT BY JEZEEM

පි: අත්සන් කලා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මහත්මයා සඳහන් කරේ සියල්ලක්ම සත්‍යයක්ද?

පි: සත්‍යයක් ස්වාමිනි.

ප්‍ර: ඒකේ වෙනසක් නැහැ?

පි: වෙනසක් නැහැ ස්වාමිනි නමුත් සඳහන් මුල්ම අවස්ථාවේ සඳහන් නොකල කරුණු තියෙනවා ස්වාමිනි. සඳහන් නොකල කරුණු පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා සම්බන්ධව සහ ඒ වගේම ශානි අබේසේකර මහත්මයාව මම හම්බිලා තියෙනවා ශානි අබේසේකර මහත්මයා ඒක සඳහන් කරන්න එපත් කිව්වා. ඒ නිසා ශානි අබේසේකර මහත්මයා හම්බිලා තියෙන එක පූජිත් ජයසුන්දර මහත්මයා පිළිබඳව නාලක සිල්වා මහත්මයා මාත් එක්ක කථා කරලා තියෙන දේවල් පිළිබඳව ඒ කිසිම දෙයක් මම සටහන් කරේ නැහැ ස්වාමිනි. ඒකට හේතුවකුත් තියෙනවා ත්‍රස්ත විමර්ශන දිසාවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා පිළිබඳව අර තරම් ප්‍රතිරූපයක් ගොඩනැගෙන කොට රටේ ඉන්න පොලිස්පති රටේ ඉන්න පොලිස්පතිවරයාට විරුද්ධව මම ලියන්න ගියා නම් නාලක සිල්වා මාත් එක්ක කථා කරපු දේවල් ලියන්න ගියා නම් එතකොට ඒදා මම CID එකට යන කොට මට කිව්වා ශානි අබේසේකර මහත්මයා මේක මම IG සර්ගෙන් අහලා OK එකක් දෙන්නම් කියලා නමුත් මේ විමර්ශනයත් නැවත යන්නේ CID එකට එතනදි මම ඒ IG සර්ට විරුද්ධව යම් කිසි ප්‍රකාශයක් කරා නම් එක මට අගතියක් වෙන්න පුළුවන් හැබැයි ඒ පිළිබඳව සියලු ප්‍රකාශයන් මම අත් අඩංගුවේ ඉන්න කාලේ දෙවනි වර ප්‍රකාශයක් විදියට මම ලබා දුන්නා මෙන්න මේ හේතුව නිසා මම මේ අයගේ පිළිබඳව පොලිස්පතිතුමා පිළිබඳව ප්‍රකාශ කරේ නැහැ කියලා

ප්‍ර: ඒ කොයි කාලේද මහත්මයා ඔය දෙවනි වර ඔය තවත් නම් ඇතුලත් කරමින් ප්‍රකාශයක් ලබා දුන්නේ?

පි: ප්‍රකාශය ලබා දුන්නේ ස්වාමිනි මම ඔය මුස්ලිම් අන්තවාදය සහ ඒ සම්බන්ධව

ප්‍ර: නෑ මම අහන ප්‍රශ්නයට උත්තර දීලා මහත්මයා යම් කිසි දෙයක් මහත්මයාට කියන්න තියෙනවා නම් කියන්න?

පි: දින ස්වාමිනි මට මතක නැහැ.

ප්‍ර: ඒ කියන්නේ මහත්මයා මුලින්ම මහත්මයා විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරේ අපාරධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2018.09.15 කියලා කිව්වොත් නිවැරදිද?

පි: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මම පැමිණිල්ල ඉදිරිපත් කරලා නැහැ

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැහැ මහත්මයා මුලින්ම ප්‍රකාශයක් ලබා දුන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට?

පි: ප්‍රකාශයක් ලබා දුන්නේ ස්වාමිනි මට දිනය මතක නැහැ ස්වාමිනි. මං 09.15 ,16 ඒ ආසන්න දිනයදි ස්වාමිනි

ප්‍ර: නෑ මම මහත්මයාට යෝජනා කරනවා 2018. 09.15 කියලා?

පි: එය නිවැරදි නම් එය මම පිළිගන්නවා ස්වාමිනි

ප්‍ර: එතකොට මහත්මයා ඊට කොපමණ කාලයකට පසුවද ඔය නම් පුද්ගලයන් කීපයකගේ නම් ඇතුලත් කරලා ප්‍රකාශයක් ලබා දුන්නේ?

පි: මම අත්අඩංගුවේ ඉන්න කාලේ ස්වාමිනි

ප්‍ර: ඒ කොයි කාලවකවානුවේද කියලා කියන්නකෝ මහත්මයා?

පි: කාලවකවානුව කියන්නේ ස්වාමිනි අත්අඩංගුවේ ඉන්නේ 2019 මැයි මාසේ 14 ත් දෙසැම්බර් 10 ත් අතර ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ 2019 මැයි මාසේ?

පි: ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මාස 08 කට විතර පස්සේ තමයි මහත්මයා නැවත ප්‍රකාශයක්?

පි: ලබා දෙන්නේ ස්වාමිනි.

ප්‍ර: ලබාදෙන්නේ පුද්ගලයන්ගේ කීප දෙනෙක්ගේ නම් ඇතුලත් කරලා?

පි: පුද්ගලයන් කීප දෙනෙක් ස්වාමිනී පුද්ගලයන් කීපදෙනෙක් පූජිත් ජයසුන්දර මහත්මයා , සරත් ෆොන්සේකා මහත්මයා ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයා පිළිබඳව ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මගෙන් ඒ පිළිබඳ දිර්ඝ ලෙස ප්‍රශ්න කරා ස්වාමිනි මම එතනදි මම කරපු මාධ්‍ය අනාවරණයකුත් මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දුන්නා ඒකට හේතුව මම 10 වෙනි මාසේ මාධ්‍ය ආයතනයකින් මගෙන් ඇවිල්ලා ගෙදරට ඇවිල්ලා අහනවා මේකේ තව කවුරු හරි ඉන්නවද කියනවද කියලා මම කියනවා ඉන්නවා නමුත් ඒක මේ වෙලාවේ කියන්න බැහැ ඒ අය තනතුරුවල ඉන්න අය ඒ නිසා මම ඒවා කියන්නේ නැහැ. මේ ඒවා වෙලාවක් ආවාම කියන් නම් කියලා කියනවා ස්වාමිනි.

ප්‍ර: අර මුල් අවස්ථාවේදී මහත්මයා ප්‍රකාශ කරාට ඇත්ත කියන්න බයවෙන්නේ නැහැයි කියලා කිව්වාට අර 2018 වෙනි මාසේ 15 වෙනිදා ඒ ප්‍රකාශය දෙද්දිත් පොඩිබයකුත් තිබ්බා හිතේ?

පි: ස්වාමිනි බයකට වැඩිය ඇත්තක් එළියට එන්න කලින් මගේ ජීවිතයේ නැති වුණානම් ඒක බොරුවක්ම වෙනවා බය වෙන්න අවශ්‍යතාවයක් නැහැ ස්වාමිනි. ජීවිතයට හැබැයි අපි මේවා එළියට දාන්න කලින් මේවා එළියට ආපු තැනම යට කරලා දැම්මා නම් අපිත් මේ රටේ අපරාධකාරයෝ වෙනවා අපිත් මේ රටේ කුමන්ත්‍රණකාරයෝ වෙනවා ස්වාමිනි ඒකයි එතන තියන ප්‍රශ්නේ ස්වාමිනි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියේ ස්වේච්ඡාවෙන්නේ ප්‍රකාශයක් ලබා දුන්නේ?

පි: ස්වේච්ඡාවෙන්

ප්‍ර: එතකොට මහත්මයා මේ සත්‍ය සිදුවීමක් කියන්න කියලා තමයි ගියේ?

පි: ඔව් සත්‍ය සිදුවීමක්නේ ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ නාලක සිල්වා කියන නියෝජ්‍ය පොලිස්පතිවරයාට විරුද්ධව මහත්මයා සම්පූර්ණ ප්‍රකශයක් ලබා දෙනවා?

පි: ලබා දෙනවා ස්වාමීනි.

ප්‍ර: නමුත් මහත්මයා මේ සියලු කරුණු අණාවරණය කරා කියලා දැන් මේ මොහොතකට ඉස්සෙල්ලා සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කරාට සමහර කරුණු ලබා දෙන්නේ මාස 09 කටත් අධික කාලයකට පස්සේ?

පි: සියලු කරුණු අනාවරණය කරා ඒ පැමිණිල්ල වෙලාවේ සියලු කරුණු අනාවරණය කරා කියලා මම කොතනකවත් ප්‍රකාශ කරේ නැහැ මෙම කොමිෂම ඉදිරියේ

ප්‍ර: මහත්මයා මහත්මයා රැකියාව ලෙස මොකක්ද කරන්නේ?

පි: රැකියාවක් කරන්නේ නැහැ ස්වාමිනි දැන්.

ප්‍ර: දැන් මහත්මයා මුලින්ම නාලක සිල්වා මහත්මයා මුණ ගැහෙන්නේ කොයි කාල වකවානුවේද?

පි: නාලක සිල්වා මහත්මයා මුණ ගැහෙන්නේ 2017.09.20

ප්‍ර: 2017?

පි: 2017 ස්වාමිනි

ප්‍ර: 2017.09.20 ඒ කාල වකවානුව තුල මහත්මයා රැකියාවක් කරනවාද?

පි: ඔව් රැකියාව පෞද්ගලික ආයතනයක සේවය කරනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කොයි කාලේද මහත්මයා සේවය කරන්නේ පෞද්ගලික ආයතනයක?

පි: සේවය කරන්නේ මම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් කරලා ඉවර වෙලා දැන් මාසය කිව්වොත් ස්වාමිනි නාලක සිල්වා මහත්මයාත් එක්ක සම්බන්ධ වෙන්නම තමයි මම කොළඹට එන්නේ පෞද්ගලික ආයතනයක රැකියවකට ස්වාමීනි ඒ රැකියාව හොයා ගන්න හේතුව මට නාලක සිල්වා මහත්මයාව මට නිරත හම්බෙන්න වෙන නිසා පෞද්ගලික ආයතනයක රැකියාවක් මම හොයා ගන්නවා ස්වාමිනි. ඊට කලින් මම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්තුවා ඒ වැඩසටහන් කරගෙන යන අතරතුර මේ තොරතුර අනාවරණය වෙනවා නාලක සිල්වා මහත්මයාට මේක සම්බන්ධ වුණාට පස්සේ මේකත් එක්ක නිරත සම්බන්ධ වෙන්න වෙනවා නාලක සිල්වා මහත්මයා නිතර හම්බෙන්න වෙනවා එතකොට මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් කරන්න වෙන්නෙත් නැහැ මුකුත් නැහැ කොළඹට වෙලා මට මේක විමර්ශන ඉස්සරහට කටයුතු කර ගෙන යන්න අවශ්‍ය සහයෝගය දෙන අතර තුර මට ජීවත් වෙන්න අවශ්‍ය රැකියාවක් හොයා ගන්න වෙන නිසා මම පෞද්ගලික ආයතනයක

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

රැකියාවක් කරන ගමන් තමයි ස්වාමිනී මම පොලිස්පතිතුමා හම්බෙන්න එන්නෙත් ඒ විදියට ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයා 2017 සැප්තැම්බර් මාසේ 20 වෙනිදායින් පසුව මහත්මයා රැකියාවක නිරත වෙනවා පුද්ගලික ආයතනයක

පි: 2017 සැප්තැම්බර් මාසේ ඔව් මම රැකියාවක නිරත වෙනවා ස්වාමිනි.

ප්‍ර: කොහේද සේවය කරන්නේ මහත්මයා?

පි: ඒ සේවය කරන්නේ කැළණිය ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක වැඩ කරන්නේ.

ප්‍ර: මොකක්ද පෞද්ගලික ආයතනයක නම ඒ විස්තර කියන්න මහත්මයා?

පි: පැහැදිලි කරන්නම් ස්වාමිනි.

ප්‍ර: පැහැදිලි නෙමේ මට නම කෙටියෙන් කිව්වාම හරි නැත්නම් ගොඩාක් කාලය ගතවෙනවා

පි: expose කියන සමාගමක ස්වාමිනි

ප්‍ර: export කියලා සමාගමක?

පි: expose සමාගමක ස්වාමිනි

ප්‍ර: expose සමාගමක කුමන තනතුරක මහත්මයා සේවය කරන්නේ?

පි: මම ඒ පිළිබඳව පැහැදිලි කරන්න උත්සහ කලා ස්වාමිනි. ඒකට බාධා කිරීම පිළිබඳව මම කණගාටුව ප්‍රකාශ කරනවා ස්වාමීනි. Expose කියන සමාගමේ වැඩකරේ ස්වාමීනි ආරක්ෂක උපදේශක කණ්ඩායම් භාර නිලධාරි වරයෙක් විදියට මගෙන් අහුවා කොහේටද වැඩකරන්නේ මට කොළඹට යන්න ළඟම තැනක් මටද හදලා දෙන්න කියලා සෙන්ට්‍රල් ෆිනෑස් කියන ආයතනයට අනියුක්තව සේවය කරා සෙන්ට්‍රල් ෆිනෑස් ආයතනයේ කළමණාකාරතුමාට කිව්වා මම වෙනත් කටයුත්තක් හොයන ගමන් ඉන්නේ මගේ වෙන කටයුත්තක් තියෙනවා ඒ නිසා මට පොඩි කාලයක් මෙතන අහවල් සමාගමෙන් මාව එව්වා මෙතනට ඔයගොල්ලන්ගේ ටීම් එකත් එක්ක බලාගෙන වැඩ කරන්න මට ඒකට අවස්ථාව ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරා ස්වාමිනි. Expose සමාගමේ නම ආරක්ෂක කණ්ඩායම් භාර නිලධාරි තනතුර සේවය කලේ කැළණිය සෙන්ට්‍රල් ෆිනෑස් යාඩ් එක යාඩ් දෙකක් තිබුණා යාඩ් දෙක භාරව හිටියේ ඒ ඉන්න අතර තුර තමයි නාලක සිල්වා මහත්මයා එක්ක සම්බන්ධ වෙන්නේ වැටුප් පෞද්ගලික ආයතනයකින් ගන්නේ

ප්‍ර: මහත්මයා දැන් 2018.09 වෙනි මාසේ 15 වෙනිදා වන විට මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මහත්මයාගේ පැමිණිල්ල සටහන් කර ගන්න අවස්ථාව වන විට මහත්මයා රැකියාවක් කරාද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කාලේ රැකියාවක් කලේ නැහැ?

පි: නැත ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ බව හොඳටම විශ්වාසයි?

පි: 2018.09.15 වෙන කොට නැහැ ස්වාමිනි

ප්‍ර: මහත්මයා දැන් මහත්මයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්ත්මේන්තුවට හඬ පට ඇතුලත් CD පට ලබා දීමක් සිද්ධ කරනවානේ?

පි: ලබා දී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: CD කොපමණ සංඛ්‍යාවක් ලබා දී තිබෙනවද මේ වෙද්දි?

පි: මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ CD පටවල හඬ පට කොපමණ සංඛ්‍යාවක් තිබෙනවද?

පි: ඒකත් මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: මහත්මයා ඒවා ගැන යම් කිසි මහත්මයා විශේෂයෙන්ම විශාල දේවල් ගැන අධ්‍යනයක නිරත වෙච්ච කෙනෙක්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් තමන් CD පට කීයක් දුන්නද කියලා මහත්මයාට මතකයක් නැහැ?

පි: ස්වාමිනී CD පට කීයකින් කීයක් කොහොම දුන්නද කියන එක මට මතක නැති හේතුව දුන්න හඬ පට මගේ ළඟ තියෙනවා ස්වාමිනි. මගේ ළඟ තිබිලා මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යම් හඬපටයක් ලබා දුන්නා නම් ඒ හඬපටයත් ඒකේ Copy එකක් මගේ ළඟ තියෙනවා ස්වාමිනි ඒක නිසා කීයක් දුන්නද කියන එක මම හොයන්න ගියේ නැහැ ස්වාමිනි දුන්න හැම එකක්ම ප්‍රකාශ කරලා අත්සන් කරලා ඇවිල්ලා තියෙන්නේ ස්වාමීනි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දීලා තියෙන නිසා මට නැවත ඒ පිළිබඳව මම අවධානය යොමු කරන්නේ නැහැ අවශ්‍ය වුණොත් ඒ මගේ ළඟ තියෙන නිසා ඒ පිළිබඳව අවධානයකින් ඉන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ මහත්මයා විසින් ලබා දෙන ලද CD පටවල අන්තර්ගත කටහඬ ඒ හඬපට කිනම් කාලවකවානුවල පටිගත කරන ලඳ හඬ පට ද?

පි: ස්වාමිනි ඇතැම් හඬ පට තියෙනවා 2017 දෙසැම්බර් මාසේ ගත්ත නාලක සිල්වා මහත්මයා එක්ක කථා කරන හඬපට එකක් තියෙනවා මට මතක හැටියට අනෙක් ඒවා ස්වාමීනි ඔක්කෝම 2018 ස්වාමීනි. බොහෝ හඬපට ලබා ගෙන තිබෙන්නේ 2018.03 වෙනි මාසේ 10 න් පස්සේ දිගන තෙල්දෙණිය , ගැටුමෙන් පස්සේ තමයි ලොකු සම්බන්ධතාවයක් නාලක සිල්වා මහත්මයා සමඟ ගොඩනැගෙන්නේ ඊට පස්සේ තමයි ඔය දේවල් කථා කරන්න පටන් ගන්නේ වැඩි පුර ඒ කථා කිරීම නිසා ඔය විශේෂයෙන්ම අද මේ සවන් දුන්න හඬ පට ලබා ගත්තේ ස්වාමිනි තුන්වෙනි මාසේ 2018 තුන් වෙනි මාසෙන් පස්සේ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ අද දින මහත්මයාට ගරු කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කරන ලද DGNJ 13 සිට 16 දක්වා වන හඬ පට මහත්මයා විසින් පටිගත

FAIR COMMENT — BY JEZEEM —

කරන ලද්දේ 2018.03.10 වෙනිදායින් පස්සේ කියලා කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: මහත්මයා මේ හඬපට පටිගත කරේ කුමන උපකරණයක් ආධාරයෙන්ද කියලා මෙම ගරු කොමිෂන් සභාවට කියන්න?

පි: මගේ ජංගම දුරකථනයක ආධාරයෙන් ස්වාමිනි.

ප්‍ර: මහත්මයා ඔය 2018.03.10 වන දින වනවිට මොකක්ද පාවිච්චි කරපු ජංගම දුරනථන අංකය? ජංගම දුරකථන වර්ගය ඒ සම්බන්ධයෙන් කියන්න පුළුවන්ද?

පි: Huawei GR5 දුරකථනයක් ස්වාමිනී

ප්‍ර: Huawei GR5?

පි: දුරකථනයක් ස්වාමිනි.

ප්‍ර: ඒ දුරකථනයට තිබුණ සිම්පත ඒ අංකය කුමක්ද කියලා කියන්න පුළුවන්ද?

පි: සිම්පත ස්වාමිනි මම දැනටත් භාවිතා කරනවා 0719576979 ස්වාමිනි

ප්‍ර: දැන් මහත්මයා ඔය ජංගම දුරකථනයේ තුළ නොයෙකුත් ඇප් වර්ග තියෙනවානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ මොනවද මහත්මයාගේ කෝල් රේකෝඩර් කියන ඇප් වර්ගය අනිවාර්යෙන් තිබෙන්න ඇති.

පි: මගේ තිබුණා ස්වාමිනි imo Whats App, call record, voice, cutter ඇප් දෙකක් තිබුණා. ඒ වොයිස් කටර් ඇප් මම ඩවුන් ලෝඩ් කරේම ස්වාමිනි

ප්‍ර: මම ප්‍රශ්නය ඇහුවේ නැහැ එක දෙයක් ගැන විතරක් මං ඇහුවේ නැහැ මම මහත්මයාගෙන් තාම ප්‍රශ්නයක් ඇහුවේ

පි: මට ඔක්කෝම මතක නැහැ.

ප්‍ර: මම මහත්මයාගෙන් ඇහුවේ මහත්මයාගේ ජංගම දුරකථනයේ තියෙන ඇප් වර්ගය මොකක්ද කියලා? මම වොයිස් කටර් ඇප් එක සම්බන්ධයෙන් විශේෂයෙන් විමසා සිටිමක් කර සිටියේ නැහැ?

පි: පහැදිලියි ස්වාමිනි.

ප්‍ර: එතකොට මහත්මයා මේ මහත්මයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද මේ හඬ පටවල සම්පූර්ණ සංවාදයක්ද තිබෙන්නේ එහෙම නැත්නම් කොටස් කොටස් එක්කාසු කරලා හදන ලද සංවාදද තිබෙන්නේ?

පි: කොටස් කොටස් එක්කාසු කරන ලද ඉතාමත් වගකීමෙන් ප්‍රකාශ කරනවා ස්වාමිනි කොටස් කොටස් එක්කාසු කරනලද හඬ පටයක් තිබෙනවා එතන ස්වාමිනි. එයට අමතරව එක වෙලාවක කථා කරන්න ගන්න පටන් ගත්තු හඬ පට තමයි අනිත් ඒවා තියෙන්නේ ස්වාමිනි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කොටස් කොටස් හඬ පටය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දෙන්න ගත්තු එකක් නෙමේ මම දෙන කොට පැහැදිලව මම ඒකේ ප්‍රකාශත් එක්ක දුන්නා මේක මම edit කරපු සංස්කරණය කරපු හඬ පටයක් ඒවා සංස්කරණය කරන්න හේතුව මේක තමයි මම මාධ්‍ය වලට නිකුත් කරේ කියලා කිව්වා. මාධ්‍යවලට නිකුත් කිරීමේ අවශ්‍යතාවය නිසා එදා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වපු නිසා ඊට ඉස්සෙල්ලා දවසේ රාත්‍රියේ මම ඒක තවත් පෝන් එකකින් අවශ්‍ය ටික play වෙන්න ඇරලා තවත් ෆොන් එකකින් රේකෝඩ් කරනවා අනවශ්‍ය ටික ගියාට පස්සේ ආයි ටිකක් ගන්නවා ඒ අනවශ්‍ය ටික ගියාට පස්සේ කියලා කිව්වේ අපි දෙන්නා කාපු ඒවා ගියපු ඒවා මේ මාධ්‍ය අයටවත් රටේ අයටවත් වැඩක් නැහැ ස්වාමීනි. රටේ අයට වැදගත් වෙන්නේ මේ සිදුවීම මම හෙළිකරන සිදුවීමට අදාල ඒ නිසා අන්න ඒ දේවල් ගන්න ඕන නිසා එහෙම සංස්කරණය කරපු එක හඬපටයක් තියෙනවා ඒ හඬපටය නමුත් කථා කරන්නේ ස්වාමීනි නාලක සිල්වා මහත්මයා ඒ නාලක සිල්වා මහත්මයා සහ මම ඉතින් ඒ හඬපටයත් එක්ක අනිත් ඒවා සියලුම දේවල් මොනවත්ම කරලා නැහැ ස්වාමිනි phone එකේ සාමාන්‍ය රේකෝඩින් ඇප් එක on කරලා ගත්තු හඬපට තියෙන්නේ ස්වාමිනි. එතන සමහර ඒවා තියෙනවා කෝල් එකක් එනකොට සමහර වෙලාවට කෝල් එක එන කොට නවතිනවා රේකෝඩ් වෙන එක සමහර වෙලාවට කෝල් එක එක්කම රේකෝඩ් වෙච්චි එවා තියෙනවා කෝල් එකක් එනවා ඒක vibrate වෙන කොට ඒකත් ඇහෙනවා vibrate වෙනවා කථා කරන එක ඇහෙන්නේ නැහැ vibrate වෙන එක තමයි ඇහෙන්නේ ස්වාමිනි

ප්‍ර: දැන් මහත්මයා ඔය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් හඬ පට දුරකථන සංවාද හඬ පටද එහෙම නැත්නම්?

පි: දුරකථනයෙන් පටිගත කරපුවා ස්වාමිනි.

ප්‍ර: ඒක මහත්මයායි නාලක සිල්වා මහත්මයයි අතර ඇතිවෙච්ච දුරකථන සංවාද මත පටිගත වෙච්චි හඬ පටද?

පි: දුරකථන සංවාද මත පටිගත වෙච්චි ඒවා නෙමේ මම ළඟ ඉදලා එකට ඉදලා මේ වගේ ළඟ ඉදලා රේකෝඩ් කරපුවා ස්වාමීනි දුරකථන සංවාද මම හිතන්නේ මට මතක හැටියට අර දුරකථන සංවාද දෙකක් තුනක් විතර තියෙනවා ස්වාමිනි. ඒවා තත්පර ගණන් වලින් විනාඩි ගණන් වල ඒවා විනාඩි දෙක, තුන , විනාඩියේ එහෙම හඬ පට මට මතකයි දෙකක් හරි තුනක් හරි තියෙනවා ඒවා එකක් අර මට තර්ජනය කරන එක ඒක දුරකථනයෙන් ගත්තු ඇමතුමක් ඒ වගේ හඬපට තුනක් විතර තියෙනවා මට මතකයි අනිත් ඒවා මම ළඟ ඉදලා රේකෝඩ් කරපුවා ස්වාමිනි.

ප්‍ර: දැන් මහත්මයා මේ කියන හඬ පට එකවත් තියෙනවද ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාවත් හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන

FAIR COMMENT BY JEZEEM

මහතාවත් ප්‍රස්න්න අල්විස් මහතාවත් මැරීම සඳහා මරණයට පත් කිරීම සඳහා කරන ලද කුමන්ත්‍රණ වලට අදාලව හඬපට තිබෙනවද?

පි: නැත ස්වාමිනි

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී උගත් නීතිඥවරයාගෙන් අසන්නේ ඒ සම්බන්ධයෙන් දැනටමත් නඩුවක් වෙනත් අධිකරණය පවතිනවද යන්නයි

පි: ස්වාමීනි දැනට විමර්ශන අවස්ථාවේ තිබෙන්නේ නඩු කටයුත්තක් තිබෙනවා ස්වාමිනි දැනට මහෙස්ත්‍රාත් අධිකරණයේ

එය එසේ හෙයින් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දිය නොහැකි බව දන්වයි.

****

<u>නීතිඥ මල්ක දෙනෙත්ති මහතා</u>

ප්‍ර: මහත්මයා විසින් සඳහන් කරා මේ තුෂාර පිරිස් යන අයෙක් සම්බන්ධයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ තුෂාර පිරිස්ගෙන් මහත්මයාට මුදල් කොපමණ වාර ගණනකදි ලැබිලා තියෙනවද?

පි: අවස්ථා කීපයකම ලැබිලා තියෙනවා ස්වාමිනී.

ප්‍ර: දැන් මහත්මයා විසින් සඳහන් කරේ ඔහු මේ වාදනය වෙච්චි C 1526 දරණ මහත්මයාගේ මාධ්‍ය වේදීයෙක් සමඟ කරන ලද සංවාද නැත්නම් වැඩසටහනට අදාලව මහත්මයා විසින් ඒ වැඩසටහනේදී ප්‍රකාශ කරනවා ජාත්‍යන්තර ගනයේ අපරාධයක් සම්බන්ධයෙන් තමයි තුෂාර පිරිස් යන අය ක්‍රියා කරන්නේ කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒක ගොඩාක් වැදගත් ජාත්‍යන්තර තලයේ අපරාධයක් නම් ඒක ගොඩාක් වැදගත්නේ?

පි: ජාත්‍යන්තරව සංවිධානය වෙන දෙයක් ස්වාමිනි.

ප්‍ර: ජාත්‍යන්තරව සංවිධානය කරනවා?

පි: සංවිධානය වෙනවා ලංකාවේ නෙමේ තුෂාර පිරිස් ලංකාවේ ඉපදුනාට තුෂාර පිරිස්ගේ පදිංචිය තියෙන්නේ ස්වාමීනි ප්‍රංශයේ ඒ වගේම තුෂාර පිරිස්ට මේවාට funds දෙන්නේ තවත් රටවල් වල ඉන්න තවත් පුද්ගලයෝ එතකොට මේ ත්‍රස්ත කටයුතු සංවිධානය වෙන්නේ ජාත්‍යන්තරව ස්වාමිනි මේක ක්‍රියාත්මක වෙන්නේ ලංකාවේ වුණාට ජාත්‍යන්තර ත්‍රස්තවාදී කටයුත්තක් කියලා තමයි මගේ දැනුමේ හැටියට ස්වාමිනි මට තේරෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒ තුෂර පිරීස් යන අය මහත්මයාට දැන් මහත්මයා සඳහන් කලානේ T 56 අවි මිලදි ගැනීම සම්බන්ධයෙන් මුදල් ලබා දීමක් සිදු කරා කියලා?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: මහත්මයා විසින් සඳහන් කලා එක් ලක්ෂ තිස්දහසක මුදලක් මහත්මයා වෙත ලැබුණයි කියලා?

පි: ඔව ඒ වගේ මුදලක් ලැබුණා ස්වාමිනි.

ප්‍ර: ඒ එක් ලක්ෂ තිස්දහක මුදලට මුදල මහත්මයා?

පි ගත්තා ස්වාමිනි.

ප්‍ර: ගත්තා ලබා ගත්තා ලබා ගෙන එය DIG නාලක සිල්වා මහත්මයාට භාර දුන්නද?

පි: භාර දුන්නේ නැහැ නාලක සිල්වා මහත්මයා මට උපදෙස් දුන්නා මොකක්ද ගන්න ඕන ක්‍රියාමාර්ගය කියලා නාලක සිල්වා මහත්මයාට මං කිව්වා මෙන්න සල්ලි එවන්න හදන්නේ මොකද කරන්නේ දාමු ෆොටෝ කිව්වා. දැම්මා ෆෝටෝ ස්වාමිනි ෆෝටෝ දැම්මාට පස්සේ සල්ලි එව්වා ෆෝටෝ දැම්මේ මගේ ෆෝටෝ නෙමේ TID එකේ තිබුණා T 56 ෆෝටෝ දැම්මේ. ඒ ෆෝටෝ දැම්මාට පස්සේ සල්ලි එව්වා. සල්ලි එව්වාට පස්සේ මං ඇහුවා සල්ලි එවල තියෙන්නේ මොකද කරන්නේ සර් කියලා සල්ලි ගන්න රිසිට් එක එවන්න කියාල කිව්වා මම සල්ලි ගත්තේ පළවෙනි පාර සල්ලි ගත්තේ අම්පාරෙන් මට මතක හැටියට දෙවනි පාර සල්ලි ගත්තා නුවරින් ඒ සල්ලි ගත්ත ඒවාගේ පින්තූර ඒ දෙවල් තව මගේ ළඟ තියෙනවා ස්වාමිනි තවමත් මගේ ළඟ තියෙනවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

රාත්‍රී ආහාරය සඳහා කොමිෂමේ කටයුතු රාත්‍රී 9.00 තෙක් කල්තබනවා.

දැන් වේලාව : රාත්‍රී 8.25

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

රාත්‍රී ආහාරයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස්වෙයි.

දැන් වෙලාව : ප.ව.9.15

පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙනවිය

මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

අත්තනායක මුදියන්සේලාගේ නාමල් කුමාර ප්‍රතිඥා දී කැඳවයි

<u>නීතිඥ මල්ක දෙනෙත්ති මහතා</u>

ප්‍ර : මහත්මයා?

පි : ස්වාමිනි

ප්‍ර : දැන් මහත්මයා විසින් සඳහන් කලා T 56 ගිණි අවි දෙකක් මිලදි ගැනීම සම්බන්ධයෙන් තුෂාර පිරිස් යන අය රුපියල් එක් ලක්ෂ තිස්දහසක මුදලක් මහත්මයාට වාර දෙකකදි ලබා දුන්නයි කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ලබාදීම සිද්ධ කරේ කුමන ආකාරයකට ද කියලා මහත්මයාට මතකයක් තිබෙනවද?

පි : මනිග්‍රෑම් ක්‍රමයට එවලා තිබුණේ ස්වාමිනි. ඒකට ඒ මනිග්‍රෑම් එවන System එකට තමයි එවලා තිබුණේ ස්වාමිනි.

ප්‍ර : ඒ ඔය මනිග්‍රෑම් ක්‍රමයට එව්වේ මහත්මයාගේ කුමන ගිණුමකටද?

පි : නෑ ඒක මනිග්‍රෑම් එවන්නේ ගිණුමකට නෙමේ ස්වාමිනි මනිග්‍රෑම් එවන්නේ ජාතික හැඳුනුම්පත් අංකයට එවන්නේ ස්වාමිනි.

ප්‍ර : ඒ ජාතික හැඳුනුම්පත් අංකය මහත්මයාගේ ජාතික හැඳුනුම් පත් අංකයට?

පි : මගේ ජාතික හැඳුනුම්පත් අංකයට ස්වාමිනි.

ප්‍ර : ඒ කුමන කාලවකවානුවේද?

පි : ඔය ස්වාමිනි තුෂාර පිරිස් සම්බන්ධවෙලා මාස කීපයකට පස්සේ ස්වාමීනි එහෙත් හරියටම කාලය මට මතක නැහැ. නමුත් 2017 දෙසැම්බර් මාසේ වගේ තමයි මගේ මතකය හැටියට ස්වාමිනි.

ප්‍ර : ඒ 2017 දෙසැම්බර් මාසේ මහත්මයාට ඒ මුදල එව්වාම මහත්මයා විසින් එම මුදල ලබා ගත්තේ කුමන ආයතනයකින්ද?

පි : ලංකා බැංකුව අම්පාර, ස්වාමිනි ඒක පළවෙනි පාර එවපු මුදල් ගත්තේ ලංකා බැංකුව අම්පාරෙන්. දෙවනි පාර එවපු මුදල් මට මතකයි ස්වාමිනි මහනුවර ලංකා බැංකුවෙන් මම අම්පාරේ ඉඳලා කොළඹ එන ගමන් නුවරින් බැහැලා මුදල් වගයක් ගත්තා ස්වාමිනි එහෙම මතකයක් තියෙනවා ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ ලබා ගත්ත මුදල් වලට අදාල රිසිට්පත් මහත්මයා ඒ රිස්ට්පත් වලට කුමක්ද
කලේ?

පි : ඒ රිස්ට්පත් ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි ඒ රිසිට්පත් එතන දැන් මනිග්‍රෑම් හරහා මුදලක් ලබා ගැනීමේදී රිසිට් එකක් අපිට දෙන්නේ නැහැ ස්වාමිනි. ඒ ෆොටෝ මම සාමාන්‍යයෙන් අපි බැංකුවක මනි ග්‍රෑම් ක්‍රමයට මුදල් ගන්න කොට ඒ අය අපට දෙනාව ෆෝම් එකක් ෆිල් කරලා දෙන්න ස්වාමිනි. මං බොහෝ අවස්ථාවල බැංකු නිලධාරියා මේ වගේ ඉදිරියේදී ඉද්දි බැංකු නිලධාරියාටත් රහසිගතව ඒ බැංකුවෙන් පුරවන ෆෝම් එක පවා ස්වාමිනි මං ෆොටෝ ගහලා ඒ මුදල් ලබා ගන්න ෆෝම් එකත් මම ළඟට අරගෙන ෆිල් කරන ගමන් ඒකත් පොටෝ එකක් ගහලා මම ඒක පවා එවලා තියෙනවා ස්වාමිනි බැංකුවෙන් දෙන මුදල් ගන්න රිස්ට් එකට අමතරව බැංකුවෙන් දෙන මුදල් ගන්න පුරවන්න කොලයක් දෙනවා. ඒ කොලෙත් මම ෆොටෝ එක ගහලා එවලා තියෙනවා. ඒ ෆොටෝ මගේ ළඟ තවමත් තියෙනවා ස්වාමිනි.

ප : යවලා තියෙනවායි කියන්නේ කාටද යවලා තියෙන්නේ කාටද යවලා තියෙන්නේ?

පි : DIG නාලක සිල්වා මහත්මයාට ලබා දීලා තියෙනවා ස්වාමිනි.

ප : ලබා දීලා තියෙනවා ස්වාමිනි?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඡායාරූප මාර්ගයෙන්ද නැත්නම් හාඩ්කොපි එහෙම නැත්නම්?

පි : ඡායාරූප මාර්ගයෙන් ස්වාමිනි

ප : මහත්මයා දැන් මහත්මයා විසින් දැන් සඳහන් කරානේ මේ පිටු 04 ක ලිපියක් DIG නාලක සිල්වා මහතාට ලබා දුන්නා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ කවදද ලබාදුන්නේ?

පි : ඒ ලබා දුන්නේ ස්වාමිනි 2018.03 වෙනි මාසේ දිගන , තෙල්දෙණිය ගැටුමට පස්සේ ස්වාමිනි.

ප : 2018/03 වෙනි මාසෙ ඒ දිගන තෙල්දෙණිය ගැටුමට පස්සේ?

පි : ගැටුමට පස්සේ ස්වාමිනි.

ප : ඒ කොහේදීද ලබා දුන්නේ?

පි : කොළඹ දී ස්වාමිනි.

ප : කොළඹ කොහේදීද?

පි : කොළඹ ස්වාමිනි මම ජීප් එකට නගින්නේ කොළඹ කොටුව එතන ඒ හරිය ශ්‍රී ලංකා ඒ හරියට කියෙන්නේ ස්වාමිනි කොළඹ කොටුව ඒ හරියට කියන තැන මට හරියටම මතක නැහැ එතන

FAIR COMMENT — BY JEZEEM —

ඒෂියන් බෑන්ක් එකක් තියෙනවා ඒ හරියේදී තමයි නැග්ගේ. අපි ගිහිල්ලා ඒ කථා කරන මට හොඳට මතකයි ස්වාමිනි හොඳටම මතකයි. අපි වාහනයට නැඟලා මම නාලක සිල්වා මහත්මයගේ වාහනයට නගින්නේ. නාලක සිල්වා මහත්මයාගේ වාහනයට නැඟලා නාලක සිල්වා මහත්මයා එක්ක කොටුව පැත්තෙන් ඇවිල්ලා ගලදාරි හෝටලය පැත්තෙන් ඒ විදියට දානවා ස්වාමිනි. වාහනය දාලා අපි එනවා එතුමාගේ ඇඳුම් වගයක් දීලා තිබුණා ලොන්ඩ්‍රි එකකට ස්වාමිනි. ඒ ලොන්ඩ්‍රියෙන් ඒ ඇඳුම් වගයක් තිබුණා ගන්න. මට මේ හරියේ ලොන්ඩ්‍රි එකක කොටුවේ ලොන්ඩ්‍රි එකකට දීලා තිබුණේ එතුමාගේ ඇඳුම් වගයක්. ඒ ටිකත් අරගෙන ඒ යන අතරතුර තමයි වාහනය යන අතරතුර තමයි ඒ දේවල් කථා කලේ ස්වාමිනි.

ප : ඒ ලිපිය මහත්මයා කිව්වා සඳහන් කරලා තිබුණා කියලා සම්පූර්ණ ඒ කියන්නේ යම්කිසි වැදගත් කරුණු මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ අනුව මහත්මයා සඳහන් කරා මෙම ගරු කොමිෂන් සභාව පත්වෙන්න සමහරවිට ඒ සම්බන්ධයෙනුත් මහත්මයා පූර්වයේ මහත්මයාගේ හිතේ තිබුණා කියලා. මේ ආකාරයෙන් කොමිෂන් සභාවකුත් තිබෙන්න ඕනේ කියලා?

පි : කොමිෂන් සභාවක් කියලා තියන්න ඕනේ කියලා තිබුණේ නැහැ ස්වාමිනි.

කොමිෂන් සභාවක් කියන දැනුම මගේ ළඟ තිබුණේ නැහැ.

ප : ජනාධිපති කාර්ය සාධක බලකායත් හෝ ඒ ආකාරයේ ජනාධිපති?

පි : මොකක් හෝ ස්වාමිනි. මොකක් හරි බලය තියෙන ආයතනයක් බිහිවිය යුතුයි කියන තැන මම හිටියා ස්වාමිනි. විනිවිද භාවයකින් යුත්ත කටයුතු කරන ආයතනයක් ස්වාමිනි.

ප : ඒ කියන්නේ මහත්මයා පූර්ව අපේක්ෂණය කරලා තමයි ඒක ඒ අකාරයේ ලිපි සඳහන් කරේ?

පි : ඔව් ස්වාමිනි විසඳුමක් ලබා ගත යුත්තේ අපි නිත්‍යානුකූල විසඳුමකටයි අපි යා යුත්තේ ස්වාමිනි. ඒ නිසයි මම එහෙම යෝජනාවක් කරන්නේ ස්වාමිනි.

ප : දැන් මහත්මයා මහත්මයා විසින් සඳහන් කරා මේ ලක්ජීව කියන පුද්ගලයෙක් සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ ලක්ජීව යන පුද්ගලයා 2017.07 වෙනි මාසේ තමයි මහත්මයාට මුලින්ම මුණ ගැහුණේ කියලා මහත්මයා සඳහන් කලා?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඊට පස්සේ තමයි මහත්මයාට මේ නාලක සිල්වා කියන නියෝජ්‍ය පොලිස්පතිවරයා මුණ ගැහෙන්නේ?

පි : එහෙමය් ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ලක්ජීව කියන පුද්ගලයා ඒ වෙනකොටත් රාජකාරි කටයුතු කරේ රාජ්‍ය බුද්ධි සේවයේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මහත්මයාට මේ නාලක සිල්වා යන අය මුණ ගැසීමටත් පෙර සිට රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් සමඟ හොඳ කිට්ටු සම්බන්ධතාවයක් තිබුණා?

පි : නිලධාරීන් සමඟ නෙමේ ස්වාමිනි. නිලධාරයෙකු සමඟ ස්වාමිනි.

ප්‍ර : නිලධාරියෙකු සමඟ හොඳ කිට්ටු සම්බන්ධතාවයක් තිබුණා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මහත්මයා එක්ක සතිපතා කථා කරනවා කියලා මහත්මයා සඳහන් කරානේ?

පි : සඳහන් කරා ස්වාමිනි.හම්බෙනවා ස්වාමිනි.

ප්‍ර : මහත්මයා හැමදේම ප්‍රකාශ කරා කියලා කිව්වානේ?.

පි : ප්‍රකාශ කරනවා ස්වාමීනි.

ප්‍ර : මේ DIG නාලක සිල්වා මහතා සම්බන්ධයෙනුත් ප්‍රකාශ කරාද ඒ නිලධාරියා?

පි : DIG නාලක සිල්වා මහත්මයා සම්බන්ධව මං ප්‍රකාශ කරේ නැහැ. ප්‍රකාශ කරන්න සිද්ධ වුණා එක අවස්ථාවකදී. ඒ අවස්ථාවේදී මම DIG නාලක සිල්වා මහත්මයා පිළිබඳව ප්‍රකාශ කරා. ඒ DIG නාලක සිල්වා මහත්මයා පිළිබඳව ප්‍රකාශ කරේ ස්වාමීනි රොහින්නියා සිදුවීමට අදාළව සැකකරුවන් අත්අඩංගුවට ගත්ත දවසේ මට ඒ ගැන ප්‍රකාශ කරන්න සිද්ධ වුණා. මට එතැන වෙන කරන්න දෙයක් නැති නිසා මම ඒක ඒ වෙලාවේ ප්‍රකාශ කරා ස්වාමීනි.

ප්‍ර : ඒ රොහින්නියා සිද්ධිය වුණේ කවදද?

පි : ඒ රොහින්නියා සිද්ධිය වන්නේ 2018.09 වැනි මාසේම වගේ මට මතකයි මේ සිදුවීම වෙනවා. 09 වැනි මාසේ හෝ 10 වැනි මාසේ වගේ. එයට දවස් කිහිපයකට පස්සේ වගේ තමයි ඔය රොහින්නියා සිද්ධියට අදාළ සැකකරුවෝ අපි වරකාපොළට ආසන්න පස්යාල, වේවැල්දෙණිය ප්‍රදේශයේදී අපි අත්අඩංගුවට ගන්නේ ස්වාමීනි. එදා ලක්ජීව කියන නිලධාරියා මං ඒ නාලක සිල්වා මහත්මයා සමඟ කටයුතු කරනවා කියලා දැනගන්නේ ස්වාමීනි මට කතා කරා පහුගිය ඊට ඉස්සෙල්ලා දවසේ මට කතා කරා. එතකොට මම

FAIR COMMENT BY JEZEEM

කලින් සඳහන් කරා ස්වාමීනි මම කොළඹ ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක වැඩ කරන ගමන් තමයි මේ දේවල් කරන් ගියේ නාලක සිල්වා මහත්මයත් එක්ක සම්බන්ධවෙලා හිටියේ කියලා ස්වාමිනි. ඉස්සෙල්ලා දවසේ කතා කරන කොට මම හිටියේ කොළඹ ස්වාමීනි. මගෙන් ඇහුවා කොහොමද මොකද වෙන්නේ මේ දවස්වල වැඩකටයුතු කියලා මම සාමාන්‍ය විදියට කතා කරා ස්වාමීනි. එතකොට නාලක සිල්වා මහත්මයත් එක්ක හෙට දවසේ කරන්න සැලැස්මක් තිබුණා. ඒ සැලැස්ම පිළිබඳව ලක්ජීව මහත්මයත් එක්ක මම කතා කරේ නැහැ ස්වාමීනි. කතා කරන්නේ නැතුව ඉඳලා අනිත් පහුවදා මට හවස 03.00 ට විතර කෝල් ගත්ත ගත්තා මොහු කොල් එකකට answer කරා. මම answer කරාම ලක්ජීව කියන ඒ නිලධාරියටත් නාලක සිල්වා මහත්මයාටත් පුළුවන් හැකියාව තිබුණා මම ඉන්න තැන හොයා ගැනීමේ හැකියාවක් තිබුණා ස්වාමීනි. මගේ ජංගම දුරකථන අංකයත් එක්ක. ඒ නිසා මම ඉන්න තැන පිළිබඳව දෙපාරක් කියන්න අවශ්‍යතාවයක් නැහැ ස්වාමීනි ඒ අයට. ඒ නිසා මගේ ඒ වෙලාවේ එන කෝල් වලින් ඇහුවා ඔයා කොහේද ඉන්නේ. මම කිව්වා මම වරකපොළ ඉන්නේ. ඊයේ කතා කරන කොට ගෙදර එන කතාවක් මට කිව්වෙත් නැහැ. ඇයි හදිසියේ වරකපොළ ආවේ. මොකක් හරි සිදුවීමක් තියෙනවා. මොකද්ද ඇත්ත. මොකද්ද එතැන තියෙන සිදුවීම. ඇයි හදිසියේම වරකපොළ ඇවිල්ලා දැන් මොකද මං කිව්වා දැන් කොළඹ යන ගමන්. එක දවසින් එන්න උදේ එන්නත් හවස යන්නත් හේතුව මට පැහැදිලි කරන්න කිව්වම මට වෙන කරන්න දෙයක් නැහැ ස්වාමීනි. මං ඒ වෙලාවේ අන්න ඒ වෙලාවේ කිව්වා මේ මම ආවා වැඩකට රොහින්නියා සිද්ධියට අදාළව පුද්ගලයෝ අත්අඩංගුවට ගත්තා දැන් කවුද අත්අඩංගුවට ගත්තේ? කොහේදිද වුණේ. මං කිව්වා මීරිගම ප්‍රදේශයේදී වුණේ. මම තැන කිව්වෙත් නැහැ ස්වාමීනි හරියට. මීරිගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනිම. ඇත්තටම අපේ location එක තිබ්බේ මීරිගම. මීරිගමට තමයි අපි මෙහෙයුම් සැලසුම් කරලා තිබ්බේ නාලක සිල්වා මහත්මයයි මායි. නමුත් ඒක අපිට වේවැල්දෙණිය දක්වා ගේන්න සිද්ධ වුණා. තවත් ඒකට අවශ්‍ය සියලුදෙනා එකතු කරගන්න ඕන නිසා. ඉතිං ඊට පස්සේ ලක්ජීව මහත්මයා මීරිගම පොලිසියෙනුත් ඒ ගැන අහලා තිබුණා. මීරිගම පොලිසියෙන් කිසිම දෙයක් දන්නෙ නැති නිසා මට කිව්වා නැහැ එහෙම දෙයක් මීරිගම පොලිසියෙන් වෙලා නැහැ. මට ඇත්ත කියන්න කාත් එක්කද මොකද්ද වුණේ මට හරියට පැහැදිලි කරන්න කියලා. ඒ නිසා ස්වාමිනි මම කිව්වා DIG නාලක සිල්වා මහත්මයා හම්බ

FAIR COMMENT BY JEZEEM

වුණා. එහිදී නාලක සිල්වා මහත්තයත් එක්ක කතා කරා ඔයත් එක්ක කතා කරලා වැඩක් නැහැ. ඔයා මේවට ඉස්සරහට ගියේ නැහැ. ඉස්සරහාට ක්‍රියා මාර්ග ගත්තේ නැහැ. ඒ නිසා මං ඔයාට වෙන්නේ මොකද්ද කියලා තුෂාර පිරිස් මහත්මයට කිව්වට මං ඒ දේවල් ඔක්කොම නාලක සිල්වා මහත්මයට දිලා ත්‍රස්ත විමර්ශන දිසාවෙන් ඒකට විමර්ශනයක් කරනගෙන යනවා කියලා මම ඔහුට කිව්වා. එදා තමයි ස්වාමීනි ලක්ජීව දැනගත්තේ මම නාලක සිල්වා මහත්මයත් එක්ක සම්බන්ධයි කියලා ස්වාමීනි.

ප : ඒ එහෙම ප්‍රකාශ කරලා කොපමණ කාලයකට පස්සේද මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නාලක සිල්වාට එරෙහිව කට උත්තරයක් ලබාදුන්නේ?

පි : වසරකට පස්සේ ස්වාමීනි.

ප : ඊට වසරකට පස්සේ?

පි : වසරක් මාස 10ක් විතර ස්වාමිනි.

ප : ඉන් අනතුරුව දැන් නාලක සිල්වා මහත්තයාත් එක්ක සාක්ෂිකරුගේ සම්බන්ධයක් තියෙන බව මේ ලක්ජීව කියන නිලධාරියා දැනගෙන හිටියානේ?

පි : දැනගෙන හිටියා ස්වාමිනි.

ප : එතකොට මහත්මයායි නාලක සිල්වා මහත්මයායි කතා කරන දේවල් සම්බන්ධයෙන් මහත්මයා විසින් ලක්ජීව යන අයත් සමඟ කතා බහා කරනවා?

පි : නැහැ ස්වාමිනි. ඇතැම් අවස්ථාවල කතා කරනවා. ඒ කතා කරන්නේ ස්වාමිනි මගෙන් අහනවා මොකක්ද වෙන්නේ කොහොමද දැන් කාත් එක්කද වැඩ කරන්නේ. මම කියනවා පොලිස්පතිතුමා සම්බන්ධ කරලා දුන්නා නාලක සිල්වා මහත්තයාත් එක්ක වැඩ කරනවා කියලා අවස්ථා කිහිපයකදීම. කියලා තියෙනවා ස්වාමිනි. කොහොමද ඒවා කරන්නේ මොකක්ද වෙන්නේ කියලා ඒ දේවල් කියලා නැහැ ස්වාමිනි හැබැයි මම නාලක සිල්වා මහත්මයා අරවගේ ඉහළ පොලිස් නිලධාරින්ට ඒ විදියට යුක්ති සහගත නොවන ආකාරයෙන් කටයුතු කිරීමට යෝජනා කරාට පස්සේ මම හඬපට ටිකත් එක්කම අරගෙන මම දෙනවා මේක මට කියන්න වෙන තැනක් නැහැ. ඔයලාට කියන්න ඔයලා තමයි මේ රටේ තියෙන බුද්ධි අංශවල අංක එක. ඔයාලා සාධාරණ විසඳුමක් ගන්න. හැබැයි මගේ ජීවිතයේ ආරක්ෂා කරන්න ඕනි කියලා මම ඒ කෙනාට මම කෙළින්ම කියලා තමයි ස්වාමිනි.

ප : ඒ හඬපට ලබා දීම කරන්නේ කවදාද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ හඬපට ලබා දෙන්නේ ස්වාමිනි 2018/04 මාසේ වගේ මට මතක. එහෙම දින වකවානුනම් හරියට මතක නැහැ ස්වාමිනි.

ප්‍ර : 04 වෙනි මාසේ වගේ?

පි : 04 වෙනි මාසේ 04,05 වගේ කොහොම හරි ඒ හඬපට ලබා ගත්තු කාලයේම තමයි ලබා දෙන්නේ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය මහත්මයා විසින් සඳහන් කරන ලද සිද්ධි මහත්මයා සාක්ෂිවලදී සඳහන් කරා මේ ශානි අබේසේකර යන අයව මුණ ගැසිලා මහත්මයා විසින් මේ සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ පැමිණිල්ල කරන්න ඉස්සරලාද මේ ලක්ජීව යන අයට තොරතුරු ලබා දීම සිද්ධ කරන්නේ ඒ පැමිණිල්ල කලාට පසුවද?

පි : ස්වාමිනි මම ශානි අබේසේකර මහත්මයා හම්බුවෙන්න ඉස්සරවෙලා ස්වාමීනි.

ප්‍ර : ශානි අබේසේකර මහත්මයා හම්බවෙන්න ඉස්සරවෙලා තමයි මහත්මයා විසින් මේ ලක්ජීව කියන අයට මේ තොරතුරු ලබා දෙන්නේ. එතකොට ඒක ඒ වෙද්දිත් රාජ්‍ය බුද්ධි සේවයේ අය දැනගෙන හිටියා?

පි : දැනගෙන හිටියා ස්වාමීනි.

ප්‍ර : මේ හඬපට සම්බන්ධයෙනුත් රාජ්‍ය බුද්ධි සේවයෙන් දැනගෙන හිටියා?

පි : හඬ පට සම්බන්ධව දැනුවත් වෙලා හිටියා ස්වාමිනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ලක්ජීව යන නිලධාරියා ඉහළට වාර්තා කරා කියලා මහත්මයාට සඳහන් කරාද? මහත්මයා උනන්දුවෙන් අහන්න ඇතිනේ මේක මොකද මේක රටේ බරපතල ප්‍රශ්නයක්නේ?

පි : ඔව් ඔව්. මම ඇහුවා මේක ඉහළට වාර්තා කරලා තියෙන්නේ මේකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා කියලා කිව්වා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ 2018/04/05 වෙද්දීත් මහත්මයා විසින් රාජ්‍ය බුද්ධි සේවයට මේ නාලක සිල්වා විසින් කරන ලැදයි චෝදනා කරන කුමන්ත්‍රණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කරලා තිබුණේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වෙද්දිත් රාජ්‍ය බුද්ධි සේවය විසින් කිසිදු පියවරක් අරගෙන තිබ්බේ නැහැ ඒක නිසා තමයි මහත්මයා විසින් ශානි අබේසේකර යන අය මුණ ගැහෙන්න යන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා මේ පාස්කු ප්‍රහාරයයි මේ නාලක සිල්වා මහතා සහ මහත්මයා අතර ඇති වෙච්ච හඬ පටයි අතර යම් කිසි සම්බන්ධයක් තියෙනවද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : සම්බන්ධයක් නැහා?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා විසින් සඳහන් කරා මේ නාලක සිල්වා යන අය අත්අඩංගුවට පත් වුණේ නැතත් මේ පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමේ හැකියාවක් නැහැයි කියලා?

පි : ස්වාමීනි ඒක පැහැදිලියි ස්වාමීනි. රටේ ජාතික ආරක්ෂාව පල්ලෙහාට වැටිලා තිබුණේ ස්වාමීනි. ඒ නිසා අන්තවාදීන් හිස ඔසවලා තිබුණේ ස්වාමීනි. ත්‍රස්ත විමර්ශන දිසාව නියෝජනය වෙන්නේ පුද්ගලයෙක් මත නෙවෙයි ස්වාමීනි. එය ශ්‍රී ලංකා පොලීසිය. ශ්‍රී ලංකාවේ හිස ඔසවන ත්‍රස්තවාදීන් පිළිබඳව හොයන්න ඉන්න ආයතනය. ඒ ආයතනය එක පුද්ගලයෙක් මත නම් ක්‍රියාත්මක වෙන්නේ ඒ පෞද්ගලික ආයතනයක් විය යුතුයි ස්වාමීනි. රාජ්‍ය ආයතනයක් පුද්ගලයෙක් මත තීරණය කරන්න බැහැ ස්වාමීනි. ඒ රාජ්‍ය ආයතනයක ඒ පුද්ගලයාට උපදෙස් දෙන ඉහළ නිලධාරින් ඉන්නවා ස්වාමීනි. ඒ වගේම ඒ පුද්ගලයාගේ පහළින් නිලධාරින් ඉන්නවා ස්වාමීනි. ඒ පුද්ගලයා එතැනින් ඉවත් වුණාම ඒ තනතුරට වෙනත් නිලධාරින් පත් වෙනවා ස්වාමීනි. ඒ අයගේ දුර්වලතා දෝෂයන් තිබෙනව නම් ඒ පිළිබඳව සොයන්න ආයතන තිබෙනවා ලංකාවේ. එතකොට ඒ හැම තැනම දෝෂයන් තිබුණු නිසා තමයි ස්වාමීනි මේ පාස්කු ප්‍රහාරය එල්ල වෙන්නේ.

ප්‍ර : ආයතන තුළ දෝෂ තිබෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මම ප්‍රශ්නය විදියට ඇහුවේ මහත්මයා ප්‍රකාශ කළේ නාලක සිල්වා යන අය අත්අඩංගුවේ හිටියත් නැතත් මේ පාස්කු ප්‍රහාරය වෙනවයි කියලනේ සඳහන් කරන්නේ?

පි : ස්වාමීනි රටේ ජාතික ආරක්ෂාවත් එක්ක නාලක සිල්වා මහත්මයටත් ඒක කරන්න පුළුවන් හැකියාවක් තිබුණේ නැහැනේ ස්වාමීනි. නාලක සිල්වා මහත්මයත් පහුගිය දවස් වල ඒ ඒ කාලයට පිටපැත්තේ දිගන තෙල්දෙනිය ගැටුම නාලක සිල්වා මහත්මයා අත්අඩංගුවට ගත්තේ නාලක සිල්වා මහත්මයාගේ හැකියාව නෙවෙයි ස්වාමීනි. එතැන මගේ හැකියාව ස්වාමීනි. රෝහින්නියා සිද්ධියට අදාළව ඔය තියෙන සියලු DIGලා සියලු SSP ලා සියලු OICලා සියලු ASP ලා සියලුම දෙනා විමර්ශන කරා ස්වාමීනි. ඒ අයටත් බැහැ. එහෙනම් ත්‍රස්ත විමර්ශන

FAIR COMMENT — BY JEZEEM —

දිසාවේ මාව අරන් යන්න ඕනේ නැහැනේ ස්වාමීනි රෝහින්නියා සිද්ධියට අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගන්න. ඒ defend වුණේ මගේ මත ස්වාමිනි. මමයි ඒ සහයෝගය ලබාදුන්නේ ස්වාමීනි. ඒ නිසා මම තීරණය කරනවා මගේ දැනුමත් එක්ක එවැනි මුදල් ත්‍යාග පවා මට ලැබිලා තියෙනවා ස්වාමීනි. සාක්ෂි තියෙනවා ස්වාමීනි. මම ඒ අන්තවාදය නැති කරන්න මම සහයෝගය දුන්නා කියලා. එවැනි මෙහෙයුම්වල මම හිටපු නිසා මම තීරණය කරනවා නාලක සිල්වා මහත්මයා හිටියත් නාලක සිල්වා මහත්මයාට ඕකට කිසිම දෙයක් කරන්න හම්බු වෙන්නේ නැහැ කියලා ස්වාමීනි. හේතුව මම එතුමත් එක්ක කටයුතු කරලා තියෙනවා. එතුමා ඒ විමර්ශනවලදී ඉඳලා තියෙන නිසා මම දන්නවා එතුමාට ඕක කරන්න හම්බවෙන්නේ නැහැ කාගේ හරි සහයෝගයක් අරගෙන මං වගේ කෙනෙක්ගේ සහයෝගය අරගෙන කරොත් ඇරෙන්න. එතුමාගේ මේ ත්‍රස්ත විමර්ශන දිසාවට එහෙනම් ඔය තුෂාර පීරිස් පිළිබඳවත් ත්‍රස්ත විමර්ශන දිසාවට හොයාගන්න තිබුණනේ ස්වාමීනි. එදා වට්ටමඩු පිළිබඳව හොයාගන්න තිබුණනේ ස්වාමිනි. වට්ටමඩු පිළිබඳව තුෂාර පිරීස්ලා එතකොට ඔය කියන නියෝජ්‍ය පොලිස්පතිවරයා ඕකේ හිටියනේ ස්වාමිනි. ඔය කොන්ක්‍රීට් ඉදිරිකිරීම් කරන කොට ත්‍රස්තවාදීන්. ඔය නියෝජ්‍ය පොලිස්පතිවරයා ඔතැන හිටියානේ ස්වාමීනි. ඒ පිළිබඳව මොනවද තිබුණ වාර්තා ස්වාමීනි කිසිම වාර්තාවක් නැහැ. එදා අපි ගිහිල්ලා ඒ වට්ටමාඩුවලට ගිහිල්ලා හොයාගෙන ඒ නිලධාරීන් එක්ක ගිහිල්ලා ඒවා කතා කරලා සාකච්ඡා කරන කොට තමයි දන්නේ මේ වගේ තැනක් රට ඇතුලේ තියෙනවා කියලා. ඒ නිසා මම යෝජනා කරනවා ස්වාමිනි නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා හිටියත් ඔය ප්‍රහාරය ඔය විදියටම දියත් වෙනවා. ඒ අන්තවාදය අපි අලුත් පැතිකඩකින් හොයාගෙන යන්න පුළුවන් පටන් ගත්තු නිසා තමයි ඔය අන්තවාදය ගැන ටිකක් හරි හොයාගෙන ඕව මර්ධනය කරගෙන යන්න හැකියාව ලැබුණේ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර : යම් දෙපාර්තමේන්තුවකට සුදුසු නැති ප්‍රධානියෙක් පත් වුණොත්?

පි : ස්වාමීනි දෙපාර්තමේන්තුවකට සුදුසු නැති නිලධාරියෙක් පත් වුණොත් ඒ දෙපාර්තමේන්තුව වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග තිබෙනවා ස්වාමීනි. ඒ ක්‍රියාමාර්ග එකක්වත් අරගෙන තියෙනවද කියලා හොයලා බලන එක මං හිතන්නේ කොමිෂමට වැදගත් වෙනවා ස්වාමීනි. ඒ කොමිෂමේ දැන් ඊට පහළ නිලධාරීන් ඒ පිළිබඳ යෝජනාවක් එන්න ඕන ස්වාමීනි. ඉහළ නිලධාරීන්ගෙන් ඒ පිළිබඳව

LEARN COMMENT BY JEZEEM

අද වන කොට යෝජනාවක් එන්න ඕන. නියෝජ්‍ය පොලිස්පති නාලකද සිල්වා මහත්මයා හිටිය නම් අපේ මේ විමර්ශන දිසාවේ මෙහෙම දෙයක් වෙන්නේ නැහැ අනිවාර්යයෙන්ම සහරාන් අත්අඩංගුවට ගන්නවා කියලා ඒ පහළ නිලධාරින්ගෙන් සහ ඉහළ නිලධාරින්ගෙන් යෝජනාවක් එන්න ඕන. හැබැයි මේ දැන් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ එවැනි යෝජනා ඉදිරිපත් කරයි ස්වාමිනි. නමුත් නාලක ද සිල්වා මහත්මයා ඉන්න කාලේ Appeal එකක් කවුද දාලා තියෙන්නේ කියන එක ලොකු ප්‍රශ්නයක් ස්වාමිනි. එහෙම Appealඑකක් මං දන්න විදියට දාලා තියෙනවා එතුමාගේ හිතවත් කිහිප දෙනෙක්. ඒ හැරෙන්න ආයතනය මට්ටමෙන් Appeal එකක් දාලා නැහැ. අපිට රාජ්‍ය ආයතනයක රාජ්‍ය ආයතනයක් අකර්මන්‍ය විදියට පවත්වාගෙන යනව නම් රාජ්‍ය සේවයෙකුට අයිතියක් තියෙනවා ඒ රාජ්‍ය ආයතනය පවත්වාගෙන යන විදිය පිළිබඳව දැනුවත් කිරීමට. ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගන්න. පොලීසියේ ඉහළ නිලධාරියෙක් ඒක අකර්මන්‍ය විදියට පවත්වාගෙන යනව නම් ඒ පිළිබඳව දැනුවත් කරන්න ඒ අයට අයිතියක් තියෙනවා ස්වාමීනි. ඒ අයිතිය ප්‍රයෝජනයට අරගෙන තියෙනවද කියලා මං දන්නේ නැහැ ස්වාමීනි. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඉදිරිපත් කරලා තිබුණා නාලක සිල්වා මහත්මයා හිටියා නම් මේක වෙන්නේ නැහැ කියලා. හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා කිව්වා. ඒ වගේ නිලධාරි කිව්වා ස්වාමීනි. හැබැයි ඒ ත්‍රස්ත විමර්ශන දිසාවේ නිලධාරින් ඒ පිළිබඳව නාලක සිල්වා මහත්මයාව අත්අඩංගුවට ගත්තට පස්සේ මේක ලොකු අසාධාරණයක් මේ ත්‍රස්තවාදී විමර්ශන දිසාව දැන් වැටීගෙන යන්නේ කියලා Appeal එකක් දාලාද කියන එක ලොකු ප්‍රශ්නයක් ස්වාමීනි.

ප්‍ර : ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉන්න කොට එහෙම කරන්න පුළුවන් ද දෙපාර්තමේන්තුවට?

පි : ස්වාමීනි ශ්‍රී ලංකා පොලීසිය එහෙම කරන්න පුළුවන් වෙන්න ඕන ස්වාමිනි. ඒකට පොලිස් කොමිෂන් එක තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා කියන ආකාරයට මහත්මයා වගේ අතිවිශිෂ්ඨ විමර්ශකයෙක් පසුපස නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා යන අය විසින් ගිහිල්ලා බොහෝම අමාරුවෙන් මේ වට්ටමඩු,තෙල්දෙණිය යන සිදුවීම් මැඩපැවත්වීමේ හැකියාවක් තිබ්බා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයා වගේ විශිෂ්ඨ?

පි : නැහැ මම වගේ විශිෂ්ඨ කියලා කියන්නේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : විමර්ශකයන්ගෙන් ප්‍රයෝජන අරගෙන පසුපස ඉඳගෙන කොහොම හරි පසුපස ඉඳගෙන පුළුවන් විදියට මහත්මයට ඒ හැකියාව පෙන්නන්න අවස්ථාව දීලා ඒ වගේ සිද්ධීන් මැඩපැවැත්වීමේ හැකියාවක් නාලක සිල්වා යන අයට තිබුණා?

පි : හැකියාවක් පෙන්වන්න අවස්ථාව දුන්නද කියලා මම දන්නේ නැහැ ස්වාමීනි. මගේ සහයෝගය අරගෙන තමයි ඒවා මැඩපැවැත්තුවේ ස්වාමීනි.

ප්‍ර : ඔව් එතකොට ඒ වගේ තෙල්දෙනිය සිද්ධිය දිගට ගියා නම් ලොකු ඛේදවාචකයකින් අවසන් වීමේ ඉඩක් තිබුණද?

පි : අනිවාර්යයෙන් ස්වාමීනි. මොකද මම නාලක ද සිල්වා මහත්මයාට කියනවා උදේ සර් දැන් ලංකාවේ පළවැනියටම WhatsApp, ෆේස්බුක් තහනම් කරන්නේ ඔය දිගන තෙල්දෙණියේ ගැටුමෙන් පස්සේ අකුරණ පැත්තේ සිදුවීම වුණාට පස්සේ. මම මෙතුමට කියනවා එක වාහනයේ ඉඳගෙන කියන්නේ, සර් දැන් පුළුවන් නම් මේ ෆේස්බුක් ඒවා මේවා වහලා දාන්න පුළුවන් ක්‍රමයක් තියෙනව නම් හොඳයි කියලා. එතුමා ඒ වෙලාවේම මං දන්නේ නැහැ කාට කතා කරාද කියලා සර් මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මේ ෆේස්බුක් එක එහෙම වහගන්න පුළුවන්නම් හොඳයි කියලා එතුමා කතා කරා. කතා කරලා හැබැයි සතුටුයි පැය බාගයක් විතර යන කොට ඔක්කොම වැහුවා. ෆේස්බුක්,WhatsApp සියල්ල නැවතුණා ස්වාමීනි. ඉතිං අන්න ඒ වගේ මං දන්නේ නැහැ ඒවා එතුමා පිළිගත්තත් නොපිළිගත්තත් මට ප්‍රශ්නයක් නැහැ ස්වාමීනි. මම කතා කරන්නේ මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව නාලක ද සිල්වා මහත්මයාව අත්අඩංගුවට ගැනීම හරහා පාස්කු ප්‍රහාරයේ සැකකරුවන් පාස්කු ප්‍රහාරයට වගකිව යුතු පුද්ගලයන් අත්අඩංගුවට ගන්න බැරි වුණා කියලා චෝදනාවක් ඉදිරිපත් කරන නිසා මම ඒක ප්‍රතික්ෂේප කරනවා ස්වාමීනි.

ප්‍ර : ඒකනේ මහත්මයා වගේ කෙනෙක් තමයි මේ පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙහෙයවීමේ හැකියාවක් මහත්මයාට තිබුණා?

පි : එහෙම මෙහෙයවීමේ හැකියාවක් නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා කිව්ව විදියට කටයුතු කරලා තියෙනවනේ දිගින් දිගටම?

පි : මම සහයෝගය ලබාදීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා දැන් මහත්මයාට ඔය ආකාරයට නාලක සිල්වා මහත්මයා පාස්කු හිටිය නම් පාස්කු ප්‍රහාරය හිටියත් නැතත් සිද්ධ වෙනවායි කියලා කියන්න තරම් මහත්මයාට කොහෙන්ද දැනුම

FAIR COMMENT BY JEZEEM

ලබාගත්තේ? නැත්නම් ඒ සම්බන්ධයෙන් මහත්මයාට තියෙන සුදුසුකම මොකද්ද ඔව වගේ ප්‍රහාරයක්.....?

පි : දැනුම ලබාගත්තේ නැත්නම් ස්වාමීනි අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පොළ විභාගයත් fail වෙලා ඉන්න මාත් එක්ක අර වගේ යෝජනාවක් කරන්න ඕනේ නැහැනේ. මගේ ජාතිය, ආගම ගැන හිතන්නේ නැතුව මට මොහොමඩ් කියලා නමට කෑල්ලක් දාලා ඉස්සරහාට මොහොමඩ් නාමල් කුමාර කියලා ෆේස්බුක් එකේ මඩගහන කොට සිංහල ජාතිය පවලා දුන්නා කියන කොට ඒ තරම් චෝදනාවකට ලක් වෙලා මම ජාතික ආරක්ෂාව ගැන හිතලා කටයුතු කරන කොට මේ රටේ ජාතික ආරක්ෂාව ගැන හිතලා තමයි මේ ඇවිල්ලා තියෙන්නේ කියලා එතකොට මම පුන පුනාම කියන කොට එවැනි කෙනෙක් එක්ක ඝාතනයක් කරන්න සැලැස්මක් කරන කොට ඒ සැලැස්මේදී ස්වාමීනි මෙම පුද්ගලයා ඒ කතා කරන විදිය මේ කතා විලාසයම දැක්කම ඔබතුමාට තේරුම්ගන්න පුළුවන් වෙයි මේ මම හඬ පටවල පැහැදිලිව තියෙනවනේ ස්වාමීනි මම අහනවා මගේ phone එකේ recodingOn කරලා අහනවා DIG ලතීෆ් සර් අරහෙම කරමු. මට දැන් උවමනාව තියෙන්නේ කලින් කතා කරපු දේ නැවත ලබාගැනීම ස්වාමීනි. මට මේ DIG ලතීෆ් මහත්මයාට මම නැවත කතා කරලා කියනවා ඊට පස්සේ DIG ලතීෆ් මහත්මයට මං කතා කරලා කියනවා ඒක ස්වාමීනි. මම නිලන්ත ජයවර්ධන මහත්මයා එක්ක කතා කරලා නැති වුණාට නන්දන මුණසිංහ මහත්මයා, නිහාල් තල්දුව මහත්මයා,DIG ලතීෆ් මහත්මයා මේ හැම කෙනෙකුටම කතා කරා ස්වාමීනි. ප්‍රසන්න අල්විස් මහත්මයාටත් මං කතා කරා. කතා කරේ නැත්තේ නිලන්ත ජයවර්ධන මහත්මයට විතරයි ස්වාමීනි. ඒ නිලන්ත ජයවර්ධන මහත්මයාව මට සම්බන්ධ කරගන්න මට ලක්ජීව නම්බර් එක්ක දුන්නෙත් නැහැ. මට හැබැයි සම්බන්ධ කරගන්න පුළුවන් වුණානම් මං අනිවාර්යයෙන්ම නිලන්ත ජයවර්ධන මහත්මයාටත් කතා කරනවා. ලතීෆ් මහත්මයාට මං කතා කරලා ලතීෆ් මහත්මයා මං මෙන්න මෙහෙම නිලධාරියෙකුත් එක්ක මෙන්න මෙහෙම වැඩක් කරා. ඒ වැඩේදී මං මෙන්න මෙහෙම ඒ නිලධාරියා මට මෙහෙම යෝජනාවක් කරා. පස්සේ මට ඒකේ සාක්ෂියක් නැති නිසා මං මගේ phoneඑකේ recoding On කරලා මං ඇහුවා ඔබතුමාව මරමුද කියලා හැබැයි ඔබතුමා මරණ තැනට මිනිහ නැහැ. මං එහෙමයි කිව්වේ සර්. සමාවෙන්න ස්වාමීනි. මම කිව්වේ ඔබතුමාව මරණතැනයි එතුමා නැහැ. ඒ මනුස්සයා මරණ තැන නැහැ නමුත් ඒ මනුස්සයා ඉන්නවා හානියක් කරන්න ඕන ඔය තනතුරෙන් ඇදලා දාන්න ඕන කියන තැන ඉන්නවා. ඒ නිසා පරිස්සමෙන් කටයුතු කරන්න. මේක මගේ

FAIR COMMENT — BY JEZEEM —

ළඟ තියෙනවා මේ හඬපටය. මං ඔබතුමාට එවන්නම් කියලා අර ලොකු හඬ පටයෙන් අර ලතීෆ් මහත්මයා ගැන කතා කරන ටික ඔන්න ඕවා මං.

ප්‍ර : ඒවා කොයි කාලේ වගේද මහත්මයා ලබාදුන්නේ?

පි : ඒ ඒ කාලේමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කාලේ කියන්නේ කොයි කාලෙද?

පි : ඒ කාලේ කියන්නේ 06 වැනි මාසේ 07 වැනි මාසේ සමාවෙන්න අගෝස්තු මාසේ.

ප්‍ර : ඒ කියන්නේ මොන අවුරුද්දේද?

පි : 2018අගෝස්තු මාසේ ස්වාමීනි.

ප්‍ර : 2018 අගෝස්තු මාසේ?

පි : 2018 අගෝස්තු මාසේ ලබාදුන්නා ස්වාමීනි.

ප්‍ර : ඒ වෙද්දිත් මහත්මයා අපාරධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ පැමිණිල්ල සඳහා කටඋත්තරයක් දීමක් සිදු කරේ නැහැ?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ වුණත් ඒ ඔවුන් විසින් ලතීෆ් මහත්වරුත් මහත්මයා විසින් ඒ සඳහන් කරන ලද දේට විරුද්ධව කිසිදු පියවරක් අරගෙන තිබ්බේ නැහැයි කියලා මහත්මයාට පෙනුණා?

පි : ලතීෆ් මහත්මයා ගත්තද නැද්ද කියන්න මම දන්නේ නැහැ ස්වාමීනි. අපරාධමය තොරතුරක්. ඒක මම තොරතුරු විදියට එකතු කරා මට තවත් තොරතුරු එකතු කිරීමේ චේතනාවෙන් මම එතන කටයුතු කරා ස්වාමීනි. නමුත් මම ඔයිට වැඩිය තොරතුරු එකතු කරගන්නවා කියලා හිතාගෙන හිටියේ. මට ඒ තරම් තොරතුරු එකතු කරගන්න බැරිවුණා මෙතුමා දැනගත්තා මං ගැන. ඉතිං මට පුළුවන් තරම් තොරතුරු එකතු කරගෙන බැරිම තැන අවසාන අවස්ථාවට ආවට පස්සේ දැන්නම් තවත් එකතු කරන්න බැහැ කියලා මං නම් දැනගත්තා. සියල්ල දැනගෙන ඉන්නේ මං ගැන කියලා. ඊටපස්සේ තමයි මම දැනගත්තා මේ රටේ සිදුවන අපාරධමය රැල්ල සහ දේශපාලන බලය භාවිතා කරන විදිය මට හොඳ දැනීමක් තිබුණ නිසා ස්වාමීනි මම හිතුවා මගේ ආරක්ෂාව තියෙන්නේ මේක සමාජ ගත කරොත් ඉස්සෙල්ලම කියලා මං පළවෙනියටම සමාජ ගත ඉස්සෙල්ලම මාධ්‍යය හමුවක් තියලා මම කිව්වා මේ මාධ්‍යය හමුව තියන්නේ මේ විදියට මං කරුණු ආනාවරණය කරගෙන ඇවිල්ලා මගේ ජීවිතයට අනතුරක් වෙයි කියලා. පැමිණිල්ලක් මම හෙට දානවා. අද මට දාන්න යන්න වෙලාවක් නැහැ කියලා මාධ්‍යය හමුවේදීම කියලා අනිත් පහුවදා ඇවිල්ලා පොලීසියේ නිලධාරියෙක් කරන වරදක් සම්බන්ධව හොයන්න තියෙන හොඳම ආයතනය

FAIR COMMENT BY JEZEEM

පොලිස් කොමිෂම නිසා ස්වාමිනි මම පොලිස් කොමිෂමට පැමිණිල්ල ඉදිරිපත් කරනවා ස්වාමිනි. මොකද පූජිත් ජයසුන්දර මහත්මයාට ඉදිරිපත් කරලා වැඩකුත් නැහැ.CID එකට කිව්වට ගණන් ගත්තෙත් නැහැ ස්වාමීනි. ඒ අදාළ නිලධාරින්ට ඒ.

ප : ඒ කියන්නේ ප්‍රසන්න අල්විස් මහත්මයටත් කිව්වා ඒ මහත්මයාත් ගණන් ගත්තේ නැහැ?

පි : ප්‍රසන්න අල්විස් මහත්මයා ගනන් ගත්තද නැද්ද කියන්න මං දන්නේ නැහැ ස්වාමීනි.

ප : ලතීෆ් මහත්මයට කිව්වා. මොකුත් මහත්මයාට පෙනෙන ක්‍රියාවලියක් වුණේ නැහැ කියලා මං යෝජනා කරනවා? නැත්නම් මහත්මයා යන්න අවශ්‍ය නැහැනේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් කොමිෂම වෙත?

පි : ස්වාමිනි මම ලතීෆ් මහත්මයට කතා කරලා කිව්වේ එතුමාට අදාළ දේ. නන්දන මුණසිංහ මහත්මයාට කතා කරලා කිව්වේ එතුමට අදාළ දේ. මං එතුමා සම්බන්ධව කතා කරලා හඬපටය කපලා කොටස් කරලා යවලා තමයි මම කතා කරන්නේ. මම අහවලා කතා කරන්නේ මං මෙන්න මේ වගේ දෙයක් කරා. මෙන්න මේ නිලධාරියා මෙන්න මේ සම්බන්ධව ඔබතුමාට මේ සම්බන්ධව කතා කරා. ඔබතුමා වැඩ කරන කොට පරිස්සමෙන් වැඩ කරන්න. ඔබතුමා ඇත්තද බොරුද කියන්න මම දන්නේ නැහැ. ඔබතුමා හොඳ කෙනෙක් ද නරක කෙනෙක්ද කියන්න මම දන්නේ නැහැ.මෙන්න මෙහෙම කතාවක් වුණා කියලා මම ඒ නිලධාරින්ට ඒ කාලේ ප්‍රකාශ කරා ස්වාමීනි.

ප : ඒ කියන්නේ පොලිස් කොමිෂමට පැමිණිල්ලක් සිද්ධ කරන්න ඉස්සෙල්ලා?

පි : ඉස්සෙල්ලා ස්වාමිනි.

ප : එතකොට මහත්මයා මහත්මයා මුලින් සඳහන් කරානේ අර voice cutter උපාංගයක් ගැන?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ මෘදුකාංගයක් තියාගෙන හිටියේ මහත්මයා ඒ ආකාරයට ඒ අවශ්‍ය අයට අවශ්‍ය කොටස් කපලා යැවීම සඳහා කියලා යෝජනා කරොත් පිළිගන්නවද?

පි : මාධ්‍යය නිවේදනයට අවශ්‍ය හඬපටය සකස් කර ගැනීම. දැන් හැම එකෙන්ම මම කල්පනා කරා අපි දෙන්න කාපුවයි මම call එක ආපුවයි.

ප : නැහැ මාධ්‍ය නිවේදනය ගැන නෙවෙයි මං ඇහුවේ දැන් මහත්මයා කිව්වනේ ලතීෆ් මහත්මයට අදාළ ඒවා?

පි : ඔව් ඒ කටයුතු දෙකම voice cutter එකෙන් කරා ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : මහත්මයා එස්.අයි. රාජකාරුණා කියලා හරි SI මදුසංඛ කියලා හරි නිලධාරීන් අඳුරනවද?

පි : එස්.අයි. රාජකරුණා කියලා ත්‍රස්ත විමර්ශන දිසාවේ මට මතක විදියට. එස්.අයි රාජකරුණා. මට මතක හැටියට නාලක සිල්වා මහත්මයගේ ගෝලයෙක්. මාත් එක්ක නුවර ගියා වගේ මට මතකයි.

ප්‍ර : එස්.අයි. මධුසංඛ?

පි : මධුසංඛ කියන නම මතකයට එන්නේ නැහැ.

ප්‍ර : මහත්තයා දන්නෙත් නැද්ද?

පි : නැහැ ස්වාමිනි. දන්නෙත් නැහැ කියන්නේ මම නම දන්නේ නැති වුණාට ඒ පුද්ගලයා කොතනදී හරි හම්බ වෙලා ඇති ස්වාමිනි. මම මොනවා හරි කතා කරලා ඇති. මට සිදුවීම මතක් කොරොත් ස්වාමිනි මුල ඉඳලා කියන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර : මහත්මයා නිතරම සාක්ෂි එකතු ඉතාම විමර්ශනශීලි?

පි : මට අවශ්‍ය නැති ඒවා මට වැඩක් නැහැ ස්වාමිනි.

ප්‍ර : ඉන්න පුද්ගලයෙක්නේ මම ඒකයි ඇහුවේ මහත්මයාගෙන්? මහත්මයා 2017 වර්ෂයේ නොවැම්බර් මාසේ කිව්වානේ මුලින්ම නාලක සිල්වා මහත්තයාව හම්බුණේ නොවැම්බර් 20 කියලා කිව්වා?

පි : සැප්තැම්බර් 20 කියලා කිව්වා.

ප්‍ර : සමාවෙන්න මට සැප්තැම්බර් 20 කියලා කිව්වා මට? ඒ කාල වකවානුවේදී මහත්මයාට යම්කිසි දීමනා ලබාදීමක් සිද්ධ කරාද ඔය ත්‍රස්ත විමර්ශන ඒකකය විසින්?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ සතපහක්වත් මහත්මයාට දීලා නැහැ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා ආපු ගියපු වෙලාවට රුපියල් 1000 ,2000?

පි : ආ එහෙම යන එන වෙලාවල් වලට රුපියල් 1000,2000,3000 ,4000, රුපියල් 5000 දුන්න අවස්ථාත් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : දුන්න අවස්ථාත් තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කාල වකවානුවේ කුමන හේතු මතද ඔය වගේ මුදල් ලබාදීම සිද්ධ කරේ?

පි : නැහැ නාලක සිල්වා මහත්මයා හම්බවෙන්න එනකොට මාසයක පඩියක් ගන්න රැකියාවක් කරපු කෙනෙක්. එතකොට නිතර දැන් සමහර විට නාලක සිල්වා මහතා අදත් එන්න කියනවා. සමහර වෙලාවට ආයේ කියනවා අනිද්දාත් එන්න කියලා. ඒ වගේ වෙලාවට ස්වාමිනි ඇවිල්ලා සමහර වෙලාවට මම කොටුවට වෙලා ඉන්නවා පැය 3ක් 4 ඉන්නවා හිටගෙන නාලක සිල්වා මහත්තයා එනකම්.

FAIR COMMENT BY JEZEEM

ආරක්ෂා වෙන්නත් ඕනි කාටවත් පෙන්නත් බැහැ. එතකොට මම පොලිස් මූස්ථානය ළඟ ඉන්නවා දැක්කාම එතනත් ප්‍රශ්නයක්. නාලක සිල්වා මහත්මයා කැමැති නැහැ කවුරුත් දකිනවාටවත්. තුස්ත විමර්ශන දිසාවටවත් මම එනවට කැමැතිත් නැහැ. ඉතින් මම ඇවිල්ලා පැය දෙක තුනයි ඉන්න ඕනි ස්වාමිනි. එතකොට මම ඒ එන අවස්ථාවල මගේ අතේ සල්ලි තිබුණොත් මම කෑම කනවා නැත්නම් බඩගින්නේ ඉඳලා යන්නේ ස්වාමිනි. ඉතින් නාලක සිල්වා මහත්මයා සතියකට දෙකකට සැරයක් රුපියල් 4000,5000 ක් නැත්නම් අඩුම තරමේ රුපියල් 500ක් හරි දුන්න අවස්ථා තිබුණා ස්වාමිනි. ඒවා මම පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර : සමහර අවස්ථාවලදී 5000?

පි : ඔව් 5000 එක පාරක් දීලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ ආකාරයට ලබාදුන්නු අවස්ථා කිහිපයක් තියෙවනවා කිව්වොත් යෝජනා කළොත් පිළිගන්නවද?

පි : 5000 දීලා තියෙනවා 2000 දීලා තියෙනවා. 1000 දීලා තියෙනවා. කොහොම හරි රුපියල් 12000ක් විතර දීලා ඇති.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයාට හොඳ තොරතුරක් ලැබිච්ච අවස්ථාවන්වලදි මහත්මයාට යම්කිසි දීමනාවක් ලබාදිලා තිබෙනවා?

පි : නැහැ තොරතුරු මම හොඳ තොරතුරු තමයි කොහොමත් හැමදාම දෙන්නෙ. නරක තොරතුරු දුන්නේම නැහැ ස්වාමිනි. හොඳ තොරතුරු නොවුණත් නරක තොරතුරු මොනවා වුණත් ඔහු අතේ සල්ලි, එතුමාට සල්ලි තිබුණොත් මට සල්ලි දෙනවා ස්වාමිනි. අතේ සල්ලි තිබුණොත් මට සල්ලි දෙනවා. තොරතුර කෙසේ වුණත් හොඳ හෝ නරක.

ප්‍ර : මහත්මයා මහත්මයා විසින් දැන් ඔය රැකියාවක් විදියට දැන් මේ අවස්ථාවේදී කරන්නේ කුමක්ද?

පි : මේ අවස්ථාවේදී රැකියාවක් කරන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර : මහත්මයා විවාහකද?

පි : විවාහකයි ස්වාමිනි.

ප්‍ර : මහත්මයාත් එක්ක කවුද ගෙදර ජීවත් වෙන්නේ?

පි : wifeගෙ අම්මා ඉන්නවා. තාත්තා ඉන්නවා. නංගී ඉන්නවා, මල්ලි ඉන්නවා. Wife ඉන්නවා මම ඉන්නවා ස්වාමිනි.

ප්‍ර : ඒ wifeගේ අම්මා තාත්තා හෝ බිරිඳ හෝ කවුරුන් හරි රැකියාවක් කරනවද?

පි : wifeගේ අම්මා රබර්වත්තක කිරි කපනවා ස්වාමිනි. තාත්තා බුලත්වත්තක නැවතිලා වැඩ කරනවා ස්වාමිනි. නංගී ගාමන්ට් යනවා ස්වාමිනි. මල්ලි ඉස්කෝලේ ගිහිල්ලා ඉවර වෙලා දැන් ප්‍රතිඵල

FAIR COMMENT — BY JEZEEM —

එනකම් ඉන්නවා ස්වාමිනි. Wife රැකියාවකට යන්න ලැබුණේ නැහැ ස්වාමිනි. Wife අසනීප තත්ත්වයක් තියෙනවා ප්‍රතිකාරත් ලබා ගන්නවා ස්වාමිනි. ඒ වගේම බාහිර උපාධි පාඨමාලාවක් හැදෑරුවා තවත් එක විෂයක් තියෙනවා ලියන්න ඒ නිසා එයා ඒ කටයුතු කරගෙන ඉන්නවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ගෙදර රැකියාව විරහිතව ඉන්නේ මහත්තයාත් මහත්මයාගේ බිරිඳත් මහත්මයාගේ සහෝදරයාත් කියලා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඉතින් මහත්මයාගේ ඔය තාත්තායි අම්මමායි රබර් කිරි කපනවා කියලා කිව්වානේ අම්මා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ මුදල ඇතිද පවුලේ අයගේ නඩත්තුවට? දැන් මහත්මයා කිව්ව විදියට 5 දෙනෙක්ගේ විතර යුත්ත පවුලක්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඉතින් ඒක ඇතිද?

පි : ඔයිටත් වැඩිය අඩුවෙන් මුදල් උපයන ජීවත් වෙන..

ප්‍ර : නැහැ මම අහන්නේ මහත්මයා ගැන. මහත්මයා වෙන පවුල් සම්බන්ධයෙන් නෙවෙයි. මහත්මයාට ඇතිද ඒක ප්‍රමාණවත්ද කියලා මං අහන්නේ?

පි : ප්‍රමාණවත් නැහැ ස්වාමිනි. නමුත් මම ඊට වැඩිය මට මුදල් උපයන්න වෙන මට අපරාධ කරන්න බැහැ. මගේ පැමිණිල්ල නිසා මගේ රැකියාව නැති වුණා. කොහේ ගියත් නාමල් කුමාර කියලා රැකියාවක් ලබා ගන්න ගියාම රැකියාවක් ලබාදෙන්න ගන්න ගියාම ඒ මං ඒක ප්‍රකාශ කරනවා. කොමිෂම ඉදිරියේ. ඊයේ පෙරේදා පෞද්ගලික ආයතනයට මාස්ක් එකක් දාන නිසා දැන් ගැටලුවක් නැහැ. ගාමන්ට් එකකට වැඩට යනවා කියලා. මම තව ගමේ තරුණයෝ දෙන්න තුන්දෙනෙක් එකතු කරගෙන අපි වැඩකට ගිහිල්ලා දවස් 04 ක් වැඩ කරන කොට නාමල් කුමාර නේද මේ රැකියාව දෙන්න බැහැ කියලා. මම කිව්වා ඉතින් මං නාමල් කුමාර කියලා කිව්වේ නැහැනේ. මට මේ විදියට වැඩ කරගෙන යන්න දෙන්න. මං වැඩ කරනවට ඔය ගොල්ලන්ගේ මේ ස්ටෝස් ඒවා සුද්ද කරලා දෙනවට මට දවසකට රුපියල් 1000 ක් 1500 ක් පුළුවන් නම දෙන්න කියලා. ඉතිං ඒකත් කරන්න බැරිවුණා ස්වාමීනි. එහෙම කියලා ස්වාමීනි මට ජීවිතය නැති කරගන්න බැහැ. මම මේ ප්‍රශ්න වලින් පැනලා යන්නත් බැහැ. ඒ නිසා මට පුළුවන් විදියට මං මුහුණ දෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවට හෝ ගුවන් හමුදාවට සම්බන්ධවීම සඳහා අයඳුම් කරාද?

පි : අයඳුම් කරා නෙවෙයි ස්වාමීනි. සම්බන්ධ වුණා ස්වාමීනි.

ප්‍ර : සම්බන්ධ වුණා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ යුධ හමුදාවටද බැඳුණේ ගුවන් හමුදාවටද බැඳුණේ?

පි : ඉස්සෙල්ලම ගුවන් හමුදාවට. ඊට පස්සේ යුධ හමුදාවට ස්වාමීනි. යුධ හමුදාවෙන් අස්වීම ලබාගත්තා. ගුවන් හමුදාවෙන් පොදු සමා කාලයක් ඊයේ පෙරේදා දීලා තිබුණා. මම training වෙලාවත් නැහැ. නමුත් ඒ නම ඇතුළත් වෙලා තියෙන නිසා කවද හරි පොදු සමාවක් දුන්න දවසට ඒක නිවැරදි කරගන්න උත්සාහ කරනවා. ඊයේ පෙරේදා පොදු සමාවක් හම්බ වුණා. එතකොට මං හිටියේ බන්ධනාගාරේ ස්වාමීනි.

ප්‍ර : ඒ යුද හමුදාවට හෝ ගුවන් හමුදාවට බැඳීමේදී මහත්මයා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනය සුදුසුකම් පිළිබඳව යම්කිසි ගැටලුකාරී තත්ත්වයක් ඇති වුණාද?

පි : ඔව් ස්වාමිනි මම ඉහත ප්‍රකාශ කරා ස්වාමිනි. උදේ ඒ පිළිබඳව ප්‍රකාශ කරා. මම ඒ සහතික හදලා තමයි ඇතුලත් වුණේ කියලා ස්වාමිනි.

ප්‍ර : මම ඒ ප්‍රශ්නය ඇහුවේ මහත්මයා මම 2න් පසුව තමයි මෙම ගරු කොමිෂන් සභාවට පැමිණියේ.

පි : පැහැදිලියි ස්වාමිනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් මම, මගේ දැනුමක් තිබුණේ නැහැ ඒකමයි මං නැවත ඒ ප්‍රශ්නය විමසා සිටියේ. මහත්මයා මම අවසාන වශයෙන් මහත්මයාට යෝජනා කරනවා මහත්මයා විසින් මේ හැරෙන හැරෙන පැත්තට කටට එන කරුණු කියමින් ඉතාමත්ම අසත්‍ය සාක්ෂි මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ ලබා දෙන බවට?

පි : ප්‍රතික්ෂේප කරනවා ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම මහත්මයා මම ප්‍රකාශ කරනවා මහත්මයා විසින් මේ දැන් නාලක සිල්වා මහතාට එරෙහිව නඟන චෝදනා අභූත චෝදනා කියලා?

පි : ප්‍රතික්ෂේප කරනවා ස්වාමිනි.

ප්‍ර : තව දුරටත් යෝජනා කරනවා මහත්තයාව විශ්වාස කරන්න පුළුවන් සාක්ෂිකරුවෙකු නෙවෙයි කියලා?

පි : එය ඔබතුමාගේ යෝජනාවක් වෙන්න ඇති ඒක මම ගරු කොමිෂම ඉදිරියේ ප්‍රකාශ කරනවා එම චෝදනාව මම ප්‍රතික්ෂේප කරන බවට.

ප්‍ර : මම තව දුරටත් යෝජනා කරනවා මහත්මයා විසින් අද දිනත් මේ සාක්ෂි ලබා දීම සඳහා පැමිණියේ මේ බාහිර පාර්ශවයන්ගේ එක්ක කරන ලද සාකච්ඡා කිරීම් වලින් අනතුරුව අසත්‍ය ලෙස නාලක

FAIR COMMENT — BY JEZEEM —

සිල්වා මහතාව අපහසුතාවයට පත් කිරීම සඳහා සාක්ෂි ලබා දීමට කියලා?

පි : නැත ස්වාමිනි මම ප්‍රතික්ෂේප කරනවා ස්වාමිනි.

ප්‍ර : මහත්මයා විසින් දැන් මේ සාක්ෂි ලබා දීමට අද දින පැමිණීමට පෙරත් ඊයේ දිනයේදී රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියෙකු සමඟ සාකච්ඡා කරා කියලා මහත්මයා ප්‍රකාශ කරා?

පි : පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මම අවසාන වශයෙන් මහත්මයා මම යෝජනා කරනවා මේ මහත්මයා විසින් සිදු කරන ලද කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ නාලක සිල්වා යන අය අත්අඩංගුවට පත්වුණේ කියලා. ඒ අත්අඩංගුවට ගැනීමේ ප්‍රතිඵලයක් විදියට මේ නාලක සිල්වා යන අය අත්අඩංගුවට පත් නොවූනේ නම් අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය වළකා ගැනීමට ඕනි තරම් ඉඩකඩ තිබුණා කියලා මම මහත්මයාට අවසාන වශයෙන් යෝජනා කරනවා?

පි : අවසාන වශයෙන් එයත් මම ප්‍රතික්ෂේප කරනවා ස්වාමිනි.

එපමණයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. සාක්ෂිකරුගෙන් වැඩිදුර ප්‍රශ්න විමසීමට ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයාගේ ඉල්ලීම මත අවසර ලබා දෙමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : ඔබ 2019 මැයි මාසේ 14 CID එකට ආවාට පස්සේ ඔබ ඇප ලබලා නිවසට එන්නේ 2020 ජූනි මාසේ කියලා කිව්වා?

පි : 06 මාසේ.

ප්‍ර : එතකොට ඔබ මාස 7ක් දවස් 211ක්?

පි : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටියා ස්වාමිනි.

ප්‍ර : ඊට පසුව ඔබව රිමාන්ඩ් භාරයට පත් කරාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කුමන අධිකරණයක් මඟින්ද?

පි : හෙට්ටිපොළ මහේස්ත්‍රාත් අධිකරණයේදී ස්වාමිනි. ත්‍රස්තවාදී වැළැක්වීමේ පනතෙන් සහ ජාත්‍යන්තර සිවිල් ICCPR පනතෙන් තමයි චෝදනා ගොනු කරලා තිබුණේ ස්වාමිනි. පළමුවෙන්ම ඇතුලත් කළේ වාරියපොළ බන්ධනාගාරයට.

ප්‍ර : නැහැ මට අවශ්‍ය ඔබව අධිකරණයට ඉදිරිපත් කර දිනය මතකයිද ඔබට?

FAIR COMMENT BY JEZEEM

පි : දිනය මතකයි ස්වාමිනි.

ප්‍ර : කවද්ද?

පි : 2019 දෙසැම්බර් මාසේ 10 ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ ඇප ලැබුණු දිනය?

පි : ඇප ලැබුණු දිනය 2020/06/18 ස්වාමිනි. නඩුව මුදා හැරියා ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබව මුදා හැරියා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කියා සිටියා අර ඔබ රැඳවුම් නියෝග මත සිටින විට ඒ අර ඔබගේ කුටියේ සිටපු අනිත් අය කියා සිටියා බව 2019/01/16 වෙනිදා ඒ සොයා ගන්නට යෙදුණු පුපුරණ ද්‍රව්‍ය වලින් පසුව මේ අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නට තිබුණා මේ බුද්ධි අංශ දුර්ලව තිබුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊට පෙර ඔබ කියා සිටියා මෙම පිපිරවීම සිදු කරන්නට යෙදුණේ තමන්ව අත්අඩංගුවට පත්වේවී එහෙම නැත්නම් බුද්ධි අංශ තමන්ට ලං වෙලා ඔවුන්ව වට කරගෙන ඉන්න බව ඔවුන්ට වැටහුණු නිසා බව ඔබ කියා සිටියා?

පි : ඔව් ස්වාමිනි ඒක තමයි කතාව.

ප්‍ර : එතකොට අර ජනවාරි 16 සහ ඔබ කියන ඊට පසුව කියන කතාවේ යම් පරස්පර විරෝධතාවයක් තියෙනවද නැත්නම් එකමද ඔබ කියන්නේ?

පි : නැහැනේ ස්වාමිනි.

ප්‍ර : සාක්ෂිකරු ඔබ කියා සිටියා ඔබ යම් යම් තොරතුරු අර ඔබ සමඟ කුටියේ සහ අර අසල්වැසි කුටිවල සිටපු අයගෙන් දැන ගත්තා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම තොරතුරු ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන්නද?

පි : ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර : කටඋත්තරයක් වශයෙන්?

පි : ප්‍රකාශ විදියට ලබා දීලා තියෙනවා ස්වාමිනි. බොහෝ තොරතුරු ලබා දී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර : අවසාන වශයෙන් ඔබ සෑම දාම දිනපතා පුවත්පත් කියවනද?

පි : දැන්නම් මං එළියට ආවාට පස්සේනම් මම පුවත්පත් කියවෙන්නේ නැහැ ස්වාමිනි.

එපමණයි ගරු උතුමාණෙනි.

****

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>

සාක්ෂිකරු සාක්ෂි ලබා දීම සඳහා වරකාපොළ සිට පැමිණ ඇති හෙයින් නීතියට අනුව ඔහුට හිමිවිය යුතු දීමනාව ලබා දෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

සාක්ෂිකරු විසින් ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු භාරයේ රඳවාගෙන සිටි කාලය තුල පාස්කු දින ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන් සමඟ සම්බන්ධතා පවත්වමින් ලබා ගත්තා යැයි පවසන ලැබූ සාක්ෂිය කොමිෂන් සභාවේ ප්‍රකාශ ඇති බවට ඔහු විසින් ප්‍රකාශ කරන හෙයින් 2015 අංක 4 දරණ සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට පහසුකම් සැලසීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උප වගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමිවිය යුතු අයිතින් සහ වරප්‍රසාද ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට පහසුකම් හා ආරක්ෂා සලසා දීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරමි.
සාක්ෂිකරු මුදා හරිමි.

****

<u>නීතිඥ මධු ජයතිලක මහත්මිය</u>

ගරු සභාපති ඇතුළු කොමසාරිස්තුමන්ලාගේ අවසරයි. මේ අවස්ථාවේ දී මගේ සේවාදායක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් කොමිෂම වෙත ලබා දී ඇති ඔහුගේ පරිගණකය ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් වී ඇති බැවින් ඔහු වෙත මුදා හැරීමට නියෝගක් ලබා ගැනීමට මෙම ඉල්ලීම කරනවා ස්වාමිනි හැකියාවක් තිබේනම්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>

ඉල්ලා ඇති පරිදි අදාල පරීක්ෂණ අවසන් කර තිබේනම් අදාළ ලිඛිත භාර ගත් බවට කුවිතාන්සි ලබාදීමෙන් පසුව පරිගණකය මුදා හරින ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරනවා.

කොමිෂන් සභාවේ කටයුතු නැවත 2020 දෙසැම්බර් මස 21 වන සඳුදා උදෑසන 10.00 තෙක් කල් තබනවා.
දැන් වෙලාව: ප.ව. 10.05

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

FAIR COMMENT BY JEZEEM

Presidential Commission of Inquiry to Investigate and Inquire into and Report or take necessary action on the Bomb Attacks on 21st April, 2019

Umair Mohamed Iqbal

Date	-	19.01.2021
Time	-	11.35 a.m.
Stenography & Typed by	-	Nerupa De Silva

Panel of the Judge

01. President - Hon. Judge of the Supreme Court - Absent
Mr. Janak de Silva Esquire

02. Member - Hon. Judge of the Court of Appeal - Acting
Chairman
Mr. Nissanka Bandula Karunarathna Esquire

03. Member - Hon. Former Judge of the Court of Appeal -
Absent
Mr. Nihal Sunil Rajapaksa Esquire

04. Member - Hon. Former Judge of the High Court
Mr. Atapattu Liyanage Bandula Kumara Atapattu Esquire

05. Member - Former Secretary to the Ministry
Mrs. W.M.M.R. Adikari

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Full Name : Umair Mohamed Iqbal
Age : 26 years.
Religion : Islam
National : Muslim
Designation :
Address : No. 55, Harrisons Jones Road, Matale.

Addl. Solicitor General Ms. Ayesha Jinasena assisting to the Presidential Commission on behalf of Attorney General.

Additional Solicitor General Ms. Ayesha Jinasena
Very good morning to the Hon. Commissioners. Prior to the leading of the evidence there are certain legal issues that I would like to submit to the attention of the Hon. Commissioners. So I am wondering whether we can contact the witness after that Sir.

I wish to enable the attention of the Commission to the fact that who has been summoned today to testify before this Commission is a suspect. In the course of the investigations conducted by the investigators in to the Easter Attack he has been arrested. And my understanding is he is still in custody. So on the 23rd of October 2020 when Hadiyas evidence was to be led before this Commission the Hon. Attorney General's representative then Senior Addl. Solicitor General Mr. Sarath Jayamanna who appeared before this Hon. Commission brought to the attention of the Commission the concerns the Attorney General would have in respect of a future prosecution, in the event that a suspect is being brought before this Commission and his evidence is led in the absence of any legal representations that he has for which he is entitled in terms of section 16 of the Act, Commission of Inquiry Act. So therefore it's my duty to invite the attention of the Hon. Commissioners to the same fact because this witness too is a suspect and if anything contradictory or any answer that he might give would have a direct impact on the criminal prosecutions in the absence and especially in the absence that he is being legally represented.

Hon. Bandula Karunaratne, Acting Chairman
So he was not given the section 16 notice earlier.

Additional Solicitor General Ms. Ayesha Jinasena
No he has not been given as I understand, but I am bringing it to the attention that as a suspect that who is in custody he generally would like to be represented by Counsels.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Hon. Bandula Karunaratne, Acting Chairman
So when you were informed yesterday that he is going to be summoned before this Commission today did you mention the fact that it is better we give the notice. So as we did when Hadiya's evidence was led, so we may proceed and we have already recorded your objection.

Order
The order from the Commissioners -
The learned Addl. Solicitor General's objection is considered but as we are sitting today to lead this witness's evidence we decide to proceed considering the previous reasons which we indicated when Zaharan's wife Hadiya was summoned before this Commission on the 23rd of October 2020, and we direct the learned Addl. Solicitor General to proceed with the leading of the evidence of Mr. Umair Mohamed.

****

Additional Solicitor General Ms. Ayesha Jinasena
Thank you.

Mr. Mohamed now we are going to get in to the proper proceedings right. Before you take the Oath I need to get certain fact out of you. Can you tell me the date today Mr. Mohamed that you have come to this BMICH?

A: Today is 19th of January 2021.
Q: 19th of January. What is the time there?
A: It shows 11.52 on screen.
Q: Right. Ok. Now you explained while we had, a brief discussion this morning that on the 21st of December 2020 you underwent a PCR test?
A: Yes.
Q: You also informed us that you were tested positive. Thereafter you were given treatment?
A: Yes sort of.
Q: Ok, so now you are, currently you are after that test right?
A: Yes.
Q: But a second PCR had not been done?
A: No, I actually objected because they informed only yesterday afternoon and I didn't want to go through hell again. So I said I prefer I actually not take part in this or rather do it over Skype. It's a must.
Q: Ok right. So now you are coming on screen that is online where you see us visually and you also hear us through the audio right?
A: Yes.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Ok. Right. Hon. Commissioners in view of the answers given by the witness I seek permission under the Victims and Witness Protection Act. Section 31 of the same to lead his evidence from a distant place since his presence cannot be secured in the well of the Commission currently due to the reasons that he has attributed. Thank you.

****

Hon. Bandula Karunaratne, Acting Chairman

Order

Considering the answers given by the witness we are satisfied that the requirements under the Witness Protection Act which is particularly Section 31 is fulfilled. we direct learned State Counsel to lead evidence on this zoom.

Additional Solicitor General Ms. Ayesha Jinasena

I thank you Sir.

****

<u>Witness affirmed</u>

Additional Solicitor General Ms. Ayesha Jinasena

Q: Am I correct if I say that your name is Umair Mohamed Iqbal?

A: Yes it's correct.

Q: Right. Am I also correct if I say that you were born in 1994 in Riyadh?

A: Yes that's correct.

Q: Now we are getting in to the proper proceeding. When I questioned you earlier you admitted your name to be Umair Mohamed Iqbal and that you were born in 1994 in Riyadh?

A: Yes.

Q: Why were you born in Riyadh? Were your parents in Riyadh at that time?

A: My dad was working there and my wife as a house wife as in my mother was in house and so dad was working a proper at long time so I was born there.

Q: Ok.

A: I studied there in Sri Lankan International School, Embassy school, mixed culture and might be grateful there and then we came back to Sri Lanka because of job issues…

Q: Hold on. I know that you know about yourself very well. But we are going to learn about you because step by step I have to lead you ok. So

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

I will try to do it in a comfortable manner and please assist us by giving the relevant answers ok?

A: Ok.

Q: Right. Now am I correct if I say by the time that you were born you had a elder sister?

A: No, actually have the elder brother.

Q: Elder brother? Ah.. so you are the second son in the family?

A: Yes.

Q: Ok. Then you have two sisters?

A: Yes, two younger sisters.

Q: And another brother?

A: Two younger brothers.

Q: Two younger brothers, one elder brother and one younger sister?

A: Two younger sisters.

Q: Two younger sisters? Altogether how many siblings?

A: Six.

Q: Six siblings. Ok, so is there anybody who still schooling?

A: Yes actually my two younger brothers and one sister is schooling.

Q: Right. You said in your answer earlier that you studied in Riyadh?

A: Yes.

Q: What was the school you attended Mr. Mohamed?

A: It's Embassy school, Sri Lankan International School Riyadh.

Q: For how long did you study there?

A: Studied there till grade 8.

Q: What happened after grade 8?

A: Afterwards we came like we had to exit Riyadh and we came as a family we came back to our home town to Matale.

Q: Am I correct if I say that you all returned in the year 2005 to Sri Lanka?

A: Yes 2005 December.

Q: So when you came to Sri Lanka you were studying in grade 8 there in Riyadh. What happened to your education in Sri Lanka?

A: I started from grade 9 in Royal English School Matale. It's an International school.

Q: Yes.

A: And afterwards I did my O/L there and from Advanced Level I went to Kingswood College, Kandy.

Q: Ok. So what did you do for Advanced Level?

A: I did languages.

Q: What are the languages?

A: I did French, English literature, Greek and Roman civilization was the 3 subjects which I did.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: Ok, so you did English Literature as well?

A: Yes.

Q: Right so have you studied about *D.H. Lawrence* his short story on the *Chrysanthemums?*

A: I can't recall but Yes I have heard.

Q: You have, ok.

A: Yes.

Q: So did you study about or did you Critique this the *Death of a Salesman* from *Arthur Miller?*

A: I can't remember actually I, we used to I mean I used to write actually I used to write poems, short stories and things as well.

Q: Ok.

A: And I was more into debating when I was in school, I was in Kingswood debating team as well. I was apappearedpear on MTV Debater and sort of programmes and all these things.

Q: So you were very active in school?

A: Yes I was very active I was actually vice-captain of the Kingswood football team, I was in what you call debate team, I was in the media team I was in lot of extra curriculum activities in lot. The Same time I focused on studies as well.

Q: Yes so what made you learn different languages?

A: Yes, I actually liked to learn lot to do with international like cultures and affairs and things like that. So I chose these 3 subjects not to actually get in to University but I wanted to study it for the interest. I was very fond of literature from small ages, so O/L I got an 'A' for literature and in Advanced Level I expected an 'A' but I got a 'C' I don't know how it came to happen but I was expecting an 'A'. and everyone in school expected that I will get an 'A' for literature. I got a 'B' in French and I got an 'A' in GR Greeks and Roman Civilization.

Q: Ok. Now out of all the subjects why did you choose to do Greek Civilization? What interest did you have in that?

A: Yes friends told like, people told that it was interesting and you know you learn lot of .. I like stuff like that anyway. I actually did it for the fun of it like I wanted to study something new. Not to study the same thing over and over again.

Q: Yes, so you said that unfortunately you couldn't get 'A's in your subjects? So sometimes these unforeseen things do happen even though we don't like right yes. So when did you conclude your A/L's, when did you sit for your A/L's?

A: I finished in 2012.

Q: Ok, what did you do thereafter?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: Afterwards I .. you mean studies wise or..

Q: Studies wise if we take because now you have done different languages. You have done Greek Civilization, you have done English literature right, so now all those things really make the map. So what did you do with regard to your studies thereafter?

A: I actually wanted to either go to Canada, Australia, study IR, International Relations.

Q: Yes.

A: But Dad did not like it because he said spent lot financially and that's lot of you know it's quite hard for him at the moment. so I had lot of arguments on that..

Q: Yes.

A: And then finally, studies wise I did my higher studies actually in this same enclosure, BMICH, BCIS Bandaranayke Center for International Studies. So I did the diploma and I started the higher diploma but I couldn't continue because of job you know clash in the time with the job…

Q: So you couldn't pursue your higher studies because of your employment?

A: Yeah exactly. But I did the diploma and I started the higher diploma but ..

Q: At the BMICH?

A: Yes. In the very same grounds.

Q: Yes. And you did it well right?

A: Yeah I did well I passed actually.

Q: Ok. Congratulations. So then can you please tell us at how many institutions that you have worked to earn your remuneration?

A: Top of the head I can remember 3. Yes 3 or 4.

Q: Initially after school didn't you go to Dubai?

A: Yes I went to Dubai. So like I said so I have this argument with Dad that I wanted to go to Canada or Australia to study IR and I even obtained a scholarship of 30% discount but still Dad didn't want to spend that much, so then I said no I was young at that time so I said I'll earn myself and I'll study my own self and I actually there stop in Dubai in search of a job and I did get a job in of my age without any degree or anything. I got a good job. But I came back for visa transfer thing and then I changed my mind I won't continue at personal reasons.

Q: Right now you said that you went to Dubai?

A: Yes.

Q: That was for employment.

A: Yeah for employment I went in search for a job actually.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Right now by that time you had studied several languages?

A Yes.

Q: So why didn't you consider of going to any European country where that your skill in languages would have been useful?

A: Problem of finance, so Dad was not willing to like spend much because he was also stuck at that moment like financially. So I thought I could earn like you know quick fire money in Dubai probably and this is the going visit visa to Dubai and then finance my own education but that disn't workout.

Q: Ok ,now at the time that you did your A/L's what was your father Mr. Mohamed?

A: He worked in Saudi for 24 years. He was in the IT sector. He was an Inventory Controller plus he had some IT knowledge as well.

Q: Ok.

A: So after he came back to Sri Lanka he didn't actually do a job. So we had a building in Matale which was given out for rent. So that was the income.

Q: So you all were living in Matale after you returned right?

A: Yes that was our home town.

Q: Ok that's how you went to that international school in Matale Royal right ok. So I was asking you about the several jobs that you had done. You said you went to Dubai in search of a job, but was not successful was it?

A: Actually got a job in the latter part of my stay, it was summer vacation that time plus I went on visit visa. So I had to get transfer, you have to go out to cross border basically and come back. I have was homesick I came back to Sri Lanka then I changed my mind I didn't go. But I got the job. I got the offer letter and everything it was for do mobiles it was a sales job actually indoor sales. So it was good salary at that time actually considering my age and all that.

Q: So what made you change your mind then after returning to Sri Lanka?

A: Personal reasons.

Q: Ok. You don't have to state the personal reasons. So due to personal reasons then you stayed back ok. Then Mr. Mohamed you also joined Lanka Bell Company didn't you?

A: Yes. It was actually called customer service Bell-vantage it was like under Lanka Bell. So I worked there for like 3 months or 4 months and I stopped again.

Q: Why?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

